මෙ කතාව මුලින් ම අසන ලද

ලිස්බෙට් ඇන්

වෙත පිරිනැමෙයි.

LOL_SEEN

## මේ කෘතිය පිළිබඳව සටහනක්........

ශල්‍ය වෛද්‍ය ආර්. එල්. ස්පිටල්ගේ "Where the White Sambur Roams" නැමැති කෘතියේ සිංහල පරිවර්තනයයි 'සුදුගෝනා'

'සුදුවැද්ද' හා 'සුදුගෝනා' යන කථා වස්තු අතර ඇත්තේ ඉතා සමීප සම්බන්ධතාවයකි. මෙම කථාවස්තු දෙකෙහිම හැන්ස්ගේ චරිතය ප්‍රධාන වන බැවිනි.

'සුදුගෝනා' සිංහල පරිවර්තනය මුලින්ම මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලද්දේ 1962 දී ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි. වසර 33 කට පසුව එහි දෙවැනි මුද්‍රණය 1996 ජනවාරි මසදී එළි දැක්විණි. ඉන් අනතුරුව 1996 මාර්තු මසදී තුන්වන මුද්‍රණයද 1996 ඔක්තෝබර් මසදී සතරවැනි මුද්‍රණයද කෙටිකාල සීමාවක් තුලදී ඉදිරිපත් කිරීමට අපට හැකියාව ලැබුණේ එම කෘතියට පාඨක හවතුන් දැක්වූ අතිමහත් ප්‍රතිචාරය හේතුවෙනි. මෙම කෘතිය මෙම ග්‍රන්ථයේ පස්වැනි මුද්‍රණයයි.

මෙම ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කරනු ලැබුයේ කෘතහස්ත පරිවර්තකයෙකුවූ අභාවප්‍රාප්ත ඒ. පී. ගුණරත්න මහතාණන් විසිනි. ඒ මහතාට අපගේ උපහාරය පිරිනැමේ.

මෙම කෘතිය එළිදැක්වීමේදී අප වෙත විශාල අනුග්‍රහයක් දැක්වූ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට මෙහිදී අපගේ ස්තුති පූර්වක ගෞරවය හිමිවේ. එසේම සාමාන්‍යාධිකාරීතුමාටත්, ප්‍රධාන පරිපාලන නිලධාරී (කළමණාකාර මණ්ඩල) තුමාටත් වාණිජ මුද්‍රණ අංශයේ කළමණාකාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ග්‍රැෆික් අංශයේ පරීක්ෂක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කාර්ය සාර්ථක කර ගැනීමට උරදුන් සැමටත් ප්‍රකාශන ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයටත් අපගේ කෘතඥතාවය පළකරමු.

නිස්සංක මදුරප්පෙරුම,
උපදේශක,
පොත් ප්‍රකාශන ව්‍යාපෘතිය,

1997 අගෝස්තු මස 15 දිනදිය.
ලේක්හවුස් මන්දිරය,
කොළඹ 10.

# පටුන


1. හැන්ස් ගෙදර හැර යයි ... ... 1
2. "ඉගිලෙන අශ්වයා" ... ... 9
3. නැගෙනහිර දිග බලා! ... ... 15
4. මුහුදු බත් වූ නැවියා ... ... 34
5. වන බැද්දේ ... ... 42
6. ගල් පොකුණ ... ... 54
7. පිහිටවීම ... ... 64
8. දිය වගුර ... ... 73
9. සුදු ගෝනා ... ... 80
10. වනයේ වැහි ... ... 85
11. වැද්දෝ ... ... 91
12. කළු දිවියා ... ... 105
13. වන තවුසා ... ... 116
14. රනී ... ... 129
15. ගුරුවරයා සහ ගෝලයා ... ... 138
16. නැවතත් විල් තෙරට ... ... 152
17. අඹා යාම ... ... 166
18. සිරකරුවා ... ... 173
19. සිංහලේ රජ ... ... 181
20. රාජ සභාව ... ... 191
21. ක්‍රීඩා සන්දර්ශනය ... ... 201
22. හැන්ස් සැලකිලි ලබයි ... ... 211
23. රාජාඥාව ... ... 215
24. ගෙදර බලා වනයට යයි ... ... 225

LOL_SEEN

## චිත්‍ර

ඔහුගේ විරුද්ධකාරයා මොහොතකින් ඔහු වෙත කඩා පනියි. ... ... 11

මහත් කලබලයෙන් මිනිස්සු ඒ මේ අත දුවති. 33

වලසාගේ නිය පහරින් හැන්ස්ගේ කලිසම ගැළැවී යයි. 52

මුළු වැර යොදා ඔහු දිවියාට පහර දෙයි. ... 82

මිනිසුන් දෙදෙනෙක් සහ යුවතියක් ඔහු ගිනිගොඩ ගැසූ තැන පරීක්ෂා කරති. ... 97

හැන්ස්ට කළු දිවිපැටවා හමුවෙයි. ... 112

හැන්ස් වැලේ නඟින හැටි දැක භික්ෂුව ක්ලාන්ත වෙයි. 125

බොහොම ඈත තියෙන අර කඳුගැට පේනව නේද? 147

හැන්ස් ගෝනාගේ කරෙන් අල්ලාගෙන ඌ ඉවතට ගෙන යයි. ... ... 163

දීප්තිමත් කළු සතෙක් හිටි හැටියේම පඳුරු අතරින් මතු වී නායකයාගේ පිටට වේගයෙන් පනියි. ... 170

දේවයන් වහන්ස, බලු ගැත්තාට එය කරන්ට බැරිවුණා. 184

එක වරට ම රජතුමා එහි පැමිණෙයි. ... 200

කදිම ඉලක්කය ... 209

මුළු ඇඟ මහත් වැරෙන් සොලවා ඇතා ගොවුවා බිම හෙළයි. 222

# හැන්ස් ගෙදර හැර යයි

සත් හැවිරිදි වියෙහි පසු වන හැන්ස් එක් හවසක තම ගෙදර පටු සාලයට කඩා වැදුණේ එයින් මහ සාලයට ඇතුළු විය. එහි ඇතුළු වූ හේ හිටිවන ම සිටියේ ය. අම්මා යයි අඬගැමට ඇරුණු කට එසේ ම ඇරී තුබුණ මුත් එයින් අඬක් පිට නො වී ය. එහි තුබුණ කවිච්චියේ වැතිරී නිද සිටි නැවියකු හේ දුටුවේ ය. ඔහුගේ එක් අතක් කවිච්චියෙන් පහළට වැටී තිබිණ. ඒ අතෙහි කොටන ලද නැංගුරමක රූ සටහනක් විය. එසේ ම ඔහුගේ ළැමද පුරා සිටින සේ රතු සහ නිල් සායමින් කොටන ලද රුවල් නැගූ නැවක රූ සටහනක් ද විය.

විස්මයෙන් ඇරුණු මුවින් යුතු ව හැන්ස් නැවියා දෙස බලා සිටියේ ය. ඊ ළඟට හැන්ස්ගේ දෙනෙත යොමු වූයේ නැවියා ළඟ ම බිම තබා තුබුණු විසිතුරු කළ කුරුලු කූඩුව දෙස ය. රතු පැහැති තුඩක්, නිලට හුරු දුඹුරු පැහැති හිසක් හා දිග පෙඳක් ද ඇති කොළ පැහැති කුඩා කුරුල්ලෙක් මෙ කූඩුවේ සිටියේ ය. කුරුල්ලා තමාගේ හිස ඔසවා හැන්ස් දෙස විමසිලි සහිත ව බලා නොපැහැදිලි වචන මාලාවක් කියා ගෙන ගියේ ය. තමාට නොපුරුදු නිසා නොතේරුණ නමුත් කුරුල්ලා කතා කෙළේ නිකම් ම කුරුළු නාදයක් නොව කිසියම් මිනිස් වර්ගයක් භාවිතා කරන වචන මාලාවක් බව වචනවල ස්වරූපයෙන් මෙන් ම ඌ කතා කළ විලාසයෙන් ද හැන්ස් තේරුම් ගත්තේ ය.

ශබ්ද නොකර ඇඟිලි වෙරෙන් ගොස් නැවියා පසු කළ හේ අම්මා සිටි කුස්සිය දෙසට ගමන් කෙළේ ය. කුස්සියේ ලිපට නැඹුරු ව සිටි රතු මුහුණක් ඇති තරබාරු ගැහැනියක් හිස ඔසවා හැන්ස් දෙස බැලුවා ය. ''අම්මේ, අර, මහා අලි නැවියෙක් අපේ කවිච්චියෙ නිද ඉන්නවා'' හේ චකිතයෙන් කොඳුරා කීවේ ය.

මව ආදරයෙන් දරුවාගේ හිස අත ගෑවා ය. ''ඒ තමා පුතාගෙ හුරා—මාමාගෙ පුතා—පීට්. පුතා උපන් අවුරුද්දෙ ම එයා ගෙදරින් පිට වෙලා ගියා. මෙච්චර මේ අවුරුදු ගණනකට පස්සෙ අද තමයි ඔය ඇවිල්ලා ඉන්නෙ. එයාට තේ දෙන්ඩ කැවිල්ලක් තමා මා මේ හදන්නෙ. මා හදන තාලෙට මේ කැවිලිවලට පීට් බොහොම කැමතියි.''

හැන්ස් තලු මැරුවේ ය. ''අම්මෙ, ඔය කැවිලිවලට නම් මාත් ආසයි.''

පීට ජීවත් වූයේ ඒ වීදිය කෙළවරේ වූ ඔහුගේ මවුපියන්ගේ නිවෙසේ ය. ඒ මාසය තුළදී පීට ද හැන්ස් ද ගජ මිත්‍රයෝ වූහ. හැන්ස් බොහෝ විට තම සගයා වූ, අවිකැමෙන් තඹ පැහැ ගැන්වුණු, හුරුබුහුටි නැවියාගේ පසෙකින් සාඩම්බරයෙන් ගමන් කරමින් ආර්නම්හි වීදි දිගේ නගරයෙන් පිටතට යයි. තම හූරාගේ ඇදෙන පැදෙන අපූරු ගමන අනුකරණය කිරීමට හේ බොහෝ උත්සාහ ගත්තේ ය. එසේ යන ඔවුන් වෙහෙස නිවා ගැනීමට තුරු සෙවණක හිඳගත් විට නැවියා විස්තර කර කියන කතාවලට දීප්තිමත් නෙතින් යුතු ව හැන්ස් කන් දී සිටියි. මුහුදෙන් එතෙර වෙනත් රටවල් ගැනත් ඒවායේ වසන වෙනස් වෙනස් මිනිස් ජාතීන් ගැනත් ඒ රටවලදී හමු වන ඇතුන් වඳුරන් හා හොණ්ඩර ගණන් බර ඇති මහා කැසුබුවන් ගැනත් විශේෂයෙන් මුහුදු ගමන් පිළිබඳ අත්දැකීම් ගැනත් පීට කී කතා ඇසීමට හැන්ස් විස්මයජනක ලෙස ලොල් කෙළේ ය.

පීට්ගේ ගෙදර පැමිණීම මෙන් ම නැවත ඔහුගේ පිටත් ව යාම ද හදිසියේ ම සිදු විය. දිනක් පාසැලේ සිට ගෙදර දුව ගෙන ආ හැන්ස් තම හූරා සමග නගරයෙන් පිටත ඇවිදීමට යාමේ අදහසින් පීට් සොයා ඔහුගේ නිවසට ගියේ හැම විට ම සතුටින් සිටින නැන්ද තම පුතණුවන්ගේ ගෙල වැලඳ ගෙන අඬමින් සිටිනු දුටුවේ ය. තවත් ගෙදරින් පිට නොයන ලෙසටත් මුහුදු ගමන්වල නොයෙදෙන ලෙසටත් ඕ පීට්ගෙන් උදක් ම ඉල්ලා සිටියා ය. පීට් හෙමින් ඇගේ දෑත මුදා ගෙන තමා වැඩි කලක් පිට නොසිට ගෙදර එන බවට සැනසිලි කතා කීවේ ය. තමා කටයුතු කළ නැවට නියමිත වේලාවට නොගිය හොත් තමා ලොකු කරදරයක වැටෙන්ට ඉඩ ඇති බව හේ තම මෑණියන්ට කී නමුත් පීට්ගේ ආසාව නැවත මුහුදු ගමනේ යාමට මිස නැවතීමට නොවන බව තවමත් ළමා විය නොඉක්ම වුව ද හැන්ස්ට තේරුම් ගියේ ය. දැන් පීට්ගේ නිවෙස මහ මුහුද ය. තම පියාගේ මේ නිවෙස එක් කුඩා නැවතුම් පොළක් පමණ ය.

මෙසේ පීට් නැවතත් පිටත් ව ගියේ ය. එහෙත් එයින් පසු ව හේ තවත් ගෙදර නාවේ ය. මාස ගණනකට පසු ව නොපුරුදු නමක් ඇති කිසියම් නැව් තොටක සිට හේ ලියුමක් එවූයේ ය. ඔහු ගැන තවත් තොරතුරක් දැන ගැනීමට තවත් මාස ගණනක් ගත විය. ඔහු එවූ අවසාන ලිපියේ සඳහන් ව තුබුණේ තමා උතුරු මුහුදේ හිම අතර සීල් නම් මසුන් දඩයමක යෙදී සිටින බව ය. පීට් මේවර ගෙදරින් ගොස් අවුරුදු හයකට පසු ව නැගෙනහිර ඉන්දියා නැව් සමාගමෙන් මවුපියන්ට එවූ ලියුමක සඳහන් වූයේ මාස අටකට පෙර පීට් ඇතුළු පිරිස වැඩ කළ මුහුදු යාත්‍රාව චීන වෙරළේදී සැඩ සුළඟකට අසු ව ගසා ගෙන

ගිය බවත් එයින් පසු ඒ නැව ගැන කිසි ම තොරතුරක් නො-ලැබුණු බවත් ය.

හැන්ස් මේ අවුරුදු කීපය තුළ ම පීට යද්දී තමාට තෑග්ගක් හැටියට දී ගිය ගිරවා සුරතල් කෙළේ ය. හැන්ස් ගිරවාට කෑම දුන්නේ ය. උගේ කූඩුව පිරිසුදු කෙළේ ය. තමා බැහැර යන විට ඌ තමාගේ අත උඩ හෝ හිස උඩ හෝ තබා ගෙන ගියේ ය. තියුණු තුඩක් හා නිය ඇති, හදිසියේ කිපෙන මේ ගිරවාට අනික් හැම දෙනා බිය වූ අතර හැන්ස් ඌට මෙසේ ආදරය කෙළේ ය. ගිරවා කියන්ට පුරුදු ව සිටි වචන මාලාව හැන්ස්ට ද කියන්ට හැකි විය. පීට තේරුම් කර නුදුන් සමහර වචන හැරුණු විට ගිරවා කී බොහෝ වචනවල තේරුම ද හේ දත්තේ ය. ගිරවාගේ වර්ණවත් පියාපතුත් උගේ අපූරු කට හඬත් ඌ කියන අමුතු වචනත් හැන්ස්ට නිතර පීට් සිහි කර වී ය. එසේ ම ආර්නම්හි කුස්සියකට පීට් යම්තමින් ගෙනවුත් පෑ ඒ විශාල ලෝකයේ අමුතු දේ ගැන හැන්ස්ගේ ආසාවත් එයින් දියුණු විය. පීට් හා කථා කළ වේලේ හැන්ස් කෙරෙහි ඇති වූ ලෝකය දැකීම පිළිබඳ ආසාව ළමයා වයසින් වැඩෙත් වැඩෙත් ම තව තවත් වැඩී ගියේ ය.

පීට් පිළිබඳ ව නැව් සමාගමෙන් දැන්වූ ආරංචිය හැන්ස්ගේ ගෙදරට දැන්වීමට පීට්ගේ මව එහි පැමිණි දිනයේ ම හැන්ස්ගේ සුරතල් ගිරවා කූඩුවෙන් එළියට පැන බළලකුට අසු වී තුවාල ලබා හැන්ස්ගේ වෙවුලන අතේ ම මිය ගියේ ය. මේ වන විට හැන්ස් දහහතර හැවිරිදි උස හුරුබුහුටි එසේ ම තමාට වඩා වයසින් වැඩි තරුණයකු සමග වුවත් කරට කර සිටිය හැකි ශක්ති මත් තරුණයකු වුවත් ගිරවා නිසා හේ පුරා පැයක් හැඬුවේ ය.

හැන්ස් පසුව ද උදයේ කනස්සල්ලෙන් බර වූ හිසින් පාසැලේ වාඩි වී සිටියේ ය. ස්කෝලෙ මහත්මයා කළුලෑල්ලේ අඳිමින් විස්තර කරන ගණිත ප්‍රශ්නවලට වඩා ගැඹුරු ප්‍රශ්නයක් විසඳා ගැනීමට හැන්ස්ට සිදු වී තිබේ. ස්කෝලෙ මහත්මයා විස්තර කිරීම ඉවර වී කළුලෑල්ල මකා දමන විටවත් හැන්ස්ට ඒ ගැන කල්පනාවක් නො වී ය. ඊ ළඟට ස්කෝලෙ මහත්මයා හැන්ස් අමතා, ''හැන්ස් වැන් ද මෙයර් මේ පාඩම හොඳට දන්නවා; ඒ නිසා මගේ විස්තරයට කන් දෙන්ට වුවමනා කෙළේ නැහැ. හොඳයි, හැන්ස් වැන් ද මෙයර්, මේ කළුලෑල්ල ළඟට ඇවිත් ඒ විස්තරය ලියා පෙන්වන්ට,'' යයි කී වචන පවා ඔහුගේ කනට වැටුණේ හුඟක් ප්‍රමාද ව ය.

හැන්ස් හුන් තැනින් නැඟිට අවුත් තමා අත ඇති හුනු කූර ගන්නා තෙක් උත්සාහයෙන් ඉවසා ගෙන සිටි ගුරුවරයා ඊ ළඟට කෝටුවක් අතින් ගෙන ඔහු පිටුපසින් සිට ගත්තේ ය.

හේ සිනාසුණ නමුත් ඒ පියකරු හිනාවක් නො වී ය. හැන්ස් කළුලෑල්ල දෙස නිකම් බලා ගෙන සිටියේ ය. ''හා ඉතින් ඇඳලා පෙන්වනවා'' කියනවා සමග ම කෝටු පහර හැන්ස්ගේ පිට හරහා වැදුණේ ය. හැන්ස් යටිතොල විකා ගත්තේ ය. ඊ ළඟට හේ කළුලෑල්ලේ ත්‍රිකෝණයක් ඇන්දේ ය. එහෙත් එහි සම කෝණයක් නො වී ය. ''මකාදපන් මෝඩයා'' යන වචනත් සමග ම තවත් වරක් කෝටු පහර වැදුණේ ය. මේ වර උරය හරහා වැදුණ පහර ඇඳුමෙන් නොවැසුණු බෙල්ලට ද වැදුණේ ය.

මේ අතවරය දිගට ම කෙරුණේ ය. වරදින වරක් පාසා—නැතහොත් කළුලෑල්ලේ ලියන වරක් පාසා—කෝටු පහර වැදුණේ ය. පන්තියේ අනික් ළමෝ කර ගත හැකි වෙනත් දෙයක් නැත්තේ මේ නින්ද සහගත ක්‍රියාව බලා සිටියෝ ය. ස්කෝලෙ මහත්මයා මීළඟට කාගෙන් ප්‍රශ්න කරත් දැයි සිතමින් පන්තියේ අනික් ශිෂ්‍යයෝ හුන් තැන ම හුන් හ.

දහවන වරටත් පහර වැදුණු හැන්ස් නොඉවසිලිමත් විය. ගුරුවරයා තවත් පහරක් ගැසුවේ ය. හැන්ස්ගේ ඉවසීම කෙළවර විය. ''බහුබූත කෝලමා, උඹට ගිරවකුට තරමට වත් මොළයක් නැහැ,'' සෙමින් වුව ද පරුස ලෙස කී හැන්ස් අඩියක් පස්සට ගියේ ය. වේගයෙන් ඇසිපිය මැරුවේ ය. හදිසියේ ම ඔහු දෙසට හැරුණ හැන්ස් තමාගේ මිටමෙළ වූ ශක්තිමත් අතින්, විරිත්තා ගෙන සිටි ඔහුගේ මුහුණට වේගවත් පහරක් දුන්නේ ය. ස්කෝලෙ මහත්මයා ඒ පහරින් ඇද වැටුණේ ය. වැටෙන ඔහුගේ හිස හැඩ මේසයක කෙළවරේ වැදිණි. එයින් නැගුණු හඬ හුළං පිර වූ කඩදාසි පසුම්බියක් පුපුරන හඬට වඩා මහත් විය. මුළු පන්තිය පුරා එක වර ම නිශ්ශබ්දතාව පැතිරිණි. ස්කෝලෙ මහත්මයාට පහර වදින විට ස්! ගා ශබ්දයක් නිකුත් කළ අනික් ළමෝ පසු ව ප්‍රීතියෙන් සෝෂා කරන්ට වූහ.

හැන්ස් පාසැලෙන් පිට විය. තවත් මේ පාසැලට නොඑන බව දත් හේ තමාගේ ගල්ලෑල්ලත් පොතත් ගැනීමට වත් නොසිට යන්ට ගියේ ය. තමා කළ මේ ක්‍රියාවට ගෙදරින් ලැබෙන සැලකිලි දන්නා හැන්ස් ස්ථිර අදහසක් ඇති ව මගට බැස්සේ ය. ඔහුගේ පියා රෙපරමාදු පල්ලියේ පූජකයෙකි. රළු දැඩි පුද්ගලයකු වූ හේ හැම විට ම ගුරුන් වැඩිහිටියන්ගේ පක්ෂය ගන්නෙකි. තමාගේ දඟකාර පුත්‍රයා කළ වරදට දඬුවම් පැමිණ වීම සඳහා පසුව ද පාසැලට යැවිය යුතු ය යනු ඔහුගේ තීරණය වනු නොඅනුමාන ය.

මෙසේ, 1675 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ එක් දිනක හැන්ස් වැන් ද මෙයර් පිටිසරක ඇවිදීමට ගිය දිනක හැර කිසි දිනකත් අත හැර නොගිය ආර්නම් නගරයට පිටු පා යන්ට ගියේ ය.

හේ වේගයෙන් ගමන් කෙළේ ය. ඔහුගේ අදහස වූයේ හැකි ඉක්මනින් ආර්නම් නගරයෙන් හැකි තරමක් දුර ඈත් වීම ය. මෙසේ නොනැවතී ම යන හැන්ස් වගහිං නගරය අසලට සේන්දු විය. ගමනින් බොහෝ වෙහෙස ව සිටි හෙතෙම මග අසල වූ පිදුරු ගොඩක් අතරට රිංගා ගත්තේ ටික වේලාවකදී ම නින්දට වැටුණේ ය.

අලුයම හැන්ස් නැවතත් ගමන් පටන් ගත්තේ ය. මීළඟ දින පහක් තුළ ම හේ වට පාරවල ඇවිද්දේ ය. හේ තමාගේ බඩ-ගින්න නිවා ගැනීමට වුවමනා වූ විට පමණක් පලතුරු වත්තක හෝ කැරට් ගොවිපළක හෝ නතර වුණේ ය. හැන්දෑ වුණ විට බඩවැටියකට හෝ හිස් ව තුබූ ධාන්‍ය ගබඩාවකට හෝ රිංගා නිදි ගත්තේ ය. ගෙදරින් පිට වූ හවෙනි දින ඔහුට හමු වූ එක් හරස් මගක සිටුවා තුබුණ දන්වීම් පුවරුවක 'ඈම්ස්ටර්ඩෑම්' නගරයට යයි සලකුණු කොට තිබෙනු හේ දුටුවේ ය. මෙතෙක් දුර හැන්ස් ගමන් කෙළේ ආර්නම් නගරයෙන් හැකි තරම් දුරට ඈත් වීමේ අදහසින් මිස අසවල් තැනට යමැ යි යන අදහසක් ඇති ව නො වේ. දැන් මේ දන්වීම් පුවරුවේ සඳහන් වන්නේ තම හූරා වූ පිට් මුහුදු ගමන් බොහොමයක මුල පිරූ ඈම්ස්ටර්ඩෑම් මහ නගරය යි. හැන්ස් එහි යෑමට ඉටා ගත්තේ ය. අතේ සතයක් වත් නැති ව සිටීම ඔහුට එතරම් කාරියක් නො වේ.

ගෙවී ගිය පාවහන් ඇති ව ගාට ගාටා ගමන් කළ හැන්ස් හැන්දෑව වන විට ඈම්ස්ටර්ඩෑම් නගරයේ මැද අලංකාර ගොඩ-නැගිලි අතර වූ ඇළ අද්දරට පැමිණියේ ය. එහි කලබලෙන් එහා මෙහා යන පිරිසෙන් තල්ලුවෙමින් මග දිගේ දුවන රථ වාහන දෙස බලමින් සිටි හැන්ස්ට පළමු වරට තනිකමක් දැනුණේ ය. ගෙදර මතක් විය. බඩ ගින්නත් සීතලත් දැනෙන්ට විය. මීළඟට කුමක් කළ යුතු ද කොහේ යා යුතු දැයි හැඟීමක් ඔහුට නො වී ය. එතැන සිට හෙමින් හෙමින් ගමන් කළ හැන්ස්ට නැව් තොටේ ලී මඩුවක වූ හිස් බංකුවක් හමු විය. හේ එහි හිඳ ගත්තේ ය. ඈඳිරි වැටී ලී මඩුව මිනිසුන්ගෙන් හිස් වූ විට, ඉදිමී තිබුණ දෙකකුලෙන් පාවහන් උනා දෙපා බංකුව මතට ගෙන එහි මුණින් අතට වැතිර ගත්තේ ය. තදින් වෙහෙස ව සිටි හෙතෙම ටික වේලාවකින් නින්දට වැටුණේ ය.

බඩ ගින්නෙන් හා සීතලෙන් ද පීඩිත වූ හැන්ස් හිමිදිරි උදේ ම අවදි වූයේ ය. තමා සිටි බංකුව අසල වූ අනික් බංකුවක නිදා හුන් නැවියකු ඔහුගේ දෙනෙතට හමු විය. නැවියාගේ කර වටේ ඔතන ලද රතු පාට කුඩා සළුවක් විය. බංකුවෙන් නැගිට සිටි හැන්ස් සීතලෙන් ඇකිළී තුබුණ අත්පාවල උණුසුමක් ඇති කර ගැනීමට ඒවා එහා මෙහා කරන අතර නිදා සිටි නැවියා නැගිට

හිඳ ගත්තේ ය. නිදිබර ඇස් හැර ඇසිපිය මැරුවේ ය. අවුල් ව තුබූ හිසකේ දැතින් පිරිමැද්දේ ය. ''හරි ම රැයක් තමයි ගත කෙළේ—හරි ම රැයක්'' ඔහුගේ මුවින් පිට විය. තදින් උගුර ඇඬ වූ නැවියා කටේ තුබුණ දුම්කොළ හපයක් එළියට විසි කෙළේ ය. තවත් වරක් දැස පිස දැමූ හේ තමා අවට පිරික්සා බැලුවේ ය.

මෙසේ බලන නැවියාට එහි සිටි හැන්ස් දක්නට ලැබිණ. තවමත් නිදිබර ගතිය නොගිය නැවියා හැන්ස් සිටින දෙසට ගියේ ''හරි සීතලයි නේ! නැද්ද?'' කියා කුලුපග ලෙස ඇසුවේ ය.

''එච්චර සීතලක් නෑ. ටිකක් සීතල තමා,'' කියමින් හැන්ස් ඔහුගේ කීමට එකඟ විය.

''උඹට හරි නෑ වගේ පේනවා, යාළුවා'' කී නැවියා ඔහු දෙස හොඳ හැටි බලා සිට, ''නෑ, උඹට හොඳ නෑ,'' යයි නැවත ද කීවේ ය.

හැන්ස් තමාගේ දුබලකම නොපෙන්වන්ට උත්සාහ ගනිමින් ''නෑ මට අමුත්තක් නෑ. මට හොඳයි,'' කීවේ ය.

''නෑ, නෑ හොඳක් නෑ. ආ, ගහපන් මේකෙන් එකක්,'' යයි කියමින් නැවියා බෝතලයක් ඇර ඔහු අතට දුන්නේ ය. ''ගහපන් ගැටයා, ගහපන්; ඕකට ඔක්කොම හොඳ වෙයි,'' කියා එය බීමට බල කෙළේ ය. ඒ සැර බීම හැන්ස්ගේ උගුර දාගෙන ගියේ ය. එයින් ඔහුට කැස්සක් ආවේ ය. කටින් කෙල වැගුරුණ අතර ඇසින් කඳුළු වැගුරුණේ ය. එහෙත් උගුරෙන් පහළට ගිය බීම ටික නිසා ඔහුට අමුතු ප්‍රාණවත් බවක් දැනෙන්ට විය.

නැවියා හැන්ස් අතින් බෝතලය ආපසු ගත්තේ ය. අනුකම්පාව හා පුදුමයත් මිශ්‍ර වූ බැල්මකින් ළමයා දෙස බැලුවේ ය. ''මේ හොඳ දේ උඹට පුරුදු නෑ වගේ පේනවා, යාළුවා'' කියමින් බෝතලයේ කට දෙතොලට ළං කර උඩ බලා එහි වූ බීම කටට වත්කර ගත්තේ ය.

නැවියා ඉතා විමසිලිමත් ව හැන්ස් දෙස බලා සිටියේ ය. ''උඹ මේ පළාතට අමුත්තෙක් නේද ගැටයා?''

ඒ එසේ ය කියන්නාක් මෙන් හැන්ස් හිස සැලුවේ ය. ඔහුට තවමත් කථා කර ගත නො හැක.

''කවද ද මෙහාට ආවෙ?''

''ඊයෙ හැන්දෑවෙ,'' හැන්ස් අමාරුවෙන් කී ය.

''මෙ ඇම්ස්ටර්ඩෑම් නගරෙ යාළුවා අඳුනන කවුරුවත් ඉන්නවා ද?''

''නැහැ.''

''ඇයි ඉතින් නැවතුම් පොළකට නො ගියෙ? මේ ලී මඩු ඔය වයසෙ ළමයින්ට එන්ඩ සෑහෙන තැන් නෙවෙයි.''

හැන්ස් ලජ්ජාවෙන් ඉවත බලා ගත්තේ ය.

''හරි, මට තේරෙනවා, කොහේ හිටලා ද ආවෙ?''

''ආර්නම්,'' මේ බව කිව යුතු ද නොකිය යුතු ද සිතා ගැනීමට පෙර ඔහුගේ කටින් වචනය පිට විය.

''ආ, එහෙනම් ගෙදරින් හොරා පැනලා ආවා!'' නැවියා බැම නභා කීවේ ය.

හැන්ස්ගෙන් පිළිතුරක් නො වී ය.

''මා, උඹ නම්, මා කරන්නෙ කෙළින් ම ආපහු ගෙදර යාම යි.''

''මාත් හිතා ඉන්නෙ එහෙම යි,'' හේ පසුතැවිලි වන්නකු මෙන් කී ය.

''ඒක හරි. හා, දැන් වරෙන් මාත් එක්ක. මම එක්ක යන්නම් මොකුත් කන්ඩ තැනකට.''

නගරය අවදි වේගන එයි. ඔවුහු ඒ අසල තුබුණ අවන් හලකට ගොඩ වැදී උදුනට නුදුරු තැනක වූ මේසයක් ළඟ ඉඳ ගත්තෝ ය. කේජු, බිත්තර හා ලොකු පාන් කැබලි ගොඩක් ද ඔවුන් ඉදිරියේ තබන ලදී. ඒ සමග නැවියාට ලොකු බීර බඳුනක් හා ඔහුගේ නියමයෙන් හැන්ස්ට කිරි වීදුරුවක් ද ගෙනෙන ලදී. මුල් කෑම බඳුන හිස් කළ හැන්ස් දෙවනු ගෙනා කෑම බඳුන ද ඉවර කෙළේ ය. ටික වෙන්ට කා තමාගේ මැටි පයිප්පයට කළු දුම්කොළ පුරවා ගත් නැවියා හැන්ස් කෑම කන දෙස බලා සිටියේ, ''හොඳ ළමයා —උඹ හාමතේ නේ ඉඳලා තියෙන්නෙ!'' කීවේ ය.

මේ වන විට කතා කිරීමට තරම ඉවසිලිමත් වූ හැන්ස් නැවියා දෙස හරසරින් බලා, ''මාත් කැමතියි ඔබ වගේ මුහුදු යන්ට'' කිය.

''ඒ ගැන කතා කරන්ඩ එපා, පුතා. මා හිතුවෙ උඹ දැන් ආපහු ගෙදර යනවා කීවා කියලයි. මා විස්වාසෙට ගනින්. මට දැන් හොඳට ම ඇති වෙලා තියෙන්නෙ. නැවියකුගෙ ජීවිතේ අපායක්.''

''එහෙම නම් ඔබ නැවියකු වෙලා ඉන්නෙ?''

''අපි ඒ කතාවට නොබැහැ ඉම්මු,'' නැවියා කීවේ ය. ඒ අවසාන වචනය බව කතාවේ හඬින් තේරුම් ගත් හැන්ස් නිහඬ විය.

ශාන්ත ස්වභාවයකින් දුම්කෝච්ඡ කරමින් සිටි නැවියා මුහුද ගැන හැර වෙනත් නොයෙක් දේ ගැන හැන්ස් සමග කතා කෙළේ ය. ඔහුගේ මව ගැන පියා ගැන ගම ගැන ගම හැර දමා මෙසේ ඒමට හේතුව ගැන කීමට හෙතෙම ළමයා උනන්දු කරවී ය. පාසැලේදී වූ සිද්දිය හැන්ස් කියා නිම වන විට නැවියා පුටුවේ ඇළ වී මහ හඬින් සිනාසුණේ ය. "ළමයා, ළමයා, බයගුල්ලකු නොවෙන කොයි ම ළමයකු උවත් අර වගේ මිනිහකුට කරන්ඩ ඕනෑ ඔය ටික තමයි. ඒත් බොහොම දෙනකුට එහෙම දෙයක් කරන්ඩ තරම ධෛර්යයක් නෑ." නැවියා ළමයා දෙස අමුතු සැලකිල්ලකින් බැලුවේ ය. ළමයා පිළිබඳ කිසියම යෝජනාවක් ඔහුගේ සිත තුළ ක්‍රියා කරන්නාක් මෙන් පෙනිණි. එහෙත් මොහොතකින් හේ ඒ අදහස ගසා දමා, "ගෙදරින් පැන ආපු මේ වයසෙ තරුණයකුට ඇම්ස්ටර්ඩෑම් කොහොමටවත් හොඳ තැනක් නෙමෙයි," හේ ඉතා සන්සුන් ව කීවේ ය. "උඹ අද ම මේකෙන් පිටත් වෙලා ගමට යන්ට ඕනෑ. දැන් ගෙදරින් පිට වෙලා හුඟ දවසක්. මෙලාකට ගෙදර අම්මලා තාත්තලා බොහොම දුකෙන් ඇති, උඹ මළා ද ආයෙත් ගෙදර නේන්ඩ ම ගියා ද කියලා. දැන් ගෙදර ගියොත් ඒ සන්තෝසෙ නිසා උඹ කරපු වරදවල් ගැන එක ම වචනයක්වත් කතා නොකරනවා ඇති. අර සිංජෝර් ඩෑම් ද කව්ද මං දන්නෙ නෑ—ඒ ස්කෝලෙ මහත්තයා ගැන මං හිතන්නෙ. . . ." හේ නැවතත් මහ හඬින් සිනාසෙන්ට විය.

තමා සතු ව කිසි ම මුදලක් නැති බව දත් නමුත් හැන්ස් කෑමවල මිල ගෙවීමට මෙන් සාක්කු අත ගානු දුටු නැවියා ඔහුගේ පිටට තට්ටු කර, "මේක මගෙ කාරියක් පුතා, මම ගෙවන්නම්. අවුරුදු ගණනකට පස්සෙ මට කට පුරා හිනා වෙන්ඩ ලැබුණෙ අදයි," කීවේ ය. අවන්හලින් පිටතට පැමිණි නැවියා මග නැවතුණේ ය. "අපි දැන් මෙතනදි වෙන් වෙනවා, හැන්ස්, මගෙ හොඳ පුතා—උඹේ නම හැන්ස් කියලා නේද කීවෙ?—හේ තමාගේ අත දිගු කෙළේ ය. හැන්ස් නැවියාගේ අත ගෙන සොලවා අත හැරිය විට රන් කාසි තුනක් ඔහුගේ අතෙහි විය. "ඕක තියා ගනින්. උඹේ ගමනෙ කෙළවරට ම යන්ඩ ඔය මුදල ඇති. ගෙදර යන මග තමා දැන් යන්ඩ ඕනෑ එක ම මග. හැකි තරම ඉක්මනින් ගෙදර පලයන්." නැවියා තවත් වරක් ඔහුගේ පිටට තට්ටු කර, "හොඳයි පුතා, උඹට දෙයියන්නෙ පිහිටයි," කියමින් හැන්ස් ස්තුති කරන තෙක් වත් නො සිට හැරී යන්ට ගියේ ය.

ඔහු මිනිසුන් අතර නොපෙනී යන තුරු හැන්ස් එහි බලා සිටියේ ය. තමාට කරන ලද සැලකිලිත් බලාපොරොත්තු නොවූ

තැග්ගත් ගැන නැවියා කෙරෙහි අතිශයින් කෘතඥ වූ හැන්ස් ඔහුගේ අවවාදය පිළිගැනීමට අදහස් කෙළේ ය. එහෙත් හැන්ස් තාම ළමයෙකි. පිටිසර ළමයකුට ඇති කුතුහලයක් ඇති ළමයෙකි. මේ ඉන්නේ ළමයකුට දැකීමට ඉතා පියකරු වූ නගරයක ය. සතියකට පසු ව ලැබුණු හොඳ ආහාරයෙන් ප්‍රාණවත් වූ හේ මෙවැනි අලංකාර මහ නගරයකට පැමිණ එහි ඇවිද නොබලා ආපසු යාම අපරාධයෙකැ යි කල්පනා කෙළේ ය.

# 2

## "ඉගිලෙන අශ්වයා"

දවසේ වැඩි කොටසක් නගරයේ වැදගත් කොටස්වල ඇවිද ගෙන ගිය හැන්ස් හැන්දෑව වන විට, නගරයේ යම් කොටසකට නොයා යුතු ද ඒ කොටසට ම පැමිණියේය. බැඳ තබන ලද රුහැන් අදිමින් එහා මෙහා පැද්දෙන මුහුදු යාත්‍රාවන්ගේ දර්ශනයෙන් වශීකෘත ව, නැවියන්ගේ රළු කරළු කතාවන්ට කන් දෙමින් හා ලුණු මිශ්‍ර බර සුළඟේ පහස විඳිමින් හැන්ස් එහි ඇවිද්දේ ය.

අවට ගෙවල පහන් දල්වනු පෙනෙන්ට වූ විට තමාට කෑමට කිසිවක් ලබා ගත හැකි තැනක් ගැන හේ කල්පනා කෙළේ ය. ''ඉගිලෙන අශ්වයා'' යන නම් පුවරුවක් ඇති ව තුබුණ අවන් හලක් දුටු හෙතෙම එහි ඇතුළු විය. එහි ඇතුළත සිත් ගන්නා සුලු නො වී ය. එහි ගඩොල් ඇල්ලූ බිම හොඳට ම ගෙවී ගොසිනි. බිත්තිවල කැඩුණ බිඳුණ තැන් බොහෝ විය. තැන තැන දමන ලද පීප්ප ගොඩක් වී ය. ඉටිපන්දම්වල එළිය විහිදුණේ ද මඳ වශයෙනි. එවෙලේ එය මිනිසුන්ගෙන් හිස් විය. එහි සිටි එක ම මිනිහා වූ බීම විකුණන්නා හැන්ස් දෙස සාමාන්‍ය බැල්මක් හෙළා තමාගේ කටයුතුවල නිරත විය. තරබාරු යුවතියෝ දෙදෙනෙක් ඔහුගේ සහකාරියෝ වූහ. ළමැද හිර ව සිටින සේ ඇඳගත් හැට්ට හා දිග සායවලින් ද සැරසුණු මොහු දෙදෙනා වෙනත් වැඩවල නිරත ව සිටියෝ ය. දොරකඩ සිටගෙන මඳ වේලාවක් කල්පනා කළ හැන්ස් හෙමින් සැරේ එහි ඇතුළු වී මහ ශාලාවේ කෙළවරක වූ මේසයක් ළඟ පුටුවක වාඩි විය.

බොහෝ වේලාවක් යන තුරු ම කිසිවෙක් ඔහු ගැන කිසි සැලකිල්ලක් නො දක්වූවෝ ය. පසුව ඔහු ට පෙනෙන මානයේ මේසයක් පිළිවෙළ කරමින් සිටි යුවතිය ඔහුට කථා කොට, "ළමයා, මොනවා හරි කෑමක් බීමක් ගන්ඩ නම් තව හුඟ වෙලාවක් ඉන්ඩ වේවි," යි කීවා ය.

"ඒක මට කාරියක් නෙමෙයි," හැන්ස් කීවේ ය.

ඊට පැයකට පමණ පසු මේ යුවතිය නැවතත් ඔහු හුන් තැනට පැමිණියා වුවමනා මොනවා දැයි විමසුවා ය.

"කේජු ටිකකුයි පානුයි," හැන්ස් කීවේ ය.

"එතකොට බොන්ඩ ?"

"වතුර."

"ඒව නෑ මෙහෙ," ඕ අවඥවෙන් මෙන් කීවා ය.

"හොඳයි, එහෙනම් බීර."

ඔහු ඉල්ලූ කෑම එහි ගෙනවුත් තැබූ යුවතිය පැන් කුසලානක් ද එහි තැබුවා ය. "ආ, මේවා අනිත් ජාතියට වඩා හොඳයි; මා නම් කරන්නෙ කෑම කාපු හැටියෙ පිරිස එක්වෙන්ට ඉස්සර මෙතනින් පිට වෙලා යන එක යි," ඈ හෙමින් කීවා ය.

එහෙත් කිසි ම කලබලයක් නැති ව හෙමින් හෙමින් පාන් කැලි හපමින් එහි සිටි හැන්ස්, තනි තනිවත් කුඩා කණ්ඩායම් වශයෙනුත් පැමිණ එහි ඇතුළු වූ මිනිසුන් දෙස කුතුහලයෙන් බලන්ට විය. මේ හැම දෙනා ම පාහේ නැවියන්ගේ සම්පූර්ණ ඇඳුමෙන් සැරසී සිටියහ. දිග කලිසමත් කොට කමිසයත් කමිස කර වටේ වූ දිග කාප්පයත් පාද වැස්මත් ඔවුන්ගේ ඒ ඇඳුම විය. ඔවුන්ගේ හිසේ වූ, සමින් කළ කැප් තොප්පි අමුතු හැඩයක ඒවා විය. කිලිටි ඇඳගත් වාදකයෝ දෙතුන් දෙනෙක් එහි ඇතුළු වූවෝ ය. කොට කඩුවකින් හා පිස්තෝලයකින් ද සැරසුණු, කනේ තෝඩු ලා ගත් දුඹුරු පැහැති මුහුදුකාරයෙක් ද එහි ඇතුළු විය. හැන්ස්ගේ සිත ප්‍රමුදිත විය. දිග වේලාවක් ගත කරන අදහසින් හේ හොඳට හරි ගැහී හිඳ ගත්තේ ය. ඔහු වැනි තවත් නැවියෝ පසු ව පැමිණියෝ ය. කාමරය මිනිසුන්ගෙන් පිරී ගියේ ය. එහි වාතය දුමෙන් ගහන විය. බීම භාජන හිස් වන හිස් වන සේ නැවත පුරව පුරවා තබන ලදී. පිරිසේ ඝෝෂාව වැඩි වන්ට විය. භාෂා පහ හයක් කථා කළ පිරිසේ සමහරු වාද කරන්ටත් සමහරු ගායනය කරන්ටත් සමහරු බැණ දොඩා ගන්ටත් තවත් සමහරු වෙනත් දුරු රටවලදී අත්දුටු සිද්ධීන් විස්තර කරන්ටත් වූහ.

රාත්‍රිය ගෙවී ගියේ ය. දුසිමක් පමණ වූ මැටි දුම්කෝප්පවලින් විහිදුණු දුම්කොළ දුම් ගඳින් වාතය පිරී ගියේ ය. බීමත් ව දෙඩවන කෑගසන තරවටු කරන මිනිසුන්ගේ කලබල ශබ්දයෙන් පිටිසර-බදව වැඩුණු හැන්ස් තැති ගත්තේ ය. සේවය කරන යුවතියෝ අතින් ගත් බීම භාජන ඇති ව එහා මෙහා ගිය අතර බීමත්-වූවෝ ඔවුන්ට විහිළුතහළු කරමින් ඔවුන්ගේ ඉඟිබිඟි බලා මහ හඬින් සිනාසුණෝ ය.

කාමරයේ එක් කෙළවරකින් මහා කලබලයක් පැන නැංගේ ය. කළුපාට ඇස් ආවරණයකින් එක් ඇසක් වසා ගත් හැඩි දැඩි තරබාරු පුද්ගලයෙක් නැගිට සිටියේ ය. ඔහු හිඳගෙන උන් පුටුව ශබ්ද නගා පෙරළී ගියේ ය. තමාගේ ඉණට අත යැවූ හෙතෙම දිලිසෙන දිග පිහියක් කොපුවෙන් මැත් කොට ගත්තේ ය. එකෙණෙහි ම ඔහුගේ ප්‍රතිවිරුද්ධකාරයා වූ හොඳට ම බීමත් ව සිටි යෝධ පුරුෂයෙක් තමා ඉදිරියෙන් තිබුණු බර මේසය



ඔහුගේ විරුද්ධකාරයා මොහොතකින් ඔහු වෙත කඩා පනියි.

එහි වූ බීම භාජන හා පහනුත් සමග පෙරළාගෙන නැගිට දිවියකු මෙන් ඉදිරියට ඇදුණේ ය. එහි වූ අනික් පිරිස වටයට සිටියෝ ය. පෙරළී ගිය භාජනවල හඬ හැරුණ විට මුළු පිරිස ම නිශ්ශබ්ද වූහ. මෙහිදී මුලින් නැගී සිටි කළු පුද්ගලයා තම පිහිය අමෝරා ගෙන සතුරා වෙතට පැන්නේ ය. එහෙත් අනිකා අඩියක් හෝ ආපසු නොගොස් තමා වෙත පහත් වන ආයුධය වමතින් පිස හැරියේ ය. එයින් ඔහුගේ අත පළා ගෙන ගිය ලොකු තුවාලයක් ඇති විය. එයින් ලේ වෑහෙන්ට පෙර ම එතෙම තමාගේ දකුණු අතේ වූ සිරිය උඩු අතට හරවා සතුරාට දුන් පහරින් කළු මිනිහාගේ බෙල්ලේ සිට නළල දක්වා කැපී ගෙන ගියේ ය. තුවාල ලැබූ තැනැත්තා ඒ ලිස්සන පොළොවේ පස්සට විසි වීගන යද්දී ම පහර දුන් තැනැත්තා නැවතත් පහර දුන්නේ ය. මේවර ඔහුගේ සිරිය අනිකාගේ හද පළා ගෙන යටට බැස්සේ එක් වරක් පමණක් ගෙරවීමක් කළ ප්‍රතිමල්ලයා මූර්ච්ඡා විය.

පිරිසේ ටික දෙනෙක් මැරුණු තැනැත්තා වෙතට ළංවූ අතර මිනිමැරීම කළ තැනැත්තාගේ යහළුවෝ දෙදෙනෙක් ඔහු කැඳවා ගෙන එළියට ගියෝ ය. පහර කෑ තැනැත්තා නිසැකව ම මළ බව පෙනී ගිය හෙයින් කීප දෙනෙක් මළ කඳ ඔසවා එළියට ගෙන ගියෝ ය. කලබලය මොහොතකින් සන් සිඳිණ. කාමරය නැවතත් වරක් සිනාහඬින් හා දෙඩමලු කතා හඬින් පිරී ගියේ ය.

හැන්ස් මෙයින් හොඳට ම තැති ගත්තේ තමා වඩා කලබල නැති මිනිසුන් ඇති මේ මුල්ලට වීම එක් වාසනාවකැ යි සිතා ගත්තේ ය. මේ පිරිසෙන් එක් පුද්ගලයෙක්—පෙනීමෙන් හේ මුහුදුකාරයෙක් නො වේ—මෙහි ඇතුළු වී හිඳ ගැනීමට පෙර හැන්ස් දෙස ඕනෑකමින් බලා මෙහි ම වාඩි වූවෙකි. මොහු පසු ව පැමිණ හිඳගත් නැවියකු හා හාද විය. මොවුන් දෙදෙනාගේ කතාවට හැන්ස් කන් දී සිටියේ ය. මෙහි තුළ පැවති නොයෙකුත් ඝෝෂාවන් අතර මේ කතාවේ යම් යම් දේ හැන්ස්ට අසා ගත හැකි විය. කතාවෙන් කියැවුණු හැටියට මේ නැවියා මෑතකදී ඉන්දියා දේශයට ගොස් ආපසු පැමිණියෙකි. මේ දෙදෙනා පසු ව අවුත් හැන්ස් සිටි මේසය ළඟ හිඳ ගැනීම හැන්ස්ගේ මහත් සතුටට හේතු විය. මේ නැවියා අනිකාගේ ඉල්ලීම පිට ඒ පෙර දිග සංචාරයෙන් ලැබූ අත්දැකීම් ඉතා සිත් ගන්නා ලෙස විස්තර කර කියන්ට වී ය.

"දුන් හිතලා බලමු මේ 'ගෙල්ඩර්ලන්ඩ්' නැවේ ගෙනාපු බඩු ගැන විතරක්. මිනිසුන් ඉක්මනින් පොහොසත් කරවන ඉහුරු ගම්මිරිස් වගේ කුළුබඩු ඉන්දියාවෙන්; වසාවාසි සාදික්කා බැන්ඩාවෙන්; කරාබුනැටි ඇම්බොයිනාවෙන්; එතකොට කුරුඳු ශෙයිලාන්වලින්. අහ්! ඒක තමා කියාපු දූපත කෙනකුට යන්ඩ.

ඒකෙ මොන දේ ද නැත්තෙ? ඇතුන්, මොනරුන්, රිළවුන්, වඳුරන් පිරිලා; ඒවගෙ ම වටිනා මැණික් ගල් වර්ග නිකම් අවුලා ගන්ඩ තියෙනවා—මෙ බලන්ඩ මේවා,'' ගේ සැක සහිත ව වට පිට බලා ඉණේ තුබුණ කුඩා පසුම්බියක් ගත්තේ ය. එහි වූ මැණික් ගල් වර්ගයක් අතට හැලුවේ ය. ඒවා බබළන්ට විය. හැන්ස් පුදුමයෙන් හා ප්‍රීතියෙන් හුස්ම ඉහළට නහා ගත්තේ ය.

''කොහෙ ද මේ මැණික් ගල් හමුවන්නෙ?'' අනිකා ඇසී ය.

''ගංගාවල පතුලෙ, කුඹුරුවල මඩේ; ඒත් මේවා නම් මා ලබා ගත්තෙ සටනක් කරලා.''

''ඔය කියන දිවයින තියෙන්නෙ කොහෙ ද?'' හැන්ස් තව දුරටත් කුතුහලය ඉවසා සිටිය නොහැකි වූයේ විමසුවේ ය.

පළමු වරට හමු වූවකු දෙස බලන්නාක් මෙන් ඔහු දෙදෙනා ම හැන්ස් දෙස බැලුවෝ ය.

''කොයි දිවයින ද ඇහුවෙ? මා කතා කළා දිවයින් කීපයක් ගැන?'' නැවියා විමසුවේ ය.

''මේ මැණික් ගල් ලැබුණා ය කී දිවයින?''

''ශෙයිලාන්! මහ මූදෙ හැතැප්ම දස් ගණනකට එහා.''

''ඒවා තමා රටවල්—තමන්ගෙ වීරකම් පෙන්නන්ඩ කැමති ගැටවරයන්ට ආ!'' අනිකා කීවේ ය.

''හා, ඒ ඇති, ඒකෙ ඔච්චර දෙයක් නෑ,'' යි කී නැවියා, ''මී ළඟට ඔබ මේ ළමයා අතට මිටියක් දීල කියයි ගල්පරුවතවලින් දියමන්ති කඩන්ට යන්ට,'' නැවියා මහ හයියෙන් සිනාසුණේ ය. අනිකා ඒ නොකැමති බවක් පෙන්වන බැල්මක් හෙළු නමුත් නැවියා ඒ ගණනකට නොගත්තේ ය. ''මටත් ඔය හැටි තමා සිද්ද උණේ, මීට පහළොස් අවුරුද්දකට පෙරදී. එතකොට මටත් ඔයිට වඩා වැඩි වයසක් තිබුණෙ නැහැ. එද පටන් අද වෙන කල් මා නැවියෙක්. දෙයියො දනිත් මන්ද කියාලා—එහෙම නම් ඒ ගැනත් මම ටිකක් කියන්නම්.''

''නෑ නෑ දැන් රෑ උණා, දැන් රෑ දෙගොඩ හරිය. මේක වහන්-ටත් ළඟයි. අපි දැන් යන්ට ඉස්සර තව බීර ඔඩමක් ගනිමු,'' යි කී නාගරිකයා එතැනින් නැගිට ගොස් බීර භාජන තුනක් ගෙන ආවේ ය. මෙයින් එකක් හැන්ස්ට විය. එහි පුටුවක් පිටට නැඟුණ හෙතෙම තමාගේ බීර ඔඩම ඔසවා කෑ ගැවේ ය. ''මෙන්න, මුහුදේ වීර පුතුන්ට.''

හැම දෙනාට ම එකවර දූන් සංඥවකින් මෙන් මුළු පිරිස ම එක් ගීයක් ගයන්ට පටන් ගත්හ. මුහුදු කොල්ලකාරයන්ගේ ඝෝෂා ගායනයක් මෙන් වූ එය පටන් ගත් තැන ම හැන්ස්ට

එක්තරා වේදනාවක් ඇති වූ නමුත් එයින් ඔහුගේ නහරවල ලේ වේගයෙන් ගමන් කරන්ට වී ය :

ඔව්, මට දැනුණා අගයි මුල
උන් කළ කතාව මා ගැන ම යි
ගෙදර පුරා පැතුරුණ අඳුර යි
මුහුදු ගමන් ගිය පුතා ගැන යි
යි

හිස සැලීමකින් හැන්ස්ට සංඥා කළ අනිත් දෙදෙන එතැනින් පිට ව ගියෝ ය. ඒ සමග ම වාගේ අනික් පිරිස ද නැගිට නැගිට යන්ට වූයෙන් ස්ථානය හිස් වන්ට විය. හැන්ස් ද එයින් එළියට බසින්ට සූදනම් විය. තමාට කලින් කතා කළ සේවිකාව මෙවිට බීමත් වූ නැවියකු විසින් වැලඳ ගනු ලැබ සිටියා එහි පැමිණියා ය. "මොනවා, තවමත් ගියෙ නැහැ! ඉක්මනට ගෙදර යන්ඩ, අම්මා මග බලාගෙන ඇති—මෙන්න අපූරු දරුවෙක්!" යයි කීවා ය.

හැන්ස් අවන් හලින් පිටතට පැමිණියේ තමා අතර මං වී සිටින වග තේරුම් ගත්තේ ය. හේ නොයා හැකි අඳුරු වීදියේ සිටගෙන උඩ බිම බැලුවේ, රාත්‍රිය ගත කිරීම සඳහා ආපසු අවන් හලට යාමට සිතුවේ ය. එහෙත් තමා පිට ව එද්දී ඒ සේවිකාව කී අවඥ සහගත වචන නිසා එහි යැමට සිත් නො වී ය. ඔහුට එය කළ නොහැකි එකක් විය. තමා තනි වී අනාථ ව ගිය වග සිතමින් වීදිය දිගේ සෙමින් සෙමින් ගමන් කරන විට මංසන්ධියකට පැමිණියේ සැකසංකා සිතින් එහි නැවතී සිටියේ ය. මෙවිට අඳුරේ තමා දෙසට එන කිසිවකුගේ සේයාවක් හැන්ස් දුටුවේ ය. පැමිණි තැනැත්තා ඔහුගේ මුහුණට එබී බලා, "ආ, මේ ඇතුළෙ හිටිය අපේ ගැටෙයා නේ!" කීවේ ය.

අඳුරේ මිනිහා ඇඳිනිය නොහැකි වුවත් තමාට බීර ඔඩමකින් සංග්‍රහ කළ නාගරිකයා බව ඔහුගේ කට හඬින් හැන්ස් හැඳින්නේ ය. "උඹ අතරමං වෙලා වගෙයි, ළමයා. උඹ වරෙන් මා කැටුව, මම උඹට අද රෑට නවාතැන් දෙන්නම්. මෙවෙලෙ මා මෙතනින් යන්ට ආවෙ උඹේ වාසනාවකට. මේ වෙලාවට මේ පාරවල යාම ඒ තරම සුබ නැහැ," හේ කීවේ ය.

මේ පුද්ගලයාගේ පෙනීම හෝ මෙසේ චෝදනා මුඛයෙන් කථා කිරීම හෝ හැන්ස්ගේ සිත් නො ගත්තේ ය. එහෙත් මිනිහකුගේ පෙනීම ගැන ඔහුට කරන්ට දෙයක් නැතැ යි සිතා ගත් හැන්ස් දෙවැනි වරටත් සිදු වූ මේ හදිසි හමු වීම ගැන ස්තුතිමත් වෙමින් සතුටින් ම ඔහු පසු පස ගමන් කෙළේ ය.

# 3

## නැගෙනහිර දිග බලා!

හැන්ස් වැරදි හැඟීමක් ඇති නොකර තම අලුත් මිත්‍රයා සලසා දුන් ආගන්තුක සත්කාරය පිළිගත්තේ ය. මිත්‍රයා හැන්ස්ට කෑම බීම පමණක් නොව ඉතා ම අවශ්‍ය ව තුබුණ ඇඳුම් ද සපයා දුන්නේ ය. මේ සියල්ලට මත් වඩා තමා ඉතා ආසා කරන මුහුදු ගමනට අනුබල ද දුන්නේ ය. නැගෙනහිර දිග රටවල ගමනින් ඉතා ඉක්මනින් ධනවත් වන බවට අපූරු කතා හේ ඔහුට කීවේ ය. මේ ගමන්වලදී කරන්ට ඉඩ ලැබෙන වීර වික්‍රමාන්විත ක්‍රියාවන් ගැන කීවේ ය. එසේ ම මුහුදු ගමනේ ඇති අන්තරාය-දායක භයානක තත්වය ගැන ද නොකියා නොසිටීමට තරම් හේ කපට විය. එහෙත් ඒ අන්තරායයන් ධෛර්‍යවත් තරුණ-යකුට ජයගත නොහැකි තරමේ බරපතල ඒවා නොවේ යයි ද මිත්‍රයා හැන්ස්ට ඇහෙව්වේ ය. තවමත් හැන්ස්ගේ හිසේ රැව් දෙන ''ඉඟිලෙන අශ්වයා'' අවහන් හලේදී ඔහු ඇති කර ගත් අත්දැකීම, දෙඩමලු නැවියන්ගේ කතා, මුහුදු කොල්ලකාරයන්-ගේ ගීතය ආදිය නිසා නොවේ නම් ඔහුට අමාරුවක් නැතිව ම මේ මුහුදු ගමන පිළිබඳ කතාව සම්පූර්ණ කරගන්ට තිබිණි.

සතියක් සිය නිවසේ හැන්ස් රඳවා ගෙන හුන් මෙතෙම හැන්ස් රළු ජීවිතයට පුරුදු විය යුතු යයි ඔහු අනික් නිවාසයකට යැවූවේ ය. මේ ආත්ම-වාණිජයා මුහුදු ගමන් සඳහා දීමට මෙසේ සපයා ගත් තවත් ගැටවරයන් දොළහක් පමණ මේ නිවාසයේ සිටියෝ ය. කලකිරීමෙන් මඟ හැර නොයන සේ හොඳින් සලකනු ලැබූ මේ පුද්ගලයෝ විවිධ ජාතීන්ට අයත් වූහ. රැකීරක්ෂා නොමැති, මුරණ්ඩු ගති ඇති, මොවුහු යුරෝපයේ නොයෙකුත් දේශයන්හි සිට ඇම්ස්ටර්ඩෑම් කරා පැමිණියෝ වූහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ජර්මන් ජාතිකයන් වූ අතර ටික දෙනෙක් බැල්ජියම, පෝලන්තය, ඉතාලිය වැනි රටවලින් පැමිණියෝ වූහ. ඕලන්ද ජාතිකයකු ව සිටියේ හැන්ස් පමණකි. පිරිසේ බාල ම පුද්ගලයා වූයේ ද මොහු ම ය. හැන්ස් මුලදී මොවුන් හා සමාගමයට පැකිළුණි. නමුත් මේ සියලු දෙනා ම මෙහි සිටින්නේ එක ම අරමුණක් ඇති ව බවත් තමාත් දූන් නැවියකු වීමේ මගට බැස්සකු ව සිටින බවත් සලකා ඔවුන් හා එකමුතු විය.

නැගෙනහිර ඉන්දියා ඕලන්ද නැව් සමාගමට අයත් දුරු රට බලා යන නැව් පිටත් වන්නේ සාමාන්‍යයෙන් ජූනි, සැප්තැම්බර හා දෙසැම්බර මාසවලදී බව හැන්ස් දත්තේ ය. දෙසැම්බර

මාසයේ නැව් ගමනට තවත් මාස දෙකක් ඉදිරියට ඇති හෙයින් ඒ කාලය හැන්ස් ගෙවූවේ නැව් තොට පැත්තේ හැසිරීමෙනි. හේ ඉඳහිට කුඩා යාත්‍රාකරුවන්ගේ ආධාරයට ගියේ ය. එවැනි කිසිවක් කරන්ට නොවූ විට එහි ගරාදි වැටට හේත්තු වී මුහුද දෙස බලා සිටියේ ය.

එක් දිනක් හැන්ස් මෙසේ මුහුද දෙස බලා සිටින විට පියකරු පෙනුමක් ඇති වැදගත් විදියට හොඳින් ඇඳ පැලඳගත් එක්තරා මහතෙක් එහි පැමිණියේ ය. හේ කොළ පැහැති අත්දිග විලූද කබායක් හා කලිසම් මේස් සපත්තු ආදියෙන් උසස් ලෙස සැරසී සිටියේ ය. ඔහුගේ ගෙල වටේ වූ සුදු පළල් පටිය ගෙලට විශේෂ අලංකාරයක් දුන්නේ ය. උඩු රැවුල හා යටි රැවුල ද හැඩ වෙන්ට කොටට කපා තිබිණි. දික් ව එල්ලෙන්ට කපා තුබුණ හිස කෙස් වසා පැලඳගෙන සිටි පළල් තොප්පිය, පිහාටුවලින් අලංකාර කොට තිබිණ. නැව්තොට දෙස ඉතා සැලකිල්ලෙන් බලා සිටින හැන්ස් දුටු හෙතෙම එහි නැවතුණේ ය.

''මුහුද ගැන ලොකු සැලකිල්ලක් තියෙනවා වගෙයි ළමයා?'' හේ විමසුවේ ය.

''එහෙමයි මහත්මයා, මා බලාපොරොත්තු වෙනවා ළඟදී ම යාත්‍රා කරන්ට,'' හැන්ස් පිළිතුරු දුන්නේ ය.

''කොයි පැත්තට ද?'' මහතා සිනාසී විමසුවේ ය.

''ඉන්දීය සාගරයට.''

අමුත්තා බැම ඉහළ නැඟුවේ ය. සිහින් හුරුඑහන් බෑමක් කෙළේ ය. යම් කිසිවක් කියන්ට යන්නාක් මෙන් පෙනිණි. එහෙත් ඒ සමග ම හේ අදහස වෙනස් කර ගත්තාක් මෙන් හිස වනා හැන්ස් අතට රිදී කාසි කීපයක් දී යන්ට ගියේ ය.

ආත්ම-වාණිජයා තමාගේ මිනිස් රැළ නැගෙනහිර ඉන්දියා කාර්‍යාලය වෙත කැඳවා ගෙන ගිය දිනය පැමිණියේ ය. ඔවුහු එකිනෙකා අධිකාරි මණ්ඩලය වෙත කැඳවන ලදි. හැන්ස් අන්තිමයා හැටියට එහි සිටියේ මණ්ඩලය වෙත ගොස් සතුටු මුහුණින් පිට වී යන්නවුන් දුටුවේ ය. එයින් එක ම එක පුද්ගලයෙක් පමණක් අසභ්‍ය වචනයෙන් මණ්ඩලයට බැණ වදිමින් පිට ව ගියේ ය.

තමාට වාරයක් නො ඒදෝ යි සිතමින් එහි සිටි හැන්ස් අන්තිමට කැඳවන ලදි. හොඳට ඇඳ පැලඳ ගත් උදාර පෙනුමෙන් යුතු වෙළඳ කුමාරවරුන් ඉදිරියේ ඉතා සුළු පුද්ගලයකුගේ හැඟීම ඇති ව මැලවුණු මූහුණින් හැන්ස් එහි පෙනී සිටියේ ය.

''ඔබේ නම?'' ලේකම්වරයා විමසුවේ ය.

නැගෙනහිර දිග බලා!

''හැන්ස් වැන් ද මෙයර්.'' ආත්ම-වාණිජයා යෝජනා කළ බොරු නම නොකියා හැන්ස් තමාගේ නියම නම කීවේ ය.

''වයස කීය ද?''

''දහ අටයි.'' හැන්ස් තමාගේ නියම වයසට අවුරුදු හතරක් එකතු කොට කීවේ ය.

''ජාතිය?''

''ලන්දේසි.''

''මවුපියන්ගෙ කැමැත්ත ඇතුව ද ආවෙ?'' මණ්ඩලයේ අනික් සාමාජිකයෙක් ප්‍රශ්න කෙළේ ය.

මේ ප්‍රශ්නය නැගූ තැනැත්තා දෙස බැලූ හැන්ස්, ඒ කීප දිනකට පෙර රිදී කාසි කීපයක් දී ගිය අමුත්තා බව හැඳින ගත්තේ ය. මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට හැන්ස් මැළි කරන විට මණ්ඩලයේ සිටි අනික් තරබාරු සරුසාර පෙනුමැති සාමාජිකයෙක් නොඉවසිලිමත් ව, ''අප එතෙක් දුර යන්ට වුවමනා ද?'' විමසුවේ ය.

එහෙත් මුලින් ප්‍රශ්න කළ පුද්ගලයා ප්‍රශ්නයක් හැටියට ම නොවූවත් ''මෙතරම් අඩු වයසේදී මුහුදු යාත්‍රාවල යාමට අදහස් කිරීමේ හේතුව කුමක් ද? මුහුදු යාත්‍රාවල ගමනේ ඇති අන්තරාදායක තත්වය හොඳහැටි දන්නේ ද?'' ඇසුවේ ය.

''මට මතක ඇති කාලෙ ඉඳලා ම මගෙ හිතේ තුබුණ ලොකු ම ආසාවක් තමා අමුතු රටවල ඇවිදීමට යාම. කරුණාකර මා බඳවා ගන්ඩ. මම සමාගමට හිතවත් ව හොඳින් වැඩකරන්නම්.'' හැන්ස් කියා සිටියේ ය.

සාමාන්‍යයෙන් කාගේත් කැමැත්ත ලැබෙන බව පෙනී ගියේ ය.

එහෙත් ඔහුට හිතවත් ව කතා කළ වෙළඳා මේ කාරියේ ඇති දුෂ්කරතා විස්තර කොට දුන්නේ ය. මේ සේවයට බැඳීමේදී එකඟ විය යුතු කොන්දේසි පහද දුන්නේ ය. ''අපට අවසාන වචනයක් දෙන්ට ඉස්සර තවත් වරක් මේ ගැන හොඳින් කල්පනා කර බලන්ට නරක ද? නැත්නම් පසු තැවෙන්ට සිදු වෙන්ට බැරිකමක් නෑ. තව ම අඩු වයසෙ නිසා අවුරුදු කීපයක් ඉවසා ඉන්ට කැමති නැද්ද?'' වෙළෙඳා නැවතත් ඇසුවේ ය.

''බොහොම ස්තුතියි. මහත්මයාණනි, මා මේ ගැන අවසාන වශයෙන් සිතා ගෙන කලක් වෙනවා. මුහුදු යාත්‍රාවේ දුෂ්කරතා අන්තරාදායක දේ සියල්ලක් මා හොඳින් දන්නවා. ඒත් ඒ මොනවා ඇති වුණත් මා ඒ ගැන චෝදනා කරන්නෙ නෑ.'' හැන්ස් කීවේ ය.

''හොඳ අභිරියවන්ත ළමයකු වගෙයි කතා කෙළේ'' කියමින් මිත්‍රයාගේ ප්‍රශ්න කිරීම ගැන නොකැමති වූ තරබාරු වෙළෙන්ද හැන්ස්ගේ ඉල්ලීම අනුමත කෙළේ ය. හේ ඉතා තෘප්ත වූවකුගේ විලාසයෙන් තමාගේ රන් හෙප්පුව හැර එයින් දුම්කුඩු ටිකක් ඇඟිලි කෙළවරින් ගෙන නාසාපුට දෙකෙහි ම ළං කොට උරා රතු සේද අත්කඩකින් නාසය පිසදමා ගත්තේ ය. පරීක්ෂණය එතෙකින් කෙළවර විය. එළියට ගොස් අනික් පිරිසට එක් වන සේ හැන්ස්ට අණ කරන ලදි. අනතුරු ව කරන ලද වෛද්‍ය පරීක්ෂණයකින් පසු නැවත පසු දින පැමිණෙන සේ නියම කොට ඔවුහු යන්ට හරින ලදහ.

මෙදින ඔවුහු නැව් සමාගමේ ලේකම්වරයා වටේ සිටුවන ලදුව සමාගමේ නීතිරීති යටතේ අවංක වත් හිතවත් වත් සේවය කිරීමට එකඟ වන්නාහු දැයි තවත් වරක් ප්‍රශ්න කරන ලදී. කිසිවකුගෙනුත් විරුද්ධතාවක් ඉදිරිපත් නොවුණ හෙයින් හැම දෙනා ලවා ම දිවුරුම් ගෙන එකිනෙකාට කටයුතු පවරා දෙන ලදි. මේ පිරිසේ සමහරු යාත්‍රාකරුවන් මෙන් ද සමහරු හේවා හටයන් මෙන් ද තවත් සමහරු එතෙරදී ලිපිකරුවන් මෙන් ද සේවය කිරීමට තෝරා ගන්නා ලදහ.

සමාගමේ ප්‍රතිපත්ති කාටත් එක් වැනි විය. මෙසේ බඳවා ගන්නා ලද හැම සේවකයකු ම අඩු වශයෙන් අවුරුදු පහක කාලයක් සමාගම වෙනුවෙන් යාත්‍රාවල හෝ ගොඩබිමේ හෝ අවස්ථාවේ හැටියට සේවය කළ යුතු විය.

පෙරදිග බලා පිටත්ව යන 'ඒසියා' නම් නැවේ නැව් තට්ටුවේ අත්උදව් කරුවකු වශයෙන් කටයුතු කිරීමට හැන්ස්ට පැවරිණ. ඔහුගේ වේතනය මසකට සිලිම් දහයක් වන ඉතා සුළු එකකි. එහෙත් නැවේ කපිතාන් තැනට ගෙවන වේතනයේ හැටියට එතරම් ම නොසැලකිය යුතු එකකුත් නො වී ය. නැවේ කපිතාන්ට ගෙවන ලද්දේ මසකට පවුම් අටක් හෝ දහයක් පමණි. එහෙයින් හැම ජාතියකට ම අයත්, ජීවිතය එපාවූවන් පමණක් මේ නැව් සමාගම්වල සේවයට ඒම පුදුමයට කරුණක් නො වේ. මේ නැව්වල නාවුක පිරිස ප්‍රධාන වශයෙන් ලන්දේසීන්ගෙන් යුක්ත ය. ඔවුහු ඉතා හොඳ යාත්‍රාකරුවන් මෙන් ම යුද්ධ හේවායෝ ද වූහ. නැවේ යුද්ධ හේවායන්ගෙන් වැඩි කොටස ජර්මන් ජාතිකයෝ වූහ.

නැව් සේවයට මිනිසුන් භාර දී සති දෙකකට පසු ව ඔවුන් එහි කැඳවා ගෙන ආ වෙර්මාත් නැමති ආත්ම-වාණිජයා තමාගේ ගතමනාව සඳහා එහි එයි. මොහුට තමා ගෙන ආ එක මිනිහකුට සිලිම් තුන්සියය බැගින් හා ඒ එක එක සේවකයාගේ මාස දෙකක වේතනය ද ලැබේ. මොහු ගෙනා මිනිසුන් අතරෙන්

යම් කිසිවකු මේ ගමනේදී මළේ නම් ඒ නැනැත්තා වෙනුවෙන් ගෙවන ගතමනා සියල්ලකට මොහු අහිමි වේ.

නොගැඹුරු දිග බෝට්ටු තුනක නංවාගත් මේ පිරිස ඇම්ස්ටර්ඩෑම් නගරයේ සිට සැතපුම් පහළොවක් දුරින් පිහිටි ටෙක්සල් වරාය දක්වා ගෙන යන ලදි. නැගෙනහිර ඉන්දියාව බලා පිටත් වීමට සූදනම් ව තුබුණ නැව් පහක කුඩා කණ්ඩායමක් එහි විය. ඉංග්‍රීසි හා ලන්දේසි යුද්ධ හේවායෝ ද වෙළෙන්දෝ ද එහි රැඳී හුළං හොඳ වන තුරු බලා සිටියෝ ය. හැන්ස් 'ඒසියා' නැවට පත් කරන ලද අනික් පිරිසත් සමග ගොස් ඒ නැවට නැංගේ ය.

පසුව ද නැව් කාණ්ඩයේ අයිතිකරුවන් වූ ලන්දේසිහු අලංකාර කුඩා යාත්‍රාවකින් එහි පැමිණ එකිනෙක නැවට නැග නිලධාරීන්ට හා අනිකුත් සේවකයන්ට ද සුබ පතා සමු ගෙන ගියෝ ය. නැවේ හැම දෙනා ම පෙරෙට්ටුවකට කැඳවා මිනිසුන් සම්පූර්ණ දැයි පරීක්ෂා කරන ලදි. මේ නැවේ පිරිස වූකලි ප්‍රධාන වෙළඳ, නැවේ ප්‍රධානියා, පූජක තැන හා ඔහුගේ දරුවන් හතර දෙනා, එකසිය පනහක් යුද්ධ හේවායෝ, නැවේ යාන්ත්‍රික හමුදව යන පිරිස් අතර ඉතාම සුළු සේවකයන් වූ නැව පිස දැමීමට සිටි හැන්ස් ඇතුළු ගැටවරයන් නව දෙනා ද වූහ. ටොන් පන්සියයක් බර ඒ නැවේ සිටි මුළු සෙනඟ 297 දෙනෙකි.

1676 ජනවාරි 14 වැනිද අලුයම නැවේ අද්මිරාල් තැන කොඩිය හා පතාකාවන් ඇති ව ප්‍රධාන කුඹ ගස මුදුනෙහි ද, උප අද්මිරාල් තැන ඉදිරි කුඹය උඩ කොඩියක් ඇති ව ද හිඳ අනික් නැව්වලින් පිරිවරන ලද 'ඒසියා' නැව දියත් කරන ලදි.

දෙදිනක් මුහුදේ යාත්‍රා කළ පසු නැවේ සිටි ලොකු කුඩා සියලු දෙන සමාගමෙන් දෙන ලද තෑග්ගක් වශයෙන් ඕලන්ද කේජු පහ බැගින් ලැබූවෝ ය. නැවේ ප්‍රධානයා එහි සිටි සියලු නිලධාරීන් හා මිනිසුන් ද නැව් තට්ටුව උඩට කැඳවා ඔවුන් හැම දෙනා ම දෙකොටසකට වෙන් කොට ඒ එක එක කොටස පැය හතරක් බැගින් වැඩ කිරීමට නියම කෙළේ ය. නිතොරව ම මිනිහෙක් හෝ දෙන්නෙක් ප්‍රධාන කුඹ ගස උඩ නවත්වා තබන ලදහ.

මේ දිනවල හැන්ස් ඉතා වෙහෙසී වැඩ කෙළේ ය. නැව් තට්ටු පිරිසුදු කිරීම හැර කුඹ ගසට නැඟීම නැවියන්ට ආධාර දීම වැනි නැවියකු වන්නට පුහුණු වන්නකු විසින් කළ යුතු හැම දෙයක් ම කෙළේ ය. බොහෝ බැණුම් ඇසූ නමුත් හේ එසේ වැඩ කිරීමෙන් සතුටක් ලැබුවේ ය.

දිනක්, එක් කලහකාරී නැවියෙක්, තවමත් හොඳට වැඩ පුරුදු නැති හැන්ස්ට අරෝ කරන්ට විය. එවිට ඒ අසල වැඩ කරමින්

සිටි අනික් නැවියෙක් කෑ ගසා, ''ඒයි, උඹ දැන් ඔය ළමයා මරා-දනවා. ඔය ළමයා අත ඇරපන්,'' යයි කීවේ ය.

අනිකා මෙයට මැදිහත් වීමේ ප්‍රතිඵලය වූයේ බිම වැතිරී සිටි හැන්ස්ට ඉළ හරහා අර නැවියාගේ පයින් වේගවත් පා පහරක් වැදීම ය. ඒ පහර හැන්ස් මුලින් ලැබූ සියලු ම පහරවලට වඩා දරුණු විය. හැන්ස්ට හුස්මත් නැති විය.

මෙහිදී දුරින් සිට කතා කළ නැවියා මේ පහර දුන් නැවියා වෙත කඩා පැන්නේ ය. දෙදෙනා පොර බඳන අතර හැන්ස්ට පහර දුන් නැවියා තම හිණෙන් පිහිය ඇද අතට ගත්තේ ය. එහෙත් අනිකා පොර බද ඔහු අතින් පිහිය උදුරාගන්නවා සමග ම නැවේ රුවල් බාර මුලාදෑනියා එහි පැමිණ දෙදෙනා වෙන් කෙළේ ය.

පිහිය ඇදගෙන දබර කර ගැනීම ගැන විභාගයක් ඇති විය. මුලින් පිහිය ඇද ගත්තේ තමා නොව අනිකා යයි පිහිය ඇද නොගත් නැවියා දිවුරා කී නමුත් මුලාදෑනියා ඇසින් දුටු හැටියට පිහිය ඇද ගත්තේ මොහු ම යයි කියා සිටි හෙයින් ඔහුට දඬුවම් නියම විය. සාමාන්‍යයෙන් මෙවැනි වරදකට නැවකදී දෙන දඬුවම වන්නේ ප්‍රධාන කුඹ ගසේ ඉහළ සිට දියට පැන්න වීම වුව ද 'ඒසියා' නැවේ විනය නීති දැඩි වූ හෙයින් වරදකරු කුඹගස ළඟට ගෙන ගොස් එහී ඔහුගේ අත තබා අත සිදුරු වී කුඹයට ඇමිණී සිටින සේ 'බාබර්' ලූවා පිහියක් ඇන්න වී ය. තමා ම අත ඇද පිහිය ගළවා ගැනීමට තරම් ධෛර්‍යයක් එන තෙක් ඔහු එසේ සිටිය යුතු විය. මෙසේ කිරීමෙන් පිරිස විසිර ගියහ.

කිසිවකුත් පෙනෙන්ට නොසිටි වේලාවක් බලා හැන්ස් තම සගයා සිටි තැනට ගොස්, ''මම මේ පිහිය ගළවා දමන්ට ද?'' කියා තවමත් කඳුළු ගලන ඇසින් යුතු ව ඇසුවේ ය.

නැවියා හැන්ස් දෙස රවා බැලුවේ ය. ''යසයි, යසයි, උඹ ඇම්ස්ටර්ඩෑම් ලී මඩුවෙ බඩගින්නෙ හිටිය, එදා මගෙ යාළුවා නූනා නම්!'' හේ කීවේ ය. ''එදා මගෙ අවවාදෙ පිළිගෙන මේ අද ඉන්නා තැන නේ ද?'' මේ එදා තමාට මුදල් දී ගෙදර යාමට අවවාද කළ නැවියා බවට හැන්ස් ඔහු හැඳින්නේ මෙවිට ය. හේ මෙවිට රැවුලක් වවා ගෙන සිටියේ ය.

''මොකක් ද කීවෙ? මේ පිහිය ගළවලා දාන්ඩ! උඹ එහෙනම් ඉඳලා ඉවරයි. ළමයා, උඹ එහෙම දෙයක් කළොත් ලැබෙන දඬුවම තට්ටමේ හම ගැළවිලා යන තෙක් කඹපොටෙන් තළන එක යි.''

මෙසේ කී නැවියා වට පිට බලා කිසිවකුත් නොදුටු, ''එහෙනම් මෙහාට ළංවෙයන් මට උඹේ උරය අල්ලා ගන්ඩ ඔන්න

බලාගනිත් මින් ඉහත දැකලා නැති දෙයක්'' කියා, හේ හුස්ම අල්ලා දත්මිටි කාගෙන ඇමිණී තුවාලය අත පහළට ගස්සා ඇද්දේ ය. එයින් උඩු අතට හරවා තුවාලය පිහි තලයෙන් අතේ ඇඟිලි අතර දැල කැපී අත නිදහස් විය. ''හනික මෙතනින් පලයන්, කවුද එනවා,'' යයි හැන්ස්ට කී හෙතෙම ලේ ගැලීම රැඳවීමට අත තදින් මිරිකා ගෙන එයට බෙහෙත් කරවා ගැනීම සඳහා, නැවේ වෛද්‍යවරයාගේ සහායකයා වූ අර 'බාබර්' ම සොයා ගියේ ය.

ප්‍රංසය හා එංගලන්තය ද පසු වී ගියේ ය. දින ගණනක් යාත්‍රා කිරීමෙන් පසු ව නැව් කණ්ඩායම ස්පාඤ්ඤ මුහුදට සැපත් විය. මෙහි මුහුද ඉතා ගැඹුරු වූ හෙයින් එහි දිය කඳ නිල් පැහැයෙන් යුක්ත විය. මෙහිදී නැව් කණ්ඩායම විසිරී එක එක නැව එයට අයිති දිශාව බලා පිටත් වූවා ය. සමහර නැවක් බටහිර ඉන්දියාව බලා ගිය අතර තවත් සමහර නැවක් ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය හා ස්මිර්නා වැනි රටවල් බලා ගියා ය. 'ඒසියා' නැව හා ඒ සමග වූ 'ටිඩෝර්', 'කොර්ටගේන', 'ටෙර්නාත්' යන නැව් ද නැගෙනහිර දිග බලා ගමන් ගත්හ.

නැගෙනහිර ඉන්දියා දේශ බලා පිටත් ව යන මේ නැව් ටොන් 200 සිට 700 දක්වා බර ඇති ශක්තිමත් නැව් ය. දුනු හැඩයට බඳ ඇති බෙහෙවින් කැටයම් කළ උස් වූ අවරක් ඇති, පාලනය තරමක් අසීරු වූ මේ නැව්වල තුවක්කු තිහක් පමණ සවි කොට ඇත. තුවක්කු සඳහා සිදුරු කරන ලද නැව් බඳක් ද වෙයි. ඒ කාලයේ වෙළඳාම සඳහා යෑමට ඊමට මාස හයේ සිට නවයක පමණ කාලයක් ගත කරන වෙළඳ නාවුකයන්ට මුහුදු කොල්ල-කාරයන් සමග මෙන් ම තරහ වෙළඳ නැව් කණ්ඩායම් සමග ද සටන් කරන්ට සිදු වේ.

ඔවුන්ට ඉතා තද කුණාටුවලට මුහුණපාන්ට සිදු වේ. එසේ ම අසම්පූර්ණ උපකරණ ඇති ව ගල්පරවලින් ගහන මුහුදේ යාත්‍රාව ද දුෂ්කර වේ. නැව් දෙක තුනක් එකතුව යන මෙවැනි ගමනකදී එක නැවකට හෝ තදබල අලාභ හානියක් සිදු නොවී ආපසු එන්ට ලැබීම කලාතුරකින් සිදුවන්නකි.

සතුරු නැව් හමුදවන් කෙරෙන් විය හැකි ව තුබූ අන්තරාය මග හැරී ගියෙන් 'ඒසියා' නැවේ පිරිස සාමාන්‍ය කටයුතුවල නිරත වූහ. ඔවුන්ගේ ආහාර කොටස වශයෙන් සතියකට එක් අයකුට විස්කෝතු රාත්තල් තුනක්, විනාකිරි පයින්ට් බාගයක්, ලිස්බන් සලාද තෙල් පයින්ට් කාලක් හා දිනපතා බ්‍රැන්ඩි පයින්ට් කාලක් බැගින් ද ලැබුණේ ය. සතියකට දින තුනක් මස් බෙදා දෙනු ලැබී ය. ලුණු දැමූ හරක් මස් හෝ ඌරු මස් රාත්තල් තුනක් බැගින් එසේ දුන් අතර සමහර දිනකට ඔවුනු

මාලු හා නැම්බූ බෝංචි ඇට විනාකිරි හෝ සලාද තෙල් හෝ සමග කෑවෝ ය.

"ඒසියා" නැව හා ඒ කණ්ඩායමේ අනික් නැව් ද හොඳ හුළං අනුව මාසයක් ම යාත්‍රාවේ යෙදුණාහ. මේ කාලය තුළ හැන්ස් අනික් කිසි නැවියකුට නොදෙවෙනි සේ හුරුබුහුටි නැවියකු මෙන් වැඩ කෙළේ ය. ඒ කාරියට ලබා උපන් කෙනකු මෙන් හේ මුහුදු ජීවිතයට හුරු විය. හැන්ස් තමා නිසා දඬුවම් ලැබූ ෆ්‍රිට්ස් නම් නැවියා හා දැඩි මිතුරු දමක් ඇති කර ගත්තේ ය. දෙදෙනා ම එක ම යාමයට වැඩට නියම වී සිටි හෙයින් ඔවුන්ට තමන්ගේ විවේක කාලය එක් ව ගත කිරීමට ඉඩ ලැබී තුබුණේ ය. හැන්දෑවේ යාච්ඤාවෙන් පසු ව සීනුව නාද කොට කැඳවනු ලැබූ හැම දෙන ම තම තමන්ගේ බ්‍රැණ්ඩි කොටස හෝ වයින් කොටස හෝ ලැබුවෝ ය. වරද කළවුන්ට මෙය නො ලැබේ. බ්‍රැණ්ඩි ගැනීමෙන් පසු ව තම පයිප්පයෙහි දුම්කොළ පුරවා ගෙන ඒ සඳහා ම තබා තුබුණ දැල්වෙන කඹපොටෙන් එය දල්වා ගන්නා ෆ්‍රිට්ස් නිශ්චල තැනකට වී තමාගේ කතාවන්ගෙන් හැන්ස් ප්‍රීතිමත් කරවයි.

ෆ්‍රිට්ස්, අව්කැමෙන් තඹවන් වූ, ඇඟෙහි රූප කොටන ලද, කනෙහි මුදු ලන ලද, සාමාන්‍ය නැවියකු වුව ද මුහුදු සේවයට බැඳෙන්ට පෙර එක්තරා ශාස්ත්‍රවන්තයෙකි, උගතෙකි. ඔහුගේ දැනීම පුස්තකාලයක් බඳු ය. එයින් හැන්ස් වෙනුවෙන් එළියට ගන්නා ලද්දේ අපූර්ව සිද්ධීන්ගෙන් යුත් රසවත් කථාවන් පමණකි. හෙතෙම භූමිශාස්ත්‍රය ඉතා හොඳින් දනී. එසේ ම මොහු ඉතා හොඳ ඉතිහාසඥයෙකි.

මොහුගේ දැනීම විවිධ ය. හැන්ස් පාසැලේදී ඉගෙන ගත් කිසිවක් මොහුගේ දැනීමට සමාන නැත. ෆ්‍රිට්ස්, දෙනෙත් විදහා ආසාවෙන් කන් දී සිටින හැන්ස්ගේ සිතුවිලිවලට රූපයත් ජීවයත් දුන්නේ ය. ඔහු උද්‍යොගිමත් කෙළේ ය.

"ඔබ මේ තරම් උගත් කෙනකුත් වෙලා, මේ වයස හතළිහේදීත් නිකම් නැවියකුට වඩා උසස් තැනක් නොලබා ඉන්නෙ?" වරක් හැන්ස් ෆ්‍රිට්ස්ගෙන් විමසුවේ ය.

"ආ! ඒක මගෙ ම තියන නොඉවසිලි ගතිය නිසා, වුවමනා වෙලාවෙදී අණට නොනැමෙන ගතිය නිසා--ඔබට ම පෙනෙන්ට ඇති ඒ මගෙ ගතිය. මුදු ජීවිතය තුච්ඡවකට ගණන් නොගන්නා මේ කාලෙ මා මෙතෙක් කල් ජීවත් ව ඉඳීම මගෙ වාසනාවක් හැටියට මම සලකනවා. මේ මුදු ගමන්වලින් එක ම ගමනක් වත් නෑ මා කවුරුත් හරි එක්ක අරගල කර ගෙන දඬුවම් නොලබාපු එකක්. එහෙම ඒවා කරලා මිනිසුන්ට දියුණුවට යන්ට බැහැ. මෙතන හැන්ස් එක්ක දම් ඇදීම මට විනෝදයක්. ඒත්

කාඩ් කුට්ටමෙන් නැත්නම් දදුකැටෙන් කරන වෙනත් සෙල්ලම් තරමට විනෝද නැහැ. හැබැයි අහු උණොත් මොකද වෙන්නෙ! කුරුසෙ හිටින්ඩ අත් දෙක දිග ඇරලා කුඹ ගහේ බැඳලා තැළුම් කන්ට වීමයි. හැන්ස් දුටුවා ද මගෙ පිටේ තියන ලොකු තුවාල කැලැල්? දුටුවෙ නැද්ද?''

''ඔව්, මම දුටුවා,'' හැන්ස් අනුකම්පා වන හඬකින් කීවේ ය.

''ඔයිටත් වඩා දරුණු තුවාල කැලැල් මට තියනවා. වරක් මම නැවේ ප්‍රධානියකුට පහර දුන්නා. ඒ මිනිහා හරිම කරදර කාරයෙක්. මේ වරදට මට දුන්නෙ නැවකදි නියම කරන දඬුවම් වලින් දරුණු ම දඬුවමයි. මා කඹයකින් ගැටගහලා මුහුදට විසි කළා. විසි කරලා මට හුස්මක් ගන්ටවත් ඉඩක් නොදී ඒ එක්ක ම නැව්බඳට යටින් අනික් පැත්තෙන් ඇදලා ගත්තා. මෙවෙලෙ මම පුළුවන් තරම යටට කිමිදුණා, නැව් බඳේ බැඳී ඉන්නා යාත්‍රා බෙල්ලන්ගෙන් බේරෙන්ට; වැදුණොත් හෙම පිට පළාගෙන යනවා. ඉතින් ඒ ගමන නැවට එනවාත් එක්ක ම ආයෙ ගමනක් මුහුදට විසි කරලා අර වගේ අනික් අතින් ඇද ගත්තා. මේ විදියට තුන්වරක්—මා ගොඩට ගනිද්දී ඇඟ නිල්වෙලා ලේ ගලනවා. නිකම් පාන්කඩයක් වාගෙ. ඇගේ පණ කියලා දෙයක් නෑ. මගෙ වාසනාවකට කඹ අල්ලා ගෙන සිටි අය මට පුළුවන් තරම බුරුල දුන්නා. නැත්නම් මටත් වෙන්නෙ මේකෙ හිටිය අර එක අසරණයකුට වෙච්ච හරිය ම තමයි. ඒ මිනිහා නම් 'මාස්ටර්' අධිෂ්ඨාන කරගන ම හිටියෙ මරන්ටයි. ඉතින් මිනිහා දියට දමලා නැව් කඳේ හැපෙන්ට ඇදලා ඔළුව පොඩි කර දැමුවා. ඔන්න, හැන්ස්, ඕක ඉගෙන ගන්ඩ හොඳ පාඩමක්. කොයි ම වේලාවකදිවත් නිලධාරියකු එක්ක කේන්ති ගන්ඩ එපා.''

හැන්ස් ටික වේලාවක් නිශ්ශබ්ද ව සිට කතා කෙළේ ය. ''ඒත් මට පේන්නෙ ෆ්‍රිට්ස් මේ ඉන්න තත්වය ගැන සන්තෝස වෙනවා වගෙයි.''

බෙලිකටු වැනි නොදියුණු මුහුදු යාත්‍රාවල නැගී දීර්ඝ සමුද්‍ර යාත්‍රාවන්හි යෙදුණු වීරවරයන් පිළිබඳ ඉතිහාසය හැන්ස්, ෆ්‍රිට්ස්ගෙන් උගත්තේ ය. එකල යාත්‍රාවලට මහ මුහුදේදී මග පෙන්වීම සඳහා දියුණු යාන්ත්‍රික උපකරණ නො වී ය. අක්ෂාංශක මානයට උපකාර වන සෙක්ස් තන්තුව (sextant) නම් යන්ත්‍රය 1730 වනතුරු නිපැද වී නොතිබුණු හෙයින් එකල ඒ සඳහා භාවිත වූයේ හරස් පටිය (cross staff) හා තුරු මාලිමාව (astrolabe) නමින් හැඳින්වුණු අසම්පූර්ණ උපකරණයන් ය. දේශාංශක තේරුම් ගැනීම කල්පනයෙන් ම කළ යුතු දෙයක් විය. තාරකා ශාස්ත්‍රය ද මෙකල පැවතියේ ළදරු අවස්ථාවෙහි විය.

නාවික කටයුතු හා වෙළඳ කටයුතු ද අතින් අතික් ජාතීන් අතර ඕලන්දය වඩා උසස් තැනක් ගෙන සිටින සැටි ෆ්‍රිට්ස්, හැන්ස්ට කියා දුන්නේ ය. සම්පතින් පිරුණු යුරෝපා රටවල් අතරෙන් ගලා එන මහා ගංගා කීපයක මුවදෙර පිහිටි ඕලන්දයේ වරායවල් ඒ රටවල උපදින ද්‍රව්‍යයන් හුවමාරු කරගන්නා මහ වෙළඳ පොළවල් වූයේ ය. ලෝකයේ වෙළඳාම පිළිබඳ කටයුතු අතින් ලන්දේසීහු පෘතුගීසීන් අභිභවා සිටියහ.

''දැන් ඔබත් මාත් යෙදී ඉන්නා මේ නැගෙනහිර ඉන්දියා වෙළඳ ගමන අපේ වෙළඳ කටයුතුවල දියුණුව පෙන්වන්නක්. මේ තත්වය කොතෙක් කල් පවතී දැයි කිසිවකුටත් කීම අසීරුයි. අනික් ජාතීන්ගෙ—විශේෂයෙන් ඉංග්‍රීසින්ගෙ නැව් මේ මුහුදුවල වැඩි වැඩියෙන් දකින්ට ලැබෙනවා. ඔවුන් වෙළඳාමෙන් පමණක් තෘප්ත වෙනවා නම් හැම අතින් ම හොඳ යි; ඒත් වෙළඳාමෙන් යුද කලහ ඇති වෙනවා. ලබාගන්ට දුෂ්කර දේවල් ගබඩා කරන්ට උත්සාහ කරන මේ මිනිස්සු මොන තරම මෝඩයෝ ද? ඊටත් වඩා මොනවා ද මේ කුළුබඩු—කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි—වගේ දේවල්? අපේ රටේ විශාල වශයෙන් ඇති එදිනෙදා ජීවිතයට අවශ්‍ය දේවලට සමාන කරන කොට ඉතා සුළු දේවල්. ඒත් යුරෝපෙදි ඒවායේ ඇති වටිනාකම? ඉතින් මේ තත්වය මෙහෙම තියන කල් ධනවත් වෙළඳුන්ට ඔවුන්ගේ මේ කබල් යාත්‍රාවල ගමනට ඇති තරම, ජීවිතේ ගැන නොතකන එඩිතර මිනිසුන් සොයා ගන්ට පුළුවනි. හැබැයි, එක වරක් මේ මුදු-උණ හැදුණොත්, ගොඩබිම ජීවිතේ මොකක් ද, ඒක නිකං නෝන්ජල් එකක් වෙනවා—සමහර විට අන්තිමට මූදට ම තමා ජීවිතේ කැප වෙන්නෙ. දැන් ඉතින් මේ කතාව ඇති. මේ හොඳ කාල ගුණය තියන වෙලාවෙ අපි ඒකෙ රස විඳිමු. බලමු මේ නැවේ ලස්සණ. ඔක්කොම රුවල් ඇදලා; දිය රළ පිට නටන අපූරුව. සිහින් හඬින් හඬන ඇගේ බඳ මුහුදු ආදරවන්තයාට කොඳුරන කෙඳිරිල්ලක් වගේ. හිතට ගන්ඩ හොඳයි හැන්ස්, අපට මේ ගමනෙ තාම නැහැ ලොකු කරදරයකට මුහුණ පාන්ඩ උණේ. ඒත් කාට කියන්ට පුළුවන් ද මේ ගමන ඉවර කරන්ට කලින් අපට මොන මොන අතවරයන්ට මූණ දෙන්ට වෙයි ද කියලා?''

පෙබරවාරි 24 වැනිදා වන විට ශීත කාලගුණය මගහැරී ගොස් තුබුණේ ය. නැවේ උඩ තට්ටුවේ ඇන්දට ඇළ වී මුහුද දෙස බලාගත් හැන්ස් ද ෆ්‍රිට්ස් ද පියාඹන මසුන් දෙස බලා සිටියෝ ය. දියෙන් උඩට පියාසර කළ මේ මස්සු තුවක්කුවක වෙඩිල්ලක් වදින තරමේ දුරක් ඉගිලී ගොස් පියාපත් තෙමා ගැනීමට නැවතත් දියට බැස්සාහ. තමන් අල්ලා කෑමට එන තල්මසුන්

මුහුදු උෟරන් වැනි මහ මසුන්ගෙන් බේරීමට අහසට නගින මේ මස්සු එසේ කිරීමෙන් තමන් අල්ලා ගැනීමට රැක සිටින ලිහිණියන්ට ගොදුරු වෙති.

කැනරී දූපත්හි ටෙනරිෆ් පර්වතය පසුබිම කොට ගෙන නැව් දෙකක් පදවා එන බව පෙනෙන්ට විය. ඒවායේ කුඹගස් මත ඕලන්ද දද පතාක ලෙල දුන් නමුත් අපේ අද්මිරාල් තැන එය විශ්වාස නො කරයි. මෙය තුර්කි මුහුදු කොල්ලකාරයන්ගේ තිප්පලක් වූ හෙයිනි. පැවැත්වුණු යුද්ධ මණ්ඩල සාකච්ඡාවකින් පසු ව මේ නැව් වඩා හොඳින් බලා ගැනීමට නැව එදෙසට පදවන ලදි. සැකය ස්ථිර විය. සටනට සැරසිණ.

හැන්දෑව වන විට සතුරු නැව් ඔවුන්ට සමීප වූහ. එහෙත් සතුරෝ වෙඩිල්ලක් වදින තරමට ළං නො වූහ. මුළු රෑ කාලය තුළ ම ඔවුහු දැඩි පරීක්ෂාවෙන් සිටියහ.

පසුව ද වයඹ දෙසට හැමූ තද සුළං වේගයකින් ඔවුහු තුර්කි කොල්ලකාරයන් කෙරෙන් දුරට ගසා ගෙන යනු ලැබූහ. එහෙත් ඊට පසුව ද අනික් නැව් කෙරෙන් වෙන් ව තනිව සිටි 'ඒසියා' නැවට එක් තුර්කි යාත්‍රාවක් දක්නට ලැබිණ. 'ඒසියා' නැවේ 'මාස්ටර්' ව සිටි හොඳ මුහුදු යුද්ධකාරයකු වූ වැන්ඩර් වූට්ස්ටන්, තුර්කි යාත්‍රාව පරදවා තමාට යාත්‍රා කළ හැකි නොවන බව ප්‍රත්‍යක්ෂ කෙළේ නැවේ සියලු ම රුවල් බා එඩිතර ලෙස සටනට සූදනම් විය. ස්වකීය යාත්‍රාවේ ලන්දේසි කොඩිය නංවා ගත් තුර්කි යාත්‍රිකයෝ හැකි ඉක්මනින් නැවට ළං ව ආවෝ ය. මිත්‍ර බවක් අඟවා ලන්දේසි භාෂාවෙන් මේ කවර නැවක් ද? කොහේ යන ගමනක් ද? ආදිය විමසීමට ද්‍රෝහී චරපුරුෂයෙක් තුර්කි නැවෙන් යෙදවිණ. 'මාස්ටර්' වෙඩි තබවු යයි වෙඩි-කාරයන්ට අණ කෙළේ ය. නැවේ පහත මාලයෙන් නිකුත් වූ වෙඩි මුරයෙන් සතුරා දරුණු ලෙස බැට කෑවේ ය. යාත්‍රාවට වූ තුවාල බලවත් වූයෙන් ඒවා අලුත්වැඩියා කර ගැනීමට ඔවුහු වහ වහා පසු බැස්සෝ ය.

එහෙත් එතරම් බැට කා ගිය ඔවුහු පසුව ද උදයේ නැවතත් නැව කරා ආවෝ ය. මේ වර ඔවුහු බලෙන් නැවට නැග හදිසි වේගවත් පහර දීමකින් නැව කොල්ලකෑමට ඉටා ගෙන එන සේ පෙනිණි.

ඔවුන්ගේ පැමිණීමත් සමග ම පටන්ගත් සටන මුළු දවස තිස්සේ ම පැවතිණ. ඉතා දක්ෂ ලෙස නැව් හසුරුවා ගනිමින් දෙපක්ෂය ළං ළංව සටන් කළෝ ය. තුර්කි නැව 'ඒසියා' නැවට ළං වූ විට එහි සිටි, ඇඟලුම් නැති හැඩිදැඩි ව වැඩුණ කොල්ල-කාරයෝ මේ නැවට පැන පහර දෙන්ට වූහ. පළල් කඩු කටින්

ඩැහැ ගනිමින් අත් පා නිදහස් කොට ගෙන නැවේ යොත් කැරලි අල්ලා ගෙන මෙහි නැග ගත් ඔවුහු ලිස්සන නැව් තට්ටුව මත බිහිසුණු සටනක යෙදුණෝ ය. තුර්කි කොල්ලකාරයන් ජීවිතාශාවෙන් තොර ව එඩිතර ලෙස පහර දුන් අතර ලන්දේසීහු ද දක්ෂ ලෙස පහර වළකා සටන් කළෝ ය. දෙදෙනකු පොර වැටුණු බොහෝ අවස්ථාවල එකකු මියන තුරු සටන පැවතිණ. ප්‍රතිමල්ලවයෝ ඉතා තියුණු ලෙස එකිනෙකා ප්‍රවේසම්වෙමින් ලැබිය හැකි හැම ආවරණයක ම පිහිට ලබමින් සටන ගෙන ගියෝ ය. සටනින් මියන තුර්කියන්ගේ කෙඳිරියත් සමග අල්ලාගේ නම ද කියවිණි.

තුවාල වූ වම් අත්ල තවමත් හොඳින් සුව වී නොතිබුණ ද සටන් පෙරමුණෙහි වූයේ ෆ්‍රිට්ස් ය. හේ එක සතුරකු මැරූ කෙණෙහි ම අනිකකු කරා කඩා පැන්නේ ය. ඔහුගේ අචල ධෛර්‍යයෙන් හා අපූරු යුද සරඹයෙන් ද ඔද ගැන්වුණ හැන්ස් නිතොර ව ම ඔහු පසෙක සිටියේ ය. ෆ්‍රිට්ස් දෙතුන් දෙනකුට මැදි වී සිටියත් කොතරම් දුෂ්කර සටනෙක යෙදී සිටියත් නිතොර ව ම හැන්ස් දෙස නෙත් යොමා සිටියේ ය. ප්‍රවේසම් විය යුතු තැන ඔහුට කෑ ගැවේ ය. ඔහු අමාරුවේ වැටෙන්ට ගිය හැම විටක ම ඔහුගේ ආධාරයට පැන ආවේ ය. වඩා හැඩි දැඩි සතුරන්ගෙන් ඔහු ආරක්ෂා කෙළේ ය.

ෆ්‍රිට්ස්ගේ ආදර්ශය අනුව ම ගිය හැන්ස් තමා ද ෆ්‍රිට්ස්ගේ ආධාරයට සිටියේ ය. ඔහුගේ පිටු පස ආරක්ෂා කෙළේ ය. එසේ කිරීමෙන් දුෂ්කර අවස්ථා කීපයකින් ම ෆ්‍රිට්ස් බේරා ගත්තේ ය. මොවුහු දෙදෙනා ම තුවාල ලැබූහ. එහෙත් සටන අවසානය තෙක් ගෙන යාමට ඒ තුවාල ඔවුන්ට බාධාවක් නො වී ය.

අවසානයේ තුර්කින්ට ම සටන එපා විය. අවසාන මහා ප්‍රහාරයකින් පසු ඔවුහු තමන්ගේ නැව මුදා නිදහස් කර ගත්හ. ආපසු යාමට තරම ශක්තිය ඇත්තෝ එහි පැන ගත්හ. අනෙක් සමහරෙක් අධිකව ලේ ගැලීම නිසා ශක්ති මඳ ව මුහුදට ඇද වැටුණෝ ය. අඳුරට මුවහ වී ඔවුහු පලා ගියෝ ය.

'ඒසියා' නැවේ භටයෝ ජයග්‍රාහක ඝෝෂාවක් නැඟුවෝ ය. නැවේ යුද්ධ භටයන් හා නැවියන් ගණනාවක් මැරී සිටියහ. එමෙන් දෙගුණයක් තුවාල ලබා සිටියෝ ය.

ෆ්‍රිට්ස්, හැන්ස්ගේ තුවාල පරීක්ෂා කොට ඔහු දෙස ආඩම්බරයෙන් බලා ඔහුගේ උරයට අත ගසා "හැන්ස්, උඹ නම් හරි ම දක්ෂ උපන් යුද්ධ කාමියෙක්," යයි ප්‍රශංසා කරන විට හැන්ස් අභිමානයෙන් රතු වී ගියේ ය. තුවාලවලට බෙහෙත් ලා ගැනීමට

පෙළ සැදී එහි සිටි පළපුරුදු භටයෝ කීප දෙනෙක් ම ග්‍රිට්ස්ගේ කීම අනුමත කරමින් හිස් සැලුවෝ ය.

පසුව ද උදයේ නැවේ පූජක තැන තම පිරිස දරුණු සතුරන්-ගෙන් ගළවා දීමේ දේව අනුකම්පාව ගැන දෙවියන්ට ස්තුති කර දේශනාවක් පැවැත්තුවේ ය. නැවේ 'මාස්ටර්' සටනේදී දක් වූ එඩිතර භාවය ගැන මිනිසුන්ට ස්තුති කොට හැම කෙනකුට ම ස්පාඤ්ඤ වයින් බෝතලයක් බැගින් දීමට අණ කෙළේ ය.

මෙයින් දෙදිනක් පසුවනවාත් සමග මහ හඬින් හමා ආ සුළඟක් නැවට බලවත් සේ පීඩා කරන්නට විය. පසුව භයානක මහා කුණාටුවක් බවට පෙරළුණ මේ සුළඟ නොකඩවා දහඅට දිනක් පැවතිණ. කීප වතාවවක් ම නැව විනාශය කරා ළං ව සිටි නමුත් යම්තම් බේරී ගැනීමට පුළුවන් විය.

අන්තිමට කුණාටුව සන්හිඳී අවට පරීක්ෂා කරන්ට ඉඩ ලැබුණ විට ඔවුන්ට පෙනී ගියේ තමන් පෘථිවියේ විෂුව රේඛාවෙන් එපිටට පාවී සිටින බව ය.

මෙහිදී ඔවුන්ට අත් දකින්ට ලැබුණේ චණ්ඩ මුහුදට ඉඳුරා ම වෙනස් තත්වයක් ය. මෙහි මුහුද සම්පූර්ණයෙන් ම නිශ්චල විය. භයානක කමින් චණ්ඩ මුහුදකට වඩා අඩු තත්වයක් නිශ්චල මුහුදේ නො වෙයි. විදුරු තලයක් මෙන් වූ නිශ්චල මුහුදේ දැඩි හිරු රැස් කමින් 'ඒසියා' නැව නොසෙල් වී දස දිනක් මුළුල්ලේ එක තැන ම සිටියා ය.

මේ වන විට නැව දියත් කොට දෙමසක් ගත වී තිබිණ. මිනිසුන්ගේ ප්‍රයෝජනයට නැවේ ගෙනා කේජු, දුම්කොළ හා බ්‍රැණ්ඩි ද නිමා වී තිබිණ. ඔවුන්ට ආහාර වශයෙන් ලැබුණේ කරදිය මෙන් ලුණෙන් තිත්ත වූ බේකන් හා අඩක් තැම්බූ මෑ ඇටත් පල් වතුර සුළු ප්‍රමාණයකුත් පමණකි. උෂ්ණය දින-පතා ම අධික අධික ව බලපවත්වන්ට විය. මුහුදු ආහාරයට නොපුරුදු මිනිස්සු උදර රෝග ලේ රෝග සමේ රෝග ආදියෙන් පීඩිත වන්ට වූහ. එපමණක් නොව තම ජීවිතයෙන් බාගයක් ම මුහුදට කැප කළ පළපුරුදුකාරයෝත් අසනීපවලට භාජන වූහ. නැවේ වම් පැත්ත ගිලන් හලක් බවට පෙරළිණි. මේ අතර කරුණු වඩාත් බරපතල වීමට හේතු වූ නොපුරුදු රෝගයකින් මිනිස්සු පෙළෙන්ට පටන් ගත්හ. සමහර කෙනෙක් සිහිවිකල ව ගියාහ.

එක් දිනක් තුළ නැවේ පූජක තැන හා භටයෝ සිවු දෙනෙක් මිය ගියාහ. තවත් භටයෝ දෙදෙනෙක් දැඩි උෂ්ණයෙන් වියරු ව ගියාහු මුහුදට පැන්නෝ ය. පිහිනීමේ දක්ෂයන් වහා පැන ඔවුන්

දෙදෙනා ආපසු නැවට නගා ගත් නමුත් එයින් එකෙක් එදා රෑ ම ගෙල වැළලාගෙන මිය ගියේ ය. අනිකා ද දින කීපයකින් මිය ගියේ ය.

තමන්ගේ දිය සලාකය ඔට්ටු අල්ලා දූ කෙළ පැරදුණු එක් සොල්දාදුවෙක් සිහි විකල් බවට පත් විය. පිට පිට තෙදිනක් ඇතුළත පූජක තැනගේ දරුවන් සිවු දෙනාගේ හා තවත් මිනිසුන් ගණනාවකගේ මළ සිරුරු මුහුදට විසි කිරීමට සිදු විය. ඊ ළඟ සතියේදී තවත් තිස් හතර දෙනෙක් මිය ගියහ.

නැව සමුද්‍රයේ නිර්වාත ප්‍රදේශයේ නැවතී තුබුණු නව දින ඇතුළත හැට හතර දෙනකුගේ ජීවිත විනාශ වී ගියේ ය. කෙනකු මිය ගිය විට මළ සිරුර කඩක ඔතා මසා උදේ හෝ හවස දේව යාච්ඤාවෙන් පසු ව ගීතිකා කියා මුහුදට හෙළනු ලැබී ය. මළ සිරුර ලෑල්ලක තබා පයට කාලතුවක්කු උණ්ඩ දෙකක් ද බැඳ දියට දැමීමේ චාරිත්‍රයක් වූ නමුත් අවශ්‍ය ව තුබුණු වෙඩි උණ්ඩ නාස්තියක් මෙයින් වන හෙයින් ඒ සිරිත අත්හැර දමන ලදි.

මේ කාලය තුළ නායක මෝරා පිරිවරා ගත් දැතිමෝරු රංචු රංචු නැව වටේ තුඩු දෙන්ට වූහ. මරණය පිළිබඳ සිතුවිලි බියකරු සිහිනයක් මෙන් මිනිසුන් වෙළා ගෙන සිටියේ විය. බීමට තුබුණු දිය කෙළවර වීමට ළංව තිබිණ. මිනිසුන්ගේ දිවි පිපාසය නිසා එළී තිබිණ. ජීවත් වීමේ බලාපොරොත්තුවක් කිසිවකු කෙරෙහිත් නො වී ය.

ෆ්‍රිට්ස් නිතොරව ම හැන්ස් ගැන සැලකිලිමත් ව සිටි නමුත් ඔහුගේ තත්වය ද අවදානම් වී ය. දිනක් ෆ්‍රිට්ස් තම වැඩ වාරය සඳහා ගොස් සිටියේ ය. පැය හතරකට පසු ව සේවාව නිම වී ඔහු පැමිණෙන විට ඔහුට දක්නට ලැබුණේ රුවල් තනන්නා විසින් කඩක ලා මසනු ලබන හැන්ස්ගේ මළ සිරුර ය.

''ඔච්චර තදට ඔය ළමයා අකුළන්ට එපා, කෝ, මට; මම ඒක කරන්නම්,'' යයි හේ ඒ මිනිසා පසෙකට තල්ලු කෙළේ ය.

''දැන් කොහොම තදට ඇකුළුවත් මොක ද, මැරිලා දර දණ්ඩක් වගේ,'' යයි මිනිසා කෙඳුරුවේ ය.

මිනිසාට පහර දී එළවා දැමීමට තම සිත තුළ ඇති වූ දැඩි වේගය මැඩ පවත්වා ගනිමින් ෆ්‍රිට්ස් එතැන නැමී හිඳගෙන හැන්ස්ගේ හිස පිරිමදින්ට විය. ''අනේ, මගෙ අසරණ හිතවතා,'' හේ සෙමින් කීවේ ය.

හැන්ස් ඇස් හැරියේ ය. එහි මහත් කලබලයක් ඇති විය. එහිදී කථා කළ එකෙක්, ''තව කාලෙ තියෙනවා. තවත් ටික

වෙලාවක් ඇහැ පියාගෙන හිටියා නම් එයත් ගියා තමා,'' යයි කීවේ ය.

ප්‍රධාන වෙළඳා එහි පැමිණ හැන්ස්ට වයින් වීදුරුවක් බීමට දුන්නේ ය. මෙයින් හේ ප්‍රාණවත් විය. ක්‍රමයෙන් හැන්ස් සුවපත් විය.

සුළං පොදක් නැතිව මෙසේ සමකය ආසන්නයේ සිටි දහවන දින කරුණා දෙව්දුවගේ අත්තටුවෙන් සැලුණ පවනක් මෙන් සුළඟක් හමා ආවේ ය. වැරුණු මුහුණු බලාපොරොත්තුවකින් උදම් විය. නැවේ මහ රුවල නැංවීමට තරම් සැහෙන නිරෝගී පිරිසක් නොවූ හෙයින් කුඩා රුවල් නංවා ගත් ඔවුහු ඒ භයානක මාර මුඛයෙන් ඉවතට සෙමින් යාත්‍රා කළෝ ය.

ආහාරයට අලුත් මසක් නැතිව හාමතේ සිටි ෆ්‍රිට්ස් ඇතුළු තවත් කීප දෙනෙක් මසකු අල්ලා ගැනීමෙ අවස්ථාව ඇති සේ දැක ලුණු ඌරු මස් කැබෙල්ලක බිලියක් යොද මුහුදට දැමුවෝ ය. එය දියට වැටී නොපෙනී යනවාත් සමග ම එක් මෝරෙක් ඇම ගිල්ලේ ය. මහත් උත්සාහයකින් මොවුහු මේ මහා මත්ස්‍යයා නැවට ඔසවා ගත්හ. බලාපොරොත්තුවෙන් අස්-වැසුම් නැති නැවියන් එහි වට කොට බලා සිටියදී නැවේ අරක්කැමියා මසාගේ බඩ පැළුවේ ය. මසාගේ බඩ ඇතුළේ නොදිරූ මිනිස් මළ සිරුරක් විය. එය නැවේ ශල්‍ය වෛද්‍යවරයා ගේ මළ සිරුර බව හඳුනා ගැනීම අපහසු නො වී ය. දර්ශනය ඉතා පිළිකුල් උපදවන්නක් වූ හෙයින් එක මිනිහෙක් හෝ මෙ මෝරාගේ මස් කනු රිසි නො වී ය. එහෙයින් ඔවුහු මසාත් මළකඳත් ආපසු මුහුදට හෙළුවෝ ය. එහෙත් ඊට පළමු ව ෆ්‍රිට්ස් මෝරාගේ ඇඟට ඇලී සිටි කිරි උරන පැටවුන් කීප දෙනකු ගළවා ගත්තේ ය. තවමත් නැගිට යාමට තරම් ශක්තිය නැති ව සිටි හැන්ස්ගේ ආහාරය සඳහා ඔහු මෙය හොඳට තම්බා බොරයක් සෑදුවේ ය.

හොඳ හුළඟක් ලබා නිම කළ දෙසතියක ගමනින් ඔවුහු අප්‍රිකාව දෙසට ළං වූවෝ ය.

ගොඩබිමක් මුලින් ම දකින තැනැත්තා කුවුන් දෙළහක තෑග්ගක් ලබතැයි නැවේ 'මාස්ටර්' ප්‍රකාශයක් කෙළේ ය. ගොඩබිමක් නුදුරු ව ඇති විට මුහුදේ ඇති වන වෙනස් පාට දැක ගැනීමට හැම දෙනා ම මුහුද දෙසට එබී ගත්හ.

තවත් රැයක් පහන් විය. ගොඩබිමක්, ගොඩබිමක් යයි මහ කුඹයේ නැගී සිටියෙක් කෑ ගැසුවේ ය. මේ ශබ්දය නැව පුරා ත්‍රාසයක් ඇති කෙළේ ය. කෑ ගැසුවේ ෆ්‍රිට්ස් ය.

''කොයි අතින් ද ගොඩබිම පෙනෙන්නෙ?'' කපිතාන් හඬ ගෑවේ ය.

''හරියට ම නැගෙනහිරින්—උස් බිමක්.''

''දකුණු අප්‍රිකාවෙ යකාගෙ හෙල වෙන්ට පුළුවනි,'' කපිතාන් කීවේ ය.

අප්‍රේල් මස 23 වැනි ද, ඔවුන් ඇම්ස්ටර්ඩෑම් වරායෙන් පිට ව හරියට ම තුන් මසකට පසු ඔවුහු 'කැබෝ ඩිබොනේ එස්පෙරන්' නුදුරුව වූ 'ටේබල් බේ' නම් මුහුදු බොක්කට ඇතුළු වූහ. මෙහි හමා එන චණ්ඩ මාරුතයන් නිසා මෙතැන 'කේප් ඔෆ් ස්ටෝම්ස්' හෙවත් කුණාටු තුඩුව යන නමින් සමහරු හඳුන්වති.

ඔවුන් පිටත් ව එන විට තුබූ නැව් පහක හමුදාවේ නැව් දෙකක් වන 'කොර්ටගේන' හා 'ටිඩෝර්' නම් නැව් දෙක මෙහිදි හමු විය. මාර්තු මාසයේ සිට මේ නැව් දෙක වෙන් ව ගොස් තිබිණ. තුර්කි මුහුදු කොල්ලකාරයන්ගේ කුඩා නැව් දෙක මොවුන්ට හමුවී සටන් කොට ගිල්වා ඇතැයි යන පුවත 'ඒසියා' නැවේ නැවියන්ට සතුටුදයක ආරංචියක් විය. සතුරු නැව්වල සිටි හොඳ පිහිනුම්කාරයන් තිස්හය දෙනකු ගළවා ගෙන මට්ටි බෙල්ලන් එකතු කිරීමටත් හුනු පිලිස්සීමටත් යොදා ගෙන තිබිණ.

ඉතා ශක්තිමත් ලෙස ආයුධ සන්නද්ධ කොට තුබුණ ඕලන්ද බල කොටුව මුහුදට මුහුණ ලා තිබිණ. ආහාර ද්‍රව්‍ය හා නැව් ප්‍රතිසංස්කරණ සඳහා මෙහි ඇතුළු වන ඕලන්ද නැව්වලට දරුණු වනචාරීන්ගෙන් ආරක්ෂාව සලසා දීමට මේ බලකොටුව මෙහි වෙයි. නියමිත ගාස්තුවක් ගෙවීමෙන් අනික් ජාතීන්ට අයත් නැව්වලට ද මෙහි ඇතුළු විය හැකියි.

මෙහි සිට සැතපුම් තිහක් රට ඇතුළට යන තුරු ඕලන්දයන් පැමිණ පදිංචි වී සිටින බෝවර් ගොවියෝ පලතුරු උයන්, මිදි උයන්, ධාන්‍ය වතු ආදියෙන් රට සශ්‍රීක කොට ඇත්තාහ. බීර, වයින් හා පාන් ද සුලභව ඇති මෙහි ගෝවා, සලාද, පිපිඤ්ඤ ආදි එළවලුවලින් ද අඩුවක් නැත. මේ අලුත් පිරිසිදු එළවලු, පලතුරු 'ඒසියා' නැවේ ලෙඩ ව දුර්වල ව වැටී සිටි මිනිසුන්ට පෝෂ්‍යදයක ආහාර වී ය.

මැයි මස පළමු වන දින 'ඒසියා' නැව හා අනික් නැව් දෙක ද බෙතාවිය බලා පිටත් වූවෝ ය. හොඳ වේගවත් හුළඟක් ඔවුන් අප්‍රිකාවෙන් මෑත් කොට මගට පැමිණ විය. දෙසතියකට පසු හිම සහිත තද කුණාටුවකට පසු ව අනික් නැව්වලින් ඒසියා නැව වෙන් වූවා ය. කලබල සහිත මුහුදක වේගවත් ගමනකින් ඔවුහු 'මොරිෂස්' පසු කළහ. මෙහිදී සුළඟ අඩු වැඩි වන ස්වභාවය ඇති විය. කුණාටු සහිත වූ විට නැව් හිස සුළං හමා එන දෙසට නමා තබා ගැනීමට නැවේ හැම දෙනාගේ සහාය

චූවමනා විය. මේ කාරියෙන් මගහරින්ට තැනුවකුට කඹපට කෙළවරින් තට්ටමට අඩු ගණනේ පහරවල් සියයකි.

ඊළඟ හදවස අහස වලස් සමින් වැසුවාක් වැනි විය. අහසේ ඉර හඳ හෝ තාරකා හෝ දක්නට නොහැකි විය. නුදුරුව ඇති තද කුණාටුවක් බලාපොරොත්තු වෙමින් ඔවුහු යාත්‍රා කළෝ ය. අකුණු ගැසීම් හා විදුලි කෙටීම් නොතොර ව ඇති විය. සුළඟ වේගවත් වන්නටත් නගින රළ නැවට උඩින් යන්නටත් විය. මහ රුවල ගළවා නැව් තට්ටුව වසා ගැනීමට ඔවුන්ට සිදු වී ය. එයිනුත් අනතුරුදායක තත්වය මග නොහැරෙන හෙයින් ඔවුහු සියලු ම රුවල් හා රුවල් පොලු ද බා සුක්කානම තද කොට බැඳ තබා නැව හුළං හා රළවල අනුකම්පාවට භාජන කොට පාවෙන්ට හැරියෝ ය.

හදිසියේ ම අඳුර දැඩි විය. හමා ආ චණ්ඩ මාරුතය නිසා නැවේ සියලු දෙනා වෙවුලන්ට වූහ. වාත වේගයෙන් නැව කැඩී බිඳී යතැයි ඔවුහු බිය ගත්හ. ඔවුහු වහා නැගිට එහි ප්‍රධාන කුඹය කපා හෙළූහ. එය වැටුණු වේගයට නැව නොපෙරළී බේරුණේ අනූනවයෙනි. වේගයෙන් නගින මුහුදත් ඝෝෂා සහිත කුණාටු-වත් නිසා නැවේ එකිනෙකා කථා කරන හඬ පවා නො ඇසුණේ ය. ඔවුහු එක් මොහොතක අහස උසට ඉහළ නංවනු ලැබූහ. අනික් මොහොතක ගැඹුරු රළ පල්ලමක ඇද වැටී ගියහ. නැවේ වූ හැම දෙයක් ම පෙරළී විපර්‍යාස ව ගොසින් අවුල් ජාලයක් ව තිබිණි. බොහෝ දෙනෙක් මුහුදට සේදී ගියාහ. තවත් සමහරෙක් දරුණු ලෙස තුවාල ලැබූහ.

මොහොතක අවසරයක් ලැබූ ෆ්‍රිට්ස් හා හැන්ස් ද එක් කාමර-යකට රිංගූහ. දෙවියන් සිහිකර කොඳුරන ශබ්දයක් නුදුරෙන් ඇසී විමසා බැලූ ඔවුන්ට දකින්ට ලැබුණේ මහල්ලකු වූ පිරිසේ නායකයා පෙට්ටි ගොඩකට යට වී සිටින බව ය. ඔවුහු දිව ගොස් නැවේ 'මාස්ටර්'ට මේ බව කීහ: එහෙත් එහිදී ඔහු කළ එක ම දෙය නම් මහල්ලා ඇද මුහුදට විසි කිරීමට අණ දීම ය.

භයානක දවල් දින පහක් හා නිදි නැති රාත්‍රි කාල පහක් ද ගෙවී ගියේ ය. කුණාටුවේ අඩු වීමක් නො වී ය. නැවේ ආම්පන්න අතර වැදී ඝෝෂා කරමින් යන චණ්ඩ මාරුතයත් උස් රළගෙඩි ගසා නැව් තට්ටුව වසා යන දිය වැළත් නිසා 'ඒසියා' නැව තව එක පැයක් ඔරොත්තු දී සිටිතැයි නොකිය හැකි තරම් වී ය. බලාපොරොත්තු සුන් ව ගිය සියලු දෙනා දේව යාච්ඤාවකට උඩ තට්ටුවට කැඳවනු ලැබූහ. මිනිස්සු ගරාදි වැට හා රුකුල් කණුව ද අල්ලා ගෙන උඩ තට්ටුවට නැංගෝ ය. 'මාස්ටර්' දෙවියන්ට කන්නලව් කොට ඔවුන්ගේ දිවි ගළවා දුන මැනව, නැත්නම්

දෙවියන් වහන්සේගේ කැමැත්ත ඔවුන් තමා සමීපයට ගැනීම නම් එසේ කළ මනැවැයි යාච්ඤා කෙළේ ය.

පසුව ද කුණාටුව අඩු ව ගොස් මුහුද නිශ්චල විය. බලාපොරොත්තුවක් උදා විය. තමා නොයිතු ලෙස ගළවා දීමේ ආශ්චර්යය ගැන දෙවියන්ට ස්තුති කළ නැවියෝ නැවේ කැඩුම් බිඳුම් පිළියම් කර ගැනීමට පටන් ගත්හ. මේ කාරිය නිම කරන්ට පළමු ව හැමූ තද සුළඟ එයට බාධා කෙළේ ය. දිය එන සිදුරු වසා ගන්ට නොහැකි වීම නිසා ගලා එන දිය පොම්ප කර හැරීම නොකඩවා කරන්ට සිදු විය. හමා එන තද සුළඟ මුහුණ හරහා වදින්ටත් රළවලින් නගින දියෙන් නැවේ උඩ ඉදිරි කොටස සේදී යන්ටත් විය. මහ කුඹය බිඳී අනික් රුවල් ද ඉරී ගොස් තුබුණ හෙයින් ඔවුන්ට නියම තැනකට නැව යොමා ගත නොහැකි විය.

කුණාටු සහිත කාලගුණයත් හදිසියේ කඩා වැටෙන වැස්සත් නිසා අවට හොඳින් නොපෙනෙතත් මුහුදු දියෙහි පැහැය වෙනස් ව යන බව පෙනෙන්ට තිබිණ. බඹ 200 ක් ඇති බරුව පත්ලට නොබට නමුත් ගොඩ බිමක් ළංව ඇත.

හැන්දෑව වන විට මුහුදේ පැහැය තවත් වෙනස් වන්ට විය. ඔවුහු නැංගුරම් ලෑමට කටයුතු සූදනම් කළහ. දක්ෂ මුහුදු යාත්‍රිකයකු වූ නැවේ නායකයා ඇත ගොඩ බිමක් පෙනේ දැයි බැලීමට අවරයේ කුඹය උඩට යවන ලදී. උෂ්ණ කලාපයේදී අඳුර වේගයෙන් එන හෙයින් හේ මීදුම අතරෙන් බටහිර දෙසට ගොඩ බිමක් පෙනෙතැයි කියා සිටියේ ය. මෙවේලේ බරුව දමා බැලූ විට බඹ අසූවක දුරින් මුහුදු පත්ල හමු විය. රාත්‍රි අඳුර වැටෙනවාත් සමග ම දියඹ මුහුදේ රුස්වී තුබුණ චණ්ඩ මාරුතයක් ගොඩ දෙසට හමන්ට වී ය. නැව රළගෙඩිත් සමග විසිවන්ට විය.

තද සුළඟ සහිත වැස්සේ හඬත් සමග මහ රළ කඳන් නැගී එන ඝෝෂාව ඇසෙන්ට විය. මැදියම් රැයේ පමණ පිටතට ආ නැවේ 'මාස්ටර්' මරණ බිය රැඳි මුහුණින් යුතුව, ''අහෝ! මගේ අසරණ නැව, ගල් පරයකට වැදුණා. අපට දැන් කරන්ට දෙයක් නැහැ,'' කීවේ ය.

නැව ශබ්ද ඇති ව කිසිවක වැදී ගැස්සී පහත වැටිණ. ඒ සමග ම මහා රළ පහරකින් ඔසවනු ලැබූ නැව නැවතත් ගල්පරයේ ගසනු ලැබී ය. මිනිසුන් කලබල ව එහා මෙහා දිවූ අතර නැව දෙදරන්ට විය. මිනිසුන් තම ආත්මයන් දෙවියන්ට කැප කරන මර ළතෝනිය මහ ඝෝෂාවක් වීය.

මේ කලබල අස්සේ හැන්ස් ගැන සොයමින් ගිය ෆ්‍රිට්ස් ඔහු අල්ලා ගත්තේ ය. ''මේ ඉතින් අවසානය තමයි හැන්ස්, ගොඩ



මහත් කලබලයෙන් මිනිස්සු ඒ මේ අත දුවති.

බිමක් ළඟක තියන නිසා තවත් සුළු බලාපොරොත්තුවක් තියෙනවා,'' යයි කී හෙතෙම හැන්ස් ලෑල්ලකට තබා බැඳ, ''අපට මේ ගල් පරෙන් එකන් වෙන්ට පුළුවන් උණොත් බේරෙතැකි. මොන දේ උණත් මේක අත අරින්ට එපා. ඔබ බේරෙයි, මේ ලෑල්ල අප දෙන්නාට ම මදි; මම තව එකක් හොයන්නම්. ''ආයුබෝවන් හැන්ස්!'' කියා යන්ට ගියේ ය.

ෆ්‍රිට්ස් එතැනින් යනවාත් සමග ම නැව දෙකඩ ව බිඳී ගියේ ය. වේගවත් ව ගසන රළ පහර නිසා එහි පසුකඩ එකවර ම ගිලී ගියේ ය. හැම දෙනා ම මුහුදට පැන්නෝ ය. මහ රළගෙඩි නගින ඝෝෂාව තවත් දැඩි ව ඇසෙන්ට විය.

ගිලී මියන මිනිසුන්ගේ කෑ ගැම කෙමෙන් අඩුවන්ට විය. අන්තිමට එහි ඉතිරි වූයේ සුළඟේ හඬත් රළ බිඳෙන හඬත් පමණි.

# 4

## මුහුදු බත් වූ නැවියා

ශාන්ත සිහිල් උදයකි. කලබල රාත්‍රියකින් පසු ව නව උදවක් වූ දිනයකි. ඝෝෂා සහිත චණ්ඩ මාරුතය මඳ පවනකට හැරී තිබිණි. මුහුදේ කෝප වේගය සිඳී ගොස් තිබිණි.

කුණාටුව සංහිඳී ගිය විට, වනාත දෙසට කෙමෙන් උස් ව පිහිටි වෙරළේ සමාන්තර ව නැගී තුබුණ වැලිකඳු හා බෙලිකටු හා රොඩුබොඩු ආදිය රළ පහර ගසා නැවතුණ තැන් පෙන්නුම් කෙළේ ය.

උස් ව නැගී එන මුහුදු දිය මත බිඳුණ නැවෙන් මිදී පාවී එන කිසිවකි. දිය මත ඇත මෑත විසි වී යමින් පැවති මෙය බොහෝ වේලාවකට පසු රළ පහරකට අසු විය. රළ පහර එය වෙරළ දෙසට පා කරන්ට විය. වරක වෙරළ දෙසට පා කරමිනුත් නැවත වරක් එය ආපසු මුහුද දෙසට ඇද ගනිමිනුත් පවතිද්දී අනික් රළවලට වඩා වේගවත් එක් රළ පහරකින් පා වූ දෙය වෙරළේ වැලිකඳු මතට විසි කරන ලදි. මෙයින් පසු ව මහ මුදද තම කාරිය ඉවර කළාක් මෙන් එය නැවත තමා වෙත ගැනීමට

උත්සාහ නොකොට වරින් වර සෙමින් ස්පර්ශ කිරීම පමණක් කෙළේ ය.

මෙකී දෙය මෙහි පැය කීපයක් තිබිණි. හිරු රැසින් පොළොව උණුසුම් වන විට බිඳුණු නැවෙන් පාවී ආ ලී කොටයකට තබා බඳනා ලද ගැටයෙක් රළ පහර වදින මානයෙන් ඉවත් වීමට මෙන් දඟලුවේ ය. එහෙත් එසේ ඇදී යාමට බාධාවක් ඇති බව දුටු හෙතෙම තම ජීවිතය ගළවා ගැනීමට ආධාර වූ ලී කොටයට තම ඉඟ තද කොට බැඳ තුබුණ බැම්ම බුරුල් කොට එයින් මෑත් වූණේ ය.

දැන් බිම ගසා එයින් නැගී සිටීමට ගත් උත්සාහය නිෂ්ඵල වූ හෙයින් මෙතෙම දෑතින් වැල්ල බද ගනිමින් වැල්ල දිගේ ගොඩ දෙසට ඇදෙන්ට වී ය. යමකට අසුව තැළී ගිය සර්පයකු මෙන් මෙසේ අහලෙන් අහල ගොඩට ඇදෙමින් වෙහෙස මග හැරවීමට විවේක ගනිමින් හේ ගොඩ දෙසට පීනුවේ ය.

මෙසේ ඇදුණ මොහු යාර පනහකට පමණ දුරින් පිහිටි සෙවණකට ඇදී ගන්නා විට ඉර මුදුන් වේලාව පමණ විය. දරුණු ලෙස විඩාවට පැමිණ සිටි හේ සිහිසන් නොමැති ව මළාක් මෙන් එහි වැතිර සිටියේ ය. හිර බැස ගියේ ය. පසුවද හිර නැග නැවත බැස ගියේ ය.

මැද රැයේ අඩ සඳේ එළියෙන් මුහුදු වෙරළ බැබළෙන විට මෙතෙම අඩ සිහියෙන් අවදි විය. තමාගේ මුළු ඇඟ ම රිදෙන සැටිත් වේදනාවෙන් තොර ව හුස්ම ගැනීම පවා අසීරු බවත් ඔහුට දැනී ගියේ ය.

මළාක් මෙන් එහි වැතිරී නිසල ව සිටින මෙතෙම මුහුදෙන් මතු වූ කිසියම් සේයාවක් අමාරුවෙන් මෙන් ඇදී එනු දුටුවේ ය. එය ඔහුගේ ප්‍රාණය පැහැර ගැනීමට එන්නාක් මෙන් ඔහු වෙත ළං ළං ව ම පැමිණියේ ය. පොළොවට ම බර වී සිහිනය-කින් මෙන් එහි වැතිරී සිටින ඔහුට අතක් පයක් සෙලවීම පවා කළ නොහැකි විය. මුහුදෙන් මතු වී ආවේ එක් සතෙකි. මේ සතා ඔහුගේ ඇළයට ම පැමිණ එහි නැවතී ඔහු වළලා දමන්ට මෙන් පොළොව හාරන්ට විය. එවෙලේ ඊට වැඩි දෙයක් ඔහුට මතක නැත.

හැන්ස් අවදි විය. ඔහුට කිසිවක් ගැන නිනවි නැත. ඔහුගේ උගුර වියලී ගොසිනි. අත් පා අවසහ ය. තමාට කිසියම් පිහිටක් නොලැබුණේ නම් මියන තුරු එසේ වැතිරී සිටීමට වන බවට යම්තම් හැඟීමක් ඔහුට එවෙලේ ඇති විය. මේ විධියට ඔහුගේ මරණය පවා දුර නො වේ. හේ හිඳ ගැනීමට උත්සාහ කෙළේ ය. ඔහුගේ මුළු සිරුර ම දුබල ය.

මෙවිට ඔහුට තමා දුටු සිහිනය සිහි විය. එය සිහිනයක් පමණක් ද? සැබවින් ම කිසියම් සතෙක් එසේ තමා සමීපයට පැමිණියේ ද? හිස හරවා බැලූ ඔහුට තමා සිටින අසල බිම පහුරු ගා තිබෙන බව පෙනිණි. මෙහි යම් කිසිවක් වළලා ඇද්ද? හේ කෙඳිරි ගාමින් අත දිගහැර එතැන බුරුල් පස අවුස්සන්ට විය. උත්සාහය නිෂ්ඵල බව දැනී එය අත් හැර දැමීමට අදහස් කරනවාත් සමග ම කිසියම් මෘදු ගෝලාකාර දෙයක් ඔහුගේ ඇඟිලි අග ස්පර්ශ විය. එවැනි ගෝලාකාර ඒවා තවෙකක් තවෙකක් බැගින් මහ ගොඩක් එහි විය. හේ එයින් එකක් ගෙන බැලුවේ ය. ඔහුගේ දෙතොල හොඳට ම වියලී ගොසිනි. මේ මෘදු ඇදෙන සුලු ද්‍රව්‍යය ගැන ලොකු ආශාවක් ඔහුට දැනෙන්ට විය. හේ එය මුවට ළං කොට දතින් කැඩුවේ ය. එය කැඩෙන වාත් සමග ම එම බිත්තර සාරු ඔහුගේ කට දෙකෙළවරින් පෙරී ගියේ ය. එය කෑමට සුදුසු බව ඔහුට සහජ ඉවකින් හැඟී ගියේ ය. හේ එයින් තවෙකක් ගෙන වඩා ප්‍රවේසමෙන් කඩා එහි සාරය ගිල්ලේ ය. මෙසේ එකින් එක එයින් බිත්තර හුහක් හේ ගිල්ලේ ය. එයින් එක්තරා ප්‍රාණවත් බවක් ලැබූයේ එයින් තෘප්ත ව නින්දකට වැටුණේ ය.

පැය කීපයකට පසු ව අවදි වූ හැන්ස් එම බිත්තර තවත් හුහක් කෑවේ ය. ඔහුට දැන් හිඳ ගැනීමටත් තමාගේ තත්වය සිතා ගැනීමටත් ශක්තිය තිබේ. ඔහු දුටුවේ මුහුදේත් ගොඩත් පැවති මහත් පාළු බවකි.

නැව බිඳී යාමේ ත්‍රාස ජනක සිදුවීම් ක්‍රමයෙන් ඔහුගේ සිහියට නැගෙන්ට විය. ෆ්‍රිට්ස් හා ඔහුගේ අවසාන ක්‍රියාව වූ ආත්ම ත්‍යාගය ඔහුට සිහි විය. දැන් මෙවෙලේ ෆ්‍රිට්ස් කොහි ඇද්ද? ෆ්‍රිට්ස් තමාටත් ලී කොටයක් සොයා ගත්තේ ද? ඔහු, ''ලී කොටයක් සොයා ගනිමි,'' යි කියනවාත් එක්කම නැව බිඳී ගියා. මා මෙහෙම බේරී ගොඩට ආවා නම් ඒ තරම ශක්තිමත් පල-පුරුදු කාරයෙක් බේරී නො ගනියි ද? තමා ලී කොටය බදාගෙන සිටි හැටි හැන්ස්ට මතක ය. මහා රළ පහරකට තමා ඔසවා පෙණ ගොඩක් සමග ගල් පරයෙන් එහා වීසි කරන විට තමා සිටි භයානක තත්වය ඔහුට සිහි විය. එයින් පසු තමා පිදුරු ගහක් වැනි දෙයක් බදාගෙන මහා සාගරයේ පාවුණු බවක් යම් තම් මතකේ ඇති නමුත් මෙ වෙරළේ වැලි තලාවේ සිහිය ලබන තෙක් එයින් පසුව වූ දෙයක් ගැන ඔහුට සිහි කළ නො හැක.

හැන්ස් අමාරුවෙන් නැගිට සිටියේ ය. නැවේ සුන්බුන් කිසි-වක් හෝ එයින් බේරී ආ කිසිවකු—සමහර විට ෆ්‍රිට්ස්—හෝ ඇද්දැයි බැලීමට ටිකක් එහා මෙහා ඇවිද්දේ ය. එහෙත් ඔහු

දුටු කිසිවක් නැත. දිස්න දෙන සාගරය ක්ෂිතිජය තෙක් ඉතා පරීක්ෂාවෙන් බැලුවේ ය. යාත්‍රාවක් හෝ මුහුදේ පාවෙන අනික් කිසිවක් හෝ පෙනෙන මානයක නො වී ය. වරක් භයානක ලෙස කැලඹෙමින් තුබුණු සමුද්‍රය දැන් ඉතා ම නිශ්චල ය. ශාන්ත ය. නමුත් එහි සිටි නිර්භීත මිනිසුන් ටික දෙනාත් මේ මුහුද සම්පූර්ණයෙන් ගිල දමා ඇති බව පෙනිණ. ආපසු හැරී අනික් පස බැලූ ඔහුට දක්නට ලැබුණේ කෙළවරක් නො පෙනෙන මහා වන ප්‍රාකාරයකි.

මෙයින් මෙතෙක් ඔහු කෙරෙහි පැවති උනන්දුව සිඳී ගියේ ය. හේ එහි දණින් වැටී තමා බාල කල කී යාච්ඤාව කියන්ට විය.

"මාගේ අම්මාටත් තාත්තාටත් දෙවියන්ගේ ආශීර්වාද ලැබේවා! ඔවුන්ට සනීපයත් ශක්තියත් ප්‍රීතියත් ළඟා කර දේ වා! හැන්ස් හොඳ ළමයකු කෙරේ වා! අහෝ! දෙවියනි—ෆ්‍රිට්ස් මා වෙත එවනු ලැබේ වා! ඔහුට යාච්ඤාව ඉවරකර ගත නොහැකි විය. හද පැළී යන්ට එන්නාක් වැනි තද වේදනාවකින් හේ ඉකි බිඳ හඬන්ට විය. දේව විනිශ්චය පිළිබඳ වූ වැදගත් පැයේදී තමා දෙවියන් වහන්සේ ඉදිරියේ තනි වී සිටින බව ඔහුට හැඟී ගියේ ය. තද තනිකමක් ඔහුට දැනෙන්ට විය. තමාගේ දිවි ගැළවීමට අර මුහුදෙන් ආ සතා එසේ එවීම ගැන හේ දෙවියන් වහන්සේට ස්තුති කොට යාච්ඤාව හමාර කෙළේ ය.

ඉන්පසු හැම දවසේ ම හිරු බැස යන මොහොතේදී මවුපියන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා දෙවියන්ට ස්තුති කිරීම ද හේ අමතක නො කෙළේ ය.

දිය පිපාසයෙන් අධික ව පීඩිත වූ හේ එහි වැල්ලේ වළක් හාරා එයින් ගෙන ලුණුරහ දිය බීවේ ය. එහෙත් එයින් වූයේ ඔහුගේ පිපාසය තවත් වැඩි වීම ය. හේ වනයට වැද දිය කඩක් සෙවීමට උත්සාහ කෙළේ ය. එහෙත් එහි දුරට යාමට හේ බිය විය. මෙසේ සොයන ඔහුට වැහිදිය රඳා සිටි එක් වළක් හමු වීම වාසනාවක් විය.

රාත්‍රි කාලයේදී හේ වැල්ලේ බිත්තර වළලා තුබුණු තැනට නුදුරු ව නිඳ ගත්තේ ය. එහෙත් ඔහුට එක වර ම නින්ද නො ගියේ ය. දැන් හොඳ සිහි කල්පනාව ඇති වූ හේ අවටින් ඇසෙන ශබ්දයන් ගැන සැලකිලිමත් විය. අවට ඇති අඳුර තැති ගන්වන සුලු විය. වනය තුළින් නොයෙක් විධියේ බියජනක අඩි ශබ්ද ඇසිණ; තමා නුදුරෙන් ම පරඬැල් තැළෙන හඬ සමග ඈත වනයෙන් පක්ෂියකුගේ බියකරු හඬක් ඇසිණ. තවත් වරෙක දුරින් ඇසුණු නරි රංචුවකගේ හූ කීම ඔහුට ඇසුණේ යකුන්ගේ ප්‍රමුදිත සිනාවක් මෙනි. මේ අතර ඇති වූ තද නිශ්චලතාව මේ

සියල්ලට වඩා බිය උපදවන සුළු විය. ඔහුට නිද ගත හැකි වූයේ බොහෝ ප්‍රමාද ව ය.

හැන්ස් සිටි තැන පොළොවේ ලූ බිත්තර 200 කට වැඩි විය. ඒවා ඔහුට හදවසක ආහාරයට ප්‍රමාණ විය. එයින් පසුව ඔහුට ආහාර වශයෙන් කිසිවක් සොයා ගත නොහැකි විය. සොයා ගත හැකි වූයේ වෙරළ වැල්ලේ වූ කකුළුවන් කීප දෙනකු පමණ ය. ඔවුන් ලැග සිටින සිදුරු ළඟට වී නිශ්ශබ්ද ව සිට ඔවුන් මතු වන කෙණෙහි අල්ලා ගැනීමට හැන්ස් සමත් විය. එහෙත් මේ කකුළුවන්ගේ මසට වඩා ඇති වූයේ කටුව ය.

නැව බිඳී යාමෙන් හත් වෙනි දින රාත්‍රියේ නිද සිටි හැන්ස් මධ්‍යම රාත්‍රියේ අවදි විය. හේ එහි හිඳ ගත්තේ ය. හඳ එළියෙන් එළිය වුණු මුහුදු වැල්ලේ ඈත සිට මෑත් වී එන රූ සටහන් දෙකක් හැන්ස් දුටුවේ ය. කිසියම් ඉවක් සොයමින් යන්නන් මෙන් උන් දෙන්නා එහා මෙහා යමින් ළං ළංව එන සේ පෙනිණි.

ඔහු සිටි තැනට යාර දෙසීයකට තරම දුරින් නැවතුණ මේ සතුන් දෙදෙනාගෙන් එකෙක් බිම ඉව කර හාරන්ට විය. අනෙකා ද ඌට එකතු විය. ඔවුන් දෙදෙනා එසේ පොළොව හාරමින් පැය බාගයක් පමණ ගත වූ විට වඩා ලොකු තවත් සතෙක් ඔවුන් සිටි තැනට ළං විය. මුලින් සිටි සත්තු දෙදෙනා නොකැමැත්තෙන් මෙන් එතැනින් ඉවත් ව ගියෝ ය. එතැනට ආ තුන් වැනි සතා ඉවත් ව යාමට පළමු බොහෝ වේලාවක් එහි ගත කෙළේ ය.

එවැනි සතුන් ගැවසෙන මුහුදු වෙරළට රාත්‍රී කාලයේ බැස ඇවිදීමට හැන්ස් බිය විය.

ඉර උදාවීමෙන් පසු ව බිය පහවී ගිය හැන්ස් එකී සතුන් ගැවසුණු තැන පරීක්ෂා කර බැලුවේ ය. එහි ගිය හැන්ස්ට දකින්ට ලැබුණේ එතැන පොළොවේ පස් හාරා ඇති බවත් මෙතෙක් තමා කෑ වර්ගයේ බිත්තර කීපයක පිට සිවිය එහි විසිරී තුබුණ බවත් ය. එතැන පසෙහි සැඟවී තවත් බිත්තර ඇද්දැයි පරීක්ෂා කළ ඔහුට එයින් හතරක් සොයා ගත හැකි විය. මුහුදු දියෙන් සෝද ගනු ලැබූ මේ බිත්තර පිට සිවියත් සමග ම හැන්ස් ගිල දැමුවේ ය.

රාත්‍රියේ මඳ එළියේ යමතමින් දුටු මේ සතුන් මොකුන් දැයි සෙවීමට උත්සාහ ගත් හැන්ස් ඔවුන් ඈත මෑත ගිය අඩි සටහන් හොඳින් බැලුවේ ය. මෙයින් දෙදෙනකුන් බල්ලන් වූ අතර අනිකා ලොකු ඌරෙකැයි හේ නිගමනය කෙළේ ය. මේ බල්ලන් අසල ගමක සිට එන්ට ඇතැයි සිතූ නමුත් මේ තෙරක් නොපෙනෙන මහ වනයේ ගම් නොවිය හැකැයි ද ඔහුට කල්පනා විය.

මේ සතා බිජු ලා තිබෙන තැන බල්ලන් මෙතරම් දක්ෂ ලෙස සොයා ගන්නේ කෙසේ දැයි යනු හැන්ස්ගේ විමතියට හේතු විය. මේ සතුන් ඔවුන්ට ඇති තියුණු ඉව අනුව බිජු ලා තිබෙන තැන සොයා ගන්නේ යයි හේ සිතුවේ ය. මේ බල්ලන් මුහුදු වෙරළ දිගේ බොහෝ දුරක් මෙසේ එන්ට ඇතැයි ද හේ සිතුවේ ය. මුහුදු වෙරළේ වැල්ල තවත් පරීක්ෂාවෙන් බලන ඔහුට දෙපා පළල් කොට ඇදට තබමින් ගිය මිනිස් පිය සටහන් සමාන පිය සටහන් වගයක් ද වැල්ලේ සටහන් වී තිබෙනු පෙනිණි. මේ අඩි බිජු ලෑ සතාගේ අඩි සටහන් බව ඔහුට වැටහී ගියේ ය. සමහර විට මේ බල්ලන් බිජු ලෑ තැන සොයා ගනු ලබන්නේ එවැනි ඉවකින් නොව මේ පිය සටහන් අනුසාර-යෙනැයි ඔහුට වැටහිණි. බල්ලන්ට එසේ සොයා ගත හැකි නම් තමාටත් මේ පිය අනුව යාමෙන් බිජු වළලා ඇති තැන් සොයා ගැනීමට නොහැකි වීමට හේතුවක් නැතැයි හේ සිතී ය.

මුහුදු වෙරළේ හිරු රැස් දැඩි විය. හැන්ස් ඇඳ සිටියේ කෙටි කලිසමක් පමණක් වූ හෙයින් බිබිලි නැගී තුබුණ ඔහුගේ උඩු කය හිරු රැස් වැදීමෙන් දැවෙන්ට වූ හෙයින් හේ වහා සෙවණක් සොයා ගියේ ය. සෙවණේ හිඳගෙන හැන්ස් කල්පනා කෙළේ මේ බිජු ලන සතා කෙබඳු එකකු විය හැකි ද කියා ය. වරක් ඔහු නැවේ සිටියදී මුහුදේ වරින් වරට උඩ යට යමින් සිටි සතුන් වගයක් පෙන්වා ඒ කැසුබුවන් යයි ෆ්‍රිට්ස් කියා දුන් හැටි ඔහුට සිහි විය. මේ සතුන් මුහුදු වෙරළට ගොස් වැල්ලේ වළවල් සාරා බිජුලන බවත් එසේ වැළලූ බිජු හිරු රැසින් මෝරා පැටවුන් උපදින බවත් එද ෆ්‍රිට්ස් ඔහුට විස්තර කෙළේ ය. එසේ ම දියෙහිදී ඉතා දක්ෂ ලෙස පීනා යන මොවුන්ගේ වරල් වැනි පාදයන් ගොඩ බිමෙහිදී එතරම් ක්‍රියාශීලී නොවන බවත් සතා අල්ලා උඩු අතට පෙරළා තැබීමෙන් ඌ මෙල්ල කළ හැකි බවත් ෆ්‍රිට්ස් එද කියා දුන්නේ ය. අද වෙරළ වැල්ලේ දුටු මේ විකාර අඩි සටහන් කැසුබුවන්ගේ එකී පා සටහන් බවට නිසැක යයි හේ සිතා ගත්තේ ය.

හැන්ස් කෙරේ පවතින බඩගින්න බලවත් ය. ප්‍රමාද නැතිව ආහාරයට කිසිවක් සොයා ගනු නොහැකි වුවහොත් තමා මේ ලබා ඇති ශරීර ශක්තිය ඉක්මනින් පිරිහී යා හැකි හෙයින් එද මුළු රෑ ම මේ එන සතුන් ගැන පරීක්ෂාවෙන් සිටීමට හේ ඉටා ගත්තේ ය.

සුදු පැහැ වූ මුහුදු වැල්ල දිගේ හැන්ස් පරීක්ෂාවෙන් ඇවිද්දේ ය. මෙසේ ඇවිදින හෙතෙම වරින් වර වන කෙළවරට ගොස් සෙවණේ විඩා හැරියේ ය. මුහුදෙන් මෑත් වුණ ඉදිබුවකු වැනි විශාල සතකු ගොඩ බිම දෙසට නැගී එනු මෙසේ සිටින එක්

වරක ඔහුට දකින්ට ලැබිණ. ඒ විශාල කැස්බෑවකි. හැන්ස් සිටි තැනට යාර විසිපහකට වඩා නොදුරෙන් නැවතුණ මේ කැස්බෑව එහි සිට තමාගේ දිගු ගෙල මැත් කොට අවට පරීක්ෂාවෙන් බැලුවා ය. ඇගේ බැල්මේ රළු බවක් පෙනෙන්ට තිබිණ. එසේ බැලූ කැස්බෑව ඇගේ වරල් වැනි පාදයන්ගෙන් එතැන වැල්ලේ තරමක ගැඹුරු වළක් සෑරුවා ය. මිනිත්තු පහක තරම කාලයක් එහි සිටි කැස්බෑව මේ වළ වසා සමතලා කළා, අනික් තැනකට ගොස් එවැනි ම තවත් වළක් සෑරුවා ය. මෙසේ වළවල් හයක් පමණ හාරා පස් වැසූ කැස්බෑව ඊළඟට සෑරූ වළ වඩා ගැඹුරු විය. එහි බැස්ස විට පිටතට ඇ නොපෙනෙන තරම විය. පැය බාගයක තරම කාලයක් ඈ මේ වළේ ලැග ගත කළා ය./හැන්ස් නොඉවසිලිමත් විය. තමාට නොපෙනී ඈ ගියේ වත් දෝයි හේ සැක කෙළේ ය. අන්තිමට හැන්ස් හෙමින් සීරුවේ එතැනට පැමිණියේ ය. සතාට ළංවන විට හේ පහත් වී වැල්ල දිගේ බඩ ගා ආවේ ය. කැස්බෑව එහි වූවා ය. හදිසියක් ඇති වුවහොත් වහා පැන යාමට සූදනමින් උගේ හිස වළ ගැටියේ තබා ගෙන මුහුද දෙසට මුහුණ ලා ඕ එහි සිටියා ය.

හැන්ස් ආපසු ඇදී ඉවත් වී බලා ගෙන සිටියේ ය. වැඩි වේලාවක් යන්ට පෙර වළෙන් ගොඩ නැගුණු කැස්බෑව වැලිවලින් වළ වසා වඩා හොඳින් සමතලා කළා ය. එසේ කොට වහ වහා දියඹ දෙසට ගමන් කරන්ට වූවා ය. හැන්ස් දුව ගොස් ඇගේ පිට කටුවේ කෙළවර දැතින් අල්ලා ගන්නා විට ඈ දිය සීමාවට හොඳටම ළං ව සිටියා ය. කැස්බෑව තමාට බාධා කළ හැන්ස්ට ඇගේ ශක්තිමත් හිසෙන් පහරක් ගැසුවා ය. මෙයින් බේරී ගත් හැන්ස් එක වර ම ලොකු ශක්තියක් ගෙන ඈ උඩු අතට පෙරළා දැමුවේ ය. කැස්බෑව කර කියාගත හැකි දෙයක් නැති ව වරල්වලින් කටුවට ගසා ගන්ට වූවා ය.

එසේ කළ හැන්ස් ආපසු සතා බිජු ලූ තැන බලා ගියේ එහි වූ අසූවක් පමණ බිජුවලින් බාගයකට පමණ වග කීවේ ය. ඉතා කැදර ලෙස මේ කැසුබු බිජු ගිල දැමූ හෙතෙම එහි ඉඳගෙන කැස්බෑවගේ ක්‍රියාව ගැන කල්පනා කෙළේ ය. බිජු ලෑමේ කාරිය අනික් සතුන් කෙරෙන් සැඟවීමට බොරු බිජුවළ කීපයක් සෑරීමට තරම කපටිකමක් මේ සතාට ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සැටි හේ මෙනෙහි කෙළේ ය.

හැන්ස් ඊළඟ උදයේ අවදි වන විටත් කැස්බෑව එතැන එසේ ම සිටියා ය. අඩි කීපයකට දුරින් වූ තමාගේ නිවාසය වන මහ මුහුදට පැන ගැනීම සඳහා සතර පයින් නැගී සිටීමට ඈ ගන්නා මහත් උත්සාහය අනුකම්පා උපදවන සුළු එකක් විය. එහෙත්

බඩගින්නේ පසුවන හැන්ස් ඇය මරා ගැනීමට ම අධිෂ්ඨාන කරගෙන සිටියි.

කැසුබු පිට-කටුව කැඩීමට තරම ශක්තිමත් ලොකු ගලක් හමු වන තුරු හැන්ස් වෙරළේ ඇවිද්දේ ය. ගල ගෙන ආ හැන්ස් එයින් වැරයේ පහරක් දීමට දැතින් ම ගල ඔසවන විට පහර ලැබීමට සැරසෙන්නියක මෙන් කැස්බෑව ඇගේ හිස එළියට දිගු කළා ය. හැන්ස්ගේ හිත ඔහු පසු බැස්සුවේ ය. මාගේ ජීවිතය රැක ගැනීමට මට පිහිට වූ මේ අසරණ කැස්බෑව මරන්නේ කෙසේ ද? මා කුසගින්න නිවා ගැනීමට ආහාරයක් සපයා ගත්තේ ද මැගේ පිහිට නිසා ම නොවේ දැයි ඔහුගේ හිත ඔහුට කියන්ට විය. එකෙණෙහි ඇති වූ අනුකම්පාවෙන් තමා ගැන අමතක ව ගිය හැන්ස් ඈ අනික් අතට හරවා දියට යන්ට ඉඩ දී බලා සිටියේ ය. කැස්බෑව වහ වහා මුහුදට ගමන් කළා මොහොතකදී දිය යට නොපෙනී ගියා ය. ඇගේ ඒ ගමනත් සමග ම ඔහුට කීප දිනක් රැකෙන්ට තුබුණ ආහාරය ද නැති වී ගියේ ය.

මින් පසු රෑ හතරක් ම රැක සිටි නමුත් එයින් කිසි ප්‍රයෝජන-යක් නො වී ය. ඔහුට ආහාර වශයෙන් ලබා ගත හැකි වූයේ දියෙන් යට ව තුබුණ ගලකින් කඩාගත් මට්ටි බෙල්ලන් අහුරක් හා කකුළුවන් කීප දෙනකුත් පමණකි. මුහුදු වෙරළ දිගේ සැතපුම් බොහෝ ගණනක් ඔහු ඇවිද ගෙන ගියේ මිනිසුන් ඇති බවට ලකුණක් හෝ ගං මෝයක් හෝ දකින බලාපොරොත්තු-වෙනි. එහෙත් ඔහුගේ බලාපොරොත්තුව සාර්ථක නො වී ය. මුහුදේ මසුන් අල්ලා ගත හැකි කිසියම් උපක්‍රමයක් ගැන නොයෙක් අතේ සිතා බැලූ නමුත් ඔහු දුටු කිසිම උපක්‍රමයක් නො වී ය. එසේ ම මේ ගැඹුරු මුහුදේ නොගැඹුරු තැනක් ද සොයා ගත හැකි නො වී ය.

තමා මේ මහ වන කතරට ඇතුළු විය යුතු අවස්ථාව පැමිණ තිබෙන බව හැන්ස් දුටුවේ ය. එහි ගොස් තෙරක් නැති වනයේ වල්මත් වූ විට කරන්නේ කුමක් දැයි සිතා ගැනීමට ඔහුට පුළුවන්කමක් නො වී ය.

අරුණෝදයෙන් ඈත ක්ෂිතිජය ආලෝකවත් වන සැටි අව-සාන වරට හේ බලා සිටියේ ය. තවමත් කිසියම් බලාපොරොත්-තුවක් ඇද්දැයි හේ තවත් වරක් මහ මුහුද දෙස පරීක්ෂාවෙන් බැලුවේ ය. නැවක රුවලක හෝ මිනිහකුගේ සේයාවක් ඔහුගේ බැල්මට හසු නො වී ය. ඇති වූයේ රළ පහරින් වෙරළ සේදී සේදී යන මලානික දර්ශනයත් ඉගිලී යන ලිහිණින්ගේ හඬත් පමණකි.

හේ තමා ම දෙවියන්ට කැප වෙමින් මුහුද දෙසට පිටු පා ඔහු ගිලගන්ට බලා සිටිනාක් වැනි අඳුරු මහ වනය දෙසට පා නැගුවේ ය. ඉදිරියට අවුරුදු ගණනාවක් ඔහුගේ නිවාසය වීමට උරුමකම් ලබා සිටියේ මේ මහ වනය ය.

# 5

# වන මැද්දේ

තද මුහුදු සුළඟින් බැට කා කරාහැටි වූ මුහුදු වැලි ආශ්‍රිත බිමේ පඳුරු ගොමුව සමග ම වූයේ වැඩුණ මහ ගස් ඇති මහ වනය යි.

වන මැද තුරු සෙවණේ දඬු කඩක් ද අතින් ගෙන දවසෙන් බාගයක් තරම හැන්ස් ඇවිදගන ගියේ කෑමට ගත හැකි කිසියම් ගෙඩි වර්ගයක් සොයා ගැනීමේ අදහසිනි. එහෙත් මෙතෙක් ඔහුට කිසි ම ගසක මොන තරමේ හෝ ගෙඩියක් දකින්ට ලැබුණේ නැත. ලැබුණේ කෑමට රස නැති ඉදී වැටී තුබුණ කුඩා ගෙඩි වර්ග කීපයක් පමණකි.

තද වෙහෙසින් මෙසේ යන හැන්ස් එක් තැනකදී අසුභ කිසියම් අමුතු ශබ්දයක් නිසා නැවතී කන් දුන්නේ ය. ශබ්දය ආ දෙසට සෙමින් ළං ව කන් දී සිටි විට මේ ශබ්දය එන්නේ ඝන ව වැඩුණ ගස් ගොමුවක් කෙරෙන් බව ඔහුට පෙනී ගියේ ය. තදින් පඳුරු ගාන ශබ්දයත් සමග සතකුගේ ගෙරවීමක් වැනි හඬකි මෙහිදී ඔහුට අසන්ට ලැබුණේ.

ඇසුණ හඬ කෑමක් ලැබුණ බල්ලකුගේ යටි උගුරෙන් ගෙරවීමක් වැනි ශබ්දයක් වූ හෙයින් කිසියම් සතකු ගොදුරක් ගන්නවා ඇතැයි සිතූ හැන්ස් උගේ කලබල වීමෙන් විය හැකි අනතුරකින් බේරී මේ කවර සතකු දැයි බලා ගැනීමට ගසකට නැග ගත්තේ ය. තවමත් දුර්වල ව සිටි හැන්ස් ගසට නැග ගත්තේ අමාරුවෙනි. ඔහුගේ බරෙන් ගසේ අත්තක් බිඳී හඬක් නැංගේ ය. මෙහිදී අර ඇසුණ ශබ්දය මොහොතකට නතර විය. එහෙත් ටික වෙලාවකින් නැවතත් එය ඇසෙන්ට විය.

ගසට නැග හොඳ හැටි අල්වා ගත් හැන්ස් මේ සතා නියම වශයෙන් දැක ගැනීමට සිතා තමා අත තුබුණ දඬු කඩ ශබ්දය නිකුත් ව ආ ගස් ගොමුවට වීසි කෙළේ ය. එකෙණෙහි ම ඇති වූයේ පොරට සැරසෙන්නා වැනි තද ගෙරවීමකි. තවත් ටික වේලාවකදී මේ ගස් ගොමුවේ සිට ලොකු ඌරෙක් මැත් වී ගියේ ය. ඌරාගේ ඇඟේ නැගී සිටි හැම දළ රෝමයකින් ම උගේ දරුණු කම පෙනී ගියේ ය. තියුණු දෙනෙතින් බලාගෙන හොඳ හැටි කන් දීගෙන ඌරා එහි නැවතී සිටියේ ය. පෙනෙන මානයක සතුරකු නොවූවත් තවමත් සැක සිතින් යුතු වූ ඌරා එහි නොසිට යන්ට ගියේ ය.

දළ ලෝම සහිත දෑඩි සමක් හා තියුණු දළ දෙකක් ද ඇති මෙතරම් ශක්තිමත් ඌරා සතුරු උවදුරක් ගැන සැකයෙන් බියෙන් මෙසේ හුන් තැනින් පහවී යනු දුටු හැන්ස්ට වන ජීවිතයේ ඇති බිය ජනක බව වචනයෙන් විස්තර කළාට වඩා හොඳින් පෙනී ගියේ ය.

සතා එතැනින් පහවී ගිය විට පවා බොහෝ වේලාවක් යන තුරු හැන්ස් ගසින් නො බැස්සේ ය. ගසින් බැසීමට පෙර හේ තවත් දණ්ඩක් කඩා ගස් ගොමුවට විසි කෙළේ ය. එහෙත් සහජ දැනීමකින් මෙන් ශබ්ද නොකරන්ට හේ ප්‍රවේසම් විය. තම පරම්පරාවෙන් අයිති ව ශතවර්ෂ ගණනක කාලයක් තුළ අභ්‍යන්තරයෙහි සැඟවී තුබුණ ආත්මාරක්ෂාව පිළිබඳ ඉන්ද්‍රිය එකෙණෙහි නැගී සිට එහිදී හැසිරිය යුතු පිළිවෙත ඔහුට කියා දුන්නේ ය.

ගසින් බිමට බට හැන්ස් ඒ සතා අත්හැර ගිය තැනට ඇදුණේ ය. එහි වූ ගසක් මුල ගැඹුරට සැරු වළක, අඩක් කා ඉතිරි වූ අල ගෙඩියක් පෙනෙන්ට තුබුණේ ය.

''ඌරකුට කෑ හැකි දෙය මට කෑමට බැරි කමක් නැත,'' යි හේ සිතුවේ ය. එයින් ඇබිත්තක් කොණහා විකූ හෙතෙම අලය රසවත් බව දුටුවේ ය.

ගසකින් වියලි අත්තක් ගෙන එහි කෙළවරක් උල සිටින සේ කඩාගත් හැන්ස් එයින් හාරා වටේට පස් බිඳ ඉවත් කරමින් අලය සැරුවේ ය. පැය දෙකක තරම කාලයක් වෙහෙසීමෙන් ඔහුට ඒ මහත් අලය සාරා ගොඩට ගැනීමට හැකි විය. බඩගින්න තදින් දැනුණ නමුත් හැන්ස් එය අධික ව නො කෑවේ ය. ''මෙය ඌරාට පත්තියම් වූවත් මට එසේ පත්තියම් නොවෙන්ට බැරිකමක් නැත,'' යි හේ සිතුවේ ය.

ඕනෑකම ඇති විට නුවණ පහළ වෙයි. කැස්බෑව බිජු ලන තැන කෙසේ සොයා ගන්නේ දැයි සලකා ගත්තාක් මෙන්

මෙහිදී ද අලය ලැබීමට හැරිය යුතු තැන ඌරා දැන ගත්තේ කෙසේ දැයි හැන්ස් කල්පනා කෙළේ ය. නටුවෙන් කැඩී වෙන් වී ගිය සිහින් වැලත් එහි තිබෙනු හැන්ස් දුටුවේ ය. මේ අලයෙන් නැඟුණ වැල විය හැකැයි සලකා ගත් හේ එය අල්ලා ගසින් පහතට ඇද සිහින් කොළ ඇති ඒ වැලෙහි ස්වභාවය අනාගත ප්‍රයෝජනය සඳහා තේරුම් ගත්තේ ය.

වනය පිළිබඳ කිසිවක් නොදන සිටි හැන්ස්ට බීමට දිය සපයා ගැනීමේ ප්‍රශ්නය සිහි නො වුණේ ය. එක් මහ ගසක පිටට නෙරා ගියා මහ මුල් අතර භාජනයක් මෙන් සෑදී සිටි තැනක දිය රැසක් එකතු ව තිබී හමු වීම ඔහුගේ භාග්‍යයක් විය.

එතැන වැතිරී විඩා හළ හැන්ස් සුදු හිරු රැස් ලප සහිත ගස් සෙවණැල්ලේ වැතිර ගෙන අවට රැව් දෙන සියොතුන්ගේ නාදයට කන් දෙමින් විවේකී ව සිටීම කොතරම් සතුටු උපදවන දෙයක් දැයි සිතුවේ ය. කොළ රිකිලි අතර ඇදී යන පෙර නොදුටු කුඩා කුඩා සතුන් පරීක්ෂාවෙන් බලා සිටි හේ ඔවුන් ගැන තොරතුරු දැන ගැන්මට ඇත්නම් කොතරම් හොඳ දැයි සිතුවේ ය. මේ අපූරු පුංචි සතුන් අර නපුරු ගොරහැඩි වල් ඌරා සමග එක වනයේ එකට විසීම කොතරම් නරක දැයි ඔහුට සිතුණේ ය. තමාගේ වැලමිට ළඟ අත්තටු සැලෙන සිහින් හඬක් ඇසී හැරී බැලූ ඔහුට නිල්වන් කුඩා කුරුල්ලන් දෙදෙනකු එම රුක් සිදුරේ දිය බොන බව පෙනිණි. වන ජීවිතය හොඳින් දැක ගැනීමට නම් නිශ්චල ව බලා සිටිය යුතු ය යන පාඩම හැන්ස් මෙහිදී ඉගෙන ගත්තේ ය.

මෙසේ සතුටු සහගත සිතකින් යුතු ව නිදි කිරා වැටෙමින් සිටි හෙතෙම අඩි ශබ්දයක් ඇසී කලබල විය.

වරක් තමා දෙසට එන සේ ඇසුණු අඩි ශබ්දය තවත් වරක දුරට යන්නාක් මෙන් ඇසිණ. පසු ව අන්තිමට අඩි ශබ්දය දුර ව නොඇසී යාම නිසා තමා නොදන්නා කිසිවකුගේ අඩි ශබ්දය පිළිබඳ ව ඔහු කෙරෙහි පැවති භය දුරු ව ගියේ ය.

හිරුගේ අන්තිම රැස් දහර මැකී යාමත් සමග ම පක්ෂීන්ගේ නාදය නැවතිණි. මහ වනය ඉක්මනින් ම අඳුරු ව ගියේ ය. එහි පැවති මහත් නිශ්චලතාව ඔහු කෙරෙහි බියක් ඇති කර විය. මහා භූතයකු තම පියාපතින් වනය වසා ගත් කලක මෙන් උවදුරක් පිළිබඳ බියකින් හේ වෙළී ගියේ ය. කුඩා කල අරාබි නිශොල්ලාසයේ කථාවක් ඇසීමෙන් තමා තුළ ඇති වී සිත් තුළ සැඟවී තුබුණ බියක් නැවත ඇවිස්සී ගියේ ය. තමාට හිතවත් තරු රැසින් එළිය වුණ මුහුදු වෙරළ කරා නැවතත් යාමේ ආසාවක් ඔහු තුළ ඇති වන්නට විය.

එහෙත් එවලේ ඔහුට කළ හැකි එක ම දෙය වූයේ මහ ගසකට නැග එහි ඉඩ කඩ ඇති, බිමට ඇද වැටීමේ අවදානමෙන් තොර අතු දෙබලක වැතිර ගැනීම පමණකි. මහත් භක්තියකින් කළ යාච්ඤාව ඔහුට දෙවියන් මෙන් ම තමාගේ ගෙදර ද සිහි කර වී ය.

වෘක්ෂ රාජයයේ අඳුරට මැදි ව සිටි හැන්ස්ට අඳුරත් එක් උවදුරක් ලෙස පෙනී ගියේ ය. උදය වන විට ජීවතුන් අතර සිටිම් දැයි හේ කල්පනා කෙළේ ය. ඔහුට කඩින් කඩ නින්ද ගියේ ය. අවදි වූ හැම වරක ම මහත් බියකින් ඔහුගේ සිරුර හිරිවැටී ගියේ ය. හදිසියේ ම එක් ගැඹුරු ගෙරවීමේ හඬකින් වනය දෙදරුම් කෑවේ ය. දඩයම් සොයා යන බඩගිනි ඇති සතකුගේ සිහින් ගෙරවීම වැනි හඬක් දිගින් දිගට ඇසෙන්ට විය. ඒ සමග ම අනතුරක ඉව දැනී පලා යන සතුන් රංචුවකගේ හඬ ගැම වැනි හූ හඬක් ඇසිණ. මෙකී ශබ්ද අඩු වී යනවාත් සමග ම මර බියෙන් මොර ගසන සතකුගේ කෑ ගැමක් අඳුර විනිවිද පැතිර ගියේ ය. හැන්ස්ගේ මුළු සිරුර බියෙන් සීතල වී හේ වෙවුලන්ට විය.

බඩගිනි සතා තමාගේ ගොදුර පොළඹවා එළියට ගත්තේ ය. කුරුමානම ඇල්ලුවේ ය. දඩයම කෙළේ ය. ඒ රැයේ ඉතිරි කොටසේදී හැන්ස්ට කෙසේ වත් නිද ගත නො හැකි විය.

අලුයම නිදිමතේ හැඬූ පක්ෂීන්ගේ නාදය හැන්ස්ට දේව දූතයාගේ ශුභාරංචියක් මෙන් විය. වන වාදක මණ්ඩලයේ මිහිරි ගීත වාදනයට හේ කන් දීගන සිටියේ ය. ගායනයේ උත්කර්ෂ-වත් අවස්ථාව පැමිණෙනවා සමග ම පක්ෂීන් එකිනෙකා ලැග සිටි තැනින් ඉගිලී ගොදුරු සොයා යාම නිසා හඬ ක්‍රමයෙන් සිහින් වන්ට විය. ඒ එසේ ව ගිය නමුත් තුරු මුදුන හිඳිනා කුරුල්ලන් හා කිරිල්ලියන් එකිනෙකා අමතන මිහිරි ගී හඬින් මුළු දවසේ ම වනය ගීතවත් වී ය.

හැන්ස් තමා හාරා ගෙන ආ අල ගෙඩියෙන් කොටසක් කා රුක් සිදුරෙන් දෝතට ගත් දිය බීවේ ය. ලොකු දණ්ඩක් ආයුධය කොට ගත් හෙතෙම රාත්‍රියේ තමා ඇසූ මර ලතෝනිය විහිදුණ දෙසට ප්‍රවේසමෙන් ගමන් කෙළේ ය. බොහෝ දුර සෙවීමෙන් පසු මරා දමා තුබුණ මුවැත්තියකගේ මළ සිරුර ඔහුට හමු විය. මළ මුවැත්තියගේ බඩවැල් ඇද කා තිබිණ. මුවැත්තිය මැරීමේදී ඇති කර තුබුණ තුවාල බිය එළවන සුලු වූයෙන් හැන්ස් එහි නොසිට පලා යාමට හැරුණේ ය. එහෙත් මසක් සඳහා ඔහු කෙරෙහි පැවති ආසාව ඔහු එයින් වළකාලී ය. තමා අත කිසි ම ආයුධයක් නොමැති හෙයින් සතාගේ මසින් කොටසක් කපා ගෙන යාම ඔහුට කළ නොහැකි වූයෙන් හේ සතාගේ බඩේ

පැල්ම අතරෙන් අත දමා උගේ හදවත හා කැවුත්ත ද කඩා ගෙන තවත් එතැන නොසිට පෙර සිටි ගසට ම පලා ගියේ ය.

මෙතරම් දරුණු ලෙස මුවැත්තිය මරා බඩවැල් ඇද කා ගිය සතා නින්දක් නිදා හිඳ නැවතත් ගොදුර කරා එන බව හොඳින් තේරුම් ගත් හැන්ස් දෙදිනක් ගත වන තුරු තමා සිටි ගසින් ඉවත් වීමට බිය විය. ඔහුට කෑමත් බීමත් එහි තුබුණේ ය. එහෙත් දෙවෙනි දින හවස වන විට මුව කුණෙන් හමා එන්ට වූ දුගඳ ඔහුගේ ආහාර රුචිය පවා නැති කෙළේ ය. එහෙයින් හේ නැවතත් අල ගෙඩියෙහි රස වින්දේ ය.

ඔහු අල ගෙඩිය කා ඉවර වනවාත් සමග ම තැති ගත් ලේනකු-ගේ හඬක් ඇසෙන්ට වූයෙන් හේ එදෙසට නෙත් යොමු කෙළේ ය. එකෙණෙහි ම තැති ගත් හැන්ස් වහා ගස උඩට නැග ගත්තේ ය. දිවියා ගස මුලට පැමිණ අවට ඉව කොට බලා ගස මුල සිදුරේ වූ දිය බොන්ට වන්නේ ය. "අපොයි, මගෙ දිය ටික!" හැන්ස් දුක් විය. දිවියාගේ දිය බීමේ සීමාවක් නැති සේ පෙනිණ. බොහෝ වේලාවකට පසු ඌ හිස ඔසවා දෙතොල ලෙව කෑවේ ය. ඉන් පසු ඌ එහි ආ සැටියෙන් ම නිසොල්මනේ ආපසු යන්ට විය. දිය ටික අන්තිම බින්දුවට ම ඌ බී ගොස් තිබිණ.

පසුව ද මුළු දවසේ ම සොයා ඇවිදීමෙනුත් හැන්ස්ට කෑමට යමක් හෝ බීමට දිය පොදක් හෝ සොයා ගත නො හැකි විය. එපමණක් නොව අමු අලත් අමු මසුත් ආහාරයට ගැනීම නිසා ඔහුගේ උදරය ලෙඩ වූවා සේ දැනෙන්ට ද විය. බඩ ඇතුළත ගැට ගැසෙන්නාක් මෙන් ම ඉතා තද වේදනාවක් පහරන්ට ද විය. ඔහුගේ ඔක්කාරයත් කෙඳිරියත් වනයේ රැව් දුන්නේ ය. බඩ පෙරළි කරමින් වමනය වන්නට ආ නමුත් බඩ ගැට ගැසී යාමෙන් එය වැළකී ගියේ ය. අධික ලෙස බියට පත් වූ හෙතෙම අම්මේ කියමින් කෑ ගසන්ට විය. අම්මා හිටියා නම් සුදුසු ප්‍රතිකාරයක් කරනු නොඅනුමාන ය.

එහෙත් මේ වනය මැද ඔහු ඉන්නේ හුදකලාව ය. ගසකින් වැටුණ කොළයකත් ඔහුත් අතර වෙනසක් නොමැත. ඩහදියෙන් තෙමී මළ සිරුරක් මෙන් සුදුමැලි වී එහි වැතිර සිටි හැන්ස් ජීවත්වීමේ ආසාව අත හැර, "අහෝ දෙවියනි, අහෝ දෙවියනි," යි කියන්ට වන්නේ ය.

අඳුර දැඩි වී එන විට හැන්ස් තමා වැටී සිටි, සතුන් රාත්‍රියේ ගමන් කරන මගින් ඉවත් ව, එතැන ම වූ ගල් කුළක් මත්ට ඇදුණේ ය. රාත්‍රිය බිය ජනක එකක් විය. තමා සිටි ගල ආවර-ණය කොට පැතිරී සිටි විශාල ගසේ අතුපතුර විශාල පියාපත් ඇති භූතයන් අරක් ගෙන ඇති සේ පෙනිණ. ඔවුන්ගේ හඬ

තැළීමත් පියාපත් ගැසීමත් නිසා ඇඟට වෙහෙස දනුණු ප්‍රමාණයට නිද ගැනීමට ඔහුට ඉඩක් නො ලැබිණ.

උදේ එළිය වැටී ගන එන විට ගසින් වැටුණු ගෙඩිවල සටපට ශබ්දයෙන් හැන්ස් අවදි විය. ඉදී බෙරි වූ ගෙඩියක් ඔහුගේ මුහුණටත් වැටුණෙන් හේ ඇස් හැර බැලී ය. තමා සිටි තැන අහස වසා සිටි, අමුතු ස්වරූපයක ගසක් විය. අරළු රැසකින් සැදුණු එහි කඳ ගලක් අද්දරින් නැගී වැඩී ගිය එකකි. විශාල ලෙස විහිදී ගිය අතුපතර ඇති මේ ගසේ අතුවලින් පහළට එල්ලා වැටුණු මුල් පොළොවට එරී අතුවලට තැබූ රුකුල් සේ පෙනුණු අතර එසේ ඇදුණු තවත් සමහර මුල් පොළොවට නොවැද නිදහසේ අහසේ වැනෙමින් තිබිණ.

ගසේ අතුපත් අතර විවිධ වර්ණවත් නොයෙක් වර්ගවල පක්ෂීහු එක එක තාලයට නාද කරමින් එහා මෙහා පනිමින් සිටියහ. ගසේ අතු රතු පාට වටකුරු කුඩා ගෙඩිවලින් පිරී තිබිණ. කුරුල්ලන් එහා මෙහා පනිමින් මේ ගෙඩි කෑ අතර ඉදී බෙරි වී ගිය ගෙඩි නටුවලින් ගිලිහී සට සට ගාමින් වියලි කොළ මත පතිත වන්ට විය.

හැන්ස් උදසීන ලෙස මෙයින් එක් ගෙඩියක් අවුලා සපා බැලුවේ ය. එහි ඇතුළත අත්තික්කා ගෙඩියක ඇතුළත මෙන් සිහින් ඇටවලින් පිරුණේ ය. එහි රසය කටට හිතවත් සේ පෙනිණි. හේ වඩ වඩා ගෙඩි අවුලා ගෙන කෑවේ ය. දිය ටිකක් සොයා ගත හැකි නම් තමාට බලාපොරොත්තු සහගත විය හැකි සේ ඔහුට පෙනිණි. වල් සතුන්ගෙන් හා පක්ෂීන්ගෙන් ද කෑ යුතු දේ පිළිබඳ උපදෙස් ඔහුට ලබා ගත හැක.

ඔහු ගල් කුළේ ඉහළට නැගුණු නමුත් අවට වසා සිටි රුක් ගොමුව නිසා එහි දුරින් යමක් දැකිය නො හැකි විය. නියම අරමුණක් නැති ව නිකම් ඇවිදීමේ තේරුමක් නැතැයි සැලකූ ඔහු එහි හිඳ ගෙන කල්පනා කරන විට ගලේ පහතින් පරඬැල් තැළෙන සර සර හඬක් ඔහුගේ කනේ වැටුණේ ය. හේ ගලෙන් පහතට බැස නොපෙනී නිශ්ශබ්ද ව සිටියේ ය. සතා යන හඬත් ඉව අල්ලන හඬත් ඇසූ හේ පහතට එබී බැලුවේ ය. ඒ ඉත්තෑයෙකි—ඇම්ස්ටර්ඩෑම් නගරයේ කූඩුවක දමා සිටි ඉත්තෑයකු හැන්ස් දැක තිබේ—ඉත්තෑයා වනය දෙසට ඇදුණේ ය.

දිය බිඳක්, අහෝ දිය බිඳක්! හේ කෙඳිරි ගෑවේ ය. රාත්‍රියේ පැවති අසනීපයෙන් පසු ඔහුගේ පිපාසය අධික විය. දිය පිළිබඳ බලවත් ආසාව ඔහුට සිතන්ට සැලසුවේ ය. මේ කුරුල්ලන්ට දිය බොන්ට ඕනෑ. උන් දිය බොන්නේ කොහෙන් ද? උන් මේ ගහේ ඉදුණු ගෙඩිවල ඉස්ම විතරක් ද බොන්නේ. . . . . . ? එතකොට මේ ඉත්තෑයා මේ ගල උඩට ආවේ කුමක් පිණිස ද?

මේ හරියේ දිය වළක් තියෙන්ට ඕනෑ. මෙසේ සිතූ හැන්ස් හෙමින් හෙමින් ඉදිරියට යන්ට විය. මේ අතර ඔහුට කුකුළකුගේ කල කල හඬක් ඇසෙන්ට විය.

"කුකුළා මේ ගහේ ගෙඩි අවුලා කන්ට එන්ට ඇති," හේ සිතා ගත්තේ ය. කුකුළු හඬ නැවත නො ඇසුණේ ය. හේ නැවතත් නැගිට දුර්වල ලෙස අඩිය තැබුවේ ය. ගලේ ගහ කොළ නැති හරියෙන් නැවතත් කුකුළු හඬ ඇසිණ. ඔහු ඒ දෙස බලන විට ම සතුටු හඬකින් හඬ ලෑ කුකුළා එක් තැනක සිට ඉගිල ගියේ ය. මේ මුඩු ගලේ කුකුළා කුමක් කළේ දැයි විමසීමට ඔහුට ඕනෑ විය. ගලේ දුර පෙනුම අවුරා සිටි උස් ගල් තලය නැග පසු කළ හැන්ස් දුටුවේ ප්‍රීතිය ඉසිලිය නොහැකි තරමේ වූ දර්ශනයකි. ගල්තලාව මත සෑදුණ පොකුණක් පැහැදි දියෙන් පිරී තිබිණ. හිම මෙන් සුදු ඕලු මලක් දිය මතු පිට ඉල්පෙමින් තිබිණ.

පොකුණ ළඟ මුණින් තලා වී දිග ඇදුණ හැන්ස් වන සතකු මෙන් දියට හොට තබා බඩ පිරෙන තුරු දිය බීවේ ය. හේ ඕලු මලට යටින් අත යවා එය ඔසවා ගන්ට තැත් කෙළේ ය. එහෙත් එය දිග නටුවකින් ගසට සම්බන්ධ ව ඇති බව පෙනී ගියෙන් හේ මල නොකඩා එය සිඹ සැනසුණේ ය. ඇඟ පුරා දිය ඉස ගත් හැන්ස් එහි වැතිරී හිඳ අහස දෙස බලා දෙවියන්ට ස්තුති කෙළේ ය. තමාට දිය පොකුණට මග පෙන්නූ ඉත්තෑයා-ටත්, කුකුළාටත් ස්තුති කෙළේ ය. තමා වෙතට කැඳවා මිහිරි ගීතයෙන් සංග්‍රහ කරන, ගසේ එහා මෙහා පැන පැන කෙළින කුරුළු කැලට ද එසේ ම ස්තුති කෙළේ ය.

හැන්ස්ට එද ප්‍රීතිමත් විවේක දවසක් විය. වඩා රස නැති නමුත් බඩගිනි නිවාලන එම ගෙඩි කෑවේ ය. ගසේ නිතොර ව එහා මෙහා පනිමින් සිටි කුරුල්ලන් පරීක්ෂාවෙන් බලා සිටියේ ය. මද්දහන වන විට ගසේ කුරුල්ලන් අඩු ව ගිය නමුත් හවස වන විට කුරුල්ලෝ තම තමන් ලගින තැන් කරා යන්නට පෙර බඩ පුරවා ගෙන යාමට එහි පැමිණියහ.

එහෙත් අඳුර පැතිරී ගෙන එන විට ගස නැවත ද රළු හඬින් කෑ ගසන නිශාචර භූතයන් අරක් ගත් තැනක් වී ය. මොවුන්ගේ කෑ ගැමෙන් හැන්ස්ගේ ඇඟ හිරිවැටී ගියේ ය. ගත වූ රාත්‍රියේ පැවති දරුණු පීඩාවලින් මිදී තවත් ජීවත් වන ඔහුට ඒ ගැන සිතීමෙන් සිතට ධෛර්යයක් ගත හැකි විය. මෙසේ හිත හද ගත් හේ තමා සොයා ගත් දිය පොකුණ ළඟ ගල් තලයේ වැතිර නිද ගත්තේ නින්දේදී සිහිනයෙන් ආර්නම් නුවර තමාගේ නිවසේ තමා සැප සේ සිටින බව දුටුවේ ය. එහිදී හැන්ස් තමා-ගේ ඇඳේ නිදා සිටි අතර මවත් පියාත් සෙමින් කථාබස් කරන

අයුරු හේ ඇසුවේ ය. මෙසේ නිදා සිටි හෙතෙම හදිසියේ ම අවදි වී ආදිම මිනිසුන් පෙළුණ බියකින් පෙළෙන්ට විය. ගසේ අතුපතර අතරින් නැගෙන වවුලන් කෑ ගසන හඬත් සමග ම වියලි කොළ අතර පා ගැටෙන හඬක් ඔහුට ඇසිණ. ඒ සමග ම කිසියම් සතකු දුව එන අඩි ශබ්දයක් හා බල්ලන් දෙදෙනකු උනුන් කා වැටෙන විටක මෙන් දහලන ගොරවන මහා කලබල-යක් ද ඔහුට ඇසුණේ ය. මේ කලබලය එක් වර ම නතර විය. නිශ්චලතාව පැතිර ගියේ ය.

ඉතා හෙමින් ඔහුගේ බිය හිඳී ගියේ ය. ප්‍රවේසමෙන් අඳුර විනිවිද බලන ඔහුට, ගලෙන් බාගයක් නැග ඉව අල්ලන සතකුගේ හුස්ම වැටීම ඇසුණේ ය. මේ සතුන් රාත්‍රියේ දිය බීමට මෙහි එන්නේ යයි ඔහුට සිතා ගත හැකි විය. සිතිවිල්ලත් සමග ම එතැනින් නැගී සිටි හේ වහා අසල පඳුරක් වෙතට ඇදුණේ ය. සතුන් දිය වළට බැස දිය බොන බව ඔහුට ඇසුණේ ය. එකකු දිය බී ඉවර වූ පසු අනිකෙක් ද දිය බීවේ ය. බොහෝ ලෝම සහිත ලොකු සතෙක් අඳුරු ඡායාවක් මෙන් ගල මත ටික වේලාවක් බලා සිටියේ ගලෙන් පහතට බැස නුග ගස දෙසට ගියේ ය. ඌත් උගේ ගැහැනු සතාත් ගස යට වැටුණ ගෙඩි අවුලා කමින් සිටියෝ ය. ටික වේලාවකින් දෙදෙනා ම එතැනින් ඉවත් ව ගියෝ ය.

හැන්ස්ට දැන් කාරණය සිතා ගත හැකි විය. දවල් කාලයේ ඒ තරම සිත් ගන්නා සුලු ව පැවති මේ දිය පොකුණ රාත්‍රි කාල-යේදී ගොදුරු සොයා යන සතුන් දියට ඇදී එන තැනකි. නොදැනුවත්කම නිසා ඔහු ඒ නිදා සිටියේ සතුන් එන මග හරහා ය. හැන්ස් අනතුරුදායක ක්‍රීඩාවක් උගනිමින් සිටින්නේ අවදානම් බහුල පාසැලක ය.

''වක්-හූ; වක්-හූ'' යයි හඬක් ඔහුට අලුයම ඇසිණ.

ගසක මුදුනේ අළුපාට ලොකු කුරුල්ලෝ දෙදෙනෙක් ලැග උන්හ. හැන්ස් ගෙදර සිටියදී දැක පුරුදු කොබෙයියන්ට මොවුහු සමාන නො වූහ. ඔහු බලා සිටියදී තවත් එවැනි යුවළක් එතැනට පියාඹා ආහ. ඒ සමග ම ඒ වර්ගයේ තව තවත් කුරුල්ලෝ එහි ආහ. ඉන් පසු ව කුඩා නීල කොබෙයියෝ රංචු වශයෙන් එහි ආවෝ ය. මෙසේ ආ කුරුල්ලන්ගෙන් ගස් මුදුන් වැසී ගියේ ය. මේ සිටින කුරුල්ලන් පෙර දින ගසේ ගෙඩි කෑ කුරුල්-ලන් වශයෙන් හැන්ස් හඳුනා ගත්තේ ය. එසේ නම් ඔවුන් කෙළින් ම නුග ගසට නොගොස් මෙසේ මේ බලාපොරොත්තු-වෙන් සිටින්නේ මන්දැයි හේ පුදුමයෙන් කල්පනා කෙළේ ය. මෙවේලේ, තමා කලින් ම දුටු බටගොයින් දෙදෙනා ගසින් ඉගිලී ගොස් පහළ ගල් තලයේ වැසූහ. තවත් බටගොයි ඔවුන්

අනුව ගියෝ ය. කලින් ගල් තලයට බැස ගිය කුරුල්ලෝ එතැනින් නැගී නුගයට පියැඹුවෝ ය.

මෙයින් කුතුහලයට පැමිණි හැන්ස් ගල මතට නැඟ පහතට එබී බැලුවේ ය. එහි දක්නට ලැබුණේ එකිනෙකා පොරකන කුරුළු පොදියකි. පොකුණේ බෑවුම් සහිත ගල පිහිටි කොටසේ සිට දියට ළං වීම පහසු වූ හෙයින් එතැනින් දිය බීමට කුරුල්ලෝ එහි රොක් ව සිටියහ. බටගොයින් හා අළු කොබෙයියන් ද ඉගිල ගිය පසු සුදු හිස් හා පබළු වැනි තුඩු ද ඇති වටු කුරුල්ලන් සමූහයකගෙන් එතැන ඉඩ පිරවිණ. මේ වර්ගයේ පක්ෂීන් ගසේ සිටිනු ඔහුට දක්නට නො ලැබුණේ ය. බිම ඇවිද ආහාර සොයා ගන්නා වර්ගයේ පක්ෂීන් දැකිය හැකි වන්නේ යටි කැලයේ දී පමණකි.

සමූහ වශයෙන් කුරුල්ලන් රැස් ව සිටිනු දුටු ඔහුට කොබෙයියකු දෙන්නකු අල්ලා ගත හැකි නම් මැනවැයි අදහසක් පහළ විය. ගලක් හෝ දණ්ඩක් හෝ ගෙන එල්ලය බලා ගැසීමට අදහස් කළ හේ එයින් කුරුල්ලන් බිය ගෙන ඉගිලී ගියේ නම් නැවතත් එහි නොඑතියි සිතුණ හෙයින් ඒ අදහස අත් හළේ ය. කලබල නොකර කුරුල්ලන් අල්ලා ගත හැකි උපක්‍රමයක් ගැන හේ සිතන්ට විය.

ගල් තලය පැතිර තුබුණ ප්‍රමාණය ඔහු සිතුවාට වඩා විශාල විය. එහි පහත කොටස වැඩුණ ගස් පඳුරු ආදියෙන් වැසුණේ විය. පොල්ලකුත් අතින් ගෙන එහි ඈත මෑත ඇවිදින හැන්ස්ට එහිදී අමුතු වර්ගයක ගසක් දක්නට ලැබිණ. කොළ නැති ව වැඩුණ අතු රිකිලිවලින් යුතු මේ ගස් වර්ගයේ කඳ දර හා කටු ද සහිත විය. මේ නම් ගල්වල බහුල ව වැඩෙන දළුක් ගස් ය. එහි රිකිල්ලක් දෙකක් කැඩූ ඔහුට එයින් කිරි ගලා එනු දක්නට ලැබිණ. කිරි ඇඟිලි අගින් ගෙන විමසා බැලූ ඔහුට එහි ඇති ඇලෙන සුලු ගතිය දත හැකි විය. එහෙත් පසුව ද උදය වන තෙක් ඔහුට තමාගේ අලුත් සොයා ගැනීමේ ප්‍රතිඵල බලා-ගත නොහැකි විය.

පසුව ද උදයේ කුරුල්ලන් දිය බොන ගල් පොකුණ අසල නොසැලකිලි ලෙස සිටුවා තුබුණ කොළ හැලී ගිය අත්තක් විය. එද උදයේ ගලේ උස් තැනක ලැග සිටි බටගොයකුගේ තියුණු දෙනෙත මේ සැක සහිත නුපුරුදු දෙය දෙස පරීක්ෂාවෙන් යොමු කර තිබෙනු දක්නට ලැබිණ. මේ ආගන්තුක ඉපල කුරුල්ලන්ගේ සැකයට භාජන විය. එතැනට බැසීමට තරම එඩිතර වූ කුරුල්ලෝ ටික දෙනා කෙළින් ම ගල මතට බැස ගත්හ. සමහර කොබෙයියෝ එතැන වූ නුගයටවත් නොගොස් අනික් අතක් බලා ගියාහ. මේ ගන වනයෙහි පවා පැමිණිය හැකි

අනතුරක් ගැන වූ ඔවුන්ගේ සහජ හැඟීම කොතරම තියුණු දැයි හැන්ස් කල්පනා කෙළේ ය.

අනතුරක ඉව ඇති ව කුරුල්ලන් එසේ පලා ගිය ද හැන්ස්ට බඩගින්නෙන් හෝ පිපාසයෙන් හෝ පීඩා විඳින්ට සිදු නො වේ. එහෙත් ඔහුට ඒ ගෙඩිවල කිසි ම රසයක් නැත.

එද හවස ලොකු මල් කුරුල්ලකු, තමා අටවා තුබුණ ලැවෙහි ඇලී තටුගසන බව හැන්ස්ට දක්නට ලැබීමෙන් ඔහුට මහත් ප්‍රීතියක් ඇති විය. කුරුල්ලා අල්ලා මරා පියාපත් ගළවා දැමූ හෙතෙම තමා කුඩා කල ආර්නම්හි සිටියදී රසවත් කෑමක් ලැබුණ විටක රස කරමින් කෑවාක් මෙන් කුරුල්ලා සහපිටින් ම කෑවේ ය.

හැම රාත්‍රියක ම වලස්සු දිය වළ කරා ආවෝ ය. ඔවුන් එන යන මං හොඳින් දැන සිටි හැන්ස් ඔවුන්ගෙන් ඈත් ව සිටියේ ය. එක් දිනක් රාත්‍රියේ වලස්සු හතර දෙනෙක් එක වර එහි ආහ. ඔවුහු බුරමින් ගොරවමින් එකිනෙකා පොර කෑවෝ ය. ඔවුන් අතරෙන් ඉවත දිව ගිය වලසෙක් හැන්ස් සිටි දෙසට එන්ට විය. තමා ඌට නොපෙනේ යයි සිතූ හැන්ස් එතැන ම සැඟ වී සිටියේ ය. එහෙත් සතා වඩ වඩාත් ළං විය. හොඳට ම ළං වූ විට හැන්ස් නැගී සිටියෙන් වලසා ගොරවා ගෙන ඔහු මතට පැන්නේ ය. එකෙණෙහි පෙරළී ගිය හැන්ස් කන්දෙන් පහතට ම පෙරළුණේ ය. වලසා ද පසු පස්සේ ම ආවේ ය. වලසා ළං වන විට, එල්ලෙන නුග අරළුවක් බද ගැනීමට ඔහුට යම්තමින් ඉඩ ලැබිණ. ඔහු එහි ඉහළට බඩ ගෑවේ ය. එහි පැමිණි වලසා දෙකකුලින් සිටගෙන දෙ අත ඔසවා හැන්ස්ට පහර දුන්නේ ය. එහෙත් උගේ නිය පහරට අසු වූයේ හැන්ස් ඇඳ සිටි කලිසම පමණකි. එය ගැළවී වැටුණේ ය. කෝපයෙන් ගොරවමින් සිටි වලහා කලිසම කැබලි කැබලිවලට ඉරා දැමුවේ ය. හැන්ස්ගේ බිය සීමා රහිත විය. අධික බිය නිසා ඔහු එයින් රූරා වැටෙන තරමට හේ වෙවුලා ගියේ ය. එහෙත් තමා නිරුපද්‍රැත ව ගසට නැඟුණ බව හැඟීමෙන් ඔහුගේ දෙනෙතට කඳුළු ඉනුවේ ය. එහෙත් ශිෂ්ට සමාජයට සම්බන්ධකම තිබුණ ඔහුගේ එක ම ලකුණ එයින් නැති වී ගියේ ය.

පසු දින උදයේ හැන්ස් ප්‍රවේසමෙන් ගසින් බැස්සේ ය. දිය උගුරක් බීම සඳහා පොකුණට ගිය ඔහුට නැති වී ගිය දේ වෙනුවෙන් වන්දි ලැබුණේ ය. නීල කොබෙයියකු හා බටගොයකු ද ලැවේ ඇලී සිටිනු ඔහුට දකින්ට ලැබිණ. කුරුල්ලන් දෙදෙනා මරා ගත් හේ දතින් සපා උන්ගේ පපුව පලා ලේ රස බැලුවේ ය. මෙලොව කිසි ම ආහාරයක් මෙතරම් රසවත් විය නොහැකැයි ඔහුට සිතිණ.



නැවත නැවත දළුක් කිරි ගැමෙන් අලුත් කෙරුණු හැන්ස්ගේ ලැව දිනපතා ඔහුට ආහාර සපයා දුන්නේ ය. ලැව ගැන දැන ගත්, දිය බීමට එන කුරුල්ලෝ එහි ලැගීමෙන් වැළකී සිටියහ. ඉඳහිට කිසියම් අපරීක්ෂාකාරී කුරුල්ලෙක් පමණක් එහි ලැගීමට රුචි කොට එයට දිවි කැප කෙළේ ය.

වලසා කෙරෙන් වූ අන-වරයෙන් පසු හැන්ස් රාත්‍රියේ නිදා ගත්තේ නුග ගසේ මහ අත්තක් උඩ ය. තොරක් නැති ව කෑ ගසන අඳුරු අවතාරයන් අතර හේ රාත්‍රිය ගත කෙළේය. රැයක් පාසා

හේ ඔවුන් ගැන සිතුවේ ය. උන් ගැන ඔහුගේ කුතුහලය මහත් විය. ඉර බැස ගෙන යන විට දෙතුන් දෙනා වශයෙන් හා රංචු වශයෙන් ද එන මොවුන්ගෙන් නුගයේ අතු පිරී ගියේ ය. හිස පහතට වැටෙන සේ අතු පත්වල එල්ලී ගන්නා මොවුන්ගේ අඳුරු ඡායාව සඳ එළියෙන් ඔහුට පෙනේ. කන තරමට වඩා ගසේ ඉදුණ ගෙඩි බිමට හලන මොවුහු කෑදර කලහකාරී ආත්මාර්ථකාමී සතුන් කොටසක් බව හේ සිතා ගත්තේ ය. ඔවුන්ගේ කෑ ගෑමේත් කලහ කර ගැනීමේත් තොරක් නො වී ය.

එක් දිනක උදයේ ගසින් බට හැන්ස්ට ගස මුල වැටී සිටි මොවුන්ගෙන් එකකු දැකිය හැකි විය. රාත්‍රියේ ඇති වූ පොරකෑමකින් අත්තටුවක් ඉරී ගොස් බිම වැටී සිටි මේ සතා මාවවුල් වර්ගයේ එකකු බව සිතා ගැනීමට ඔහුට පුළුවන් විය. උගේ අත්තටුවේ කෙළවරේ කොක්කක් බැගින් විය. මේ කොක්කෙන් ඌ අතුවල එල්ලී ගනී. මීයකුගේ මෙන් මුහුණක් ඇති මේ සතාගේ සම ලෝමයෙන් වැසී තිබේ. අල්ලද්දී ඌ හැන්ස්ගේ අත සපා කෑවේ ය. ඌ මරා ගල් පතුරක ආධාරයෙන් හම ගැසූ හැන්ස් උගේ මස දිව ගා බැලුවේ ය. එය රසවත් මසක් වූයෙන් හේ ඒ මස් කෑවේ ය. තමා මුලදී යකුනැයි බිය වූයේ මොවුන්ට නොවේ දැයි ඔහුට සිතිණ.

හැන්ස් තමාට නිවාස පහසුවත් ආහාර පහසුවත් සලසා දෙන නුග ගස ද ගල් තලාව ද ප්‍රිය කෙළේ ය. උදේ දිය බීමට යන විට සිනා මුහුණෙන් තමා පිළිගන්නා පිපුණ ඕලු මල් ඇති පොකුණ හේ වඩාත් ප්‍රිය කෙළේ ය.

# 6

# ගල් පොකුණ

සෘතුව වෙනස් වනු සමග ම වන ජීවිතය ද වෙනස් විය. නුග ගසේ ගෙඩි වරා ගෙන යන විට කුරුල්ලන්ගේ එහි ඒම අඩු වී ගියේ ය. කුරුල්ලන්ගෙන් ටික දෙනෙක් පොකුණේ දිය බීමට පැමිණි නමුත් හැන්ස්ගේ උගුලේ අසු නොවීමට ඔවුහු ප්‍රවේසම් වූහ. ඒ සමග ම පොකුණේ ජලය අඩු වී යාම නිසා කුරුල්ලන්ට එයින් දිය බීම ද හොඳට ම අපහසු විය. කොබෙයි-යන් දෙදෙනකු පොකුණට වැටී දියේ ගිලීම නිසා කුරුල්ලෝ එතැන සම්පූර්ණයෙන් අත් හැර ගියෝ ය.

මේ අතර හැන්ස් ගල අද්දර වනයේ දණ්ඩකුත් අතේ ගෙන එහා මෙහා යමින් දකින හැම සතකුට ම ගල් හෝ දඬු කැබලි හෝ එල්ල කළ නමුත් එයින් එක ද සතකුවත් මරා ගත නො හැකි විය.

අතක් පයක් නොසොල්වා නිසොල්මනේ සිටීමෙන් එක් වරක් ළඟට පැමිණි හාවකු අල්ලා ගැනීමට ඔහුට හැකි විය. සතුන් ඇල්ලීමට ඔහු යෙදූ අලුත් ම උපක්‍රමය එය විය.

අන්තිමේදී එක් දිනක, මේ වනයේ වඩා දුර ඇවිදීමට හේ ඉටා ගත්තේ ය.

එද ඌරා නිසා කෑමට ඉගෙන ගත් වර්ගයේ අලයක් සොයා ගැනීමේ ආසාවෙන් ද කුරුල්ලන් කඩා කන වර්ගවල ගෙඩි වර්ග සොයා කමින් ද තමාට ඇසෙන එක එක ශබ්දයන් අනුව යමින් ද හේ දවස ගත කෙළේ ය. කටයුත්තෙහි දුෂ්කරතාව ඔහු තේරුම් ගත්තේ ආපසු තමා සිටි කන්දට යාමට උත්සාහ කිරීමේදී විය. ඔහුට මග සොයා ගත නො හැකි විය. අඳුරත් වැටිණ. ලොකු ගසක් සොයා නැග හේ එහි රාත්‍රිය ගත කරන්ට විය. එද නැව බිඳී මහ මුහුද මැද පා වී ගිය හැටිත් අද මහ වනයේ සිටින හැටිත් එකටෙක පරස්පර ව ඔහුට පෙනෙන්ට වී ය.

මෙහි අවස්ථාවන් දෙක ම එක සමාන ය. එහෙත් පරිසරය පමණක් වෙනස් වෙයි. එද තෙරක් නැති දියෙන් පිරි මහ මුහුද, අද කෙළවරක් නො පෙනෙන එක ම වනය! මෙහිදී බඩගින්න-ටත් වඩා ඔහුට ඉවසිය නොහැකි වූයේ මේ ඉඩවර කාලයේ වූ පිපාසය යි. තමාගේ ඒ අපූරු දිය පොකුණ තවත් හමු නොවෙතැයි බියක් ඔහු තුළ ඇති විය.

පසුව ද උදයේ ගසෙන් බට හැන්ස් නැවතත් මග සොයා යාමට පිටත් විය. මේ වනයේ කොතරම් ඉක්මනින් කෙනකු

මං මුළා විය හැකි දැයි ඔහුට වැටහුණේ මෙහිදී ය. ගමන් කෙළේ අඩි කීපයක් වී නමුත් තමා කලින් සිටි තැන සොයා ගැනීම අපහසු ය. හැම ගසක් ම හැන්ස් දුටුවේ එක ම එක වගේ ය. මහ ගසුත් කුඩා ගසුත් එක එක ප්‍රමාණයේ ගස් එක සමානව ම පෙනේ. එය ඔහුගේ මවිතයට හේතුවක් විය. එහෙත් වඩා ළං ව වඩා පරීක්ෂාවෙන් බැලූ විට ඒ එක එක ගහක් වෙනස් වෙනස් ලක්ෂණයන්ගෙන් යුක්ත බව ඔහුට සලකා ගත හැකි වී ය. තව ම නොපුරුදු දිසාව දැනීමේ ඉව ගැන ම විශ්වාසය නොතබා මේවා ගැන වඩා හොඳින් සලකා බැලිය යුතු ව තුබුණ බව ඔහුට හැඟී ගියේ ය. තමා කලින් දැක මතකේ තුබුණ එකම ගසක් වත් මෙතෙක් ඔහුට හමු නො වී ය. විඩා සංසිඳුවා ගැනීමක් හෝ නො කොට ඔහු නොනැවතී ම ගමන් කළ හෙයින් පෙර දින බොහෝ දුර ගමන් කරන්ට ඇතැයි ඔහුට සිතිණි.

මද්දහන වන තෙක් එසේ ගමන් කළ ඔහුට තමා නිකමිට කඩා විසි කළ අමු අතු රිකිල්ලක් හමු විය. තමා එතැනට පැමිණියේ කොයි දිසාවෙන් ද? ඔහුට එය සිතා ගත නො හැකි විය. ඔහු අවට පිරික්සා බැලුවේ ය. කුඩා කල කියවා ඇති සුරංගනා කතාව ද නුවණැති හැන්සල් මග සලකුණට කඩදසි කැබලි දමා ගිය හැටි ද ඔහුට සිහි විය. වනයේ කඩදසි සෙවිය නො හැක. එහෙත් කුඩා ගල් කැට තිබේ. ගස්වල කොළ තිබේ. ගස්වලින් වැටී වියළී ගිය පරඬලා නොව අමු කොළ තිබේ. මේ නිකමට කඩා දැමූ රිකිල්ල ඔහුට නුවණක් පහළ කෙළේ ය. මගක් නැති වනයේ යන විට අතු රිකිලි කඩා දැමී-මෙන් ආපසු මග සොයා ගැනීම පහසු වෙයි. මේ සිතිවිල්ලත් සමග ඔහුට අමුතු ප්‍රීතියක් ඇති විය.

මෙසේ ප්‍රීති සිතකින් යන ඔහුට තමා කලින් නැවතී සිට විඩා හළ තැනක වූ මහ ගසක් හඳුනා ගත හැකි විය. හිරු බැස යන අත ද ඔහුට මග සොයා ගැනීමට උපකාරි විය. මේ දක්ෂකම්-වලට වඩා වාසනාවකට අඳුර වැටෙන්ට පළමු තමා සිටි ගල් කුළට ළංවීමට ඔහුට හැකි විය. කලින් ඇඹිහිරි රසක් දැනුණ ඉදුණ තුගපල මෙවේලේ ඉතා මිහිරි පලතුරක් විය. ගල් පොකුණේ ඇල් දිය අමෘත පානයක් වැනි විය.

එද ඉගෙන ගත් පාඩම අනුව වනයේ යන විට අතු රිකිලි කඩා දමා යාමටත් අසල වූ ගස් ගල්වල හැඩ රුව සිහියට ගැනීමටත් හැන්ස් අමතක නො කෙළේ ය. එයින් පසු ව ඔහුට වනයේ මග වැරදීමේ බියක් ඇති නො වී ය. මග සොයා යාමේ දුෂ්කරතාව මග හැරී ගිය නමුත් ආහාර සොයා ගැනීමේ දුෂ්කරතාව මග හැරී නො ගියේ ය. වනයට අයත් සජීව අජීව සියලු දෙයක් කෙරෙහි පවතින නිශ්ශබ්දතාව ඔහු හැම විට ම අනුගමනය කෙළේ ය.

ගසක් යට ඉදී වැටුණු ගෙඩි හමු වූ විට ඒවා කුරුල්ලන් තුඩ ගසා ඇද්දැයි හැන්ස් පරීක්ෂා කෙළේ ය. ගෙඩි කෑමට ගසට කුරුල්ලන් එද්දැයි බලා සිටියේ ය. එසේ යයි හැඟී ගිය විට ඒ ගසට නැග ගෙඩි කඩා කැවේ ය. කුරුල්ලන්ගේ හෝ වෙන සතුන්ගේ සිත් නොගත් සේ පෙනුණු ගෙඩි වර්ග කොතරම් මිහිරි සේ පෙනුණත් හේ ඒ ගෙඩි නො කැවේ ය. ශබ්දයක් ඇසුණු විට හේ නිශ්ශබ්දව හිටිවන ම සිට ඊට ඇහුම්කන් දෙයි. දැන් මෙවේලේ ඔහුට ශබ්දයක් අසෙන්ට විය. එය තමා දිය වළ ළඟදී දැක පුරුදු වන කුකුළකුගේ හඬට සමාන හඬකි.

කුකුළා දෙතුන් වරක් හඬලන විට දුරින් අනික් වන කුකුළකුගේ පිළිතුරු හඬක් ඇසිණ. කුකුළෝ දෙදෙනා වරින් වර හඬලමින් එකිනෙකාට අභියෝග කරමින් එකිනෙකා ඉදිරියට ගියෝ ය. නිශ්ශබ්දතාවක් ඇති විය. නිසොල්මනේ කුකුළා පසු පස දුරින් ගිය හැන්ස්ට කෙකර ගෑමක් හා තටු ගැසීමක් ද ඇසිණ. පොරය පටන් ගෙන ඉවර ය. හැන්ස් ඔවුන් හොඳින් පෙනෙන තරම දුරට ළං ව මහ ගසකට මුවහ වී සටන බලා සිටියේ ය. කුකුළන් දෙදෙනාගේ ම කරේ තටු පිපී තිබිණ. දෙදෙනා ම තටු ගසා උඩ පැන එකිනෙකාට පහර දුන්නෝ ය. ඔවුන්ගේ පොර කටු තියුණු සේ දික් ව තිබිණ. උඩ පැන මේ පොර කටුවෙන් අනිකාට ගසන කුකුළා තැන් මාරු කොට අනික් පැත්තට පනියි. මෙය සෙල්ලමට කරන සුළු පොරයක් නොව විසිරී ගිය පැහැයෙන් විදහා ගත් පියාපතින් හා වරින් වර වැරයේ පහර දෙන තියුණු පොරකටුවලින් ද යුතු ව කරන මාරාන්තික නපුරු සටනකි. කුකුළෝ දෙදෙනා ම එක සමාන තරුණ වයසේ වූහ. එකකු උඩ පැන වේගයෙන් ගසන පා පහරට අනිකා ලක් විය. තටු ගැළවී විසිරී ගියේ ය. මොවුන් දෙදෙනාගේ සටන එකකු හෝ දෙදෙනා ම හෝ මිය යාමෙන් මිස අවසන් නොවේ යයි හැන්ස්ට සිතුණේ ය.

පැය බාගයක් පමණ ගත වූ විට සටනේ උග්‍ර අවස්ථාව එළඹියේ ය. එකිනෙකාට තදින් පා පහර දීමත් සමග එකකු අනිකාගේ ලේ ගලන කරමලය හෝ ඇහ මස් ඩැහැ ගැනීම ද දැඩි විය. වහා දුව ගොස් කුකුළන් දෙන්නා බද ගැනීමට නො ඉවසිලිමත් ව සිටි හැන්ස් ඔවුන්ගේ පොරය වඩා සිත් ගෙන තුබුණු හෙයින් සටන ඔවුන් කැමති හැටියකට අවසාන කිරීමට ඉඩ දී නිසොල්මනේ බලා සිටියේ ය.

මොවුහු එකිනෙකා වේගයෙන් පොර වැටුණාහ. නැවත වෙන් වූහ. එකෙක් බිම සිට කර ඔසවා තටු ගසා වෙර ගැනීමට සැරසෙන විට ප්‍රතිමල්ලවයා වහා උඩ පැන පහත් වී අනෙකාගේ කන මුල ගෙල සිදුරු කර ගෙන යන සේ මාරාත්මක පහරක්

ගැසුවේ ය. පහරෙන් පසු ව දෙදෙනා ම බිම වැතිර හති ඇරියහ. ගෙලේ ඇමිණි තුඹුණ පොර කටුව ගළවා ගැනීමට දඟලූහ. මේ අතර විස්මය ජනක සිද්ධියක් ඇති විය. අර මාරාන්තික පහර කෑ කුකුළු නාම්බා නව පණක් ලැබී වහා කෙළින් සිට මුළු වැර එකතු කොට යොද පසමිතුරාට වේගවත් පහරක් ගසන්නේ අනෙකාගේ හිස සිදුරු කර ගෙන යන සේ ගැසී ය.

හැන්ස් ඔවුන් දෙදෙනා අල්ලා වෙන් කෙළේ ය. ඒ වන විටත් එකෙක් මැරී සිටියේ ය. අනිකා යම්තම් දහලා නැගී සිට ජයග්‍රාහක හැඬලීමක් කරන්ට උත්සාහ කෙළේ ය. ඌට තමාගේ නැමී ගිය, බැට කෑ හිස යම්තම් හෝ ඔසවා ගත නොහැකි විය. නැඟූ හඬ දුර්වල විය. එහෙත් එසේ හැඬලීමට උත්සාහ කිරීමේදී එයින් ම හුස්ම හිර වී අනිකාත් මිය ගියේ ය.

හැන්ස් කෙතෙක් බඩසයින් සිටිය ද, අවසානය දක්වා නොපසු බැස සටන් කළ තරුණ කුකුළන් දෙදෙනාගේ සිඳී බිඳී ගිය සිරුරු දෙස ප්‍රශංසාත්මක සිතිවිල්ලකින් යුතු ව එහි හිඳ ගෙන බලා සිටියේ ය. ටික වේලාවකට පසු ව සිහි එළවා ගත් හැන්ස් ඔවුන් දෙදෙනාගෙන් එකකුගේ තටු සිඳ තමාගේ දූවෙන බඩගින්න සන්සිඳුවා ගත්තේ ය.

මීට සති කීපයකට පසු දිනක හැන්ස් ජීවිතය කෙළවර විය හැකි ව තුඹුණ තරමේ බිහිසුණු ක්‍රියාවකට මුහුණ පෑවේ ය. ඔහු වනයේ මහ ගසක් අසලින් ගමන් කරන විට යම් කිසිවක් ඔහු ඉදිරියේ බිම පතිත විය. එය අවුළා ගෙන බැලූ ඔහුට පෙනී ගියේ එය මීවදයක කොටසක් බව ය. එතැන ම සිට උඩ බැලූ හේ ගසේ අත්තක් උඩ වූ කළු ගනලොම් පොදියක් දුටුවේ ය. මේ කළු වලසෙකි. ඌ කලබලයෙන් එහි වූ මීයකට අත ඔබා ගෙන මීවද කඩමින් සිටියේ ය. ඌ වරින් වර මීය තුබූ රුක් සිදුරේ කට පළල් කිරීමට දතින් හැපුවේ ය. අතින් පහුරු ගෑවේ ය. නැවතත් ඇතුළට අත ඔබා මීවදයෙන් කොටසක් කඩා එළියට ගෙන ගිජු ලෙස කටේ ඔබා ගත්තේ ය.

ඌට එය නිදහසේ කර ගත හැකි කාරියක් ව නොපවතින බවත් කෝප වූ මී මැස්සන්ගෙන් හිරිහැර ඇති ව තිබෙන බවත් වරින් වර උගේ දඟලීමෙන් මුහුණ පිසීමෙන් හා පිඹීමෙන් ද පෙනෙන්ට තිබිණි.

මුළු සිත යොදවා මේ ක්‍රියාවේ යෙදී සිටි හෙයින් සතා ගස මුල සිටින හැන්ස් නො දුටුවේ ය. එහෙත් වඩා හොඳින් මුගේ ක්‍රියාව දැක ගනු කැමති වූ හැන්ස් නොසැලකිල්ලෙන් වියලි අතුරිකිල්ලක් මත පා තැබීම නිසා ශබ්දයක් ඇති විය. මෙවිට වලසා කාරිය නවතා වට පිට බැලූ නමුත් හැන්ස් නිශ්චල ව ම

සිටි හෙයින් ඌ ඔහු ගණන් නොගෙන තම කාරියෙහි නැවතත් නිරත විය.

මී මැස්සන්ගේ පහර දීම තව දුරටත් ඉවසා සිටිය නො හැකි වූ වලසා ගසේ කඳ දිගේ වහ වහා බිමට බසින්ට විය. බිමට බට වලහා බිම දිගේ කරණම් ගසන්ට විය. සරකස් කණ්ඩායමක විකට නළුවකු මෙන් එහා මෙහා පැන්නේ ය. බිම දිගේ කරණම් ගැසුවේ ය. කළු ලොමින් වැසුණ ඇඟේ මැස්සන්ට විත් ගැසීමට ඉඩ නැති මුත් විත් කෑ හොම්බ හා තට්ටම ද වරින් වර බිම ඉලුවේ ය. මෙවේලේ මඳක් දුරට වී මොහුගේ මේ විකාර ක්‍රියාව බලා සිටි හැන්ස්ට සිනා නොවී සිටිය නො හැකි විය. ඔහුගේ මහ සිනාවක් ඉබේ ම පිට විය. වලසාගේ කරණම් ගැසීම එකෙණෙහි ම නැවතිණ. ඌ හැන්ස් දෙස කෝපයෙන් බැලුවේ ය. උගේ තත්වයට මදිකමක් කළ සේ, ඌට අවඥාවක් කළ සේ, ඌ සිතාගත්තා සේ පෙනිණි. ඌ වහා ම හැන්ස් කරා එන්ට විය. ගොරව ගොරවා වේගයෙන් ආවේ ය.

මුගුර තර ව ගෙන එහි ම සිටිනු හැර එවේලේ අනික් කළ හැක්කක් නැති සේ හැන්ස්ට පෙනී ගියේ ය. එසේම ඔහුට කිසිවක් කර ගත නො හැකි විය. වලහා එක වර ම හැන්ස්ගේ ඇඟට කඩා පැන ඔහු බිම හෙළුවේ ය. දෙදෙනා ම එහා මෙහා බිම පෙරළෙමින් පොර බැදුවෝ ය. හැන්ස් හොඳ සිහියෙන් සටන් කෙළේ ය. එක් මොහොතක් නිකම් නිශ්චල ව සිටියොත් වලසාගේ තියුණු දතින් හා දරුණු නියෙන් ද සිදු විය හැකි විනාශය ඔහු දැන සිටියේ ය. ඔහුගේ නිරුවත් සිනිඳු සමේත් වලසාගේ දළ ලොමින් වැසුණු ගොරහැඩි සමේත් අතර වෙනස කොපමණ ද? වලසාගේ තියුණු දළ හා නිය හමුවේ මුගුරෙන් ඇති ඵලය කුමක් ද? ඔහු උඩු අතට බිම වැතිරී සිටි අතර ඔහුගේ මුහුණට අඩියකට නුදුරින් තියුණු දත් ඇති, අයා ගත් මුව ඇති, වලසා ය. තව එක මොහොතකදී වලසා පැන ඔහුගේ ඔළු ගෙඩිය බිජුවටක් මෙන් බිඳ දමනු ඇත. හැන්ස් අත තුබුණ මුගුරේ දෙකෙළවර දැතින් අල්ලා සතාගේ ළයට තබා වැරෙන් තෙරපා ඉවතට පැන ගත්තේ ය. වලසා මුගුර සපා කැබලි කෙළේ ය. හැන්ස් ළඟ ම තුබුණ අනික් දඬු කඩක් අතට ගත්තේ ය. දැන් වලසාගේ පිම්ම ඉගෙන ගත් හේ එහා මෙහා පැන උගෙන් බේරුණේ දඬු කඩින් උගේ ඇඟපතට පහර දුන්නේ ය. එය ගණනකට නොගත් වලහා නැවතත් හැරී ඔහු ඉදිරියේ මුහුණට මුහුණ ලා සිට ගත්තේ ය. හැන්ස් අතේ මෙවිට තුබුණේ සතාට පහර දීමෙන් කැඩී ගිය දඬු කඩක් පමණකි. අනික් කළ හැක්කක් නො වූ හැන්ස් මෙයින් උගේ හොම්බට පහරක් දුන්නේ ය. පහර විදුලි වේගයෙන් ක්‍රියා කෙළේ ය. නපුරු වන සතා මෙල්ල වී වහා ආපසු හැරී තවත් එහි නොසිට පලා ගියේ ය.

බිය පහව ගියේ ය. හැන්ස් මූර්ඡා වී එතැන ම මුණින් වැටී හොත්තේ ය.

පැයකට පමණ පසු සිහිය ලැබූ හැන්ස් තමා තුවාල නොලබා බේරී ඇති බව තේරුම් ගත්තේ ය. ඔහුගේ ඇඟ පුරහම වූ නිය පහර හා සීරීම් හැරුණ විට උරයේ තරමක ලොකු තුවාලයක් වී තදින් ලේ ගලමින් තුබුණේ ය. එහෙත් ඒ වෙනුවෙන් කළ හැකි කිසිවක් නොවූයෙන් ලේ ගැලීම නතර වන තුරු කළ සටන ගැන සිතමින් එහි ම උන්නේ ය. දඬු කඩක් හැර අනික් ආයුධයක් නැති ව සිටි නිරුවත් කොලුවකු වූ තමා මෙතරම් දරුණු සතුරකු පරාජය කොට පලවා හැරීම ගැන හේ ආඩම්බර වී ය. ඒ ප්‍රීතියෙන් ඉපිලී ගිය හැන්ස් මෙසේ ඉටා ගත්තේ ය. වනයේ ජීවත් වීමට නම් මොන තරම දරුණු අවදනම් උවදුරකදී නමුත් හොඳ සිහියෙන් ක්‍රියා කළ යුතු බවයි.

මෙවැනි සිතිවිලිවලින් ඔහුට තමාගේ බඩගින්න අමතක කළ නො හැකි විය. හේ ආහාර ගැන සිතුවේ ය. මේ වනයේ සැමවිට ම ඔහු බඩගින්නේ ය. කුරුල්ලන් බිය ගෙන දිය වළ හැර යාමෙන් පසු ව ප්‍රධාන වශයෙන් ඔහුගේ ආහාරය වූයේ ඌරන් හා ඉත්තෑවුන් ද නිසා කෑමට පුරුදු වූ අල වර්ග කීපයකි. ඔහු අත කිසි ම ආයුධයක් නොවූ හෙයින් කුඩා සතකු හෝ දඩයම් කර ගැනීම ඔහුට නො කළ හැක්කක් විය. ආහාරයේ වෙනසක් ඇති විය යුතු බව ඔහුගේ ඇඟට හොඳින් දැනී තිබිණ. එවැනි හොඳ ශක්ති උපදවන මිහිරි ආහාරයක් දැන් ළඟ ම තිබේ. ඒ ගැන සිතන විටත් ඔහුගේ කටට කෙල උනයි.

වලසා නැග මීය කැඩූ; එහෙත් තමාට නැගිය නොහැකි මහ ගස උඩ ඔහු බැලුවේ බලාපොරොත්තුවක් ඇති ව නො වේ. ඔහුට දැතින් බදා ගත නො හැකි තරම මහත ඇති මේ ගසේ අඩි පනහක් පමණ උසට කිසි ම අත්තක් බෙදී නැත. දැතින් ම බදා ගත් විට ගසෙන් බාගයක් වත් දෑතට අසු නොවන තරමට එහි කඳ මහත ය. වලසා ගසට නැගීමේදී උගේ නියවලින් ගස බදාගත් තැන්වල වූ නිය පහරවල් හේ පරීක්ෂා කෙළේ ය. එහෙත් ඌ ගිය සේ ගස බදා යාමට සුදුසු තියුණු නිය ඔහුට නැත. හැම අතින් ම බැලූ නමුත් ගසේ කඳ දිගේ ඉහළට යාමේ ඉඩක් එහි නො වී ය.

ගස මුල වැටී සිටිය මී මැස්සකු අත්ලට ගත් හේ ඌ එහි බඩගා යන සැටි බලා සිටියේ ය. මේ තරම කුඩා සතුන් අර තරම මහත් දරුණු සතුරකු පහර දී පසු බැස්ස වූ වික්‍රමය ගැන හේ කල්පනා කෙළේ ය. ගසේ උඩ දිරා ගිය අතු වටේ ඉගිලෙමින් උන් නගන අනතුරු හැඟවීමේ සිහින් හඬ ඔහුට යම් තමින් ඇසේ. හොඳයි, තමා එහි නැග මීවදය ළඟට ගියොත්

ඔවුන්ගෙන් කවර සංග්‍රහයක් ලැබෙයි ද? ඔහුට දුන් බොහෝ බඩගිනි ඇති හෙයින් මේ වැඩිමනත් දේ ගැන සිතීමට කාලයක් නැත. එහි නැගීමට මගක් සෙවිය යුතු ය.

ළඟ තුබුණ තවත් ගසක උඩ අත්තක් මේ ගසේ පහත අත්තේ වදින තරමට ළංව තිබේ. හේ ඒ අනික් ගසට නැංගේ ය. ඒ අත්තෙන් අනික් ගසේ අත්තට මාරු වීම දුෂ්කර කාරියක් විය. නැවියකු වූ ඔහුගේ හදවත පවා බියෙන් කම්පා විය. එසේ ම ඇති වූ තුවාල නිසා ඔහු හිටියේ ද දුර්වල තත්වයක ය. එහි ටික වේලාවක් ළතැවෙමින් සිටි හේ සිතට ධෛර්‍ය ගෙන, අත්තට මාරුවීමට උත්සාහ ගත්තේ ය. නැමූ දණින් හිටි අත්ත අවුළුවා ගෙන අනික් අත්තට දික්වී යම්තම් ඇඟිලිවලින් එය බද ගැනීමට ඔහුට පුළුවන් විය. හැන්ස් හතිලමින් දෙපසට දෙකකුල් දමා අත්ත උඩ හිඳ ගත්තේ ය. උරයේ තුවාලයෙන් නැවතත් ලේ ගලන්ට විය. මූර්ඡා වේගන එන බවක් හැඟී ගියෙන් හේ අත්ත උඩ බඩ තියා දිග ඇදී අත්ත තදින් බද අල්ලා ගත්තේ ය. ටික වේලාවකින් සිහිය ලැබූ හේ ගසේ මහ කඳ දෙසට බඩ ගෑවේ ය. එතැනින් මීවදය තිබෙන තැනට ද යා ගත්තේ ය. මෙහිදී ඔහු තුවාල වූ අතට වෙහෙස නොදීමට ප්‍රවේසම් විය. එතැනට ළං වූ හේ වලහා උන් සැටි අනුගමනය කරමින් ගතට වැර දී ඉඳ ගත්තේ ය. ඉන්පසු හේ රුක් සිදුරට එබී බැලුවේ ය. මැස්සෝ කලබල වී එහා මෙහා ඉගිලුණා හ. එකෙක් ඔහුට ඇන්නේ ය. හැන්ස් උං තළා දැමුවේ ය. මැස්සා තැළෙනවාත් සමග ම තවත් හත් අට දෙනෙක් මැස්සෝ ඇන්නාහ. ඔහු ටික වේලාවක් කලබල නැති ව හුන්නේ ය. එසේ කලබල නැතිව වැඩ කිරීමෙන් මැස්සන්ගෙන් බැට නොකා සිටිය හැකි බව හේ තේරුම් ගත්තේ ය. එහෙත් නිශ්ශබ්ද ව සිටීමෙන් මීවද එළියට ගත නො හැක. හේ ඉතා සෙමින් මීය තුළට අත යැවුවේ ය. වලහා මීයේ කට පළල් කොට තුබුණ හෙයින් ඔහුට මේ කාරිය පහසු විය. මැස්සෝ කලබල නොකර ඔහුට ඉඩ දුන්හ. හේ එහි ඉහළට ම අත යවා මීවද අහුරක් කඩා ගත්තේ ය. හේ එය ඉතා කෑදර ලෙස ගිල දැම්මේ ය. කෑදරකමට වන්දි ගෙවන්ට සිදු විය. තවත් වරක් හේ මැස්සන්ගෙන් පහර කෑවේ ය. එයින් ද පාඩමක් උගත් හේ ඉන් පසු ව කලබල නො වී හීන් සීරුවේ ක්‍රියා කිරීමට ඉටා ගත්තේ ය. මැස්සන්ගේ කල-බලය සන්සිඳෙන තුරු බලා සිටි හැන්ස් තවත් වරක් හීන් සැරේ අත දමා තවත් මීවද අහුරක් එළියට ගත්තේ කලබල නො වී හෙමින් කෑවේ ය. මෙසේ හෙතෙම තමාට හොඳට ම සෑහේ යයි සිතෙන තුරු මීවද කඩා කෑවේ ය.

හොඳට ම බඩ පිරී ගිය හැන්ස් වට පිට බැලුයේ ගසින් බිමට බැස ගැනීම දුෂ්කර කාරියක් ව තිබෙනු දුටුවේ ය. නැග ගත්

මගින් ම බැස ගැනීමට ද සිතා ගත් හේ අත්ත දිගේ ගියේ ය. එහෙත් අනික් අත්තට මාරුවීම පහසු කාරියක් නො වේ. හේ එහි සිට වෙවුලන්ට විය. තමා එතැනින් අනික් අත්තට පනින්ට ගියොත් බිම වැටිය හැකි බවත් නොමැරී ඉතිරි වුවත් අතක් පයක් නොකැඩී බේරී ගත නොහැකි බවත් දුටුවේ ආපසු මහ කඳ දෙසට ම බඩ ගෑවේ ය.

බිමට බැසීමට අනික් කිසි මගක් නොදුටු හෙතෙම ඒ බදගත නොහැකි මහ ගසේ කඳට බඩ තියා දෑත් විදහා අතේ ඇඟිලිවලින් ගස බද ගත්තේ ය. දෙදණින් හා දෙපා ඇඟිලිවලින් ගස තදකර බද ගත්තේ ය. ඉන්පසු පහළට රූටන්ට විය. එහෙත් කෙළින් උසට වැඩුණ රිටි ගසේ එවැනි බැස්ම එන්ට එන්ට වේගවත් විය. එය නවතා ගත නො හැකි විය. එසේ වේගයෙන් පහළට රූටා ගෙන ආ ඔහු ''ඩොග් ගා'' ගස මුල බිම ඇනිණි. හේ භ්‍රාන්ත විය.

හැන්ස් තමාගේ මුළු ඇඟ පුරා අත ගා බැලුවේ ය. කොතැනකවත් කැඩී බිඳී ගොස් නැත. එය ඔහුට සැනසුමක් විය.එහෙත් ඔහුට අවට කිසිවක් නොපෙනෙන බව හැඟී ගියේ ය. හේ තමාගේ මුහුණ අත ගා බැලුවේ ය. එය තැන් තැන්වල ඉදිමී තිබිණ. සටනකදී මුහුණට පහර ලැබුණ විටක මෙන් ඉදිමී ඇස් වැසී ගොස් තිබිණ. කුඩා කල දෙබරයකට ගල් ගසා මැස්සන්ගෙන් ඇනුම් කෑ විටක මුහුණ ඉදිමී තුබුණ හැටි මෙහිදී ඔහුට සිහි විය. හේ එක් ඇඟිල්ලකින් ඇසි පිය ඔසවා මීමැසි විත් ගළවා දැමීමට උත්සාහ කෙළේ ය. එය එතරම් සාර්ථක නො වී ය. මේ ගැළවී ගිය හැම විතක් නිසා ම එම මැස්සන්ගේ ජීවිතය කෙළවර වන බව හැන්ස් දැන සිටියේ නම් එය ඔහුට එක්තරා සැනසීමක් විය හැකිව තුබුණේ ය.

වනයට වැදුණ ද සිට විඳි වේදනා නිසා ඔහු දැන් වේදනාවකට පුරුදු ය. එවැනි වේදනාවක් නොලබා පසු වී ගිය එක දවසකුත් නො වී ය. වනයේ කිනිතුල්ලන් නිසා දිනපතා විඳින වේදනා අපමණ ය. ඇසට නොපෙනෙන තරමේ කුඩා කිනිතුල්ලකු ඇති කරන වේදනාව රත්කළ තියුණු යකඩයක් ඇඟට කා වැද්දීමෙන් ඇති කරන වේදනාවකට සමාන ය. මෙවැනි කිනිතුල්ලන් ඇඟිලිවලින් සූරා දමන හැන්ස් මොවුන් කෙරෙහි පිහිටා ඇති විස ගැන නොයෙක් වාරවල පුදුම විය. අද මේ වලසා ඇඟ පුරා සූරා උරය තුවාල කෙළේ ය. මීමැස්සන්ගේ ඇනීමෙන් ඇඟ පුරා ඉදිමී ගියේ ය. මෙයින් මීමැස්සන් දුන් දඬුවම වඩා මහත් සේ ඔහුට දැන් පෙනෙයි.

එතැනින් නැගී සිටි හැන්ස් තමා නවතින ගල් තලය තෙක් වූ දුර ගමන හෙමින් හෙමින් ගියේ ය. ඔහුගේ මුළු ඇඟ ම

එකට වේදනාවන්ට විය. ගණන් නැති පමණ මීමැස්සන් විදිනු ලැබූ විස නිසා ඔහුට සිහි මඳ ගතියක් මෙන් දැනිණි. ඇගේ තුවාල ඇල් දියෙන් සෝද ගත් හේ එහි පැමිණෙන නපුරු වන සතුන් නිසා විය හැකි උවදුරු ගැන නොතකා කොළ අතු ටිකක් කඩා දමා ඒ මත වැතිර ගත්තේ ය. තුන් දිනක ම හේ එහි තද උණෙන් හා උණ නිසා වූ සිහි විකල බවෙන් ද පෙළුණේ ය. ඔහුගේ එක ම සැනසීම වූයේ දිය වළ ය. නොසිහියෙන් ම හේ එතැනට ඇදී ගොස් හැකි පමණ ඇල් දිය බීවේ ය. තුවාල ඇති වූ දින බඩ පුරා මීපැණි කා සිටීම ඔහුට බොහෝ ප්‍රයෝජනවත් විය.

හතර වැනි දින උණ අඩු වී ඔහුට හොඳ සිහිය ලැබී තුබුණ නමුත් දුර්වලකම ඉතා දැඩි විය. ඔහුගේ උරහිසේ තුවාලය වැඩි වී තිබිණි. දකුණු අත ඉදිමී අප්‍රාණික ව තිබිණි. බඩපුරා බොන ඇල් දිය ඔහුගේ මලානික සිරුරට පණක් දුන්නේ ය. එහෙත් බඩගින්න සැනසීමට ඒ කෙසේවත් ප්‍රමාණවත් නො වී ය. නුගයේ ඉඳුණ ගෙඩි දූන් වරා ගොසිනි. හැන්ස් හුන් තැනින් පහළට බැස හාවුන් කකා සිටිනු දැක පුරුදු තණපත් හා පලා වර්ග ද කඩා කෑවේ ය. තුන් දිනක් ම මේ තණපත් ආදිය කෑම නිසා ඔහුගේ ශරීර ශක්තිය මුළුමනින් පිරිහී ගියේ ය. අඩි කීපයක් දුර ගෑටීම පවා ඔහුට දුෂ්කර කාරියක් විය. උණ ගතිය ඔහුගේ ඇඟෙන් තාමත් පහ වී ගොස් නැත. උරයේ වූ තුවාලය පැසවා හැරව ගලන්ට වීම නිසා මැස්සෝත් කුහුඹුවෝත් එයට ඇදෙන්ට වූහ. උන් එළවා දැමීමට හේ උත්සාහ නො කෙළේ ය.

තමාගේ ජීවිත අවසානය ළඟ බව සිතා ගත් හේ ගන වනයට ඇදී වැතිර ගත්තේ දෙවියන් යාච්ඤා කොට ජීවිතය පවරා මරණයට සූදනම් වී ය.

පසුව ද දවල් වන විට ඔහු සිටි තැනට නුදුරුව ගස්වල අතුපත් වේගයෙන් සැලෙන්ටත් සමූහ වශයෙන් කරන මහා කෑ ගැසීමක් ඇසෙන්ටත් විය. මේ වනයේ මින් ඉහත මෙවැනි බියකරු ශබ්දයක් හැන්ස් අසා නැත. එහෙත් ඒ ගැන සැලකීමට ඕනෑ කමක් හැන්ස්ට නො වී ය. තමා කරා එන කොයියම් විපතක් නමුත් පිළිගැනීමට හේ දූන් සූදනම් ව සිටී.

හූ! හූ! හූ! ගස්වල අතු දෙදරවාගන මහා වන සතකු මහ වනය බිඳ ගෙන එන්නාක් මෙන් ශබ්ද කරමින් මේ හූ හඬ නැගිණි. මේ අතු සෙලවීම නිසා ඒ අනුව උඩ බැලූ හැන්ස්ට නුදුරු ව ගසක සතර පයින් සිට ගෙන අතු සලමින් කෑ ගසන කළු යකකු වැනි සතකු දකින්ට ලැබිණි. ඒ මහා කළු වඳුරෙකි. ඌ කෑ ගැසුවේ හැන්ස් දෙස බලමින් නො ව දිය වළ දෙස බලමිනි. දිය වළ ළඟ කිසියම් සතකුට ආපදකවැයි හේ තේරුම් ගත්තේ ය.

හැන්ස් කොතෙක් දුර්වල ව සිටිය ද කුතුහලයෙන් පෙළඹුණේ ය. හේ තුවාල අත වත්තම් කර ගෙන ගල උඩට නැංගේ ය. පළමු වරට ඔහුගේ දැකීමෙන් කැළඹුණ වඳුරෝ ඔහුට එරෙහි ව දත නියවන්ට වූහ. වඳුරු මුළේ නායක වඳුරා එක පිම්මෙන් ගල උඩට පැන කට විරිත්තා ගෙන ඔහු ඉදිරියට ආවේ ය. එහෙත් ඌ ගණන් නොගත් හැන්ස් දිය වළ ළඟට ඇදී එය පරීක්ෂා කෙළේ ය. වඳුරු පැටවෙක් එහි දිය මත පාවෙමින් සිටියේ ය. ඌ දිය වළේ ගැඹුරු පැත්තෙහි වූ හෙයින් ඌට ගොඩට නැගීමට හෝ අනික් වඳුරන්ට ඌට පිහිටක් වීමට හෝ පුළුවන් කමක් නො වී ය. පිපාසය ඉවසා සිටිය නොහැකි වූ වඳුරු පැටවා දිය බීමට ගොස් මේ අනතුරට භාජන වී ඇත. පැටවා අල්ලා දියෙන් මෑත් කළ හැන්ස් ඌ එහි ගල මත තැබී ය. එහෙත් උගේ අතක් පයක් සෙලවීමක් පවා සිදු වූයේ නැත. පැටවා ළඟට වඩා ළං ව හැඬූ මවු වැඳිරියගේ විලාපය ඇසීමට තරම් කනගාටු උපදවන එකක් විය.

පැටවා නියත වශයෙන් ම මිය ගොස් ඇති බව වටහා ගත් වඳුරු මුළේ නායක වඳුරා අත්තකට පැන අනික් වඳුරන්ට එක් වීමට අණක් දෙන සේ කෑ ගැමක් කෙළේ ය. විසිරී සිටි වඳුරෝ රොත්ත පිටින් ගසට පැන ඌට එකතු වූහ. මවු වැඳිරිය පමණක් දරුවා හැර යාමට මැළි කරමින් බොහෝ වේලාවක් එතැන රැඳී සිටියා ය. තව මොහොතකින් වඳුරෝ සියලු දෙනා ම වන වැදී නොපෙනී ගත්හ.

මිය ගිය සේ පෙනුණ වඳුරු පැටවාත් මියන්ට ළංව සිටි ළමයාත් පමණක් එහි ඉතිරි ව සිටියහ. හැන්ස් වඳුරු පැටවා අතින් අල්ලා ඔසවන විට ඌට බඩපුරා ගිලී සිටි දිය ඌගේ කටින් වැගිරී ගියේ ය. ඊළඟට ඌ කට ඇරියේ ය.

හැන්ස් උගේ තෙමුණු ඇඟ අත ගාන්ට විය. ටික වේලාවකදී වඳුරු පැටවා උගේ දුඹුරුවන් පළල් ඇස් ඇර හැන්ස් දෙස බැලුවේ ය. වඳුරු පැටවා වඩාගත් හැන්ස් අව්වට ගිනියම් වූ ගල අත් හැර හෙවණට ගැටුවේ, වෙහෙස වූ තමාගේ දුර්වල ශරීරයට පහසුවක් දීමට වඳුරු පැටාවත් තුරුළු කරගෙන එතැන වැතිර ගත්තේ ය.

ඔහු නැවත අවදි වන විට පැටවා එහි නො සිටියේ ය. ඌ එහි ළඟ වූ පඳුරක දළු කමින් සිටියේ ය. ඒ අතර ඌ කුරුල්ලකු මෙන් සිහින් හඬක් නගමින් ඌගේ මවට අඬ ගැසුවේ ය. හැන්ස් ඌ හිටි තැනට ළං ව අත දිගු කළ නමුත් ඌ ළඟට නොපැමිණ අනික් ගසකට පැන ගත්තේ ය. හැන්ස් ඌ දළු කමින් සිටි ගසෙන් කොළ අහුරක් කඩා ඌට පෑ නමුත් ඌ තව තවත් දුරට ම ගියේ ය. හැන්ස් ආපසු හැරී වඳුරු පැටවා දළු කෑ පඳුර

දෙස බැලුවේ ය. ඒ පඳුරේ කොළ තමාටත් ආහාරයට හොඳ යයි ඔහුට සිතුණේ ය. හේ එයින් කොළ කඩා කෑවේ ය. වඩ වඩා කෑවේ ය. වඳුරු පැටවා කැඳවා ගැනීමට හේ නැවත නැවතත් උත්සාහ කෙළේ එයින් පලක් නොවනු දැක තමාගේ තිප්පලට වී වැතිර ගත්තේ ය.

මොළොක් වූ යමක් බෙල්ලේ වදිනවා දැනීමෙන් හැන්ස් රාත්‍රියේ නින්දෙන් අවදි විය. අත ගා බැලූ ඔහුට වඳුරු පැටවා අසු විය. හේ මේ පැටවා තුරුළු කර ගෙන නිදි ගත්තේ ය.

පසු ව එකකුගෙන් අනෙකා වෙන් කළ නොහැකි හිතවතුන් දෙදෙනකු වූ හැන්ස් හා බිම්බි—මේ හැන්ස් තැබූ නම වී ය—ද හමු වූයේ මේ ලෙසිනි. හැන්ස් බිම්බිගේ ජීවිතය ගැළෙවුවේ ය. එසේ ම බිම්බි ද කෑ යුතු ගහකොළ ගඩාගෙඩි ආදිය හඳුන්වා දීමෙන් හැන්ස්ගේ ජීවිතය ගැළවූවා ය. ඉතා කුලුපගයෝ වූ ඔහු දෙදෙනා එක් ව වනයේ හැසුරුණෝ ය.

තමාගේ තනි නොතනියට එක් ව යාමට කෙනකු ලබා දීම ගැන තමාට දකින්ට ලැබුණ හැම වඳුරු රෑනකට ම හැන්ස් කෘතඥතා පූර්වක බැල්මක් හෙළුවේ ය.

## 7

# පිහිට වීම

නැවත වරක් හොඳ ශරීර ශක්තිය ලැබූ හැන්ස් බඩගින්නෙන් පීඩිත වූයේ කලාතුරකිනි. දැන් ඔහුට තමාගේ ආහාර සපයා ගැනීම එතරම් අසීරු කාරියක් නො වී ය. බිම්බි ගස්වලට නැග ළා දලු කඩා කන විට ඔහු ද ඇය සමග හවුල් වී ගස්වල දලු කඩා කෑවේ ය. වනයේ ඉතා ම පෝෂ්‍යදයක ආහාරය වූ මී පැණි ලබා ගන්නා සැටි දැනගන්ට ලැබීම ඔහුට ලොකු ආශීර්වාදයක් වී ය.

මෙවැනි ආහාරවලින් හැන්ස් ශක්තිමත් ව වැඩුණේ ය. එහෙත් මේ වනයේ ඔහුට එක් දුෂ්කරතාවකට මුහුණ පාන්ට සිදු විය. දහ අතේ කල්පනා කළ නමුත් එයට උපායක් සොයා ගැනීමට හේ අපොහොසත් විය. මේ දුෂ්කරතාව නම් වනයේ

දෙස බැලුවේ ය. ඒ පඳුරේ කොළ තමාටත් ආහාරයට හොඳ යයි ඔහුට සිතුණේ ය. හේ එයින් කොළ කඩා කෑවේ ය. වඩ වඩා කෑවේ ය. වඳුරු පැටවා කැඳවා ගැනීමට හේ නැවත නැවතත් උත්සාහ කෙළේ එයින් පලක් නොවනු දැක තමාගේ තිප්පලට වී වැතිර ගත්තේ ය.

මොළොක් වූ යමක් බෙල්ලේ වදිනවා දැනීමෙන් හැන්ස් රාත්‍රියේ නින්දෙන් අවදි විය. අත ගා බැලූ ඔහුට වඳුරු පැටවා අසු විය. හේ මේ පැටවා තුරුළු කර ගෙන නිදා ගත්තේ ය.

පසු ව එකකුගෙන් අනෙකා වෙන් කළ නොහැකි හිතවතුන් දෙදෙනකු වූ හැන්ස් හා බිම්බි—මේ හැන්ස් තැබූ නම වී ය—ද හමු වූයේ මේ ලෙසිනි. හැන්ස් බිම්බිගේ ජීවිතය ගැළෙවුවේ ය. එසේ ම බිම්බි ද කෑ යුතු ගහකොළ ගඩාගෙඩි ආදිය හඳුන්වා දීමෙන් හැන්ස්ගේ ජීවිතය ගැළවූවා ය. ඉතා කුලුපගයෝ වූ ඔහු දෙදෙනා එක් ව වනයේ හැසුරුණෝ ය.

තමාගේ තනි නොතනියට එක් ව යාමට කෙනකු ලබා දීම ගැන තමාට දකින්ට ලැබුණ හැම වඳුරු රෑනකට ම හැන්ස් කෘතඥතා පූර්වක බැල්මක් හෙළුවේ ය.

## 7

## පිහිට වීම

නැවත වරක් හොඳ ශරීර ශක්තිය ලැබූ හැන්ස් බඩගින්නෙන් පීඩිත වූයේ කලාතුරකිනි. දැන් ඔහුට තමාගේ ආහාර සපයා ගැනීම එතරම් අසීරු කාරියක් නො වී ය. බිම්බි ගස්වලට නැග ළා දලු කඩා කන විට ඔහු ද ඇය සමග හවුල් වී ගස්වල දලු කඩා කෑවේ ය. වනයේ ඉතා ම පෝෂ්‍යදායක ආහාරය වූ මී පැණි ලබා ගන්නා සැටි දැනගන්ට ලැබීම ඔහුට ලොකු ආශීර්වාදයක් වී ය.

මෙවැනි ආහාරවලින් හැන්ස් ශක්තිමත් ව වැඩුණේ ය. එහෙත් මේ වනයේ ඔහුට එක් දුෂ්කරතාවකට මුහුණ පාන්ට සිදු විය. දහ අතේ කල්පනා කළ නමුත් එයට උපායක් සොයා ගැනීමට හේ අපොහොසත් විය. මේ දුෂ්කරතාව නම් වනයේ

දුර ගමන් යන විට දිය ගෙන යාමට සුදුසු භාජනයක් සොයා ගත නොහැකි වීම ය. මේ හේතුව නිසා හේ මේ වනයේ තමාගේ දිය වළෙන් දවසක ගමනට වඩා දුර ගමනක නො ගියේ ය. මෙවැනි දිය වළවල් මේ වනයේ තවත් ඇති බව හේ දනී. එහෙත් මෙතෙක් ඔහුට එවැනි එක දිය වළක්වත් හමු නො වී ය. මේ නියඟය තව දුරටත් අල්ලා හිටිය හොත් ටික දවසකින් ම දිය වළ සිඳී යාමට ඉඩ තිබේ. දිය වළට ඉරු රැස් නොවැටීමට වළ මත ඔහු නැගූ වහලය නිල් තණපත් ආදියෙන් හේ නැවත නැවතත් අලුත් කෙළේ ය.

එක් රැයක කිසියම් සතකුගේ මාරාන්තික කෑ ගැමක් හැන්ස්ට ඇසුණේ ය.

උදයේ අවදි වූ එතෙම බිම්බිට කථා කොට "වරෙන් බිම්බී, අද අපට දඩමසක් ලැබෙයි ද කියා බලන්ට යන්ට. සති ගණනකින් මසක් ලැබුණෙ නෑ; ඔය කොළ දලු කෑම උඹට හොඳ උණාට පැටෝ මට හොඳ මදි" කියමින් බිම්බීවත් උරයේ ගන්නා ගෙන ගමන් ඇරඹුවේ ය.

අවට වනයේ හොඳ හැටි හොයා බැලූ නමුත් මළ සතකු ගැන කිසි ම ලකුණක් හමු නො වී ය. එහෙත් තව දුරටත් මේ ගැන සොයන හැන්ස් සතුන් යන මගක් ඔස්සේ යන විට බිම්බී නො ඉවසිලිමත් ව දඟලන්ට වූවා ය. හේ හිටිවන ම සිට වනය පරීක්ෂා කෙළේ ය. සතකුගේ ලකුණක් නැත. හේ හැම විට ම බිම්බිගේ හැඟීම් ගැන ගරු කෙළේ ය. විශේෂයෙන් අනතුරක් ඉදිරියෙහි ඇති විට බිම්බි පෙන්වන ලකුණු ඔහුගේ සැලකිල්ලට භාජන විය. කොයි හැටිත් හේ වඩ වඩා පරීක්ෂාවෙන් ඉදිරියට අඩිය තැබුවේ ය. එහෙත් බිම්බි ඔහු වෙන මගකට හැර වීමට ඔහුගේ හිස කෙස්වලින් අදින්ට වූවා ය. හේ නො නැවතුණි. ඒ ඉටු නොවුණ විට ඈ කෙළේ ඔහුගේ උරයෙන් ඉවතට පැන ගසකට නැගී දලු කෑමට පටන් ගැනීම ය. හැන්ස් ද ඉතා පරීක්ෂාවෙන් හතර අත ම බැලූ නමුත් කිසි ම අමුත්තක් ඔහුගේ දෙනෙතට ලක් නො වී ය. එහෙත් මෙවිට ම බිම පරළු තැළෙන හඬක් ඇසුණෙන් හේ විමසිලිමත් ව එදෙස බැලුවේ ය. එවෙලේ දුටු දර්ශනයෙන් බිය ගත් හේ එකවර ම පස්සට පැන්නේ ය. බිම වියලි කොළ අතර පරඬලා පැහැයෙන් ම වූ මහා සර්පයෙක් නිශ්චල ව සිටියේ ය. සතා දෙස ඇස විහිදුවා බැලීමෙන් උගේ කඳේ කොටසක් පොදියක් මෙන් මහත් ව ඇති බවත් උගේ කටින් පිටට මුව අං තට්ටුවක් විහිදී ඇති බවත් හැන්ස් දුටුවේ ය. උගේ අනර්ථකාරී දෙනෙත උදාසීන ලෙස හැන්ස් දෙසට හෙළා තුබුණේ ය. මුවන් ගෝනුන් වැනි ලොකු සතුන් දරණයෙහි ලා මිරිකා සහපිටින් එකවර ගිල දමන පිඹුරු වර්ගයන්

ගැන වරක් නැවියකු ඔහුට විස්තර කළ සැටි ඔහුගේ සිහියට ආවේ ය. ප්‍රහේලිකාවක් හැටියට ඔහුට මෙවේලේ සිහියට නැගී ආවේ මේ මහ අං බලවුවලට කුමක් කරන්නේ ද යන්න ය. මීට අවුරුදු කීපයකට පසු ව මේ ප්‍රශ්නයට ඔහුට පිළිතුරු සැපයුණේ දුනුණු කුණු මස් ගඳක් අනුව ගිය ඔහුට එවැනි සතකු ගිලගත් පිඹුරකු දැකීමෙනි. මෙකියන පිඹුරාගේ කට කුණු මසින් නැගී පණුවන්ගෙන් පිරී තුබුණ අතර අං බලවු සහිත සතාගේ හිස උගේ කටින් ගැලවී යන්ට ළං වී තිබිණ.

පෙර කී නැවියාගේ එක් විස්තරයකට අනුව, වරක් නැව බිඳී ගොස් මහ වනයක අතරමං ව සිටි ඔහු මෙවැනි මහ පිඹුරකු ගිල සිටි වල් ඌරකු පිඹුරාගේ බඩ පළා එළියට ගෙන තමාගේ ආහාරය වශයෙන් ගෙන තිබේ. එයින් ඔහුට කිසි ම විස ගතියක් ඇති වී නැත.

පිඹුරා මෙවේලේ කිසිවක් කර කියා ගත නොහැකි තත්වයක සිටි නිසා බිය පහ ව ගිය හැන්ස් තමා ද මේ සතාගේ බඩ පළා මුවා එළියට ගෙන ආහාර කොට ගනිමැයි සිතා ගත්තේ ය. එහෙත් මේ සතා මරා ගැනීම ඔහු සිතා සිටි තරම් පහසු කාරියක් නො වී ය. පිඹුරාගේ හිස හපයක් සේ වන තෙක් ඔහු ගසා පොඩිකළ නමුත් පිඹුරා නොකඩවා දඟලන්ට වන්-නේය. මේ නපුරු සතා මෙහි මග සැහ වී බලා සිටි අතර තමාට කලින් මුවා මෙතැනින් යාම නිසා තමාට ඇති වූ වාසිය ගැන හැන්ස් කල්පනා කෙළේ ය.

නතර වීමක් නැති ව කොතෙකුත් කරන මේ දඟලීම තවත් එහි බලා සිටිය නොහැකි වූ හැන්ස් පිඹුරා අත හැර ගොස් බිම්බිට එකතු වී ගස්වල කොළ දලු කඩා කන්ට විය.

පැය කීපයකට පසු ව එතැනට හැරී ආ ඔහුට ද දකින්ට ලැබුණේ පිඹුරා මෙවිට නිශ්චල වී සිටින බව ය. හැන්ස් ඌ අල්ලා ඇද මග හරහා දමුවේ ය. සතා පිළිබඳ පිළිකුල පසෙක තබා උගේ බඩ පැළීම ආරම්භ කෙළේ ය. මෙවැනි කාරියට සුදුසු උපකරණයක් ඔහු අත තිබේ. එය නම් කීප දිනකට පෙර වනයේදී හමු වූ වල් හූරකුගේ ඇටකටු අතර තිබී අවුලා ගත් හූරු දළයකි. එක් කෙළවරක් සිදුරු සහිත ව වක් ව තුබුණ එහි අනික් කෙළවර ඌරා නිතර ප්‍රයෝජන ගැනීම නිසා තියුණු සේ උල් ව තිබිණ. මුවා ගිලීමෙන් මහත් වී තුබුණු පිඹුරු බඩට හේ එයින් ඇන සිදුරු කෙළේ ය. පිඹුරා නැවතත් දඟලන්ට විය. ඌ කොතෙක් දඟලුවත් දුන් මේ කාරිය නවතාලිය නො හැක. හැන්ස් ගොදුර එළියට ගන්නා තෙක් උගේ බඩ පැළුවේ ය. පිඹුරාගේ හකුපාඩාවලට හිරවී තුබුණ ඉහ හැර මුවාගේ ඉතිරි ශරීරය හේ ඉවත් කර ගත්තේ ය. මුවාගේ ඇටකටු සියල්ලක්

පොඩි වී තිබිණ. මුවා හම ගසා ගැනීමත් ඔහුට මේ උපකරණ-යෙන් ම කර ගත යුතු ව තිබිණ. අතේ දිය බිබිලි නැග තුබුණ නමුත් ඒ ගැන නො සලකා හේ වැඩය කොට නිම කෙළේ මුව මස් කැබලි කඩ කඩා කටේ ඔබා ගත්තේ ය. ඒ ළඟ ම ගසක අත්තක වාඩි වී බිම්බි මේ ක්‍රියාව ඕනෑකමින් බලා සිටියා ය. මුව මස් කැබලි බිම්බි දෙසට දිගු කළ විට ඈ ඊට පිළිකුලක් පෙන්නුවා ය. පිඹුරා තවමත් එහි පරඬලා තළමින් දඟලයි.

තමාට වුවමනා කරන මස් සියල්ල එකතු කරගත් හැන්ස් සතාගේ ශරීරය තුළ වූ අවයව පරීක්ෂාවෙන් වෙන් වෙන් ව බැලුවේ ය. උගේ මුත්‍රාශය ඔහුට හමු විය. හේ එය කපා වෙන් කොට ගෙන එහි තුළ වූ දේ මිරිකා හැරියේ ය. තමා මෙතෙක් සොයමින් සිටි අවශ්‍ය ම දෙය මෙහිදී ඔහුට හමු විය. වනයේ යාමේදී දිය ගෙන යාමට ස්වභාවයෙන් සැදුණ මෙ පහිය ඉතා ප්‍රයෝජන වේ. හැන්ස් එහි කර කුඩා පට්ටයකින් ගැට ගසා වියලෙන්ට එල්ලා තැබුවේ ය.

දැන් මේ අංබලටු කොයි තරම ප්‍රයෝජනවත් ආයුධ විය හැකි දැයි සිතූ හැන්ස් ලොකු ගලකින් ගසා ඒවා බිඳ ගත්තේ ය. වනයේ අල හාරා ගැනීමට මෙන් ම මී බැඳ ඇති ගස් සිදුරුවල කුඩා කටවල් මහත් කර ගැනීමටත් මේ ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය.

වුවමනා සියලු දේ එකතු කරගත් හැන්ස් බිම්බිවත් කරට නංවා ගෙන රාජ කුමාරයකු මෙන් මහත් ආඩම්බරයෙන් ආපසු තමාගේ ගල් වළ කරා ගමන් කෙළේ ය.

තමාගේ දිය වළ දැන් සිඳී ගෙන එන හෙයින් එය අත් හැර දමා යා යුතු කාලය ළං වේගන එන බව සැලකූ හැන්ස් මුවා-ගෙන් ලබා ගත් දිය පහියේ දිය පුරවා එය කෝටුවක එල්ලා කර තබා ගෙන වනයේ ඇවිද්දේ ය. දෙ දිනක ගමන් දුර ඔහුට මෙසේ යා හැකි විය. එහෙත් ගිය ගිය හැම තැනක ම ඔහුට දකින්ට ලැබුණේ සිඳී ගිය ඇළ දෙළ හා පොකුණුත් ය. සිඳී ගිය දිය කඩවල පත්ල කොතෙක් සෑරුව ද ඔහුට එයින් දිය ලබා ගත හැකි නො වී ය.

ගිය ගිය හැම තැනකදී ම බලාපොරොත්තු සුන් වූ හැන්ස් මෙවර තුන් දිනක් නොකඩවා ගමන් කෙළේ ය. මෙවිට ඔහු සිටියේ තමාගේ දිය වළ පිහිටි තැනින් සැතපුම් විසිපහකට පමණ දුරිනි. ගමනේ යෙදීමෙන් අධික ලෙස ඩහදිය පිට වීම නිසා ඔහුට වඩාත් දැඩි පිපාසයක් ඇති විය. ගෙන ආ දිය ටිකෙන් අවසාන කොටස මේ උදේ බිම්බිටත් දී හැන්ස් බීවේ ය. මෙ තෙක් සිටි තැන සිට ගල් වළට හෙට ආපසු ගිය විට එහි ඉතිරි ව

ඇති බොර දිය ටික පෙරා ගත හැකි වෙයි. එහෙත් එය එක් දිනක් ගත කිරීමට පමණක් සෑහෙයි. එයින් පසු?

එදා හේ බීම්බිගේ ඇඟ අතගා ''බීම්බි පැටික්කියේ, මේ තමා අපේ අවසානෙ. උඹ ඔච්චර නුවණ ඇති එකී උඹට වත් බැරි ද දිය ඇති තැනක් කියන්ඩ?'' හේ විමසුවේ ය. ඇගෙන් මීට ලැබුණ පිළිතුර දුක්මුසු කෙඳිරියක් පමණකි.

මෙවිට ම ඔහුට එක්තරා හඬක් ඇසිණ. මෙය කිසියම් විශාල සතකුගෙන් පිටවුණ දුක් මුසු හැඬීමක් වැනි එකක් විය. එය අසුබ හඬක් වුව ද, කුරුල්ලන්ගේ ශබ්දයක් පවා නැති මේ පාළු අඩවියේදී සතුටින් පිළිගත හැකි එකකි.

හැන්ස් නැගිට ශබ්දය නැග ආ දෙසට ගමන් කෙළේ ය. ශබ්දය තවත් වරක් ඇසිණ. එය ඇසුණේ ලොකු ගලකින් මුවහ ව තුබුණ වන ගැබිනි. ගල වටේ ගොස් එබී බැලූ නමුත් එහි ඔහුට පෙනෙන්ට කිසි ම සතෙක් නො වී ය. මෙසේ ටික වේලාවක් පරීක්ෂාවෙන් බලන ඔහුට සෙමින් සැලෙන කිසිවක් දැකිය හැකි විය. ඔහු මෙතෙක් ගසකැයි සිතා සිටියේ විශාල සතකුගේ එක් පයකට බව ඔහුට පෙනිණි. තවත් ටිකක් ළං වී කොළ අතු අතරෙන් එබී බැලූ හැන්ස් දුටුවේ මේ විශාල පාදය එහි සිටි මහ ඇතකුගේ පාදයක් බව ය. ඇතා එහි සිටියේ හැන්ස් දෙසට පිටුපා සිටගෙන ය. ඌ සිටි තැන වටේ පඳුරු සියල්ල කඩා එළි කොට තිබිණ. කිසියම් ආපදාවකට මුහුණ පා ඇති සේ පෙනුණ මේ සතා හිටගෙන හිටියේ තුන් පයකිනි. අනික් පය අමාරුවෙන් නිය කෙළවරින් බිම තබා වත්තම් කර ගෙන සිටියේ ය. උගේ ඇඟේ සම බුරුල්ව එල්ලුණේ විය. 'එහෙනං ඌත් අප වගේ ම පිපාසෙන්,' හැන්ස් තමාට ම කියා ගත්තේ ය.

මේ සතා අසරණ ව සිටින සේ පෙනෙන්ට තුබුණ හෙයින් හැන්ස් උගේ ඉදිරියට ගියේ ය. ඇතා දුර්වල ලෙස හොඬය වනා හිස් බැල්මෙන් ඔහු දෙස බැලුවේ ය. සතා තමාට විරුද්ධව නො එන බව දුටු හැන්ස් අනතුරට පත් ව ඇති පස්සා ගාතය දෙසට නැඹුරු ව එය පරීක්ෂා කෙළේ ය. එහි යටි පතුලේ යටට ඇනුණ කෝටුවක් පිටට පෙනෙන්ට තුබුණෙන් හැන්ස් එය දැතින් අල්ලා ගැළවීමට උත්සාහ කෙළේ ය. එහෙත් එය පහසුවෙන් එළියට ඇදී නො ආවේ ය. මේ ක්‍රියාවෙන් ඇතාට වේදනා ඇතිවුණ බව පෙනුණ නමුත් ඌ එයට විරුද්ධකමක් නොපෙන්වා ඕනෑකමෙන් පය දීගෙන සිටියේ ය. මෙයින් ධෛර්‍ය-වත් වූ හැන්ස් බොහෝ උත්සාහ කොට ඉතා අමාරුවෙන් ඒ උල ඇද ඉවතට ගත්තේ ය. එය ඇඟිල්ලක් තරම මහත ඇති අඟල් තුනක් පමණ දිග කෝටු කැබැල්ලකට තබා තිඹිරි ගාන ලද පට්ටාවලින් තදින් වෙළනු ලැබූ ලොකු ඊතල මුණතක් විය.

ඇතා මෙයින් පහර ලැබුවේ කෙසේ දැයි සිතමින් හැන්ස් ඊතලය පරීක්ෂා කරන්ට විය. සමහර විට සතා නිදා සිටි වෙලෙක ඌ කරා ළංවූ වනචාරියකු විසින් සතා ගමන් කිරීමෙන් වළකා බඩගින්නේ තබා මැරීමේ අදහස ඇති ව මෙය උගේ යටි පල්ලට විදින්ට ඇතැයි හැන්ස් සිතුවේ ය.

හැන්ස් මේ නිගමනයට බැස ගන්නවාත් සමග ම කිසිවක් ඔහුගේ බෙල්ලේ දවටෙනු හැඟී අත ගා බැලුවේ ය. ඒ ඇතාගේ හොඬවැල ය. හැන්ස් නැගී සිටීමට බිය විය. එහෙත් මේ හොඬය අහිංසක ලෙස ඔහු හා සෙල්ලම් කරන්නා සේ පෙ- පෙනෙන්ට වූයෙන් හේ නැගී සිට හොඬයට අතින් තට්ටු කෙළේ ය. ඇතාට ආදරය පෙන්වූයේ ය. අසල ගසකින් කොළ අත්තක් කඩා ඌ දෙසට පෑවේ ය. දුන් කොළ අත්ත ආසාවෙන් බද ගත් ඇතා එය මුවෙහි ලා ගත්තේ ය. තමාත් දුර්වල ව සිටි නමුත් හැන්ස් ඇදිරි වැටෙන තුරු ම මෙසේ කොළ අතු කඩමින් ඇතා කැවුවේ ඇදිරි වැටුණ පසු බිම්බිත් සමග රුක් මුල් අතරකට වැද නිදා ගත්තේ ය.

ඔහු උදේ අවදි ව බලන විට ඇතා එහි පෙනෙන්ට නො සිටියේ ය. ගල් වළේ දිය සොයා හේ ආපසු පෙර සිටි ගල්වළ වෙතට ගමන් කෙළේ ය.

පසුව ද උදේ ගල් වළේ ඉතිරි ව තුබූ මඩ වතුර බී දිය ගෙන යන පහිය ද මඩ දියෙන් පුරවා ගත්තේ ය. තමාට තුන් මාසයක් වාසස්ථානය ව පැවති ගල දෙස අවසාන බැල්මක් හෙළූ හැන්ස් දුක් මුසු සිතකින් යුතු ව එතැනින් නැගී ගමන් ඇරඹුවේ අතේ තියෙන දිය ටික ඉවර වන විට කොහෙන් හෝ දියක් නො ලැබුණොත් තමා ඉවරයි යන සිතිවිල්ලෙන් යුතු ව ය.

මද්දහනේ ගසක් මුල හිඳ ගිමන් හරින්ට වූ හැන්ස්ට ඇතා ගැන සිහි විය. කකුලේ ඇනුණ උල නිසා යා ගත නො හැකි ව සිටි ඇතා අවට තුබුණ සියලු ම ගස් කඩා කා ඉන් එහා යා ගත නොහැකි ව බඩගින්නේ සිටියේ ය. ඌ මෙතෙක් කල් පිපාසයෙන් පෙළෙන්ට ඇත. ඇතාගේ පළමුවන කාර්ය විය හැකි ව ඇත්තේ දිය ඇති තැනක් සොයා යාම ය. මේ ගැන කලින් සිතුවා නම් හොඳ යයි ඔහුට සිතිණ.

ඇතා අත් නොහැර සිටියා නම් දිය කඩක් කරා යා හැකි ව තුබුණේ යයි කල්පනා කළ හැන්ස් එතැනින් වහා නැගිට සැතපුම් ගණනකට දුරින් වූ ඇතා සිටි තැන බලා ගමන් කරන්ට වී ය.

ඇතා ගමන් කොට තුබුණේ ඉතා සෙමින් වූ හෙයින් ද තැනින් තැන නැවතී ගස් කොළන් කඩා කා ගොස් තුබුණු

හෙයින් ද උෟ ගිය මග සොයා යාම අපහසු කාරියක් නො වී ය. එහෙත් ඇතා පිටත් ව ගියේ හුහක් කල් ඇති ව හෙයින් එද දවස ගෙවෙන තුරුත් ඔහුට උෟ හදිකර ගත නොහැකි විය.

පසුව ද උදේ ම නැවත ගමන් ඇරඹූ හැන්ස් තමාගේ දුර්වල ශරීරයට වෙහෙස විය හැකි හොඳ ම වේගයෙන් ගමන් කෙළේ ය. මෙවිට ඇතා අඩුවෙන් නවතිමින් වැඩියෙන් ගමන් කොට ඇති බව ඔහුට පෙනී ගියේ ය. තුවාලය වූ පය ක්‍රමයෙන් සුව වීමත් පිපාසය ක්‍රමයෙන් දැඩි වීමත් උගේ ඉක්මන් ගමනට හේතුව වශයෙන් හැන්ස් සැලකුවේ ය.

පිපාසයෙන් පෙළෙමින් නොකඩවා ගමන් කළ හැන්ස් උගුර කට වියලී දිව ඇදී බිම හින්ද වූණේ ය. අන්තිමට හේ සියලු බලාපොරොත්තු සුන් කර ගනිමින් තවත් අඩියක් ඉදිරියට යා නොහැකි ව බිම වැතිර ගත්තේ ය.

මෙවේලේ ඔහුට නුදුරෙන් ගසක අත්තක් කැඩෙන හඬ ඇසිණ. එවැනි ප්‍රීතිදයක ශබ්දයක් මෙතෙක් නැසූ හැන්ස් ඇඟ-පතේ දුර්වලකම් ගසා දමා නැගී සිට ශබ්දය කුමක් විය හැකි දැයි සැලකීමට පවා ප්‍රමාද නො වී කලක් නැති ව සිටි හිතවතකු කරා දුවන්නාක් මෙන් වහා එදෙසට ගියේ ය. ඔහුගේ විස්වාසය වැරදි නො වී ය. ඔහු එනු ඉව වැටී සිටි ඇතා සොඬය දිගු කර ගෙන එන පෙර මග බලා සිටියේ ය.

එහෙත් බිම්බී ඇතාට යහළු කරවීම මුලදී අමාරු කාරණයක් විය. ස්වභාවයෙන් ඔවුන් කෙරෙහි පවතින අන්‍යොන්‍ය අවිශ්-වාසය නිසා මුලින් දුරස්තර ව සිටි බිම්බි දුර යද්දී ක්‍රමයෙන් ඇතාට කුලුපග වූවා ය.

ඇතා කොර ගසමින් සෙමින් ගිය නමුත් ඒ විශාල සතාගේ ගමන එක් ව යාම හැන්ස්ට දුෂ්කර කාරණයක් වී ය. එසේ ම මුළු හවස් වරුවේ ම නැවතී සිටි දෙ පැයක් හැර ඉතිරි මුළු කාලයේ ම ඇතා ගමන් කෙළේ ය. රාත්‍රිය මුළුල්ලේත් උෟ ගමන් කෙළේ ය. උදය වන විට හැන්ස්ට ඉතා තදින් නිදිමත දැනිණි. යද්දී ඔහු නොදැනුවත් ව ම ඔහුට නින්ද ගියේ ය. හැන්ස් බිම හිඳ ගෙන ඇසි පිය මැරුවේ ය. ඇස් හැර බැලූ ඔහුට ඇතා පෙනෙන හරියක නොදැකිය හැකි විය. එහෙත් නුදුරෙන් ගස් අතු කඩන ශබ්දයක් ඇසෙන්ට වූයෙන් මිත්‍රයා තමා අත හැර ගොස් නැති වග හේ තේරුම් ගත්තේ ය. හැන්ස් පැමිණි විට ඇතා ගමන ඇරඹුවේ ය. ගමනේදී ඔහු නිතර නිතර පසු බසින්ට විය. මේ හැම වරක ම ඔහු එන තුරු ඇතා මග රැඳී බලා සිටියේ ය. එසේ හැන්ස් නොගිය විට ඇතා ආපසු පැමිණ ඔහු හුන් තැනින් නොනැගිටින බව දැක ඔහු සොඬෙන් ඔසවා ගෙන

ගියේ ය. බිම්බි මීට විරුද්ධතාව දක්වමින් කෑ කෝ ගසමින් පසු පසින් කලබල කරමින් ගියා ය. හැන්ස් ඇයට අත දිගු කළ විට ඈ අතට නැංගා ය. තව ටික වේලාවකින් බිම්බි අතින් පැන ගොස් ඇතාගේ කුඹුතලය මත මහා රාජා කෙනකු මෙන් සුව සේ හිඳගෙන යනු හැන්ස්ට දැකිය හැකි විය.

මෙසේ යන ඇතා එක් තැනකදී තමා ප්‍රිය කරන ගසක් දැක හැන්ස් බිම තබා අතු කඩා කෑවේ ය. බිම්බි ද උගේ පිටින් බැස ගසකට නැග දලු කඩා කෑවේ ය.

මීළඟට ඇතා හැන්ස් ඔසවා ගැනීමට සොඬය දිගු කළ විට හැන්ස් සොඬය අතින් අල්ලා ගෙන උගේ පිටට නැඟීමට කැමැත්ත පෙන්නුවේ ය. ඇතා දණ ගසා හිස පහත් කොට ඔහුට තමාගේ කනක් අල්ලාගෙන කරට නැගීමට උදව් දුන්නේ ය. හැන්ස් ඇතාගේ පිටට නැග ගත් පසු ඇතා කෙරේ බිය ඇරී සිටි බිම්බි උගේ වලිගය අල්ලාගෙන පිටට නැංගා ය. මෙතෙක් බොහෝ වෙහෙස කරවා තුබුණ ඔහුගේ දෙපයට විවේකයක් දෙන්ට ඉඩ ලැබීම හැන්ස්ගේ ප්‍රීතියට කාරණයක් විය. ඇතු පිට යාමේ ඇති දුෂ්කරතා වැඩි දුරක් යාමට පෙර ඔහුට වැටහී ගියේ ය. බිම්බිට ද එසේ ම වූ බව ඇගේ නොඉවසිලිමත් දැහලීම්වලින් පෙනෙන්ට තිබිණ. ඇතාගේ පිටේ දළ ලෝම හැන්ස්ගේ නිරුවත් ශරීරයට වේදනා ඇති කර වී ය. එසේ ම ඇතා ගස් අතු යටින් ගමන් කරන විට ඒවායේ නොවැදී ප්‍රවේසම් වීමට හිස පහත් කරමින් යාමට ඔහුට සිදු විය.

දැඩි පිපාසයෙන් මඩනා ලද ඇතා තමාගේ පිට උඩ සුව සේ සිටින මිත්‍රයා ගැන සොයා බැලීමේ වග කීමෙන් ද තොර වූයේ නොකඩවා වේගයෙන් ගමන් කරන්ට වන්නේ ය. සමහර විට ඒ යන අතර ම උෟ ගස්වල කොළ අතු කඩමින් කෑවේ ය. උෟ රාත්‍රි කාලය තුළ ම ගමන් කළ හෙයින් හැන්ස්ට නිද ගැනීමේ අවසරයක් ඇති නො වී ය. එය ඔහුට දුෂ්කර කාරණයක් වූ සේ ම ඔහුගේ නිදිමත නිසා ඔහුට ඇතු පිට නොවැටී හිඳීම පවා අසීරු කාරණයක් විය. දෙවරක් ම ඔහු මෙසේ ඇතු පිටින් වැටුණේ ය. මේ දෙවර ම ඇතා නැවතී සිට ඔහුට පිට උඩට නැගීමට ආධාර කෙළේ ය. නැවත ගමන පටන් ගැනීමට පෙර ඔහු හරිහැටි හිඳ ගත්තේ දැයි පරීක්ෂා කෙළේ ය.

අලුයම ගයන කුරුල්ලන්ගේ ගීත රාවය හැන්ස්ගේ සිත ප්‍රබෝධ කෙළේ ය. මෙතෙක් කුරුල්ලකුගේ නාදයක් අසන්ට නොලැබී සිටිය ඔහුට මේ ඇසුණු කුරුළු නාදයෙන් අලුත් බලාපොරොත්තු ඇති කර වී ය. මේ නාදය ඇසෙනු සමග ම ඇතාගේ ගමන ද අවසාන පියවරක් මෙන් ස්ථිර එඩිතර එකක් වී ය.

මෙවිට ම ඔවුහු මහ කැලය අතරෙන් විශාල එළිමහන් බිමකට පැමිණියාහ. එහි මැද පන් පඳුරුවලින් ගහන දිය බිමකි. මෙය වල් මීමුන්ට හා වල් ඌරන්ට ද ගොදුරු බිමක් විය. රාජාලි වර්ගයේ සුදු කුඩා කුරුල්ලෝ උන් පිට ලැග සිටියහ. එහි වූ මහා කළු ගල් මෙන් හැන්ස් දුටුවේ එහි සිටි තවත් ඇතුන් කීප දෙනෙකි. දිය බිම වටා පිහිටි තණ බිමේ තැන් තැන්වල විසිරී ගිය මුව රංචුවල මුවෝ තණ කමින් සිටියහ.

සයින් පවසින් පීඩිත දුඃඛිතයන් තිදෙනා මේ ක්ෂෙම ස්ථාන-යට පැමිණෙන විට එහි බිම සිට ඉහළ ඉගිලී ගිය කිරල් යුවළක් ''ඩිඩ් හී ඩූ ඉට්! ඩිඩ් ඩිඩ්, ඩිඩ් හී ඩූ ඉට්'' යයි කෑ ගසන්ට වූහ.

කෙළින් ම දිය බිම කරා ගිය ඇතා එයට බැස නැවත කිසි දිනක නොනවත්වන්නාක් මෙන් දිය බී ගෙන බී ගෙන ගියේ ය. ඇතු පිටින් බිමට බැස ගත් හැන්ස් ගැඹුරු තැනක ගිලී සිහිල් දිය පහස ලබන්ට විය. එහෙත් බිම්බි ආරක්ෂාව කොයිකටත් වඩා හොඳයි සිතා ඇතු පිට ම හිඳ ද්‍ය සොඩින් ගෙන ඇගේ විසුරුවා ගත් දියෙන් ටික ටික තොල ගෑවා ය. මේ දුටු ඇතා සොඩින් ගත් දිය පාරක් කෙළින් ම ඇයට එල්ල කොට විද්දෙන් ඈ වහා හැන්ස්ගේ අතට පැන ගත්තා ය.

මේ ලැබුණ දියෙන් හා අවට පැතිරී තුබුණ සිරියාවෙන් ද අහස වසා සිටි නිල් ගුවන් ගැබින් ද හැන්ස් කෙරෙහි නැවතත් වරක් ජීවන ප්‍රීතිය උද වී ගියේ ය.

# 8

## දිය වගුර

දියෙන් සෝදා හැරීමෙන් හැන්ස්ගේ ශරීරයේ කිලිටි ඩහදිය පහ වී පිරිසිදු විය. ශරීරයේ තුබුණ තුවාලවල කැසිලි සුව වී ගියේ ය. මෙයින් ශරීරයට සැහැල්ලු බවක් ලත් හෙතෙම දිය බිම අසල සෙවණැති ගසක් මුල වැතිරී හොත්තේ ය. දින ගණනක් තුළ පැවති බඩගින්නෙන් හා පිපාසයෙන් ද දුර්වල ව සිටි නමුත් හේ දරුණු අසනීපයකින් පසු ව සුවය ලබා එන ලෙඩකු හෙදියකගේ සාත්තුවෙන් පසු ව අස්වැසිල්ලක් ලබන්නාක් මෙන් අස්වැසිලි සිතකින් යුතු වූයේ එහි නින්දට වැටුණේ ය.

අවට පරිසරය ගැන කිසි ම තැකීමක් නැති ව මළාක් මෙන් ඔහු එහි නිද සිටි අතර මුවන් රංචුවක් ඔහු සිටි තැනට ඉතා ළං ව තණ කමින් සිට යන්ට ගියේ ය. පරඬලා අතර ලැග සිටි තිත් පොළඟෙක් දිය බිම දෙසට යාමට එතැනින් ආවේ තමා එන මග හරහා වැතිරී සිටි ඔහු දැක අයින් වී ඔහුගේ ඉස වටේ කරකැවී දිය බිම අසලට ගොස් අසරණ දිය ගෙම්බකු අසු කර ගන්නා අටියෙන් එහි දරණ ලාගෙන හොත්තේ ය.

රාත්‍රි කාලයේ එහි පැමිණි හිවලුන් දෙදෙනෙක් ඔහු ඉව කර බලා ආහාර කොට ගැනීමට තව ම සූදුසු නැතැයි කතිකා කර ගෙන ඔහු හැර යන්ට ගියෝ ය. ඊට පසු ව එහි පැමිණි වල් ඌරෝ ඔහු සිටි අවට හැම තැනක් ම හාරා අවුස්සා අල මුල් කා යන්ට ගියෝ ය.

උදේ ඉර පෑවීමෙන් පසු අවදි ව නැගී සිටි හැන්ස් තමා ඉන්නේ කොහේ ද, එහි පැමිණියේ කෙසේ දැයි කල්පනා කෙළේ ය. ඔහු ඇනා හා බිම්බි ගැන ද සොයා බැලූ නමුත් දෙන්නාගෙන් එකකුවත් පෙනෙන මානයක සිටියේ නැත.

හැන්ස් දියට බැස දිය බී දිය නා ගොඩ වුණේ ය. කෑමට කිසිවක් සොයා ගන්නේ කෙසේ දැයි එහි සිට හේ කල්පනා කෙළේ ය. ඔහු සිටි තැනට නුදුරෙන් වූ දිය පැළෑටි මත වඳුරු රැනක් සිටිනු ඔහුට දකින්ට ලැබිණ. හේ එහි ළංවන විට රංචුවේ වඳුරෝ දෙන්නා තුන්දෙනා බැගින් ගොඩට පැන ගොස් එහි වූ ගල් තලයක් මතට නැග ගත්හ. එකෙක් පමණක් කිසි චකිතයක් නැති ව හුන් තැන ම හිඳ දලු හා මල් කැකුළු ද කඩා කමින් සිටියේ ය. මේ බිම්බි වූවා ය. හැන්ස් ද ඇය සමීපයට ගොස් හිඳ ගෙන ඒ දලු මල් කඩා කන්ට විය. තමන්ට බිය වීමට

කිසිවක් නැති බව සලකා ගත් අනික් වඳුරෝ ද එහි පැමිණ නැවතත් කෑමට පටන් ගත් නමුත් හැන්ස්ට වඩා ළං නො වූහෝ ය.

ටික වේලාවකට පසු හිරු රැස් දැඩි වූ විට බිම්බි සහිත වඳුරෝ ගස්වලට නැංගෝ ය. හැන්ස් ද දියෙන් ගොඩ විය. ආහාරයට මසක් ලබා ගැනීමට හේ ඉතා ආසා කෙළේ ය. මසට සුදුසු සතුන්—ඌරන් මුවන් මීමුන් කුරුල්ලන්—මෙහි බහුල ය. එහෙත් ඔවුන් අල්ලා ගැනීම මරා ගැනීම ප්‍රශ්නයක් ව තිබේ.

දිය කෙළවර ගොඩට වී අව්ව තපින ගෙම්බෝ ඔහු ළං වන විට ම වහා දියට පැන ගනිති. උන් මසට සුදුසු සේ ඔහුට පෙනී ගියත් ඔහුගේ ඔතැනි උත්සාහයන්ගෙන් උන් අල්ලා ගත නො හැක.

හැන්ස් දිය කෙළවර හිඳගෙන දෙදණ මත දෙ වැලමිටි තබා ඒ මත හිස තබා ගෙන කල්පනා කරමින් සිටින විට යමක් දියට වැටෙන හඬක් හා ගෙම්බකුගේ හැඬීමක් ද ඔහුට ඇසිණ. සොයා බැලූ ඔහුට දකින්ට ලැබුණේ දියබරියකු ගෙම්බකුගේ කකුලකින් අල්ලා ඩැහැගෙන සිටින බව ය. තව මොහොතකින් ගෙම්බා දියබරියාගේ මහ පළල් මුව තුළට ඇදෙනු හේ දුටුවේ ය. ගෙම්බාගෙන් එළියට පෙනෙන්ට තුබුණේ උගේ හිස පමණකි. හැන්ස් වහා කෝටුවක් ගෙන දියබරියාට ගැසුවේ ය. බලාපොරොත්තු නොවූ මේ පහර නිසා දියබරියා උගේ ග්‍රහණය ලිහිල් කෙළේ ය. ඒ සමග ම ගෙම්බා ද දහලා උගේ කටින් එළියට- පැන ගත්තේ ය. හැන්ස් වහා පැන ගෙම්බා අල්ලා ගත්තේ ගස් සෙවණට ගෙන ගොස් බිම තැබුවේ ය. ගෙම්බා පැන යන්ට උත්සාහ කළ නමුත් හේ "නෑ උඹ යන්නෙ නෑ" කියා ඌ අල්ලා වැරෙන් බිම ගැසුවේ ය.

ගෙම්බා මෙතෙක් ඉක්මනට සුවපත් වී පැන යන්ට තැත් කිරීම නිසා ඌ අල්ලා ගෙන සිටි සර්පයා විස නැති එකකු විය හැකි බව හැන්ස් සිතා ගත්තේ ය. හැන්ස් ඒ අප්‍රියකර මාංසය දෙස බලා සිටියේ ය. ප්‍රංශ ජාතිකයෝ ගෙම්බන් ආහාරයට ගනිති. මේ මස පිළිකුල් කිරීමට ඔහු කවරෙක් ද? හේ තම ඉණ බැඳගෙන තුබුණ ඊතල මුණ ලිහා අතට ගත්තේ ගෙම්බාගේ එක් ගාතයක් කපා හම ගසා රස බැලුවේ ය. එය මිහිරි රසින් යුතු විය. හේ උගේ ඉතිරි කොටස් ද හම ගසා කෑවේ ය. එහෙත් බඩගින්නේ සිටින කොලුවාට ඒ එක කටක් පමණකි. හෙතෙම ගෙම්බාගේ ඉතිරි කොටස, ඉතා පහතින් පියාසර කළ උකුස්සකු වෙතට විසි කෙළෙන් උකුස්සා එය අහසේදී ම අල්ලා ගත්තේ ය.

මඩේ ලැග සිටි මීමුන් සැනසිලි සිතකින් යුතු ව වමාරා කන සැටි හේ බලා සිටියේ ය. එක් පැටවෙක් මවු දෙනගෙන් කිරි

උරා බීවේ ය. මාන කොකෙක් නොගැඹුරු දියේ නිසල ව බලා සිටියේ එක් වර ම සිය හොටය දිය යට ගසා ඔසවා දිලිසෙන අපූරු මසකු උඩ බලා ගිල්ලේ ය. ඔහු සිටි තැනට නුදුරෙන් කලාඳුරු වැනි අල වර්ග සෙවීමට ඌරෙක් බිම හාරමින් සිටියේ ය. වන සැවුලෙක් වහා එතැනට පැන මතු වී දඟලන පණුවන් අවුලා කන්ට වන්නේ ය. බිම දුවමින් කුඩා සතුන් අවුලා කෑ පණු කුරුල්ලෙක් දිව ගොස් ඇත් වසුරු පිඩක් මතට නැගී ප්‍රීති ගී ගායනයක් කෙළේ ය.

''මේ හැම සතකු ම කා බී ප්‍රීතියෙන් ඉන්නවා, මා පමණක් බඩගින්නේ,'' හැන්ස් සිතුවේ ය.

මේ කල්පනාවෙන් සිත ඉවත් කොට සිහි එළවා ගත් හැන්ස් එළිමහන් බිමේ අවට විසිරී පැවති සත්ත්ව ජීවිතයේ සෞන්දර්‍ය්‍යය නැරඹුවේ ය. හෙවණ ඇති වන අද්දර පිටියේ තැනින් තැන මුවෝ තණ කමින් සිටියහ. ඌරෝ මඩෙහි ලැග මඩ තළමින් උන්නෝ ය. උසට වැඩුණු තණ පඳුරු අතර ඇත්තු තිදෙනෙක් වූහ. මොවුන් අතුරෙන් වැහැරුණු සිරුර ඇති ව සිටියේ තම මිත්‍රයා බව සිතා ගැනීමට ඔහුට කාලයක් ගත නො වී ය. හේ වහා එහි ගොස් ඇතා තමා දෙසට දිගු කළ සොඬය අල්ලා ගෙන උගේ පිට උඩ නැංගේ ය. එසේ නැග ළහට ආ කුරුල්ලකු අල්ලා ගැනීමේ බලාපොරොත්තුවෙන් පිළිමයක් සේ නිශ්චල ඉරියව්වකින් සිටියේ ය. ටික වේලාවකින් කුඩා වර්ගයේ සුදු රාජාලියෙක් ඔහුගේ අත දිග හරියේ ලැග්ගේ ය. වහා ඌ අල්ලා බද ගත් හැන්ස් උගේ ගෙල ඇඹරුවේ ය. උගේ අත්තටු ගැසීමෙන් සුදු පියාපත් ගැළවී සුළඟේ පාවී ගිය අතර හැන්ස් මුලින් ගත් ගෙඹි මසට වඩා සැහෙන හොඳ ආහාරයක් භුක්ති වින්දේ ය.

බිම්බි තමා හැර ගොස් වඳුරු මුළකට එක් වී සිටි හෙයින් රාත්‍රි කාලයේදී හැන්ස්ට තනි කමක් දැනෙන්ට විය.

පසුව ද උදයේ හැන්ස් විලට බැස එහි වැඩී තුබුණු පලා දළුවලින් හීල ආහාරය පිරිමසා ගත්තේ අද කෙසේ නමුත් හොඳ ආහාරයක් සොයා ගත යුතු යයි සිතා ගෙන අව්ව සැර වෙන්ට පෙර ගමන් ආරම්භ කෙළේ ය. ඔහු මේ වනාන්ත දිගේ පැය දෙකක් ගමන් කළ නුමුත් කිසිවකුත් හමු නො වී ය. එහෙත් මෙහිදී ඔහුට යමක් බර බර ගා විකන හඬක් ඇසී හේ හිටි වන ම කන් දී සිටියේ ය. හනික ගසකට නැග අවට එබිකම් කර බැලූ ඔහුට කොළ අතුරෙන් වරින් වර පෙනී ගිය දිවියකුගේ වැනි ඡේයාවක් දැකිය හැකි විය.

ගසට වී ඉවසිල්ලෙන් බලා සිටිය ඔහුට මෙතෙක් ඇසුණු ශබ්දය අඩු වේගන යන බව දැනුණෙන් දිවියා ගොදුර ඇද ගෙන

යන බව සිතා ගත්තේ ය. තවත් බොහෝ වේලාවකට පසු ව ගසෙන් බැස ගත් හැන්ස් මැරුණ සතා සොයා ගියේ ය. එසේ ගිය ඔහුට බඩවැල් ඇද දමනු ලැබූ මුවකුගේ මළ සිරුරක් හමු විය. ඔහු වහා වැඩට බැස්සේ ඉණ තුබූ ඊතලය අතට ගෙන මුවාගේ පස්සා ගාතයක් කපා වෙන් කොට ගත්තේ ය. ඔහු එසේ කළේ දිවියා ආපසු ඒ දැයි අවට හොඳ හැටි වරින් වර බලමින් හා සියුම් ලෙස කන් දීගන සිටීමෙනුත් ය. සතාගෙන් කොටසක් කපා ගැන්මෙන් පසු ව තවත් එහි නොරැඳුණ හේ සැතපුම් බාගයක් පමණ දුරින් වූ අසල ගල් තලාව මතට ගෙන ගියේ ය. ඊතලයේ ආධාරයෙන් මුව ගාතය හම ගසා ගත් හැන්ස් බඩ පුරා අමු මස් කෑවේ ය. ඉතිරි මස සිහින් තීරුවලට ඉරා වියලෙන්ට රත් වූ ගල් තලය මත ඇතුරුවේ ය. රතු ඉන්දියා ජාතිකයන් මෙසේ මස් වියලා ගන්නා බව ඔහු අසා තුබුණේ ය. ඔහුට ගින්දර නොතුබුණ නමුත් රත් වූ ගලත් අධි අව්වත් නිසා වියලීමේ කාරිය ඉටුවේ යයි හැන්ස් බලපොරොත්තු වුණේ ය.

සිය කාර්යය මෙසේ ඉවර කළ හේ හෙවණකට ගොස් හිඳ ගත්තේ ය. ඔහු එතැනින් නැගී යනවාත් සමග ම එතෙක් රැක ගෙන උකුසු ඇස්වලින් බලා සිටිය උකුස්සෝ දෙදෙනෙක් වහා එතැනට බැස මස් තීරු දෙකක් නියෙන් ඩැහැගෙන ඉගිලුණෝ ය. ඒ දුටු හැන්ස් පොලු කැලි ගොඩක් ළඟ තබා ගෙන මුළු දවස තිස්සේ ම මස් ටික මුර කෙළේ ය. හැන්දෑ වන විට ඒවා දුඹුරුවන් වී තුබුණෙන් හේ ඒවා එකතු කොට රුක් බිලයක ලා සඟවා තැබුවේ ය. තවත් දෙ දිනක් මෙසේ වේලීමෙන් පසු ව ඔහුට සතියකට සෑහෙන හොඳ ආහාරයක් සැලසුණේ ය.

එක් දිනක් අසල වනයේ සතුන්ගේ කලබලයක් ඇසී බලන්ට දුව ගිය හැන්ස්ට දකින්ට ලැබුණේ හිවලුන් දෙදෙනකු විසින් ඇද ගෙන යනු ලබන මුව පැටවෙකි. උගේ මව නිර්භය ව ඔවුන්ට පහර දුන්නා ය. එහෙත් මේ හිවල්ලු ඉතා කපටි ගති ඇත්තෝ ය. මුව දෙන ඔවුන්ට තම ඉදිරි ගාත් දෙකින් පහර දෙන්ට වූ විට එක් හිවලෙක් ඇය හා සටන් කරන අතර අනික් හිවලා පැටවා මරා ගන්ට උත්සාහ කෙළේ ය. මෙහිදී හැන්ස් ඔවුන් අතරට පැන මුව පැටවා ඔසවා ගෙන ඌ නිදහස් කර නො ගත්තේ නම් හිවලුන්ගේ කාරිය ඉටු වෙන්ට ඉඩ තිබිණි. මුව පැටවා බියෙන් වෙවුලන්ට විය. උගේ තුවාල බලවත් නො වූයෙන් ඌ හැන්ස්ගේ අතින් පැන මවුගේ තුරුල්ලට වැදී කිරි උරන්ට විය.

එදා සිට හැම දිනක ම මේ මුව දෙනත් පැටවාත් එවේලාවට එතැනට පැමිණෙන්ට පුරුදු වූවෝ ය. ඔවුන් හා යහළු වූ හැන්ස් මුව පැටවා සුරතල් කෙළේ ය. එසේ කිරීමෙන් හැන්ස් මුව දෙනගේ විශ්වාසය දිනා ගත්තෙන් ඈ තමාගේ බුරුල්ලෙන් කිරි

උරා බීමට ඔහුට ඉඩ හැරියා ය. එහෙත් පැටවාගේ ආහාරය පැහැර ගැනීමට නොකැමති වූ හැන්ස් කොයි වේටෙක වත් උගුරකට දෙකකට වඩා කිරි උරා නො ගත්තේ ය.

ස්වභාව ධර්මතාව විසින් දිවියාගේ ගොදුර වශයෙන් සලකනු ලබන මුවා වනයේ නිතොර ව ම මරනු ලබන සතා ද විය. ඔවුන්ගේ ජීවිතය බියෙන් සැකෙන් පිරුණු එකකි. මුව රැළක් ගොදුරු කන අතර තරුණ මුවකු හෝ දෙන්නකු නිල් කොළ පතක් පසාකර පෙනෙන තියුණු දෙනෙත් හා ඉතා සියුම් හඬකට පවා යොමුකර ගත් දෙකන් ද ඇති ව අනතුරක් කොයි අතින් ඒ දැයි ඉව කරමින් මුර සේවයේ යෙදී සිටින සැටි හැන්ස් දුටුවේ ය. සැක කටයුතු සිහින් ශබ්දයක් පවා ඇසුණ කෙණෙහි ම මුව රැළේ සියලු ම මුවෝ එකවර හිස් ඔසවා, මවු දෙනුන් කුඩා පැටවුන් ඇළයට ගෙන අනතුරු කොයි දිසාවෙන් ඒ දැයි විමසිලි කරති. එහෙත් දිවියා හැම විට ම උන් ගොදුරු කර ගනියි. බෝහෝ විට දිවියා මුවන් යන මග ගසක අත්තකට නැඟ මුවහ වී රැක සිට එකකු පිටට කඩා පනියි. නැතහොත් හෙමින් හෙමින් පස්සේ යමින් ළං ව පැන අල්ලා ගනියි. දිවියා දෙනත් සමග එකතු වී දඩයමේ යෙදෙන අවස්ථාවල එකකු මුවන් පැන යන මංකපොල්ලක සැඟ වී බලා සිටින අතර අනිකා අනික් පසින් ගොස් ඔවුන් ඉදිරියේ පෙනී සිටියි. උගේ දැකීමෙන් තැති ගෙන විසිරී ආපසු දුවන මුව රැළෙන් තනි ව දුවන එකකු බලා රැකවලේ සිටි දිවියා කඩා පනියි.

ඉඩෝරය පවතින මේ දිනවල හැම ද ම හැන්දෑ වේගන එන විට ඇත්තු එහි ආවෝ ය. ඔවුන් මෙවෙලේ එන්නේ ආහාර සොයා රාත්‍රි සංචාරයේ යාමට පෙර දිය බී නාගෙන යාම සඳහා ය. හැන්ස්ගේ හිතවතා වූ ''දිකුද්'' (සන සම් ඇත්තා) ද ඔවුන් අතර විය. අනික් ඇතුන්ට වඩා උසින් ද මහත් දළ දෙකකින් ද යුතු වූ ඌ දුර තියා අඳුනා ගත හැකි විය. එහි ගිය හැන්ස් උගේ කරට නැගී වැවේ මීමුන් ඌරන් හා පක්ෂීන් ද අතර ගැවසුණේ ය. බලවතුන් ආශ්‍රයේ සිටි ඔහුට ඒ එකෙකුත් විරුද්ධකමක් නො පෑවේ ය. ඒ තබා ඇතු පිටින් බැස ඔවුන් අතර දියේ එහා මෙහා යාමට පවා උන්ගෙන් අවහිරයක් නො වී ය.

අනික් සියලු ම වන සතුන්ට වඩා හැන්ස් බිය ගත්තේ කුළු මීමුන්ට ය. කුළාගේ ශක්තිමත් ගෙලට ඉහළින් පිහිටි විශාල අං දෙකට මෙන් ම උගේ තේජස්වී පෙනුමට ද හේ බිය විය. දිනක් මේ කුළාගේ දෙනුන් පට්ටියට අනික් කුළු මදයකු ළං වූ අවස්ථාවේදී මොහුගේ දරුණු කමත් ශක්තියත් මැන ගැනීමේ අවස්ථාවක් හැන්ස්ට ලැබුණේ ය. එය ඔහුට කිසි දිනකත් අමතක නොවන දර්ශනයකි. වියලි බිමේ වේගයෙන් පැන ගෙන ගොස් එකිනෙකා හිසට හිස හප්පා ඇන ගත් සැටිත් උන්ගේ

මහ අං පොලු ගැටුමෙන් නැඟුණ මහ හඬින් වනය දෙදරුම් කැ සැවිත් ඔහුට අමතක නො වේ. එක සමාන මහත් ශරීර ශක්තියකින් යුත් මුන් දෙදෙනා බොහෝ වේලාවක් මෙසේ ඇන ගැනීමෙන් පසු එකකු පිඹගෙන ගොස් වේගයෙන් දුන් පහර නිසා අනිකාගේ පසු පස බිම ඇණී ඉන්දවිණ. එකෙණෙහි ම අහ බේරා ගත් රැළේ කුළා ඇළයට නැමී අනිකාගේ ඇළපතේ ගැඹුරු තුවාලයක් ව කඩාගෙන යන සේ අං කෙළවරින් ඇන්නේ ය. මේ දරුණු පහරින් අඩපණ වූ අමුත්තා වහා නැගිට අනිකා පසු පස එළවද්දී කැලය බිඳ ගෙන දිව්වේය. ඒ පහර නිසා ඇති වූ වණයෙන් ඌ මිය යන්ට හෝ කලක් ඔත්පල ව සිට වැහැරී යන්ට හෝ ඇත.

දිකුද්ගේ ආශ්‍රය නිසා මේ කුළා කෙරෙහි පවා හැන්ස් තුළ තුබුණ බිය කෙමෙන් පහ වී යන්ට විය. කුළා ද මේ මිනිස් ගඳක් නැති ගස් ගඳ හමන නිරුවත් මිනිස් දරුවා තමන්ගේ රැළේ එකකු සේ සැලකුවේ ය. වන සතුන් මෙන් ම වනය කා ජීවත් වන, ගිනි භාවිතයක් නැති, තඹවන් සිරුරක් හා අවුල් කෙස් ද ඇති ඔහු කෙරෙහි අනික් වන සතුන්ට වඩා කිසි ම උසස් බවක් නො වී ය.

කුඩා වසු පැටවකු සහිත මී දෙනක් එහි වූවා ය. කිසියම් අදහසක් සිතේ ඇති ව හැන්ස් මේ වසු පැටවා තනි කොට ගෙන අතපත ගා මිතුරු විය. ඊළඟට දෙනට තණපත් අහුරු කඩා ගෙනවුත් දීමෙන් හා ඇගේ ඇහේ කිනිතුල්ලන් කඩා දැමීමෙන් ද ඇයට සංග්‍රහ කෙළේ ය. මෙසේ මී දෙන ඔහුට හොඳින් හීලෑ වූ පසු ඔහුට ඇගෙන් කිරි දෙවා ගැනීමට දෙන ඉඩ දුන්නා ය. ඒ වෙනුවෙන් සාදගත් මැටි භාජනයකට හේ දිනපතා කිරි දෙවා ගත්තේ ය. ඇගේ බුරුල්ල කිරෙන් බර ව තුබුණු හෙයින් තමාට ඇති තර ම කිරි ඇගෙන් දෙවා ගැනීමට හේ මැළි නො වී ය. ටික දිනක් යන විට දෙනගේ තැගිවන්තකම නිසා හැන්ස් ශක්තිමත් ක්‍රියාශීලී තරුණයකු බවට පත් විය.

මේ වනයේ වූ මහ ගස් අතර එක් මහ ගසක් තමාගේ වාසය සඳහා හැන්ස් තෝරා ගත්තේ ය. මෙය විලට මඳක් දුරින් වනය තුළ පිහිටියේ ය. විශාල ලෙස පැතිර සිටි මහ නුග ගසක් වූ මෙහි මුදුන් අතුවලට නැග බැලූ විට විලත් අවට තණ පිටියත් හොඳින් පෙනේ. මේ නුග ගස අර ගල් පොකුණ ළඟ තිබුණු මහ නුග ගසට වඩා බෙහෙවින් විශාල ය. ගසේ හරස් අතට විහිදී ගිය මහ අතු හැම පැත්තෙන් ම ඇති අතර ඒ අතුවලින් පහළට ඇදී ගිය අරළු බිමට ඇදී මහ කඳන් සේ වැඩී ඇත.

ලොකු අතු දෙකක් බෙදී ගිය ඉඩ ඇති දෙබලක හැන්ස් රාත්‍රී කාලයේ මෙන් ම දවල් කාලයේ ද වැතිරී නිද ගත්තේ ය.

හොඳට ඉඩ තුබුණු මෙවැනි දෙබල් කීපයක් ම මේ ගසේ විය. එයින් පෙරළී බිමට වැටෙ ය යන බියක් ඔහු කෙරෙහි ඇති නො වී ය.

මේ ගස නිවාසය කර ගත් තවත් සත්තු එහි වූහ. දිරා යාමෙන් ඇතුළත සිදුරු ව දෙපැත්තකින් කට ඇති ව තුබුණ එහි එක් මුලක මුගටි පවුලක් විසී ය. මේ බිලයේ එක් කටක් පොළොවට ළං ව පිහිටි අතර අනික් කට අඩි කීපයක් ඉහළින් පිහිටියේ ය. බොහෝ විට මේ පවුලේ කිසිවෙක් උඩ සිදුරින් හොරෙන් එබී බලන සිරිතක් පැවැත්තේ ය. මුගටි පවුල මවු පිය දෙදෙනාගෙන් හා කුඩා පැටවුන් දෙදෙනකුගෙන් ද යුක්ත වී ය. හැන්ස් මේ පැටවුන්ගෙන් එකකු අතපත ගා සුරතල් කෙළේ ය. ඌ නිතර සෙමින් නගන ටික් ටික් ටික් හඬ අනුව ඌ ''ටිකී'' යයි හැන්ස් නම් කෙළේ ය. මේ පැටවා සුරතල් කිරීම ගැන බිම්බි මුලින් ඊෂ්‍යා කළා ය. එහෙත් පසු ව හැන්ස් කෙරේ ඇති ළැදි කම නිසා දෙදෙනා මිත්‍ර වූහ.

දවල් කාලයේ සැරිසරන කෑදැත්තෝ අළු කොබෙයියෝ නීල කොබෙයියෝ, බටගොයි, කොට්ටෝරුවෝ, කහ කොණ්ඩයෝ, කොණ්ඩයෝ හා කැරල්ලු ද වෙනත් කුඩා කුඩා පක්ෂීහු ද බොහෝ සෙයින් මෙහි ලැග සිටියහ. මේ හැම පක්ෂීන්ගේ නාදය එක් වූ විට එය ආනන්දජනක සංකර සංගීතයක් ව පෙනුණේ ය. රළු කර්කශ ස්වරයන්, නැවත නැවත ගායනය වන අත්වැල් කීම් වැනි ස්වරයන්, සිහින් හඬින් කොඳුරා කියන ස්වරයන් මෙන් ම නිසල සිහින් කෙඳිරීම් ද මේ වන සංගීතයෙහි බහුල විය.

මනහර දකුම්කලු දර්ශනයක් මෙන් ම චමත්කාර ජනක ගීත රාවයන් ද අතරට වී ඒවා දකිමින් ඒවාට කන් දෙමින් සිටින හැන්ස්ට හැඟී ගියේ තමා මේ වන පරිසරයට ම මිස බාහිර ලෝකයට අයත් කෙනකු නොවන බව ය. තමා මේ සිටින්නේ සිය නිවෙසින් බොහෝ දුර ව ය. නැව් යන මුහුදින් බොහෝ දුර ව ය. තමා මුහුදුබත් වන්ට නොදී බේරා ගත් ෆ්‍රිට්ස් කෙරෙන් බොහෝ දුර ව ය.

හැන්ස් දින සති ආදිය ගණන් නො ගත්තේ ය. ඔහුට මෙහි ඇති කටයුතු දවසට ප්‍රමාණවත් ය. හේ වන සත්ත්ව ලෝකයේ එක් වන සත්ත්වයෙකි; අනික් වන සතුන් මෙන් ම ශක්තිමත් ය; වේගවත් ය. ස්වාභාවික පරිසරය ඔහුගේ පරිසරය යි. හැන්ස් අලුයම් ගීතයෙන් ප්‍රීතියෙන් කුල්මත් වෙයි. නිශ්චල මධ්‍යාහ්නයේ අලස ව සිටියි. ශාන්ත සන්ධ්‍යා සමයේ තැන්පත් ව හිර බැස යන තුරු අහස දෙස බලා ගෙන අඳුරේ ගිලී යන ලෝකයේ ආරක්ෂාවට තාරකාවන් එළි බැස එන සැටි බලා සිටී.

# 9

## සුදු ගෝනා

හැන්ස් තමා දකින හැම දෙයක් ම විමසිල්ලෙන් බැලුවේ ය. හැම විට ම කිරීමට විශේෂ කාරියක් ඇති හැන්ස්ට කිසි විටෙකත් කාන්සියක් නො දැනුණේ ය.

විල අවට බුරුල් පස ඇති බිමෙහි යන එන හැම සතකුගේ ම අඩි සටහන් පැහැදිලි ව පෙනෙන්ට තුබුණේ ය. මුදු තෙත් බිමේ යමින් අඩිය එබී ගිය කොබෙයියාගේ පටන් තදින් එරී ගිය මහ අඩි ඇති ඇතා දක්වා වූ සතුන්ගේ අඩි සටහන් මෙහි වී ය. මෙහි ඌරන්ගේ හා මුවන්ගේ බෙදුණ අඩි සටහන් ඇති වූ අතර, වලසුන්ගේ හා ඉත්තෑවුන්ගේ ද, දිවියන්ගේ, හිවලුන්ගේ හා කලවැද්දන්ගේ ද මොළොක් කොට්ටා සහිත පා සටහන් ද එහි විය. හැන්ස් මේ එකිනෙකෙහි ඇති වෙනස්කම් පරීක්ෂාකර බැලුවේ ය. මඩ සහිත බිමේ මේ අඩි සටහන් පැහැදිලි ව පෙනුණේ ය. තද වියලි බිමට යන විට මේ සටහන් එකකින් එකක් අඳුනා ගත නො හැකි තරමට මැකී ගොස් තුබුණේ ය.

හොඳින් හඳ එළිය පැවති එක් රැයක ගෝනකුගේ හඬක් අසන්ට ලැබුණ හැන්ස් තමා සිටි ගසේ හිරිමුදුන් අත්තට නැග විල අවට පිටිය හොඳින් පිරික්සා බැලුවේ ය. පුදුමය දියුණු කරවමින් ඔහුට දකින්ට ලැබුණේ සුදු ගෝනකු වැව කෙළවර නිසල ව සිටින බවකි. භූතයන් පිළිබඳ බොරු බියක් මේ වන ජීවිතයේදී හැන්ස් කෙරෙහි ඇති වී තුබුණෙන් මේ සුදු ගෝනා වනයේ කිසියම් අවතාරයක් විය හැකැයි සිතුණ ඔහුගේ ඇඟ කිළිපොළා සමේ හිරිගඩු පිපී ගියේ ය. එහෙත් මේ අවතාරය තව මොහොතකින් වැවට නැමී දිය බී තණ පිටිය හරහා ගොස් වනයට ඇතුළු වනු දැකීමෙන් මේ අවතාරයක් නො ව මසින් ලෙයින් සැදුණ සතකු ම විය යුතු යයි හේ වටහා ගත්තේ ය.

හැන්ස් දුටු මේ පුදුම දර්ශනය ඔහුගේ සිතේ බල පවත්වන්ට විය. මේ අපූරු සතාගේ මනහර දර්ශනය නැවත ලබන තෙක් ඔහුට අන් කිසිවකින් සතුටක් ලබනු නො හැකි විය. රැයක් පාසා තම මුරපළේ සිට හැන්ස් අවට පරීක්ෂා කළ නමුත් ඔහුට සුදු ගෝනා දැකිය හැකි නො වී ය. දහවල් වනයේ ඇවිදින විට ද ඔහු ඉතා සැලකිල්ලකින් විමසුම් කෙළේ සුදු ගෝනා ගැන ම ය. සති ගණනක් ගත විය. තමා කිසියම් මායාවකින් මුළා ව මෙවැනි දර්ශනයක් ලැබුවේ යයි හේ සිතන්ට වන්නේ ය. එහෙත් එක් දිනක් ඔහු වනයේ ඇවිදින අතර වන බූටෑවේ

කොළ අතු අතරෙන් සුදුවන් සතකුගේ සේයාවක් දුටුවේ ය. ඌ ඉතා සෙමින් කලබල නැති ව ගමන් කෙළේ ය. ගෝන දෙනුන් දෙදෙනකුත් සමග මේ සිටින්නේ තමා මෙතෙක් සොයමින් සිටි සුදු ගෝනා බව හැන්ස් දුටුවේ ය. ඔවුන් කර ඔසවා පඳුරුවල දලු කඩා කෑ අතර හැන්ස් බොහෝ වේලාවක් ඔවුන් දෙස බලා සිටියේ ය. වනයේදී ආරක්ෂා වීමට සුදුසු පැහැයක් නොලබා මේ සතා මෙතෙක් වැඩුණේ කෙසේ ද, මේ තනි සුදු පැහැය උගේ ආරක්ෂාවට කොතරම් බාධාවක් ද යනුවෙන් හේ කල්පනා කෙළේ ය. මේ සුදු ගෝනා හොඳින් වැඩුණ නාම්බෙකි. ගෝන රජෙකි. හොඳින් වැඩුණ ශක්තිමත් අංබලටු යුවළකින් උගේ හිස සැරසී තිබේ. කොතරම් ශක්තිමත් දිවියකුට වුවත් පැරද විය නො හැකි සතෙකි.

සති ගණනකට පසු දිනක් හැන්ස් වනයේ අල හාරමින් සිටින අතර වනය බිඳෙන හඬක් ඇසී හිස ඔසවා බැලුවේ ය. වනය බිඳ ගෙන පැමිණි සුදු ගෝනා එහි නැවතුණේ ය. නැවතී හැරී කර ඔසවා සිටිනවාත් සමග ම එදෙසින් ආ දිවියෙක් ඌ පිටට පැන්නේ ය. එකෙණෙහි කර අඹරා හැරී සිටි ගෝනා උගේ අඟ නමා දිවියාට ඇන්නේ ය. අං පහරින් දිවියාට තුවාල විය. ඉන් පසු දෙදෙනා අතර ඉතා බිහිසුණු සටනක් පැවතුණේ ය. සම සම වූ ශක්තියෙන් යුතු වූ සත්තු දෙදෙනා එකකුට එකෙක් නොපරදින සේ සටන් කළෝ ය. හොඳට වැඩුණ ගෝන නාම්බා ශක්තිමත් ය. එසේ ම දිවියා ද කඩිසර ය. සැම විට ම පහර දෙන්නා වූ දිවියා සටන් නීතිය අනුව කපටි දීන සටන් කරුවෙක් විය. එහෙත් මේ වනයේ මෙය ශූරතාව දිනාගැනීමේ සටනක් නොව ජීවිතය පවත්වා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ සටනකි. ඇවිසී ගිය කෝපයෙන් දැවෙන දිවියාගේ දෙනෙතින් ගිනි පුලිඟු විසිවන්නාක් මෙන් විය. උගේ දෙකන පිටුපසට ඇදී හිසට ඇලී තුබුණේ ය. ඌ ගොදුරට පනින්ට සූදනම් ව දත් විලිස්සා වලිගය බිම ගසමින් සිටියේ ය. ස්වභාවයෙන් මහත් වූ ගෝනාගේ දෙනෙත බිය නිසා වඩාත් මහත් ව තුබුණ අතර ඇස් ගුළ කඳු-ලෙන් පිරී තුබුණේ ය. එහෙත් උගේ අංදලු සුදු තද ඒවා විය. උගේ කරේ කෙසරු පිපී උස් ව සිටි හෙයින් ඌ වෙනදට වඩා මහත් ව සිටි සේ පෙනිණ. එකකුට අනෙකා වැටෙන්ට පහර දීමට සැරසුණ මල්ල යෝධයන් දෙදෙනකුන් මෙන් ඔවු-නොවුන් මුහුණ බලා ගත් වන ම දෙදෙනා බලා සිටියෝ ය. ගෝනාගේ තියුණු අංවලට අසු නොවී මග හැර උගේ පිට උඩට පැන ගැනීම දිවියාගේ අදහස ව ඇති අතර පනින දිවියාට අං පහර එල්ල කිරීම ගෝනාගේ අදහස වී ය. ඔවුන් පොරට වැටුණ හැම විට ම දෙදෙනා ම සැහෙන තුවාල ඇති කර ගත්හ. එහෙත් මෙවිට නොඉවසිලි ගතියක් දැක් වූ ගෝනා දුවගන්ට



මුළු වැර යොද ඔහු දිවියාට පහර දෙයි.

ඉඩක් සොයන නියායෙන් ඉවත බලන්ට වී ය. ගෝනාගේ නො ඉවසිලි ගතියට හේතුව සටන ඕනෑකමෙන් බලා සිටි හැන්ස්ට තේරුම් ගත හැකි විය. තවත් දිවියෙක් තව අතකින් ඌ පිටට පැනීමට මාන බලමින් සිටියේ ය. මෙවෙලේ ම පළමු දිවියා ගෝනාගේ අංවලින් බේරී උගේ පිටට පැන ගන්නා අදහසින් අහසට පැන්නේ ය. ගෝනා ද එකෙණෙහි පස්සට වී උගේ පසු පස පහත් කොට හිස ඔසවා දිවියාට අහ පෑවේ ය. පිම්මේ වේගයෙන් දිවියා ගෝනාගේ අංගේ ඇමිණී සිටියේ ය. එක් අඟකින් උගේ ළය සිදුරු වී ගොස් තුබුණ අතර අනෙක් අඟින් ගෙල සිදුරු කරගෙන ගොස් තුබුණේ ය. මෙවිට ම අනික් දිවියා ගෝනාගේ උරහිස මතට පැන නියෙන් හා දතින් තදින් ඩැහැ ගත්තේ ය. හිස සැලීමෙන්, අඟෙහි ඇමිණී හුන් දිවියා බිමට ගසා දැමූ ගෝනා වහා ඉදිරියට පැන ඉදිරි ගාත් දෙකින් වේග-යෙන් ඌට පහර දෙන්ට විය. ඌ එසේ දෙපයින් දුන් පහර දෙමෝලෙන් හාල් පාහින වේගයට ද වඩා වේගවත් විය. මොහොතකින් දිවියා පරලොව යැවිණ. මෙතෙක් කෙරුණ මේ සටන ඉතා වේගවත් වූයෙන් ගල්ගැසී බලා සිටිනු හැර අන් කළ හැකි දෙයක් හැන්ස්ට නො වී ය. මේ අලංකාර වියඝ්‍රවත් සතාට වන්ට යන විපත ගැන කෝපයෙන් දැවුණ හැන්ස් මෙවේලේ අසරණ තත්වයක සිටි ගෝනා වෙතට ගියේ තම අත තුබුණ මුගුර දැතින් ම ඔසවා මුළු වෙර යොද ගෝනාගේ පිට උඩ කාගෙන සිටින දිවියාගේ පිටකොන්ද හරහා පහර දුන්නේ ය. වේදනාවෙන් කෙරෙන කෙඳිරියක් ඇති ව දිවියා ගෝනාගේ පිටෙන් බිමට පෙරළුණේ වරක් දෙකක් ඇඹරුණේ ය. හැන්ස් තවත් පහරක් දීමට ඌ ඉදිරියට යනවාත් සමග ම වහා නැගිට ගත් දිවියා වනයට දිව ගත්තේ ය.

සටනේ ත්‍රාසය කෙළවර විය. මුළු ඇඟ ම වෙවුලමින් සිටි ගෝනා එහි බිම වැතිර හති අරින්ට වී ය. උගේ සිරුරේ ගණන් නැති තුවාල වලින් ලේ ගලන්ට විය. තමාගේ අත්ල තුවාල වලට තබා තද කිරීමෙන් ගලන ලේ නවතන්ට හැන්ස් උත්සාහ ගත්තේ ය.

දවසේ ඉතිරි කාලය හැන්ස් ගෝනාගේ ආරක්ෂාවට මුර සිටියේ ය. ඒ අතර හේ ගෝනාගෙන් මැරුම් කෑ දිවියා හම ගැසුවේ ය. උගේ මස් පවා කෑවේ ය. රාත්‍රියේ ගෝනා ළඟ ම වැතිර නිද ගත්තේ ය.

අලුයම හිමිදිරියේ ම හැන්ස් අවදි විය. මෙවේලේ ගෝනා ද දණිපණි ගා නැගිට ගත්තේ ය. ගෝනා සැතපුම් දෙක තුනකට දුරින් වූ විල දෙසට යන්ට පිටත් වූයෙන් හැන්ස් ද ඌ අනුව ගමන් කෙළේ ය. අතර මග දෙවරක් ම ඌ පය පැකිල වැටෙන්ට

ගියෙන් හැන්ස් ඌට කෙළින් සිටීමට උදව් දුන්නේ ය. හැන්ස් ඌගේ උරය මත අත තබා ඌගේ ගමනට ධෛර්‍ය්‍ය දුන්නේ ය.

වීලට පැමිණි ගෝනා එයින් දිය බී අපූරු දෙයක් කෙළේ ය. දිය බීම පයින් පාගා මඩ කොට ඒ මඩ කුරයෙන් එකතු කොට ගොඩක් කෙළේ ය. ඉන් පසු ඒ මඩ ගොඩ ළඟ වැතිරී හොස්සෙන් මඩ ගෙන තුවාලවල තවරන්ට පටන් ගත්තේ ය. හැන්ස් ද ඌ අනුව යමින් ඌට තවරා ගත නොහැකි තැන්වල වූ තුවාලවල මඩ තැවරුවේ ය. වන සතුන් තමන්ගේ ඇඟේ ඇති වන වණවලට මෙසේ ප්‍රතිකාර කර ගනු හැන්ස් දැන සිටියේ ය. මීමුන් ඌරන් තුවාල ලැබූ විට මැස්සන්ගෙන් බේරී ගැනීමට මඩේ ලැග සිටිනු ඔහු දැක තිබේ. මෙසේ කිරීමෙන් වන සත්තු තමන්ගේ වණ සුව කර ගනිති.

ටික වේලාවකට පසු ගෝනා නැඟී සිටියේ ය. හැන්ස් ඌ කැඳවා ගෙන තමා ලගින ගස යට සෙවණට ගියෙන්, ඌ එහි ඝන ව වැඩී තුබුණ පඳුරු අතරට වී වැද හොත්තේ ය.

ගෝනා සම්පූර්ණ සතියක් ම එතැන ලැග සිටියේ ය. මේ කාලය තුළ හැන්ස් ඌ කැමති කොළ දලු වර්ග හැදින ඒවා කඩ කඩා ගෙනවුත් සංග්‍රහ කෙළේ ය. දිරා ගිය කොට කැබැල්ලකින් සාදා ගත් භාජනයකට දිය ද ගෙනැවිත් දුන්නේ ය.

ගෝනාට ඇවිද ගන්ට තරමට සුවය ලැබුණ විට හැන්ස් ද ඌ සමග වනයට ගියේ ය. පසු ව දෙදෙනා තම තමාගේ ආහාර සොයා වෙන් ව ගියෝ ය. සුදු වැද්දා හා සුදු ගෝනා ද අතර මිත්‍ර සම්බන්ධය ඇති වීමට මේ සිද්ධිය හේතුව වී ය. වනයේ ඇවිදින අතර බොහෝ විට ඔවුහු හමු වූහ. හැන්දෑ කාලයේ මෙන් ම දවල් කාලයේ ද හැන්ස් හමු වීමට ඔහුගේ ගස යටට ඒමට ගෝනා පුරුදු ව සිටියේ ය. වැඩි කලක් යන්ට පෙර ම හේ ගෝනා පිට නැඟී පිටියේ එහා මෙහා දුවන්ට පටන් ගත්තේ ය. මුලදී මේ සිද්ධිය දුටු අනික් වන සත්තු කලබල ව පුදුම ව බලා සිටියහ. එහෙත් වැඩි දිනක් යාමට පෙර ම ඒ සත්තු ද මේ අපූරු දර්ශනයට පුරුදු වූහ. හැම විට ම හැන්ස් අනුගමනය කරන බිම්බි ද ගෝනා පිට යාමට පුරුදු වූවා ය. ඇතින් දෙපයින් ගෝනාගේ පිට තරයේ අල්ලා ගත් බිම්බි හොඳ අසරුවකු මෙන් ගෝනා පිට නැග ගියා ය.

# 10

## වනයේ වැහි

නැව බිඳී ගොස් හැන්ස් වන ගත වීමෙන් හමසක් ඉකුත් විය. හැන්ස් මේ වැව අසල වාසයට පැමිණ සිවු මසකි. මේ මුළු කාලය තුළ ම නියඟය පැවතිණ. වැවේ දිය සිඳී අඩු වී යන අතර සතර වටින් දිවා රෑ දෙකේ එහි දිය බීමට එන වන සතුන්ගේ ගණන ද වැඩි වන්ට වී ය. උණුසුම ඉවසිය නොහැකි තරම් වූ අතර අලුයම් කාලයේදී පවා සුළං රැළක් හමා නො ගියේ ය. වාතය නිශ්චල විය. තුරු ගොබඩු වියළී ගියේ ය. යටි කැලය තුනී ව ගියේ ය. බැලූ බැල්මට වනයේ බොහෝ දුර පෙනිණ. වන බිම වැටුණ වියළි කොළවලින් ගහන ව සර සර ගා පයට පෑගුණේ ය.

නැගෙනහිරි අහසේ කළු වලාකුළු පෙනී ගියේ ය. වාතය පීඩා ගෙන දෙන සුලු වී ය. දෙව්ලොව කුපිත වේගන එන්නාක් මෙන් සිහින් ගිගුරුම් හඬ දුරින් ඇසෙන්ට විය. එක් රැයක ගෙම්බන්ගේ බක බකය විල දෙසින් ඇසෙන්ට විය. කට-කට-කට-කට- එළුවන් රැසකගේ එකවර හෑඩීමක් මෙන් ඒ ඇසුණේ ගෙඹි ගීත රාවයයි. මේ අතර පිරිමි ගෙම්බන්ගේ ක්‍රෝක් ක්‍රෝක් යන ගැඹුරු හඬ ද සිය දහස් ගණන් සිහින් හඬ ද මේ ගීතයට එක් වූයේ හැන්ස්ට මිහිරක් ඇති කෙළේ ය. හැන්ස්ට පමණක් නොව අනික් සතුන්ට ද එය මිහිරක් ඇති කෙළේ ය. වැස්සක් ළඟ ම එන බව හා දෙව්ලොවින් මෙලොවට සෙතක් සැලසෙන බව ද එයින් කියැවුණ හෙයිනි.

එවැනි හඬ ඇති දෙරැයකින් පසු ව එක වර ම වැහි සමය කඩා වැදුණේ ය. සටන් යොමුව සිටි අහස එකවර චතුරංගනී සෙනඟ මෙහෙයූවාක් මෙන් අහස ගොරවමින් විදිලි කොටමින් අකුණු ගසමින් මහ වැහි කඩා හැලුණේ ය. හඩා ගෙන ආ මහ සුළඟ ගස් අතර වැද ඒවායේ අතුපත් කඩා හැලුවේ ය. කොළ රිකිලි විසුරුවා හැරියේ ය. දින තුනක් රෑ දවල් තිස්සේ නො කඩවා එක සීරුවට වැහි වැස්සේ ය. මේ කාලය තුළ හැන්ස් තමාගේ රුක් නිවසට වී කුදගහගෙන සිටියේ ය. කුරුලු හඬක් ඇසෙන මානයක නො වී ය. වන සතෙක් පෙනෙන මානයක නො වී ය. වූයේ මොර සූරන්නාක් මෙන් සට සට ගා කොළ මත වැටෙන වැහි පොද පමණකි.

හතර වන දින උදයේ සිහින් පොද පැවතුණත් මහ වැසි තුරල් වී අහස එළිය වී තිබිණ. දෙව්ලොව කෝපය කෙළවර වූවාක්

මෙන් විය. ඇසීමට මිහිරි කුරුලු ගීතය අවටින් ඇසෙන්ට විය. මෙතෙක් තැන තැන සිර කර සිටි කුරුල්ලන් නිදහස ලැබූ සේ පෙනිණි.

හැන්ස්ට ඉතා තදින් බඩගිනි දැනිණි. වැහි කුණාටුව කල් ඇති ව දන්වා සිටි නමුත් මෙවැනි තද වැහි ඇති වේ යයි හැන්ස් බලාපොරොත්තු නො වූයේ ය. ඔහුගේ ආහාර ගබඩාව හිස් ව තිබිණි.

ගසින් බැස ගත් හැන්ස් දියබරි වී එරෙන පොළොවට අඩිය තැබුවේ ය. වැව පිරී උතුරා ගොස් තණ පිටියත් යට කර ගෙන වන කෙළවර දක්වා පැතිරී තිබිණි. අලුත් වතුරේ ජබ් ගහමින් යන ඔහුට දකින්ට ලැබුණේ මෙතෙක් වැලිතලාවක් ව පැවැති වියලි ඇළ කඳුරු පිරී ඉතිරී වැවට ගලා එන බව ය. තැන් තැන්වල ඉතිරි ව තුබුණ දිය වළවල සිර වී සිටි කුඩා මස්සු අලුත් වතුරේ එහා මෙහා පැන්නෝ ය. හැන්ස් මොවුන් බොහෝ දෙනකු අල්ලා කෑ නමුත් තුන් දිනක් තුළ උපවාසයේ යෙදී සිටි ඔහුගේ කුසගින්න සමනය කිරීමට ඒ ආහාරය ප්‍රමාණවත් නො වී ය.

විල අවට කැටිව සිටි වන සතුන් වැස්ස නිසා විසිරී ගොසිනි. දිකුද් හෝ එහි වූ ඇත් රැළ කීපයක අනික් ඇත්තු හෝ එහි පෙනෙන්ට නො වූහ. මීගවයෝ පමණක් එහි දකින්ට සිටියහ. මේ හැන්ස් පුරුදු දෙනගෙන් ඇති තරම කිරි දෙවා ගත්තේ ය. මේ දිනවල ඔහුට ලැබුණ ප්‍රධාන ආහාරය එය විය. වැහි කාලයේ ආරම්භය ඉවර වූ නමුත් වැහි කාලය ඉවර නො වී ය. අහසේ නැග තුබුණ කළු වලාකුළු ගිගුරුම් සහිත ව මහ වැසි මෙන් පොළොවට ගලා වැටිණ.

මීට අනතුරු ව පොද වැහි ඇති වූයෙන් වනය නව පණක් ලැබ අමුතු පැහැයක් ගත්තේ ය. තලාවන්හි වියලී තුබූ තණ පඳුරු අලුත් දලු ලා පැහැපත් විය. විල ද නව සැරසිලිවලින් බබළන්ට විය. ඕලු නෙලුම් මල් පිපී ගියේ ය. විවිධ වර්ණවත් ජලචර පක්ෂීන්ගෙන් විල පිරී ගියේ ය. විල් ලිහිණියන්, කිරි කොකුන් මැටි කොකුන් මාන කොකුන් කරවැල් කොකුන් කණ කොකුන් හා කොරවකුන් ද සේරුන් හා දියකාවුන් ද දක්නට ලැබිණ. කිරලුන් ද බහුල විය. මේ වෙනස් වෙනස් කුරුල්ලන් දැක දැක රිස්ස නොයන හැන්ස්ට මොවුන්ගේ දැකීමත් ඔවුන්ගේ නාදයන් ඇසීමත් මහත් විනෝදයක් විය.

දිනපතා මී හේ මෙහි දියට පැන නෑවේ ය. පිහිනුවේ ය. එක් දිනක් එක් භයානක සිදුවීමක් ඇති වන තුරු හේ කැමති කැමති විට මේ දියට පැන නාන්ට පුරුදු ව සිටියේ ය.

පැවිල්ල තුබුණ දිනවල දිය අද්දර අව්ව තපිමින් සිටි කිඹුලුන් ඔහු බොහෝ විට දැක තිබේ. මුලදී හේ ඔවුන්ට බිය විය. එහෙත් තමා ළං වන විට දියට පනින, තමා ඇතුන් හෝ මීවුන් කැටුව දියේ බැස යන විට මග හැර යන මේ සතුන් අහිංසක සතුන් කොටසකැයි හේ සිතා ගත්තේ ය.

වැව සිඳීගෙන යන විට මේ සියලු කිඹුලුන් එහි වහ වැටී සිටිතැයි හැන්ස් සිතා සිටි නමුත් උන්ගේ ගණන ක්‍රමයෙන් අඩු වන්ට විය. ඔවුන්ට කුමක් වන්ට ඇද්දැයි හේ සැක කෙළේ ය. එහෙත් එක් දිනක් වනයේ සැරිසරන හේ එක් තැනක අඩක් පරළුවලින් වැසී තුබුණ ලී කොටයක් මත හිඳ ගත්තේ ය. තමා ලී කොටයකැයි සිතූ දෙය යටින් සෙලවෙනු දැනී වහා ඉවතට පැන ගත් ඔහුට එහිදී දක්නට ලැබුණේ ග්‍රීෂ්මකාල නිද්‍රාවට වැටී සිටින දැවැන්ත කිඹුලෙකි. තවත් දිනක් හේ තමාගේ මිත්‍ර ඇතාත් සමග වනයේ ඇවිදින අතර එක් තැනක පඳුරු අතරෙන් තදින් ගොරවන හඬක් ඇසිණ. මේ ගෙරවීමෙන් කෝපයට පත් ඇතා කන් සලා නගුට කෙළින් කරගෙන, පඳුරු පෝඩි කර එහි ළං වී බැලූ විට දක්නට ලැබුණේ එහි වැතිරී සිටි මහ කිඹුලෙකි. ඇතාගේ පයට පෑගුණ කිඹුලා මහත් විලාප හඬක් නගන්ට විය. ඇතා ඌ සොඬින් අල්ලා දෙකට නමා ඔසවා අහසට විසි කෙළේය. කිඹුලා ගසක අතු දෙබලක රැඳී ගියේ ය. මේ සතාගේ මළ සිරුර අතු දෙබලේ ම කුණු වෙමින් තුබුණ බව පසු ව එතැනින් ගිය හැන්ස් දුටුවේ ය. පසු කල උගේ ඇටසැකිල්ල පමණක් අතු දෙබලේ තිබෙනු හැන්ස් දුටුවේ ය.

මේ මේ හේතු නිසා හැන්ස් ඔවුන් සුළු කොට තැකුවේ ය. මොවුහු කුමක් කා ජීවත් වන්නෝ දැයි හැන්ස් බොහෝ විට සිතුවේ ය. ඔවුන්ගේ හුනු පාට අසුචි දුටු හෙතෙම මොවුන් මැටි කා ජීවත් වන්නේ යයි සිතා ගත්තේ ය. මෙසේ සිතා සිටින අතර අනික් දවසක හේ එක් අපූරු නෙලුම් මලක් දෙස ආසාවෙන් බලා සිටියේ හදිසියේ ම මේ නෙලුම් මල කිඹුලකුගේ මුව තුළට ඇදී යනු දුටුවේ ය. කිඹුලා පැළෑටි වර්ග අනුභව කරන බව හැන්ස් දැන ගත්තේ එදින ය.

දියබෙහිදී කිඹුලාගේ ශක්තියට මිනිහාගේ හෝ අනික් වන සතුන්ගේ හෝ ශක්තිය පරදින බව හැන්ස් තවමත් නො දත්තේ ය. කිඹුලුන් සත්ව මාංස අනුභව කරන්නවුන් බව හැන්ස්ට ඔප්පු කිරීමට ඌට ගොදුරට ළං වූයේ අනික් වන සතකු නොව තමා ම වීම හැන්ස්ගේ අවාසනාවක් විය.

හේ දිනක් පුරුදු සේ පිහිනීමට විලට බැස්සේ ය. නෙලුම් කොළයක් මත හුන් කුරුල්ලෙක් ඔහු දැක වහා ඉගිලී ගියේ ය. එහි ළං වී බැලූ ඔහුට දකින්ට ලැබුණේ දුඹුරුවන් බිජුවට හතරකි.

හේ එයින් කුනක් බිඳ කෑවේ ය. ඉතිරි බිජුවට කමදෝ නොකම දෝ සිතමින් සිටින අතර වේගයෙන් දිය දෙබෑ වෙන හඬක් ඇසිණ. එකෙණෙහි හැන්ස් ඈඹරී ඇළයකට පැන නොගත්තේ නම් පළල් කිඹුල් කට පිය වෙද්දී එයට අසුවන්ට ඉඩ තිබිණ. ඒ ළඟට ඔහු දෑඩ ග්‍රහණයකට අසු විය. කිඹුලා ඔහුගේ ඉඟ තදින් බඳ ගත්තේ ය. කොතෙක් දඟලුවත් ඔහුට එයින් බේරී ගත නො හැකි විය. කිඹුලා හැන්ස් ගැඹුරු දියට අදින්ට විය. මේ දරුණු සතා තමාගේ නියපඳුරෙන් හැන්ස්ගේ ඉඟ තදින් බඳ ගෙන තිබිණ. උගේ හිස ඔහුගේ ළය මතු විය. හැන්ස් දූන් දිය යට ය. හැන්ස් නිදහස් ව තුබුණ තමාගේ දෑතින් කිඹුලාගේ හිස ඉවත් කරන්ට උත්සාහ ගත්තේ ය. ප්‍රතිඵලය වූයේ ග්‍රහණය තව තවත් දැඩි වීම ය. ඌ තමා මඩට තබා තද කරන බව හැන්ස්ට දැනුණේ ය. සතා තද කරන වේගය හැන්ස්ට නොඉවසිය හැකි තරම් විය. හැන්ස් සිහිසන් නැති වන තරම් වූයෙන් ගැළ වීමට කරන අවසාන උත්සාහයක් වශයෙන් උගේ හිස ඈත් කිරීමට ගැට සහිත හිසට අත ගසද්දී ඔහුගේ ඇඟිලි උගේ බුරුල් ඇස් ගුළවල ඇනුණේ ය. හැන්ස් තම ඇඟිලි තව තවත් යටට තද කෙළේ ය. එකෙණෙහි ම උගේ ග්‍රහණය ලිහිල් වී හැන්ස් දියෙන් මතු විය. හේ ගැහෙමින් හතිලමින් කලබලෙන් ගොඩ දෙසට ඇදුණේ ය. ඔහු විල් ඉවුරට ගොඩ වීමට තතනවාත් සමග ම ඒ දරුණු සතා තවත් වරක් ඔහු ගැනීමට පැන්න නමුත් හැන්ස් ඉස්සර විය. මේ සියලු සිද්ධියට මිනිත්තු කීපයකට වඩා ගත නො වූ නමුත් හැන්ස්ට මෙය කල්පයක් මෙන් විය.

ඔහුගේ ඇඟ හොඳට ම සීරී ඔහු ඉතා තදින් බිය ගෙන සිටි නමුත් ඔහුගේ හැම අවයවයක් ඔහුට ම ඉතිරි ව තිබීම පුදුමය උපදවන හේතුවක් විය.

එද එදයින් පසු අවට දිය හොඳ හැටි පරීක්ෂා නොකොට හේ දියට නො බැස්සේ ය. කිඹුලා දිය යටින් ගොදුර කරා එන්ට පෙර එක පිම්මට පැන අල්ලා ගත හැකි දැයි මඳක් දුරින් මතු වී සිට බලයි. මෙවිට උගේ පිට ගැටයේ මිනිස් අල්ලක තරම ප්‍රමාණය දියෙන් මතු වී පෙනෙයි.

මෙයින් සති කීපයකට පසු ඔහුට එවැනි ම ජීවිතයට අවදානම් වූ අත්දැකීමකට මුහුණ දෙන්ට සිදු විය. කෑමට යමක් සොයා දවස තිස්සේ ඇවිදීමෙන් වෙහෙසට පත් ව සිටි හේ දිනක් තමාගේ ගස යට වැතිර නිදා හුන්නේ අවදි ව නිදි ගැට හරිමින් නැගිට සිටියේ ය. එකෙණෙහි තමාගේ පයට යටින් යමක් ඇදෙනු දැනුණ හේ වහා ඉවතට පැන්නේ ය. තමාට යාරයක් පමණ දුරින් පෙණ ගොබය ඔසවා ගෙන පහර දීමට සූදානම් ව සිටි විශාල නාගයකු ඔහුට පෙනුණේ ය. යම්තමින් හේ සෙල-

වුණොත් උගේ දළ පහර නියත බව තේරුම ගත් හැන්ස් නො සැලී එහි ම සිටියේ ය. මෙවිට ම ටීත් ටීත් ටීක් යන හඬ සෙමින් ඇසෙන්ට විය. ඒ සමග ම ඔහුගේ මුගටියා තම බිලයෙන් එළියට ආවේ ය. නයාගේ අවධානය මෙවිට යොමු වී තුබුණේ මුගටියාගේ ශබ්දය කෙරෙහි විය. හැන්ස්ට වඩා මුගටියා නයාට සතුරු වූවකු හෙයිනි. මුගටි පැටවා ලොම් පුප්පාගෙන ගොරවමින් බිය සැක නැති ව නයා ඉදිරියට ගියේ ය. අවදානම් කාරියක් වුවත් තමාගේ සුරතලා එතැනින් ඉවත් කර ගැනීමට හැන්ස්ට සිතුණේ ය. එකෙණෙහි ම නාගයා මුගටියාට පහර දුන්නේ ය. පෙණ පහර වේගවත් වූවා සේ ම මුගටි පිම්ම ද වේගවත් විය. මුගටියා පහරින් බේරිණි. නයි පෙණය බිම ඇණී ගියේ ය. නයා නැවතත් කරකැවී සිට පිඹිමින් පහර දුන්නේ ය. මුගටි පැටවා බිය නැති ව සිට කෝපයෙන් ''කැක්'' යයි හඬ නැගුවේ ය. හැන්ස්ට සටන බලා සිටිනවාට වැඩි දෙයක් කළ නො හැකි විය. මුගටියා තමාගේ කාරිය දන සිටි බව ඔහුට පෙනී ගියේ ය. එහෙත් දෙදෙනා කෙසේවත් සටනට සම නො වී ය. නාගයා අඩි පහක් පමණ දිග විෂ සහිත සර්පයෙකි. මුගටි පැටවා අඩියක් පමණ වත් දිග සතෙක් නො වී ය.

නාගයා තවත් වරක් මුගටියාට පහර දී වරද්ද ගත්තේ ය. මුගටියා කුඩා වුවත් වටයට කරකැවෙමින් මාන බලන්නේ නයාට මාරාන්තික පහරක් දීමට ය. නාගයා තවත් වරක් ගැසූ පහර වැරදී ගියේ ය. කිසිවක් කර ගත නොහැකි ව කෝපයෙන් සිටි නාගයා පිඹිමින් කරකැවුණේ ය. මුගටියාට මෙය සතුටු උපදවන සෙල්ලමක් සේ පෙනුණේ ය. වටේ යමින් සිටි මුගටියා ඉඩයා බලා වරක් පැන උගේ කර විකුවේ ය. මෙසේ සටන දිගට ම ගියේ ය. නයා දඟලා උං ඉවතට විසි කෙළේ ය. මුගටියා නයා ගසන පහරට ඉවත පනිමින් උං වටා දුවමින් උං කලබල කෙළේ ය. එක් වරක් නයා ගැසූ තද පහරක් මුගටියාගේ ඇළයේ කා වැදුණේ ය. හැන්ස්ට කෑ ගැසුණේ ය. සටන එයින් ඉවර යයි හේ සිතී ය. එයින් පසු ව ටිකී වඩා උනන්දුවකින් වඩා නිර්භය ව පහර දුන්නේ ය. වරක් ටිකී ලොම් පුප්පා ඇස් මහත් කොට දල්වා එල්ලය බලා නයාගේ ගෙලට පැන්නේ වරක් දෙකක් සොලවා පහර වදින්ට පෙර ඉවත පැන ගත්තේ ය. නයාට පහර ගැසීමට ඉඩ හැර ගසන විට ම පහරින් බේරී එකෙණෙහි උගේ ගෙලට කඩා පැනීම ටිකී යෙදූ එක් උපායක් විය. මෙසේ මේ සටන පැයක් පමණ වේලා පැවතිණ. හැම විට ම පහර දෙන්නා මුගටියා විය. නයා දිගටම කෙළේ මුගටියාගෙන් ආරක්ෂා වෙමින් නැවත පහර දීම ය. මුගටියාගේ කඩිසර ගතිය හා සමාන කරන විට නයාගේ සටන හෙමින් කෙරෙන

සේ පෙනිණ. එහෙත් පෙනීමෙන් පිඹීමෙන් හා වේගවත් ව පහර දීමෙන් ද නාගයා ඉතා හයානක විය. ටිකී ද පහර නොකා ගැළවුණේ නො වී ය. අඩු ගණනේ හතර වරක් නයාගේ විෂ දළ උගේ ලොම අතර කා වැදුණේ ය. එහෙත් ටිකී බියක් හෝ වේදනාවක් පෙන් වූයේ නැත.

මුගටියා තවත් වරක් නයාගේ යටි හනුව ඩැහැ ගත්තේ ය. ඔවුන් එකිනෙකාගේ මුව එකට ඇවිළී තද විය. නයා උගේ දරණයෙන් මුගටියා වෙළා ගත්තේ දෙදෙනා ම එකට බිම පෙරළෙන්ට වූහ. අන්තිමට දෙදෙනා වෙන් වන විට දෙදෙනාට ම හොඳට හති වැටී තිබිණ. නයාගේ පෙණය පහත් වී යටි හනුව පහතට එල්ලෙමින් තිබිණ. ඌ මෙවේලේ සතුරාට මුහුණ දුන්නේ බැට කෑ මල්ලවයකු මෙනි. ඔවුන්ගේ අන්තිම පොරයේදී මුගටියා මුළු ගැන්නී නයාගේ වාසියට කටයුතු සැලසී තුබුණේ ය. ඇද වැටුණ ගසක මුලක් අතරට මුළු වූ ටිකීට එතැනින් එක අතකට වත් පැනීමට ඉඩක් නො වී ය. මේ අතර නාගයා මුළු වෙර යොද වේගවත් පහරක් ඌට එල්ල කෙළේ ය. මෙහිදී ටිකී කෙළින් ම අහසට පැන්නේ ය. එසේ පැන පහතට එන්නේ කරණමක් ගසා නයාගේ ඉහට ම පැන එය සපා ගත්තේ එයින් ම සටන කෙළවර කෙළේ ය. නයා යම්තම් හිස ඔසවා ඇදී යන්ට උත්සාහ ගත් නමුත් විදිලි වේගයෙන් නැවත පැන්න ටිකී උගේ මොළයෙහි ම දත් ගැසුවේ ය. සටන කෙළවර විය.

හැන්ස් වහා ඉදිරියට පැන තම සුරතලා වඩා ගෙන උගේ ලොම් අතරට කටින් පිම්බේ ය. තුවාල හත අටක් ම උගේ සමේ ඇති විය. නයාගේ එක් දළයක් කැඩී සමට කා වැදී තිබී හැන්ස් එය මිරිකා ගළවා දැමුවේ ය. ටිකීගේ ආයුස මෙයින් ඉවර යයි සිතූ හැන්ස් ඌට දිය පොවා ලේ ගලන තුවාල දියෙන් සේදුවේ ය. ඌ ගැන සිතන හැන්ස්ගේ ඇසට කඳුළු ඉනුවේ ය. ඇඳිරි වැටුණ විට ඌත් රැගෙන ගසට නැග ගත් හැන්ස් නිදිමත එන තුරු ඌට සාත්තු කෙළේ ය.

හැන්ස් උදේ අවදි ව බලන විට ටිකී පෙනෙන්ට නො සිටියේ ය. ඌගේ මළ කඳ ගස මුල වැටී ඇතැයි සිතූ හේ වහා ගසින් බැස බැලුවේ ය. ගස මුල එවැනි දෙයක් නො වී ය. එහෙත් මේ පුංචි කලහකරුවා තමා මරා දැමූ සතුරාගේ මසින් හීල පිරිමසා ගන්නවා හැන්ස්ට දකින්ට ලැබුණේ ය. මේ වන විටත් ඌ නයාගේ හිසත් ගෙලත් කා දමා තිබිණ.

## 11

# වැද්දෝ

මහ වැසි වැසීමෙන් පසු ව වනයේ දිය හිඟයක් නොවූයෙන් හැන්ස් එහි වඩ වඩා දුර පෙදෙස්වල ඇවිදින්ට වූයේ ය. හවස් වන විට විල කරා ආපසු නොපැමිණි හේ දින ගණන් ඈත වනයේ ගත කෙළේ ය. නැවත ඔහු විල කරා පැමිණි හැම විටක ම ඔහු පිළිගැනීමට බිම්බි හා ටිකී ද සුදු ගෝනා ද එහි වූහ. වැහි ඇතිවීමෙන් පසු ව දිකුද් ඔහු අත හැර ගියේ ය.

වනයේ ඈත සවාරිවල ගිය ගමන්වලදී නොයෙක් විට රුස්ස ගසකට නැග හාත්පස දර්ශනය දෙස බැලී ය. මෙසේ කරද්දී ඔහුගේ හිතට ඇල්ලූ විශේෂ ලක්ෂණ කිහිපයක් හෙතෙම දුටුවේ ය.

බොහෝ දිනකට පසු ව වැව අසලට පැමිණි හැන්ස් වියලි මස් ඉරු ගොඩක් ළඟ තබා ගෙන වැතිරී සිටියේ ය. ඔහුගේ අදහස වූයේ මේ ප්‍රදේශය හැර යාම ය. තමා කොතෙක් දුර ගියත් කෙළවරක් නැති සේ දුටු මේ මහ වනය තරණය කිරීම ය.

හේ තමාගේ මිත්‍රයන් වූ සුදු ගෝනාට ටිකීට හා මීදෙනට ද ආයුබෝවන් කීවේ බිම්බිට තමා සමග ඒමට කතා කෙළේ ය. "බිම්බි, දැන් ඉතින් ඔය යාළුවන් අත ඇර මා කැටුව යාමට එන්ට ඕනෑ. උඹත් නැතු ව මට බොහොම කාන්සියි" හේ කීවේ ය. බිම්බි මුහුණ ඇඹුල් කරගෙන ගමනට සූදනම් ව ඔහුගේ කරට නැගී හිඳ ගත්තී ය.

එය ඉතා ම පියකරු උදයක් වී ය. සිහින් මඳනල ගස්වල කොළ රිකිලි සලමින් හමා ගියේ ය. එසේ ම එය නිර්භීත ක්‍රියා කිරීමේ ආසාව අවුස්සන සුලු, දිග වනමං සොයා යාමට පොළඹ-වන සුලු දිනයක් ද වී ය. හැන්ස්ගේ අදහස වූයේ මේ රට ගැන වැඩි දුරට සොයා බැලීම විය.

හැන්ස් තමාට හිතුණ හිතුණ අතේ ගමන් කෙළේ ය. ඔහු ගමන් මග තීරණය කර ගත්තේ ඒ ගමනින් ලැබිය හැකි ආහාර වර්ග අනුව ය. වැඩිපුර ඔහුගේ සිත් ගත් ස්ථානවල හේ වැඩි දවසක් ගත කෙළේ ය.

මේ දවස් ඉතා ම ප්‍රිය ජනක දවස් වී ය. මෙවිට මහ වැයි හා වතී ඉඳ හිට වහින මඳ වැහිවලට ඉඩ දී තුබුණේ ය. වාතය සුවදායක විය. වනය නව කොළ පැහැයෙන් බැබළුණේ විය. සිඳී වියළී ගොස් තුබුණ ඇළ කඳුරු පණ ගැසී හඬ නගා ගලා ගියේ ය. හැන්ස් ගිය ගිය හැම තැනක ම දිය හිඟ නැති ව තුබුණේ ය. වන බිම රාත්‍රියේ හැසිරෙන වන සතුන්ගෙන් ගහන ව තුබුණ හෙයින් බිම්බි නිසා හේ හැම රැයක ම නිද ගැනීමට මහ ගසක් තෝරා ගත්තේ ය. නිතර දැකීමෙන් හා එක් ව හැසිරීමෙන් ද වන සතුන් කෙරෙහි බියක් ඔහු තුළ නො පැවැත්තේ ය.

වරක් බිම්බි නිසා හැන්ස් මරුට කැප වන්ට ගියේ ය. දිනක් වනයේ ඇවිදින ඔවුහු ඉදුණ දෙඩම් ගෙඩි පැහැයෙන් යුතු කුඩා දෙඩම් ගෙඩි තරම ගෙඩි ඇති එක් ගසක් කරා පැමිණියෝ ය. කැඳැත්තෝ මේ ගසේ ගෙඩි කමින් සිටියෝ ය. බිම්බි ද ගසට නැග ඔවුන් හා එකතු ව එහි ගෙඩි කෑවා ය. හැන්ස් උන් අනුගමනය කරමින් කෝටුවකින් ගසා ගෙඩි කීපයක් කඩා ගෙන කෑවේ ය. එහෙත් එහි රසය හැන්ස්ට ප්‍රිය නොවූ හෙයින් හේ වැඩිපුර නො කෑවේ ය. කැඳැත්තන් මෙන් ම බිම්බි ද කෑවේ මේ ගෙඩිවල ඇටයටත් පොත්තටත් අතර ඇති සුදු සිවිය පමණකි. ඒ බව නොදත් හැන්ස් එහි ඇට ඇතුළේ වූ සුදු මදය දතින් සපා කෑවේ මොහොතකින් තද වේදනා ඇති ව බඩ පෙරළන්ට විය. (මේ ගල්කඳුරු ගෙඩි ය. එහි ඇටයේ මද ග්‍රේන්ස් 30 ක ප්‍රමාණය මිනිහකු මරන්ට ප්‍රමාණ වේ.) කීප වරක් තදින් වමනය ගිය හෙයින් ඔහුගේ ජීවිතය ඉතිරි විය. එහෙත් හේ කිසිවක් කර කියා ගත නො හැකි ව දෙදිනක් එහි වැතිර හොත්තේ ය. බිම්බි කලබල කරමින් මුමුණමින් ඔහු වෙත සිටියා ය.

මසක් ගත විය. හැන්ස් තමාගේ පුරුද්ද අනුව උස ගස්වලට නැගී අවට පරීක්ෂා කෙළේ තුරු මුදුන්වලට ඉහළින් නැග සිටි මහ ගල් පවුවක් දුරින් දුටුවේ ය.

පසුව ද හැන්ස් ඒ ගල් කුළ බලා ගමන් ගත්තේ ය. වනයේ දිසාව සොයා ගෙන යාම දැන් ඔහුට පුරුද්දෙන් කර ගෙන යා හැකි ව තිබිණ. මග සොයා ගැනීමට අතුපත් කඩා හෙළීම හේ කලක සිට ම අත්හැර තුබුණේ ය. ඔහු දැන් හොඳට ම වනයට පුරුදු හෙයින් එහි අවශ්‍යතාවක් ද නො වී ය.

බල්ලකුගේ බිරීමක් වැනි සිහින් හඬක් අසන්ට ලැබුණු හැන්ස් හිටි වන ම සිට එයට කන් දුන්නේ ය. ඊ ළඟට මිනිස් කට හඬ කට සමාන හඬක් ද ඇසුණෙන් හේ කෙණෙහි වට පිට බලා ඝන ව වැඩී සිටි කොළ අතු ඇති ඇද කුද සහිත ව වැඩී තුබුණ මහ ගසකට නැග ගත්තේ ය. ගස ඔහු හොඳින් මුවහ කෙළේ ය. කිසි ම හඬක් නැති ව ටික වේලාවක් ගත විය. හදිසියේ ම

මිනිසුන්ගේ පිය ගැටෙන හඬක් හා බල්ලකුගේ කෙඳිරියක් ද මිනිසුන්ගේ කතාව ද ඇසිණ. දුනු ඊ ගත් කළු වනචාරී මිනිසුන් දෙදෙනකු ඔවුන්ගේ බල්ලන් ද පිරිවරා තමා සිටින ගස යටින් ගමන් කරනු හැන්ස් දුටුවේ ය. ඉදිරියේ ගිය වැඩිහිටියා හදිසියේ ම එහි නතර ව ඊ මූණත පොළොවට දිගු කර පොළොවේ සටහනක් අනිකාට පෙන්නුවේ ය. මේ අඩිය තැබූ ඇත්තා කොයි අතට යන්ට ඇද්දැයි තේරුම් ගැනීම හේ එක එක අතට ගොස් බැලුවේ ය. ඔහුට එය තේරුම් ගත නො හැකි වූයෙන් හේ මේ ගස දෙස තුනීමතින් බැල්මක් හෙළුවේ ය. ඔහු දුටු කෙනකු නැත. සමහර විට මේ තමන්ගේ ම එකකුගේ අඩි සටහනක් විය හැකි යයි තීරණය කර ගත් ඔවුහු ඊතල බිම ඇණ දුනු පසෙකින් තබා ගෙන එතැන ඇණ තබා ඉඳගත්තෝ ය. පහත් හඬින් යමක් කතා කර ගත්හ. බස්සකු මෙන් නිසල ව ගහේ සිටි හැන්ස් මේ සියල්ල බලා සිටියේ ය.

තරුණයා එතැනින් නැගිට ගොස් ගස් අතර නො පෙනී ගියේ ය. ටික වේලාවකට පසු ව එතෙම දර කෝටු ටිකක් හා විශේෂයෙන් තෝරා ගත් ඒවා සේ පෙනුණ දඬු කැබලි දෙකක් රැගෙන නැවත එහි පැමිණියේ ය. මෙයින් එක දණ්ඩක් මැදින් පැතලි වන සේ සැස එහි මැද වළක් මෙන් සිටින සේ කැපුමක් කැපුවේ ය. ඊට වඩා සිහින් වූ අනික් දණ්ඩේ අග වට ව සිටින සේ කැපුවේ ඊ දෙක ම වැඩිහිටියා අතට දුන්නේ ය. ඒවා අතට ගත් වැඩිහිටියා පැතලි කළ දණ්ඩ බිම තබා එහි දෙකෙළවර දෙපයේ ඇඟිලිවලින් පාගා ගත්තේ ය. ඊ ළඟට අග වට ව කැපූ දඬු කඩ මෙහි වූ වළට තබා කෙළින් අල්ලා දෙ අත්ල මැදට කර වේගයෙන් දැතට කර කවන්ට වූයේ තත්පර කීපයකදී එයින් ගිනි පුපුරක් පිට කර ගත්තේ ය. තව මොහොතකින් එතැන ගිනි ගොඩක් විය. මේ අතර තරුණයා තමා මරා ගෙන ආ ගොයකු හම ගැසුවේ ය. මෙවැනි සතුන් වනයේ එහා මෙහා දුවනු ඔහු බොහෝ විට දැක ඇතත් මොවුන් කෑමට සුදුසු යයි කිසි විටෙකත් නො සිතුවේ ය. ගොයා පිලිස්සීමේදී ඉහළට නැග ආ පුලුටු මස් සුවඳ ඔහුට තමා ගේ අතීතය සිහි කරවූයේ ය.

පුලුස්සා ගත් මස කා ඉවර කළ ඔවුහු සතාගේ බොකු බඩවැල් ආදිය බල්ලාට දී තම තමන්ගේ ආයුධ අතට ගෙන අවසාන වරටත් ගස දෙසට බැල්මක් හෙළා ආ දෙසට ම ආපසු යන්ට ගියෝ ය.

ඔවුන් එතැනින් පිට ව ගොස් බොහෝ වේලාවක් යන තුරුත් ගසින් බැසීමට හැන්ස් බිය විය. ගසින් බැස ගත් හේ ඔවුන් ගිනි ගෑ දඬු දෙක ආසාවෙන් පරීක්ෂා කෙළේ ය. හේ එහි හිඳ ගෙන තමා දුටු සේ ඔවුන් කළ සැටි අනුකරණය කිරීමට උත්සාහ

කෙළේ ය. ඔහු ශක්තිමත් වූයේ එයින් දුමක් නැංවීමට පමණකි. පසු ව නව උත්සාහ කොට කාරිය සාර්ථක කර ගැනීමට සිතා ගත් හේ දඬු කැබෙලි දෙකත් රැගෙන ඔවුන් සිටින මානයෙන් හැකි තරම ඉක්මනින් දුරු වන බලාපොරොත්තුවෙන් හනික ගමන් කෙළේ ය. මේ වනචාරීන් තමන් දුටු පිය සටහන් පරීක්ෂා කිරීමට තවත් පිරිස කැඳවා ගෙන එහි එනු ඇතැයි හැන්ස් සිතුවේ ය.

හැන්දෑවේ විවේක ව හිඳ දවසේ සිදුවීම් සිහි කළ ඔහුට කල්පනා වූයේ දිකුද්ගේ පයේ තුවාලය සිදු කරනු ලැබුවේ මෙ වැනි දඩයම්කරුවන් විසිනැයි යනු ය. හේ තමා අත තුබුණු ඊතලය මේ හැඟීමෙන් යුතු ව පරීක්ෂා කෙළේ ය.

වෙනදා මෙන් පුරුදු ගසට නැග නිදා ගත් ඔහුට නින්දේදී භයානක සිහිනයක් පෙනෙන්ට විය. වනයේ එක් එළිමහන් තැනක වනචාරීන් විසින් වට කරනු ලැබ තමා සිටින බවත් ඔවුන් තමා දෙස එබිකම් කරමින් විදීමට දුනුවලට ඊ නගමින් සිටින බවත් හේ දුටුවේ ය. ඔහුට ගැළවී යාමට තුබුණු එක ම මග එහි නො සිට පලා යාම වුවත් හැන්ස්ට තමාගේ අතක් හෝ පයක් හෝ සොලවන්ට වත් නො හැකි විය. එසේ පැන යාමට ඔහු ගත් උත්සාහය නිසා ඔහු ගසින් බිමට නොවැටී බේරුණේ අනූනමයෙනි. හැන්ස් නින්දෙන් අවදි විය. ඔහුගේ සිරුර ඩහදියෙන් තෙමී මුළු ඇඟ ම වෙවුලමින් තිබිණ. මෙයින් කලබලයට පත් බිම්බි මුහුණ රැළි නගා ඇස් මහත් කොට ඔහු දෙස බලා සිටියා ය. "බය ගන්ට එපා බිම්බි, ඒක හීනයක්. උඹ හොඳට ම බය උණා නේ ද?" කී හැන්ස් ඇය ළඟට ගෙන නිකට යටට තබා තද කර ගත්තේ ය. වැඳිරියගෙන් ඔහුට පිළිතුරු සිනාවක් ලැබිණ.

වනයේ මේ කොටස වනචාරී මිනිසුන් වසන කොටසක් බව හැන්ස් මෙදින වටහා ගත්තේ ය. වනයේ ඇවිදින තමා මේ ඇවිදින්නේ කිසිවකුගේ ගොදුරු බිමක දැයි දැන ගැනීමට සාක්කි ඇද්දැයි මෙතෙක් දවස් හැන්ස් පරීක්ෂාවෙන් බැලුවේ ය. එයින් සති ගණනක් ඇසූ ව ගිය නමුත් නැවත ඔවුන් ගැන කිසි ම ලකුණක් ඔහුට දැන ගන්ට නො වී ය. මේ අතර හැන්ස් දඬු දෙකෙන් ගිනි ගෑමට පුරුදුවන්ට ද විය. ඒ දඬු දෙක ගෙවී යාමෙන් පසු ව හේ දඬු දෙකක් සොයා ගත්තේ ය. මෙසේ කරන එක් දවසක එයින් ගිනි පුලිඟුවක් නගා ගින්නක් මොළවා ගන්ට හැන්ස් සමත් වී ය. එදා ඔහුගේ ප්‍රීතිය නිම්හිම් නැති විය. කටට රසට පුලුටු මස් කෑමට ඉඩ ලැබීම පමණක් නොව අනික් වන සතුන්ට වඩා උසස් බවක් ලැබීමත් නැවත වරක් මිනිස් බවට පත්වන්ට ලැබීමත් මේ ප්‍රීතියට හේතු විය.

උස ගසකට නැග අවට බැලීමට කීප දවසකින් ම නොසිතූ හැන්ස් මෙදින එසේ ගසකට නැග බැලූවේ තමා කලින් බොහෝ දුර ව දුටු ගල් පවුව හොඳට ම ළං ව පෙනිණ. ඔහුගේ පුදුමය මහත් වූ සේ ම ගල් පවුව ඔහු එහි කැඳවන්නාක් මෙන් ඔහුට හැඟිණ. හේ දැන් ගල් පවුවෙන් සැතපුම් පහකට වඩා දුරකින් නො සිටියේ ය.

ගල් පවුව දෙසට ළං ව යන ඔහුට ගල් ගෙඩි ගහන දිය කඳුරක් හමු විය. කඳුර, ඉතා සිත් ගන්නා සුලු වූයෙන් හේ එහි ගිලී හොඳ හැටි නා ගත්තේ ය. සුවදයක දිය නෑමෙන් පසු ව එහි සුදු වැලි තලාවක් මත වැතිර ගත් හැන්ස් කන්කලු කුරුලු ගීතයට කන් දී සිටියේ ය. මේ අතර ඔහුට අනික් කිසියම් ශබ්දයක් ද ඉතා සෙමින් ඇසෙන්ට විය. එය ඔහුට ඇසුණේ කිසිවක් කොටන හෝ තළන හෝ හඬක් ලෙසිනි. එය වරක් නැවතී තිබී යළිත් පටන් ගැනිණ. මෙය මේ වනයෙහි අසා නුපුරුදු ශබ්දයකි. හේ කෙණෙහි නැගී දණින් සිටියේ ය. ගොදුරකට මාන බලන දිවියකු මෙන් හොඳින් කන් දුන්නේ ය. එහි තවත් සැකයක් නැත. තොප්, තොප්, තොප් යන හඬින් ඇසුණේ කිසිවකු සිතා මතා එක් විදියකට කරන ශබ්දයකි.

ගල් ගෙඩි විසුරුණු කඳුරු බඩින් හඬ ඇසුණු දෙසට යන ඔහුට එහි එක් නැම්මක් හමු විය. එයින් ඔබ්බ එක් ගලකින් මුවහ ව තිබිණ. ශබ්දය නුදුරු ව ඇසෙන හෙයින් හේ ඉතා ප්‍රවේසමෙන් සෙමෙන් ඉස ඔසවා ගලට උඩින් එබී බැලූවේ ය. දිය වළක් ළඟ ගලක් උඩ හිඳ ගත් අඳුරු පැහැති සමක් ඇති යුවතියක් එහි වූවා ය. වැලකින් අමුණන ලද කොළ අතු ටිකක් ඇඳුමක් වෙනුවට ඇගේ ඉණ වටේ දවටී තිබිණ. කිසියම් වර්ගයක ගෙඩි (—කුකුරු මුවන් ගෙඩි) ගොඩක් ළඟ තබා ගෙන හුන් මෝ ඒ එක එක ගෙඩිය ගෙන ගලකින් තළා දිය වළට විසි කළා ය. ගෙඩි ටික තළා දමා ඉවර කළ යුවතිය කෝටුවක් ගෙන එයින් වළේ දිය කලතන්ට වූවා ය. එවිට එහි දියේ සබන් දැමූ විටක මෙන් පෙණ මතු විය. ඒ සමග ම කුඩා කුඩා මසුන් දිය පිට පාවී සුදු පැහැයෙන් දිලිසෙන්ට විය. යුවතිය දියට බැස මේ පාවෙන මසුන් දෝතින් එකතු කළා ය. තළා දැමූ වහට මේ මසුන් මත් වී තිබිණ. යාර විස්සකට පමණ දුරින් සිට බලා සිටිය හැන්ස්ට මේ සියල්ලක් හොඳින් පෙනිණ. තමා දුටු දර්ශනයෙන් වශී වූ හැන්ස් නොසැලකිලි ලෙස හුන් අඩිය වෙනස් කෙළෙන් එතැනින් ගලක් ගැළ වී ශබ්ද නගා දියට වැටුණේ ය. මෙයින් කලබල වූ දැරිය වහා වළෙන් ගොඩට පැනගත්තා විමසිලිමත් ව අවට බලන්ට වූවා ය. හැන්ස්ගේ සුදු මුහුණ හා රන්වන් අවුල් කෙහෙ ගලට උඩින් දුටු දැරිය බියෙන් හා විමතියෙන් ද

ගල් ගැසී කථා කර ගැනීමට හෝ පා නගා දිවීමට හෝ නො හැකි ව පරණ සියබලා අරටුවකින් නෙළූ පිළිමයක් මෙන් නොසැලී හිටි වන ම සිටියා ය.

තමා මේ දැරියට ඇති කර වූ බිය ගැන මහත් සේ පසුතැවිලි වූ හැන්ස් තමා කරන්නේ කුමක් දැයි හරි හැටි නොසලකා ඈ සැනසීමට ඉදිරියට ගියේ ය. එයින් වඩාත් බිය ගත් ඕ තොමෝ නයකුට දූපනේ වැටුණ කිරිල්ලියක මෙන් මහත් කර ගත් ඇසින් හා වෙවුලන ගතින් ද යුතු ව විස්මයෙන් බලා සිටියා ය. ඈ ඉදිරියේ සිනා සුණ හැන්ස් බිය නොගන්න ලෙස අතින් සංඥ කෙළේ ය. ගලක් සංඥ තේරුම් නො ගනී. ඕ ගලක් මෙන් ම එහි නොසැලී සිටියා ය. ඇගේ භ්‍රාන්තිය මඟ හැර වීමට සිතා ගත් හැන්ස් දිය වළට බැස එහි පාවෙන කුඩ මසුන් හුඟක් එකතු කොට එහි වූ ගස්පොතු කැබෙල්ලක ගොඩ ගසා වළෙන් නැගී ගොස් ඈය අතට දුන්නේ ය. අසිහියෙන් ම එය අතට ගත් දැරිය සිහිනෙන් ගමන් කරන්නියක මෙන් සෙමින් පා නගා යන්ට වූවා ය. ක්‍රමයෙන් ඇගේ පියවර ඉක්මන් විය. සෙමින් සෙමින් ඈ අනුව ගිය හැන්ස්ට දකින්ට ලැබුණේ හදිසියේ ම ඈ මසුන් ඉවත විසිකර දමා වේගයෙන් දුව යන්ට වූ බව ය. වනයේ එහා මෙහා හැරෙමින් දුව ගිය දැරිය මොහොතකින් නො පෙනී ගියා ය.

මෙයින් කනස්සල්ලට පත් වූ හැන්ස් ආපසු හැරී ඈ මුලින් හමු වූ තැනට ආවේ ය. දිය වළේ තවමත් කුඩ මස්සු පාවෙමින් සිටියහ. මොවුන් එකතු කරගත් හැන්ස් එතැනින් ගොස් ගින්නක් දල්වා ඒ එක එක මසා උල් කළ කෝටුවක අමුණා ගින්නේ පලහා කටුත් සමග ම හපා කෑවේ ය.

ඉන් පසු එහි බිම දිගා වී දවල් සිහිනයකට වැටුණ හැන්ස් තමා දුටු දර්ශනය ගැන සිතමින් සිටිද්දී ම නින්දට වැටුණේය. බොහෝ වේලාවකට පසු බිම්බිගේ කැගැම් හා අතපත ගැම් නිසා නින්දෙන් අවදි ව බැලූ ඔහුට රැය ගත කිරීම සඳහා ගසකට නැගිය යුතු වේලාව පැමිණ තිබෙන බව පෙනී ගියේ ය. වෙන ද මෙවැනි අවස්ථාවක මෙන් වහා එතැන හැර යාමේ වුවමනාවක් මෙවිට ඔහුට ඇති නො වී ය. දුව ගිය දැරිය තමා දුටු දේ අනික් මිනිසුන්ට දන්වනු ඇතැයි බියක් ද ඔහු තුළ හට නො ගත්තේ ය.

ගසට නැගුණ හැන්ස් මේ දුටු දැරිය කොතැනක වසන්නී ද? ඇගේ නෑයන් කෙබඳු මිනිසුන් විය හැකි ද? යන දේ සිතමින් බොහෝ වේලාවක් නිදි නැති ව සිටියේ ය.

පසුව ද උදයේ මිනිස් කට හඬකින් නින්දෙන් අවදි වූ හැන්ස් පහත බැලුවේ මිනිසුන් දෙදෙනකු හා ඊයේ හමු වූ දැරිය ද තමා

ගිනිමැලය ගැසූ තැන විමසමින් සිටනු දුටුවේ ය. මේ මිනිසුන් දෙදෙනා තමා කලින් දවසක දුටු තරුණයාත් වැඩිහිටියාත් යයි ඔහුට සිතුණේ ය. මොවුන් අතුරෙන් සිහින් රැවුලක් හා ගැඹුරු පෙනුමැති මුහුණක් ද ඇති ව සිටි වැඩිහිටියා ගිනිමැලය තුබූ තැනට අත දිගු කර දැරියට යම් කිසිවක් කියා තරවටු කෙළේ



**මිනිසුන් දෙදෙනෙක් හා යුවතියක් ඔහු ගිනිගොඩ ගැසූ තැන පරීක්ෂා කරති.**

ය. ඈ කී කතාව ඔහු විස්වාස නොකළ සේ ද ගිනිගොඩ ඇගේ ම වැඩක් වනැයි කියන සේ ද පෙනිණ. ඒ එසේ නොවන බව කියා සිටි දැරිය ඔහු තමාට හමු වූයේ දිය වළ ළඟදී යයි දිය වළ දෙසට අත පා කීවා ය. ඉන් පසු ඔවුහු එකියන අමුත්තා පිළිබඳ කිසියම් සටහනක් ඇද්දැයි සොයන්ට වූහ. වැලිතලාවේ අඩි සටහනක් දැකිය හැකි වූ නමුත් කොළවලින් වැසුණු බිමේ ඔවුන්ට එවැන්නක් දැකීම පහසු නො වී ය. එහෙත් බොහෝ

වෙලා මෙසේ සෙවීමෙන් පසු ව වැඩිහිටියා හැන්ස්ගේ පා සටහන් අනුව ගස මුලට ආවේ ය. ගස අවට විමසා බැලූ එතෙම එයින් පලක් නො ලැබ ගස උඩ බලන්ට විය. තුන් දෙනා ම ගස යට එහා මෙහා වෙමින් ගසේ අතු දෙබලක් පාසා විමසිලිමත් ව බලන්ට වූහ.

•

සිරිතක් වසයෙන් ම හැන්ස් රැයෙහි ලැගීමට තෝරා ගත්තේ සුව සේ නිදගත හැකි මහත් අතු ඇති විශාල ගසකි. මේ ගස ද එසේ වූවකි. කාරිය නරක අතට හැරී ගෙන එනු දුටු හැන්ස් ඒ මහ අත්තේ බඩ තබා ගොයකු සේ වැතිර ගත්තේ ය. මෙසේ සිටින විට බිම සිට ඔහු දැකීම අපහසු කාරියකි. බිම්බි ද වඳුරන්ට පමණක් සැඟවී සිටිය හැකි රෙස් ගසේ අතුපත් මඩුල්ලේ සැඟවී ගත්තා ය.

ඔවුන් අතර සිටි දූරිය තැති ගත්තා සේ එක්වර ම කෑ ගැවා ය. තමා ඔවුන්ගේ ඇසට අසු වූ බව හැන්ස් දැන ගත්තේ ය. හිස ඇළ කර එබී බැලූ ඔහුට ඈ තමා දෙසට අත දිගු කර ගෙන සිටින බව පෙනී ගියේ ය. ඔවුන් කලබල ව ගුහමින් කතා කරන හඬ ඔහුට ඇසිණ. කට හඬවල් නැවතිණ. ඒ සමඟ ම වේගයෙන් නැගී ඊයක් හැන්ස්ගේ මුහුණට අඟල් දෙක තුනකට ළඟින් හඬා ගෙන ගියේ ය. තමා මෙසේ සිටින තුරු බිම හිඳ ඊයක් විදිය නො හැකි බව දත් හැන්ස් නිසල ව එසේ ම වැතිර සිටියේ ය. එහෙත් මිනිසුන් දෙදෙනා සුළු සාකච්ඡාවකින් පසු දූරියගේ විරුද්ධතා හෝ කෑ ගැම හෝ නොතකා හැන්ස් සිටි ගසට දෙපැත්තේ වූ ගස් දෙකකට නගිනු දුටු හැන්ස් තමාට තවදුරටත් එසේ නො සිටිය හැකි බව සිතා ගත්තේ ය. ගසට නගින මිනිස්සු තමන්ගේ දුනු දතින් සපා ගෙන ඊතල දියලනුවේ රුවා ගෙන එසේ නැංගෝ ය. වැද්දන් දෙදෙන දෙපැත්තේ ගස්වල නැග සිටි හෙයින් ඔහුට එහි මුවහ විය හැකි සැටියක් නො වී ය. එකකුට නො පෙනී සිටීමට අනෙක් අතට ඇළ වුවොත් අනෙකාට තමා හොඳින් පෙනෙයි. මෙවිට ම තමාගේ පිටේ ගැවී ගන ඉවත ගිය ඊයකින් ඒ බව වඩාත් හොඳින් ඔප්පු විය. වැඩිහිටි මිනිහා සැර පහරක් ඇද හැරීමට දුන්න තැත් කවන බව ද හැන්ස් දුටුවේ ය. තමා මෙතැන තවත් සිටිය හොත් ඊවලින් ඇඟ පුරා සිදුරු කරනු නියත යයි සිතා ගත් හේ වහා එතැනින් නැගී අත්ත උඩ අර ඇඳ සිට කෙළින් උඩ පැන ඉහළ අත්තක් බද ගත්තේ එයින් ත්වත් අත්තකට එයිනුත් තවත් අත්තකට ද වශයෙන් කලබල වූ වඳුරකු මෙන් අත්තෙන් අත්තට පැන පැන ගොස් තරුණ වැද්ද සිටි ගසට පැන ගත්තේ ය. හැන්ස් ඒ ගසට පනින්නේ එහි හුන් වැද්දගේ ඇඟට ම පැන්නේ ය.

වැද්දට කිසිවක් කරගන්ට ඉඩ නොතබා එසේ පැන්න හෙයින් දෙදෙනා ම එක ගොඩේ බිමට වැටුණෝ ය. බිමට වැටුණු හැන්ස් තරුණයා එක අතකින් අල්ලා ගෙන අනික් අතින් ඔහුගේ දුන්න උදුරා ගත්තේ එහි එක් කෙළවරක් බිමට තබා දණින් නෙරපා එය බිඳ දැමුවේ ය.

හැන්ස්ගේ මේ ක්‍රියා සියල්ලක් අතරක් නැති ව එක වේගයෙන් කෙරුණේ විය. මේ අතර වහා ගසින් පැන ගත් අනික් වැද්ද හැන්ස් කරා ඊයක් විද්දේ එය ඔහුගේ කලවය සිදුරු කර ගෙන ගියේ ය. වැද්ද අනික් ඊයක් ද දුන්නට නගා හැන්ස්ට විදීමට මාන ගන්නවා දුටු හැන්ස් වහා තරුණයා අල්ලා ඊ පෙරමුණට පෑවේ ය. වැද්ද එක එක අතට දුවමින් හැන්ස්ට විදීමට තැත් කළ නමුත් හැන්ස් පලිහයක් අල්ලන්නාක් මෙන් ඒ හැම අතට ම තරුණයා ඉදිරි කොට පෑවේ ය.

කරන්ට ගිය කාරිය වැරදී යාම නිසා කෝපයෙන් වියරු වී ගිය වැද්දා අත තුබූ දුන්න පසෙකට විසි කොට ඉණ තුබූ පොරොවත් අමෝරා ගෙන හැන්ස් ඉදිරියට ආවේ ය. තමාට දැන් සටන් කරන්ට වී ඇත්තේ වන මෘගයකු මෙන් වියරු වී සිටින මිනිමරුවකු සමග බව දූරිය තැති ගෙන වේගයෙන් නැගූ විලාප හඬින් හැන්ස්ට තේරුම් ගියේ ය. හේ තරුණයා පසෙකට දමා ඉදිරියට ගොස් තමාගේ හිස පොරෝ පහරින් රැක ගැනීමට අතක් ඔසවා ගෙන උරයට වදින්ට එන පොරෝ පහර නොතකා වහා පැන සතුරා දැතින් බද ගත්තේ ය. හැන්ස් ශක්තිමත් වුවත් තාමත් ගැටවර වයසේ වූවෙකි. වැද්ද හතළිස් විය පමණ වූ තැළී පොඩි වී පුරුදු ශක්තිය ඇත්තෙකි. තරුණයා හා දූරිය ද බලා සිටි අතර ඔහු දෙදෙනා එක ගොඩේ පොර බැදුවෝ ය. තරුණ වැද්ද ද පියාගේ ආධාරයට යාමට උත්සාහ කළ නමුත් දූරිය ඔහුගේ ඇඟේ එල්ලී ඔහු වැළකුවා ය. හැන්ස් උඩුකුරු ව යටින් වැටී සිටි අතර වැද්ද ඔහු මත නැගී යහඬුවකින් අල්ලා ගත්තාක් මෙන් ඔහුගේ ගෙල තදින් මිරිකා ගෙන සිටියේ ය. ඔහු බේරා ගැනීමට දූරිය පියාගේ කෙහෙයෙන් අල්ලා ඇද්ද නමුත් ඔහු සෙලවුණේ වත් නො වී ය. ඊ ළඟට ඈ කෙළේ පියාගේ බාහුව තදින් විකීම ය. එය ඔහුට වේදනාකර වූයෙන් ඔහුගේ ග්‍රහණය ලිහිල් විය. වැද්ද එක් අතකින් හැන්ස්ගේ ගෙල අල්ලා ගෙන අනික් අතින් දූරියට පහරක් ගැසුවේ ය. දූරිය බඩ අල්ලා ගෙන වකුටු වී හොත්තා ය. එහෙත් එයින් බුරුලක් ලැබූ හැන්ස් දණ ඔසවා වැද්දගේ බඩට තබා වේගයෙන් විසි කර හැරියේ ය. වැද්ද විසි වී උඩුකුරු ව පෙරළී ගියේ ය.

හැන්ස් නැගී සිට කලවයේ වේදනාව නිසා අත ගා බැලුවේ. මේ අරගලයේදී ඊදඬුව කැඩී මසට කාගෙන තිබෙනු දැක වැදි සතුරා නො තකා. එය ඇද දමන්ට උත්සාහ ගත්තේ වේදනා-වෙන් මූර්ච්ඡා විය. වැටුණු තැනින් නැගිට ගත් වැද්ද හැන්ස්ට නැවතත් පහර දීමට තරුණයා අත තුබුණු පොරොව උදුරා ගෙන ආවේ තමාගේ අනුවණ ක්‍රියාව තේරුම් ගෙන නිකම් බලා සිටියේ ය.

නැවත සිහි ලැබ අවට බැලූ හැන්ස්ට දකින්ට ලැබුණේ වැද්දන් විසින් වටකර ගනු ලැබූ තමා කඳුර අසබඩ සිටින බව ය. තමා දෙස කුහුලින් බලා සිටින දැරියගේ කරුණාවත් මුහුණ හේ යම්තමින් දුටුවේ ය. මහ වැද්දගේ කුරිරු මුහුණ පවා මෙවේලේ මොළොක් වී තුබුණ සේ පෙනිණි. එහෙත් ඊ දඬුව කලවයෙන් ඇද දැමීමේදී හුහක් ලේ ගලා තුබුණ හෙයින් මලානික ව සිටි හැන්ස් නැවත ද ඇස් පියා ගත්තේ ය.

නැවත ඔහු අවදි වන විට එහි සිටියේ දැරිය පමණකි. පිපාසය තදින් දැනුණ හැන්ස් කඳුරේ දිය දෙස බලා මුවට ඇඟිල්ලක් තබා දිය වුවමනා බව ගොළු බසින් කීවේ ය. දෝතට දිය ගෙන ආ දැරිය එය ඔහුගේ මුවට ළං කළා ය. ඔහුගේ දිය පිපාසය සන් සිඳෙන තුරු ඕ නැවත නැවතත් දිය ගෙනවුත් ඔහු පෙවූවා ය.

මේ අතර මිනිසුන් දෙදෙනා වනයෙන් එකතු කර ගත් කොළ පොතු වගයක් ගලක් මත තබා එකට අඹරමින් සිටියෝ ඇඹරුණ කල්කය පළල් කොළයක තබා ගෙන එහි පැමිණියෝ ය. කල්කය කලවේ තුවාලයට තබා පට්ටාවලින් වෙළා බැන්දෝ ය. උරයේ වූ වණයට ද ඔවුහු මෙසේ ම පිළියම් කළෝ ය.

මෙවෙලේ නැගිට හිඳ ගැන්මට තරම ශක්තිය ලැබූ හැන්ස්, තරුණ වැද්ද පියා අත තුබුණ දුන්න අතට ගෙන ගස උඩ වූ යම් සතකුට විදීමට මාන බලනු දුටුවේ ය. උඩ බැලූ හැන්ස්ට දකින්ට ලැබුණේ බිම්බි ගසේ උඩ අත්තකට වී බලා සිටින බව ය. මෙතෙක් මේ කලබල සියල්ලක් බිම්බි ගසට වී නිසොල්-මනේ බලා සිටියා ය. හැන්ස් කලබලෙන් කෑ ගැවෙන් වැද්ද දුන්න පහත් කර ගත්තේ ය. සතාට නොවිදින ලෙස අතින් සන් කරමින් හා කෑ ගසමින් ද හේ කියා සිටි ආකාරයට වැද්ද මවිත ව බලා සිටියේ ය. මඳකට දුර ගොස් සිටින ලෙස හැන්ස් ඔවුන්ට සංඥා කළ විට ඔවුහු ඊට අවනත ව ඈතට ගියෝ ය.

හැන්ස් පුරුදු ලෙස සියුරු හඬ ලැමෙන් බිම්බිට ළඟට අඬ ගැසුවෙන් ඔහු කෙරෙහි විස්වාසය ඇති ව වහා එහි පැමිණියා ය. බිම්බි අල්වා ළඟට ගත් හේ වැද්දන්ට ආපසු එන සේ සංඥා කෙළේ ය. මේ කළු මිනිසුන් කෙරේ විස්වාසය නො තැබූ බිම්බි

ඔවුන් එන විට පැන යාමට තැත් කළ නමුත් හැන්ස් ඇය සනසා ළඟ හිඳුවා ගත්තේ ය.

අඩ ගෑ පමණින් වන සතුන් ළඟට ගෙන්නා ගන්නා මෙතෙම මායාකාරයෙක් වනැයි වැද්දන් සිතූ සේ ඔවුන්ගේ මුහුණුවලින් හැන්ස්ට පෙනී ගියේ ය. හැන්ස්ගේ හා වැදිරියගේත් මේ අපූරු හැසිරීම දුටු වැද්දන්ගේ බල්ලෝ නොකඩවා තදින් බුරන්ට වූවෝ ය. ඔවුන් නිහඬ කළ හැකි වූයේ තරුණ වැද්ද ඔවුන් දෙසට දඬු කඩක් විසිකර තරවටු කිරීමෙන් පසු ව ය.

හැන්ස්ගේ හා බිම්බිගේ ද උසුළු විසුළු බලමින් ඔවුහු එහි බොහෝ වේලාවක් ගත කළහ. ඉන්පසු හුන් පළින් නැගී සිටි වැඩිහිටි වැද්ද දැන් යා යුතු වේලාව බව හඟවමින් හැන්ස්ට නැගිට සිටීමට අත දී තමා කපා සකස් කොට තුබූ සැරයටිය ද ඔහු අතට දුන්නේ ගමනට ඉස්සර වී ය. අනික් පිරිස හැන්ස්ට පසු ව හෙමින් ගමන් කළෝ ය.

මෙතෙක් වනයේ කිසි මිනිසකු නොදක තනි ව ජීවත් වූ හැන්ස්ගේ ජීවිතය ක්ෂණයකින් මිනිස් ඇසුරට වැටුණ කෙනකුගේ ජීවිතයට පරිවර්තනය විය. දැන් ඔහු ද ඔවුන්ගේ සහචරයෙකි. ඔවුන් ආදි යුගයට නෑකම් කියන වනචාරීන් වුවත් ඔවුහුත් දයා කරුණා ගුණ පෙන්වන මිනිස්සු වෙති. හඳුනා ගැනීමේදී පමණක් ඔවුහු කලබලකාරී වූහ.

අතරමග තැන් තැන්වල නතර වෙමින් දිග කාලයක් තුළ වෙහෙස නිවමින් ඔවුන්ගේ ද ආධාර ඇති ව ගමන් කළ නමුත් හැන්ස්ට මේ ගමන වෙහෙස ගෙන දෙන සුලු දිග ගමනක් වී ය.

මෙසේ බොහෝ දුර ගමන් කළ ඔවුහු වනයෙන් ගැවසුණ එක් ගල් කුළක් වෙතට පැමුනුණෝ ය. තමා ගස් මුදුනට නැගී බැලූ විට පෙනුණ ගල් කුළ මේ යයි හැන්ස් සිතා ගත්තේ ය. වැද්දන් දෙදෙනා දැළයේ සිට වත්තම් කරගෙන යනු ලැබූ හැන්ස් ගල් ගෙඩිවලින් ගහන ගල් කුළ නැග එක් ගල් තලයක ගැටිය ළඟට පැමුනුණේ ය. මේ ගල් තලය මත ඇළයට පිහිටි ගල් කුළක් යට ඉඩකඩ ඇති පළල් විවරයක් විය. එය ඉතා අපූරුවට වනයෙන් මුවහ ව පැවති හෙයින් කෙනකු එතැනට ම වදින තුරු එහි ගල් ගෙයක් ඇති වගක් කෙසේ වත් සිතා ගත නො හැක. වැද්දන්ගේ නිවෙස මෙවැනි එකක් විය. එය වන සීපාවුන් ලගින නිකම් ගල් රැකුලක් පමණක් විය. මිනිසුන් වසන තැනක් බවට තුබූ සලකුණ නම් එහි ගිනි උඳුන් දෙකක් තිබීමත් දුනු ලී කීපයක් ගලට හේත්තු කර තිබීමත් පමණ ය. යම්තම් පිරිමසා ගන්ට තනා ගත් උපකරණයක් හෝ මොන ම වර්ගයක

සම ගොත්තක් හෝ එහි නො වී ය. වන සීපාවුන්ගේ හා මොවුන්-ගේ ද අතර වෙනසකට පැවැත්තේ ඔවුන් ආයුධ ඇතිව සිටීමත්, ගින්නක් මොලවා ගන්ට දන සිටීමත් යම්තම් හෙළුව වසා ගන්ටවත් නොසෑහෙන තරමේ කොළ අතුවලින් කළ ඉණ-හැඳක් ඇති ව සිටීමත් පමණකි. ඉණේ කිසි ම වස්ත්‍රයක් හෝ කොළ අතු වැලක් හෝ නොතුබුණු, රන්වන් අවුල් කෙහෙයක් ඇති ව සිටි සුදු ගැටයා ඔවුන්ට වඩා වන සතුන්ට නෑකම් කියන තැනැත්තෙක් විය.

දූරිය තමා එද්දී කඩා ගෙන ආ කොළ අතු ටිකක් හැන්ස්ට නිද ගැනීමට ඇතිරියක් හැටියට ගල් බිම ඇතුරුවා ය. දුර්වල ලෙස එහි වැතිර ගත් හැන්ස් අධික වෙහෙස නිසා එකෙණෙහි ම තද නින්දට වැටුණේ ය.

හැන්දෑ කාලයේ හැන්ස් අවදි වන විට ඔහුට ආහාර සූදනම් ව තුබුණේ ය. මීපැණියේ ගැල් වූ මුව මසුත් පුලුස්සන ලද අලත් මේ ආහාරය විය. මේ ආහාරයේ රසවත්කම මෙන් ම එය පිළිගැන් වුණ දයාබර දෑත ද නිසා හැන්ස් එයින් විශේෂ ආස්වාද-යක් ලැබුවේ ය. මෙතෙක් කලක් මානුෂික දයාවට අමුත්තකු ව සිටි හැන්ස්ට මෙවේලේ තමාගේ දෙනෙතට ඉනූ කඳුළු වළකා ගත නො හැකි විය.

ශීත වළකා ගැනීමට ඔහුට ගිනිමැලයක් ගසා දුන් ඔවුහු එළිවන තුරු ම එය නිවී යන්ට නො දී රැක දුන්හ. වැද්දන් තිදෙනෙක් ඔවුන්ගේ බල්ලන් ද සමග අනික් ගිනිමැලයක් වටෙ නිද ගත්හ. බිම්බි නහනම් ගෙඩියක් බව මේ වන විට ඔවුන්ගේ බල්ලෝ තේරුම් ගෙන සිටියෝ ය. බල්ලෝ මේ වර්ගයේ අනෙක් සතුන් වෙත කොතරම් වියරු ලෙස කඩා පැන්නත් බිම්බිට පාඩුවේ ඉන්ට ඉඩ හැරියෝ ය. එහෙත් බල්ලන් සහජ-යෙන් ම තමන්ගේ වර්ගයේ සතුරන් බව සලකා ගත් බිම්බි ඔවුන් විශ්වාසයට නො ගෙන ගුහාව අසල ගසක් උඩට වී රාත්‍රිය ගත කළා ය.

පසුව ද උදය වන විට හැන්ස්ට ඉතා තදින් උණ ගැනී තිබිණ. හැන්දෑව වන විට හේ අඩ සිහියෙන් විකාර දෙඩවන්ට වී ය. කෑම ප්‍රතික්ෂේප කළ හේ දිය පමණක් බීවේ ය. පසු ද උදයේ ද මෙසේ ම තදින් උණ නැග නො පැහැදිලි දේ කියමින් දෙඩවන්ට වූයෙන් වැඩිහිටි වැද්ද දැඩි කුහුල් සිතකින් බර ව ඔහු දෙස බලා සිටියේ ය. එකෙණෙහි තමා හුන් පළින් නැගී සිටි වැද්ද තමා ගේ ආයුධ අතට ගෙන දූරියට දනමුතුකම් කියා තමා සමග එන සේ තරුණයාට අණ කෙළේ ය.

දෙ දිනකට පසු ව ආපසු ගල් ගෙට ආ ඔවුහු ඒ එන විට මරා ගත් ගොයින් දෙදෙනකු හා වඳුරකු ද අල ටිකක් හා කුඩා මුලක් සේ දවටා ගත් තවත් යම් කිසිවක් ද ගෙන ආවෝ ය. හැන්ස් දෙස බැලූ එක බැල්මෙන් ම ඔහුගේ තත්වය නරක බව වැද්ද තේරුම් ගත්තේ ය. දඟලමින් හා දෙඩවමින් ද සිටි රෝගියාට තමා අවට සිදුවන දේ ගැන සිහියක් නො තුබුණේ ය. වැඩිහිටියන් ගල් ගෙයි නොසිටි කාලය තුළ නොකඩවා ම දූරිය ඔහුට සාත්තු කළා ය. මීපැණි හා දිය ද දෝතින් ගෙන ඔහුට පෙවුවා ය.

වැද්ද තමා ගෙන ආ මුල ලිහා එහි තුබූ කොළ හා පොතු ද ගලක අඹරන්ට වූයේ ය. තරුණයා තමා ගෙන ආ බෙලිකටු වගයක් ගිනි අඟුරු මත තබා ඒවා දැවී අළු වන තුරු කොළ අත්තකින් පවන් ගැසුවේ ය. ඉතිරි වූ සුදු අඟුරු කොළයකට ගෙන දිය ටිකකින් තෙමා බදමයක් ව සිටින සේ ඇණුවේ එය පියා අතට දුන්නේ ය. වැද්ද මේ හුනු ටිකත් අර කල්කයට ම දමා ඇඹරුවේ ය.

ඉන්පසු වැද්ද හැන්ස්ගේ වණ දියෙන් සෝද ඔහුගේ දඟලීම නිසා එහි බැඳී තුබුණ කුණු ඉවත් කෙළේ ඇඹරූ කල්කය වණ මත තබා ඒ මත කොළයක් තබා පෙර සේ ඊටත් වඩා හොඳින් වෙළා බැන්දේ ය.

මේ බෙහෙත් ඔවුන් බොහෝ දුක සේ ලබා ගත් ඒවා විය. සිංහල මිනිසුන්ගේ ගම්වල පමණක් වැවෙන සමහර ගස්වල පොතු මොවුන් ලබා ගත්තේ රාත්‍රි කාලයේ ගොස් සොරකම් කිරීමෙනි.

තවත් කළ යුතු යමක් වෙතොත් ඒ ඉරණමට ඉඩ හැර බලා සිටිනු මිස මේ වෙනුවෙන් මීට වඩා කළ හැකි යමක් ඔවුන්ට නො වී ය. වනයේ සොයා ගත හැකි හොඳ ම පෝෂ්‍යදයක ආහාරය වන තලගොයි මස් හා වඳුරු මස් ද ගෝනල වැනි හොඳ ම අල ද මීපැණි ද ඔවුහු ඔහුට සැපයූවෝ ය. එහෙත් ඔහු කෑවේ ඉතා ස්වල්පයකි.

හතර දිනකට පසු ව වණ ලිහා බැලූ විට උරයේ වණය සුව වේගන එන නමුත් කලවයේ ගැඹුරට සිදුරු ව ඇහිරී තුබුණ වණය පැසවා රතු වී ඉදිමී තිබිණ. එය අල්ලන විට පවා හැන්ස්ට කෑ ගැසිණ. නැවතත් බෙහෙත් තබා බඳින ලදී.

මේ මුළු කාලය තුළ ඔහුගේ ඇඟේ උණ තදින් පැවතිණ. හේ උණෙන් වෙවුලුවේ ය. උණ විකාරයෙන් දෙඩෙව්වේ ය. හැන්ස් තමාට දුන් තරමක් දේ නිකම් ම බීවේ ය. එහෙත් හැම කෑමක් ම ප්‍රතික්ෂේප කෙළේ ය. ඔහුගේ භක්තිමත් උපස්ථායි-

කාව තමා අතින් ම පිළියෙල කළ ආහාර කොතරම් පෙරැත්තයකින් පිළිගැන් වූ නමුත් හේ ඒ කිසිවක් නො පිළිගත්තේ ය.

තවත් සතියක් ගත විය. නූගත් වනචාරී අසරණයන් තවත් කළ හැකි කිසිවක් නැත්තෙන් බලාපොරොත්තු කඩ කර ගෙන සිටින අතර හැන්ස් හදිසියේ ම හොඳ සිහිය ලැබුවේ ය. උණත් බැසී වේදනාවත් අඩු ව ගියේ ය. වණයේ වෙළුම් ලිහා බැලූ විට දකින්ට ලැබුණේ කුණු සැරව ගොඩකි. එතැන කුණු ලේ කැටි කරමින් නැගී තුබුණ මහ ගඩුව පුපුරා ගොසිනි. හැන්ස් මේ වරටත් සුවය ලැබුවේ ය. ස්වභාව ධර්මය තමාට ඕනෑ හැටියට තමාට ඕනෑ වෙලාවට ඔහු සුවපත් කෙළේ ය.

හැන්ස් මිනිස් රූකඩයක් පමණක් ව සිටියේ ය. එහෙත් හේ නැවතත් පුරුදු දර්ශන හා ශබ්දයන් ද අතරට පැමිණියේ ය. මෙතෙක් ඔහු ළඟට පැමිණීමට බියෙන් අසල ගසකට වී ඔහු දෙස බලාගත් වන ම සිටි බිම්බි හිතවතා තමා අත්හැරියේ මන්දැයි විමතියෙන් පසු වූවා ය. හැන්ස් හොඳ සිහිය ලබා හඬ ගෑ කෙණෙහි ම බිම්බි ළඟට දිව ආවා ය. බල්ලන් ඇයට හානි කිරීමට තැත් කළ නමුත් තරවටුවකින් එය වළක්වා ගත හැකි විය.

හැන්ස් හොඳට ම දුර්වල ව සිටි හෙයින් කුඩා ළමයකුට මෙන් ඔහුට සාත්තු කළ යුතු විය. එහෙත් වැද්දන් අඩු නැති ව ඔහුට සපයා දුන් පෝෂ්‍යදයක ආහාර තව දුරටත් ප්‍රතික්ෂේප නොකර වඩ වඩා කැමෙන් ටික දිනක දී හේ ශරීර ශක්තිය ලැබුවේ ය.

# 12

# කළු දිවියා

හැන්ස් ද වැදි පවුලේ ම එකකු සේ පිළිගැනීමට වැඩි කලක් ගත නො වී ය. වැද්දන් කතා කරන බාසාව ඉගෙන ගැනීමට හැන්ස් යුහුසුලු විය. ගිනි, දිය, ගල් ගේ, දුන්න වැනි ළඟ ම ඇති දේවලට කියන වචන මුලින් ම ඉගෙන ගත් හේ අනික් වචන හා සතුන්ට භාවිතා කරන වචන ද උගත්තේ ය. සියලු පක්ෂීන්ට චප්පි යන වචනය හැර එක එකා වෙන වෙන ම හඳුන්වන වචන ඔවුන් අතර නොවූයෙන් හැන්ස්ට කුරුල්ලන් වෙන වෙන ම නම් කිරීමට ඉගෙන ගත නො හැකි විය.

වැද්දන්ගේ වචන මාලාව සීමා සහිත එකක් වූයෙන් දවස දෙවේලේ ඔවුන් හා එක් ව ගත කරන ඔහුට ඔවුන්ගේ ව්‍යවහාරය අල්ලා ගැනීම අපහසු කාරියක් නො වී ය. වැද්දන් ගේ කවි සීපද මෙන් ම වැදි දූරිය හවස් කාලවල සිහින් හඬින් ගැයූ නැළවිලි ගී ද හැන්ස් පාඩම් කර ගත්තේ ය.

වැද්දෝ මුලදී ම හැන්ස්ට හූරා (සහෝදරයා) යයි නමක් තබා ගත්හ. ඔවුන්ගේ නම් වූයේ රන්දුනා, පෙමා හා රනී ද වශයෙනි. එහෙත් මොවුහු අප්පා, පුතා, දුව, අයියා, නංගී වශයෙන් එකිනෙකා ඇමතුවා විනා නම කියා කතා කිරීමක් නො වී ය.

රන්දුනා තුනීමතේ වැඩුණ රැවුලක් හා රළු පෙනුමැති මුහුණක් ද ඇති තලතුනා මිනිහෙක් විය. වලසකුගේ නියෙන් සිදු වූ තුවාලයක කැලලක් ඔහුගේ මුහුණ හරහා විය. ඔහුගේ බිරියන් දෙදෙනකු හා ළමයින් කීප දෙනකු ද මිය ගොස් ඉතිරි ව සිටියෝ මොහු දෙදෙනා පමණක් වූහ. ඔහු ඔවුන්ට ඉතා ආදරයෙන් සිටි අතර දූ පුත් දෙදෙනා ද පියාට භක්තිමත් ව විසූවෝ ය. පියාගේ වචනය ඔවුන්ට රජ අණ මෙන් විය. ඉතා ඈත වනයේ මිනිසුන්ගෙන් දුරු ව විසූ මොවුහු නියම ගල් වැද්දෝ වූහ. ඉතා කලාතුරකින් සිංහල මිනිසුන් හමුවට ගිය මොවුහු වන සතුන් මෙන් බොහෝ කුළෑටි ගති ඇත්තෝ වූහ. පවුල් අටකින් යුත් වැදි පරපුරකට අයත් ව සිටිය මොවුන්ගේ සෙස්සවුන්ගෙන් වැඩි දෙනෙක් මිය ගියෝ ය. රන්දුනා හා ඔහුගේ දූ පුත් දෙදෙනා හැර ඉතිරි වුණෝ අනික් වැදි කුලවලට එකතු වී සිටිය හ. මේ වනයේ වෙනත්

ගල් ගෙවල වාසය කරමින් දඩයම් කරමින් ඇවිදින තවත් වැදි කුල කීපයක් මෙහි විසිරී තිබිණ.

ඔවුහු තමන්ගේ දඩබිම් සීමාවෙන් පිට නො ගියෝ ය. මේ දඩබිම ගල් කුළු, දිය කඳුරු හෝ දුනු හැඳ ලකුණු කෙටූ මහ ගස්වලින් හෝ සීමා වී තිබිණ. තමන්ට අයත් දඩබිම් මායිමෙන් පිට දඩයම් සඳහා හෝ අනික් කාරියක් සඳහා හෝ යාම මරණයෙන් දඬුවම් ලබන වරදකි. තමන් අතින් විත් කෑ දඩ සතකු එළවා හෝ අනික් කැලයකට අයත් දඩබිම් සීමාවකට නොයාමට ඔවුහු ප්‍රවේසම් වූහ.

තමා මෙතෙක් දක පුරුදු අනෙක් මිනිසුන්ට වෙනස් වූ හැන්ස් තමන්ගේ දඩබිම් සීමාව තුළ සිටිනු දුටු රන්දූනා ඔහු සතුරකු කොට තැකුවේ මේ හෙයිනි.

වැද්දන්ගේ කතා බහට හුරු පුරුදු වූ හැන්ස් මේ වගතුග හා තවත් මෙවැනි විස්තර ද ඔවුන්ගෙන් අසා දැන ගත්තේ ය. තමාගේ අතීතය පිළිබඳ තොරතුරු ඔවුන්ට විස්තර කරන්ට උත්සාහ කළ හැන්ස් යුරෝපා රටේ ජීවිතය හා මුහුද නැව් ආදිය ගැන කී විට ඒවා පිළිබඳ වචනයක් වත් නොදත් ඔවුහු ඒ තේරුම් ගත නොහැකි ව බලා සිටිය හ. එහෙත් නැව් බිඳීමෙන් පසු ව වන ගත වුණ තමා වන සතුන්ගෙන් හා කුරුල්ලන්ගෙන් ද කෑ යුතු දේ ගැන ඉගෙන ගත් සැටිත්, ආහාර පාන නැති ව මිය යන්ට ළං ව සිටි සැටිත්, මුගුරක් පමණක් අතේ ඇති ව නපුරු වන සතුන් හා සටන් කළ සැටිත් විස්තර කරන විට මෙතෙක් දුෂ්කරතා මැද ඔහුගේ ජීවත්වීම ගැන ඔවුහු මවිතය ප්‍රකාශ කළෝ ය.

හැන්ස් දැන් වැද්දන් මෙන් හෙළුව වසා ගැන්මට කොළ අතුවලින් තැනූ ඉණහැඳක් බඳියි. වන ජීවිතය ගත කරන්නකු වශයෙන් වනයේදී උගත යුතු ශාස්ත්‍රය ඔවුන් කෙරෙන් උගනිමින් සිටියි. රන්දූනා ඔහු තමාගේ දරුවකු වශයෙන් ද පෙමා හා රනී ඔහු තමන්ගේ සොහොයුරකු වශයෙන් ද පිළිගත්තෝ ය. හැන්ස් ද නියම වැද්දකු මෙන් ඔවුන්ට ම සමාන ජීවිතයක් ගෙවූයේ ය.

එකට ගෑවිට පහසුවෙන් ගිනි උපදින්නේ කවර ගසක ලීයෙන් ද? කවර ගෙඩි වර්ගයක් කවර පොතු වර්ගයක් කවර කිරි වර්ගයක් දැමීමෙන් කුඩා මසුන් මත් කර අල්ලා ගත හැකි ද? වැද්දෝ මේවා ඔහුට ඉගැන්නුවෝ ය. එසේ ම කණවේ මැස්සන් මීමැස්සන් බඹර මැස්සන් ගැන හා ඔවුන්ගේ පැණි වද ගැන ද කරුණු කියා දුන්නෝ ය. ගැඹුරු ප්‍රපාතයක වේවැල් ඉණිමගක් දිගේ පැද්දෙමින් පහළ බැස දුම් පන්දමක ආධාරයෙන් මැස්සන් පලවා හැර මීපටල කඩා ගැනීම තරම් විනෝද ජනක කාරියක් මේ හිටපු නැවියාගේ සිතට තවත් නො වී ය. හඩනහා

ගෙන ආ බඹර මැස්සන් තමා වට කොට කරකැවෙද්දී අහසේ සැරිසරන කුරුලුගොයකු මෙන් පහත වැටුණු වැලේ පැද්දෙමින් බඹර කඩන දුෂ්කර කාරියේ යෙදෙන හැන්ස් කෙරෙහි වැද්දන්ගේ ආඩම්බරය මෙන් ම සැලකිල්ල ද මහත් විය.

දුනු සඳහා ලී ගත යුතු ඉතා ම හොඳ ගස් වර්ගය කවරක් ද, මොන ගසක දඬුවලින් ඇද නැති සැහැල්ලු ඊ කෝටු ලබා ගත හැකි ද, ඊ තනාගන්නේ, ඒවාට පිහාටු තබා බඳින්නේ කෙසේ ද? යනාදි දේ ඔවුහු ඔහුට කියා දුන්නෝ ය. තමා ද වැද්දන් තරමට ම හෝ ඊටත් වඩා දක්ෂ දුනුවායකු වන තෙක් හැන්ස් දුනු භාවිතය පුහුණු කෙළේ ය.

වැද්දන් අනික් මිනිසුන් කෙරෙන් කොතරම් දුරුව ඈත වනයේ වාසය කළත්, සමාජයට කොතරම් කුළැටි වුවත් ඔවුන්ට සිංහල මිනිසුන්ගේ ගම්වලට නොගොස් කර ගත නොහැකි එක් අවශ්‍යතාවක් වී ය. යකඩ වාත්තු කිරීමේ කාරිය නොදන සිටි ඔවුන්ට ඊතල පොරෝතල තනවා ගැනීම සඳහා සිංහල ගම්වලට නොගොස් සිටිනු නො හැකි විය. ඔවුන් එය කරන්නේ කෙසේ දැයි වැද්දන් අතරට පැමිණි නොබෝ දිනකින් ම හැන්ස් දැන ගත්තේ ය.

රන්දුනා හා පෙමා ද වෙත ඊතල හයක් බැගිනුත් රනී වෙත ඊතල තුනකුත් විය. වැද්දන්ගේ උපදෙස් පිට හැන්ස් තමා ම තනාගත් දුන්නට රනී මේ තල තුන දුන්නා ය. තව ද ඔවුන්ගේ ආරක්ෂාවටත් මී කඩා ගැනීමේදී ගස් රැකුල් මහත් කර ගැනීමටත් නිතර අතේ ගෙන ගිය පොරෝ කෙටියක් ද ඔවුන් වෙත වී ය. මේ අවශ්‍ය ආයුධ හැන්ස්ට සපයා දීමටත් ගෙවී කැඩී ගිය ආයුධ අලුත් වැඩියා කරවා ගැනීමත් ඔවුන්ට ඉතා අවශ්‍ය ව තිබිණ.

එක් දිනක් උදයේ නින්දෙන් අවදි වී ගත් රන්දුනා හැන්ස්ට හා පෙමාට ද කථා කොට මීපැණියේ දැමූ මුවමස් බඩපුරා කා තමා කැටුව එන ලෙස අණ කෙළේ ය. රනී හා බල්ලන් ද ගල්ගෙයි රැඳවූ ඔවුහු වන මගට බැස දවස තිස්සේ නොකඩවා ගමන් කළෝ ය. දෙවන දින සතුන් දඩයමට සෙවූ ඔවුහු හොඳ ගෝන නාම්බකු හමුව ඌ විද එළාගන්නා තෙක් දඩයම් කළෝ ය.

මරා ගත් ගෝනා මස් කළ ඔවුහු මසින් කොටසක් එහිදී ම පලහා කා රළු මස් කොටස් ගස් දෙබලක රඳවා තබා සතාගේ ඉදිරි ගාත් දෙක හා පසු ගාත් දෙක ද ඇතුළු හොඳ මස් කත් දෙකකට බැඳගත්තෝ නැවත ගමනට පිටත්වූහ. මගදී එකිනෙකා මාරුවෙන් මාරුවට කත් ගෙන ගියෝ ය.

හැන්දෑ වන විට ඔවුන් ගමන් ගත් වනමං පළල් ව තුබුණ හෙයින් තමා දැන් සිටින්නේ සිංහල මිනිසුන්ගේ ගම්වලට

නුදුරෙන් බව ඔවුහු තේරුම්ගත්හ. කත් දෙක රුක්දෙබල් දෙකක රඳවා තැබූ ඔවුහු දවසක ගමන් වෙහෙස හැර ගැන්මට නැවතුණෝ ය. බෙලිකටු හුනුත් සමග ඔවුන් නිතර විකන්ට පුරුදුව සිටි පොතුවර්ග මෙවැනි වේලාවන්හි කොතරම් සුවදයක දෙයක් දැයි හැන්ස් තේරුම් ගත්තේ මෙහිදී ය. මෙවැනි විට සැපීමට වැද්දන් ඔහුට අනුබල දුන්නෙන් කල් යන විට ඔහු ද මේ පුරුද්දට වැටිණි.

රන්දුනා නැගිට ගොස් පළල් කොළ වගයක් කඩාගෙන අවුත් ඊතල මුණකින් ඒවා උල ඇති නාකොළ හැඩයකට කැපුවේ ය. එයින් සමහරක් කුඩා වූ අතර සමහරක් මහත් විය. හේ මෙවැනි කොළ දෙළහක් කැපුවේ තමාට වුවමනා කරන ඊතල ගණන හා ඒවා තැනිය යුතු හැඩය ද පෙන්වීමට ය. ඉන්පසු තවත් කොළයක් ගත් රන්දුනා එය පොරෝ තලයක හැඩයට කැපුවේ ය. මේ හැන්ස් අතට දීමට වුවමනා පොරොව ය.

වනයට ඇඳිරි වැටුණ විට හැන්ස් හා පෙමා ද එහි වැතිරී නිදගත් අතර රන්දුනා නොනිද මුරට සිටියේ ය. රෑ දෙගොඩ හරි යාමයේ පමණ ඔවුන් අවදි කර වූ රන් දුනා ඔවුන්ට ඇත් ව පස්සේ එන ලෙස හැන්ස්ට අණ කොට පෙමාත් සමග දඩමස් කත් ද කර ගසා ගෙන මහ අඳුරේ ගමන් කරන්ට වූවෝ ය. මේ හඳ නැති රය ඔවුන් විශේෂයෙන් මේ ගමනට තෝරාගෙන තිබිණ. දෙපැයක් පමණ මෙසේ ගමන් කළ ඔවුහු අඳුරේ යම්තමින් පෙනුණ ගෙපැලක් වෙතට පැමිණියෝ ය. ඔවුන් එනතුරු එහි නතර ව සිටින සේ හැන්ස්ට කී ඔවුහු ඉතා සීරුවෙන් ගෙපැල වෙත ගියෝ දඩමස් එහි පරාලවල එල්ලා කපන ලද කොළ කැබලි ටික ද එහි ම තබා ආපසු ආවෝ ය. ඔවුන් මේ කාරිය කොතරම් ප්‍රවේසමෙන් කෙළේ ද කියතොත් එහි මුරට සිටි බල්ලා පවා ඔවුන් නො දුටුවේ ය.

පසුව ද හවස ඔවුන් ආපසු ගල් ගෙට එන විට රනී එහි මැස්සක් බැඳ එයට යටින් දර ගොඩක් ගසා තුබුණා ය. ඔවුන් එන විට දඩ මස් ගෙන එන බව දන්නා රනී ඒවා වියලීමට මෙසේ සූදනම් කොට තිබිණි. වෙහෙස වී සිටි මිනිසුන් නිද ගත් අතර රනී මේ මස් තීරුවලට කපා මැස්සේ තබා මුළු රෑ කාලය තුළ ම ගින්දර දමමින් වියලුවා ය. උදේ වන විට මස් තීරු හොඳට දුඹුරුවන් වී තිබිණ. ඉන්පසු මේවා බුරුල්වීමට පොරෝ බන්දකින් තැළූ යුවතිය ඒවා මීපැණි පුරවා තුබූ ගල් කුහරයක තැන්පත් කළා ය. මොවුන්ගේ ආහාර ගබඩාව මෙය වී ය.

සතියකට පසු ව නැවතත් ඔවුහු එකී යකඩ තළන්නාගේ කම්මලට ගියෝ ය. මෙදින තමා තනිව එහි ගිය රන්දුනා ටික වේලාවකින් ඊතල හා පොරෝ තලය ද රැගෙන ආපසු ආවේ ය.

ඒ සියල්ලක් ඔහුට වුවමනා කළ හැඩයට ම තනා තිබිණ. මෙවැනි නිශ්ශබ්ද ගනුදෙනුවලින් වැද්දෝ තමන්ට වුවමනා උපකරණ කිසිවකුත් හමු නොවී කිසිවකු විසිනුත් දකිනු නොලැබ තනවා ගනිති.

මේ ආදි කල්පික වනචාරී ජීවිතය හැන්ස්ගේ සිත් ගත්තේ ය. සිරිතක් හැටියට ඔවුහු එක් ව ගොස් දඩයම් කළෝ ය. මේ අතර රනී අල හෑරීමක, මී කැඩීමක හෝ කුඩමසුන්ට වහ තැළීමක හෝ යෙදුණා ය. පිරිමින් මෙන් ම ආයුධ අතේ ඇති ව වනයේ හැසුරුණ රනී නපුරු වනසතුන්ගෙන් ආරක්ෂා වීමට දැන සිටියා ය. සමහර විටක ඕ තම පියා හෝ සහෝදරයා හෝ හැන්ස් හෝ සමග වනයේ ගියා ය. දැන් ඔවුන්ට හැන්ස් හොඳට ම විශ්වාස ය.

වැද්දන් කුඩාවට වැඩුණ හැඩි දැඩි මිනිසුන් කොටසක් වූ අතර හැන්ස් වඩා උස මහත දේහයක් ඇති ව සිටියේ ය. වයස දහසයේදී හැන්ස් රන්දුනාට වඩා උසින් වැඩී ගියේය. සිහි නුවණින් ද දියුණුව සිටි ඔහුට ඔවුන්ගෙන් උගත් දේ වඩා හොඳින් කළ හැකි වී ය. එහෙත් වන ජීවිතයට වුවමනා සියුම් ලෙස දැකීමේ හෝ ඇසීමේ හෝ තියුණු ඉව කිසි විටෙකත් වැද්දන්ට මෙන් ඔහුට නො පිහිටියේ ය. වැද්දන්ගේ මේ සහජ ඉව පරම්පරා බොහෝ ගණනක සිට ඔවුන්ට උරුමයෙන් ලැබී එන්නක් වූයේ ය.

හැන්ස් ද වැද්දන් මෙන් ම සතුන් මැරුවේ ය. දඩමස් කෑවේ ය. ඔහුට කළ නොහැකි වූ එක ම දෙය වඳුරන් මැරීම විය. වඳුරන් දකින හැම විටක ම ඔහුගේ සිහියට ආවේ බිම්බි හා ඇගේ ආදරබර හැසිරීමත් ය. ඔවුන් කෙරෙහි කිසි ම දයාවක් අනුකම්පාවක් වැද්දන් වෙත නම් නො වී ය. වානර මස ඔවුන් ගේ රසවත් ම ආහාරය වූ හෙයින් වඳුරන් රිළවුන් අසු වූ හැම විටක ම වැද්දෝ උන් මරා ගත්තෝ ය. මිනිසුන්ගේ ඊ පහරකින් බිම වැටුණ විට හෝ උන්ගේ බල්ලන්ගේ දත්පහරවලින් තුවාල ලැබූ විට හෝ මරණ බියෙන් අයාගත් ඇස් ඇති ව දුක්මුසු මුහුණු ඇති ව මිනිසුන් මෙන් ම අභය ඉල්ලා සිටින මේ සතුන් මැරීම හැන්ස්ට සිත් වේදනා ඇති කරවන දෙයක් විය.

වැද්දන් වඳුරු දඩයමේ යන විට හැන්ස් ඔවුන් සමග එක් ව නො ගියේ ය. එහෙත් බඩගිනි වූ විට ආහාර වශයෙන් ලැබුණ ප්‍රණීත වඳුරු මස් හේ ප්‍රතික්ෂේප නො කෙළේ ය. සතකු මසට හැරුණ විට ඒ කොයි සතා වුවත් එහි ඇති අමුත්ත කවරේ ද?

වැද්දෝ තමන් මැරූ සතුන් ගේ සම්වලින් කිසිම ප්‍රයෝජනයක් නො ගත්තෝ ය. ගෝන හම් මුව හම් වේලාගත් විට ඔවුන්ට

රළු ගල් පොළොවේ නිදා ගැනීමට ප්‍රයෝජනවත් වේ. එහෙත් වනයේ තැනින් තැන යමින් දඩයමින් ජීවිතය ගෙවන මොවුහු මේ සම්වලින් අමුතු බරක් ඇති කර ගැනීමට නොකැමැත්තෝ නිදා ගන්නා විට විසම ගල්බිම කොළ අතු ටිකක් කඩා අතුරා නිදාගනිති.

වැද්දන්ගේ දඩයම් ගමන් හැම විට ම වාගේ අනතුරු සහිත කාරියක ස්වරූපයක් ගනියි. කිසි ම හඬක් නොනගා එකා පසු පස එකා යන මේ ගමනේදී හදිසියේ ම ළඟ ඉදිරියේ වේ තුඹසක් ළඟ වලසෙක් හමුවෙයි. දුන් ආයුධ අතේ ඇතිව සිටින හැන්ස් තමාගේ දක්ෂතාව මැන ගැන්මට මෙවැනි හදිසි හමුවීම් කැමති වෙයි. අනික් කාරණය දිවි සමක් ලබා ගැනීමට දුන් හැන්ස්ට චුවමනාව තිබේ. එහෙත් කිසි ම ඉවක් නැතත් තියුණු ඇස් කන් ඇති දිවියා වැද්දන් මග හැර යයි.

එක් දිනක් පෙමා හා වන දඩයමේ ගිය හැන්ස් මේ බලා-පොරොත්තුව ඉටු කර ගත්තේ ය. වඳුරන් නැගූ අනතුරු හැඟවීමේ කැගැසුම ඇසූ හැන්ස් දිවියකු ළඟ ම ඇතැයි සලකා ගත්තේ තමා අනුව එන සේ පෙමාට සන් කොට එදෙසට පිය නැගුවේ ය. වඳුරු දඩයමට නොකැමැති සුදු හූරා දුන් මේ වඳුරු හඬ අනුව යන්නේ මන්දැයි පෙමාට විමතියක් විය. පෙමා තුරු මුදුන් දෙස බලමින් වඳුරන් සෙවූ අතර හැන්ස් යටි කැලය විම-සුවේ ය. මෙසේ යන හේ එක් තැනක දුඹුරුවන් කැටියක් පඳුරු අතර සැඟවී තිබෙනු දුටුවේ ය. දිවියෙක්, කලබල වී දුව එන වඳුරු නාම්බකු බඳ ගැනීමට සැරසී එහි රැක සිටියේ ය. පැහැ-දිලි ව බලා එල්ලය ගැනීමට අඩියක් මැත් වුණ හැන්ස් දුනුදිය කන දක්වා ඇද වේගවත් ඊ පහරක් යැවුවේ ය. බිහිසුණු ගෙර-වීමක් සමග ම අහසට පැන ගත් දිවියා බිම එහා මෙහා පැන දඟලා ළයෙහි ඇනී තුබුණ ඊය කටින් සපා ඇද දමා තවත් එතැන නොසිට යන්ට ගියේ ය. පෙමා පුදුම ව බලා සිටිනු දැක හැන්ස් සිනාසුණේ ය. වඳුරෝ විසිරී ගියහ.

"ඇයි ඌ විද්දේ?" පෙමා හිත නොහොඳෙන් විමසුවේ ය.

"ඒක උඹට පෙනේවි!" යයි කී හැන්ස් තමාගේ වඳුරු සම් මල්ලෙන් ගත් කහට පොතු විටක් පෙමාට දුන්නේ ය. විත් කෑ සතකු පාරේ යන්ට පෙර හැම විට ම මේ දඩයක්කාරයෝ ටික වේලාවක් නැවතී සිටියහ. විත් කෑ සතා ලේ හලා දුර්වල වන තුරු කල් ගැනීමට ඔවුහු එසේ කරති.

පැයකට පමණ පසු දෙදෙනා ලේ පාරේ පිටත් ව සැතපුම් දෙකක් පමණ ගමන් කළෝ ගල් කුළක් වෙතට පැමිණියෝ ය. මේ ගල් කුළ අතන මෙතන ගණන් නැති ගල් රැකුල් සැදුණ

ගල් ගෙඩිවලින් ගහන එකක් විය. මෙහි මේ ගල් බිලයකින් කොයි මොහොතේ නමුත් නපුරු වන සතකු පැන ආ හැකි ය. සතාගේ ලේ පාර දුන් අඩු වී ගොසිනි. මෙහිදී ලේ බිඳු පෙනෙන්නට නොවී ය. අඩි සටහන් හෝ අනික් ලකුණක් මේ හරියේ දී සෙවී ම දුෂ්කර ය. සතාගේ ලකුණක් සොයා ගැනීමට හැන්ස් තව දුරටත් උත්සාහ කරන අතර පෙමා ඔහුගේ ඇඟට අත තබා මෙහි සතා සෙවීම අවදානම් යයි කීවේ ය. එහෙත් මෙය අත් හැර යෑමට බැරිතරම් හැන්ස් කලබල ව සිටි හෙයින් හේ පෙමාට අනුව එන සේ සන්කොට ආ මග හරහා තුබුණ ගලකට නැංගේ ය. තමා මේ නැඟුණේ ගල් බිලයක කට ළඟට බව මෙහිදී හැන්ස් දුටුවේ ය. එහි ලේ බින්දුවක් ද විය. ඊයක් නගා ගත් දුන්න වමතින් ද පොරෝ කෙටිය දකුණතින් ද ගත් හැන්ස් පරෙස්සමෙන් නැමී එයට එබිකම් කරන්ට විය. මුලදී ඔහුට එහි කිසිවකුත් නො පෙනුණේ ය. එහෙත් අඳුරට ඇහැ හැඩ ගැහීමේදී ගුහාවේ ඇත කෙළවරේ ගිනි පුලිඟු දෙකක් මෙන් දිලිසෙන යමක් ඔහුට දැකිය හැකි විය. පොරොව පසෙකින් තබා දණක් නමා දණක් බිම ඇණ හැරහී ගත් හේ හොඳ හැටි මාන බලා ඊයක් විද හැරියේ ය. දිවියා එකෙණෙහි ම ඔහු කරා පැන්න නමුත් සූදන මෙන් සිටි හැන්ස් වහා ඉවත් ව උගේ නියෙන් බේරී ගත්තේ ය.

එල්ලය වැරදී දුර ගිය දිවියා ගලෙන් පහළට වැටුණේ පෙමා එහි සිටිනු දැක ඌ පිටට පැන්නේ ය. වහා ගලෙන් පහළට පැන ගත් හැන්ස් ඌට කෙටීමට පොරොවත් අමෝරා ගෙන එහි ගිය නමුත් සතා ඒ සමග ම පෙරළී බිම වැටී කට ඇර නිශ්චල විය. උගේ ළයට වැදුණ ඊය හදවත සිදුරු කර ගෙන ගොස් තුබුණ හෙයින් මේ උගේ අවසාන පිම්ම විය.

තරුණයෝ දෙදෙන ජයග්‍රහණය ගැන ප්‍රීතියෙන් සිනාසුණෝ ය.

පෙමාගේ ද උදව් ඇති ව හැන්ස් සතා හමගසන්ට විය.

"මෙකිට කිරි තියෙනවා," මේ අතර සතා ගේ තන පුඩුවක් මිරිකූ පෙමා කීවේ ය. "මැගේ පැටවුන් ගල් රැකුලෙ ඇති."

"අපි ගිහින් බලමු."

ඔවුහු ගලට නැග බැලුවෝ ය. ගල් බිලයේ කට කුඩා ව තුබුණ හෙයින් එහි තුළට යාහැකි වූයේ බඩ ගාගෙන යාමෙන් පමණක් විය. හැන්ස් එසේ කිරීමට සූදනම් වනු දුටු පෙමා "බලාඟෙන පැටවුන් ලොකුවෙලා ඇති," කීවේ ය. එය කනකට නොගත් හැන්ස් ගල් බිලය තුළ අඳුරේ බඩ ගාගෙන ගියේ ය. අතපත ගෑ නමුත් ඔහුට පැටවුන් සොයා ගත නොහැකි විය. මුල්ලක සෙමින් පිඹින හඬකට අනුව අත ගෑ ඔහුට එක පැටවකු අසු විය. ඒ අතර



අනිකෙක් ඔහුගේ අත පහුරු ගෑවෙන් හෙතෙම ඌ ද අල්ලා ගත්තේ ගුහාවෙන් පිට වී ය.

පැටවුන් දෙදෙනා පරීක්ෂා කළ ඔවුහු මවිතයට පත් වූහ. එයින් එකෙක් දිවි පැටවකු වූ අතර අනෙකා. දළි අඟුරක් මෙන් කළු විය. දෙදෙනා ම ලෝමයෙන් ගැවසුණු බළලකුට වඩා ලොකු නැති පැටවුන් වූ නමුත් තද නපුරු ගති ඇතියෝ වූහ. විශේෂයෙන් කළු පැටවා නපුරු විය. හැන්ස් කළු පැටවා අත තබා ගෙන අනෙකා පෙමා අතට දුන්නේ ය. පෙමා ගේ අත බුරුල්වීමෙන් ඉඩ ලැබුණු පැටවා ඔහුගේ අත සපා කෑවේ ය. මෙයින් කෝපයට පැමිණි පෙමා ඌ ගලේ ගසා මැරුවේ ය.

''උඹ එහෙම කළ එක හොඳ නෑ,'' හැන්ස් පෙමාට සැර කෙළේ ය.

''ඇයි, උඹෙ එකාට එහෙම කරන්නේ නැද්ද?''

''අපොයි නෑ, මම ඌ තියාගන්නවා.''

''සැබැවින් ම තමන්ගේ මේ සොහොයුරා පුදුම අදහස් ඇත්තෙකැ,'' යි පෙමා සිතුවේ ය.

අත් නියවමින් ගොරවන මේ නපුරු දිවි පැටවා ප්‍රවේසමින් දැඩි කොට අල්ලාගෙන හැන්ස් උගේ ඇඟ පිරි මදිමින් නළව නළවා ඌ මුරණ්ඩු කම් නොකොට හොඳින් හිටියොත් රැක බලා ගන්නා බව කීයේ ය. පැටියා ක්‍රමයෙන් නිශ්චල වී අම්මා නැති දුකින් හඬන්ට වුණි. පෙමා හැන්ස් කළ කී සියල්ල දෙස විනෝදයෙන් හා ප්‍රීතියෙන් බලා සිටියේ ය.

''දැන් උඹ ඌ අල්ලා ගනින්,'' හැන්ස් කීවේ ය, ''මම දිවි දෙන හම ගහන කල්. හැබැයි අනිකට කරපු දේ නොකර පරිස්සමින් අල්ලා ගන්ට ඕනෑ.''



හැන්ස් ගේ වැඩේ අවසන් වූ පසු දිවි හම ඔතා පෙමාට දී තමා ඉතා ප්‍රිය කළ දිවි පැටවා අතට ගත්තේ ය.

හැන්ස් ගුහාවට පැමිණි විට ඔහු මේ පුදුමාකාර දිවි පැටවා බිම තිබ්බේ ය. ඌ දත් විලිස්සමින් ගොරව ගොරවා එහා මෙහා බඩගෑවේ සැඟවී ගන්නට අස්සක් මුල්ලක් සොයන ලෙසිනි. බල්ලෝ ඌට බිරුවෝ ය. රන්දූනා හා රනී ඌ දෙස විස්මයෙන් ඇස් විදහා බලා සිටියෝ ය. රන්දූනා ගේ මුළු වන ජීවිත කාලයේ ම මෙබඳු සතකු දුටු බවක් හෝ එවැන්නකු ගැන ඇසූ බවක් හෝ නැත්තේ ය. මෙබඳු සතකු බිහිවීමට දිවිදෙන කවර සතකු සමග හාදකම් පවත් වන්නට ඇද්දැයි කියා හිතා ගන්ටවත් රන්දූනාට බැරි විය.

"ඉතින් උඹ මේ සොයා ගෙන සිටින සතාට මක් කරන්ඩ ද කල්පනාව?" රන්දූනා හැන්ස්ගෙන් ඇසුවේ ය.

"ඇති කරන්ඩ," හැන්ස් කීවේ ය.

"හා, හා, එපා; මේකා යක් පැටියෙක්. මූ හෙම ලොකු වුණොත් අපව මරාදැයි. ඕකා මෙහෙ මට දියන්. මම උගේ ඉහ තළා දමන්නම්," රන්දූනා කීයේය.

"අනේ බෑ!" උස් හඬින් කියා වැද්ද ළඟට වී සිටි දිවි පැටවා ඉක්මනින් වඩා ගත්තේ ය. "අපි උඹව මෙහි තියාගෙන හද

ගන්නවා. එහෙම නේද පැටියො? හොයන්ට බැරි තරම ලස්සණ වස්තුවක් උඹ. මරන්ඩ හොඳ නෑ.''

පෙමා හා රනී ද ලවා කෝටු හා පට්ටා ද ගෙන්වා ගත් හැන්ස් දිවි පැටවාට බල්ලන්ගෙන් බේරී සිටීමට හතරැස් කූඩුවක් තැනුවේ ය.

ඔවුන් මැරූ සතුන්ගේ බඩවැල් හා එවැනි මොළොක් කොටස්-වල මස් හැන්ස් දිවි පැටවාට කැවූවේ ය. බොහෝ විට හේ මේ පැටවා කූඩුවෙන් එළියට ගෙන බළල් පැටවකු සමග සෙල්ලම් කරන්නාක් මෙන් ඌ හා සෙල්ලම් කෙළේ ය. දිවි පැටවා හා එකට පෙරළෙමින් ඌ උඩ දමමින් සෙල්ලම් කළ හැන්ස් සමහර විටෙක ඌ ඉතා කැමති මසක් පට්ටා හුයක ගැට ගසා ඌ ඉදිරියට දමා එය ඩැහැ ගන්ට තැත් කරන විට නූල ගස්සා ඉවත ගත්තේ ය. මෙවැනි වේලාවල පැටවා ගේ කුරුමානම වැරදී ගියේ ය.

දීයා යයි වැද්දන් විසින් නම් කරනු ලැබූ මේ සතා කෙරෙහි බිම්බි මුලදී බිය වූවා ය. බිම්බිගේ වර්ගයේ සතුන් දිවියා ගේ ප්‍රධාන ආහාරය වූ හෙයිනි. දිවියකු හදා වඩා ගැනීම ගැන බිම්බි ඊර්ෂ්‍යා ද කළා ය. එහෙත් හැන්ස් ඔවුන් දෙදෙනා ට ම එක සේ ආදරය කළ හෙයින් පසුව මේ දෙදෙනා ද යහළු ව එකට සෙල්ලම් කළෝ ය.

දිවි දෙන ගේ සම ඇණ ගසා අව්වෙන් වියලා ගත් හැන්ස් එය පහසුවෙන් නැමෙන සේ එහි යටි පැත්ත තියුණු මුවහත ඇති ගලකින් සූරා දැමූවේ එයින් ඉණට ඇඳුමක් තනා ගෙන කොළ අතු හැඳ අත් හැරියේ ය. රනී අඹරා දුන් නියඳ ලනුවකින් හේ එය බැඳ ගත්තේ ය. වැදි යුවතියකගෙන් ඉණට දියලනුවක් අඹරවා ගැනීම විවා ගිවිසුමක් වන බව මෙවිට හැන්ස් නොදැන සිටියේ ය. සමේ ඉතිරි කොටසෙන් තමා ගේ නාවුක පුහුණුව අනුව අපූරු පහියක් තැනූ හේ එය රනීට තෑග්ගකට දුන්නෙන් ඕ එය වටිනා දෙයක් කොට සුරැකි ව තබා ගත්තා ය.

මාස කීපයක් ගත වන විට දිවි දෙන ඉක්මනින් වැඩෙන්ට වූවා. ඇයට තනිව ආරක්ෂාව සලසා ගැනීමට තරම ඈ වැඩුණ විට හැන්ස් කූඩුව කඩා දැමූවේ ය. දිවියන්ට හැම විට ම විරුද්ධ වූ බල්ලෝ ඇයට පාඩුවේ ඉන්ට හැර නිසොල්මන් ව සිටියෝ ය. රාත්‍රි කාලයේ හැන්ස් ළඟ නිදගත් දිවි දෙන ඉතා සුළු ශබ්දයකට පවා විමසිලිමත් ව කන් නමා ගෙන පරීක්ෂාවෙන් සිටියා ය. තමා කැමති තැනක යාමට ඉඩ ලැබූ දිවි දෙන ගල් ගේ අවට වනයේ ඇවිද ගොයින් ලේනුන් කුරුල්ලන් මරාගෙන කෑමට පුරුදු වූවා ය. හැන්ස් දඩයමේ ගොස් ගල් ගෙට එන විට ම ආදර ගෞරව පෙන්වීමට ළඟට එන කීකරු බළලකු මෙන් දිවි දෙන ද

ඔහු කරා දිව ආවා ය. ඔවුන් දෙදෙනා අතර සම්බන්ධය එසේ ඉතා දැඩි වුවත් වැද්දන් හා පැවැත්තේ දූන හැඳුනුම් කමක් පමණක් වී ය.

හැන්ස් දුන් හොඳ ආහාර නිසා දිවි දෙන ඉක්මනින් වැඩුණා. අවුරුදු දෙකක් ගත වන විට නිල්වන් නපුරු ඇස් ඇති බියකරු පෙනුමක් ඇති ශක්තිමත් දිවි දෙනක බවට පැමිණියා ය.

හැන්ස් දිවි දෙනගේ මුහුණට අතින් පහර දෙමින් ඇගේ ඉළ-වලට අනිමින් ඔවුන් දෙදෙන එක ගොඩේ පෙරළෙන සැටිත් දිවි දෙන ඔහුගේ ගෙලට මුහුණට පනිමින් සෙල්ලම් කරන සැටිත් රනී පුදුම ව බලා සිටි අවස්ථා බොහෝ විය. තරුණයකු තිරිසන් සතකු කෙරෙහි මෙතරම් දැඩි ආදරයක් පෙන්වීම ගැන රනීගේ සිත් තුළ උකටලී බවක් හා හද තුළ ගැස්මක් ද ඇති කෙළේ ය.

එක් දිනක් රාත්‍රියේ වනයේ අඳුර අතරෙන් ඇසීමට බිය ජනක තරමේ වේගයෙන් ගොරවන ශබ්දයක් ගල් ගෙයි සිටියවුන්ට ඇසිණ. ඔවුහු හැම දෙනා ම නැගිට එබිකම්කර බැලුවෝ ය. ගල් ගෙට නුදුරුව ඇති එක් ගලක් මත දිවි දෙන සිටිනු වැටී තුබුණ හඳ එළියෙන් ඔවුන්ට දැකිය හැකි විය. දිවි දෙන සම්පූර්ණ ශක්තිමත් තරුණ බවට පැමිණ සිටින බව ඔවුහු තේරුම් ගත්හ.

එයින් ටික දිනකට පසු මුවකුගේ මර හඬක් අඳුරේ ඔවුන්ට අසන්නට ලැබිණ. අලුයම එදෙසට ගිය ඔවුන්ට දකින්නට ලැබුණේ කළු දිවි දෙන තම පළමු මුව දඩයම කර ඇති බව ය.

දිවි දෙන හැන්ස් සමග දඩයමේ ගියා ය. ඒත් එසේ ගියේ හැන්ස් පමණක් යන විට පමණකි. එසේ ගිය දිවි දෙන හැන්ස් ගේ ඊයෙන් විත් කැ කොතරම් විශාල සතකු වූව ද එක පහරින් පැන ඉරා දමන්නී ය. බොහෝ විට දිවි දෙන තනිව දඩයමේ ගියා ය. ඉර බැසගන යන විට ගල් ගෙයින් පිටව වනයේ දුර යන මෝ එළා ගත් ගොදුරෙන් හොඳට ම බඩ පුරවා ගෙන අලුයම ආපසු එයි. දවල් දවසේ ම විවේක ව ගල්ගෙයි සිටින දිවි දෙන හැන්දෑ-වේ ආපසු යන විට ඇ සමග යන වැද්දන්ට මැරූ සතාගෙන් කොට සක් ලබා ගත හැකි වෙයි. ඔවුන් දඩයම් කළ විට එකිනෙකා අතර බෙදා ගත්හ. එහෙත් හොඳම දඩයක්කාරිය දිවි දෙන වූවා ය.

13

# වන තවුසා

රන්දුනා, පෙමා හා හැන්ස් ද ඔවුන්ගේ ආයුධවල අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා යකඩ තළන කම්මල්කරුවා දැකීමට යාමට සූදානම් වූහ. මේ සඳහා කම්මල්කරුවාට ගෙන යාමට වුවමනා ගෝනා දඩයම් කර ගැනීමට දඩපාරේ ගිය ඔවුහු වනයේ බොහෝ දුර ගියහ. එසේ ගිය ඔවුන් එක් තැනක රාත්‍රිය ගෙවීමට නැවතී සිටි අතර කෙනකු මන්ත්‍ර පිරුවහන හඬක් වැනි ඉතා සිහින් හඬක් හැන්ස්ගේ කනෙහි වැකුණේ ය. මේ අසා නැගී සිටි හැන්ස් තම සගයන් දෙස බැලුවේ ය. ඒ හඬ ඔවුන්ට නෑසුණාක් මෙන් විය.

"මට ඇහෙන ඒ හඬ මොකක් ද? හැන්ස් ඔවුන් විමසුවේ ය.

"මොන හඬක් ද?"

"කෙනකුගේ ගායනයක් වගේ හඬක්, ඔය ඇහෙන්නෙ. ඇයි නැද්ද ඇහුණෙ?"

"ආ! ඒ අඬ!" කී රන්දුනා "මතක ද අප දවල් ලොකු හෙලක් ළඟින් ආවා. අන්න ඒ හෙළේ එක ගල් ගේක තාපස කෙනෙක් ඉන්නවා. ඒ තාපසයො හැම ද ම මේ වෙලාවට ඔය කියමන කියනවා."

මේ හඬ තුරු මුදුන්වලට උඩින් ආශීර්වාද ගීයක් මෙන් බැස ආවේ ය. ජනාවාසයෙන් තොර මෙවැනි තැනකදී ඇසීමට අපූරු හඬකි.

"ඒ තාපසයන් තනි ව ම ද ගල් ගෙයි ඉ[illegible]ඉන්නෙ?" හැන්ස් විමසුවේ ය.

"ඔව්, මිනිස්සු කියනවා ඒ තාපසයා කවදාවත් ගලෙන් පහළ බහින්නෙ නැහැ කියා."

"කොහොම ද එතකොට කෑම බීම ලබාගන්නෙ?"

"හෙලට එහායින් ගමක් තියෙනවා. ඒ ගමේ මිනිසුන් තාපසයාට වුවමනා කෑම බීම ගෙනත් දීලා යනවා කියා අහලා තියෙනවා."

''ඒ ගමෙ ඉන්නෙ කොහොම මිනිසුන් ද? මේ වගේ වැද්දන් ද?''

''නෑ. අප ගස් කොළන් වවා ගෙන ඒවායින් කෑම ලබා ගන්නෙ නැහැ නේ. ඒත් ඒ මිනිස්සු වවනවා. ඒ මිනිසුන්ට කියන්නෙ හිංගල මිනිසුන් කියලා.''

''හිංගල මිනිසුන් හුඟක් ඉන්නවා ද?''

''ඔව්, ඉන්නවා. ඒ බොහොම දුර. සමහර වෙලාවට ඒ මිනිස්සු ලොකු ලොකු කාණ්ඩ හැදිලා මේ වනේ මැදින් යනවා. එහෙම දට අපි හෙල්වලට නැගිලා හැංගෙනවා.''

''ඒ මිනිසුන් එන්නෙ මොන කාරියකට ද?''

''අලි ඇතුන් අල්ලන්ට එනවා. තවත් සමහර කාලවලට තවත් මිනිසුන් එක්ක කරන හටන්වලට යනවා.''

''ඒ මිනිසුන් එහෙම නිතර එනවා ද?''

''මගෙ ජීවිතකාලෙදි දෙතුන් වරක් එහෙම ආ වග මම දන්නවා.''

''ඒ මිනිසුන් ගැන ඔය තරම වග විත්ති කොහොම ද දන්නෙ?''

''අපේ ඇත්තන්ගෙන් කොටසක් ඔය හිංගල මිනිසුන් ඉන්න ගංවලට අපට වඩා නුදුරෙන් ඉන්නවා. ඊටත් නුදුරෙන් තවත් මිනිසුන් ඉන්නවා. ඉතින් ඔය කතා කටින් කට ඇවිත් අපි දන්නවා.''

''ඔය හෙලේ ගල් ගෙයි ඉන්න තාපසයා දකින්ට ගිහිං හෙම නැද්ද?''

''බොහොම ඉහත දවසක මේ පුතාගෙ අම්මා ලෙඩ වෙලා ඉඳිද්දී අපේ මාමා මා කැටුව ගියා. තාපසයා හොඳ වෙදෙක්.''

මෙහිදී පෙමා කතාවට කට දැම්මේ ය. ''ඇයි ඊට පස්සෙ මේ මෑතකදි අර. . . .''

''හහ්! ඒකෙන් කමක් නැහැ මෙතෙන්ට,'' රන්දූනා ඔහුට හරස් විය.

ඒ ප්‍රශ්නය නැවත නොඇසීමට හෑන්ස් ප්‍රවේසම් විය.

හෑන්ස් මේ ඇසූ දේ ගැන බොහෝ වේලාවල කල්පනා කෙළේ ය. මේ තනි ව වනයේ ජීවත් වන තවුසා දැකීමට යාමේ ආසාව ඔහු තුළ බලවත් ව වැඩුණේ එක් දිනක් රන්දූනාට මේ වග කීවේ ය. එහෙත් වැද්දා ඔහු අධෛර්‍යවත් කෙළේ ය. ''අර මා කී ගමේ හිංගල මිනිසුන් දැනගත්තොත් මෙහෙම කෙනකු මේ වනේ ඉන්නවා කියලා එයින් කරදර ඇතිවෙන්ට ඉඩ තියෙනවා. අර කළු දීයා වගේ තොපත් මේ රටේ අනෙක්

මිනිසුන් වගේ නො වෙයි. කතාව පැතිරිලා ගියොත් මේ වනේ සුදු වැද්දකු ඉන්නවා කියා මිනිසුන් එන්ට ඉඩ තියෙනවා මේ අමුතු වැද්ද හොයාගන. ඉතින් මෙ අපත් එක්ක ගත කරන මේ ජීවිතේ සන්තෝස නැද්ද?'' කියූ රන්දූනා තමාගේ පුතාට මෙන් ම ආදරය කරන ඔහු දෙස දයාබර බැල්මක් හෙළුවේ ය.

''මෙ ජීවිතේ මට හොඳයි,'' හැන්ස් කීවේ ය.

රන්දූනා කී කතාවේ සත්‍යය වටහා ගත් හැන්ස් තාපසයා දැකීමට යාමේ අදහස කලකට අත් හැරියේ ය. එහෙත් ඒ යටපත් කර ගෙන සිටිය අදහස බලවත් ව නැවත නැග ආයෙන් හේ තවත් දිනක මේ ගැන රන්දූනාට කීවේ ය. ඔහුගේ අදහස තර බව වටහා ගත් රන්දූනා ඔහු තමන්ට නැති වේය යන බියෙන් ''හොඳයි ඉතින් යන්ට ම තර නම් පෙමාත් කැටුව යන්ට,'' යයි සමු දුන්නේ ය.

දෙදිනක ගමන් ගෙවීමන් පසු ව ඔහු දෙදෙනා හැන්දෑ කාලයේ තවුසා වසන ගල් ගේ ඇති හෙළ පාමුලට පැමිණියෝ ය. තවුසාගේ පිරිත් කීම මෙවිට කඳු පාමුලට ඇසෙන්ට වී ය. හඬ උස් පහත් කරමින් මිහිරි තාලයකට කෙරුණු සංගායනය ගුවන් තලයෙන් පමණක් ආවරණය වුණ හෙල මුදුනෙන් බැස අඳුරු වනයේ සතර අතට විහිද ගියේ ය.

රෑ කඳු පාමුල ලැග සිටි ඔවුහු අරුණත් සමග ම කන්දට නගින්නට පටන් ගත්හ. වැඩි දුරක් යාමට පෙර ම ඔවුන් ඉදිරියෙහි පැටවකුත් සමග සිටි වැලහින්නක් පෙනී සිටියා ය. වරක් ඔවුන් දෙස බැලූ වන හැතිරිය කෙළින් සිට ළය ඉදිරියට දමා අහංකාර ලෙස ඔවුන් ඉදිරියට ආවා ය. එකෙණෙහි පෙමා පසෙකට කර පොරොවත් අතින් ගෙන එඩිතර ව ඉදිරියට ආ හැන්ස් දුටු වැලහින්න මුල් අදහස වෙනස් කොට ගෙන බිමට නැමී බියකරු ලෙස ගොරවමින් යළිත් වන වැදුණා ය.

දෙපැයක දුෂ්කර ගමනකින් පසු කෙළින් ඉහළ නැගිය යුතු හෙල ඉදිරියෙහි වූයෙන් ගස් පඳුරු අල්ලමින් එහි නැග ගත් ඔව්හු ගල් කුළේ පහත කොටසේ එක් ගල් ගෙයක් සමීපයට නැංගෝ ය. නිතර වවුලන්ට වාසය වී තිබීම නිසා ඔවුන්ගේ වසුරුවලින් පිරී තුබුණ මේ ගල් ගෙය තද වවුල් ගඳින් යුතු විය. එහි එක් විවරයක් සමීපයෙන් වේ තුඹසක් මතු වී තිබිණ. ගඩොලින් බැඳ තුබුණ පැරණි බිත්තියක් බිඳ වැටී ගඩොල් තැනින් තැන විසිරී තිබිණ. එහි වූ ගලින් කළ පැතිලි මල් ආසනයක් මත වන මල් පුද තිබිණ. වේයන් කා දිරා ගිය ලී පිළිමයක් බිම පෙරළී තිබිණ. ගල් ගෙයි ගල් පියස්ස බඳමයකින් වසා වට කොට එය වර්ණවත් සිතියමින් සරසා තුබුණෙන් මෙහි පැරණි විහාරයක් වී යයි සිතා ගත හැකි විය.

මේ ගල් ගෙයින් ඔබ්බේ ගමන් කිරීමට අන්තරායකර පටු මගක් විය. තැනින් තැන මිටි ගස් වැඩී තුබුණ මේ පටු මග හෙල අද්දරින් ගොස් අනික් විශාල ගල් ගෙයක් කරා යොමු විය. මේ ගල් ගෙයින් බාගයක් පැදි දියෙන් පිරි ගල් පොකුණකට ඉඩ ඇරී තිබිණ. ගල ඇතුළෙන් ගලා ආ දිය පාරකින් මේ පොකුණට දිය සැපයෙයි. හැන්ස් ද පෙමා ද පොකුණට නැමී දියට කට තබා තිරිසන් සතුන් මෙන් දිය බීවෝ ය.

පොකුණ අද්දරින් එළියට මග පෙන්වූ පෙමා ගල් කෙළවර බෑවුම් සහිත කපොල්ලකින් රිංගා ගියේ එකෙණෙහි නොපෙනී ගියේ ය. පෙමා ගලෙන් පහළට වැටෙන්ට ඇතැයි හැන්ස් බිය ගත්තේ ය. එහෙත් එතැනට පැමිණ බැලූ ඔහුට මග එතැනින් නැමී පහතට බැස කෙළවර ගල් ගෙට යොමුව ඇති බව පෙනී ගියේ ය. එයින් ඔබ්බට මගක් නො වී ය.

කහ සිවුරක් පොරවා ගත් මහලු භික්ෂුවක් එහි හුන්නේ ය. නිල්වන් දෙනෙත් හා හණ කෙඳි වැනි කෙහෙ ද ඇති පඬුවන් පැහැයෙන් යුත්, එහෙත් හැම අතින් ම වැද්දකු වූ හැන්ස් දුටු භික්ෂුව තැති ගත්තාක් මෙන් විය.

"කවුරු ද උඹ මේ කැටුව ආවෙ?" පෙමා ළං වී පිළිගැන් වූ මීපැණි කරුණාවෙන් පිළිගත් භික්ෂුව ශාන්ත ස්වරයකින් පෙමා විචාළේ ය.

"මේත් අපේ ගල් ගමේ කෙනෙක්," පෙමා සිනා සහිත ව පිළිතුරු දුන්නේ ය.

"ඔව්, මාත් ඒ ගල් ගෙයි ම තමා," හැන්ස් එය ස්ථිර කෙළේ ය.

"කතාවත් වැද්දන්ගෙ කතාව!"

භික්ෂුව උගත් කෙනකු වුවත් වැද්දන් කතා කරන මේ බහ තේරුම් ගැනීමට හෝ එසේ කතා කිරීමට හෝ අපහසුවක් උන් වහන්සේට නො වී ය. මේ වැදි වචනවලින් බොහොමයක් මුලදී බුද්ධ ධර්මය ලියා ඇති පාළි භාෂාවේ වචනවලට සමාන වෙයි. ඒ හැර බොහෝ කාලයක සිට මෙහි වසන මුන් වහන්සේ නොයෙක් වර වැද්දන් හමු ව කතා බස් කොට පළපුරුදුකම් ලබා ඇත.

කල්පනාවෙන් බර ව මුහුණ අත ගෑ මහලු භික්ෂුව පෙමාට කථා කොට, "මේ වගේ සුදු මිනිහකු උඹලා අතරට ආවේ කොහොම ද?"

"මේ හුදු හූරා බොහොම කලකට ඉහත අප අතරට ආවා. එතෙක් මෙතෙක් අප අතර ම ඉන්නවා."

කාරණය තේරුම ගත්තාක් මෙන් බැම නැගූ භික්ෂුව, "ඇයි උඹලා හිටගෙන ඉන්නෙ? ඉඳගනිමු," හිඳීමට තැනක් පෑවේ ය.

භික්ෂූන් වහන්සේට කීකරු ව එහි හිඳගත් ඔවුහු පුරුද්දට අනුව ඉණෙහි එල්ලා ගෙන තුබුණු වඳුරු සම් පසුම්බිය ගෙන එයින් ගත් කහට පොතුවිට සපන්නට වූහ.

මේ දුටු භික්ෂුව "මේ නම් නියම ම වැද්දෙක්," යයි හැන්ස් දෙස බලා සිනාසුණේ ය. අනතුරු ව පෙමා දෙසට හැරී, "දැන් ඉතින් උඹ කියාපන් ඇයි මේ ඇත්තා මෙහාට කැටුව ආවෙ කියලා?"

"හුදු හූරට ඕනැ උණා ඔබ වහන්සේ බලන්ට එන්ට."

"මා බලන්ට. මේ ඇත්තා කොහොම ද දන්නෙ මා මෙහි ඉන්නා වගක්?"

"වලියක් ද අපි මේ කඳු පාමුල කිට්ටුවට ආ වෙලාවක අහන්ට ලැබුණා ඔබ වහන්සේ පිරිත් කියන හඬ. එද පටන් හුදු හූරා ඔබ වහන්සේ දකින්ට එන්ට ම ආසා කළා මිස වෙන කිසි ම දේකින් සතුටු කරවන්ට බැරි උණා. ඉතින් අපි මේ ආවා."

භික්ෂූන් වහන්සේ සැක සහිත බැල්මක් හෙළූහ.

"ඔව්, ඒ කීම ඇත්ත," ඉවත හැරී ගලෙන් පහළට කෙළ පහරක් විදි හැන්ස් පෙමාගේ කතාව ස්ථිර කෙළේ ය.

"ලෝකයේ හැම දෙයක් ම අත හැරලා මේ වගේ තනියම ජීවත් වෙන මා වගේ වයස් ගත් කෙනකු දකින්ට ආසා කෙළේ මොකට ද?"

"ඒක හැම දෙනාට ම කරන්ට බැරි බොහොම අමාරු දෙයක්."

"දැන් ඉතින් මා දුටුවා නේ! බලාපොරොත්තු කඩ උණා වෙන්ටත් පුළුවනි මා හිතන්නෙ."

"අපොයි, නෑ," හැන්ස් කෙණෙහි පිළිතුරු දුන්නේ ය.

මේ තරුණයා තමන්ගේ වැඩිහිටියකුට මෙන් තමාට ගරු කරන බව සලකා ගත් භික්ෂුව, "පෙනුමට වැද්දකු උණාට ඊට වැදගත් තරමක් ඇත්තෙක්," යයි කියා සිනාසුණේ ය.

ටිකක් කල්පනා කළ භික්ෂුව "මෙහෙ එන්ට ඕනෑ කෙළේ නිකම් ආසාවට ම නෙමෙයි මා හිතනවා. මේ දුප්පත් වැද්දන්ට ලබාදෙන්ට බැරි දෙයක් ගැන ආසාවක්. කලක් තිස්සෙ වෙන් වෙලා හිටිය බාහිර ලෝකේ ගැන සම්බන්දෙ ගැන ආසාවක් යටි හිතේ බලපවත්වන්ට ඇති," යි කීවේ ය.

''ඒක එහෙම තමා,'' හේ කල්පනාවෙන් බර ව පිළිතුරු දුන්නේ ය.

මහලු භික්ෂුව කොන්ද කෙළින් තබා ගෙන නැගිට වට පිට බැලුවේ, ''මා ළඟ නැහැ නේ කෑමට දෙන්ට දෙයක්. ගමේ මිනිසුන් ගෙනත් දෙන දේකින් තමා මා යැපෙන්නෙ. දීකිරි ටිකකුත් බත් ටිකකුත් ඇති. මේ ගෙනා මීපැණිවලින් ටිකක් දමා ගත්ත ම රාජ බෝජනයක්,'' යයි කීවේ ය.

''කවුරුවත් ගෙනත් දුන්න කෑම ටික අප ගන්ට වටින්නෙ නෑ. අපට ඕනෑ තරමක් කෑම හොයා ගන්ට පුළුවනි,'' හැන්ස් කීවේ ය.

''මා සතුටු කරන්ට ටිකක් ගනිමුකො. දෙන්නාට ම ඇති-වෙන්ට තිබෙයි කියන්ට බෑ. ටිකක් ගනිමු.''

''හොඳයි, එහෙම නම් අපේ මේ වේලාපු මුව මස්වලින් ටිකක් ගන්නවා නම්?'' හැන්ස් යෝජනා කෙළේ ය.

භික්ෂුව අත ඔසවා පෑවේ, ''නැහැ, මා පුතා, මස් කෑම අපේ ආගම ධර්මයට එකඟ නෑ. කිසි ම මසක් මගෙ මේ තොලේ ගෑවිලා නෑ.''

භික්ෂුව පොල්කටු හැන්දකින් ගත් බත් හා දීකිරි ද කුඩා මැටි භාජනයකට බෙදා ඒ මත මී පැණි වත් කෙළේ හැන්ස් අතට දුන්නේ ය.

එයින් එක කටක් කෑ හැන්ස් තලු මැරුවේ ය. තොල ලෙව කෑවේ ය. ''මේවා අපූරු කෑම නේ,'' කී ඔහුගේ දෙනෙත කුඩා ළමයකුගේ මෙන් ප්‍රීතියෙන් පළල් විය.

හැන්ස් ආහාරය රස විඳින සැටි බලා සිටීම වයසක භික්ෂුවගේ ප්‍රීතියට කාරණයක් විය. කිරි පැණිවලින් බාගයක් කෑ ඔහු ඉතිරිවා පෙමා අතට දෙනු දැකීමෙන් භික්ෂුවගේ සතුට වඩාත් මහත් විය.

සපමින් සිටි කහට පොතු විට ඉවතට විසි කළ පෙමා තවත් වරක් කෙල ගසා මේ මිහිරි බොජුනට කට සුද්ද කර ගෙන භාජනයේ ඉතිරි ව තුබූ කිරි පැණි උගුරට දෙකට ගිල දැමුවේ, ''මේ වගේ කෑම මේ කැලෙන් අපටත් හොයා ගන්ට ඇත්නම් කොච්චර අගේ ද?'' කීවේ ය.

''හාමුදුරුවන්ට මතක ද හඳවල් බොහොමයකට ඉස්සර වලියක් ද මාත් අපේ අප්පොච්චිත් මෙහෙ ඇවිත් බෙත් වගයක් ඉල්ලාගෙන ගියා?'' පෙමා භික්ෂුව විචාළේ ය.

''ඔව්, මට මතක යි. ඉතින්!''

''ඒ එදා දීපු බෙහෙත් මේ හූරට තමයි ඇන්න ගියේ.''

හැන්ස් මවිතයෙන් බැම නැගුවේ ය.

''ඒ බේතෙන් එයා සුව උණා ද?''

''ඒ හුරා දූත් මේ ඇවිත් ඉන්නෙ. ඉතින් හොඳ වෙලා නැද්ද?'' හැම දෙනා ම මේ කතාවට සිනාසුණෝ ය.

''මෙයාට කොහොම ද ඒ වණ ඇති වුණේ?''

මේ ප්‍රශ්නයට පිළිතුරු දී ගත නො හැකි ව පෙමා තතනන්ට විය. තමා වුවමනාවට වඩා දුර ගොස් ඇති බව ඔහුට වැටහිණ. මේ කතාව කනේ වැටීමට තම පියා මෙහි නොසිටීම ගැන හේ සතුටු විය.

''දූන් අප ඒ ගැන කතා කරන්ට වුවමනා නැහැ, පෙමා'' මෙවිට හැන්ස් ඔහුගේ සහායට සිටියේ ය.

''ඔහොම ඉන්ඩ. මොකක් ද එද කීවෙ?'' භික්ෂුව මොහොතක් කල්පනා කෙළේ ය. ''ඔව් මට මතකයි. උඹලැ අප්පොච්චි එද කීවෙ වලහකුගෙන් තුවාල වෙලා කියලා. මෙහාට වරෙන් පුතා මට ඒ වණ කැලල බලන්ට. වෙදකම් කරන අපි කැමති යි ඒවයෙ ගුණාගුණ බලාගන්ට.''

හැන්ස් ළං විය. ඔහු දෙසට නැඹුරු ව බැලූ භික්ෂුව ''ඇයි ළමයා, මේ ඇඟ පුරා ම තුවාල කැලල් නේ. ඉතින් කොයි තුවාලෙට ද මගෙන් බෙහෙත් ගත්තෙ?'' විමසුවේ ය.

හැන්ස් ඒවා පෙන්නුවෙන් උරයේ වණ කැලල දෙස භික්ෂුව යම්තම්න් බැලුවේ ය. එහෙත් උන් වහන්සේගේ කුතුහලය ඇවිසුවේ කලවේ වූ වණ කැලල වී ය. අතේ ඇඟිලි තබා වණ කැලල මිරිකා බැලූ උන් වහන්සේට එහි ගැඹුරු බව මැන ගත හැකි විය. ''මේක යමක් ගැඹුරට ඇනුණ වණයක්. වලහකුට බැ මේ වගේ ගැඹුරට අනින්ට. උන් සපා කනවා. ඉරා දමනවා,'' යි පැවසූහ.

මෙසේ කී උන් වහන්සේ කතාවේ මුලදී වූ පෙමාගේ තැති ගැන්ම ගැන සිහි වී උන් අත තුබූ එක් ඊයක් අතට ගෙන පරීක්ෂා කොට පෙමා දෙස බැලූහ. ඒත් මෙවිට පෙමාගේ දෙනෙත පහත පෙනෙන දර්ශනය දෙසට යොමු වී තිබිණ.

''හොඳයි, කමක් නැහැ. ඒ ගැන අපි තව දුරට ප්‍රශ්න කරන්නේ නැහැ,'' යි අදහස් බර ස්වරයකින් උන් වහන්සේ පැවසූහ. එයින් පසු ව පහත භූමි දර්ශනය දෙස බැලීමට පෙමාට වුවමනා නො වී ය.

මෙවෙලේ හුන් පළින් නැගී සිටි හැන්ස්, ''දූන් ඉතින් අපට යන්ට වෙලාව. ඔබ වහන්සේ ටිකක් සැතපිලා විවේක ගන්ට

හොඳයි. ඒ අතර පෙමාත් මාත් බලන්නම් අප එද්දී දුටු බඹර වද වගයක් මී ගරා ගත හැකි ද කියා?'' හැන්ස් කීවේ ය.

''ඒ බඹර වද බැඳ ඇත්තේ ගල් බෑවුමේ කෙනෙකුට ළංවන්ට බැරි හරියක යි. මී කපන බොහෝ දෙනා ඇවිත් ඒවා කපන්ට කියා වැලේ බැහැලා හරි නොගිහින් ආපහු ගියා,'' භික්ෂූන් වහන්සේ කීහ.

''එත් අපි ටිකක් උත්සාහ කර බලමු; නේ ද පෙමා!'' යි කී හැන්ස්, ''අපට හිස් ලබු කැට දෙකක් ලැබුණොත් හොඳයි,'' කී ය.

''ඒක නම් අමාරු කාරියක් නෙමෙයි. ඒත් මේ ලබු කැට දෙක හිස් ව ම ආපහු ගෙනෙන්ටත් වෙයි. ඒ ගැන අඩමානයක් නැහැ,'' භික්ෂුව කී ය.

ඔවුන් ලබු කැට දෙකත් රැගෙන එතැනින් ගිය පසු දහවල් නින්දට වැටුණ භික්ෂූන් වහන්සේ දෙ පැයකට පමණ පසු ගි හඬක් වැනි කිසියම් හඬකින් අවදි වූහ. කන් දී සිටිය උන් වහන්සේට ඒ හඬ මී කපන්නවුන් වැලේ බහින විට කියන කවි බව තේරුම් ගත හැකි විය.

''මේ කොල්ලන් දෙන්නා මේ ගලෙන් පහළ තෙරක් නොපෙනෙන ප්‍රපාතයෙ වැටිලා කකුල් කඩාගන්ට තරමට නොසැලකිලි නැහැ, මං හිතනවා. මා ගිහින් බලන්ට ඕනෑ. මම උන් වළකන්ට ඕනෑ,'' යයි තමාට ම කියා ගත් උන් වහන්සේ හැරමිටියත් අතින් ගෙන එහි යාමට පිටත් වූවෝ ඒ දුෂ්කර පටු මාර්ගයේ දුක සේ ගොස් පළමු වන ගල් ගෙයට සමීප වූහ. එහි සිට ගල් කුළ මුදුනට ටික දුරක නැගීමකි. එහෙත් අවුරුදු බොහෝ ගණනක සිට එක තැනකට වී භාවනා කරමින් සිටි තැනැත්තකුට මේ දුෂ්කර ගමනක් වී ය.

ප්‍රපාතය දෙසට නැමී තුබුණ මහ ගසක ගැට ගසන ලද 'වැල්' රකිමින් පෙමා එහි සිටිනු උන් වහන්සේට දැකිය හැකි වී.

''කෝ තොපේ හූරා?'' උන් වහන්සේ පෙමාගෙන් විමසූහ.

''පහළ—වැලේ බැහැලා—ආන්න අර තැනට ගියොත් හොඳට පෙනේ වි.''

කුතුහලයෙන් බර වූ සිතින් හා වෙහෙසින් පීඩිත ගතින් ද යුතු වූ උන් වහන්සේ පෙමා කී තැනට ගියෝ එහි පහත බැලූහ. යාර සියයකට පමණ පහළින් වැලේ සිට එහා මෙහා පැදෙන හැන්ස් උන් වහන්සේගේ නෙතට හමු වී ය. ඒ දර්ශනය උන් වහන්සේ මූර්ජා කරවන තරම් වී ය. වහා දෙනෙත් ඉවතට ගත් භික්ෂූන් වහන්සේ පසෙකට වී හිඳ ගත්හ.

ටික වේලාවකට පසු ව උන් වහන්සේ නැවත ද එ දෙස බැලූහ. එතැන සිට බලන විට හැන්ස් කරන කියන හැම දෙයක් ම හොඳ හැටි පෙනේ.

අත පය නිදහසේ ක්‍රියා කරවීම සඳහා ඇඳ සිටි දිවි සම ඉවත් කර දමා සිටි හැන්ස් වැලේ එල්ලී සිටියේ මුළු නිරුවතිනි. එසේ ම ඔහු රැඳී සිටියේ දෙකට පැළූ මාවේවැල් හිරුවක අගට ගැට ගසනු ලැබූ කුඩා හරස් දඬුකඩක් මතෙහි වී ය. වේවැල එක් අතකින් අල්ලා ගෙන සිටි හේ අනික් අතින් ගත් මත්ලියක ආධාරයෙන් බඹර වදයෙන් මැස්සන් ඉතා සෙමින් ඉවත් කරමින් සිටියේ ය. නැවත හේ මැස්සන් ඉවත් කළ බඹර වදයේ කොටස් මත්ලීයේ ආධාරයෙන් කඩ කඩා ඉණ බැඳ ගෙන සිටි ලබු කැටයට දමන්නට වී ය. ඔහු වටා ගනාව හැසුරුණු බඹර මැසි පටලයක් විය. බඹර කපන්ට යන කොයි කැපුම්කාරයකු වුවත් දුම් පන්දමක් ගෙන බඹරයට ළං වීම සිරිතක් වුව ද මේ තරුණයා එවැනි කිසිවක් නැති ව මේ භයානක කාරියෙහි යෙදී සිටිනු දක්ම උන් වහන්සේගේ විස්මය දියුණු කර වී ය.

මේ තැනැත්තා දැන් උඩට නගින්නේ කෙසේ ද යි විමතියක් ද මෙවෙලේ උන් වහන්සේට ඇති විය. ඔහුට නැග ඒමට වැල් ඉණිමඟක් නො වී ය. මොහු මේ සිටින්නේ තනි වැල්පටක ය. උඩ සිටින පෙමාට ඔහු ඉහළ ඇද ඔසවා ගත නො හැකි බව ද පැහැදිලි ව ම පෙනේ.

භික්ෂූන් වහන්සේට මෙසේ සිතමින් වැඩි වේලාවක් ඉන්ට සිදු නො වී ය. ලබු ගෙඩිය ඉක්මනින් ම මී පැණියෙන් පිරිණ. හැන්ස් තම ඇතෙහි තැවරී තුබුණ පැණි එකින් එක ලෙව කා අවුල් කෙහෙයෙහි පිසද ගත්තේ ය. ඔහුගේ හැම ක්‍රියාවක් ම ඉතා ඉවසිලි සහිත ව කෙරුණේ විය. ඉන් පසු හේ පයේ ඇඟිලිවලින් හා දෙකලවායෙන් ද වැල හිර කර ගනිමින් අත් මාරු කර වැලේ ඉහළට නගින්ට විය. එක් තැනක වත් නොනැවතී පැද්දෙන වැලේ අඩියෙන් අඩිය ඉහළට නගින ඔහු දෙස භික්ෂූන් වහන්සේ විස්මයෙන් බලා සිටියේ යම් හෙයකින් අතක් ලිස්සා ගියොත් මේ ගැඹුරු ප්‍රපාතයේ ඇද වැටිය හැකි මොහුගේ කැබලිවත් ඉතිරි නො වේ ය යන විමතියෙනි.

මේ දර්ශනය බලා සිටිනු නොහැකි වූ භික්ෂුව කීප වරක් ම ඉවත බලා ගත් නමුත් නැවතත් බැලුවේ කොර වූ වඳුරකු මෙන් වැලේ ඉහළ බඩගාන හැන්ස් දුටුවේ ය. ඔහුගේ නැගීම ඉතා හෙමින් සිදු වූවක් විය. මසින් ලෙයින් සැදුණ ගතකට මෙතරම් වෙහෙසක් දැරිය හැකි ද? මොහුගේ මස් පිඩුවලට වේදනා නො වන්නේ ද? උන් වහන්සේ සිතූහ.



දූන් හැන්ස් පැමිණ සිටින්නේ පහළ වැටුණ වැල ගල් කෙළවර හා ගැටෙන තැනට ය. තව දුරටත් වැල දිගේ ඉහළ නැගීම ඔහුට කළ නො හැක. මෙහිදී හේ ගලේ එක් පැල්මකට පයක් තබා ඉහළින් වූ ගල් කෙළවරක් එක් අතක ඇඟිලිවලින් මිරිකා ගත්තේ එකෙණෙහි අනික් අත හා පය ද වැලෙන් ඉවත් කොට ගලට බර විය. භික්ෂූන් වහන්සේට මෙය තව දුරටත් බලා සිටිය නො හැක. උන් වහන්සේ එතැනින් ඉවත් වූහ.

ගල් තල්ලෙහි බඩ තබා දැත් හා දෙපාවලින් ගල බදාගත් හේ හෙමින් හෙමින් ඉහළට නැංගේ පෙමා දිගු කළ අතේ එල්ලී

ගල මතට පැන ගත්තේ ය. ඔහුගේ දෙපා වෙවුලමින් තිබිණ. ඊතල මුණකින් වැල කැපූ පෙමා ඔහුගේ ඉණ තුබූ පැණි පිරුණ ලබු ගෙඩිය වහා ඉවත් කෙළේ ය. හැන්ස් දෑත් දෙපා විදහා උඩුකුරු ව වැතිර ගත්තේ විඩා හැරියේ ය.

පැය බාගයක් පමණ වේලා මෙසේ සිටි හැන්ස් විඩා දුරු කර නැගිට ගත්තේ ය. දෙදෙනා එක් ව වියලි අඩමස් මී පැණියෙහි ඔබා කෑවෝ ය. මෙවෙලේ කතා කළ පෙමා "හමුදුරුවො මෙතනට ඇවිත් හූරා වැලේ නගින හැටි බලා හිටියා. දැන් නාවෙ මන්ද කියන්ට බෑ," කීවේ ය.

"අපි ගිහින් බලමු," හැන්ස් යෝජනා කෙළේ ය.

උන් වහන්සේ ක්ලාන්ත ව වැතිර උන්හ. හැන්ස් කොළ අතු ටිකක් කඩා පවන් සලන විට සිහිසන් ලැබූහ. නැගිට හිඳ ගත් උන් වහන්සේ තවමත් කර කැවෙන හිසට අතින් තට්ටු කර "මේ වගේ අවදානම් කාරියක් දකින්ඩ තවත් මම කැමති නෑ," කියා මුමුණන්ට වූහ.

"හාමුදුරුවො නාවා නම් තමා හොඳ," හැන්ස් කීවේ ය.

"ලබු කැටයක තරම මී පැණි ටිකක් නිසා මේ වගේ ජීවිතේට අවදානම් වැඩට යන්ට නරක යි."

"මේකෙ කිසි ම අවදානමක් නෑ. මේක මට හොඳට පුරුදු කාරියක්. තව පොඩියකින් මම යනවා අනික් ලබු ගෙඩියත් පුරවා ගෙන එන්ට," හැන්ස් කීවේ ය.

"එපා, එපා" යි ඔහු වැළකූ භික්ෂුව, "මට ගල් ගෙට යන්ට උදව් වෙන්ට. මට දැන් තනි ව යන්ට බැහැ," යි කී ය.

ඔහු දෙදෙනා භික්ෂුව කැඳවා ගෙන ගල් ගෙට ගියෝ ය. එහි හුඟ වේලාවක් විඩා හළ භික්ෂුව ඔවුන්ට කථා කරමින්, "අද මා මේ දුටුව මහා අවදානම් කාර්ය ඇත්තක් ය කියලා මට අදහන්ට බැහැ. මිනිසුන් වැල් ඉණිමගේ බැහැලා මී කොටනවා මා දැක තියනවා. ඒත් ඒ මිනිසුන් මේ නපුරු බඹර මැස්සන්ගෙන් බේරෙන්ට දුම් පන්දමක් කාරිය අරගෙන ම යි යන්නෙ. මේ අඳු කළ හැටියට කවුරුන් හරි කරන වගක් මා කවදවත් අහලා නැහැ."

"අපෙ හූරාට විතර ම යි ඔය හැටි කරන්ට හැක්කෙ," පෙමා උදම් අනන්ට විය.

"උඹලා ඒකට ඉඩ දෙනවා වැරදි යි," භික්ෂුව ඔහුට චෝදනා කෙළේ ය.

''අපෙ අප්පච්චි යි මා යි කොච්චර කිව්වා ද මෙහෙච් දේ කරන්ට එපා කියලා. කවුරු කිව්වත් අහන්නෙ නෑ. අපෙ හූරා හිතුණ හැටි තමා කරන්නෙ.''

''ඒක ඒ තරම දෙයක් නොමෙ යි; කෙනකුට පුරුදු උණා ම,'' හැන්ස් කීවේ ය.

''බඹරු ඇන්නේ නැද්ද?''

''එහෙන් මෙහෙන් එකෙක් දෙන්නෙක් ඇන්නා. උන්ගෙ විත් පෙමා ගළවා දැමුවා.''

''දැන් ඉතින් අපට යන්ට වෙලාව පෙමා,'' කියමින් හැන්ස් තම ආයුධ අතට ගත්තේ ය.

''දැන් හවස් උණා වැඩියි. රෑ මෙහි ඉඳලා උදේ යමු,'' භික්ෂූන් වහන්සේ බල කර සිටියාහ.

තමාට ලැබුණ මී පැණි මාස ගණනකට සෑහේ යයි කී භික්ෂුව ඔවුන්ට තමාගේ ආහාර තවත් දුන්නේ ය.

''අපි ගල උඩ හිටියදි කෑවා. අපට බඩගිනි නෑ; නේ ද පෙමා?'' හැන්ස් කීවේ ය.

පෙමා රාමතෙල් නැගුවේ ය.

''ඔව්, මට ජේනවා,'' යයි කී භික්ෂුව, මඳ සිනාවක් පහළ කෙළේ ය.

මැදයම් රැයේ ගල කෙළවර වූ පොකුණෙහි කිසියම් සතකු දිය තලුගහන හඬ ඇසූ පෙමා හැන්ස්ට කොඳුරා කිසිවක් කීවේ ය.

උන්ගේ බහ කන වැකුණ භික්ෂුව, ''ආ, උන් ගණන් ගන්ට එපා. මේ පායන දවස්වල වලසුන් දිවියන් නිතර එනවා මෙතැන දිය බොන්ට,'' භික්ෂුව කීවේ ය.

''ඉතින් බය නැතුව කොහොම ද තනි ව ම ඉන්නෙ මේ ගල් ගෙයි?'' හැන්ස් විමසුවේ ය.

''උන්ගෙන් මට කිසි හානියක් නෑ. උන් හීන් සැරේ ඇවිත් දිය බීලා යන්ට යනවා.''

ඔවුන් දෙදෙනා උදයේ ආපසු යන්ට පිටත් වන විට හැන්ස්ට කථා කළ භික්ෂුව, ''ආයෙ එන්ට ඕනෑ,'' යි කී ය.

''ඔව්, මම එනවා,'' හැන්ස් පිළිතුරු දුන්නේ ය.

ගමනක් ගොස් ආවකු විඩා හැර තමා ම පළමු ව කතා කරන තෙක් ප්‍රශ්න නො කිරීම වැද්දන්ගේ සිරිතකි. පෙමා හා හැන්ස් ද ගල් ගෙට පැමිණියේ රෑ බෝ වී හෙයින් පසු ද උදයේ ඔවුන්ට

කතා කළ රන්දූනා "හිතුවාට වඩා වැඩි දිනක් ගමනට ගත වුණා නො වේ ද" යි විමසී ය.

"ඒ හාමුදුරුවො බොහො ම හොඳ කෙනෙක්. අපට එන්ට නොදී රෑ එහි රඳවා ගත්තා," හැන්ස් කීවේ ය.

මෙහිදී කතාව උදුරා ගත් පෙමා හාමුදුරුවන්ගෙන් ලැබුණු රසවත් කිරිපැණිවල හැටි, ඔවුන් හාමුදුරුවන්ට මී පැණි ලබා දුන් හැටි, හැන්ස් වැලේ බැස බඹර කැපූ හැටි, ඒ බලා සිටි භික්ෂුව ක්ලාන්ත වූ සැටි විස්තර කෙළේ ය. රන්දූනා හා රතී ද හැන්ස් කෙරෙහි අමුතු ආදරයකින් විස්තරය අසා සිටියහ.

දීයා මෙවිට එහි පැමිණියා ය. ඈ බොහෝ වෙහෙසට පත් ගතියකින් හෙමින් හෙමින් පැමිණියෙන් මොකක් නමුත් වරදක් ඇති වී තිබෙන බව හැන්ස්ට වටහා ගත හැකි විය. එසේ ආ දීයා වෙහෙස ලෙස හැන්ස් ළඟ වැතිර ගත්තා ය.

"උඹ ඊයෙ රෑ මොන සතකු ද මැරුවෙ?" කියමින් හේ දිවියා අත ගෑවේ ඇගේ තෙත් ගතියක් දැනුණේ ය. ඇඟ ලෙයෙන් තෙත් වී තිබිණ. වඩා හොඳින් පරීක්ෂා කර බැලූ ඔහුට ඇගේ තුවාළ බොහෝ ගණනක් ඇති බව ද එයින් ඇළපතේ වූ දිග පැල්ම පපුවත් යටිබඩත් පසා කර ගෙන යන තරමට වූ ලොකු එකක් බව ද පෙනී ගියේ ය.

මොන සතකුගෙන් මෙතරම් තුවාල ඇති විය හැකි දැයි ඔවුහු සැක කළහ. දීයා සාමාන්‍යයෙන් සීරීම් තුවාලයක් පවා නො ලබා ලොකු සතුන් දඩයම් කිරීමට සමතෙකි. තුවාලවල හොඳින් අළු තැවරූ හැන්ස් ඌට නිදගන්ට සලසා බීමට දිය ළඟට ගෙනැවිත් දුන්නේ ය.

දවල් දවස මුළුල්ලේ ගල් ගෙයි වැතිරී සිටි දීයා හොඳටම හවස් වී නැගිට ගල්ගෙන් පිටට ගැටුවා ය. හැන්ස් ද වැද්දෝ ද පස්සේ ගියෝ ය. දීයා යන්නේ ඊයේ රෑ මැරූ සතා වෙතට බව දත් හෙයිනි.

එක් වියලි දෙළ පහරක එක් පළල් පෙදෙසක් තුළ සටන සිදු වී තිබෙන බව ඔවුන්ට පෙනී ගියේ ය. එතැන තැළී පොඩි වී තුබුණ හැටියට ටික වේලාවක් කෙරුණ සුළු සටනක් නොව බොහෝ වේලා පැවතුණ දරුණු සටනක ලකුණු පෙනෙන්ට තිබිණ.

වනයේ ඉතා ම නිර්භීත සතා වූ හොඳට වැඩුණ කිනිසි වැනි තියුණු දිග දළ ඇති මහ වල් ඌරකුගේ මළ සිරුර එහි වැටී තිබිණ. උගේ ගෙල සපා තුවාල කර තුබුණ අතර බඩ පළා

දමා තිබිණ. උගේ සම පළා දැමීමට අමාරු තරමට ඝන ව වැඩුණ එකක් වී ය. වරක් දීයා ඌරාගේ ගෙලට පැන කටින් ඩැහැගෙන, දැත් දෙපාවල නිය අවුළුවා තර ව අල්ලා ගත් විට තමාගේ හුස්ම ටික ගියත් සතා මරා මිස නැවත අත නාරියි. වැව අසල සිටිය දී වරක් දිවියකුට පහර දුන් ඊරිය මෙහිදී ඔහුගේ සිහියට ආවේ ය.

"මේ වගේ ඌරකු මරා ගන්ට දීයාට කොයි තරම ශක්තියක් ඇද්ද?" මෙහිදී රන්දූනා කීවේ ය.

සටනෙන් ඇති වූ අධික වෙහෙස නිසා දීයා මළ ඌරාගෙන් කිසිවකුත් නොකා විඩා හැරීමට ගල් ගෙට ගොස් තිබිණ. සතකු මැරූ විට දිවියා හැම විට ම ගන්නා පළමු ආහාරය වන අකුණු බඩහතින් ඔවුහු දීයා කැවූවෝ ය. ඉන් පසු ඌරාගේ හිස වෙන් කොට ඉතිරි කොටස තඩයක ලා කර තබා ගෙන ගියෝ ය. ඒ ඔවුන්ට කර ගසා ගෙන යා හැකි තරම විය. ඔවුහු ඌරාගෙන් සුළු කොටසක් තමන්ගේ ප්‍රයෝජනයට ගෙන ඉතිරි කොටස දීයා කැමති විටක පැමිණ සප්පායම් වීමට ගල් ගෙට නුදුරු තැනක වූ ගලක් මත දැමූවෝ ය. හැන්ස් දීයාට සාත්තු සප්පායම් කෙළේ ය. දෙසතියකින් පසු ව දීයා නැවත දඩයමේ යාමට තරම සම්පූර්ණ සුවය ලැබුවා ය.

# 14

# රතී

රන්දූනාගේ පවුලට ඇතුළු වී සිටින සුදු වැද්ද පිළිබඳ පුවත ඔවුන්ගේ වරුගයේ අනික් වැද්දන් අතර පැතිර ගියේ ය. තම වරුගයේ මිනිසුන් ගෙන් පමණක් සැදුණ ස්වාධීන මිනිස් කොටසක් වූ මේ වැද්දෝ උනුන් අතර සාමයෙන් වනයේ ජීවත් වීමට කැමති වූවෝ අමුත්තා ගැන විරුද්ධත්වයක් නො දැක්වූහ. එහෙත් මේ සුදු මිනිහා පවුලේ ම හූරකු වශයෙන් ජීවත්වන්ට යතොත් ඒ අනිත් වැද්දන්ගේ තැති ගැන්මට හේතුවකි. එහෙත් එවැනි සලකුණක් ඔවුහු නො පෙන්වූහ. මේ වැද්දන් ඉඳ හිට හමු වූ නමුත් නිකරුණේ කෙරෙන කතාවලට

කාලය ගත කිරීමට නොකැමති මිනිසුන් කොටසක් වූ හෙයින් වැඩි කතා නැති ව වෙන් ව ගියෝ ය.

එක් දවසක ගොයින් දඩයම සඳහා රන්දූනා පෙමා හා හැන්ස් ද ගොයින් රුක් සිදුරු හුඹස් බෙන ආදියෙන් මැත් ව වෙයන් හා දළියන් වැනි අනෙක් කුරුමිණි සතුන් ද සොයා එළිබසිත වේලාව වූ මද්දහන් වේලේ පිටත් වූහ. ඔවුහු තමන්ගේ ගල් ගෙයින් බොහෝ දුරක් ගිය පසු ඉදිරියට ආ අනික් වැද්දන් දෙදෙනකු දුටුවෝ ය. මොවුහු මෙවිට කතාවකට සූදානම් බවක් පෙන්වා සිටියහ. ටික වේලාවක් එතැන එක් ව සිටීමෙන් පසු ව රන්දූනාගේ වයසට තර ම වයස් වූ අනික් වැද්ද ඔවුන්ට කතා කොට නුදුරෙන් ඇති තමන්ගේ ගල් ගෙට එන මෙන් ආරාධනයක් කෙළේ ය.

එහි ගිය ඔවුන්ට දකින්ට ලැබුණේ හොඳට ඉඩ කඩ ඇති ලොකු ගල් ගෙයකි. මෙහි පවුල් පහක සෙනඟ පදිංචි ව සිටියහ. මෙහි මේ එක එක පවුලට වෙන වෙන ම කොටස් ඇති විය. මෙහි සිටි ගැහැනුන් හා ළමයින් මෙන් ම සමහර පිරිමි වැද්දන් ද සුදට හුරු සමක් හා නිල්වන් ඇස් ද කහ පැහැති කෙහෙ ද ඇති උස අමුත්තා වැන්නකු දැක නොපුරුදු හෙයින් ඒ හැම දෙනාගේ ම ඇස් හැන්ස් කෙරෙහි වී ය.

ඔවුන් එහි පැමිණ හිඳ ගෙන ආ ගිය විත්ති කතා කිරීමෙන් පසු ව වැඩිහිටි වැද්දෝ දෙදෙන එකිනෙකාට ළං ව හිඳ ගෙන පහත් හඬින් යම් දෙයක් ගැන සාකච්ඡා කළෝ ය. සාකච්ඡාව කවරක් ගැන වුවත් එය ඉක්මනින් ම කෙළවර විය. ඒ සමග ම නැඟිට සිටි රන්දූනා ''අප ගොයින් බඳන්ට යනවා නම් තවත් මෙහෙ පරක්කු නො වී යන්ට ඕනෑ,'' යයි ගමනට පිටත් විය.

එද දඩයමේ ගිය ඔවුහු ගොයින් හතර දෙනකු මරා දෙදෙනකු එහි ම සිට පුලුස්සා ගෙන කෑවෝ ය. ඉතිරි දෙදෙනාත් රැගෙන ගල් ගෙට ගිය ඔවුන්ට අල ටිකක් හාරා ගෙන අවුත් බලා සිටි රනී හමු විය.

එදට පසුව ද සිට මේ වැදි ගෙදර පියාත් දුවත් අතර නොමනාප ගතියක් පැවතීගන යන බව හැන්ස් දුටුවේ ය. හැන්ස් මෙහි පැමිණි ද සිට ඔහු දැක පුරුදු පියකරු කෙළි ලොල් සතුටු මුහුණ රනී කෙරෙන් ඉවත් ව ගොස් තිබිණ.

ඔවුන් අනික් වැද්දගේ ගල් ගෙට ගොස් පැමිණි සතියකට පසු එද එහිදී හමු වූ තරුණ වැද්දෙක් මරා ගත් මීවින්නකු හා ගස් පොතු දෙකක් අතර තබා බැඳ ගත් මීවදයක් ද රැගෙන එහි පැමිණ කළමනා ගරු සැලකිලි සහිත ව රන්දූනා ළඟ තැබී ය. රන්දූනා කළ සංඥාවකින් එහි පැමිණි රනී මෙකී කළමනා ගෙන ගොස් කෑම පිළිවෙළ කිරීමට පටන් ගත්තා ය.

ඔවුන් අතර වැඩි කතාවක් ඇති නොවුණා සේ ම ‍තෙරුණ කතාව ද සාමාන්‍ය එකක් විය. එහෙත් අමුතු තරුණයා රනී දෙස වරින් වර හෙළූ ඇස් කොන් බැල්ම හැන්ස්ට කාරණය පැහැදිලි කෙළේ ය. කෑම පිළිවෙළ වූවායින් පසු ව රනී මුලින් ම මොහුට කෑම පිළිගැන්වීමෙන් හැන්ස්ගේ සිතිවිල්ල තවත් තහවුරු විය. මින් ඉහත රනී මුලින් කෑම බෙදුවේ හැන්ස්ට ය. සමහර විටක අමුත්තකුට කරන සැලකිල්ලක් හැටියට අද මෙසේ කරන්ට ඇතැයි තවත් වරක හැන්ස් සිතුවේ ය. රනී එද කිසිවක් නො කෑවා ය. එද ඇගේ මුහුණ හැඟීම් විරහිත එකක් ව තිබිණ.

බතෙන් පසු ව ගමනට සමුගෙන පිටත් වූ තරුණයා ගල් ගෙයින් පිට වී ටික දුරක් ගොස් බියෙන් තැති ගත්තකු මෙන් ආපසු හැරී දිවැවිත් රන්දුනා පසු පසින් සිටියේ ය.

මොහු වලසකු විසින් ලුහුබඳිනු ලැබුවේ වනැ යි සැක කළ හැන්ස් හා පෙමා ද තම තමන්ගේ ආයුධ අතින් ගෙන මගට පැන්නෝ ගල් ගෙට එමින් සිටි කළු දීයා දුටුවෝ ය. ආගන්තුක තරුණයා හැර අනික් හැම දෙන ම සිනාසුණාහ. හෙමින් පැමිණ ගල් ගෙට ගොඩ නැගුණ දීයා හැන්ස් ළඟට පැමිණ බළලකු මෙන් ඔහුගේ පා ළඟ දවටුණ සැටි දුටු තරුණයාගේ ඇස් ගෙඩි මහත් ව පුදුමය පළ කළ සැටි දුටු සෙස්සවුන්ගේ විනෝදය වඩාත් මහත් විය. තරුණ වැද්දකු වූ එතෙම තමා සිනාවට ලක් වීම ගැන මනාප නො වූයේ ය. වඩාත් ඔහුගේ සිතට වේදනා ඇති වූයේ තමාට වූ ගැහැට රනී ලොකු විනෝදයක් කොට සිනාසීම විය. තරුණයා ඉක්මන් කර ගල් ගෙයින් පිට වී ගියේ ය.

පසු දින එක් ව දඩයමේ ගිය පෙමාගෙන් හැන්ස් මේ ගැන විමසුවේ ය.

"මොකක් ද පෙමා ඊයෙ අර ගැටයා ආපු කටයුත්ත?"

පෙමා සිනා සුණේ ය. "ඒ ඇත්තා හොඳට ම බය ගත්තා නේ!"

"ඒක නෙමෙයි මා ඇහුවෙ? මොකට ද අර දඩයමක් කර ගෙන ආවෙ? ඇයි අපට බැරි ද අපේ දඩයම් කරගන්ට?"

"ඒ අපෙ අප්පොච්චිගෙ නගාගෙ පුතා. අර අප ගිය ගල් ගෙයි වැදිරාළ තමා අප්පා. ඒ හූරාට රනී සහේ දෙන්ට නම නියම කර ගත්තා. ඒ ගෙනාවෙ සිරිතට ගෙනෙන කදමල්ල. ඒ ඇත්තා අනික් දවසේ ආවා ම ඈ කැටුව යනවා."

"අපට එහෙනං රනී නැති ව යනවා," හැන්ස් දුක් විය.

"ඒක එහෙම වෙයි. අප්පච්චිට ම තමා වැඩියෙ දුක. ඒ මොක ද? අප්පච්චි ඔය පෙන්නනවාට වැඩියෙ බොහො ම ආදරෙයි රනීට. කවදා හරි දූරිච්චියන් සහේ දෙන්වත් එපා යැ. මටත් එකියක ලැබෙයි ළඟදි. අර එදා ඒ ගල් ගෙයි හිටිය ඇස් ලොකු කඩවසම් කෙල්ල—දක්කානේ මේ ආපු ගැටයාගෙ නගා?"

"එතකොට උඹලැ අප්පච්චි තනි වේවි, නේ!"

"නැහැ, මගෙ පවුල යි මා යි අප්පච්චි එක්ක ඉන්නවා, රනීලාත් පස්සෙ මෙහාට ඒවි."

මේ කතාවෙන් පසු ව ඔවුහු තවත් කතා නැති ව දඩයමේ යෙදුණෝ ය.

ඔවුන් ආපසු ගල් ගෙට එන විට රන්දුනා කෝපයෙන් බණිමින් ද රනී ඇඬූ කඳුලෙන් ද සිටියෝ ය. රන්දුනා රනීට බැට දී තිබෙණ බව ඇගේ මුහුණේ සීරීම්වලින් හා පිටේ නැග තිබුණ වැච්චිවලින් ද සලකා ගත හැකි විය.

එතැන් සිට ඉදිරි දින කීපය ගල් ගෙයි කිසිවකුගේත් සතුටට හේතු නො වී ය. මෙතෙක් සතුටෙන් හා සාමයෙන් පසු වූ මේ පවුල මත අඳුරු වලාකුළක් පහත් ව තිබිණ. රනී කැඳවා ගෙන යාමට පෙම්වතාගේ පැමිණීම විය යුතු දිනට එළි වී ගල් ගෙයි වැද්දන් අවදි වී බලන විට රනී එහි නො සිටියා ය. ගල් ගේ අවට අඬ ගා ඇවිද ගිය ඔවුන්ට ඇගෙන් පිළිතුරු හඬක් අසන්ට නො ලැබුණේ ය. ඔවුන් වහා වනයේ එහා මෙහා දුවමින් සෙවූ නමුත් එයින් ද කිසි පලක් නො වී ය.

රන්දුනා කෝපයෙන් අයිනකට වී සිටියේ ය. තමන්ගේ ම දියණිය තමන්ට කීකරු කර ගන්ට නො හැකි වීම ගැන දැන ගන්ට ලැබුණ අනික් වැද්දන්ගේ සිනාවට ඔහු භාජන වෙයි. රන්දුනා තමන්ගේ චරිතයේ ඇති තද ගතිය නිසා රැහෙන් වෙන් වී තනි ව වසන වැද්දෙකි. රනී පතා ගෙන පැමිණි තරුණයා පිළිගැනීමක් නො වූයෙන් දුකින් තැවුණ හේ ආපසු යන්ට ගියේ ය.

දින ගණනක් යන තෙක් මේ ගල් ගෙයි වැද්දන් මෙන් ම අනික් වැද්දන් ද රනී සෙවූ මුත් ඈ ගැන කිසි ම ලකුණක් සොයා ගනු නො හැකි විය. හැන්ස් තනි ව වනයේ ඇවිදිමින් ඇගේ නම හඬ ගාමින් වනයේ ඇවිද්ද නමුත් ඈ ගැන කිසි ම සලකුණක් සොයා ගත නො හැකි වූයේ හතර දිනකට පසු ගල් ගෙට පැමිණියේ ය. මහ වනය රනී ගිල ගත්තාක් මෙන් පෙනිණි.

දෙසතියක් මුළුල්ලේ දන්නා හැම උත්සාහයක් ම ගෙන රනී සෙවූ මුත් කිසි පලක් නො වූයෙන් ඈ වනයේ කිසියම් සතකු අතින් විනාශ වන්ට ඇතැයි හෝ ඈ තමා ම දිවි නසා ගන්ට ඇතැයි හෝ ඔවුහු සිතා ගත්හ.

මාස ගණනක් පසු විය. වැද්දෝ පරණ පුරුදු ජීවිතයට බැස ගත්හ. එහෙත් ඔවුන් අතර ජීවිතය පෙර මෙන් සතුට ගෙන දුන් එකක් නො වී ය. ඔවුන් එකිනෙකා සමග කළ කතා බහක් නො වී ය. දඩයමේ ගොස් එන විට අවට වනයෙන් අල ටිකක් කොළ ටිකක්, මී වදයක් ගෙනත් තබා ගෙන ඔවුන් පිළිගැනීමට බලා සිටින රනී ගල් ගෙයි නො වූවා ය.

රන්දූනා කතා බහක් නැති ව පසෙකට වී බුම්මා ගෙන උන්නේ ය. හේ ඉදහිට බහක් දෙඩුවත් කිසි විටෙකත් සිනාසුණේ නැත. හැන්ස්ගේ සිත ද දුකින් බර විය. එදා දිය වළ ළඟදී රනී මුලින් ම දුටු දිනය ඔහුට අමතක නො වේ. ඇගේ පියා තමාගේ ගෙල මිරිකා මරන්ට තැත් කළ වේලේ ඈ තමා බේරාගත් සැටි, තමාට සාත්තු කළ හැටි හේ නැවත නැවතත් සිහි කෙළේ ය. ඇගේ කල්පනාකාරී බව ඇගේ ගුණවත්කම ඇගේ සැලකිලි ඔහුට නිතර සිහි වෙයි. ඇගෙන් තමාට සිදු වූ විශාල සේවය ඔහුට හොඳ හැටි පෙනී යන්නේ මෙවිට ය.

පෙමා ඉක්මනින් ම හිත හදා ගත්තේ ය. සමහර විට ළඟ එන තමාගේ විවාහය ගැන සිතීමෙන් විය හැකි ය. ඇගෙන් හිස් වූ තැන තමා නිසා එන බිරිඳගෙන් පිරෙන බව ඔහු සිතා ගත්තා විය හැක. වන ජීවිතයේ සිදුවන මරණ ගැන දන්නා රන්දූනාට ද රනී ඉක්මනින් අමතක ව ගියා සේ පෙනිණ. එහෙත් හැන්ස් හැම හැන්දෑවක ම තමන්ගේ මවුපියන් ගැන ද යහළුවා වූ ෆ්‍රිට්ස් ගැන ද එමෙන් ම රනී ගැන ද දෙවියන්ට යාච්ඤා කෙළේ ය.

සති ඉක්මනින් ගෙවී ගියේ ය. දූන් වනයේ ගස්වල පලු වීර මොර කෝන් ඉදෙන සමය වී ය. මෙවායේ මල් සුවඳින් මීවද සුවඳවත් වී තිබිණ. වැද්දන් තමන්ගේ ගල් ගෙවල් අතහැර කඳුබිම්වල ඇවිද ආහාර සපයා ගන්නා කාලය මෙය විය.

මොවුහු ගල් ගෙය හැර ගමනට පිටත් වූහ. හැන්ස් බිම්බි කරින් ගෙන දීයා ද කැටුව ගියේ ය. දීයා හැම විට ම රාත්‍රියේ දඩයම් සඳහා පිටත් ව යන්නී, එළිය වැටෙන විට ඔවුන් නැවතී සිටි තැනට එන්නී ය. දීයාගේ ඒම ප්‍රමාද වුවොත් ඈ එන තෙක් ඔවුහු එහි රැඳී සිටියහ. ඈ කරන දඩයම් ඔවුන් බෙදා ගන්නා හෙයිනි.

තද ඉඩවරය පැවති මේ කාලයේ ඔවුහු දිනකට සැතපුම් පහකටත් අටකටත් අතර දුරක් ගෙවමින් පැරණි දඩ මං දිගේ

තමන්ට පුරුදු එක් දිය කඩක සිට අනික් දිය කඩක් දක්වා හෙමින් ගමන් කළෝ ය. මී පැණි හෝ පලවැල හෝ ලැබුණු තැන්වල නැතහොත් සිඳී ගිය ඇළ දොළවල ඉතිරි වූ දියකඩවලින් කුඩා මසුන් අල්ලා ගත හැකි වූ තැන්වල ඔවුහු නැවති නැවතී ගමනේ යෙදුණෝ ය. කැලයෙන් වැසුණු ගල් කුළු මුදුන්වලට නැග ගත් ඔවුහු සතුන්ට බැස ගිය හැකි එක මග කොටු අත්තක එකකු—බොහෝ විට හැන්ස් හෝ රන්දුනා—සිටුවා අනික් දෙනා බල්ලනුත් රැගෙන ගෝනුන් එළවීමට කැලෑ ගැසුවෝ ය.

ඔවුහු දැන් පහත තැනි බිමෙන් බොහෝ දුර ව උස් කඳු බිමේ වූහ. බඹරුන් බහුල ව බැස වද බඳින්නේත් වඳුරන් බහුල ව සිටින්නේත් මේ අඩවියේ වෙයි. එසේ ම මේ ඉදුණු මොර ගෙඩි ඇති කාලය හෙයින් මෙහි වලස්සු මොරගස්වලට නැග අතු නමා සූරමින් මොරගෙඩි ගිල දමති. මෙහි හැම තැනක ම වලසුන් සිටින ලකුණු පෙනෙන්ට තුබුණු නමුත් වලසා ද මිනිහා ද එකිනෙකාගෙන් මග හැර යති.

පෙමා ගලක් මුවහවේ සිට හදිසියේ ඉදිරියට හමු වූ මොවුන්ගෙන් එකකු අතින් පහර ලබන්ට ගොස් හීන් ගසකට නැග ගැනීමෙන් යම් තම් බේරී ගත්තේ ය.

මෙයින් කෝපයට පත් ව සිටි පෙමා වලසකු ගිය අඩි සටහන් දැක මේ ගමන නම් මේ නීච බල්ලන්ගෙන් එකකු හදි ගැහුණොත් මම විද අරිනවා ඊයක් ආයෙ උතුර නො හොල්ලන්ඩ,'' යයි දිවුරුවේ ය.

පෙමාගේ දිවුරුමට පිළිතුරක් වශයෙන් මෙන් මෙවේලේ ම ඉදිරියෙන් වූ ගසක අත්තක් කඩන හඬ ඔවුන්ට ඇසුණේ ය. හැන්ස් දෙස බැලූ පෙමා එදෙසට ඉස්සර විය. හැන්ස් ද ඔහු අනුව ගිය අතර රන්දුනා හෙමින් පස්සේ ගැටුවේ ය. තවත් වරක් ඇසුණු අතු බිඳින හඬ අනුව ඉදිරියට ගිය ඔවුන්ට ඉදුණු ගෙඩිවලින් බර වූ මොරගස් රාශියක් ඇති ගස් ගොමුවක් හමු වී ය. හඬ නැගී ආවේ ගස් අතර මැද වූ උස ම ගසකින් බව පෙනිණ. එහි ළං වූ පෙමා එහෙන් මෙහෙන් එබිකම් කර බැලුවේ අඳුරු සේයාවක් යම්තමින් දුටුවේ ය. වහා ඊයක් ගෙන දුන්නට නගා ගත් ඔහු එල්ලය බලා විද හරින්ට තැත් කරන විට ම පිටුපසින් ගොස් ළං වූ හැන්ස් ඔහුගේ අතට ගැසුවේ ය. ඊය ලක වැරදී වෙනතක ගියේ ය.

පෙමා කෝපයෙන් හැන්ස් දෙසට හැරී, ''ඇයි එහෙම කෙළේ?'' තර්ජනාත්මක ව විමසුවේ ය.

''ආයෙ හොඳට බලාපන්. ඒ වලහෙක් නො වෙයි,'' කියන විට ම මිනිසුන්ගේ කට හඬින් කලබල වූ ගසේ සිටි තැනැත්තා

හුන් තැනින් අනික් තැනකට මාරු වූයෙන් බිම සිටියවුන්ට වඩා හොඳින් බලා ගත හැකි විය.

මෙවිට රන්දූනා ද එහි පැමිණ හැම දෙනා එක් ව එබී එබී බැලුවෝ ය.

"ඒ කවුද මිනිහෙක්. මොර හූරා කනවා. හූරා අතට ගැහුවා හොඳයි," රන්දූනා කීවේ ය.

ගල් ගෙඩිවලින් වට ව තුබූ ඒ උස ගහ මුලට ඔවුහු ගියෝ ය.

"කවුද ගහේ ඉන්නෙ?" ගසේ මුවහ වී සිටි ඇත්තාට රන්දූනා කෑ ගැවේ ය.

පිළිතුරක් නො වී ය. "උඹ කවු ද?" හේ නැවත ද ඇසූ නමුත් පිළිතුරක් නො ලැබිණ. තුන්වන වරටත් මෙසේ කෑ ගසා පිළිතුරක් නො ලැබූ රන්දූනා කෝපයෙන් "ඔය ගහේ ඉන්නා කවු ද? කතා නොකළොත් ඊයක් විදිනවා කඳ පළා ගෙන යන්ට," යි කෑ ගැවේ ය.

"ඉතින් විදපන්," යි හොඳට පුරුදු කට හඬකින් කියවෙනු ඇසිණ.

"අපේ කෙලී," රන්දූනාත් පෙමාත් එකවර කීවෝ ය. මුලින් දුටු කෙණෙහි ම හැන්ස් ඇ හැඳින සිටියේ ය.

"රනී බිමට බැහැපන්, මේ උඹේ අප්පොච්චි යි අයියා යි මෙහෙ ඇවිත් ඉන්නවා," හැන්ස් කීවේ ය.

"මම බහින්නෙ නෑ. මා මෙහෙ ඉන්ට ඇරලා උඹලා ඔක්කොම පලයල්ලා," ඕ කියා සිටියා ය.

ඔවුහු මවිත ව එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. මේ ඔවුන් බලාපොරොත්තු නොවූ දෙයකි. බිමට බසින සේ ඇ පෙළඹවීමට ඔවුහු එකිනෙකා උත්සාහ ගත්තෝ ය. එහෙත් ඕ නො බසින්ට ම සිතා සිටියා ය.

"උඹ බිමට නොබහිනවා නම් මම එනවා ගහ දිගේ උඹ අල්ලා ගන්ට," අත තැබූ ආයුධ ඉවත දැමූ රන්දූනා ඇට තරවටු කෙළේ ය.

"උඹ ආවොත් මම අර ගලෙන් පහළට පනිනවා," කිසි ම පැකිලීමක් නැති ව ඕ කියා සිටියා ය.

මේ මාස ගණනකට පසුවත් ඇ එම කෝපයෙන් ම සිටින සැටි ඔවුහු තේරුම් ගත්හ.

"බලන්ට බැරියැ මෙකිගෙ මුරණ්ඩුකම. ඕකි මෙහාට ගත්තා නම් මම දන්නවා කරන දේ. ඇ කොහාට පැන්නත් මට කමක් නෑ; මම නගිනවා ගහට," රන්දූනා කෝපයෙන් කී ය.

හැන්ස් ඔහුගේ උරයට අතක් තබා ඔහු නැවතුවේ ය. ''එපා, ගහට නැංගොත් රනී කීවා වගේ ම පනීවි. මම ඇට කාරණා කියලා බලන්නම්.''

''රනී, ඇයි බීමට බහින්ට බැහැ කියන්නෙ?'' හේ ඇ විමසුවේ ය.

''ඒක අහගන්ඩ ඕනැ අපේ අප්පොච්චිගෙන්,'' ඕ කීවා ය.

හැන්ස් රන්දුනා මුහුණ බැලුවේ ය.

''මං කැමතියි ඒකි මගෙ බෑනට සහේ දෙන්න. ඒක කෙරෙන්ඩ ඕනෑ.''

''ඒ කටයුත්ත කෙරෙන්නෙ නෑ,'' හැන්ස් කී ය.

''ඇයි නැත්තෙ?'' රන්දුනා එරෙහි විය.

''ඇයි, ඒ ගැන ඇට බල කළොත් ඈ ගලෙන් පැන දිවි නහ ගනියි.''

මහලු වැද්ද මූණ නරක් කරගෙන කල්පනා කෙළේ ය.

''ඈ කැමති හැටියක් කරන්ට ඉඩ දෙන්ට අප්පොච්චි,'' පෙමා ඇවිටිලි කෙළේ ය. ''ඔය බෑනට වැඩියෙ අපේ කෙලී අපට ලොකුයි. ඈ නැති ව කොහොම ද කියලා මේ ටිකේ අපට තේරුණා.''

''හොඳයි එහෙනං,'' රන්දුනා නොමනාපයෙන් පැවසුවේ ය.

''රනී, උඹලැ අප්පොච්චි කියනවා ඒක හරි කියලා,'' හැන්ස් ඇට හඬ ගා කීවේ ය.

''මොකක් ද, ඒක හරි කියන්නෙ?''

''උඹ ඒ කොලුවා එක්ක යන්ට ඕනැ නැහැ.''

''එහෙනං ඒ වග අප්පොච්චිගෙ කටින් ම කිවුවොත්.''

''කෙල්ලක් තමන්ගෙ අප්පොච්චිට කවදා හරි ඔහොමට කතා කර ඇද්ද?'' රන්දුනා අවලාද කීවේ ය.

''එක්කෝ ඈ කියන හැටියකට කරන්ට. නැත්නම් අපට ඇගෙ කෑලි අවුලා ගන්ට වෙයි ගල පාවුලින්,'' හැන්ස් කියා සිටියේ ය.

''අපි ඕකි ව අත ඇර දලා යන්ට යමු.''

''අත ඇර දලා ගිහින් ආයෙ ඕකි හොයා ගන්ට ලැබෙන්නෙ නෑ මේ හිමේ. අපට දූන් හමු උණෙත් එක වාසනාවකට. මෙවෙලෙ වලසුන් ගැන මගෙ හිතේ වෛරයක් අට ගැනුණ නිසා මිස නැත්නම් අපි ඔය හද්ද ගණන් නොගෙන ඔහෙ යන්ට යනවා,'' පෙමා කාරණය පැහැදිලි කෙළේ ය.

''පෙමා කීවා හරි. අපි මෙහෙන් ඉඳ ගනිමු,'' හැන්ස් තමාගේ බුලත් මල්ල ලිහා කහට පොතු විටක් ගෙන රන්දූනා අතට දුන්නේ ය.

ඉදුණු ගෙඩිවලින් පිරුණු මොර අතුරිකිල්ලක් බිමට වැටුණේ ය. ඒ සමග ම අනිකක් ද අනිකක් ද වශයෙන් හැමට ම ඇති වන සේ මොර අතු බිම වැටුණේ ය.

''මේවා බොහො ම රසයි,'' හැන්ස් කී ය. ඒවා රස බව පෙමා තලුමැරීමෙන් ඇඟ වී ය. හැන්ස් මොර අත්තක් රන්දූනා ළඟින් තැබුවේ ය. මෙවේලේ පිපාසයෙන් සිටි රන්දූනා කටේ තුබුණු හපය ඉවත ලා මොර කන්ට විය.

මේ අතර රනී කෑ මොර ගෙඩිවල ඇට සට පට ගා ඔවුන් සිටි තැනට වැටුණේ ය.

''තව මොර ඕනෑ ද?'' ගසේ සිටි රනී ඇසුවා ය.

''ඔව්, ඕනෑ,'' හැන්ස් කීවේ ය.

රනීගේ පොරොවෙන් කැපුණු මොර අතු එකින් එක බිම වැටුණේ ය. හැන්ස් රන්දූනා දෙස බලා සිනාසී, ''කියන්ට රනීට තමන් කැමති හැටියක් කර ගන්ට කියලා,'' කීවේ ය.

ගස උඩ බැලූ රන්දූනා ''හොඳයි, උඹ කැමති හැටියක්,'' යයි කීවේ ය.

''මට ඇහුණෙ නෑ. මොකක් ද අප්පච්චි කීවේ?''

රන්දූනා ඒ වචන වුවමනාවාට වඩා වේගයෙන් හඬ ගා කීවේ ය.

''ඔය ඇත්තන් දෙන්නාට ම ඇහුණා නේ!'' රනී ඇසුවා ය.

''ඔව් අපට ඇහුණා,'' දෙදෙනා ම සිනාසෙමින් පිළිතුරු දුන්හ.

එහෙත් රන්දූනා එයින් සතුටට පත් නො වී ය.

මඳ වේලාවකින් රනී ගසින් බැස ඔවුන් වෙතට පැමිණියා ය.

බල්ලෝ ඈ හමු වූ සතුටින් බුරන්ට වූවෝ ය. දීයා සතුටින් කන් ඔසවා සිට නගුට කරකවන්ට වූවා ය. හැන්ස් ද පෙමා ද ප්‍රීතියෙන් උදම් වූහ. රන්දූනාගේ මුහුණේ කිසි අමුතු හැඟීමක් සටහන් නො වී ය. බිම්බි තවමත් තුරු මුදුනේ පල බුදිමින් සිටියා ය.

කීප දිනක් ගත වූ විට ඔවුහු නැවතත් පෙර තුබුණු ප්‍රීතිමත් ජීවිතයට පැමිණියෝ ය. ළඟ එන වැහි කාලයේ ලකුණු අවටින් පහළ වන තෙක් කඳු බිමේ සැරිසැරූ හැම හැම එකකුට ම සෑහෙන බරක් වියලි දඩමස් හා මී පැණි ද ඇති ව පහළ තැනි බිමට බැස ගත්හ. තමන්ගේ ගල් ගෙට පැමිණි මොවුහු වැහි කාලය කෙළවර වන තෙක් ගල් ගෙයි ම සිටියෝ ය.

## 15

# ගුරුවරයා සහ ගෝලයා

හැන්ස් ගල් ගෙයි වසන භික්ෂුව දකීමට ඒ ගල් පවුවට ගිය ද සිට නැවත එහි යාමට ඔහු සිත තුළ ඇති වූ ආසාව මැඩ පවත්වා ගැනීම ඔහුට නො කළ හැක්කක් වී ය. තමා භික්ෂුව දකීමට ආසා කෙළේ කලක සිට හැන්ස්ට නො ලැබී තුබුණු සභ්‍ය සමාජයේ ආශ්‍රයට ඇති ආසාව නිසා යයි එද භික්ෂුව කී කීම සත්‍යයකි. වනය ඔහුට ප්‍රිය ජනක විය. එසේ ම ආශ්‍රය කරන වැදි මිත්‍රයෝ ද හොඳ හිතවත්තු වූහ. එහෙත් වැද්දන්ට වඩා උසස් තත්වයක් ඇත්තවුන් හා සම්බන්ධකම් පැවැත්වීමට, සභ්‍ය ලෝකයට තව ටිකක් ළං ව සිටීමට ඔහුට වුවමනා වී තුබුණේ ය.

මේ වර ඔහු භික්ෂුව කරා ගියේ බිම්බි පමණක් තමා සමග කැඳවා ගෙන ය. මගදී මීයක් ගරා රැස් කරගත් මී පැණිත් හාරා ගත් අල ටිකකුත් භික්ෂුවට පඬුරක් හැටියට ගෙන ගියේ ය.

හැන්ස්ගේ දකීමෙන් භික්ෂුවගේ මුහුණ ප්‍රීතියෙන් ප්‍රබෝධ වී ගියේ ය. පසු ගිය දින කීපය තුළ භික්ෂුව බොහෝ වර මේ තරුණ වනචාරියා ගැන සිතුවේ ය.

"ආ, මේ ගමන වෙන යාළුවකු කැටුව ආවා නේ ද?" භික්ෂුව හැන්ස්ගේ උරය මත සිටි වැඳිරිය දෙස බලා සිනා සහිත ව තෙපළේ ය. කරින් බිමට පැන ගත් බිම්බි එහි වූ සුන්බුන් වගයක් අවුලා ගත්තා ය. මිනිසුන් දෙදෙනාගේ කතා-වෙන් තමන්ට වැඩක් නැති බව ටික වේලාවකින් ම වටහා ගත් වැඳිරිය ගල් ගෙට උඩින් වූ වනයට වැද තුරු මුදුනකට පැන ගත්තා ය.

ටික වේලාවක් ආ ගිය පුවත් කතා කරමින් එහි සිටි හැන්ස් "ඔබ කතා කරන බාසාව ටිකක් ඉගෙන ගන්ට මම කැමතියි," කීවේ ය.

"ඒ මොකට ද?" භික්ෂුව විමසී ය.

''අපට එතකොට නිදහසේ අදහස් හුවමාරු කරගන්ට පුළුවනි. අපට වුවමනා කරන හැම දෙයක් ම කියා ගන්ට තරමට වැදි භාෂාවෙ වචන නැහැ,'' යි හේ කීවේ ය.

''බොහො ම හොඳයි. මම උගන්වන්නම්. ඒත් ඒ වැඩේට ටික කලක් ගත වෙයි. නිතර නිතර මෙහි එන්ටත් වේවි. කොහොමටත් මේ වැදි කතාව දන්නා නිසා අපේ කාරිය පහසු වෙයි,'' භික්ෂුව කීවේ ය.

''මට ඔබේ අවසරය ලැබෙතොත් ඔබ කැමති කොයි දවසක උණත් මට එන්ට පුළුවනි.''

මේ දෙදෙනා අතර පැවතුණු දිග සම්බන්ධකමට මුල පිරුවේ මේ සැටියෙන් විය.

ගුරුවරයා ද ගෝලයා ද යන දෙදෙනා ම මේ කාරිය ගැන විශේෂ උනන්දුවක් දැක් වූහ. හැන්ස් තමා ඉගෙනීමෙහි දක්ෂ ශිෂ්‍යයකු බව පෙන්වූයේ ය. මේ මුල ඉගෙනීම් වාරයට සතියක් ගත විය.

හැම හැන්දෑවකට භික්ෂුව පිරිත් කීමට පටන් ගනියි. ඒ අසා සිටින හැන්ස්ට, තම යහළුවා වූ ෆ්‍රිට්ස්, හෝමර් පාඨ කිය වූ සැටි සිහියට එයි. මේ දෙදෙනාගේ කියමන්වලින් වඩා කනට මිහිරි කවුරුන්ගේ කියමන දැයි ඔහුට විසඳා ගත නොහැකි වෙයි—ෆ්‍රිට්ස්! ඔහු දැන් කොහේ නම් ඇද්ද? හැන්ස් කල්පනා කෙළේ ය.

භික්ෂුව හැන්ස්ට උගන්වා ලූ බාසාව බණ දහම් ලියා ඇති පුරාණ පාළි භාෂාව නොව කතා කරන සිංහල බාසාව විය.

හැන්ස් පැමිණ සතියක් ගෙවී ගෙන යන විට ඔහුට කථා කළ භික්ෂුව, ''හෙට මේ පහළ ගමේ මිනිස්සු දෙන්නෙක් මේ ගලට නගිනවා මට දන උපකරණ ඇරගෙන. ඒ මිනිසුන් මේ ගල් ගෙට එන්නේ නැහැ; ඒත් ඉහළ ගල් ගෙට ඇවිත් ගෙනා දේ එහි තියල එතැන මල් ආසනේ මල් පුදලා බැහැලා යනවා. ඔබ මෙහි හිටින වග ඒ මිනිසුන් දැනගත්තොත් ඒක හොඳ නෑ. දැන් මෙහෙන් ගිහින් ඊට පස්සෙ මනාප වේලාවක ආයෙ එන්ට. ගල් ගෙයි වැද්දනුත් ඔබ දකින්ට ආසාවෙන් ඇති,'' යි කී ය.

''ඔව්, ගල් ගෙයි ඇත්තන් පුදුම වෙලා ඇති මා ගියේ කොහේ ද කියා. මා මෙහි එන වගක් කියා ආවේ නැහැ,'' හැන්ස් කතාව පිළිගත්තේ ය.

ගමනට සූදනම් වූ හැන්ස්, ''ඉතින් ඒ මිනිසුන් මේ ගල් ගෙට නොඑනවා නම් කොහොම ද දැනගන්නෙ ඔබ තාමත් මෙහි ඉන්නවා කියා?'' හේ විමසී ය.

මම හැම ද ම හැන්දෑවට පිරිත් කියනවා. මේ පිරිත් කීම නෑහෙන තරම දුරක නෙමෙයි ගම ඇත්තෙ. මේ ඉහළ ගල මුදුනෙ ඉඳ හඬ නගා කියන දෙයක් පහළ දුරට ඇහෙනවා. ඔහොම යන අතර ඒ මිනිසුන්ට මගේ කට හඬ අහන්ට නො ලැබෙන දිනයක් ඒවි. එතකොට මිනිසුන් ගලට නැග ගෙන කෑම එතැන ම තියෙනවා දැකලා මේ ගල් ගෙට ඒවි. එතකොට මගේ ප්‍රාණය නිරුද්ධ වෙලා. මම දිවුරුමක් දිවුරා තිබෙනවා කිසි ම දවසක මේ ගලෙන් පහතට බහින්නේ නැහැ කියා.''

හැන්ස් ආපසු වැද්දන්ගේ ගල් ගෙට පැමිණි විට එහි කිසිවෙක් නො සිටියෝ ය. මෙවිට බොහෝ වෙහෙසී සිටි හැන්ස් පසු දින ඔවුන් ගැන සෙවීමට තීරණය කොට ගෙන එහි හුන් නමුත් ඔහුට එසේ කිරීමට වුවමනා නො වී ය. හැන්දෑව වන විට වෙහෙසින් හා දුකින් ද පීඩිත ව සිටි සේ පෙනුණ වැද්දෝ එහි ආවෝ ය. හැන්ස් ගල් ගෙයි සිටිනු දුටු ඔවුන්ගේ මුහුණුවලින් පෙනී ගිය සතුට අති මහත් විය. රනීගේ දෙනෙත සතුටු කඳු-ළෙන් තෙත් වී බබළන්ට වී ය.

''මේ ටික දිනේ ම අපි හූරා හොය හොයා කොයි තරමක් නම් වෙහෙසුණා ද? අපි හිතුවා මොකක් හරි අනතුරක් වත් සිද්ද වෙන්ට ඇති කියලා. කොහෙ ද ගිහින් හිටියෙ?'' රන්දූනා විමසුවේ ය.

''ගල්ගෙයි හාමුදුරුවන් එක්ක.''

''මේ මුළු කාලෙ ම?''

''මගෙ කෑම හොයා ගන්ට මා කැලයට ගිය වෙලාවල් ඇර ඉතිරි මුළු කාලෙම.''

''ඉතින් එහෙ මොක ද කෙළේ?''

''හිංගල බාසාව ඉගෙන ගත්තා.''

''මොකට ද?''

''මම දන්නෙ නැහැ—බාග වෙලාවට හාමුදුරුවන් කියන දේ හොඳ හැටි තේරුම් ගන්ට.''

''අප වගේ වන දඩයමේ යෙදිලා ජීවත් වෙන හූරාට ඒ වයසක හාමුදුරුවන්ගෙ කතාවෙන් මොකක් ද ඇති පලේ?''

එය තමාට විස්තර කළ නො හැකි කාරණයක් වූ හෙයින් හැන්ස් මේ ප්‍රශ්නයට පිළිතුරක් නො දුන්නේ ය.

''ඇයි හූරා අපත් එක්ක ගෙවන මේ ජීවිතේ සතුටෙන් නේ ගෙවන්නෙ. ඉතින් මෙහෙ හොඳ නැද්ද?'' රන්දූනා එක්තරා සංවේගයකින් විමසී ය.

''ඇත්තෙන් ම මම බොහො ම සතුටෙන් ඉන්නෙ. ඒත් මම මේ වනෙන් පිටත රටතොට ගැන දැනගන්ට කැමතියි,'' හැන්ස් කීවේ ය.

''ඔය මිනිසුන්ගෙ රටට වඩා අප මේ ඉන්න ගහ කොළෙන් වැහුණ වන සතුන් ඉන්න රට බොහො ම හොඳයි කියලයි ඔය ගම්වලට කිට්ටුව ඉන්න අපේ ඇත්තන් කියන්නෙ.''

''බාග වෙලාවට ඔය කියන කතාව ඇත්ත,'' හැන්ස් පිළි-ගත්තේ ය.

''ඉතින් ආයෙමත් යනවා ද එහෙ?''

''ඔව්; මා එනවා කියලා ආවා. ඒත් තව කලකට යන්නෙ නෑ. මට මේ පිරිසෙ මෙහෙ ඉඳීම වඩා සන්තෝස යි — කෝ දීයා?''

''දීයා හැම ද ම මෙහෙ ඇවිත් බලාලා හූරා නැති හින්ද යනවා.''

පසුව ද එළි වන විට දීයා තමා ළඟ නිද සිටිනු ඔහුට දකින්ට ලැබිණ.

සති තුනක් වැද්දන් අතර ගත කළ හැන්ස් ඉගෙනීම් කටයුතු නැවත කිරීමට වුවමනා වූයේ භික්ෂුව කරා ගියේ ය. මේ වර යන විට තමා එහි යන බව වැද්දන්ට කියා හේ ගියේ ය.

''යන්ට එපා. එයින් කරදරයක් වෙන්ට පුළුවනි. කොයි වෙලේ හරි ඔය මිනිහකුට ඇහැ ගැහේවි,'' රන්දූනා හැන්ස්ට ඇවිටිලි කෙළේ ය.

''මම හොඳට පරෙස්සම් වෙනවා,'' කියමින් ම හේ තමාගේ ආයුධ අතට ගත්තේ ය.

''ඉක්මනින් එන්ට,'' මෙවිට පෙමා අයැදියේ ය.

භික්ෂුවගේ ගල් ගෙට ගිය හැන්ස් කලකින් හමු වූ යහළුවකු මෙන් පිළිගනු ලැබී ය. ''මා මේ හිතුවා අප අමතක උණා වත් ද කියලා,'' භික්ෂුව කී ය.

''ඒ මට නෙමෙයි,'' කී හැන්ස් කෙළින් ම ඉගෙනීමේ කාරියට සැරසුණේ ය.

තමා ඉගැන් වූ සියල්ලක් ම පාහේ හොඳින් මතක තුබුණ ගෝලයා ගැන ගුරුවරයා පහන් විය. ඔහු දෙදෙන පාඩමට සිත් අලවා එය කරගෙන යන අතර භික්ෂුව එක් වර ම නිශ්ශබ්ද වී ය. ඔහුගේ මුව විවර වී දෙනෙත් පළල් ව හැන්ස්ගේ කරට උඩින් කිසිවක් දෙස නෙත් යොමා සිටිනු දුටු හැන්ස් හිස හරවා එදෙස බැලුයේ ගල් ගෙයි දොර ළඟ සිටින දීයා දුටුවේ ය.

''උඹට බය වෙන්ට එපා. උගෙන් අනතුරක් වෙන්නෙ නැහැ,'' යි භික්ෂුව සැනසූ හැන්ස් දිවි දෙනට ළඟට කතා කෙළේ ය. එතැනට සෙමින් පැන ගත් දිවි දෙන ඔහු ඇළයේ සිට ගත්තා ය. ඔහු නොදැනුවත්ව ම දිවි දෙන තමා පසු පස්සේ ඇවිත් තිබිණ.

''මහ පුදුම යාළුවන් නේ ඉන්නෙ. මුල් දිනේ වැද්දෙක්, ඊ ළඟට වඳුරෙක්; දැන් මේ භයානක සීපාවෙක්,'' පැටලුණ ස්වරයකින් භික්ෂුව කී ය.

''මේකී කළු දිවි දෙනෙක්. මේ ඇගේ පුල්ලි යම් තම් පෙනෙනවා.''

''ඔව් මට පෙනෙනවා. මෙවුන් කලාතුරකින් එකෙක් ඉන්නෙ. කොහොම ද යාළු කර ගත්තෙ?''

දිවි දෙන පිළිබඳ කතාව මුළුමනින් භික්ෂුවට කී හැන්ස් ඇට කථා කොට, ''හා ඉතින් උඹ පලයන්; ගිහින් වඳුරන් දඩයම් කරගනින්. අපට මෙතන වැඩ තියෙනවා. හුඟක් වැඩ තියෙනවා,'' කීවෙන් එයට කීකරු වූ දිවි දෙන තවත් එහි සිට බාධා නොකර වනය දෙසට ගියා ය.

''අන්න හොඳයි. දැන් හිතට සැනසීම යි. ඒ සතාගෙ ඇස් බොහොම භයානක යි. මිනිසුන්ට කඩා පනින්නෙ නැද්ද?'' සැනසුම් සුසුමක් හෙළූ භික්ෂුව ඇසුවේ ය.

''කවදවත් නෑ. ඈ යන්නෙ මා එක්ක විතරයි. වැද්දන් එක්කත් යනවා මා ඉන්නවා නම්. වැද්දකු හරි අමුත්තකු ඇහැ ගැහුණ හැටියෙ මග ඇර ගිහින් හැංගිලා ඉන්නවා.''

''ඇගෙන් පරෙස්සම් වෙන්ඩ ඕනෑ. ඔය ජාතිය විස්වාස නෑ. එක දවසක තමාට විරුද්දෙට හිටින්ඩ පුළුවනි.''

''ඒ මගෙ දීයා නෙවෙයි,'' හේ සිනාසුණේ ය.

ඔවුහු නැවතත් පාඩම පටන් ගත්හ.

මේවර හැන්ස් එහි සිටියේ තෙදිනක් පමණකි. පත්හිදෙන් පුස්කොළ ලියන හැටි භික්ෂුව ඔහුට ඉගැන් වූ හෙයින් හේ ඕලන්ද අකුරෙන් භික්ෂුව කියා දුන් සිංහල වචන හා ඒවායේ තේරුම් සටහන් කරගෙන ගෙදරදී පාඩම් කිරීමට ගෙන ගියේය.

ඊළඟ මාස කීපය තුළ හැන්ස් නිතර නිතර මේ ගුරුවරයා දැකීමට එහි ගියේ ය. එසේ යන හෙතෙම වනයෙන් සොයා ගත් කිසියම් දෙයක් පඬුරක් වශයෙන් ගෙන ගියේය. හැන්ස් උනන්දු වෙන් ඉගෙනීමේ කටයුතු කළ අතර ස්වාමීන් වහන්සේ ද ඔහුගේ ධෛර්යය දියුණු කරවමින් සැලකිල්ලෙන් පාඩම් කියා දුන්නෝ ය. වැඩි කලක් යාමට පෙර මේ ගුරු ගෝල දෙදෙනා බාධා රහිත ව සිංහලයෙන් තම තමන්ගේ අදහස් හුවමාරු කර

ගැනීමෙහි සමත් වූහ. වැද්දන්ගේ බාසාවට වඩා උසස් ලෙස අදහස් උදහස් ප්‍රකාශ කිරීමෙහි සිංහලය ප්‍රයෝජනවත් බව හැන්ස් වටහා ගත්තේ ය.

එක් දිනක් හැන්දෑවේ පිරිත් කීමෙන් පසු ව ස්වාමීන් වහන්සේ හැන්ස්ට කථා කොට, ''මා පිරිත් කියනු අසා සිටින ඔබ හැම දා ම දුක් බර මුහුණක් ඇති ව සිටින්නේ ඇයි දෑ'' යි විමසූහ.

''මේ පිරිත් කියන කොට මට මගේ ගෙදර සිහි වෙනවා. මට ඉතා හිතවත් ව හිටි මා එක් ව මුහුදේ යාත්‍රා කළ යහළුවකු සිහි වෙනවා. මේ යහළුවා මුහුදේදී මා නිසා ජීවිතය මුහුදට කැප කළ කෙනෙක්. ඔහුත් මා නොදන්නා භාෂාවකින් මේ වගේ කීමක් කියන්ට පුරුදු ව හිටියා. ඒ කීමත් මේ වගේ ම මගෙ කනට මිහිරි ගීතයක්,'' හැන්ස් කී ය.

''ඉතින් ඔය කියමන් දෙකෙන් කොයික ද ඔබට වඩා මිහිරි වුණේ?'' තමාගේ පිරිත් කීම ගැන සැලකූ ස්වාමීන් වහන්සේ විචාළහ.

''ඒක මට හරියට කියන්ඩ බැහැ. ඔහු ඒ කියූ කියුම් යම්-තම්නුයි මට දැන් මතක. ඒ කීම යුද්ධ ගැනත් රණකාමීන් ගැනත් ය කියා ඒ මිත්‍රයා මට කියා තුබුණා. ඒ කියමන් අහන කොට මගෙ ඇඟේ ලේ කිපුණා. ඒත් මේ පිරිත් කීම අහන මගෙ හිත දුකකින් බර වෙලා මෙලොවට වඩා පරලොව ගැන සිහි වෙනවා.''

''හොඳයි මට කියන්ඩ ඔබේ ජීවිත කතාව. ඔය කියන මිත්‍රයා ගැනත් මට විස්තරයක් කියන්ඩ.''

භික්ෂූන් වහන්සේගේ උනන්දුව නිසා ධෛර්‍යවත් වුණ හැන්ස් එදා බොහෝ රෑ වන තුරු තමා පිළිබඳ කෙටි වූ එහෙත් වීර ක්‍රියාවලින් ගහන ජීවිත කථාව විස්තර කෙළේ ය.

ස්වාමීන් වහන්සේ බාධාවක් නොකොට කුතුහලයෙන් මේ කථාව අසා සිටියහ. එය තද දුක් ඉසිලීමෙන් හා භයානක සිදුවීම්වලින් ද යුත් එකක් විය. හැන්ස් කතාව ඉවර කළ විට භික්ෂූන් වහන්සේ ඒ ගැන කිසිවක් කීමට පෙර බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියහ. ''ඔබේ රටේ මිනිසුන් මහ පුදුම ජාතියක මිනිසුන් වෙන්ඩ ඕනෑ, වෙළඳාමෙන් ලබන සුළු ලාබයක් තකා ජීවිතය පරදුවට තියා වීරකම් කරන ආසාවෙන් මේ වගේ භයානක දේට මූණ දෙන්ඩ. අනික් අතට ඔබේ අනාගතය කොහො ම එකක් වෙයි ද කියලා මට නම් කියන්නට බෑ,'' පසු ව උන් වහන්සේ පැවසූහ.

අනතුරු ව ටික වේලාවක නිශ්ශබ්දතාවක් පැවැත්තේ ය. මේ නිශ්ශබ්දතාව බිඳ හැරිය හැන්ස්, ''දැන් ඉතින් මා ගැන

තොරතුරු හැම දෙයක් ම මම කීවා. ඉතින් මට කියන්නෙ නැද්ද ඔබ වහන්සේගෙ කතාව?'' හැන්ස් විමසී ය.

''දූන් බැහැ දරුවා, හඳත් බැහැලා ගියා. තව පැය කීපෙකින් එළියත් වැටෙයි. මගෙ මේ වයසක මොළේට වෙහෙස යි. ටිකක් විවේක ඕනැ. උදේ අවදි උණා ම මේ කියාපු පුදුම දේ ගැන ටිකක් හිතන්ඩ ඕනැ. ඔබ උදේ ගිහින් කෑම බීම හොයා ගන්ඩ. ඒ ගිහින් ආවා ම හැන්දෑවට මම කියන්නම් මේ රටේ කතාවෙන් ටිකක්.''

භික්ෂූන් වහන්සේගේ කතාව දිග එකක් වූ අතර දවසෙන් වැඩි කොටසක් කතාවට ගත විය. එය පුරාණයෙහි විසූවන්ගේ ගුණ කථනයක් විය. පුරාවෘත්තයන් ආශ්‍රයෙන් පටන් ගැනුණු කථාව ඉතිහාසය හා එක් ව පසු ව භික්ෂූන් වහන්සේගේ ශාසනය වූ ආගම ධර්මය හා සම්මිශ්‍රණය විය.

ශත වර්ෂ බොහෝ ගණනකට පෙර විජය නම් රාජ කුමාරයකු උතුරු ඉන්දියා දේශයේ සිට පිරිවරත් සමග මෙහි පැමිණෙන විට අදත් වන ගත ව ජීවත් වන රන්දූනා පෙමා වැනි වනචාරී මිනිස්සු මෙහි ජීවත් වූහ. විජය හා පිරිස ලංකාව අත්පත් කර ගත්තෝ පසු ව ශක්තිමත් වූ සිංහල නම් ජාතියක් ඇති කළෝ ය. ජාතියක් වශයෙන් දියුණු වූ සිංහලයෝ පෙරදිග ලෝකයේ පැතුරුණ කීර්ති ඇති සංස්කෘතික අධ්‍යාපනික හා වාණිජ මධ්‍යස්ථාන වූ අනුරාධපුර වැනි මහ නගර ඉදි කළහ. අවුරුදු දහසකට අධික කාලයක් තුළ දකුණු ඉන්දියාවෙන් වරින් වර පැමිණි සතුරු දෙමළ ආක්‍රමණයන්ට එඩිතර ව මුහුණ දී සිටි අනුරාධපුරය පසු ව දෙමළුන් විසින් විනාශ කර දමන ලදි. අනුරාධපුර පැරණි නෂ්ටාවශේෂ අද දක්වාත් වන ගත ව පසින් වැසී පවතී.

අනුරාධපුරයෙන් ඉවත් ව ගිය සිංහලයෝ ඊට සැතපුම් පනහකට ගිනිකොන දෙසින් පොළොන්නරුව නම් නව නගරයක් ඇති කර ගත්හ. පරාක්‍රමවත් මහ රජවරුන්ගේ සමයෙහි උසස් ම තත්වයට දියුණු ව පැවති මේ පොළොන්නරුව ද වරින් වර දෙමළුන් විසින් ආක්‍රමණය කරන ලදු ව ගිනිගත් මහ වනයක් මෙන් විනාශ වී ගියේය.

සතුරන්ගේ නොතොර පහරදීම්වලින් පීඩිත වූ සිංහල රජවරු පසු ව පොළොන්නරුව ද අත හැර රට මැදට ම පිවිසියාහු අනික් රාජධානි පිහිටුවා ගත්හ. අද උඩුනුවර සිංහල රාජධානිය ව පවතින අතර බටහිර හා දකුණු ලංකාව කෝට්ටේ රාජධානිය සතු ව පවතී. පසු පසු ව දෙමළ සිංහල ජාතීන්ගේ සම්මිශ්‍රණයක් ඇති වූවා මෙන් ම සමහර සිංහල රජවරු දෙමළ ලේ ඇත්තෝ ද වූහ. මේ සමග දෙමළ චාරිත්‍ර වාරිත්‍ර ද සිංහලයන්ට පුරුදු වූ

අතර හින්දු ධර්මයේ ඇදහීම් ද බෞද්ධ සභ්‍යත්වයට වැද්ද දී තිබුණේ විය. මෙහිදී නව දූරටත් කතාව කියා ගෙන ගිය භික්ෂූන් වහන්සේ යුරෝපා දේශයේ සිට පෙරදිගට ආ සුදු මිනිසුන් කොටසක් ලංකාවේ වෙළඳාම අල්ලා ගෙන පදිංචි වීම නිසා දෙමළ ආක්‍රමණයන් එයින් පසු නතර වූ සැටිත් ඒ එසේ නොවී නම් ලංකාව කවර ඉරණමකට පත් වන්ට තුබුණේ දැයි තමාට නො කිය හැකි බවත් පැවසූහ.

මේ පෘතුගීසි සුදු මිනිසුන්ගේ පැමිණීම ගැන අපේ සිංහල ලේඛකයකු ලියා තුබුණේ, "අපේ කොළොම් තොටට සුදු පාට මිනිස්සු වර්ගයක් පැමිණ සිටිති. ඔවුහු යකඩ සැට්ට ඇඟ ලා ගෙන යකඩ තොප්පි ඉස ලා ගෙන විගසක් එක තැනක නො සිට සක්මන් කරන්නෝ ය. සුදු ගල් සපා කමින් ලේ බොන්නෝ ය. සෙණ හඬ මෙන් හඬ නගන ඔවුන්ගේ කාලතුවක්කු උණ්ඩ යකඩ කෝෂ්ට ගල් කෝෂ්ට පමණක් නොව යුගන්ධර පර්වතය පවා බිඳ ගෙන යන්නේ ය," යනුවෙනි.

මෙතැන් පටන් ලංකාවේ තත්වය සම්පූර්ණයෙන් වෙනස් වී ය. දකුණු ඉන්දියාවත් ලංකාවත් අතර මෙතෙක් පැවති හටන සිංහලයන් හා සුදු මිනිසුන් අතර හටනක් බවට හැරිණි. එතැන් සිට කරදර අප්‍රමාණ විය.

මේ පැමිණි පංරගීහු මුහුදු බඩ වරායවල් තනා ගෙන වෙළඳාම් කළෝ ය. එයින් සෑහීමට පත් නොවූ ඔවුහු පූජකවරුන් ගෙන්වා තමන්ගේ ආගම පැතිරවීමට ද පටන් ගත්හ. සිංහලයන් ඔවුන්-ගේ ආගමට හරවා ගත් ඔවුහු ඔවුන්ට පරංගි නම් දුන්හ. ඔවුන් සඳහා පල්ලි පාසැල් ඇති කළහ. රජ මැදුරට පවා පරංගි සිරිත් හා පරංගි බස ද බෝ කළහ.

සිංහලයන් හා නිදහසේ මිශ්‍ර වූ පරංගීහු සිංහල කතුන් විවාහ කර ගෙන සිංහලයන් මෙන් ජීවත් වූහ. එහෙත් ඉක්මනින් කිපෙන සටන් කාමී මිනිසුන් වූ ඔවුහු බොහෝ දරුණුකම් කළෝ ය. නපුරෙන් නපුරක් ම සිදුවේ යන කීම අනුව අපේ මිනිස්සු ද ඔවුන්ට දරුණු කම් කළෝ ය. ඔවුන් මෙහි සිටි අවුරුදු එකසිය පණහක් පමණ වූ කාලය අතර අපත් ඔවුනුත් අතර ඇති වූ සටන් ගණන් නැති විය. කන්ද උඩ රාජධානිය පවා ඔවුන් වළකා ලීමෙහි සමත් නො වී ය. මාර්ගයන් කෙතෙක් ආරක්ෂා කළත් මේ සුදු හමුද උඩරට රාජධානියට කඩා වැදී ගෙවල් දෙරවල් හා විහාර දේවාල ද කඩා ගිනි තබා විනාශ කළෝ ය. ඔවුන්ගේ එක් කපිතාන් කෙනෙක් මේ විනාශය නිතර නිතර ම සිදු කෙළේ ය. වරක් කඳු අතර මගක ගමන් කළ මේ හේවා පිරිසක් ගහක් එතර කරද්දී සිංහලයන් විසින් වටලනු ලැබ විනාශ කර දමන ලදි.

මේ අතර තව තවත් විදේශීය ජාතීහු මෙහි පැමිණ වෙළඳාමෙහි යෙදුණෝ විශේෂයෙන් කුරුඳු හා පුවක් ද හොඳ වෙළඳ බඩු වශයෙන් සැලකුවෝ ය. මොවුන් අතර එක් ජාතියකි ඕලන්දයෝ. ඕලන්දයෝ රජුගේ සිත් දිනා ගැනීමෙහි උත්සාහ කළෝ ය. ඔවුන් රටවල් අල්ලා ගැනීමට වඩා වෙළඳාමට උන්නවුන් යයි වටහා ගත් රජ ඔවුන්ට කැමති වී වරායක් ද පවරා දුන්නේ ය. මොවුන් හා මිත්‍රවීමෙන් පෘතුගීසීන් පලවා හැරීමට මොවුන්ගේ උපකාර ලබා ගත හැකි වේ යයි රජු සැලකුවේ ය.

ඒ උපකාරය ඕලන්දන්දයෝ ඉටු කළෝ ය. කාලයක් තිස්සේ කෙරුණු දරුණු සටන් රාශියකින් පසු පෘතුගීසීන්ගේ එක එක කොටුව අල්ලා ගන්නා ලදී. අන්තිමට අල්ලා ගනු ලැබුවේ කොළඹ කොටුව විය.

තව දුරටත් මේ විස්තරය කර ගෙන ගිය භික්ෂූන් වහන්සේ "ඒත් වැඩි දවසක් යන්ට ඉස්සර අපේ රජ්ජුරුවන්ට තේරුම් ගියා තමන් මේ කෙළේ ඉඟුරු දීලා මිරිස් ගැනීමක් වග. අල්ලා ගත් බල්කොටු වඩාත් තර කරගත් මේ ඕලන්දයෝ අවට කොටස් පාලනය කරන්ට පටන් ගත් නමුත් රටට ඇහෙවුවේ ඔවුන් රජුගේ සේවකයන් බවයි."

රණකාමී නිර්භීත නරවරයකු ව හිටිය අපේ රජතුමා දැන් වයස්ගත ව සිටි නිසා මේ සටන්වලින් වෙහෙසට පත් වෙලා කන්ද උඩ රට රාජ්‍යයට ම ගියා; තව ම එහි රජකම් කරනවා. පහත රට මුදුකර පළාත් ඕලන්දයන්ට අත් ඇරිය නිසා ඕලන්දයෝ රජුට කරදර නොකර ප්‍රධාන වශයෙන් වෙළඳාම් කටයුතු කරගෙන යනවා. ඉතින් ඔන්න අද තත්වය ඔහොම යි," කියා ස්වාමීන් වහන්සේ කථාව කෙළවර කළහ.

"අර, කන්ද උඩරට පිහිටා ඇතැයි කී රාජධානිය ඇත්තේ මෙහි සිට කොයි අතින් ද"යි හැන්ස් විමසුවේ ය.

මෙවිට තම සැරයටියත් අතින් ගෙන නැගී සිටි භික්ෂූන් වහන්සේ, "එන්ඩ මා කැටුව, මම පෙන්වන්නම්. මේ ගලේ යාම අමාරු තැන්වලදී මට ආධාර කරන්ඩ ඕනෑ. මගෙ මේ වයසක දෙපා දැන් වලංගු නැහැ; ඒවා ඒතරම විස්වාස නැහැ," යි කීහ.

ඔවුහු ඒ හෙල නැග මුදුන් ගල මත සිටියහ. එයට පහළ පෙනෙන තෙක් මානයේ එක සැටි වූ මහ වනය සමහර තැනක වූ කුඩා කුඩා ගල් කුළුවලින් පමණක් බිඳී පෙනිණි.

එහිදී තම සැරයටිය දිගු කර දුර පෙන්වන ස්වාමීන් වහන්සේ, "අර ඈත වලාකුළු පෙළක් වගේ තනි ව ඇති කඳු ගැට පෙළ පෙනෙනවා නේ ද?"

"ඔව්, මට පෙනෙනවා," හැන්ස් කී ය.



බොහොම ඈත තියෙන අර කඳුගැට පේනව නේද?

"අන්න ඒ කඳු පෙළට එහායින් තමා උඩුනුවර පිහිටා ඇත්තෙ."

"ඒ ගැන මට තව විස්තර ටිකක් කීවොත්!"

"උඩුනුවර රජ්ජුරුවො ඒ කාලෙ බොහො ම සටන් කර ජය ගත්ත මහා රණ ශූරයෙක්. ඒත් දැන් වයස් ගත වෙලා සටන්වලින් වෙහෙසට පත් වෙලා රාජධානියෙන් පිට නොගිහින් ඉන්නවා. පහත රට මුහුදුකරය අල්ලා ගෙන ඉන්න ඕලන්දයො ස්වාධීන ව තමන්ගෙ කටයුතු කර ගෙන යන අතර මුළු රටේ ම අධිරාජයා හැටියට රජුට සලකන බව පෙන්නා ගන ඉන්නවා. වරින් වර අශ්වයන් සිංහයන් ආදි රජු කැමති තෑගි බෝග මාලිගාවට එවනවා."

"මේ රජුගේ ළමා කාලයෙදි ඔහුගෙ පියා, මොහුටත් මොහුගේ වැඩුමල් සහෝදරයන් දෙන්නාටත් කතෝලික පූජකවරුන් ලවා පෘතුගීසි භාෂාව ඉගැන්නුවා. ළමා අවදියෙහි කෙනකු ලවා මොන දේ ද කරවන්ට බැරි! ඉතින් දැන් මේ රජ පෘතුගීසි භාෂාව ලියනවා කියවනවා. මාලිගාවෙ බිසෝවරු පෘතුගීසි ඇඳුම් අඳිනවා. කතෝලික භක්තියටත් පූජකවරුන්ටත් රජු සම්මාන පුදනවා. ඔවුන්ගෙ පල්ලි පාසැල් අපේ විහාර ස්ථාන අතර සාදු ගන තියනවා. මේවා දැක දැක හිත් වේදනාවෙන් ඉන්නා අතර මා මහණ වී සිටිය විහාරස්ථානය මේ විදේශිකයන් කඩා

විනාශ කර දමනු ලැබුවා. මේවා තව දුරටත් ඉවසා සිටින්ට බැරි මම අපේ බුදු හාමුදුරුවො කළා වගේ පාත්‍රයත් අරගෙන විහාරයෙන් පිට වෙලා වනගත වුණා. පස්සේ මට මේ විවේක ස්ථානය හමු වෙලා මම මෙහි වාසය කරනවා.

''උඩරට රාජධානියෙ කරදර කලිකලහ බොහොම යි. කුමන්ත්‍රණ වැඩි යි. රජු වයසට ගිහින් නිසා බලය අල්ලා ගන්ට නිලමවරු එකිනෙකා උත්සාහ කරනවා. කීප වරක් ම රජු මරන්ට උත්සාහ කළා. ඒත් හරි ගියේ නැහැ. මේ වේලාවලදී සැකයට භාජන වුණ වුන්ගෙ දරු පවුල් පවා වද දී විනාශ කරනු ලැබුවා. ඒ රටේ කයට සැපක් වත් සිතට විවේකයක් වත් නැහැ.''

''මේ කී කතෝලික පූජකවරුන් ඇරුණා ම තවත් සුදු මිනිසුන් මේ රාජධානියෙ ඉන්නවා ද?'' හැන්ස් විමසී ය.

''බොහො ම ඉන්නවා, මෙයින් වැඩි හරියක් පෘතුගීසි ජාතිකයනුත් ඔවුන්ගේ සිංහල විවාහයන් නිසා ඇති වුණ දරුවනුත් තමා. ඔවුන් ඔබට වඩා කළු පැහැ යි. ඉස කෙසුත් කළු යි. ඒ ඇර තවත් ජාතීන් හතර පස් වර්ගයක් ම ඉන්නවා. ඔබේ රටේ මිනිසුනුත් ඉන්නවා මා හිතන්නෙ.''

''කවදා හරි මාත් මේ රාජධානියට ගිහින් ඔවුන් හමු වෙන්ඩ ඕනැ.''

මෙහිදී අත ඔසවා ඔහුට අවවාද කළ භික්ෂුව, ''දරුවා, ඒ වැඩේ නම් කරන්ඩ යන්ඩ එපා. ඒ අදහස අත් ඇර දමන්ඩ. එහි වරක් ගිය කෙනකුට එයින් පිට ව ඒමට ඉඩක් ලැබෙන්නෙ නැහැ.''

''ඇයි එහෙම කියන්නෙ?''

''මා එහෙම කියන්නෙ, එහි ඉන්න විදේශිකයන් හැම දෙනකු ම ඒ ඉන්නෙ හිරකාරයන් හැටියට. රජතුමාට අහුවුණ කිසිවකුට රටින් පිට ව යන්ට දෙන්නෙ නැහැ. එයින් සමහරකු රාජ සේවයට බඳවා ගෙන ඇති අතර තවත් සමහර දෙනකු හිරකරුවන් හැටියට තබා ගෙන ඉන්නවා. වැඩි හරියක් දෙනාට නිදහස දී ගම්වල වාසය කරන්ට ඉඩ දී ඇතත් එයින් පිට වී යන්ට ඉඩක් දෙන්නේ නැහැ. රාජ්‍යයට ඇතුළු වන මාර්ග යුද්ධ භේවායන් තදින් මුර කරනවා. කිසිවකුට හොරෙන් පැන යන්ට බැහැ. පැන යතොත් උඩහින් ඇති නපුරු වන සතුන් ඉන්නා මහ වනයෙන් ම විතරයි.''

''මට එයින් බේරී එන්ඩ අමාරුවක් වෙන්නෙ නැහැ,'' මෙයට හැන්ස්ගේ පිළිතුර වී ය.

''තවමත් බොළඳ කතා කියනවා. අනේ තරුණකම කොයි තරම මුරණ්ඩු ද? භික්ෂූන් වහන්සේ ඔහුට අවලාද කීහ. හිතේ

තියාගන්ඩ, මෙකෙ ඉන්න මිනිසුන්ගෙන් ඔය ඔක්කොට ම වඩා ලොකු අන්තරායක් ඔබට තියෙනවා. යම් හැටියකින් කවුරු හරි දැකලා ඔය කතාව කටින් කට ගිහින් රජ්ජුරුවන්ගෙ කනේ වැටුණා ම—වැඩියත් අර මා දවසක් දුටුව කළු දිවියාත් එක්ක සුදු වැද්දෙක් මේ වනයේ ඉන්නවා කියා පැතිරී ගියා ම ඔය දෙන්නා ම අල්ලා ගෙන ගොහින් රජතුමාගෙ සතුන් ගාලට එකතු කර ගන්න තෙක් රජතුමා සෑහීමකට පත් වෙන්නෙ නැහැ. රාජ පුරුෂයනුත් ඇතුන් බඳින මිනිසුනුත් එවා වැද්දන්ගෙත් උදව් ඇතුව මේ කැලේ කොතන හිටියත් අල්ලා ගෙන යාවි.''

''ඔක්කොට ම ඉස්සර වෙලා මා අල්ලා ගන්ඩ එපා යැ,'' හේ සිනාසිණි.

''දරුවං, ඔය අදහස මුළුමනින් අත් ඇර දමන හැටියට මා ඉල්ලා සිටිනවා. මේ වන ජීවිතයේ රස විඳින්ඩ. ඔබ තරුණ යි. ශක්තිමත්, මේ ජීවිතේ සැප යි. නියම කාලය පැමිණියාම වනය ඇර යන්ඩ. ඒත් රජ රටට නෙවෙයි. ඉර බැස යන දෙසට. බටහිර දිග මුහුදුබඩ පළාත්වල ඉන්නෙ ඔබේ වර්ගයේ මිනිසුන්. කියූ විස්තරය අනුව මා හිතනවා ඔබත් මේ ඕලන්ද ජාතියට අයිති කෙනෙක් කියා. බටහිර වෙරළේ වරායවල් ඇති නගර ඔවුන් අතේ. මහ වනය අත්පොත වගේ හොඳින් දන්නා ඔබට මේ ගමන අමාරු එකක් වෙන්නේ නැහැ. මේ අතර මෙහි කාටවත් නො පෙනී ඉන්ඩ පරෙස්සම් වෙන්ඩ ඕනෑ. මේ මා දකින්ඩ නිතර එන ගමනත් එක විදියකින් අන්තරාදායක යි.''

''මොන දේ වුණත් මම ආපහු වනේට ම එනවා,'' හැන්ස් කීවේ ය.

මෙහිදී භික්ෂූන් වහන්සේගේ සිනාව එයට අනුකූලතාව දක්වන එකක් විය. උගත්කමත් තාපස වේසයත් කෙබඳු වුව ද උන් වහන්සේගේ සිතෙහි ද නිර්භීත වීර ක්‍රියා පිළිබඳ ගරු කිරීමක් රැඳී පැවතිණ.

''අව්ව සැර වේගන එනවා. අපි දූන් ආපසු ගල් ගෙට යමු,'' උන් වහන්සේ කීහ.

මහලු භික්ෂුවගේ ගමනට අනුව ගාටමින් ගලෙන් බසින හැන්ස්ට ගලෙන් පහළ සිට සිනා සෙන කොලුවකුගේ කට හඬක් ඇසිණ. එකෙණෙහි ම හැන්ස්ට කථා කළ භික්ෂුව, ''දූන් මා අත ඇරලා හැකි ඉක්මනින් වනේට යන්ඩ. මට දන උපකරණ අරගෙන එන ඔය මිනිසුන්ට නො පෙනී යන්ඩ. ප්‍රවේසම් වෙන්ඩ. මේ කතාවන් නිසා මට කියන්ඩ අමතක උණා අද මේ මිනිසුන් එන දිනය වග,'' ඔහු ඉක්මන් කරවූයේ ය.

හැන්ස් වහා වන වැදුණේ ය. ඔහු භික්ෂූන් වහන්සේ දුටු අවසාන වාරය ද එය විය.

තමා මෙතෙක් කරුණු අසා ඇති සිංහල මිනිසුන් කෙබඳු උන් දැයි දැක ගැනීමේ ආසාව මුදුන් පත් කර නො ගෙන හෙලෙන් බැස යාමට තරම හදිසියක් හැන්ස්ට නො වී ය.

ඔවුන් යන මග මේ යයි සලකා ගත් හෙතෙම එය හොඳට පෙනෙන හරියේ වූ ගසකට ගැන ගත්තේ බලා සිටියේ ය. එකෙණෙහි ම මග දිගේ මිනිහෙක් ද කොලුවෙක් ද දනෝපකරණ ඔසවා ගෙන ආවෝ ය. ඔවුන්ගේ ඇඟ සම වැද්දන්ගේ සමට වඩා පැහැපත් විය. හිසේ වූ දිග කෙස් වැටි ගැහැනුන් මෙන් පීරා පිටුපස ගැටයක් ගසා ගෙන තිබිණ. ඉණ කඩ හැරුණ විට උඩුකයට ඇඳුමක් නො වී ය. ඉණ කඩ ද කඳු නැගීමේ පහසුව සඳහා දණ තෙක් වැටෙන සේ නමා හිණ ගසා ගෙන තිබිණ. වඩාත් හැන්ස්ගේ සිත් ගත්තේ කොලුවා කර තබා ගෙන ආ කෙටි කෝටුවක ලැග උන් ගිරවෙකි.

ගිරවකු අල්ලා ගැනීමට කලක සිට ම හැන්ස් ආසා කෙළේ ය. ඔවුන් ගස් මුදුන්වල ලැග සිටිනු බොහෝ විට දැක ඇති නමුත් එකකු අල්ලා ගැනීමෙහි ඔහු සමත් නො වී ය.

ඔවුන් මග පසු කර ගල් ගේ දෙසට ගිය පසු ගසින් බැස ගත් හැන්ස් ඔවුන් ආ මග දිගේ ගල පහළට බැස්සේ ය. මෙසේ යන මග එක් තැනක ඉහළින් වූ ගලක් මතට නැමී සිටි තැනක් වී ය. මේ ගල නැගී එහි මුණින් වැතිර ගත් හේ මග දෙසට එබී ගෙන බලා සිටියේ ය.

ඔවුන් ආපසු එන අඩි ශබ්දය ඔහුට ඇසිණ. මෙහි වූ පටු මගින් එක වරකට එක් අයකුට වඩා යා නො හැකි වී ය. කොලුවා පැමිණියේ අනික් මිනිහාට යාර කීපයක් පසු ව ය. කොලුවා හැන්ස් සිටි ගල අසලට එනවාත් සමග ම සිංහලෙන් කතා කළ ගිරවා, ''පොලී, උඹ බත් කෑවා ද?'' කී ය.

මෙය හැන්ස්ට නොඉවසිය හැකි තරමට කුතුහලය ඇති කර වූ අවස්ථාවක් විය. භික්ෂූන් වහන්සේගේ අවවාද අමතක කළ හේ වහා පහළට අතක් දිගු කර ගිරවා අල්ලා ගෙන නැගිට දුවන්ට වන්නේ ය. ඔහුගේ අහේතුවට ගිරවා කෑ ගසන්ට වූයෙන් ඔහු ගිය මග මිනිසුන්ට දැනගත හැකි විය. උකුස්සකු විසින් ගිරවා ගසා ගෙන යන ලදැයි සැක කළ මිනිස්සු ගිරවා බේරා ගැනීමට එළවා ආවෝ වනයේ වේගයෙන් දුවන හැන්ස්ගේ සේයාව දුටුවෝ ය. දුටුවේ යම්තමින් වුවත් මේ ගල් ගෙට ඉඳහිට සුදු වැද්දෙක් එන්නේ ය යනුවෙන් අසා තුබුණ කතාව සනාථ කිරීමට එය ප්‍රමාණවත් වී ය.

මෙ ගැන කිසිත් නොදත් හැන්ස් ලැබූ වස්තුව ගැන උදම් වෙමින් ආපසු තම ගල් ගෙට ගියේ තමා ගිරවා ලබා ගත්සැටි පෙමාටත් රනීටත් විස්තර කෙළේ ය. මේ අසා සිටි රන්දූනා කල්පනාවෙන් බර වූ හිස සලා, ''හූරා ඔය වැඩේ නොකළා නම් හොඳයි. ඒ මිනිසුන්ට ඇහැ ගැහෙන්ට ඇති,'' යි කීවේ ය.

''මිනිසුන්ට දකින්ට හැටියක් නෑ. මම හාවකු වගේ වේගෙන් දුවගෙන ආවා—ඒකට කාරියක් නෑ. මා ආයෙමත් ඒ ගල් ගේ අහලකටවත් යන්නේ නැහැ,'' යි හැන්ස් පිළිතුරු දුන්නේ ය.

ගිරවා, වරක් තම ඥාති සහෝදරයා ගෙදර දී තමාට දුන් එකාට සමාන එකකු වූයෙන් ඔහු ද ලංකාවට එන්ට ඇතැයි හැන්ස් සිතා ගත්තේ ය.

ගිරවාගේ පයක් නියඳ ලනුවකින් ගැට ගැසූ හැන්ස් ඌෟ අත්තක් උඩ බැඳ තැබුවේ ය.

''මූට දැන් මොක ද කරන්ට යන්නෙ, පුච්චන්ට ද? මස් නම් එක කටකට වැඩියෙ නෑ. ඒත් රසට ඇති,'' පෙමා කීවේ ය.

''නෑ නෑ, මූ කතා කරන ගිරවෙක්. මම අහගන යි කියනවා, ''පොලී උඹ බත් කෑවා ද කියලා,'' හේ කීවේ ය.

''මේ හූරා කියන පුදුම කතාවක්—මෙහෙවු දෙයක් කවද නමුත් අහලා තියනවා ද?'' පෙමා සිනාසුණේ ය.

එහෙත් පසුව ද හැන්ස් අතින් කෑම කා බය ඇරී පුරුදු වූණ ගිරවා ඒ වචන කීවේ ය. මූ අරුම පුදුම සතෙකැයි වැද්දෝ සැලකූහ.

කලවැද්දන්ගෙන් හා උකුසු ආදීන්ගෙන් ගිරවා ආරක්ෂා කිරීමට හැන්ස් කූඩුවක් සෑදුවේ ය. බොහෝ විට හේ ගිරවා ඇඟිල්ල උඩට ගෙන වැද්දන්ට නො තේරෙන කිසිවක් නැවත නැවත කියමින් ඉගැන්නුවේ ය.

මේ අසා සිටි රනී, ''ඔය මොනවා ද ඌට කියා දෙන්නෙ?'' විමසුවා ය.

''හැන්ස්, උඹ කොහෙ ද?'' කියලා අපේ බාසාවෙන්.

ගිරවා ඒ වචන පුරුදු කර ගත් පසු ව ''අපටත් තේරෙන දෙයක් ඌට උගන්වන්ට,'' කියා රනී ඇවිටිලි කළා ය.

හැන්ස් එය ද කෙළේ ය. එහෙත් වැද්දන් ඉදිරියේ නො වී ය.

එක් දිනක් උදයේ, ''රනී රනී නැගිටපන්,'' යයි ගිරවා කියනු අසා ඔවුහු පුදුම වූවෝ ය. මේකා යකා වැහුණ එකෙක් යයි රන්දූනා කී නමුත් කිසිවෙක් ඒ ගණන් නො ගත්තෝ ය.

16

# නැවතත් විල්තෙරට

හැන්ස් වැද්දන් අතරට පැමිණ දැන් සතර අවුරුද්දකි. දහනව වැනි වියේ සිටි මෙතෙම අඩි හයක් පමණ උස් වූ හොඳින් වැඩුණ ශක්තිමත් ශරීරයක් ඇති කඩවසම් තරුණයෙකි. දේහ ශක්තිය ඇති හොඳ පුරුෂයකුගේ ආදර්ශයකි. ඔහු ළඟ වූ කල රන්දුනා පවා අහුටු මිට්ටෙකි. සිහින් සිරුරක් ඇති හැන්ස්ට වඩා දැවුරුද්දකින් වැඩුමල් පෙමා හැන්ස්ගේ කර ළඟටත් නැත. පිරිපුන් සිරුරක් ඇති ව සිටි රනී අඩි පහකටත් වඩා මිටි එකියක් වුව ද කාරියෙහි දක්ෂ කඩිසර යුවතියක වූවා ය. දුක් ඉසිලීමෙහි මහත් ශක්තියක් ඔවුන් කෙරෙහි පැවතිණ. ස්වභාව ධර්මය අනුව එසේ වීම ඔවුන්ට අවශ්‍ය ව තිබිණ.

හැන්ස් භාවිතා කළ මහ දුන්න රන්දුනාට හෝ පෙමාට හෝ පහසුවෙන් පාවිච්චි කළ හැකි එකක් නො වී ය. හාවුන්, මීවින්නන්, කුරුල්ලන් වැනි කුඩා දඩයම් සඳහා හැන්ස් අතට ගත් කුඩා දුන්නක් ද විය. පෙමාත් රන්දුනාත් එල්ලේ නොවරදවා විදින හොඳ දඩයක්කාරයන් වුව ද හැන්ස් ඔවුන් දෙදෙනාට ම වඩා හොඳ දක්ෂ දුනුවායෙක් විය. විදීමේ දක්ෂ කම ඕනුට සහජයෙන් පිහිටි එකක් මෙන් විය. ඔහුගේ විදමන් ගැන වැද්දෝ බොහෝ වීට පුදුම වූහ. උස් තුරු මුදුනක ලැග සිටින කොබෙයියකු විද හෙළීම හෝ වනයේ ගස් අතර දුවන මුවකුගේ ළය පසා කර ගෙන යන සේ හීයක් යැවීම හැන්ස්ට අමාරු කාරියක් නො වී ය.

හැන්ස් කෙරේ ඊර්ෂ්‍යා නොකළ වැද්දෝ ඔහු ගැන ආඩම්බර වූවෝ ය. ඔහු තමන්ට වඩා උසස් පරපුරක උපන් උසස් ගති ඇති එකකු සේ ඔවුහු සැලකුවෝ ය. දඩ සතුන් සෙවීමෙහි ලා ඔහු ද වැද්දන් තරමට ම සමත් විය. එහෙත් එක් කාරණයකින් පමණක් හේ වැද්දන්ට වඩා දුර්වල විය. කිසි ම මගක් හසරක් නැති මහ වනයේ කිසියම් ඉවකින් මෙන් මග සොයා යාමේ ශක්තියක් වැද්දන් කෙරෙහි පිහිටා තිබිණ. මග සලකුණු මතක තබා ගැනීමක් ඔවුනට වුවමනා නො වී ය. ගල් කුළු මත දී හැර අනික් මහ වනයේ අහස පවා නොපෙනෙන කවර තැනක

වුවත් නියම මග සොයා යාමේ සහජ ඉවක් පරම්පරා ගණනක සිට උරුමව ඒමෙන් ඔවුන්ට අයත් ව තිබේ. හැන්ස්ට මේ දක්ෂකම නො පිහිටියේ ය.

මේ මහ වනයෙන් වෙන් වූ තලාවක් විලක් වැව් එළියක් වැනි එළිමහන් බිමක් ඇසුරු කිරීමේ ආසාවක් හැන්ස් තුළ බල පැවැත් වී ය. මොවුන් වසන මේ වනය දිග පළලින් සැතපුම් තිහක පමණ විශාල ප්‍රදේශයක් වුව ද මීට ඇතුළත් එවැනි එළිමහනක් කොතැනකවත් නො වී ය.

තමා කලින් සිටි විල්තෙරට යාමට ආසාවක් මෙවිට ඔහු තුළ උපන්නේ ය. එක් දිනක් හවස කෑම කා විවේක ව සිටින හැන්ස් වැදි පිරිස අමතා, ''හෙට මම ගමනක් පිටත් වෙලා යනවා හුඟ දවසකට ආපහු එන්නෙ නෑ,'' යි කී ය.

මෙයින් පුදුමයට පැමිණි බවක් පෙන්නූ රන්දුනා, ''ඇයි හූරා එහෙම කීවෙ? අර හාමුදුරුවන් ඉන්න ගල් ගෙට යනවා නෙ මෙයි මම හිතනවා. ඇයි එහෙ ආයෙමත් යන්නෙ නැහැ කීවා නේ,'' යි පැවැසී ය.

''නෑ, මම ගිහින් එන්ඩ ඕනෑ මා කලින් හිටපු විල අද්දරට. මම එතන කලක් හිටියා. එහෙ මගෙ යාළුවන් කීප දෙනෙක් ඉන්නවා. මම ගිහින් ඔවුන් දැකලා එන්නට ඕනෑ.''

''මොන යාළුවන් ද? අපි හිතාගෙන හිටියෙ මෙහාට එන්ට ඉස්සර වෙලා කිසි ම යාළුවකු හිටියෙ නැහැ කියාලායි.''

''ඔව්. මිනිස් යාළුවන් මට හිටියෙ නැහැ. ඒත් මට එහෙදි කිරි දීපු මීදෙනක්, නයකුගෙන් මගෙ දිවි ගළවා දීපු මුගටියෙක්. ඒ ඔක්කෝට ම වඩා ලොකු සුදු ගෝන නාම්බෙක් එහෙ ඉන්නවා.''

''මේ කතාව අහපල්ලකො. කවුද අහලා ඇත්තෙ සුදු ගෝනුන් ඇති වගක්?'' පෙමා සිනාසෙන්ට විය.

''ඒ උණාට ඒක ඇත්ත. හොඳයි උඹලා අහලා තිබුණා ද කළු දිවියන් ගැන නැත්නම් කතා කරන ගිරවුන් ගැන?''

''අපෙ හූරා කියනවා නම් ඒක ඇත්ත වෙන්ඩ ඕනෑ,'' මෙහිදී රන්දුනා කීවේ ය.

රනීගේ දෙනෙත මහත් විය. ''අපි සේරම යමු. මාත් ආසයි ඒ විල් එළිය දකින්ඩ.''

''ඔව්, එහෙනං අපි යමු,'' පෙමා ද එකඟ විය.

''හොඳයි, එහාට කොතෙක් දුර ද?'' රන්දුනා විමසී ය.

හැන්ස් අතේ ඇඟිලි සතරක් ඔසවා පෙන්වා, ''ඉර බහින තෙක් ගමන් කරලා මෙතෙක් දවසක ගමන් තියෙනවා,'' යි කී ය.

''එහෙම නම් අපට යන්ඩ බෑ. ඒක අපේ ගම් ඉමෙන් පිටයි.''

''මා දන්නා හැටියට නම් ඒ හරියෙ කවුරුවත් ම නැහැ.''

''ඒක වෙන්ඩ පුළුවනි. ඒත් ඒක අපේ වරිග නියමෙට විරුද්දයි.''

පසුව ද උදයේ හැන්ස් වැද්දන්ගෙන් සමු ගෙන, තම දුනු දණ්ඩේ ලැග සිටි ගිරවා ද එක් උරයක හිඳගත් බිම්බි ද තම ඇළයකින් ගමන් ගත් දීයා ද කැටුව ඒ දිග ගමනෙහි පිටත් විය.

හැන්ස් බොහෝ දුරක් යාමට පෙර රනී හතිලා ගෙන ඔහු වෙත දිව ආවා ය.

''ඇයි රනී? ඇයි මොකුත් කලබලයක් ද?'' හේ ඈ විමසුවේ ය.

''මාත් කැටුව යන්ඩ,'' ඕ ඇවිට්ලි කළා ය.

''මා කොහොම ද ඒක කරන්නෙ? රනීගෙ අප්පොච්චිත් අයියාත් මොනවා නො කියයි ද?''

''ඒ ඇත්තන් මොනවා කීවත් කාරි නෑ.''

''බැහැ, රනී අපට බැහැ එහෙම කරන්ට. රනීගෙ අප්පොච්චි කෝපෙන් පිපිරෙයි.''

''ඉතින් මට මොක ද?''

''ඒක කවදවත් මගෙන් කෙරෙන්නෙ නෑ රනී.'' ඈ කොතෙක් ඇවිට්ලි කළ ද හැන්ස් ඊට එකඟ නො වෙයි. රනී හැන්ස් හොඳින් අඳුනන්නී ය. ඔහුගේ මේ තීරණය ස්ථිර එකක් බව කියන හඬින් ම ඕ තේරුම් ගත්තා ය. හැන්ස් පිළිබඳ ඇගේ හැඟීම් රනී මින් පෙර කිසි විටෙකත් මෙසේ පෙන්වා නො සිටියා ය. පිරිහුන් යොවුන් වියේ අවුරුදු ගණනක් සිත තුළ මිරිකී සිටි ආලය පිළිබඳ හැඟීම් සියල්ලක් මෙවෙලේ මතු ව සිටියේ ය. එහෙත් ඒ නිසා මෝඩ එකියක මෙන් හැසිරීමට ඕ නො පෙළඹුණා ය. රනී හැන්ස්ට ආලය කළාක් මෙන් ම ඔහුට ගෞරව ද කළා ය.

උද්වේගයෙන් වෙවුලන අතක් ළයට තබා පෙන්වූ රනී, ''මට මගෙ මෙතෙන්ට හැඟෙනවා මේ ඇත්තන් ආයෙත් දකින්ට ලැබෙන්නෙ නැහැ කියලා. මේ ඇත්තන් ගල්ගෙන් බැහැලා එනවා එක්ක ම ගල් හූණෙක් ඇඬුවා.''

''විකාර ද රනී, ඔවා නිකං ගෑනු කතා,'' යයි කී හැන්ස් තමා ගේ අතක් ඇගේ උරය මත තබා, ''ටික දවසකින් ආයෙ මා දකින්ට ලැබෙනවා. හොඳ ළමයා වගේ ආපහු යන්ඩ ගල් ගෙට. අප්පොච්චිලා මෙලාකටත් හොයනවා ඇති රනී කොහි ගියාද කියලා.''

"ඉක්මනින් ආපහු එන්ඩ ඕනෑ," ඕ ඔහුට ඇවිටිලි කළා ය. "මේ ඇත්තන්ට මොනවා හරි නරකක් උණොත් මා දිවි තියා ගන්නෙ නැහැ."

එතැන සිට ගමනේ ගියේ සිතිවිලිවලින් බර වූ හිසක් ඇති හැන්ස් කෙනෙකි. මෙතෙක් තමා තුළ තුබුණේ දැයි තමා ම නොදත් වේගවත් හැඟීම් ඇවිසි ඇවිසී එන්ට විය.

බල්ලකු බුරන්නා වැනි බුරන හඬකින් හැන්ස්ගේ සිතිවිලි වැළ කැඩී ගියේ ය. ඒ හඬින් ම ඒ මුවකු බව තේරුම් ගත් හේ නැවතත් වන දඩයක්කාරයාගේ විලාසය ගත්තේ ය. මුවාගේ හඬ අනුව ගිය හෙතෙම මුවා විද මරා ගත්තේ ය. මේ කුඩා මුවාගේ බඩ පළා බඩවැල් ඉවත ඇද දැමූ හැන්ස් උගේ සතර පය එකට ගැට ගසා උරයේ එල්ලා ගෙන, ඉදිරි දෙතුන් දින දඩයමේ නොයෙදී දිගට ම ගමනේ යෙදෙන්ට ඉඩ ලැබීම වාසනාවකැයි සිතමින් නැවතත් ගමනට පිටත් විය.

හැන්දෑවේ එක් තැනක නැවතී මැස්සක් බැඳ ගිනි දල්වා මුව මස් තීරු වියලන හැන්ස් තමා සමග වැද්දන් මෙහි නොපැමිණීම ගැන සතුටු වූයේ ය. වනයේ අනික් තැන්වල මුවන් මැරීම ගැන ඔහුගේ නොකැමැත්තක් නොතුබුණ නමුත් තමා මේ යන ශාන්ත පරිසරයේ නිදහසේ සිටින මුවන් මැරීම ගැන හේ සතුටු නො වූයේ ය. මෙහිදී මුවන් විද මැරීම ඔහුට නොඉවසිය හැකි දෙයක් විය. තමා දුන් ඇටකටු විකමින් සිටි දීයා දෙස බලා සිටි හෙතෙම ඇයට මෙහිදී කොතරම් හොඳ විවේක කාලයක් ගත කළ හැකි වේ දැයි සිතුවේ ය. මෙකල දීයා වුවමනා ප්‍රමාණයට වඩා දඩයම් කරන්නියක නො වූවා ය.

විල් එළිය සොයා ඒමට හැන්ස් සිතුවාට වඩා වැඩි දින ගණනක් ඔහුට ගත විය. මේ විල් එළිය තෙරක් නැති මහ වනයේ එක් කුඩා කොටසක් විය. එසේ ම එය හැර යන ඔහු තුළ නැවත මෙහි ඒමේ අදහසක් ද නො වී ය. අනික් අතට ඔහු මෙයින් ගොස් දැනට සතර අවුරුද්දකි.

විල් එළියට සැතපුම් පහක පමණ දුරක් තිබියදී එක් දඩ මහක් හරහා යන හැන්ස්ට ලොකු මිනිස් පිරිසක් ඒ මගින් ගමන් කර ඇති ලකුණු දැකිය හැකි විය. මගට නැමුණ ගස්වල අතුපත් කපා හෙළා තිබිණ. සමහර තැනක ගස් පට්ටා ගසා තිබිණ.

මේ ඔහුගේ විමතියට කාරණයක් වූ හෙයින් හේ නැවතී කල්පනා කෙළේ ය. පෙනෙන ලකුණු දෙමසක් පමණ පරණ වූ ඒවා හෙයින්, මේ වනය මැදින් කිසියම් කාරියකට ගිය පිරිසක් විය හැකැයි ද, මේ වන විට ඒ පිරිස ගම්වලට ගොස් ඇතැයි ද සිතූ හේ කොයි එකටත් ප්‍රවේසමෙන් ගමන් කෙළේ ය.

අනතුරක් ළඟ ඇති බව මුලින් වටහා ගත්තී දීයා වූවා ය. සැක කටයුතු හඬක් කන වැටුණියක මෙන් දීයා හිටිපියේ සිට කන් ඔසවා හිස කෙළින් කර සිටියා ය.

එවැනි අමුත්තක් නොදුටු, අමුතු හඬක් නොඇසූ හැන්ස් අඩියෙන් අඩිය ඉදිරියට ගියේ හුඟ වේලාවකට පසු ව මිනිස් කට හඬක් වැනි හඬක් ඇසුවේ ය. හඬ ඇසුණේ විල දෙසිනි. නියං සමය පටන් ගෙන කලක් වන හෙයින් විලේ දිය බොහෝ දුරට අඩු වී ඇතැයි හැන්ස් සිතුවේ ය. සමහර විට පිරිසෙන් මඟ හැරී ගිය කොටසක් මෙහි නැවතී ඇතැයි හැන්ස්ට කල්පනා විය.

ගිරවා හා බිම්බි ද ගස්වලට යැවූ හැන්ස් හොරෙන් හොරෙන් හඬ ඇසෙන දෙසට ළං විය. හඬ ඔහු ඉදිරියෙන් ඇසේ. හේ මඟ වෙනස් කොට අනික් අතකින් ළං විය. ඒ අතිනුත් මිනිස් කට හඬ ඇසිණ. ඔහු එහි යාමට තැත් කළ හැම දෙසකින් ම මිනිස් කට හඬ ඇසිණ. ඝන වනයේ කිසි මිනිහකු ඔහුට දැකිය හැකි නො වී ය. මිනිසුන් කතාබහ කෙළේ ද පහත් හඬිනි. ඉඳහිට ඇසුණ ලී කපන හඬ අනුව මෙහි ලොකු මිනිස් පිරිසක් ඇතැයි හැන්ස් සලකා ගත්තේ ය.

මේ මිනිසුන් රාත්‍රිය ගෙවීමට මෙහි නැවතී ඇතැයි සිතූ හැන්ස් වනයේ දුරට ගොස් එදා රාත්‍රිය ගත කෙළේ ය. එහෙත් පසුව ද නැවතත් විල දෙසට පැමිණි ඔහුට මිනිස් පිරිස තවමත් එහි සිටිනු දැකිය හැකි විය. ඊ ළඟ දිනයෙහි ද එසේ ම විය.

මේ මිනිස් පිරිස නිසා දියකඩට ළං වී ගත නොහැකි වූ හැන්ස් පිපාසය සන්සිඳුවා ගැනීමට කුමක් කටයුතුදැයි කල්පනා කෙළේ ය. මෙසේ කල්පනා කරන අතර දීයා හුන් තැනින් නැගිට යනු දුටු හැන්ස් ඇය අනුව ගමන් කෙළේ ය. මීන් පෙර මෙවැනි දුෂ්කර අවස්ථාවල මෙසේ දීයා අනුගමනය කිරීමෙන් හැන්ස් හොඳ ප්‍රතිඵල ලබා ඇත. සිඳී ගිය දෙළ පාරක මහ ගසක මුල් අතර වලසුන් සාරා තුබූ දිය වළක් කරා දීයා කෙළින් ම ගමන් කළා ය. එයින් දිය බී පිපාසය නිවා ගත් හැන්ස් පුරුදු සංඥාවෙන් හඬ ගසා බිම්බි හා ගිරවා ද එහි කැඳවූයේ ය. ඔවුන් එකිනෙකා එකට හමු වන තැන එහි වී ය. හමුවන්ට වුවමනා හැම විටක ම එතැනට පැමිණීමෙන් එකිනෙකා හමු වූ නමුත් මෙහිදී දීයා ඔහුට නුදුරු ව ම හැසුරුණා ය. ඔහු කොතැනක සිටියත් සොයා ගෙන ළං විය හැකි පුදුම එළවන ගතියක් මේ දිවි දෙන කෙරෙහි වී ය.

මේ මිනිස් පිරිස වනයට වී කවර කාරියක යෙදී සිටිත් දැයි දැන ගැනීමේ ආසාවෙන් හැන්ස් එක් දිනක් හැන්දෑවේ ඔවුන්

සිටි දෙසට හැකි තරම ළං ව මහ ගසකට නැගී අවට බැලුවේ ය. ඔහුගේ නෙතට අසුවීමට එහි කිසිවෙක් නො වූහ.

මෙවිට වනයේ අඳුර පැතිරී ගොස් ඉවර ය. හැන්ස් ගසින් බසින්ට සූදනම් වන විට දුරින් එළියක් දුටුවේ ය. මේ එළිය එන්ට එන්ට මහත් වෙමින් තමා සිටි දෙසට පැමිණෙන බව පෙනී ගියෙන් හේ ගස උඩ ම සිටියේ ය. එළිය ගස යටින් යද්දී ඔහු දුටුවේ මිනිහකුගේ හිස මත නැමූ කෝණාකාර කූඩයක් වැනි දෙයක මුදුනෙන් මේ එළිය විහිදී එන බව ය. එළිය හිසින් ගත් මිනිහා පිටුපසින් දුනු හී ගත් මිනිස්සු දෙදෙනෙක් වූහ. මේ නම් රාත්‍රියේ දඩ සතුන් විද ගැනීමේ ක්‍රමයක් විය හැකැ යි ද මේ එළියෙන් ගිනිකණ වැටී යා ගත නොහැකි ව සිටින සතුන් පහසුවෙන් ළං වී විදගත හැකැ යි ද හැන්ස් සිතා ගත්තේ ය. පසුව ද උදයේ ඔවුන් ගිය මග අනුව ගමන් කළ හැන්ස්ට දඩයම් කළ සතකුගේ ඉවත ඇද දැමූ අතුණුබහන් දකින්ට ලැබීමෙන් පසු තමා සිතා ගත් සේ නිවැරදි බව හේ ඒත්තු ගත්තේ ය.

මේ කාරණය අනාවරණය කර ගැනීම ඔහුගේ සතුට පිණිස වූ නමුත්, මේ මිනිසුන් සමූහයක් ව වනයට වී කුමක් කරන්නේ දැයි යන ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට එය කිසි පිහිටක් නො වී ය.

වඩාත් ඔහුට ප්‍රහේලිකාවක් වූයේ මේ මිනිස් සමූහය රාත්‍රී කාලයේ ගිනිමැල නොදැල්වීම ය. දමල් කාලයේ පවා වැඩි කලබලයක් නොදැක් වූ ඔවුහු රාත්‍රියේ දෙතුන් දෙනා ගිය දඩයම් ගමන් හැර සිටි තැනින් පිට නො ගියෝ ය.

ඔවුන් කිසියම් විශේෂ කාරියක යෙදී සිටින බව දුන් ඔහුට නිසැක ය. ඒ කාරිය කවරක් දැයි නිශ්චය වශයෙන් දැන ගැනීමට හේ අධිෂ්ඨාන කර ගත්තේ ඒ අඳුරේ ම විල වටා යමින් හැකි තරම ඔවුන්ට ළං විය. පිරිස සිටින ඉසව්ව දැක්වීමට කිසි ම එළියක් හෝ ශබ්දයක් හෝ නො වී ය. ඔහුට උපකාර වූයේ ඉඳ හිට ඔවුන් එහා මෙහා යන යම්තම් පියවර හඬත් සෙමින් කථා කරන හඬත් පමණකි. එහෙත් රාත්‍රී කාලයේ හොඳින් දැකීමට තරම ඔහුගේ දෙනෙත අඳුරට පුරුදු ය. විල වට කොට සම්පූර්ණ වටයක් පමණ ගිය තැන මිනිසුන්ගෙන් හිස් එක් ඉඩවරයක් ඔහුට පෙනී ගියේ ය. ඒ ඉඩවරය වරක් තමා වාස-ස්ථානය කොට ගෙන සිටි මහ ගස අසලින් විය.

ඔහු මේ බව අනාවරණය කර ගන්නා විට මධ්‍යම රාත්‍රිය පසු වී ගොස් තිබිණ. තමාට මේ ගස උඩ නො පෙනී සැඟ වී සිටීමට හැකි කම ගැන හොඳ විශ්වාසයක් තුබුණ හැන්ස් මේ ගස උඩට වී පසු ද දවස ගත කිරීමෙන් ඔවුන්ගේ කටයුත්ත කවරක් දැයි දැන ගැනීමට සිතා ගත්තේ ය.

හිමිදිරි උදයේ ම ගසට නැග ගත් හැන්ස් විලත් අවට පෙදෙසත් පරීක්ෂා කර බැලුවේ ය. පෙනෙන මානයක කිසිවෙක් නො වූහ. එහෙත් පැයකට පමණ පසු ඔහු සිටි කෙළින් ම විලේ අනික් පැත්තේ සිට එක් මිනිහෙක් විල් එළියට බැස එහි සාරා තුබූ වළකින් ලබු ගෙඩියකට දිය ගෙන ආ මගින් ම ආපසු ගියේ ය. ඔහුට පසු ව අනිකෙක් ද අනිකෙක් ද වශයෙන් පනස් දෙනෙක් පමණ මෙසේ දිය ගෙන ගියෝ ය. එහෙත් එක් වරකට එකකුට දෙන්නකුට වඩා එහි නො ආවෝ ය. හැම දෙනකු ම ආවේ ද මේ එක ම වළට ය. මේ ඔවුන්ට එදිනට නියමිත දිය ප්‍රමාණය සේ සිතා ගත හැක. එයින් පසු දවසේ ඉතිරි කාලය තුළ එක ම මිනිහෙක්වත් විල් එළියට නො පැමිණියේ විය.

එහෙත් මේ මිනිසුන් විල අද්දර වනයේ වැඩක යෙදී සිටින බවට ලකුණු වශයෙන් ඉඳ හිට ලීයකට කොටන හඬක් ඇසීමත් කෙනකු දෙන්නකුගේ සේයාවන් දකින්ට ලැබීමත් ඇති විය.

ඉර නැගුණ විට විල වට කොට සිටි වනය පරීක්ෂාවෙන් බලන ඔහුට ගස් අතර සැඟවෙන සේ ළං ළං ව උස ඉනි සිටුවා බඳින ලද වැටකින් විල වට කොට තිබෙන සැටියක් පෙනී ගියේ ය. ඉඩවරයකට තුබුණේ ඔහු සිටින කොටසේ යාර දෙසීයක තරම වූ කොටසකි.

හැන්ස් එද ටිකී සමග එකතු වී දවස ගෙවුවේ ය. හැන්ස් දුටු කෙණෙහි ම ළඟට දිව ආ මේ මුගටියා ඔහුට තුරුළු වී සිටියේ ය. හවස් කාලයේ ඔහු සිටි ගස පසු කර ගිය ඌරෙක් බොහෝ වේලාවක් විමසිලිමත් ව බලා සිට විලට බැස දිය බී ආ මගින්ම ආපසු ගියේ ය. එයින් පසු ව සිවල්ලු දෙදෙනෙක් ද එසේ ම කළෝ ය.

රාත්‍රී කාලයේ ඔහුට ඇසුණු කුර හඬ අනුව මුව රංචු හා වෙනත් සතුන් ද දිය බීමට එහි පැමිණි සේ සලකා ගත්තේ ය.

මේ කලබලයේ තේරුම කවරක් දැයි සලකා ගත නොහැකි වූ හැන්ස්, කවරක් වුවත් ඔවුන්ගේ කටයුත්ත රාත්‍රී කාලයේ කෙරෙන එකක් විය හැකැයි සිතා ගත්තේ ය. දවස තිස්සේ මෙතැන මෙසේ සිටීමෙන් බඩගින්නෙන් හා පිපාසයෙන් පීඩිත වූ හේ ගසින් බැස දිය වළ කරා ගොස් දිය බීවේ ය.

දවල් කාලය තුළ නිදගත් හේ රාත්‍රියේ ආපසු මේ ගසට පැමිණ නැවතත් මුර කිරීමෙහි යෙදුණේ ය.

දින කීපයක් යන තුරුත් මේ තත්වය මෙසේ ම පැවැත්තේ ය. මෙය කිසි දිනෙකත් ඉවර නොවන කාරියක් විය හැකැයි හැන්ස්ට සිතුණේ ය. මෙතෙක් සද්ද බද්ද කිසිවක් නැති ව නිශ්චල ව

තුබුණ විල අවට මහ වනය හදිසියේ ම කලබල සහිත විය; ඝෝෂා සහිත විය. ඔවුන් මෙතෙක් අහලකට වත් නොපැමිණි වැටේ ඉඩවරය දෙසින් මේ සියලු ම කලබල ඇසෙන්ට විය. ඔවුහු එකිනෙකා උනන්දු කරවමින් කෑ ගසමින් කලබල ස්වභාවයක් ඇති කළෝ ය. වැටේ ඉඩ තබා තුබූ තැන වෙතට රොක් වූ මිනිස්සු උරයෙන් උරය ගටා සිට කපොල්ල වසා ඉනි සිටුවා වැට බඳින සැටිත් තවත් මිනිස්සු ඉනි මිටි මිටි ඔවුන් වෙතට ගෙන ආ සැටිත් යාර පනහකට පමණ දුරින් සැඟවී බලා සිටි හැන්ස් දුටුවේ ය.

අතනින් මෙතනින් ඇසුණ තැති ගත් මුවන්ගේ හූ හඬින් ඔවුන් රංචුවක් ම වට කරනු ලැබ සිටින බව හැන්ස් වටහා ගත්තේ ය. මේ මිනිසුන්ට මුවන් මරා ගන්ට වුවමනා වූයේ නම් ඔවුන් දිය බීමට විලට බසින විට සැඟ වී සිට මුව රෑන ම විද ගැනීමට හැකි ව තිබියදී මෙවැනි කලබලයක් කිරීමේ හේතුව කුමක් දැයි සිතන ඔහුට සමහර විට මේ මිනිසුන් මුවන් නොමරා අල්ලා ගැනීමට මෙසේ කරනවා ඇතැයි කල්පනා විය.

රාත්‍රියෙහි අඳුර දැඩි විය. මෙතෙක් පැවති මිනිසුන්ගේ කලබල ගතිය ප්‍රීති ඝෝෂාවකට හැරුණ බව අසා සිටි හැන්ස්ට තේරුම් ගියේ ය. සමහර විට ඔවුන් මෙතෙක් උත්සාහ කළ කාරිය මෙවිට සම්පූර්ණ කර ගත්තා විය හැක.

මෙතෙක් දවස් නොදල් වූ ගිනිමැල මෙවිට තැනින් තැන දල්වී පෙනෙන්ට විය. ඒවා වටා හිඳගත් මිනිස්සු දුෂ්කර කාරියක් කොට නිමා කළ අවස්ථාවකදී මෙන් කලබල ස්වභාවයකින් එකිනෙකා හා කථා කළෝ ය.

උදේ එළිය වැටුණ විට හැන්ස් සිටි තැනට අසල වූ මිනිස්සු නැගිට ගොස් සෙස්සවුනට එකතු වූහ. මෙතෙක් ගසේ සැඟවුණ දෙබලක වැතිර ගෙන සිටි හැන්ස් එතැනින් නැගිට වඩා හොඳට අවට බලා ගැනීමට ගසේ ඉහළට නැග ගත්තේ ය. විල් එළියට මැදි වී තැති ගෙන සිටි කුඩා කුඩා මුව කණ්ඩායම් බියෙන් එහා මෙහා දුවනු මෙහිදී හැන්ස්ට දැකිය හැකි විය. ඒ සමග ම බියෙන් ඇඟ කිළිපොළා යන දර්ශනයක් ඔහුගේ දෙනෙතට අසු විය. සුදු ගෝනා මේ සතුන් අතර වැටට මැදි වී සිටියේ ය. මේ මිනිසුන් මෙතෙක් මහත් උත්සාහයක් ගෙන ඇත්තේ මේ දුර්ලභ වටිනා සතා අල්ලා ගැනීමට බව එක වර ම ඔහුට අවබෝධ විය.

නිතොර ව ම වන වදුලේ සැඟවෙමින් ජීවත් වුණ මේ දුර්ලභ සතා විල් එළිය මැද හාරසීයකට අඩු නොවන මිනිසුන් සමූහයක් මැද එළිපිට ම මෙසේ සිටිනු දුටු හැන්ස්ගේ ඇඟේ ලේ නටන්ට

විය. මේ මිනිස්සු මෙතෙක් සිටි අනෙක් කිසි ම සතකු දෙස නෙත් නොහෙළා සුදු ගෝනා දෙස ම නෙත් හෙළා සිටියහ.

මදු ගසන්නෝ මදුත් රැගෙන පැමිණියෝ ය. විශාල මිනිස් පිරිසක් උල් රිටි අතින් ගෙන අඩ කවයක් ව සැදී සුදු ගෝනා ගාලේ කොනකට කොන් කර ගැනීමේ අදහසින් ළං ළං ව ආවෝ ය. එන්ට එන්ට වටය කුඩා වී තමා කොටු වේගන එන බව දුටු සුදු ගෝනා තැති ගෙන පලා යන්ට දිව ගියේ වැටේ හැපී ආපසු හැරුණේ ය. ඊළඟට මිනිස් වටය දෙසට හැරුණ ගෝනා මිනිසුන්ගේ කෑකෝ ගැසීම් හෝ තරවටු හෝ නොතකා ඔවුන් වෙත වේගයෙන් දිව ගියේ බොහෝ දෙනකු තුවාල කොට තවත් බොහෝ දෙනකු පෙරළා ගෙන වටයෙන් පිට පැන ගියේ ය. එහෙත් එයින් අධෛර්‍යයට නොපැමිණි මිනිස්සු නැවතත් ඌ වට කොට ගත්හ. ගැළවී යන අතක් නොදුත් සුදු ගෝනා හතිලමින් හිටිවන ම බලා සිටියේ ය. උගේ බිය ඒ විශාල දෙනෙතින් හොඳ හැටි පෙනෙන්ට තිබිණ. ඒ අතර හදෙනෙක් පමණ වූ මදුකාරයෝ ගෝනා වෙත ළං වන්ට වූහ. පැන යාමට කරන අන්තිම උත්සාහයක් හැටියට හේ තව වරක් වේගයෙන් දිව ගොස් වැට උඩින් පැනීමට උත්සාහ කෙළේ ය. ප්‍රතිඵලය වූයේ වැටේ ඉන්නක ඇමිණී සිටීම ය. එයින් ගැළවීමට දඟලන ගෝනා උඩු අතට බිම පතිත විය. මේ අවසරයෙන් එහි ළං වූ මදුකාරයෝ සතා තරයේ අල්ලා බැඳ ගත්තෝ ය.

මේ නටන නාටකය කෝපයෙන්, ශෝකයෙන් හා වැගිරෙන කඳුළෙන් ද යුතු ව හැන්ස් බලා සිටියේ ය.

විරුද්ධකම් පා දඟලමින් සිටි සුදු ගෝනා රැක් සෙවණේ විශේෂයෙන් තැන වූ කූඩුවකට ඇතුළු කරන ලද්දේ ය. මේ කූඩුව මිනිසුන් හය දෙනකුට කර තබා ඔසවා ගෙන යා හැකි, දෙපසින් විශාල රිටි දෙකක එල්වන ලද්දක් වී ය.

මේ අතර ඉතිරි මිනිසුන්ගේ ඊමුණත්වලින් මුව රැළේ මුවෝ එකිනෙකා මරණයට පත් වූහ. පණ පිටින් අල්ලා ගනු ලැබූ මුව පොව්වන් දෙදෙනෙක් පමණක් එයින් ඉතිරි වූවෝ වූහ.

තමන්ගේ කාරිය සාර්ථක ලෙස ඉවර කළ මිනිසුන් මෙවිට නිදහසේ එහා මෙහා හැසිරෙන්ට වූ හෙයින් එද මුළු දවසේ ම ඒ ගසේ සිර වී සිටීමට හැන්ස්ට සිදු විය. තම හිතවතාට සිදු වූ අතවරය ගැන පිහිටක් වීමේ අපොහොසත්කම ගැන හැන්ස් කම්පා විය. හේ ඇඬූ කඳුළින් යුතු ව කල්පනා කෙළේ ය. කොලුවකු ව සිටින තමා මෙතරම් විශාල පිරිසකට විරුද්ධ ව කුමක් කරම් දැයි හේ ළතැවුණේ ය.

ලොකු ගිනිමැසි කීපයක් බැඳී, දඩයම් කළ මුවන්ගේ මස් ඒවායේ වියළෙන සැටි හා වන කපුටන් මෙන් ම උකුස්සන් ද ඒ මළ සතුන්ගෙන් ඉවත් කළ බොකු බඩවැල් එහා මෙහා ඇද කමින් සිටින සැටි ද එහි දැකිය හැකි වී ය.

රාත්‍රිය එළඹියේ ය. මේ මිනිසුන් හැසිරෙන සැටියෙන් ම ඔවුන් තවත් දිනක් මෙහි නතර නොවන බව වටහා ගත් හැන්ස් වහා ක්‍රියා කළ යුතු බව සිතා ගත්තේ ය.

පැය ගණනක් ගෙවී ගිය නමුත් කිසිවක් කර ගැනීමට කිසි ඉඩක් නොලැබූ හැන්ස් නොඉවසිලිමත් විය. ගිනිමැල ක්‍රමයෙන් එකිනෙක නිවී යන්ට විය. මිනිසුන්ගේ කතාව අඩු වී නිශ්ශබ්දතාව පැතිර ගියේ ය. දෙමසක් තිස්සේ වෙහෙසී කර ගෙන ගිය රාජකාරිය සාර්ථක වී ඉවර ය. අසු කර ගන්ට උත්සාහ කළ දුර්ලභ සතා කූඩුවේ සුරක්ෂිත ව සිටී. පසු ගිය දෙතුන් දින තුළ වූ දැඩි වෙහෙස නිවා ගැනීමට මිනිසුන්ට අවස්ථාව පැමිණ තිබේ. රාත්‍රී කාලය තුළ නිදි වරා මුර කිරීමෙහි යෙදීමේ වුවමනාවක් නැත. තව ඉදිරියට දින කීපයක ගමන්වලට මුහුණ පෑ යුතුව ද තිබෙන හෙයින් ඔවුහු ඒ ඒ තැන වැටී නිද ගත්තෝ ය. මේ මෙසේ වුව ද සුදු ගෝනා ලන ලද කූඩුව අවට දැඩි මුරකාවල් යොද ඇති බව හැන්ස් දත්තේ ය.

තමා මේ කරන්ට යන්නේ කුමක් දැයි හරිහැටි නොදන හැන්ස් තමා සිටි ගසින් බැස ගත්තේ ගොදුරකට මාන අල්ලන දිවියකු මෙන් ඉතා නිශ්ශබ්දව කූඩුව ඇති දෙසට යන්ට වී ය. විල් එළිය හරහා නො ගිය හේ විල වට කොට ගස් අතර සැඟවෙමින් වනාන්ත දිගේ ගියේ ය.

සුදු ගෝනා සිරකර ඇති මැදිරිය අසලට මෙසේ පැමිණි හැන්ස් ඒ වටේ තැන් තැන්වල වැතිරී නිද සිටි මිනිසුන් අතරෙන් වන සතකු මෙන් හතර ගාතයෙන් සිට ඉතා සීරුවෙන් ගමන් කෙළේ ය. අත්තක් පතක් පෑගීමෙන් හෝ යම්තම් ශබ්දයක් නැඟුණේ නම් මිනිසුන් අවදිවීමෙන් මොහොතකින් ඔහුත් සිරකරුවකු වීමට ඉඩ තිබිණ. මෙසේ යන ඔහු කූඩුවට යාර කීපයකින් ළං ව සිටියදී ගෝනාගේ දැඟලීම නිසා වූ ශබ්දයෙන් එක් මිනිහෙක් අවදි විය. එකෙණෙහි ම හැන්ස් බිම දිගා වී වැතිර ගත්තේ ය. අවදි ව නැඟිට හිඳගත් මිනිහා ගිනිමැලය දෙසට නැඹුරු ව ගිනි පෙනෙල්ලක් සොයා නොලැබ තොල් මතුරමින් ගෝනා සිටි මැදිරිය වෙත ගියේ ය. එය හොඳ හැටි පරීක්ෂා කර බලා එහි අමුත්තක් නැති බව හොඳින් තේරුම් ගත්තේ ආපසු ගොස් නැවතත් නිද ගත්තේ ය.

මඳ වේලාවකට පසු ව හැන්ස් නැවතත් මැදිරිය දෙසට ඇදෙන්ට විය. ඔහුගේ සිතේ මෙවිට පැවති එක් බියක් නම් ගෝනා තමා නොහැඳින කලබලයක් කොට මිනිසුන් අවදි කරවතැ යි යන්න ය. එතැනට ගිය හෙතෙම මැදිරියේ බැමි අතරෙන් අතක් ඇතුළට දමා සතාගේ හොම්බ අත ගැවේ ය. අත ඉව කළ සතා එය හැඳින ලෙව කන්ට වූයෙන් තමාගේ මිත්‍රයා කලකට පසු තමා හඳුනා ගත්තේ යයි සතුටට පැමිණි හැන්ස් උගේ මුහුණ හා බෙල්ල ද අතගා සෙමින් තට්ටු කෙළෙන් කාරණය තේරුම් ගත්තා සේ හැඟ වූ ගෝනා කිසි ම ශබ්දයක් නොකොට නිශ්චල ව සිටියේ ය.

දිගෙන් වැඩි පළලින් අඩු වූ මේ මැදිරිය වඩා ඉඩකඩ ඇති එකක් නො වී ය. මෙවිට කාරියට බට හැන්ස් මේ සඳහා ම ඊගසකින් වෙන් කොට ගෙනවුත් තුබුණ ඊතලය අතට ගෙන එහි ඉදිරි කොටසේ ලී බැඳ තුබුණ ශක්තිමත් වැල්පටවල් එකිනෙක කපන්ට වී ය. ශබ්ද නො නගින සේ මේවා කපා ලී බිමට පහත් කළ හැන්ස් ඒ පසු වුණ හැම මොහොතක ම කිසිවකු අවදි වේ දැයි පරීක්ෂාවෙන් බැලුවේ ය. සතාට පිට වීමට තරම මහත කපොල්ලක් මෙසේ ඇති කර ගත් හැන්ස් ඉන් පසු සුදු ගෝනාගේ එක් අං අත්තකින් අල්ලා උගේ හිස පහත් කෙළේ ය. අං අතු ලීවල වැදීමෙන් ශබ්දයක් ඇති වේය යන බියෙන් හේ එසේ කෙළේ ය. ඉන් පසු හේ ගෝනාගේ එක කනක් මිරිකා අල්ලා ගෙන හෙමින් සැරේ අඩියෙන් අඩිය ඌ ඉස්සරහට ගත්තේ ය. ගෝනා ද සුළු ශබ්දයක් පවා නො කොට මැදිරියෙන් පිටතට ආවේ ය. හැන්ස් උගේ කන අත හැර ගෙලට අතක් තබා ගෙන නිදා සිටි මිනිසුන් අතරෙන් ඌ දක්කාගෙන යන්ට විය. හැන්ස් ඉඩ දුන් තරමට වඩා ඉක්මනින් යාමට උත්සාහයක් නොකළ මේ වන සතා ඉතා සෙමින් මිනිසුන් අතර ගමන් කෙළේ ය.

මොහු දෙදෙන නිදා සිටි මිනිස් වළල්ලෙන් පිට වන්ට ඉතා ළං ව සිටියදී නිදා සිටි මිනිහෙක් විහිදා ගෙන සිටි එක් අතක් ගෝනාගේ පස්සා පයට පෑගීම නිසා ඒ මිනිහා අවදිව වේදනාවෙන් කෑ ගසන්ට විය. සුදු ගෝනා සිර මැදිරියෙන් පිට ව සිටිනු දුටු මේ මිනිහා ඒ බව කියා මොර දෙන්ට වූයෙන් නිදා සිටි පිරිසේ හැම දෙනා ම කලබල ව අවදි වූවෝ ය. අඩ නින්දේ සිටි තවත් සමහරු අලි වටයක් පැන්නේ යයි සිතා කෑකෝ ගසමින් කලබල කළෝ ය.

සතර අතින් ආ මිනිස්සු හැන්ස් හා සුදු ගෝනා ද වටකර ගත්තෝ ය. එක් මිනිහෙක් පැන ගෝනාගේ අඟකින් අල්ලා ගත්තේ ය. ගෝනා උගේ අඟින් අල්ලා ගත් මිනිසා පසෙකට

විසි කෙළේ ය. මිනිහා අඳුරේ විලාප ගසන්ට විය. මේ අතර හැන්ස් ගෝනාගේ පිට උඩට පැන මිත් ඉහත කර පුරුදු ලෙස දෙපයින් සන් කෙළේ ය. එක පිම්මට මිනිස් වටයෙන් ඉවතට පැනගත් ගෝනා විදිලියක වේගයෙන් දුවන්ට විය. පිනූ පිම්මට හැන්ස් නොවැටී බේරුණේ යම්තමිනි. හැන්ස් අතින් උගේ



හැන්ස් ගෝනාගේ කරෙන් අල්ලා ගෙන ඌ ඉවතට ගෙන යයි.

ගෙල තද කිරීමෙන් දුන් සංඥව අනුව දුව ගිය ගෝනා ඔහු කල්තබා ම සාද තුබූ වැවේ කපොල්ලකින් පිට වී මහ වනයට වැදුණේ ය. කෝපයෙන් කෑ ගසන මිනිසුන්ගේ හඬ ටික වේලාවකින් ඔවුන්ට නො ඇසී ගියේ ය.

සැතපුම් කීපයක් දුර ඉක්මෙන තුරුත් ගෝනා තම පිම්මේ වේගය අඩු නො කෙළේ ය. තමාගේ බරින් සතාට වෙහෙස ඇති බව තේරුම් ගත් හැන්ස් උගේ පිටෙන් බිමට පැන්නේ උගේ

පිටට තට්ටු කර ඇඟ අත ගෑවේ ය. එහි සිට මඳක් විඩා හැරිය හැන්ස් නැවත වරක් ඌට සන් කර ගමන අරඹා, උගේ ඇළයකින් දිව ගියේ ය. ඔවුහු මෙසේ දිව ගියේ ගෝනාගේ අං අතු පටලැවීමක් නැති ව යා හැකි අඩමංවල ය. එහෙත් මෙතැන් සිට ඔවුහු මහ කැලයට වැදුණෝ ය. ඔවුහු පැය ගණනක් ම මෙසේ දිව ගියෝ ය. දෙදෙනාට ම හොඳට වෙහෙස දැනී විඩා හැරීමට මොහොතක් නැවතුණ තැනකදී හැර අතරක නො නැවතුණෝ ය. ඝන කැලෑවට වැදුණු මේ යහළුවෝ දෙදෙන එහි එක් තැනක එකිනෙකා ඇළයේ වැතිර ගත්තෝ ය. රෑ දෙකක් ම නිදි නොලබා සිටි හැන්ස් තද නින්දකට වැටුණේ ය.

මේ මිනිස් හමුදව අතර වැද්දෝ දෙදෙනෙක් ද වූහ. ඉන් එකෙක් වනයේ හැසිරෙන වැද්දෙකි. වනයේ හැසිරෙන මොහු මේ සුදු ගෝනා දැකීමෙන් ඒ බව කියා ඇවිදින්ට විය. කටින් කට ගිය මේ පුවත රජුගේ කනේ වැකුණේ ය. විශේෂයෙන් වන සතුන්ට ආසා කරන රජ සුදු ගෝනා අල්ලා ගෙන ඒමට මෙසේ මේ පිරිස එවී ය. අනික් වැද්ද විදීමේ ඉතා දක්ෂයකු ලෙසත් හොඳ හැටි වන මං දන්නකු ලෙසත් ප්‍රසිද්ධියක් ලබා සිටින, රජ මැදුරට දඩමස් සපයන වැද්ද විය. සුදු ගෝනා අල්ලා ගෙන ඒමේ සම්පූර්ණ වගකීම ඇත් පන්තියේ නායකයාට භාර විය. වල් ඇතුන් හා වෙනත් වල් සතුන් ද අල්ලා ගැනීමෙහි පළපුරුදු දක්ෂ පිරිසක් මොහු යටතේ විය. ඔවුන් සමග එවූ විදුනෝ ද එහි විය. විදුනේට රජුගෙන් අණ ලැබුණේ රජු ආසා කරන සුදු ගෝනා අල්ලා ගෙන ම මිස හිස් අතින් ආපසු නොඑන හැටියට ය. තමාගේ අදහස මුදුන්පත් නොකරන්නවුන් කෙරෙහි රජුගේ අනුකම්පාවක් නොවන හෙයින් මේ රාජකාරිය ඉටු නොකර ආපසු යාම ඔහුගේ ජීවිතයට අන්තරායකර දෙයක් ද විය හැක. මෙවේලේ කරුණු සිදු වූ සැටිය නිසා මොහු දෙදෙනා කෝපයෙන් හා රජු කෙරෙහි බියෙන් ද වියරු ව ගියෝ ය. සති ගණනක් තිස්සේ දරුණු කිනිතුල්ලන්ගෙන් ගහන, දිය සිඳී වියලී ගිය මහ වනයට වැදී දුක් විඳ ගෙන වෙහෙසී අසු කර ගත් සතා මෙසේ අතුරුදන් වීම ඉවසිය හැකි තරම් එකක් නො වී ය.

විදුනෝ මේ ගැන මුලින් සිතුවේ මේ පිරිසේ ම සිටින තමාගේ සතුරකු විසින් මේ ද්‍රෝහී ක්‍රියාව කරන ලදැයි කියා ය. එහෙත් මිනිහකු ගෝනා පිට නැගී පලා ගිය ඒ අපූරු දර්ශනය දුටු බොහෝ දෙනා වූ හෙයින් හේ ඒ අදහස අත්හැර දැමී ය.

වහා ම පිරිසේ මිනිසුන් ගැණ බැලීමට විදුනෙන්ගෙන් අණ ලැබිණ. දල්වා ගත් පන්දම් එළියෙන් මිනිසුන් ගැණ බැලූ විට පිරිසේ එකකුත් නොඅඩු ව එහි සිටියෝ ය.

සතා හුන් මැදිරිය පරීක්ෂා කර බැලූ විට එහි වැල් පටවල් කපා තිබෙන බව පැහැදිලි විය.

මුවහත් දෙයක් උඩ පය තැබූ එක් මිනිහෙක් ඒ කුමක් දැයි අතට ගෙන බැලූ විට එය දණ්ඩෙන් කඩා වෙන් කර ගත් ඊතලයක් බව පෙනී ගියේ ය. එවිට මේ ගැන වැද්දන් සැක කළ විදනේ ගෝනා මුදා හැරීම ගැන ඔවුන්ට චෝදනා කෙළේ ය. මහ වැද්දා මේ කතාවට එකවර ම විරුද්ධ විය. එපමණක් නොව හේ ඔහු මරන බවට සපථ කොට පොරොව අතට ගත්තේ ය. විදනේ බියෙන් හැකිළී ගියේ ය. අනික් හැම දෙනාමත් තරයේ බිය ගත්තෝ ය.

මෙවිට පිරිස අතර සිටි එක් මිනිහෙක් කථා කොට, මේ වනයේ වැද්දකු මෙන් හැසිරෙන සුදු මිනිසකු ඇති බවත් ඒ සුදු මිනිහා වන සතුන් සමග විශේෂ හිත්වත්කම් ඇති කර ගෙන ඇති බවත් මේ සතා නිදහස් කර ගෙන යාම ඔහුගේ වැඩක් විය හැකි බවත් මතක් කර දුන්නේ ය. ගෝනා පිට නැගී ගිය තැනැත්තා සුදු මිනිහකු මෙන් ඒ අඳුරේ පවා පෙනුණ බව තවත් සමහර කෙනෙක් කීහ.

චිත් කෑ සතකුගේ ලේ පාර අනුව යන දඩ බල්ලන් මෙන් වැද්දෝ හුළුඑළි ගෙන ගෝනා ගිය මග සොයා ගියෝ ය. ඔවුන් අනුව තෝරා ගත් හොඳ ම දුනුවායන් දෙළොස් දෙනෙක් හා ඇත් පන්තියේ රාළ ද පස්සේ ගමන් කළෝ ය.

# 17

## අඹා යාම

සුදු ගෝනා විසින් හොම්බෙන් ඇන අවදි කරනු ලැබූ හැන්ස් නැගී සිටියේ ය. ගෝනා දෙනෙත් මහත් කොට ගෙන දෙකන් ඔසවා නැති ගත් ස්වාභාවයකින් සිටිනු දුටු හේ සැකය තහවුරු කිරීමට හේතු ඇද්දැයි විමසීමට ප්‍රමාද නොවී වහා ඉදිරියට පැන ගෝනාගේ කරට අතක් තබා ගෙන ඌත් සමග දුවන්ට වන්නේ ය.

පුරා දෙපැයක් එක වේගයෙන් දිව ගිය ඔවුහු හොඳට ම වෙහෙස ව එක් තැනක නැවතුණෝ ය. පසු ගිය දෙදින තුළ මිනිසුන්ගේ කටයුතු පරීක්ෂාවෙන් බලා සිටි ඔහුට ආහාර පානයක් නොමැති ව සිටි හෙයින් හැන්ස් මෙවිට දුර්වල ව සිටියේ ය.

රාත්‍රිය පහන් වේගන එනු දුටු ගෝනා අනතුරක ඉව දැනී නොඉවසිලි ගතියක් දක්වන්ට විය. ඔවුන් අඹා එන්නෝ වේගයෙන් එති. හැන්ස්ගේ ධෛර්‍ය්‍යය හොඳට ම පිරිහී ගොසිනි. ඔහුගේ ගමන් වේගය පෙරට වඩා බොහෝ අඩු විය. ඔහුගේ දෙපා එළෙන්ට විය. දෙතුන් වරක් ම හේ පැකිල වැටුණේ ය. දෙකන් මුල නාඩි වේගයෙන් වැටෙන්ට විය. දිව එළෙන්ට විය. ඔහු නිසා ගෝනා වරින් වර නැවතී බලා සිටියේ ය. ගෝනා පිට නගින්ට අදහස් කළ හෙතෙම තමාගේ බරින් ඌට වෙහෙස විය හැකි හෙයින් ඒ අදහස අත් හැරියේ ය. දෙදෙනා ම එකට පලා යාමට උත්සාහ කිරීමෙන් දෙදෙනා ම සතුරන් අතට අසු විය හැකි බව ඔහුට පෙනී ගියේ ය. මහ වනයේ පලා යාමට මිනිහකු තෝරා ගන්නා මග ගෝනකු තෝරා ගන්නා මග නො වේ. එහෙයින් දෙදෙනා වෙන් වෙන් ව යැම දෙදෙනා ගේ ම යහපතට හේතු විය හැකැයි සිතූ හැන්ස් තමාගේ පිය සටහන්වලට වඩා පහසුවෙන් ගෝනාගේ පිය සටහන් සොයා ඒමට පහසු වෙතත් ඔවුන් එකිනෙකා වෙන් වූ විට දඩ බල්ලන් නොමැති ව ගෝනා අල්ලා ගැනීම පහසු නොවන හෙයින් ඔවුන් පිය සටහන් අනුව තමා සොයා එන බව ද සලකා ගත්තේ ය.

මෙයින් පසු ව අඹා එන්නෝ තමා අනුව එන බව හොඳ හැටි තේරුම් ගත් හේ තැති ගෙන සිටි සුදු ගෝනාගේ උරයට අතින් ගසා වනය බිඳ ගෙන යන සේ ඌ එළවා දැමුවේ ය.

මෙතැන් සිට හැන්ස් වේගයෙන් දිවීම හැර සැඟ වී ගමන් කිරීමට ඉටා ගත්තේ ඝන වනයේ බඩවැටි අතරෙන් රිංගා ගියේ ය. අඹා එන්නවුන් මුළා කරවන සේ වට මංවල ගමන් කෙළේ ය. සමහර තැනකදී ගසකට නැග ගසින් ගසට පැන ගොස් පිය සටහන් වළහා ගියේ ය. තවත් දුරක් පයින් ගොස් නැවතත් ගස් උඩින් ගමන් කෙළේ ය.

හඹා එන්නවුන්ගේ හඬක් ඇසේ දැයි දැන ගන්ට විටින් විට නැවතී කන් දුන් නමුත් ඔවුන් ළඟ එන බවක් හැඟවීමට තරම් ශබ්දයක් ඔහුට ඇසුණේ නැත. සමහර විට ඔහු ඔවුන් වල්මත් කිරීමට යෙදූ උපායන් නිසා ඔවුන්ගේ ගමන් වේගය බෙහෙවින් බෙල හීන ව ගියා සේ ය. ඔහු හිතුවේ තමන් ලුහුබඳින සියලු දෙනාගෙන් බේරී දැන් සැඟ වී සිටින බව ය.

මෙසේ යන හැන්ස් එක් තැනකදී බොහෝ දුරක් ගස් උඩින් ම ගියේ සැඟ වී සිටීමට ඉතා සුදුසු එක් මහ ගසකට නැඟුණේ ය.

පැයක් ගත විය. වනයේ නිශ්චලතාවට බාධා වන කිසි ම ශබ්දයක් ඇති නො වී ය. ඊළඟට දුර වනයේ සිහින් මිනිස් කට හඬක් ඇසෙන්නා සේ ඔහුට හැඟිණ. දැන් මෙතැන ම සැඟ වී හිඳිම් ද ගසින් බැස අන් තැනකට පලා යම් දැයි හැන්ස් කල්පනා කෙළේ ය.

මේ තමා අඹා එන තැනැත්තා කවරකු වුවත් ඔහු වන සතකු-ගේ මෙන් සහජ ඉවක් හා ලකුණු සොයා ඒමෙහි හොඳ පළ-පුරුද්දක් ද ඇත්තකු බව මෙහිදී ඔහුට හැඟිණ. තමා මෙතෙක් වළහමින් ආ මං සියල්ලක් හැඳින මෙතෙක් දුර නිවැරදි ව ආ මේ තැනැත්තාට තමාගේ කපට කම් සියල්ලක් තේරුම් ගොස් ඇතැයි ඔහුට සිතිණ. ඉතා සියුම් ලකුණක් පවා හොඳින් දැකිය හැකි මොහුට ප්‍රමාද වී හෝ තමා අසු වනු නියත ය. ගසේ සිටින විට එසේ අසු වුවොත් ගස් ගෝනකු මෙන් තමා විද හෙළනු නියත ය. තමා පණ පිටින් අල්ලා ගැනීමට ඔවුන්ට වුවමනා ව ඇති බව ඔහුගේ සිතට නො නැංගේ ය.

ගසින් බිමට පැන ගත් හැන්ස් දිවි ගළවා ගෙන යාමේ අව-සාන ප්‍රයත්නයෙහි යෙදුණේ ය. එහෙත් ඔහුගේ ඇඟේ මස්පිඬු කකියන්ට විය. දිවීමට පා අවසඟ විය. වැඩි දුරක් යන්ට පෙර ඔහු එක් මුලක හැපී වේගයෙන් බිම පතිත විය. පයේ ඇස්වටය පෙරළී වේදනා දෙන්ට විය. වේදනාවෙන් කෙඳිරිගාමින් හේ පයේ තුවාල වූ තැන අත ගෑවේ ය. එයින් පසු නැඟිට නැවතත්

දුවන්ට උත්සාහ කෙළේ ය. නමුත් යා ගත හැකි වූයේ අඩි කීපයක් දුර පමණකි.

ගැළවී වැටී ඇදී ගිය මුල්වලින් ඇළ ව රැඳී සිටි මහ ගසක් එහි වී ය. එහි කඳේ පහත කොටස කැලයෙන් හොඳ හැටි වැසී තිබිණ. හැන්ස් මේ කඳ දිගේ ඉහළට බඩ ගෑවේ ය. එහි කඳ කුහරයක් ව තිබෙන බව දුටු හේ එයට දෙපා රුවා කඳත් එහි තුළට ම ඇද ගෙන සැඟ වී ගත්තේ ය.

හැලහොල්මනක් නැති ව බොහෝ වේලාවක් ගත වීමෙන් පසුව වියලි රිකිල්ලක් කැඩෙන සිහින් හඬක් හා වියලි කොළයක් පෑගෙන ඊටත් සිහින් හඬක් ද ඔහුට ඇසිණ. තවත් පැත්තකින් එවැනි ම හඬක් ඇසිණ. රහසේ එන කෙනකුගේ මෙන් වූ මේ හඬ ළං ළං ව ඇසෙන විට මේ වන කුකුළන් යුවළකගේ හඬ විය හැකැයි හැන්ස් සිතුවේ ය.

ඔහුට මෙසේ සැක සිතින් වැඩි වේලා එහි ඉඳීමට සිදු නො වී ය. 'හ්ම්' යයි උගුරෙන් හැඩවුණ ශබ්දය වැද්දකුගේ හඬක් බව හේ තේරුම් ගත්තේ ය. එය දඩමංවල යන වැද්දන්ගේ සංඥවකි.

එකකුගේ අඩ ගැමට තවෙකකු පැමිණි බවත් දෙදෙනා එකතු ව මං ලකුණු විමසන බවත් ඇසුණු හඬින් හේ තේරුම් ගත්තේ ය. ඔහුගේ හදවතේ ගැස්ම අඟා එන්නවුන්ට ඇසෙන තරමට වේගවත් විය.

කොළතුරෙන් එබී බැලූ ඔහුට ඔවුන්ගේ සේයාවක් දැකිය හැකි විය. දුන්නට නගා ගත් හීයක් ඇති ව ඉතා සැලකිල්ලෙන් බිම ලකුණු විමසන්නවුන් ඔහු දුටුවේ විත් කෑ දිවියකු හෝ ඌරකු සිටි අසලට ළංවන්නවුන් මෙනි. ඔවුන් මෙසේ බිය සහිත ව ළං වූ නමුත් හැන්ස් එහි සිටියේ කිසි ම ආයුධයක් අතේ නොමැති ව ය. තමා සිටි තැන කොළ අතු ඉවත් වී වැද්දකුගේ කැලැල් සහිත වියරු මුහුණක් තමා සිටි දෙසට දිගු කරනු මීළඟට හැන්ස් දුටුවේ ය. වැද්ද එතැනින් ඉවත් විය. මිනිසුන් රහසේ කථා කරන සිහින් හඬ ඇසිණ. එකකු එතැනින් ඉවත් ව ගිය සේ ද ඇසිණ. අනිකා එතැන ම ඇණ බා හිඳ ගෙන බුලත් පහිය ලිහා ගෙන විට සැපීමට වනි.

තවත් ටික වේලාවක් ගිය විට දුරින් හූ හඬක් ඇසිණ. මේ පසු ව එන්නවුන්ගේ හඬ බව හේ වටහා ගත්තේ ය. දෙතුන් වරක් මේ හූ හඬ ඇසුණ පසු පිළිතුරු හූවක් මොබින් දෙනු ඇසිණ.

හැන්ස් දෙම්නස් විය. ඔහුගේ ඇස්වටය වේදනාවෙන් කකියන්ට විය. තමා අසු වූ බව ඔහු දත්තේ ය. රනී ඔහු ඒමෙන් වළකන්ට කළ උත්සාහය ඔහුට සිහි විය.

අවට හැම අතින් ම රහසේ කෙරෙන ශබ්ද ඔහුට තේරුම් ගත හැකි විය. සතුරු පිරිස අවටින් ඔහුට ළංවන්ට වූහ. වරක් තමා දෙස එබී බැලූ වැද්ද අතුපත් පීරා ගෙන පොරොවත් අතේ ඇති ව සතර ගාතයෙන් ගස් කඳ දිගේ ආවේ හැන්ස්ට නැගිට සිටීමට ඉඟි කෙළේ ය. හැන්ස් ඊට කීකරු නොවූ විට හේ ඔහුගේ කෙස්වල්ල දැතින් ම තරයේ අල්ලා ඔහු ඔසවා එළියට ගෙන බිම සිටවූයේ ය.

ආයුධ අතින් ගෙන කලබලයේ කෑකෝ ගසමින් ඔහු වට කර ගත් දහ දෙළොස් දෙනකුගෙන් යුත් පිරිසකට හැන්ස් මැදි වුණේ ය. ඔහු දැකීමෙන් වෙනස් නොවී ගිය එක ම මුහුණ වැද්දගේ මුහුණ විය.

එකෙණෙහි ම කලබලයේ හතිලමින් එතැනට දිව ගෙන ආ දැවැන්ත මිනිහෙක් විය. පැය හයක් තිස්සේ නොකඩවා අඹා ඒමෙන් වෙහෙසට පත් ව සිටි මේ මිනිහා රජුගේ ඇතුන් බඳින පිරිසේ නායකයා විය. තමාට මෙතරම් වෙහෙස දුන් එසේ ම තමන්ගේ මාස ගණනක උත්සාහය ව්‍යර්ථ කර දැමීමෙන් තමා අමාරුවට පත් කර වූ හතුරා දැකීමෙන් එතෙම කෝපයෙන් දැවෙන්ට විය.

එතැනින් නැගී සිටින ලෙස එතෙම හැන්ස්ට අණ කෙළේ ය. මේ අණට හැන්ස් කීකරු නොවුණ විට හේ ඔහු ඉණෙන් අල්ලා ඇද කුණුසරුපයක් ද කියා ගස්සා බිම සිටවූයේ ය. හැන්ස් දණිපණි ගා යම්තමින් සිට ගත් කෙණෙහි ම හේ අත මිට මොළවා ඔහුගේ මුහුණට පහරක් ඇන්නේ ය. හැන්ස් උඩුකුරු ව බිම වැටිණ.

එකෙණෙහි ම බිහිසුණු ගෙරවීමක් සමග වනය අතරෙන් ඔප ඇති කළු වස්තුවක් මැත් වී පිමි දෙකකින් ඇත් පන්තියේ රාළගේ පිටට පැන්නේ ය. උගේ වානේ වැනි තියුණු නිය පඳුරෙන් එක් කම්මුලක් ඩැහැ ගෙන හිස අඹරවා තියුණු දිග දත්වලින් උගුරු දණ්ඩ විකුවේ ය. ඒ හැඩි දැඩි පුරුෂයා මළ කඳක් ව බිම වැතුරුණේ ය. වූයේ කුමක් දැයි සිතා ගැනීමට අවට සිටියවුන්ට ඉඩක් නොතබා ම මේ වියරු වැටුණු දරුණු සතා එහාටත් මෙහාටත් පනිමින් ඔවුන්ට පහර දෙන්ට වූවා. දරුණු යකකු තමන් අතරට කඩා වැදුණ කලක මෙන් බිය ගත් මිනිස්සු දිවි ගළවා ගෙන ඒ මේ අත දිව ගියෝ ය.

හැන්ස් සිහි එළවා ඇස් හැර අවට බලන්නේ එහි සිටි දීයා දුටුවේ ය. ඇගේ හොස්ස ලෙයින් තෙත් වී තිබිණ ඈ ඔහුගේ ආරක්ෂාවට ඔහුට තුරුළු වී සිටියා ය. ගෙල සපා ඉරා දමනු

ලැබ මැරී වැටී සිටි ඇත් පන්තියේ රාළගේ මළ සිරුර එහි වැතිරී තුබුණේ ය. තමා ඔහුගේ පහර කා සිහිසන් නැති ව වැටෙද්දී සිහිනයෙන් මෙන් ඇසුණු ගෙරවීම මෙහිදී ඔහුගේ සිහියට ආවේ ය.



**දීප්තිමත් කළු සතෙක් හිටි හැටියේ ම පඳුරු අතරින් මතුවී නායකයාගේ පිටට වේගයෙන් පැනියි.**

හැන්ස් දිවියාගේ ගෙල වටේ අතක් යවා උණු ළං කොට ඔහුගේ ලේ ගලන මුහුණ සතාගේ සිනිඳු ලෝම අතර රුවා ගත්තේ ය. පසු ව ඇගේ නිකට අතින් ඔසවා තමාට පමණක් කරුණාවත් වූ ඇගේ බියකරු දෙනෙත් දෙස බැලුවේ ය. ඔහු දෙදෙනා එකිනෙකා ඇළයේ මෙසේ වැතිර සිටින අතර ම මොහු දෙදෙනා ම සිටින්නේ අනතුරුදයක තත්වයක බවත් දැන් මේ පලා ගිය මිනිසුන් ආයුධ සන්නද්ධ ව තව මොහොතකින් මෙහි ද පැමිණිය

හැකි හෙයින් මේ අවස්ථාව විශේෂයෙන් දීයාගේ ජීවිතයට අවදනම් සහිත බවත් හැන්ස් ගේ සිහියට නැගුණේ ය. මේ කොයි මොහොතේ නමුත් අවට පඳුරු අතරෙන් ඊයක් හඩා ගෙන ආ හැක. ඒ අනුව තව තවත් ඊ සැර නොකඩවා ආ හැක. ඔවුන්ගේ ඉලක්කය දීයා විය හැක. මේ වැද්දෝ කොතරම් දක්ෂ ලෙස ඊයේ මාන ගනිද්දැයි එද වැව් එළියේ මුවන් විදි සැටි බලා සිටි හැන්ස් දන්නේ ය.

දීයා හදිසියේ ම තැති ගත් බවක් පෙන්වා සිටි හෙයින් හැන්ස්ගේ සැකය ස්ථිර විය. මොහොතක් හෝ ප්‍රමාද කළ යුතු නො වේ. හේ වහා දීයා වැළඳ ආදර බසක් කියා, ''හා! දැන් පලයන් දීයා'' යයි ඇට අණ කෙළේ ය. වෙනද නම් ඔහුගේ අණක් අතපසු නොකරන දීයා අද මෙතැනින් යාමට මැළිකම් පාන්ට වූවා ය. හැන්ස් අත්තක් කඩා ගෙන ඌට තදින් පාරක් ගසා, ''පලයන් දීයා පලයන්,'' යයි කී ය. ඊට අවලාදයක් වශයෙන් දීයා හැරී ඔහු දෙස බලන විට ම වනයෙන් හඩා ගෙන ආ ඊයක් දීයාගේ ළඟින් ම හඩා ගෙන වැටුණේ ය. එක පිම්මට වනයට පැන්න දීයා මොහොතකින් නො පෙනී ගියා ය.

මිනිස්සු නැවතත් වරක් ඔහු වටකර ගත් නමුත් ඒ කිසිවකුත් ඔවුන්ගේ නායකයා කළාක් මෙන් ඔහුට සැලකීමට එඩිතර නුවූවෝ ය. වනයේ දරුණු ම සතුන් පවා දමනය කොට ගෙන සිටින මේ අපූරු පුද්ගලයා කෙරෙහි භය සම්ප්‍රයුක්ත ගෞරවයක් ඔවුහු පෙන්වා සිටියෝ ය.

මළ නායකයාගේ සිරුර ඔවුන් සිටි වාඩියට ඔසවා ගෙන යාමට හතර දෙනෙක් නිල කරනු ලැබූහ. ඉතිරි පිරිස හැන්ස් මැදි කොට ගෙන අවට වනය ගැන දැඩි පරීක්ෂාවකින් ගමන් කළෝ ය. පය ඇඹරී යා ගත නොහැකි ව සිටි හැන්ස් ඔවුන් දුන් සැරයටියක වාරුවෙන් හෙමින් ගමන් කෙළේ ය. ඔහු ඉක්මන් කරවීමට උත්සාහ නොකළ මිනිස්සු හැන්ස්ගේ ගමන අනුව ගැටුවෝ ය.

වාඩියේදී කුතුහලයෙන් පිරී ගිය මිනිස්සු ජයග්‍රාහක ලීලාවකින් ඔහු දැකීමට රොක් වූහ. එහෙත් ඔවූහු ඔහුට හොඳින් සැලකුවෝ ය. ඔහුට මෙවේලේ ඉතා ම අවශ්‍ය ව තුබුණ ආහාර පානයන්ගෙන් සංග්‍රහ කළෝ ය. පිරිසේ වූ දක්ෂ වෛද්‍යවරයා වන ඔසු තළා බෙහෙතක් තනා ඔහුගේ පයට බෙහෙත් කෙළේ ය. අත තුබුණ කුඩා කාරකයකින් ගත් බෙහෙත් කුඩක් පුපුරා තුබුණ තොලට එළුවේ ය.

පසු ද දිනය මළ නායකයාගේ ආදහනය වෙනුවෙන් ඔවූහු එහි ගත කළෝ ය. පිරිසේ කට්ටාඩියා ද වූ වෛද්‍යවරයා මළගම

පිළිබඳ කටයුතුවල මූලික ව ක්‍රියා කෙළේ ය. ගොප් කොළ ආදිය වනයේ සොයා ගත නොහැකි හෙයින් ගස් අතුවලින් සරසන ලද දර සෑයක ඔවුහු ඒ මළමිනිය ආදාහනය කළෝ ය.

මේ අතර පිරිසේ සංවිධායකයා වූ විද්‍රනේ, වයස වැඩිකම නිසා හැන්ස් අඹා නොගියේ, ඔහු මෙහි ගෙනා විට ඔහු ලවා සුදු ගෝනා නැවත අසු කරවා ගැනීමට දන්නා හැම උත්සාහයක් ම ගත්තේ ය. එසේ කළහොත් ඔහුට වටනා තෑග්ගක් ලබා දෙන බවටත් ඔහුගේ නිදහස දෙන බවටත් හේ පොරොන්දු විය. ඔහු හැන්ස් හා කථා කෙළේ වැද්දන්ගේ මාර්ගයෙනි. සිංහල වචනයක් හෝ තමා නොදන්නා බව හැන්ස් අඟවා ගෙන සිටියේ ය. විද්‍රනේ ගැන ගරුසරුවක් නොකළ හැන්ස්, තමාට සුදු ගෝනා ඔය තරමට ම අවශ්‍ය නම් මේ තරම විශාල දක්ෂ පිරිසක් ඇති ව සිටියදී තමා ම එසේ කරගන්නා මෙන් හැන්ස් කියා සිටියේ ය.

මේ කතාවෙන් විද්‍රනේට බොහෝ තරහ ගියේ ය. එවෙලේ ඔහු කෙරේ පෙනෙන්ට තුබුණ ඒ භයානක පෙනීම නුදුරු අනාගතයේදී තමා රජු වෙත පැමිණ වූ විට තමන්ට විඳින්ට සිදු විය හැකි දඬුවමේ ස්වභාවය මැනැවින් පෙන්වා දුන්නේ ය. එහෙත් ඔහුගේ ඒ තරවටු හැන්ස් ගණන් නො ගත්තේ ය. පැය ගණනක් මෙසේ කථා කොට එයින් ප්‍රයෝජනයක් නොවනු දුටු විද්‍රනේ අනික් කළ හැකි දෙයක් නොවූයෙන් පිරිස පසුව ද ආපසු යාමට කටයුතු සලසා ගන්නා සේ විධාන කෙළේ ය.

එද රෑ කෝප වූ දිවියාගේ ගෙරවීම අවටින් වරින් වර ඇසුණ හෙයින් හැන්ස් සිටි තැන වටේ ම ගිනි මැල ගසා ගත් මිනිස්සු මුළු රෑම ඉතා පරීක්ෂාවෙන් මුර කිරීමෙහි යෙදී සිටියෝ ය. එහෙත් දීයා ඔහු වෙත ඒම උගේ යහපත පිණිස නොවන හෙයින් එහි ඒමට හැන්ස් ඌට සංඥ නො කෙළේ ය.

පසුව ද උදයේ ම ඔවුහු ගමනට පිටත් වූහ. ගම්වලින් එකතු වී ආ පිරිස යන ගමනේ ම විසිරී තම තමන්ගේ ගෙවල් බලා යන සේ ඔවුන් මුලින් පිටත් කොට හැරිය විද්‍රනේ සෙස්සවුන් හැන්ස් එක්කොට ගෙන යන සේ විධාන යෙදුවේ ය. මේ පිරිස අතර දක්ෂ දුනුවායෝ සූවිස්සක් ද වැද්දෝ දෙදෙනා ද වූහ.

මෙවිට හැන්ස්ගේ පය ඉදිමී බිම අඩිය තැබිය නොහැකි ව සිටි හෙයින් හේ රිටි දෙකක එල්වා ගත් ගෝන සමක හිඳුවා ඔසවා ගෙන යන ලදී.

ඔවුන් අතර මග නතර වුණ හැම රැයක ම දීයාගේ ගෙරවීම අවට වනයෙන් නැගී ආවේ ය. අවසානයේ ඒ හඬ නො ඇසී ගිය විට, අද තමාට කිසි ම හිතවතකු නැතැයි දුක්මුසු හැඟීමක් හැන්ස් කෙරෙහි ඇති විය.

# 18

# සිරකරුවා

කණ්ඩායමේ වෛද්‍යවරයාගේ තෙලට පින් සිදුවන්ට සතියක් ගතවන විට හැන්ස්ට බිම පය ගසා ඇවිදීමට හැකි වන සේ පය සුව වී තිබිණ. ඇවිදින්ට හැකි වූ කෙණෙහි ම මිනිස්සු ඔහුගේ දෑත් එකතු කොට බැන්දහු එහි ගැට ගැසූ ලනු පටක් මහ වැද්දගේ ඉණේ බැන්දෝ ය. මහ වැද්ද ඔහුගේ ආරක්ෂකයා සේ පත් කොට තිබිණ. වැද්ද රළුපරුෂ ගති ඇති ආරක්ෂකයකු සේ පෙනිණි. කෑම ගන්නා වේලාවෙහි පමණක් ඔවුහු ඔහුගේ දෑත බැම්මෙන් මිදුවෝ ය. රාත්‍රියේදී වැද්දන් දෙදෙනා හැන්ස් දෙපසින් නිදි ගත් අතර පැය හතරෙන් හතරට මිනිස්සු දෙදෙනා බැගින් ඔහු මුර කළෝ ය. ඒ හැර හැම මිනිහකු ම ඔහු ගැන තද පරීක්ෂාවකින් සිටියේ ඔවුන්ගේ ජීවිතය පිළිබඳ ඉරණම ඔහු මත රඳා පවතින්නක් සේ සිතා ගැනීමෙනි. ඔවුන් කෙරෙන් පැන ගිය දුර්ලභ මෘගයා පිළිබඳ කථාවේ ඉතිරි ව ඇති එක ම සම්බන්ධය ඔහු වී ය. එසේ ම රාජ උදහසින් බේරීමට ඔවුන්ට ඇති ව තුබූ එක ම සාක්ෂිය ද ඔහු ම වී ය.

හැන්ස්ට පලා යාමට ඉඩක් නොදී හොඳින් මුර කර ගැනීම හැර ඔවුහු ඔහුට හොඳින් සැලකිලි කළෝ ය. හැන්ස් කථා කෙළේ වැද්දන් සමග පමණකි. මේ රාජකීය මහ වැද්ද සෙලා නම් විය. ඔහු නිසා නොවේ නම් කිසි විටෙකත් හැන්ස් අල්ලා ගැනීමට ඉඩක් නො ලැබෙයි. හේ ශක්තිමත් ව වැඩුණ මිටි මිනිහෙකි. තිස් පහක් පමණ වයස් වූ ඔහුගේ මුහුණේ සිහින් ව වැඩුණ එළු රැවුලක් විය. නිතර කලබල බැල්මත් තුවාල ලැබූ කැලලුත් ඔහුගේ මුහුණේ නපුරු පෙනුම තවත් වැඩි කෙළේ ය. ටිකක් කථා කරන ස්වභාවය ඇති මෙතෙම හැන්ස් අමතා කිසිවක් නො කීවේ ය. ඔහු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දුන්නේ වචනයකින් දෙකකින් පමණකි. සමහර විට පිළිතුරක් නොදී ම සිටියේ ය. හැන්ස් හා කථා කිරීමට ඔහු මෙසේ මැළිකම් දැක් වූ නමුත් තමා භාරයේ සිටින මේ සිරකරුවා ඔහුගේ සිත් ගත්තේ ය. හේ බොහෝ විට හැන්ස් ගැන දුරට කල්පනා කෙළේ ය. අනික් බාල වැද්ද වූ ගෝඹා සමග හැන්ස් කතාවේ යෙදී සිටින විට ඒ ගණන් නොගත්තා සේ සිටි නමුත් හේ මේ කතාවලට හොඳින් ඇහුම්කන් දුන්නේ ය.

රජ මැදුරට වුවමනා තරම නිති පතා මුව මස් සැපයීම සෙලා සතු කාරිය ව ඇති බව හැන්ස් ගෝඹිරාගෙන් දැන ගත්තේ ය. සෙලා වන දඩයමේ අසහාය දක්ෂයකු ව සිටි හෙයින් ඔහු තම පිරිසෙන් වෙන් කොට රාජකාරියට බඳවා ගන්නා ලදී. සුදු ගෝනා අල්ලා ගැනීම වැනි මහ වනය පිළිබඳ විශේෂ කාරියක් ඇති වූ විට වනමං පෙන්වා දීමට පිරිස් කැටුව යාම ද සෙලා සතු තවත් කාරියක් ව තුබුණේ ය.

හැන්ස් තමා සිංහල නොදන්නා බව අඟවා ගෙන සිටීම නිසා සිංහල මිනිසුන් සැක නැති ව කොයි දේත් ඔහු ඉදිරියේ කතා කළ හෙයින් තමා කැඳවා ගෙන යන මේ රට තොට පිළිබඳ කරුණු ඒ කතාවලින් ඔහුට දත හැකි විය. හැන්ස්ට අසන්ට ලැබුණු කතා අනුව රජුගේ ගති ගුණ ගැන ඔහු තුළ පැහැදීමක් ඇති නො වී ය. මේ මිනිසුන් තමා මෙතරම් දැඩි ව මුර කිරීමේ හේතුවත්, රාජධානියට ළං වන්ට ළං වන්ට වග කිය යුතු නිලධාරීන්ගේ මුහුණුවල දෙම්නස් ගතිය වැඩි වන්ට වීමේ හේතුවත් ඔහුට සිතා ගත හැකි විය.

මෙසේ ආපසු නුවරට එන මොවුහු බොහෝ වෙහෙස ගෙන ගමන කළෝ ය. හිමිදිරියේ ම ගමන අරඹා දවල් බතට දෙපැයක තරම විවේකයක් ගෙන නැවතත් ඉර බැස යන තුරු ම ඔවුහු ගමන් කළෝ ය.

මේ ගමන අතරතුර අවස්ථා දෙකකදී ඔවුහු සම්පූර්ණ දවසක් එක තැන නැවතී සිටියෝ ය. මේ අවස්ථා දෙකෙහිදී ම පිරිසේ වූ වැද්දෝ විදීමේ දක්ෂ සිංහලයන් සමහරකු ද කැටුව පිරිසට දඩමස් සැපයීම සඳහා දඩයමේ ගියෝ ය. මෙසේ දඩයම් කොට ගෙන ආ සතුන්ගේ මස් තීරු කොට ගිනිමැසිවල ලා වියලා ආහාරයට ගත්තෝ ය. දිනක දඩයමෙන් ගෙන ආ මස් පිරිසට තිප දිනකට ප්‍රමාණවත් විය.

මෙකී දෙවන දින දඩයමට යාමට සූදානම් වූ සෙලා, අනික් වැද්ද වූ ගෝඹාගේ බලවත් ඉල්ලීම පිට හැන්ස් ද කැටුව යා යුතු යයි විදනේට යෝජනා කෙළේ ය. සිරකරුවාගේ ආරක්ෂාව පිළිබඳ සම්පූර්ණ වගකීම තමා භාරගන්නා බව සෙලා කියා සිටි නමුත් මේ බව සඳහන් කළ පමණකින් ම විදනේ කෝප-යෙන් වියරු විය.

''මේ කොල්ලා අතට දුනු ඊ දෙන්ඩ! යස වැඩේ. උඹලාට මතක නැ ඌ අඹා අල්ලා ගන්ඩ අප වින්ද දැස වද. රාජ උදහසෙන් අපේ ජීවිත බේරා ගන්ඩ පුළුවන් එක ම විදිය මේකා පණපිටින් ගිහින් භාර දීමයි. උඹලාගෙ මෝඩ යෝජනා තියෙද්දී ඕකා හොඳ හැටි රැක ගනිල්ලා,'' යයි විදනේ කෑ ගැසුවේ ය. මේ අසා සිටි සෙලා වැද්දගේ මුහුණ ඇඹුල් විය. ඔහු එතැනින් ඉවත්

ව ගියේ, ''මේ වගේ ගැමමකට නැති සිංහලයෙක් මින් ඉහත මට මෙහෙම කතා කරලා නැහැ. මට මේ රාජකාරිය පැවරිලා නො තිබුණා නම් මේ නැහැදිච්ච තක්කඩියාට කරන දේ මම දන්නවා,'' යයි ඔහුට ඇසෙන සේ කියමිනි.

තමාගේ මිනිසුන් ඉදිරියේ මෙසේ කියනු ලැබීමෙන් තමා ලොකු අවමානයකට පත්වුණු වග විද්‍යනේට හැඟී ගිය නමුත් රජුගේ දඩයක්කාර වැද්දට විරුද්ධ ව ඇඟිල්ලක් එසවීමට තරම හේ බිය පත් වී ය. මෙතෙක් මේ ඇති වී තිබෙන කරදර ඔහුට හොඳට ම ප්‍රමාණවත් ය.

එද දඩයමට සෙලා නො ගියේ ය. ගෝඹාගේ උදව් ඇති ව එය සිංහලයන්ට ම කරගන්ට සිදු විය. මේ මෙසේ වීම නිසා ඔවුන්ට එතැන දෙදිනක් ම නතර වන්ට සිදු විය.

මේ සිද්ධියෙන් පසු ව සිංහලයෝ හැන්ස්ගේ රැකවරණය පිළිබඳ කටයුතු දෙගුණ කළෝ ය. කපට ක්‍රියාවල මෙන් ම පලිගැනීමෙහි ද ප්‍රසිද්ධියක් උසුලන මේ වැද්ද මීළඟට කුමක් කෙරේ දැයි සැක සහිත විය. සිරකරුවා කෙරෙහි මහත් කරුණා-වක් මේ වැද්ද පෙන්වන බවට ලකුණු පැහැදිලි ව ම පෙනෙන්ට තිබිණ.

දෙසතියක් මෙසේ ගමන් කිරීමෙන් පසු ව ඔවුන් ගමන් ගත් මග පළල් වන්ට වූ හෙයිනුත් මහ කැලය වෙනුවට ලඳු කැලෑ හා තලාවන් ද වඩ වඩා හමුවන්ට වූ හෙයිනුත් මේ පෙදෙස වරින් වර ගොවිබිම් ව තුබුණ බව හා පිරිස දැන් මිනිස් වාසයට ළං ව එන බවත් සිතා ගත හැකි විය. මග අසල සිට ගෙන මේ එන පිරිස දෙස බලා සිටි මගීන් දෙදෙනකු නිසා මේ අදහස වැඩි දුරටත් ස්ථිර විය.

ඔවුන් තලාවක් පසු කර යන විට දුරින් පැහැදිලි ව මතු වී පෙනුණ උස් කඳු වැටියක් හැන්ස් දුටුවේ තව ටික වේලාවකින් එය නැග යාමට සිදුවන බව සිතා ගත්තේ ය. එවිට ඔහුගේ සිහියට ආවේ, ''ගල් ගෙයි සිටි භික්ෂූන් වහන්සේ තමා නොයා යුතු ය,'' යි කී සිංහලේ රාජධානියට කෙසේ නමුත් තමාට යන්ට සිදු වී ඇති බව ය. එහෙත් ඒ තමා එහි යාමට බලාපොරොත්තු වූ විධියට හෝ බලාපොරොත්තු වූ කාලයට හෝ නො වී ය.

පසුව ද ඔවුහු එක් ගම්මානයකට පැමිණියෝ ය. මෙහි වූ මැටි බිත්ති හා මානා සෙවිලි කළ වහල ද ඇති කුඩා ගෙවල් සමූහ වශයෙන් කොස් දෙල් පුවක් දෙහි කෙහෙල් බුලත් වැල් වැනි ගස් කොළන් අතර තනා තිබිණ. මෙහි ගෙවල් දෙළහක් පමණ විය.

ගමේ මිනිසුන් සමූහයක් ඔවුන් එන මග ඉදිරියට අවුත් බලා සිටීම හැන්ස් අසු කර ගැනීමේ ආරංචිය ඔහු ඒමට පෙර මොවුන් වෙත පැමිණ තිබෙන බවට සාක්කියක් විය.

ඉදිරියට තමාට විඳින්ට සිදුවන හිරිහැර පිළිබඳ පෙර නිමිත්තක් මෙන් ඔහුට මෙහිදී යම් යම් ගැහැටවලට මුහුණ පාන්ට සිදු විය. බැඳගෙන ආ කිසියම් වල් සතකු බලන්නට එක් වන්නාක් මෙන් එහි දුව ආ ගැහැනු මිනිස්සු හා ළමයි ද බැඳ සිටි ඔහු වට කර ගත්හ. වැඩි හිටියෝ දරුවන්ට ඔහු සමීපයට යාමට ඉඩ නොදී ඔවුන් ඔසවා ඇඟිල්ල දිගු කොට දුර සිට පෙන්නුවෝ ය.

දිවි සමකින් පමණක් හිණ වසා ගෙන සිටි රන්වන් ඉහිරුණ කෙහෙ හා නිල්වන් නිර්භීත දෙනෙත් ද ඇති මේ සුදු තරුණයා කළ නිර්භීත ක්‍රියා ගැන අසා සිටි, වීරයන් ගරු කරන යුවතියෝ මහත් සතුටකින් දෙනෙත් මහත් කොට ඔහු දෙස බලා සිටියෝ ය. ඔවුහු ඔහු වීරයකු කොට තැකූහ. මෙයින් වඩා එඩිතර එක් යුවතියක් තම බාල සහෝදරයා අතට දෙඩම් ගෙඩි දෙකක් දී එය මේ සිරකරුවා අතට දෙන සේ කියා ඔහු ඉදිරියට තල්ලු කළා ය. මේ දුටු වැඩිහිටියෝ තරුණියන් විලිබිය නැති ව මෙසේ හැසිරීම ගැන නොකැමති වූවෝ ගෙදර දොරේ වැඩපළ අත හැර පැමිණ මෙහි සිටීම ගැන ඔවුන්ට බැණ දොඩා ඔවුන් ආපසු ගෙවල් වෙත යැවුවෝ ය. එහෙත් එසේ ගිය යුවතියෝ කිසියම් වැඩක යෙදෙන සේ අඟවා ගෙන අනුකම්පා සහගත සිතින් ඔහු දෙස බලන්ට වන්නෝ ය. හැන්ස් වනයේදී කර තිබෙන ක්‍රියාව ගැන අසා ඇති මොවුහු ඒ වෙනුවෙන් ඔහුට විඳින්ට විය හැකි දඬුවම ගැන සිතා දුක් වූහ.

"මේ කොලුවා මහ වාසලට ගෙන ගියා ම මොන දඬුවමක් විඳින්ට වෙයි ද? කියා එක් ගැමියෙක් අනිකකුගෙන් අසනු හැන්ස් අසා සිටියේ ය.

"ඒ ගැන ආයෙ සැකයක් ඇද්ද?" යනු දෙවැන්නාගේ ක්ෂණික පිළිතුර වී ය.

නින්ද බස් නිසා හැන්ස් කෙරෙහි ඇති වූ කලකිරුණ ස්වභාවය වැද්දකු වූ සෙලාට පවා ඉවසිය නොහැකි වූයේ හේ වහා පොරොවත් අතින් ගෙන වට කොට හුන්නවුන් කොටන්ට මෙන් කඩා පැන්නේ ය. කොලු කෙලි පිරිස කෑ ගසමින් එතැනින් දුරට දිව ගිය අතර අනික් මිනිස්සු ද මුමුණමින් ඉවත් ව ගියෝ ය.

මෙහිදී හැන්ස්ට යහපතක් ද සිදු නොවූයේ නො වී ය. මීහිරි සිංහල කැවුම්වල හා ඉදුණ කෙසෙල් ගෙඩි පැණිදොඩම් වැනි රසවත් ආහාරවල රස බැලීමට මෙහිදී ඔහුට පුළුවන් විය.

අවුරුදු ගණනක් තුළ රළු ආහාර පමණක් ගනිමින් සිටි ඔහුට මේ ආහාර මී මෙන් මිහිරි විය.

එද දහවල් හා හවස ද ඔවුන් නැවතුණ තැනත් එවැනි ම ගම් වී ය. මේ දෙතැනදී ද හැන්ස්ට මුහුණ දීමට සිදු වූ කරදර පෙර සේ ම විය. පසු ව හේ මෙවැනි දේට පුරුදු වූයේ ඒවා ගැන තැකීමක් නො කෙළේ ය. තමාට ඉදිරියට විඳින්ට සිදු විය හැකි අතවරයන් ගැන සිතන විට මේවා මොන කරදර දැයි ඔහුට සිතුණේ ය.

රැකවල් ඉතා දැඩි වූ හෙයින් පලා යාමක් ගැන සිතීම පවා හැන්ස්ට නොකළ හැකි දෙයක් විය. රාත්‍රි කාලයේදී ඔහුගේ දෑත් දෙපා කොතරම් තද කොට බැඳ තුබුණේ ද කියතොත් බැම්වල ලනු අත්පාවල මස් අතර කාගෙන ගොස් තිබිණ.

ඔවුහු අන්තිමේදී කඳු පාමුල එක් විශේෂ ගමකට සැපත් වූහ. විශාල පිරිසක් මොවුන්ගේ ඊම බලාපොරොත්තුවෙන් එහි රැඳී සිටියෝ ය.

පයට ලූ යදම්වලින් ගස්වලට බඳිනු ලැබ සිටි ඇත්තු දෙදෙ- නෙක් මෙහි රුක් සෙවණේ එහා මෙහා වැනෙමින් සිටියෝ ය. ඔවුන්ගේ ආහාර සඳහා කිතුල් ගස් හා කෙසෙල් ගස් ද එහි දමා තිබිණ. උඩුකය නිරුවත් ව සිටි ඇත්ගොව්වෝ අතින් ගත් අකුසු ඇති ව ඔවුන් ඇළයේ සිටියහ.

එළිමහනේ අලුතෙන් තැනූ ඉඩකඩ ඇති මඩුවක් ඉදිරියේ ප්‍රතාපවත් පුද්ගලයෙක් හේවාපන්නකාරයන් දෙදෙනකු පිරිවරා සිටියේ ය.

සුදු රැවුලක් ඇති හුරුබුහුටි පුද්ගලයෙක් වූ මෙතෙම අත් දිග සැට්ටයක් හා පයෙහි ඇස් වටය දක්වා වැටෙන තුප්පොට්ටි- යක් ද ඇඳ සිටියේ ය. තුප්පොට්ටි රෙදිවල ඔඩොක්කු කැටි කර ඉදිරියට නෙරා එන සේ තබා පටියකින් බැඳ තිබීම ඔහුගේ ඇඳුමට උදර පෙනුමක් ඇති කෙළේ ය. ඔහු විසිතුරු කළ අටමුලු තොප්පියක් පැලඳ සිටි නමුත් පයෙහි ලූ වහනක් නො වී ය. ඉණ බැඳි පළල් රතු පටියෙන් මතු වී පෙනුණ රිදී මිටක් සහිත සිරියක් හා පසෙකින් එල්ලුණ, රිදියෙන් කැටයම් කළ කොපුවක් සහිත කඩුවක් ද විය. රතු නිල් ලොකු මැණික් එබ්බූ මුදුවලින් ඔහුගේ අත්වල ඇඟිලි බැබළුණේ ය. හේ එක් අතකින් මේවර කළ සැරයටියක් ගෙන අනික් අත උකුළට තබා ගෙන සිටියේ ය.

තමා මේ පෙනී සිටින්නේ මහ රජු ඉදිරියේ යයි හැන්ස්ට හැඟී ගියේ ය. එහෙත් මේ සිටියේ අල්ලා ගෙන එන මේ සිර- කරුවා භාර ගෙන කන්ද උඩ රාජධානියට ගෙන යාමට පැමිණ සිටි දිසාව කෙනෙකි.

මෙතෙක් හැන්ස් භාර ව ආ විදනේ තැන දිසාව හමුවට ගොස් දැත් එකතු කොට නැමී ආචාර කෙළේ ය. දෙදෙනා වචන කීපයක් හුවමාරු කර ගැනීමෙන් පසු ව හැන්ස් දෙස විමසුම් සහිත ව බැලූ දිසාව මඩුව ඇතුළට ගමන් කෙළේ ය. විදනේ ද ඔහු අනුව එහි ඇතුළු විය. සුදු ඇතිරියක් එළූ පුටුවක හිඳ ගත් දිසාව විදනේගේ කතාව ඇසීමට සූදනම් විය. නොයෙක් විස්තර සහිත දිග කතාවක් වූ මෙය දිසාව සැලකිල්ලෙන් අසා සිටියේ ය. කතාව අතරතුර දිග කෙහෙ ඇති කුඩා කොලුවෙක් ළඟ සිට ගෙන දිසාවේට බුලත් පිළිගැන්නුවේ ය. බුලත් හා ලියූ පුවක් ද එක්කර කටේ තබා ගැනීමට පෙර දිසාවේ තම හිසෙන් ගත් රිදී කිල්ලෝටයකින් ඇඟිල්ලට හුනු ගෙන බුලත් කොළයේ ගෑවේ ය. මෙසේ බුලත් සපන දිසාව තම දෙතොලට අතේ ඇඟිලි දෙක තබා ඒ අතරෙන් පිත්තල පඩික්කමකට කෙල ගැසුවේ ය.

කතාවේ උත්කර්ෂවත් අවස්ථාව වූ හැන්ස් පිළිබඳ සිද්ධිය කියන විට දිසාවේගේ මුහුණේ ස්වභාවය වෙනස් වන්ට විය. අහසේ වලාකුළු පාවී යන්නාක් මෙන් ඔහුගේ මුහුණේ ස්වභාවය කුතුහලයෙන් කෝපයට හා කළු දිවියාගේ පැනීමේ අවස්ථාවට එන විට මහත් වූ විස්මිත ස්වභාවයකට ද පෙරළුණේ ය.

විදනේගේ සම්පූර්ණ විස්තර කථාව කෙළවර වූ විට දිසාව හැන්ස්ට බැණ වදින්ට විය. ඔහුට සිංහල නොතේරෙන වග දැන ගත් විට එකල මහ වාසල නිතර කතා කළ භාෂාවක් වූ පෘතුගීසි භාෂාවෙන් බැණ වැදුණේ ය.

''උඹට තේරෙනවා ද, උඹ මේ කර තිබෙන රාජද්‍රෝහිකමේ බරපතල කම? උඹ දන්නවා ද උඹට වෙන්ඩ යන දේ?'' හේ විමසුවේ ය.

මේ කතාවේ එක වචනයක්වත් තේරුම් නො ගත් හැන්ස් අමුත්තක් නැති ව නිශ්චල ව ඔහු දෙස බලා සිටියේ ය. මෙහිදී දිසාවෙ විදනේ දෙසට හැරී, ''ආ විදනෙ, වැද්දන් ලවා මේකාට කතා කරවීමෙන් අපට වැඩක් ඇත කියා හිතනවා ද?'' හේ ප්‍රශ්න කෙළේ ය.

''කිසි ම වැඩකට නෑ. දන්නා තරම අපිත් උත්සාහ කළා. ඒත් මේකා ගොනකු වගේ මුරණ්ඩුයි,'' යනු විදනේගේ පිළිතුර විය.

මේ සුදු මිනිහා දෙස බොහෝ වේලාවක් කල්පනාවෙන් බලා සිටි දිසාවෙ ඔහු කෙරෙහි ප්‍රකට ව ම පෙනෙන්ට තුබුණ කතා නොකරන මුරණ්ඩු ස්වභාවය දැක තව දුරටත් ප්‍රශ්න කිරීමෙන්

පලක් නොවන බව සලකා ගත්තේ ඔහු තම භාරයට ගෙන හොඳින් රැකවල් ගන්නා ලෙස තම භේවායන්ට අණ කෙළේ ය.

ඉන් පසු හේ සෙලා වැද්ද කැඳවා මේ සිරකරුවා සොයා අල්ලා දීම ගැන ඔහුට ස්තුති කොට ත්‍යාගයක් වශයෙන් මුදල් පසුම්බියක් ඔහු වෙත දිගු කෙළේ ය. එහෙත් එය අත ගැසීමට වත් නොකැමැති වූ වැද්ද එකෙණෙහි ම ආපසු හැරී යන්ට ගියේ ය.

මේ පිරිස කඳු මග නගින්ට පටන් ගන්නවාත් සමග ම කටුපැලැලි දෙරටුවක නතර වන්ට සිදු විය. ළංළං ව කටු බැඳ සාද තුබුණ විශාල හතරැස් කටු පැලැල්ලකින් මේ කටු දෙරටුව සැදුණේ වෙයි. අඩි දෙළහක් උස බිම සිට වූ කණු දෙකක හරස් අතට ලූ මහ දණ්ඩක මේ කටු පැලැල්ල එල්ලා ඇත. එය රිටිවලින් ඔසවා සිට වූ විට ඇතකු පිට නැගුණ කෙනකුට එතැනින් පහසුවෙන් යා හැකි වෙයි.

මේ දෙරටුවලට පැමිණෙන කිසිවකුටත් ප්‍රවේශානුඥවන් නැති ව මේ තැන් පසුකර යා නොහැකි වෙයි. මේ ප්‍රවේශානුඥ-වන් නම් කිසියම් සටහනකින් මුද්‍රා තැබූ මැටිකඩ ය. භේවා-යකුගේ ප්‍රවේශානුඥව වන මැටිකඩ හෙල්ලයක් අතින් ගත් මිනිහකුගේ රූ සටහනක් ඇති එකක් වෙයි. එසේ ම එය කම්කරුවකුගේ නම් එහි ඇති රූ සටහන කඳක් ගෙන යන මිනිහකුගේ වන අතර සුදු ජාතිකයකුගේ ප්‍රවේශානුඥවක නම් කඩුවක් අතින් ගෙන තොප්පියක් හිස ලා ගත් රූ සටහනක් වෙයි. මෙසේ එය දරන්නාගේ තරාතිරම අනුව මැටිකඩේ රූ සටහන වෙනස් වෙයි.

හැන්ස් කැටුව යන පිරිස දෙරටුවේ සිරිත් ඉටු කර ඉදිරියට ගමන් ගත්තෝ ය.

පිට උඩ මිනිසුන් නංවා ගත් ඇතුන්, වක් වූ මේ පටු මහ දිගේ හෙලේ නගිමින් අපහසුවක් නැති ව ගමන් කළ ලීලාව හැන්ස්-ගේ මවිතයට හේතු වී ය. මද්දහනේ විඩා හැර ගැනීමටත් ආහාර ගැනීමට දිය ඇල්ලක් සමීපයේ නතර වූ එක් වරකදී හැර දවස තිස්සේ ම මේ හෙලේ නැගීම නොකඩවා කෙරුණේ ය.

මෙසේ ගිය මොවුහු මහවැලි නම් මහ නදිය තරණය කොට සිංහල රජුන්ගේ කන්ද උඩරට රාජධානිය ව තුබූ සෙංකඩගල පුරයට පැමිණියෝ ය. වර්තමාන රජ මෙහිදී තමාගේ ජීවිතය හානි කිරීමට සතුරන් විසින් කළ ප්‍රයත්නයකින් පසු ව මේ ස්ථානය හැර වඩා සුරක්ෂිත ස්ථානයක් රාජධානිය කොට ගෙන තිබිණ. එකී ස්ථානය මෙයින් සැතපුම් කීපයකට දුරින් පිහිටා තිබුණේ ය.

සෙංකඩගල පුර අලංකාර නගරවරයක් බව හැන්ස් දුටුවේ ය. කඩා වැටුණු ගෙවල් හා දිරාපත් වී ගන යන ගෙවල් ද අතර අලංකාර ලෙස පිහිටි බොහෝ ගෙවල්, විහාරාරාම හා දේවස්ථාන ද විය. මෙහි වීදි ජනයාගෙන් පිරී පැවතිණ. මේ පිරිස් අතර හිස මුඩු කොට කහ සිවුරු පොරවා ගත් බෞද්ධ භික්ෂූහු ද, හින්දු පූජකයෝ ද ප්‍රැන්සිස්කන් දේවගැතිවරු ද වූහ. සුළු බඩු වෙළෙන්දෝ තම තමන්ගේ වෙළඳ බඩු ඔසවා ගෙන ඒවායේ නම් කියා අඬගාමින් වීදිවල ඇවිද්දෝ ය. වෙළඳ හල් හිමියෝ තම තමන් විකුණන එළවලු පලතුරු හැළිවළං ආදි දේ වෙළඳාම සඳහා තබා ගෙන හුන්හ.

දිග කෙස්වලු ඇති ගැහැනු මෙන් ම පිරිමි ද තම කොණ්ඩා හිස පිටුපස ගැටයක් ගසා ගෙන සිටි අතර තරුණ පෙළ වැඩි වශයෙන් තම කෙහෙ උර වතුරුවා ගෙන සිටියෝ ය. පිරිමි හැම දෙනකු ම පාහේ රැවුල් නොකපා ඇඟේ උඩ කොටස නොවසා සිටියෝ ය. ගැහැනු ඉණ වටා ඇඳි වතින් එක් පටක් උතුරු සළුවක් කොට ළය වසා කරින් දමා ගෙන සිටියෝ ය.

සාමාන්‍ය මිනිසුන් මෙසේ වුව ද උසස් පෙළට අයත් වූවෝ අත් දිගට ඇති සැට්ටා හා ඔක්ක තබා අලංකාර ලෙස ඉණට ඇඳි සළු ද ඇති ව සිටියෝ ය. මේ අතර උසස් පෙළේ ගැහැනු පෘතුගීසි පන්නයට ගවුම් ඇඳ ඇඟිලිවල මුදු හා අත්වල වළලු ද පැලඳ සිටියෝ ය. අපූරුවට කැටයම් කළ රිදී මාල හා පබළු වැල් ද ඔවුහු කර පැලඳ සිටියෝ ය. බුලත් සපමින් මහේශාක්‍ය ලීලාවෙන් ගමන් කළ මේ කාන්තාවෝ සේවකයන් ඇති ව කඩපිල්වලට ගොස් වුවමනා දෙයක් මිලයට ගත්හ. මේ උස් පහත් හැම දෙනෙක් ම පාවහන් නොමැති ව ගමන් බිමන් කළෝ ය. පාවහන් භාවිතය මහ වාසලට පමණක් සීමා වූවක් විය.

යුරෝපීය ජාතීහු ටික දෙනෙක් ද මෙහි සිංහල මිනිසුන් මෙන් හැඳ ගෙන ජීවත් වූවෝ ය. ඔවුන් සමහරකුගේ ඇඳුම් වැරහැලි සේ පෙනිණ. මේ දෙජාතීන්ගේ සම්මිශ්‍රණයෙන් උපන්නවුන් සේ පෙනුණ සිවි පැහැ ඇති තවත් පිරිසක් ද මෙහි වූහ.

නගරය පසු කර ගිය පිරිස නැවතත් වරක් ගමන් අපහසු මංවලට වැටී අතන මෙතන කුඩා ගෙයක් දෙකක් හමු වන වන මගක් ඔස්සේ ගමන් කරන්ට වන්නෝ ය. මෙහි රට සෙංකඩගල පුරට එන මගටත් වඩා දැඩි ව භේවායන් විසින් ආරක්ෂා කරන ලදී. කඩු හෙල්ල දුනු ඊ ආදි ආයුධ රැගත් භේවායන් මුර කරන ස්ථාන කීපයක් ම පසු කර යාමට මේ පිරිසට සිදු වී ය.

19

# සිංහලේ රජ

එදා හැන්දෑව වන විට හැන්ස් හා ඔහුගේ රැකවල්ලු ද රජුගේ තාවකාලික රාජධානිය වූ හඟුරන්කෙතට පැමිණියෝ ය. අදිකාරම් කෙනෙක් ද හේවා හමුදාවක් ද ඉදිරියට පැමිණ හැන්ස් නමන් යටතට භාර ගත්තෝ ඔහු මුර ගෙයක ලා රැකවල් තැබූවෝ ය. රජතුමා කැඳවා එවන තුරු අන් කිසිවකු ඔහු හා කථා නොකළ යුතු යයි අණක් පැනෙව්වෝ ය.

හඟුරන්කෙත රජ මාලිගය මහ ගිරි හෙලක පාමුල පිහිටියේ විය. මේ ගිරි හෙල සතුරු ආක්‍රමණයකදී රජුගේ ආරක්ෂා ස්ථානය වන හෙයින් කිසිවකුටත් එහි නැගීමට අවසර නො දෙන ලදි. රාජභාණ්ඩාගාරයේ වටිනා ධනයෙන් වැඩි කොටසක් මෙහි කිසියම් රහස් ස්ථානයක සඟවන ලද්දේ ද විය.

කඳු දෙකකට මැදි වී තුබුණ මේ ස්ථානය කිසි ම අලංකාර පරිසරයක පිහිටියේ නො වී ය. රජ මාලිගය තැනීමට මේ ස්ථානය තෝරා ගන්නා ලද්දේ කිසියම් අලංකාරයක් ප්‍රතාපවත්කමක් නිසා නොව ආරක්ෂාවට හොඳ ස්ථානයක් හැටියට සලකා ගැනීමෙන් පමණකි.

මාලිගා භූමියේ ඉඩවරය මැටි බිත්තියකින් වට කරන ලද්දේ විය. මේ මැටි බිත්තිය වර්ෂාවට සේදී නොයාම සඳහා මුදුන උළුවලින් සෙවිලි කරන ලද්දේ ද විය. බිත්තිය ඇතුළත පල පහත්, අතු සෙවිලි කරන ලද කුඩා ගෙවල් බොහොමයක් විය. මේවා රජුගේ ආරක්ෂක භටයන්ගේ වාසය සඳහා විය. රජ මාලිගය උළු සෙවිලි කරන ලද දෙමහල් ප්‍රාසාදයකි. මාලිගයේ උඩුමහල් ආලින්ද කැටයම් කරන ලද කළුවර ගරාදිවලින් හා මේවර කරන ලද ගරාදිවලින් ද අලංකාර කරන ලද්දේ විය.

මාලිගයේ විශාල දෙරවල් විසිතුරු ලෙස කැටයම් කර තිබිණ. එසේ ම අගුල් මුදු හා යතුරු තහඩු ද කැටයමින් විසිතුරු කළ ඒවා විය. වා කවුළු කළුවර ලීයෙන් හා රිදී තහඩුවලින් වද්ද තිබිණ. එහි පියසි කෙළවර මැටි කලසක් බැගින් ඉඳුවා සරසන ලද්දේ විය. විහාරයක දේවාලයක හෝ රජ මාලිගයක හැර අනික් ගෙයක පියසි කෙළවර මෙසේ සැරසීම තහනම් වූවකි.

මේ මාලිගය රජුගේ ම සැලැස්මක් අනුව කරන ලද්දක් වී ය. එහි තුළ හැරි හැරී යා යුතු වක් වූ තැන් බොහෝ විය. මාලිගයේ දොරටුවක් පාසා රජ අණින් සිට වූ දොරටුපාලයෙකි. මේ දොරටුපාලයන් කුලීනයන් වුවද රජුගේ අවසරයක් නැති ව තැන් මාරු කර ගැනීම හෝ එකිනෙකා සමග කතාබස් කිරීම හෝ ඔවුන්ට තහනම් විය. රජ ගෙයින් බැහැර මුර කළ හේවායෝ මොවුන් යටතේ වූහ. රජුගේ යහන් ගබඩාවේ දෙපස මුර කළ ආරක්ෂක භටයෝ නීග්‍රෝ ජාතිකයෝ දෙදෙනෙක් වූහ. ස්ව ජාතිකයන්ට වඩා මේ නීග්‍රෝ ජාතිකයන් කෙරෙහි රජතුමා විශ්වාසය තබා සිටියේ ය.

රාත්‍රියේදී සෙනෙවිරත්වරු මාලිගය ඇතුළත මුර කළ අතර ඔවුන්ගේ හේවායෝ මාලිගයෙන් පිටත රඳවා සිටියෝ ය. මුර හේවායන් නිද වැටෙනු වැළැක්වීමටත් රාජ ගෞරවය සඳහාත් යාමයෙන් යාමයට තූර්‍ය වාදනයක් පැවැත්විණ.

හදිසියේ සතුරු ආක්‍රමණයක් වී නම් ඒ මැඩලීම සඳහා සටනට සැරහූ ඇත් සේනාවක් මාලිගය අසල සිටුවා තිබිණ. මෙවැනි සංවිධානයන්ගෙන් රාජෛශ්වර්‍යය හොඳ හැටි පිළිබිඹු වී පෙනුණ අතර මහලු වියට පැමිණ සිටි රජකු කෙරෙහි පැවති මහත් බිය ද පැහැදිලි ව පෙනී ගියේ ය.

හැන්ස් එහි පැමිණ දෙ දිනක් ගත වන තුරු හේ රජු ඉදිරියට නො කැඳවනු ලැබී ය. මෙවිට සුදු වැද්ද පිළිබඳ කතාව කවුරුත් දන සිටි එකක් ව තුබුණ හෙයින් ඔහු මාලිගයට යන විට මග දෙපස විශාල සේනාවක් පෙළ ගැසී බලා සිටියෝ ය.

මග දෙපස පෙළ ගැසී සිටි මිනිසුන්ගේ මුහුණු දැකීමෙන් හා ඔවුන් කී කතා ඇසීමෙන් ද හැන්ස් තේරුම් ගත්තේ තමාගේ වාරය ළං වී තිබෙන බව ය.

ඉංග්‍රීසි ජාතික කපිතාන්වරුන් දෙදෙනකු යටතේ වූ සිංහල හේවා හමුදා දෙකක් මහ වාසල දොරටුව ළඟ සිටි හැන්ස් ඇතුළු පිරිස භාර ගෙන මාලිගය වෙත ගෙන ගියෝ ය.

ඔවුහු රජතුමා වෙත කැඳවනු ලැබීමට පෙර එක් විශාල ශාලාවක රැඳී සිටීමට සලසන ලදහ. මේ නාටකයේ ප්‍රධාන නළුවා හැන්ස් වන හෙයින් මෙහිදී ඔහුගේ නොඉවසිල්ල දැඩි විය.

රට වැසියාගේ ජීවිතයත් මරණයත් පිළිබඳ ඉරණම අතේ ඇති ව සිටි මහ රජතුමා මගුල් මඩුවේ සුදු අතුරන ලද ආසනයක වැඩ සිටියේ ය. මේ තේජස්වී පුරුෂයා තනි සුදු ඇඳුමකින් සැරසී එහි සිටි නමුත් මේ නම් මහ රජු ම මිස අනිකකු යි වරදවා ගත නො හැකි විය. මධ්‍යම ප්‍රමාණයට වැඩුණ තරබාරු දේහයක්

හා මුහුණ පුරා වැඩුණ සුදු වූ රැවුලක් ද ඇති ව සිටි රජතුමාගේ කළු මහත් දෙනෙත ප්‍රතාපවත් විය. මේ රජු අවුරුදු හැත්තෑ හයක් වයස් වූවෙකැයි දකින කිසිවෙකුටත් නොකිය හැකි තරම් වී ය.

නීග්‍රෝ ජාතික යොධයෝ දෙදෙනෙක් කඩු හා හෙල්ල දරා රජු දෙපසින් සිටියෝ ය. අදිකාරම්වරු දෙදෙනෙක් ද එහි වූහ. පිරිස රජු ඉදිරියට ගොස් තරමක් දුරින් නැවතුණ විට රජුගේ නිර්භීත තියුණු දෙනෙත පිරිසේ එකිනෙකා කෙරෙහි යොමු වී අන්තිමට හැන්ස් වෙත පැමිණ නැවැත්තේ ය. ආරක්ෂක භටයන්ට මැදි වූ හැන්ස් සිටියේ පසු පසිනි. වෙස් මුහුණක් මෙන් පෙනුණ රජුගේ මුහුණෙන් කිසිවක් තේරුම් ගැනීමට අසමර්ථ වූ හැන්ස්ට එය දැකීමෙන් මහත් බියක් හට ගත්තේ ය. එහෙත් රජු දෙවෙනි වරට හැන්ස් දෙස කෙළින් බැලූ විට මේ දෙනෙතේ එක්තරා කුතුහල ගතියක් පෙනෙන්ට තුබුණ හෙයින් ඔහුගේ බිය තරමකින් අඩු විය. හැන්ස් මෙතෙක් බලාපොරොත්තු ව සිටියේ මීට වඩා දරුණු පුද්ගලයකු දැකීමට ය.

මේ මහ රජ බාහිර පෙනුමෙන් මිණිය හැකි පුද්ගලයකු නොවන බව අනිත් අය දැන සිටි නමුත් ඒ වග හැන්ස් නො දත්තේ ය. ඔහු දැන සිටියේ නම් රජු කෙරෙහි මෙවැනි විශ්වාස-යක් නොතබනු ඇත. රජතුමා කිසි විටෙකත් තම කෝපය පිටතට නොපෙන්නුවේ හොඳ හැටි සිතා මතා කරන සියල්ලක් කෙළේ විය. ඔහුගේ ක්ෂණික දරුණු තීරණයන් එක්වර ම ප්‍රකාශ වන තුරු කිසිවකුටත් ඔහුගේ අදහස් තේරුම් ගත හැකි නො වී ය. යම්තමින් හෝ ඔහු අමනාප කිරීම අන්තරාය කර කාරියකි. මෙහි රැස් ව සිටි සියලු දෙනාට ම වඩා සුදු ගෝනා ඇල්ලීමේ කාරිය භාර ව සිටි විද්‍රනේ බියපත් ව සිටියේ ය.

වන සතුන් කෙරෙහි ඇල්ම දැක් වූ මේ මහ රජ විශේෂයෙන් සුදු ගෝනා වැනි දුර්ලභ අලංකාර සතුන්ට ප්‍රිය කෙළේ ය. සුදු ගෝනකු වනයේ හැසිරෙතැ යි ඇසූ තැන් පටන් ම ඌ අල්ලා තම වන සතුන් ගාලට ගෙන එන තුරු අන් කිසිවකින් රජු සතුටු කළ හැකි නො වී ය. සුදු ගෝනා අල්ලා ගෙන එන්නකුට ලොකු තෑග්ගක් දෙන බව රජතුමා ප්‍රකාශ කෙළේ ය.

සුදු ගෝනා ඇල්ලීමට ගිය පිරිසේ කාර්‍ය්‍යය අසාර්ථක වූ බව හා සුදු වැද්දකු ඊට සම්බන්ධ බවත් කල් ඇති ව රජුට අසන්ට ලැබී තිබිණ. දැන් ඒ පිළිබඳ සම්පූර්ණ කතාව ඇසීමට මහ රජ සූදනම් වෙයි.

රජු කථා කරන තෙක් මගුල් මඩුවේ රැස් ව සිටි පිරිසේ කිසිවකුත් කිසි ම හඬක් නොනගා සිටීමෙන් රජු ඉතා ළඟින්

ආශ්‍රය කරන්නෝත් . රජු කෙරෙහි කොතරම් භයක් ඇති ව සිටියෝ දැයි සිතා ගත හැකි විය.

මහ රජුගෙන් ලැබුණු අවසරය අනුව, හැන්ස් භාරව පැමිණි අදිකාරම් තැන රජු ඉදිරියට ගොස් තෙවරක් බිම වැටී නමස්කාර කොට ඉදිරියට හිස නමා ඇණ බා සිටියේ ය. සිංහාසනයේ පිටු පසට ඇළ ව පුටු අත් දෙකෙහි දෑත රඳවා ගත් රජ තෙම කථා කෙළේ ය.

"වනේ හැසිරෙන සුදු ගෝනකු අල්ලා ගෙන ඇවිත් මට භාර දීමට මම දිසාවට භාර කළා. දැන් ඒ රාජකාරිය ඉවර උණා ද?" රජු කථා කෙළේ සාන්ත ව ය.

"පස්වාන් දහසකට ආයුබෝවන්ඩ මහ රජාණන් වහන්ස, ඒ රාජකාරිය ඉෂ්ට කරන්ඩ ගැත්තවුන්ට බැරි වුණා," දිසාව කියා සිටියේ ය.



"දේවයන් වහන්ස, බලු ගැත්තාට එය කරන්ට බැරි වුණා."

"හොඳයි, ඊට හේතුව කියා හිටිමු."

"ඒක දිග කතාවක් දේවයන් වහන්ස. තරහ අවසර නොවදා-රනවා නම් ඒ රාජකාරිය බාර ව එතැන හිටි විදනෝගේ කටින් ම මේ කතාව අසා වදාළොත් හොඳයි."

"කවුරු ද ඒ විදනෙ?" රජ විමසුවේ ය.

"මේ රාජකාරිය භාර ව කටයුතු කිරීමට මා පැවරූ විදනෝ."

"මේ වගේ වැදගත් රාජකාරි කටයුත්තක් නොවැරදී කළ හැකි කෙනකුට භාර දීම දිසාවගේ වග කීමක්."

"පස්වාන් දහසකට ආයුබෝවන්ඩ දේවයන් වහන්ස, මේ තෙන්නකෝන් විදනෙ මේ වගේ කටයුතුවල හොඳ ම පළ-පුරුද්දක් ඇති කෙනෙක්. මින් ඉහත බොහෝ වාරවල වන සතුන් අල්ලා මහ වාසලට ගෙනවුත් තියෙනවා. මේ වාරයේත් දේවයන් වහන්සේගේ හිත වැටුණ සතා ඇල්ලීම මේ ගෙනත් ඉන්නා සුදු වැද්ද නිසා නො වේ නම් සාර්ථක උණා ම ය කියන්ඩ ඕනෑ."

රැවුල අතින් පිරිමදිමින් මෙහිදී මහ රජු හැන්ස් දෙස බැලූ තියුණු බැල්මෙන් බිය ගත් හේ හැකිළී ගියේ ය. රජුගේ කෝපය ඔහු කෙරෙහි එක වර ම කඩා හැලුණාට වඩා මෙහිදී ඇති වූ අවිනිශ්චිත භාවය ඔහුට ඉසිලීමට අමාරු දෙයක් විය.

"හොඳයි, විදනෝ මෙහි කැඳවමු," මෙහිදී රජු අණ කෙළේ ය.

තවත් වරක් බිම වැටී රජු නමස්කාර කළ දිසාව පස්සෙන් පස්සට ගොස් හැරී ගමන් කෙළේ ය.

තදින් තැති ගෙන සිටි විදනෝ මෙවිට රජු නමස්කාර කොට හිස ඉදිරියට නමා දණ ගසා ගෙන සිටියේ ය.

මිනිසුන් කෙරෙහි අණ පවත් වන, අලංකාර ලෙස ඇඳ පැලඳ මහෙශාක්‍ය ලීලාවෙන් ඇතුන් පිට නැගී යන මේ ජන ප්‍රධානයෝ මෙවැනි දීන තත්වයක වැටෙන මෙවෙලේ දිවි සමකින් පමණක් හිණ වසා ගත් ගෙතී එල්ලෙන දිග කෙහෙ ඇති වනචාරියකු වූ තමාට කෙබඳු ඉරණමකට මුහුණ පාන්ට වේ දැයි හැන්ස් විමතියෙන් පසු විය. මේ මගුල් මඩුවේ රැස් ව සිටින අලංකාර ඇඳුම් ආයිත්තමින් සැරසුණු මිනිසුන් අතර වනචාරී වෙසින් සිටියේ හැන්ස් ම පමණක් වී ය.

"කැලේ සතකු අල්ලා ගෙන ඒමට මගේ අණින් තමා පිටත් කර යැවුවා. ඇයි ඒ රාජකාරිය ඉෂ්ට කර ඒ සතා ගෙන ආවෙ නැත්තෙ?" රජ තෙම විදනෝ අමතා ඇසුවේ ය.

"පස්වාන් දහසකට ආයුබෝවන්ඩ දේවයන් වහන්ස, රාජ-කාරිය ඉෂ්ට නොකළ බලු ගැත්තාට සමා අවසර දෙවා වදරන්ඩ හොඳයි," ඔහුට කියා ගත හැකි වූයේ එපමණකි.

"හොඳයි, ඒ ගැන තොපට කියන්ට ඇත්තේ මොකක් ද?"

මුලදී තැති ගැන්මෙන් යුතු ව ගොත ගසමින් කතා කළ විදනේගේ කට හඩ ක්‍රමයෙන් දැඩි වන්ට වී ය. සුදු ගෝනා පලා යාමේ පුවත විස්තර කර කියන විදනේ තමා ඇතුන් බඳින්නවුන්ගේ නායකයාත් සමග ගෝනා ඇල්ලීමේ කටයුතු ඉතා සැලකිල්ලෙන් හා ප්‍රවේසමෙන් සාකච්ඡා කොට යොද ගත් සැටි ද, කොතරම් වෙහෙසකින්, කොතරම් ඉවසීමකින් හා කොතරම් දිග කාලයක් තිස්සේ ඉඩෝරයෙන් දිය සිඳී වියලී ගිය මහ වනයට වැදී මෙතරම් විශාල පිරිසක් පාලනය කර ගෙන විලත් විල් එළියත් වට කොට රහස් වැටක් ලා සතා මැදි කර ගෙන මදු ගසා ඌ අල්ලා ගත් සැටි ද, ඌ මහ වාසලට ඔසවා ගෙන ඒමට කූඩුවක ලා සූදනම් කොට සිටියදී මේ සුදු වැද්ද ඔවුන්ගේ නිදිවර බලා ඔවුන් අතරට රිංගා ඌ මුදු ගෙන උගේ පිට උඩ නැගී පැන ගිය සැටි ද, පසු ව වැද්දන්ගේ මග පෙන්වීම අනුව ගොස් සුදු වැද්ද අල්ලා ගත් සැටි හා කළු දිවියා හදිසියේ පැන ඇතුන් බඳින රාළ මරා දැමූ සැටි ද, මේ දිවියා සුදු වැද්දගේ ආරක්ෂාවට නිතොර ව ම ඔවුන් අවට වනයේ රැක සිටි සැටි හා පසු ව උගෙන් ඈත් කොට ආරක්ෂා ඇති ව සුදු වැද්ද මහ වාසලට පැමිණි වූ සැටි ද එකින් එක විස්තර කොට කීවේ ය.

රජ තෙම මේ කතාව සාවධාන ව අසා සිටියේ ය. හැන්ස් පිළිබඳ සිද්ධි විස්තර කරන විට රජුගේ දෙනෙත වරින් වර හැන්ස් කෙරෙහි යොමු වුණ නමුත්, මේ කතාව කියන විට අසා සිටි දිසාව ආදීන්ගේ මුහුණුවල මෙන් වරින් වර වෙනස් වුණ ස්වභාවයක් හෝ නො පෙන්වී ය. විස්වාස කළ නොහැකි තරම වූ මේ කතාව එහි රැස් ව සිටි සෙස්සවුන් අසා සිටියේ විස්මයා-කුල දෙනෙතින් හා වරින් වර වෙනස් වුණ මුහුණෙන් ද යුතු ව ය.

මෙසේ කියා ගෙන ගොස් කතාව ඉවර කළ විදනේ අවසානයට "පස්වාන් දහසකට ආයුබෝවන්ඩ දේවයන් වහන්ස, බලු ගැත්තාට අනුකම්පා දෙවා වදළ මැනව. මේ කියා සිටියේ සම්පූර්ණ ඇත්ත සිද්දියයි. මින් ඉහත කිසි දකවත් අණක් කඩ නොකර ඉෂ්ට කළ මේ බලු ගැත්තාට සමා අවසර දෙවා වද-ළොත් හොඳයි," කියා බිම දිගා වී දෑත් එකතු කොට හිස් මුදුනේ තබා නමස්කාර කෙළේ ය.

"නැගිට යව," යි රජු තෙපළේ ය.

මී ළඟට රජුගේ සංඥාවකින් ඉදිරියට ආ ඉංග්‍රීසි කපිතාන්වරු දෙදෙන සිංහල නිලමේවරුන් මෙන් දණ ගැසීමක් නොකොට ඉංග්‍රීසි හේවා චාරිත්‍රය අනුව ආචාර කොට සිටියෝ ය.

"ඔය කොලුවාගෙ අත්වල විලංගු ගළවා ඔහු මෙහාට කැඳ-වවු," රජතුමා ඉතා චතුර ලෙස පෘතුගීසි භාෂාවෙන් අණ කෙළේ ය.

කපිතාන්වරු රජතුමාත් අණ කළ ලෙස කළෝ ඔහු ඉදිරියට කැඳවූහ.

රජතුමා පැසසුම් බැල්මකින් හැන්ස් දෙස බොහෝ වේලාවක් බලා සිට එක් කපිතාන් කෙනකු අමතා, "පෙ/රෙයිරා, තමා භාෂා කීපයක් ම දන්නවා නේ. මේ කොලුවා මොන ජාතියකට අයිති ද අහලා බලන්ඩ," යයි අණ කෙළේ ය.

පෙ/රෙයිරා තමාගේ ම භාෂාව වූ පෘතුගීසි භාෂාවෙන් හැන්ස් ප්‍රශ්න කෙළේ ය. ඉන්පසු වඩා හුරු නැති ඉංගිරිසියෙන් හා ප්‍රංශ භාෂාවෙන් ද ප්‍රශ්න කෙළේ ය. හැන්ස් ඔහුට පිළිතුරක් නොදුන්නෙන් හේ තමාගේ කාරිය සාර්ථක නො වූ සේ ඉඟියක් කොට එතැනින් ඉවත් වී ය.

"දැන් බලන්ඩ තමා ප්‍රශ්න කරන්ඩ," රජතුමා අනික් කපිතාන්ට අණ කෙළේ ය.

"මහ රජතුමා දැනගන්ඩ කැමතියි යුෂ්මතා මොන රටකට අයිති ද කියා," හේ ප්‍රශ්න කෙළේ ය.

හැන්ස් වහා ම මේ ප්‍රශ්නකරු දෙස නෙත් යොමු කෙළේ ය. මේ නොදන්නා රටෙකදී තමාගේ ම ජාතික භාෂාවෙන් තමා අමතනු ලැබීම ඔහුගේ කනට මිහිරි සංගීතයක් මෙන් විය. අවස්ථාව අනික් එකක් වී නම් එවෙලේ ඔහු ප්‍රශ්නකරු වැළඳ ගනු නො අනුමාන ය.

"මගේ රට ඕලන්දය," හැන්ස් පිළිතුරු දුන්නේ ය.

"ඔහු මගේ රටේ දේවයන් වහන්ස," යි කපිතාන් රජුට කීවේ තරමක ආඩම්බරයක් සිතට ගනිමිනි.

"ආ! අහන්ඩ, ඔහු මේ වනගත ජීවිතයට වැටුණෙ කොහොම ද කියා."

තම රටේ වැසියකු හා කථා කරන්නේ ය යන හැඟීමෙන් සිටි හැන්ස් තමා "ඊස්ට් ඉන්ඩියා" නැව් සමාගමට බැඳුණ හැටි හා නැව බිඳී ගොස් පාළු වෙරළකට පා වූ සැටි ද, කිසිවකු හමු නොවූයෙන් අසල වූ වනයට වැදුණ සැටි ද හේ කියා සිටියේ ය.

මේ කතාව පෘතුගීසි භාෂාවෙන් රජුට කී විට, "ඔය කොච්චර කලකට ඉහත ද?" රජු ප්‍රශ්න කෙළේ ය.

එය තමාට හරි හැටි නොකිය හැකි බවත්, එවිට වයස දහතර බවත් වන ජීවිතයට වැටීමෙන් පසු ව දින වකවානු පිළිබඳ දැනුම තමා කෙරෙන් දුරු ව ගිය බවත් හැන්ස් කීවේ ය.

එවිට හැන්ස් දෙස හොඳින් විමසා බැලූ රජතුමා කපිතාන් අමතා, ''කැප්ටන් වැන් ස්ටෙරවෙල්ට්, දැන් මොහුගෙ වයස කීයක් වගේ ඇද්ද කියන්ට හැකි ද'' යි විමසී ය.

''දහ අටක් දහ නවයක් විතර ඇති කියන්ට පුළුවනි.''

''මටත් පෙනෙන්නෙ ඒ තරම් තමා,'' රජ එකඟ වී ය. ''ඔහු හැඩි දැඩි මිනිහෙක්; වනේ රළු ජීවිතය නිසා ඔහුගෙ ඇඟ වැඩුණු මිනිහකුගෙ වගේ හැදිලා; ඇතත් ඔහුගෙ මුහුණේ රැවුල වැඩී නැහැ.''

කපිතාන් සිනාසුණේ ය. රජතුමා සිරකරු ගැන සැලකිල්ලක් දැක්වීම ඔහුගේ සැනසිල්ලට හේතු විය.

ඕලන්ද භාෂාවෙන් හැන්ස්ගෙන් ප්‍රශ්න ඇසූ අතර පිළිතුර පෘතුගීසි භාෂාවෙන් රජුට දන්වන ලදි.

''මේ අවුරුදු කීපයක කාලය තුළ කොහොම ද ඔහු වනේ ජීවත් වුණේ? ඔහු අත ආයුධ මොකුත් තිබුණා ද?''

''නැත මහ රජතුමනි, බොහොම කාලෙකට පසු වැද්දන් හමු වී ඔවුන් අතරට වැටෙන තුරු එවැනි කිසිවක් තිබුණේ නැහැ.''

''මුලදී කෑම සොයා ගැනීමට ඔහු මොක ද කෙළේ?''

''මොහු කියනවා, තමා කෑ යුතු දේ ඌරන්ගෙන් ඉත්තෑවුන්ගෙන් වඳුරන්ගෙන් ඉගෙන ගත්තා කියා. සමහර දවසක දිවියකු මරා දැමූ සතකුගේ මසක් ලැබී තිබෙනවා.'' කැප්ටන් මේ පිළිතුරු දුන්නේ සිනා මුසු ව ය.

රජුගේ කුතුහලය වැඩි වී තව තවත් ප්‍රශ්න කරන්ට වී ය. එයින් උනන්දු වූ හැන්ස් තමා පිළිබඳ ප්‍රවෘත්තිය ටිකින් ටික විස්තර කෙළේ රජුගේ ආසාව තෘප්ත කෙළේ ය.

එයින් පසු නැවතත් රජතුමා, ''ඔහුගෙන් අහන්ඩ, මේ මිනිසුන් අල්ලා ගෙන සිටි සුදු ගෝනකු මුද හැරීම ගැන අපූරු කතාවක් අපි දැන් ඇහුවා. ඒ කතාව ඇත්තක් ද කියා.''

ඒ කතාව හරියට තේරුම් ගන්ට බැරි උණත් ඒ කීම ඇත්ත යයි තමා සිතන බව හැන්ස් කියා සිටියේ ය.

''ඔහුගෙන් අහන්ඩ, මගේ අණින් මිනිසුන් අල්ලා ගෙන සිටි ඒ සතා නිදහස් කර ඇරියෙ ඇයි කියා?''

රජුගේ මේ ප්‍රශ්නවලට හොඳ කල්පනාවෙන් පිළිතුරු දිය යුතු බවට හැන්ස්ට අවවාදයක් කළ කපිතාන් ප්‍රශ්නය ඉදිරිපත්

කෙළේ ය. තමා කී දේට වැඩිමනත් දෙයක් කතාවට එකතු කළ බව තේරුම් ගත් රජ කපිතාන් කඳිප් අමතා "වැන් ස්ටෙරවෙල්ට්, මා කියන දේට වැඩිමනත් දෙයක් නො කියා මා අහන දේ පමණක් ඔහුගෙන් අහන්ඩ," කියා අණ කෙළේ ය.

කපිතාන් යටත් පහත් ලෙස හිස නැමුවේ, "හොඳයි, උත්තර දෙන්ඩ," කියා හැන්ස්ට කීවේ ය.

"ඒ සුදු ගෝනා මගේ මිත්‍රයා; ඌ හිරකර ඉන්නවා දැකීම මගේ සිතට දුකක් වුණා. මේ රජ අණින් කළ වැඩක් වග මා දැන හිටියේ නැහැ."

"හොඳයි, මේක මගේ අණින් කළ දෙයක් කියා දැන හිටියා නම් ඒත් නිදහස් කර අරිනවා ද?"

කපිතාන් මේ ප්‍රශ්නය ඉදිරි පත් කළ විට මීට දෙන පිළිතුර කෙතරම් බරපතල වෙනසක් ඇති කළ හැකි දැයි ඔහුට කල්පනා විය. දිය හැකි පිළිතුරක් නොදැක හේ වට පිට බලන්ට විය. සභාවෙහි තරමක කලබල ගතියක් ඇති විය.

"රජතුමා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා," කපිතාන් කී ය.

එහෙත් පිළිතුර හැන්ස්ගේ මුවට නො ආවේ ය.

"හොඳයි කමක් නැහැ. ඒක පසුවට පුළුවනි. අර කී කළු දිවියාත් මිත්‍රයෙක් ද?"

"එහෙමයි. මම ඌ පැටවා කාලේ හිට හදා ගත්තා. මේ මා ඇඳගෙන ඉන්න දිවි සම උගෙ අම්මාගෙ."

රජතුමා හැන්ස් ගැන මොහොතක් වේලා කල්පනා කළේ, කපිතාන් අමතා, "කැප්ටන් වැන් ස්ටෙරවෙල්ට්, මේ කොලුවා කැටුව යන්ඩ, ඔහුගෙ භාරය මම කැප්ටන්ට පවරනවා. ඔහුට හොඳින් සලකන්ට ඕනෑ. ඒ වගෙම හොඳින් ඔහු රැකවල් කරන්ට ඕනෑ. යම් විදියකින් මෙයින් පැන ගියොත් මේ ගැන තමා වග කියන්ට වේවි. කොහොමටවත් මොහුගෙ මේ ඇඳුම වෙනස් කරන්ට එපා. නැවත මට මොහු වුවමනා කරන දිනය මම දන්වන්නම්."

රජුට ආචාර කළ කපිතාන් හැන්ස් කැඳවා ගෙන මඩුවෙන් පිටත ගියේ ය.

විදනෝ නැවතත් සභාවට කැඳවන ලදි. බියෙන් වෙවුලමින් ඔහු එහි පැමිණියේ තව මොහොතකින් තමාගේ ඉරණම විසඳෙන බව සිතා ගත්තේ ය.

සාන්ත ස්වරයකින් විදනෝ අමතා කතා කළ රජතුමා, "විදනෝ මෙයින් පිටත් කෙළේ සුදු ගෝනා අල්ලා ගෙන එන්ට.

ඒත් මට මෙහි ගෙනාවේ සුදු වැද්දකු. වනේදි සතා හොයා ගන්ඩ බැරි වුණා නම් මට හිතාගන්ට තුබුණා ඌ දිවියකුගෙන් මැරුම් කන්ට ඇති; එහෙම නැත්නම් ඒ සුදු ගෝනා ගැන කතාව කාගෙ හරි හිතලුවක් පමණක් වෙන්ට ඇති කියා. සතා අල්ලා ගන්ට බැරි උණා කීවා නම් ඒත් සමාවක් දෙන්ඩ ඉඩක් තුබුණා. එහෙමත් නැති ව මේ සතා අල්ලා ගෙන ඉවර වෙලා, මේ තරම විශාල මිනිස් පිරිසක් රවටලා එක කොලුවකුට සතා මුදා හරින්ට ඉඩ දුන්නා. නුඹලා හැම දෙනා ම එදා රෑ නිදා හිටිය නිසා මිස එහෙම නූනා නම් මේ සිද්දිය මෙහෙමට වෙන්නෙ නැහැ. දූන් තමා කීවා ඉහතදි මෙහෙම දේ පැහැර නොහැර ඉෂ්ට කළා කියා. ඒවාට සුදුසු තෑගි තමා ලැබුවා. දූන් කාරණය වී ඇත්තේ මේ කාරිය ඉෂ්ට නොකළා කියන එකයි.

විදනේ බියෙන් තැති ගෙන ඩහදියෙන් නැහැ වී ඇඟ සිහිල් ව ගොස් පෙරට වඩා ගෞරවාචාර සහිත ව මුණින් වැටී වැන්දේ රජතුමා තීරණය දීමට සැරසී ඇති බව සිතා ගැනීමෙනි.

"පස්වාන් දහසකට ආයුබෝවන්ඩ දේවයන් වහන්ස, බලු ගැත්තාට එක වචනයක් කියන්නට අවසර දෙවා වදළොත් හොඳයි."

"කියව," රජුගෙන් වචනය පිට වූයේ කිනිසි පහරක් එන වේගයෙනි.

"මේ සුදු කොලුවා අල්ලා ගත්ත හේතුවෙන් දේවයන් වහන්ස, අපට සුදු ගෝනා විතරක් නෙමෙයි, කළු දිවියාත් අල්ලා ගන්ට පුළුවන් විදියට කටයුතු සැලසිලා තියනවා."

"ඇයි එහෙම නම් එහෙම නො කළෙ?"

"එහෙම කරන්ට උත්සාහ නොකළා නෙමෙයි දේවයන් වහන්ස, මුළු දවසක් තිස්සේ අපි දෙන්නා මහන්සි ගත්තා ඔහු ලවා සුදු ගෝනා අල්ලවා ගන්ට. ඔහුට හිරිහැර කරන බලයක් අපට තිබුණේ නැහැ. ඔහු නිදහස් කර අරින බව පවා කීවා සුදු ගෝනා අල්ලා දුන්නොත්. ඒත් ඔහු බැහැ කියනවා. ඒත් දේවයන් වහන්සේ ඉදිරියෙ එහෙම වෙන එකක් නෑ. ඔහු ඔබ වහන්සේගෙ අදහසට නම්මවා ගත්තොත් අපට කරන්ට ඇත්තේ ඔහුත් කැටුව ආයෙ ම වනයට ගිහින් උන් තුන් දෙනාමත් කැටුව ආපහු ඒමයි. මේ මිනිහා අඩක් නැගු හැටියෙ ඒ සතුත් ළඟට එනවා. මොන ප්‍රාතිහාර්යයක් ද මට නම් තේරෙන්නෙ නෑ," විදනේ කියා සිටියේ ය.

"හොඳයි අපි බලමු. විදනේට කළ යුත්ත මම දෙවනු බලන්නම්. දූන් යමු."

නැවතත් වරක් සමාව ඉල්ලමින් වැඳ වැටුණ විදනේ පස්සෙන් පස්සට ආපසු ගියේ ය.

සභාව විසිරී ගිය පසු එහි ඉතිරි වූයේ රජතුමා පමණකි. "ඕලන්ද තානාපති තව කීප දවසකින් මෙහි එනවා. ඔවුන්ට පෙන්වන්ට අලුත් දෙයක් මට දැන් තියනවා," හේ තමාට ම කියා ගත්තේ ය.

# 20

## රාජ සභාව

ඇඩ්මොන්ට් වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හැන්ස් අතින් අල්ලා ගෙන වාසලින් පිට වූයේ තමා යටතේ සිටි සිංහල සාජන්ට් කෙනකුට හා හේවායන් සිවු දෙනකුට ද කළ යුතු දේ විධාන කොට හැන්ස්ගේ භාරය පැවරුවේ ය.

මොවුහු හැන්ස් කැඳවා ගෙන ගොස් ශක්තිමත් මුර ගෙයක දමා රැකවලට දෙදෙනකු එහි සිට වූහ. මෙහි දෙරටුව මෙන් ම බිමින් අඩි අටක් පමණ ඉහළින් තුබුණ කුඩා වා කවුළුව ද යකඩ ගරාදි සවි කරන ලද ඒවා විය. ලීයෙන් කළ ඇඳකුත් කුඩා පුටුවකුත් පමණක් එහි තුළ තිබිණ.

එහිදී ඔහුට ලැබුණ බත්මාලු රටේ සිරිතට අනුව හේ අතින් කෑවේ ය. ඉන් පසු එහි හිඳ ගෙන තමා ලැබූ මේ අත්දැකීම් මෙනෙහි කරන ඔහුට මෙවිට මැදිරියක ලූ සතකුගේ වැනි හැඟීමක් ඇති විය. මෙවෙලේ බරට අඩි තබා එන කිසිවකුගේ අඩි ශබ්දයක් පිටතින් ඔහුට ඇසුණේ ය. වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් මුරගෙයි දෙරටුව හැර එහි ඇතුළු වී රැකවලුන්ට ඉවත් ව යන සේ අතින් සංඥා කෙළේ ය.

ඔහු ඇතුළු වෙද්දී හුන් පළින් නැගී සිටි හැන්ස්ට "ඉඳ ගන්ට" යයි කී හෙතෙම තම කබායේ කරේ බොත්තම් බුරුලු කොට ගෙන හැන්ස් පසෙකින් ඇඳේ වාඩි විය.

"ඉතින්, ඉතින්, මෙක හරි ම ජංජාලයක් තමා," හැන්ස් ආසා කළ ඕලන්ද භාෂාවෙන් හේ කථා කෙළේ ය. "මොකක් ද දැන්

මෙකෙන් වෙන්ඩ යන්නේ? දෙයියො තමයි දන්නෙ,'' හේ තම දෑත එකවර ඔසවා නැවත පහත් කොට දෙකලවා මත රඳවා ගත්තේ ය.

''ගැස්පර්—මහ වාසලදි ඔබ දුටු අර පෘතුගීසි කපිතාන් මේ දූන් මට කීවා, අප එතැනින් පිට වෙලා ආවායින් පස්සෙ අර කාලකණ්ණි විදුනෙ රජතුමාගේ හිතට මහ වස අදහසක් ඇතුළු කළා කියලා.''

තව දුරටත් කතාව කර ගෙන ගිය කපිතාන්, විදුනේ රජුගෙන් සමාව ඉල්ලා වැඳ වැටුණු සැටිත් එහිදී ඔහු සුදු ගෝනාත් කළු දිවියාත් අල්ලා ගැනීමට උදව් දෙන සේ හැන්ස්ට බල කිරීමට රජුට කියා සිටි සැටිත් විස්තර කෙළේ ය.

කපිතාන් මේ කතාව කියන අතර හැන්ස්ගේ මුහුණේ ඇති වූ වෙනස් වීම හේ පරීක්ෂාවෙන් බැලුවේ ය. ඔහු මුහුණ නරක් කර ගෙන කිසිවක් කියන්නට සැරසෙද්දී අතක් ඔසවා ඔහු වැළකූ හේ, ''ඉන්ඩ, ඉස්සර වෙලා මා කියන දේට හොඳින් කන් දෙන්ඩ,'' කියමින් සුසුමක් හෙළුවේ ය. තමාට පැවරී ඇති කාරිය අම්හිරි එකක් සේ ඔහුට පෙනී ගියේ ය.

''හැම දේකට ම ඉස්සර වෙලා මේ කාරණය හිතට ගන්ඩ. මේ රජතුමා වන සතුන්ට බොහොම ඇලුම් කරන කෙනෙක්. විශේෂයෙන් ඔය වගේ දුර්ලභ සතුන්ට. බලන්ඩ ඕනැ රජ-තුමාගේ සතුන් ගාල. ඒකෙ අශ්වයො, සිංහයො, උකුස්සු, ඔය හැම සත්තු ම ඉන්නවා. මොකුන් ද නැත්තෙ? මස්සු හිටන් ඉන්නවා. රජතුමා තමන්ගෙ අතින් ම උන් කවනවා. සතුන් බලන සේවකයකු නොසැලකිල්ලෙ වැඩ කළොත් හෙම උන්දෑ ඉවර යි. වරක් එක උකුසකු මැරෙන්ඩ ඇරියා කියලා රජතුමා කොලුවකු මරන්ට අණ කළා.''

හැන්ස් මවිතයෙන් කට අයා ගත්තේ ය.

''ඔව්, ඒක එහෙම තමයි. ඉතින් රජතුමා මේ සුදු ගෝනා ගැන ඇහුවා ම ඌ මහ වාසල සතුන් ගාලට ගෙන්නා ගන්ට තීරණය කර ගත්තා. මම නම් මට මේ මුළු ඉන්දියා දේසෙ ම වස්තුව දෙනවා කීවත් ඒ විදුනෙයි අනිත් මිනිසුනුයි භාර ගත් කාරිය බාර ගන්නෙ නෑ. දැන් ප්‍රශ්නය වෙලා තියෙන්නෙ ඔවුන්ට ඒ කාරිය ඉෂ්ට කරන්ට බැරි උණා ම ද ඊට තව කල් තියනවා ද යන්න යි. විදුනෙගෙ කතාව අනුව රජතුමා ඒ ගැන බලාපොරොත්තුවක් ඇතුව ඉන්නවා. ඒක යි රජතුමා විදුනෙගෙ දඬුවම කල් දැමුවෙ. නැත්නම් එතුමා කාටවත් එහෙම දඬුවම් නොකර අරින්නෙ නෑ. ගැස්පර් මාත් එක්ක කීවා විදුනෙගෙ කතාවට රජතුමා වැඩි සතුටක් පෙන්නුවෙ නැහැ කියා,'' කපිතාන් කී ය.

''මම නම් කිසි ම දවසක ඔය වන සතුන් පාවා දෙන්නෙ නෑ.'' හැන්ස් කීවේ ය.

වැන් ස්ටෙරවෙල්ට් තොල විකා ගෙන හිය සැලුවේ ය. ''ඔය තරම ඉක්මන් වෙන්ට එපා, ළමයා. ඒ ගැන ඔය තරම විශ්වාසයක් තියා ගන්ටත් එපා. මිනිසුන් ලවා තමන්ගෙ අදහස් ඉෂ්ට කරවා ගන්න මහ දරුණු ක්‍රම රජතුමා දන්නවා. කවුරු හරි එහෙම නොකළොත් ඉතින් දෙයියන්නෙ පිහිට තමා. ඊටත් වඩා මොකුන් ද වන සතුන් කියන්නෙ; උන් නිසා මිනිසුන් වදයට කැපවෙන්ට ඕනැ ද?''

''මේ සත්තු මගෙ මිත්‍රයෝ.'' හැන්ස් කීවේ ය.

''ඔව් හොඳයි, මම හිතනවා රජතුමාගෙ හැටි තව ටිකක් මම විස්තර කරලා කීවොත් හොඳා කියලා. ඒක ඉක්මනින් කළ තරමට හොඳයි. මොකද, කාටවත් කියන්ඩ බෑ රජතුමා මේ ගැන කොයි වේලේ ඔබ කැඳවයි ද කියලා? බාග වෙලාවට හෙට වෙන්ඩත් පුළුවනි, නැත්නම් තව සති ගණනකින් වෙන්ඩත් පුළුවනි. සූදානමෙන් ඉන්නවා හොඳයි. එතකොට තමන් දන්නවා රජු ඉදිරියෙ කොහොමට ද හැසිරෙන්ට ඕනෑ, කොහොමට ද උත්තර දෙන්ට ඕනැ කියලා? එක වචනයක් වැරදුණොත් උන්දෑ එතනින් ම ඉවරයි.''කපිතාන් ඔහුට අවවාද කෙළේ ය.

''ඔබ කළ රාජාපරාධය ගැන කියද්දී අද රජතුමා බොහොම සාන්ත ව යි හිටියෙ. ඒත් එයින් රැවටෙන්ට එපා. ඔබ ගැන රජතුමාගෙ හිතේ මොන අදහසක් ඇද්ද කියලා තව කාටවත් කියන්ඩ බෑ. අද උදේ අහපු අර ''රජ අණින් ගෝනා ඇල්ලූ වග දන්නවා නම් ඒත් ඌ නිදහස් කරනවා ද කියන ප්‍රශ්නයට උත්තර නොදී ඉඳිද්දී මා හිටියෙ බයේ හුස්මත් නැතුව. මොකුත් ම නොකියා හිටියායින් බේරුණා. ඒත් අනිත් සැරේ ඔය ප්‍රශ්නය අහන කොට උත්තර නොදී ඉන්ට හම්බ වෙන්නෙ නෑ. ඔය ප්‍රශ්නය ආයෙම අහනවටත් මට සිකුරු යි.''

කපිතාන් තැන තම හිසකේ පිටු පසට අත ගා හැරියේ ය. රැවුල පිරිමැද්දේ ය. හැන්ස්ට තව දුරටත් කරුණු කීමෙන් ප්‍රයෝජනයක් වේදෝයි සිතූ සේ පෙනිණ. එහෙත් නැවත හිත හද ගත් හේ කථා කෙළේ ය. ''රජතුමාගෙ උදහස කොයි කාටත් එක යි. එයින් බේරෙන කෙනෙක් නෑ. බන්ධනාගාර ගත කරපු සිය ගණන් ඉන්නවා. පොඩියක් උස් වෙලා ඔය ජනේලයෙන් පිටත බලන්ඩ.'' කපිතාන් කී විට හැන්ස් එසේ කෙළේ ය.

''ඔය යදම්වලින් බැඳලා වීදි අතුගාන හිරකාරයන් පේනවා නේ ද? ඔයින් සමහරු උසස් පෙළපත්වල රදලවරු. සමහරු සාමාන්‍ය මිනිස්සු. ඔය කවුරුත් එක හිරගෙයි එකට තපින්නෙ.

සමහරකුට කෑම දෙනවා. තවත් සමහරෙක් රැකවලුන් එක්ක ගිහින් හිහා ගෙන කන්ඩ ඕනැ. මෙහෙම අවුරුදු ගණන් හිරබාරෙ ඉන්න මිනිසුන් දවසක ගෙන්නලා මරනවා, මොන හේතුවක් නිසා ද කියා දන්නෙ නැහැ.''

විදේශිකයකු හිර බාරෙට ගත්තා ම ඔවුන්ට කිසි දවසක ගැළවිලා යාමට ඉඩ දෙන්නෙ නෑ. ගැස්පර් ෆෙපරෙයිරා, මා වගේ කීප දෙනකු රාජ සේවයට යොදා ගෙන ඉන්නවා. ඒත් අනික් දෙනා ගම්වල වාසයට යවනවා. ඒවායෙ ඔවුන්ට ගෙවන්ට වෙන්නෙ මහ කාලකණ්ණි ජීවිතයක්. මේක වට කර තියන මහ ගිරි හෙල් වන කතර නිසා කාටවත් ම ගැළවී යාමට ඉඩක් ලැබෙන්නෙත් නෑ. අවුරුදු විස්සකටත් වඩා සිටියවුන් මෙහි ඉන්නවා.''

''මට මේකෙන් පැන ගන්ට ලැබුණොත් ගැළවිලා යන හැටි මම දන්නවා,'' මෙහිදී හැන්ස් කීවේ ය.

''මා කියන දේ අහන්ඩ.'' වැන් ස්ටෙරවෙල්ට් බැරෑරුම් ස්වරයකින් කථා කෙළේ ය. ''ඒ අදහස මුළුමනින් ම අත් අරින්ඩ. මතක තියා ගන්ඩ ඕනැ ඔබ මා භාරයේ ඉන්න හිර-කාරයා. රජතුමා මට පුද්ගලික ව ඔබ භාර දුන්නා. යම් විදියකින් ඔබ මෙයින් පැන ගියොත් මා ඉවර යි.''

''රජතුමාගේ මහ වාසල සේවයට බැඳී එක ඉංග්‍රීසි ජාතික-යෙක් හිටියා. මගෙ යාළුවා. එක දවසක් මේ ඇත්තා රජතුමාගේ මොකක් ද පිඟන් බඩුවක් බින්ද වරදට ඔහු මැරෙන තරමට තැළෙව්වා. මීට සති කීපෙකට පස්සෙ මේ අවාසනාවන්ත මිනිහා රාජධානියෙන් පිටත ඉන්නා පෘතුගීසි ජාතිකයකුට තල්පතක ලියුමක් ලියනු අහුවෙලා ප්‍රසිද්ධ ස්ථානයක ඉඳුවාලා ඇතකු ලවා අත්පා සිඳුවාලා මරා දැමුවා. ඒ එහෙම කෙළේ අනික් අයටත් දැන ගන්ට යි.''

''අයියෝ! හරි ම භයානක යි,'' හැන්ස් පුදුම විය.

''ඔබ කැමති ද ඒ ටික මට සිද්ද වෙනවා දකින්ට ?''

''අයියෝ නැහැ.''

''එහෙම නම් අතට අත දීලා දිවුරන්ඩ මගෙ භාරයෙ ඉන්නා තෙක් පැන යාමට උත්සාහ කරන්නෙ නැහැ කියලා,'' කපිතාන් අත දිගු කෙළේ ය.

ඔහු දිගු කළ අත දැතින් ම ගත් හැන්ස් තමාගේ දිවි යතත් කපිතාන්ට හිරිහැරයක් වන දෙයක් නොකරන බවට දිවුළේ ය.

''බොහොම හොඳයි,'' කපිතාන් ඔහුගේ උරයට අත ගසා කීවේ ය. ''හොඳ ධෛර්‍යවත් තරුණයකු වගේ කතා කළා මට ඒ ඇති.'' මෙසේ කී කපිතාන් තම සාක්කුවෙන් හොඳ සැර

දුම් කොළයක් එළියට ගෙන එයින් ටිකක් කඩා මුවෙහි ලා සපන්ට විය. හැන්ස් ඉතා ගිජු ලෙස දුම් කොළය දෙස බලා සිටිනු දුටු හේ එය ඔහුට පිළිගැන්නුවෙන් හැන්ස් එකවර ම එය පිළිගත්තේ ය.

''මම හිතුවෙ නෑ ඔබ මේවා පාවිච්චි කරන බවක්. ඔය ගත කරපු වන ජීවිතේ හැටියට.'' දුම් කොළ නොදී විකීම ගැන සමාවට කරුණු වශයෙන් කී ය.

''අපි වනේදි කහට පොතු විකනවා. ඒත් මේවා ඊට වඩා හොඳා,'' කියමින් හැන්ස් තම සතුට ප්‍රකාශ කෙළේ ය.

කපිතාන් තම කබාය ගළවා තබා බිත්තියට හාන්සි විය. දැන් අපි දන්නවා අපේ තත්වය. අපි මේ අමිහිරි කතා ටිකකට අමතක කරලා වෙන දෙයක් ගැන කතා කරමු. කියන්ඩ ඔබ ගැන මට තව විස්තර,'' හේ කීවේ ය.

''ඊට ඉස්සර වෙලා මට එක ප්‍රශ්නයක් අහන්ඩ අවසර ද?'' මෙහිදී හැන්ස් ඇසුවේ ය.

''ඕ, එහෙම නම් කැලේ හිටියාට ඔබට චාරිත්‍ර අමතක වෙලා නැහැ. හොඳයි අහන්ඩ,'' කපිතාන් කීවේ ය.

''ඕලන්දයේ අපේ මිනිසුන් අතරෙ ඔවුන්ට සේවය කළ යුතු ඔබ මේ සිංහලේ රජ්ජුරුවන්ගෙ හේවා හමුදවට එක් වුණේ කොහොම ද?''

කපිතාන්ගේ බැම උඩ නැඟුණේ ය. ''මා කතා කළා ඉක්මන් වැඩියි. ඔබේ ඔය ප්‍රශ්නය මා පිළිතුරු දෙන්ට නොකැමති ප්‍රශ්නවලින් එකක්,'' හේ කීවේ ය.

''එහෙම ප්‍රශ්නයක් අහන්ඩ උණාට මම කනගාටු වෙනවා'' හැන්ස් සමාව අයැදියේ ය.

කපිතාන් මඳ වේලාවක් කල්පනා කෙළේ ය. ඉන්පසු හේ තමාගේ නිය හොඳින් පරීක්ෂා කෙළේ ය. ''දැන් ඉතින් ඔබ ඒ ප්‍රශ්නය නැගු නිසා මට හිතෙනවා උත්තර දීම හොඳය කියා. එහෙම නූනොත් ඔබ මා ගැන වඩා නරකට හිතා ගන්ඩ පුළුවනි. මම කියන්නම්, මේ රාජධානියෙ ඉන්න විදේශිකයෝ බොහොම දෙනා එක්කෝ යුද්ධ හිරකාරයෝ, නැති නම් බිඳුණු නැව්වලින් රටට ඇතුළු වෙලා හිරභාරයට නියම වූවෝ. ඒත් එයින් ටික දෙනෙක්—මාත් එක් කෙනෙක්—අපේ රටේදි කළ අපරාධයක් නිසා ජීවිතය බේරාගන්ට මේ රටේ පිළිසරණ හොයා ගෙන මෙහි ආ මිනිස්සු. මා කෝපවුණු වේලාවක මගේ උසස් නිලධාරියකුට පහර දුන්නා. ඊට නියම දඬුවම තමා මරණය.''

ඔහු දෙස ඔනෑකමින් බැලූ හැන්ස් මේ වගේ අපූරු ජේවායකු තම රටට නැති ව යාම කොතරම් පාඩුවක් දැයි කල්පනා කෙළේ ය. එහෙත් කපිතාන් කිසි ගණනකට නැති ව සිටියේ ය.

''කොහොම ද දැන් මේකෙන් පිට වෙලා යාමට අදහස් කරන්නෙ? බාග වේලාවට ඒ ගැන උපකාර වෙන්ඩ මට පුළු-වනි,'' හැන්ස් ඔහු විමසුවේ ය.

''ඔච්චර ඉක්මන් වෙන්ඩ එපා ළමයා. ඔය වගේ හයියෙන් කතා කරන්ඩත් එපා. ඔය කතාව කාට නමුත් ඇහෙන්ඩ පුළුවනි. ඕලන්ද භාෂාව තේරෙන මිනිස්සු මෙහි නෑ. ඒත් මේ රජතුමා හැම තැන ම චර පුරුෂයන් යොදා ඉන්නවා,'' යයි පහත් හඬින් කී කපිතාන් එතැනින් නැගිට හෙමින් සැරේ දොර ළඟට ගියේ ය. මුර භටයන් දෙදෙන මඳක් දුරින් ගස් සෙවණක ඉඳිනු දැකීම ඔහුගේ සැනසීමට හේතු වි ය. හේ නැවත හැන්ස් වෙත පැමිණියේ :

''ඔබ මගෙන් අහනවා කොහොම ද මෙයින් පැන යාමට අදහස් කරන්නෙ කියාලා? එහෙම දෙයක් ගැන මා තාම හිතුවේ වත් නෑ. මම දැන් මෙහි පස් අවුරුද්දක් හිටියා. මට මෙහෙ හොඳයි. යම් විදියකින් මා අපේ මිනිසුන්ට අහු උණොත් මට අත් වෙන්නෙ අවමානයත් මරණයත් තමා. ඒත් එක දවසක යම් දෙයක් වෙන්ඩ පුළුවනි. කාට ද කියන්ඩ පුළුවන්. කොයි හැටිත් මෙවෙලෙ අපි ඒ කතාවට නොබැහැ ඉඳිමු. අපි ආයෙම ඔබ ගැන කතා කරමු. මොකක් ද ඔබේ නම? ඔබ කොහේ හිට ද ආවෙ?'' මෙසේ කියා තම ඔරලෝසුව දෙස බැලූ කපිතාන් ''මට තව පැයක් නිවාඩු තියනවා,''යයි කියා කතා සල්ලාපයෙහි යෙදුණෝ ය.

හැන්ස් කෙරෙන් සමු ගෙන යන වැන් ස්ටෙරවෙල්ට් ඔහුට කතා කර, ''ඔබේ ඇඳුම වෙනස් කරන්ට වත් කෙස්ස කපා දමන්ට වත් මට අවසරයක් නැතිකම ගැන මම කනගාටු වෙනවා. පනාවක් වත් දෙන්ට තහනම්. එහෙම යි රජතුමාගෙ අණ. මම ඔබට කීවා නේ රජතුමා වල් සතුන්ට කැමති යි කියලා,'' හේ සිනහවක් පෑවේ ය. ''ඔන්න මතක තියා ගන්ඩ පැන යන්ඩ හදන්නෙ නෑ කියලා මට පොරොන්දුවක් උණා,'' කියමින් පිට වූ හේ දොර අගුළු ලා මුරකරුවන් නැවත එහි කැඳ වී ය.

මීළඟ දෙසතිය තුළ හැම දිනක ම කපිතාන් හැන්ස් දැකීමට එහි ආවේ ය. ඒ එන සමහර දක හේ තම සගයා වූ ගැස්පර් ෆෙපරේයිරා ද කැටුව ආවේ ය. ඔවුන් නිතර එක් වීමත් තමන්ගේ වීර ක්‍රියාවන් ගැන කෙරෙන කතාත් නිසා හැන්ස්ට නුදුරු අනාගතයේ තමා වෙත එල්ල වී ඇති අනතුර සිහි නො වූයේ ය.

කපිතාන් තමාගේ තත්වය ඔහුට විස්තර කර දුන් හෙයින් හේ මෙයින් පැන යාමට ද අදහස් නො කෙළේ ය.

කපිතාන්වරු දෙදෙනා ද නිතර පැමිණ වනයේ අත්දැකීම පිළිබඳ හැන්ස්ගේ කතා ඇසීමෙන් වෙහෙසට නො පැමිණියෝ ය. වනය පිළිබඳ ඔවුන්ට ප්‍රයෝජනවත් බොහෝ කරුණු ඔවුහු ඉගෙන ගත්හ. හැන්ස් වැද්දන් අතර ගත කළ ජීවිතය පිළිබඳ කතා ඇසීමට හා රනී ගැන කියන විට ඔහු උකටලී වන සැටිත් දැකීමට ද ඔවුහු ප්‍රිය කළෝ බොහෝ විට රනී ගැන සමච්චල් ද කළෝ ය.

හැන්ස් දැකීමට දින කීපයකින් ම නොපැමිණි කපිතාන් එක් දිනක් උදය කාලයේ කලබලයෙන් එහි පැමිණ හැන්ස්ට කතා කොට, ''එන්ඩ මාත් එක්ක යන්ට. රජතුමා ඔබ කැඳවනවා,''යයි කී ය.

හැන්ස් සැක සහිත ව ඔහු දෙස බැලුවේ ය.

''ආ, බය වෙන්ඩ එපා. මේ කැඳවන්නෙ, රජතුමා ටික දවසක සිට මෙහි ඉන්නා ඕලන්ද තානාපතිවරුන් වෙනුවෙන් පෙන්වන ක්‍රීඩා දර්ශනයක් බලන්ට යි,'' කපිතාන් ඔහුගේ බිය දුරු කෙළේ ය.

රජතුමා හැම විට ම විදේශීය තානාපතිවරුන් ගෞරවයෙන් නො පිළිගත්තේ ය. සමහර අවස්ථාවක හේ ඔවුන් පැමිණි විට තමා බැහැ දැකීමට ඉඩ දීමට සති ගණන් පසු කෙළේ ය. ඔවුන් මුළුමනින් සිර භාරයට පැමිණ වූ අවස්ථා ද විය. තවත් සමහර විටක අගනුවර කරා පැමිණෙන තානාපතිවරුන් සාමය සඳහා පඩුරුත් රැගෙන රාජධානියට ළං වන විට රජුගේ විරුද්ධ-තාව හැඟී යාමෙන් දැකීමට ඒමට බියෙන් අදහස ඉෂ්ට කර නොගෙන ආපසු හැරී කොළඹට ගිය අවස්ථා ද විය.

ඕලන්දයන් තමන්ගේ ප්‍රයෝජනය සඳහා රජුට මැදහත් වී සිටින්නවුන් සේ මේ රජ සැලකුවේ ය. ඔවුහු මුහුදු බඩ ප්‍රදේශයන් හා වරායවල් ද අල්ලා ගෙන ඒවා පාලනය කළ අතර පහත රට බහුල ව තුබුණ කුරුඳු වතුවල ප්‍රයෝජන අත් කර ගත්තෝ ය. ඔවුන් බල පවත්වන ප්‍රදේශවල යම් යම් රාජ්‍ය විරෝධී ක්‍රියා ඇති වූ විට එයින් රජ කෝප විය.

එසේ වුවත් මේ ඕලන්දයෝ සිංහලේ රජු රටේ රජු වශයෙන් සැලකුවෝ ය. වරින් වර රජතුමා කැමති යම් යම් පඩුරු සහිත ව තානාපතිවරුන් රජු වෙත පිටත් කළෝ ය. ඔවුහු රජුට බොහෝ ගෞරවාචාර දක්වූ අතර තමන් රජුගේ යටත් ගැත්තවුන් සේ කියා ගෙන සිටියහ. මහා ප්‍රතාපවත් අපරාජිත අධිරාජයා වැනි හරබර නම්වලින් රජු ආමන්ත්‍රණය කළෝ ය.

ඕලන්දයින්ගේ මේ ක්‍රියා රජුගේ ප්‍රෙෘඪ චිත්තය ඉවසුවේ ය. එවකට ඕලන්දයන්ගේ හා රජුගේ ද සම්බන්ධකම් හොඳින් පැවතුණේ නම් රජ තෙම ඔවුන්ගේ තානාපතීන් ගෞරවාදරයෙන් හා උත්සව ශ්‍රීයෙන් පිළිගත්තේ ය.

මේ එවැනි අවස්ථාවක් විය. ඕලන්ද තානාපතීන් දෙදෙනා පිළිගැනීමට රජ තෙම තම හේවා හමුදවක් සමග නිලමේවරුන් දෙදෙනකු සැතපුම් ගණනක් ඉදිරියට යැවී ය. ඔවුන්ගේ බඩු බාහිර ඔසවා ගෙන ඒමට කල් ඇති ව ම මිනිසුන් තැබී ය. එන මග එළි පහළි කරවූයේ ය. ඔවුන්ගේ ගමනට අශ්වයන් සැපයූ අතර භේරී තූර්‍ය්‍ය හා කොඩි සේසත් සහිත පෙරහැරකින් රාජධානියට කැඳවා ගෙන ආවේ ය. මනාව සරසන ලද මහ මැදුරක ඔවුන්ට ඉඳුම් හිටුම් සැලසූ අතර විශ්වාස කටයුතු නිලධාරීන් යටතේ විශේෂ මුරකාවල් තබන ලදි. එහෙත් තමා ම හැර අනික් කෙනකු ඔවුන් සමග කතා කරනු රිසි නො කළ රජතුමා කිසිවකුටත් ඔවුන් වෙත යාම තහනම් කොට තුබුණේ ය.

තානාපතිවරුන් මෙහි නතර ව සිටින තෙක් කල් රජුගේ වියදමින් ඔවුන්ට සංග්‍රහ සැලැස්වී ය. ඔවුන්ගේ සේවය සඳහා තරුණ තරුණියන් පවරා දුන් අතර ඔවුන්ගේ ආහාර මහ වාසල මුළුතැන් ගෙයින් ම සපයන ලදි.

ඔවුන්ගේ පැමිණීමෙන් දෙ දිනකට පසු ව මගුල් මඩුවේදී පිළිගැනීමේ රාජ සභාවක් පැවැත්විණ. මෙවෙලේ තානාපතිවරු උසස් නිල ඇඳුමෙන් සැරසී ආවෝ ය. ඔවුන්ගේ අත් දිග වෛවර්ණවත් ජකට්ටු ලොව්ච්චිවලින් අලංකාරව තිබිණ. ඇඳ සිටි කලිසම් ඉණ වටා බැඳි පටියකින් සැරසී දණ ළඟදී හිර කොට අමුණා තිබිණ. පහළ කොටස වැසෙන සේ මේස් හා බකල්-ගාංචු යෙදූ සපත්තු ද ඔවුහු පැළඳ සිටියෝ ය. ඔවුන් රජු ඉදිරියට පැමිණ නැමී ආචාර කරන විට ඔවුන්ගේ දිග කඩු පසෙකින් එල්ලුණේ ය.

ඔවුන් ගෙන ආ පඬුරු ගැන රජ පැහැදුණේ ය. සුදු පර්සියා අසුන් දෙදෙනෙක්, සිංහයෙක්, උකුසු යුවළක්, පරෙවියෝ, රන් ආලේප කළ මැදිරිවල දමූ ගිරවු හා සිල්ක් රෙදි කච්චි කීපයක් ද මේ තෑගිවලට අයත් වූහ.

ඕලන්ද තානාපතිවරුන් හා වැන් ස්ටෙරවෙල්ට් ද අතර කිසි ම සම්බන්ධයක් ඇති නොවූව ද ඔවුන්ගේ පැමිණීම පිළිබඳ ව මේ කපිතාන් විසින් කරනු ලැබිය යුතු දේ බොහෝ විය.

තානාපතිවරුන්ට පෙන්වන ක්‍රීඩා නැරඹීමට රජු විසින් හැන්ස් කැඳවනු ලබන බව දැන් වූ විට මෙතෙක් සිරකරුවකු මෙන් හුදකලා ජීවිතයක් ගෙවූ ඔහුගේ සිතේ එක්තරා සැනසිල්ලක්

ඇති වී ය. ඔහුගේ දෙනෙත් දීප්ත විය. තමා කුඩා කොලුවකු ව සිටියදී ආර්නම් නගරයට පැමිණි සරකස් කණ්ඩායමක දර්ශනය ඔහුගේ මතකට නැගී ආවේ ය.

එහෙත් හැන්ස් කපිතාන්ගේ අලංකාර ඇඳුම දෙසත් තමා දෙසත් බැලුවේ මදක් පැකිලී සිටියේ ය. "මට ඇඳ ගන්ඩ ඇඳුමක් දෙන්නෙ නැද්ද?" හේ විමසුවේ ය.

"නෑ නෑ, රජතුමා කැමති ඔය ඇඳුමෙන් ම කැඳවීමට යි. මා මේ මගෙ නිල ඇඳුම ඇඳ හිටියාට ඔබටත් මටත් ඇත්තෙ පැත්තක ඉඳ ගෙන බලා සිටින එක යි," කපිතාන් කීවේ ය.

හැන්ස් කපිතාන් කැටුව මගට බැස්සේ ය. රජු දූන් මාලිගයෙන් එළියට බසින්නේ ඉතා ම කලාතුරකින් හෙයින් මේ අවස්ථාවේ එතුමා දැක ගැනීමට වාසලින් පිටත රැස් ව සිටි පිරිස අතර මොහු දෙදෙනා ද සිට ගත්තෝ ය.

රතු නිල ඇඳුම් ඇඳ ගත් හේවාපන්න කාරයෝ කඩු හා හෙල්ල දරා මග දෙපස පෙළ ගැසී සිටියහ. ඉතා අලංකාර ලෙස ඇත් සන්නාහයෙන් සැරසූ ඇතුන් හා සන්නාහ ලූ අසුන් ද කුරුල්ලන් සහිත කුරුළුගොයින් හේ කරන්නවුන් ද දෝලා සහිත දෝලාකාරයන් ද සහිත වූ රජ පෙරහැර භේරි තූර්‍ය වාදකයන් හා ගායකයන් ද පෙරටු කොට ගමන් ගත්තේ ය.

පිරිවර සහිත ව රජතුමා පැමිණෙන වේලාවෙහි පිරිසේ කුතුහලය හා උද්වේගය ද වැඩි වී ගියේ ය. එකෙණෙහි මහත් කලබල සහිත භාවයක් ඇති විය. රජතුමා වාසලින් පිටතට පා තැබී ය. මොන තරමේ රාජ ප්‍රතාපයක් ද!

රජතුමා තුන්පත් රන් ඔටුන්නක් හිස ලා සිටියේ ය. එහි ඉදිරියේ කෙළින් සිටුවා සැදූ පැස්බර පිහාටුවකි. නිල හා රතු මිශ්‍ර කාන්තිමත් වර්ණයකින් යුක්ත වූ සැට්ටයෙහි අත් රන්වන් පැහැයෙන් යුතු විය. ඉණට ඇඳ තුබුණ රැළි කලිසම ඇස් වටය දක්වා දික් විය. ඉතිරි කොටස පාද ජාලාවෙන් හා මිරි වැඩියෙන් ද වැසුණේ විය. උර පළා එල්ලුණු පළල් පටියකට සවි වූ රන් කම් කළ මිට හා එසේ ම රන් කම් කළ කොපුවක් ද ඇති කඩුවක් විය. රජුගේ අතෙහි රතින් කර වූ විල්ලක් ඇති මේවර කළ වේවැලක් දරා සිටියේ ය. මෙහි අග කෙළවර මිණි කැට ඔබ්බන ලද්දේ විය.

මුහුණ පුරා වැඩී හිටි රැවුල හා තේජස්වී දෙනෙත ද සෙබළකුගේ මෙන් ඍජු වූ ශරීරය හා ලැසි ගමන ද රාජ ප්‍රතාපය මොනවට පිළිබිඹු කෙළේ ය. ගෞරව සම්ප්‍රයුක්ත විස්මයකින් හැන්ස් රජු දෙස බලා සිටියේ ය. එහි මොහොතක් නතර ව තමා වෙනුවෙන් සරසා සිටි පාරසීක අශ්වයා දෙස බලා සිටි රජ තෙම අසු

පිට නැගීමේ අදහස අත හැර මහඟු කඩතුරාවෙන් සරසා තුබූ දෝලියෙහි හිඳ ගත්තේ ය. එහි සිටි හැඩි දැඩි මිනිස්සු හතර දෙනෙක් උණලියෙන් තනා රිදී විලි යොදා තුබුණ අඬුවෙන් ඔසවා දෝලාව කර තබා ගත්හ.



එක වරට ම රජතුමා එහි පැමිණෙයි.

එකෙණෙහි හේරි තූර්ය වාදනය වන්ට පටන් ගැනිණ. කස පුපුරවන්නවුන් පෙරටු කොට ගෙන කුඩ කොඩි සේසත් දරන්නවුන්, නටන්නවුන්, වයන්නවුන්, ගී කියන්නවුන්, ඇතුළු රජ පෙරහැර සෙමින් ගමන් කරන්ට විය.

අසුන් පිට නැගුණ තානාපතිවරු රජුගේ දෝලාවට පිටුපසින් ගමන් කළෝ ය. අනතුරු ව දෝලා පෙළකින් ගමන් ගත් අදිකාරම්වරු ද නිලමවරු ද කාන්තාවෝ ද වූහ.

මෙ පෙරහැර මෙතරම් අලංකාර ව සාඩම්බර ව ගිය ද එයට යාමට තුබුණේ අත් තුවක්කු උණ්ඩයක් වදින තරම දුර වූ ඊක දුරකි. මෙය රාජ ඓශ්වර්යය පෙන්නීමට සැරසූ පෙරහැරකි.

දෝලාවෙන් මගක් ගිය රජතුමා මන්සලදී එයින් බැස ගත්තේ හිසේ වූ ඔටුන්න ගළවා තබා බරින් අඩු අනික් ඔටුන්නක් පැළඳ ගෙන භාණ්ඩාරපතිවරුන් අදිකාරම්වරුන් හා අනික් නිලමේවරුන් ද පිරිවරා පයින් ගමන් කෙළේ ය.

# 21

# ක්‍රීඩා සංදර්ශනය

රාජකීය කෙළි මඩල කරා යන වටමග වැටී තුබුණේ රජුගේ සතුන් ගාල ඇළයෙන් විය. එහි දුර්ලභ සත්තු විශාල සංඛ්‍යාවක් යතුරු ලූ මැදිරිවල සිර කරනු ලැබ සිටියාහ.

අනික් සියලු ම ඇතුන්ට වඩා රජුගේ ආදරය දිනා ගත් ගෝමර ඇතෙක් මෙහි සිටියේ ය. සුදු වන් ගාත් හා උස් වූ කොඳු නාරටියක් ද ඇති ඉන්දු දේශයෙන් ගෙනා ගවරෙක් ද, ව්‍යාඝ්‍රයන් හා සිංහයෝ ද, මුවන් හා වල් ඌරෝ ද, වලසුන් හා දිවියෝ ද, ඕලන්දක්කාරයන් තෑගි කරනු ලැබූ පාරසීක අශ්වයෝ ද මෙහි වූ සතුන් අතර වූහ. එසේ ම කතා කරන මයිනන් හා ගිරවුන් ද, උකුස්සන්, බස්සන් වැනි පක්ෂීහු ද, සෑද වූ තඩාගයන් අසල හංසයන් කොකුන් සේරුන් වැනි ජලචර පක්ෂීහු ද වූහ. තවත් කොටසක දඩයම් පුහුණු කර වූ කුරුළුගොයි සිටියෝ ය.

එහි වූ එක් මඩුවකට ගිය රජතුමා ඕලන්දයින්ගෙන් මෑතදී අල්ලා ගනු ලැබ එහි තබා තබූ දෙළහක් පමණ වූ කාලතුවක්කු ඔවුන්ට පෙන්වූයේ මහත් ආඩම්බරයකිනි. අල්ලා ගත් මෙ තුවක්කු රජතුමා විසින් රිදියෙන් හා තඹෙන් ද කැටයම් කොට මැණික් ඔබ්බා කරවන ලද රියවල සවිකරන ලදු ව එහි තබා තිබිණ. තමාගේ ම පිත්තල කාලතුවක්කුවලට වඩා අගය කොට සලකනු ලැබූ මෙ කාලතුවක්කු රජුගේ ජයග්‍රාහක සංකේතයක් වශයෙන් සලකන ලදී.

එතැනින් ගිය ඔවුහු සමතලා කරන ලද කුඩා කඳු ගැටයක් මතට නැංගෝ ය. ඊ සැරයක් වදින තරමේ දුර පළල ඇති මෙය ක්‍රීඩා භූමිය වී ය. ඊට නුදුරෙන් වූ මිටියාවත හරහා දමන ලද බැම්මක් නිසා මෙය ජලාශයක් බවට හැරී තිබිණ. මසුන් බහුල ව සිටි මෙම ජලාශය රජුගේ ඇතුන් නහවන ස්ථානය විය. ජලාශයත් තැනි බිමත් අතර වූ අවට කඳු හෙල් දර්ශනීය ලෙස පෙනෙන ස්ථානයෙහි තනවන ලද වර්ණවත් චිත්‍රයෙන් හා විසිතුරු කැටයමින් සරසන ලද බිත්ති හා කුළුණු ද ඇති මණ්ඩප පෙළක් ම විය. මෙයින් එක් මණ්ඩපයක සඳැල්ල ජලාශයට උඩින් සිටින සේ තැනුණේ විය. රජතුමා මෙතැන සිට බත් හා වෙනත් කෑම වර්ග මසුන්ට දැමීමෙන් විනෝද වීමට පුරුදු ව සිටියේ ය.

මෙහිදී රජතුමා රාජකීය මණ්ඩපයට ගොස් හිඳ ගත්තේ ය. තානාපතිවරුන් දෙදෙනා රජු දෙපස අසුන් ගත් අතර තවත් නිලමේවරු කීප දෙනෙක් ද එහි අසුන් ගත්හ.

ඊට යාබද මණ්ඩපයෙහි වෛවර්ණ වටනා සළුපිළියෙන් හා බබළන රන් රුවන් ආභරණයෙන් ද සැරසුණ මහ වාසල බිසෝවරු අසුන් ගත්හ. මනහර රූ සපුවෙන් හෙබි යුවති ජනයා ද මේ පිරිසට අයත් වූහ.

රජු ඉතා කුලුපග ලෙස තානාපතිවරුන් හා කථාවෙහි යෙදී සිටි අතර කැවිලි පෙවිලිවලින් සංග්‍රහයක් පැවැත්විණ. විනෝද-යට සිත ගිය රජතුමා මෙවෙලේ අමුතු ම පුද්ගලයෙක් විය. තානාපතීන් පිළිගන්නා අවස්ථාවේ පැවති සාටොප ගාථ ලක්-ෂණ කිසිවකුත් මෙවෙලේ එතුමා කෙරෙහි නො වී ය. එකල යුරෝපීය රජ කුමරුවන් මෙන් ප්‍රැන්සිස්කන් දේවගැතිවරුන් සෙවණේ ඉගෙනීම ලැබූ රජතුමාට මේ යුරෝපීය තානාපති-වරුන් සමග සමාගමය නිදහස් ප්‍රිය ජනක එකක් විය. රජතුමා ඔවුන් සමග කථා කෙළේ පෘතුගීසි භාෂාවෙනි.

මේ සිදුවීම් අතර වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හැන්ස් සමග පිරිස පිටුපස අප්‍රකට ව සිටියේ අවට සියල්ලක් හැන්ස්ට පෙන්වා දුන්නේ ය. අනතුරු ව රජු සිටි මණ්ඩපයේ පසු කොටසේ අවශේෂ නිලධාරීන් අතරට පැමිණි ඔවුහු කැවිලි පෙවිලි වලින් සංග්‍රහ ලැබුවෝ ය. අනතුරු ව පලතුරු හා තැඹිලි ද රස විඳීමට හැන්ස්ට හැකි වූයෙන් ඔහුට පළමුවරට නිදහස් ප්‍රීතිමත් හැඟීමක් ඇති විය.

අන්තිමේදී හැන්ස් කපිතාන්ට කථා කොට ''ඔබත් එක්ක මෙහි ඉඳීම මට විශාල ප්‍රීතියක්,'' යයි කීවේ ය.

එයට පිළිතුරු දෙන කපිතාන්, "ගැස්පර් වගේ රාජකාරියේ නොයෙදී මේ වගේ ඉන්ට ලැබීම මටත් ලොකු ප්‍රීතියක්. මින් ඉහත කවදවත් නොදුටු අපූරු දේ දූන් දකින්ට ලැබෙයි—ආන්න බලා ගන්ඩ," හැන්ස්ට කීවේ ය.

ක්‍රීඩා සන්දර්ශනය ආරම්භ වී තිබිණ.

අසුන් පිට නැගී ගත් අසරුවෝ හදෙනෙක් විදිලි වේගයෙන් පිටිය වටා අසුන් පැන්නූහ. මෙයින් දෙදෙනෙක් රජුගේ සිත් ගත්තෝ තෑගි ලැබුවෝ ය.

අනතුරු ව ඉන්ද්‍රජාලිකයන් ඉන්ද්‍රජාලම් පෙන් වූ පසු ව පිනුම්කාරයෝ පිනුම් සරඹ දැක් වූහ. එක් මිනිහෙක් අඩි අටක් උස රිටක් මුදුනේ කොලුවකු සිටුවා ඒ රිට තම ළය මත හිඳුවා සමබර තබා සිටියේ ය. ඔහුගේ ඊළඟ සරඹය වූයේ එකට තැබූ අඩියක් දිග තල ඇති ඊ හතරක් රිටක් මත සම බර කොට තැබීම ය. මෙසේ කළ හේ එක වරම ඇණ බා බිම හිඳ ගත්තේය. බිමට වැටුණ ඊ හතර ඔහු වටේ සතර කොණ බිම ඇනී සිටියේ ය.

ඊළඟට පැමිණි තැනැත්තා ඊ නහා දුනුදිය ඇද රඳවා සිට වූ දුනු දෙකක් අතරට පැමිණියේ එතැන බිම වැතුරුණ විට පිට දෙපසින් ඊ දෙක යන සේ පහත් කොට දුනු සිටවූයේ ය. ඉන් පසු දුනු දෙක අතර නටමින් සිටි හේ එක් වරම දුනු දෙකට සම්බන්ධ කොට තුබුණ මරුවැල ගස්සා බිම මුණින් දිගාවි ය. ඒ ක්ෂණ යෙන් ම මිදුණු ඊ දෙක පිට දෙපසින් ගියේ ය.

අනතුරු ව පැමිණියා සියුම් මුවහත් කඩු තුනක් ගත් යුවතියකි. එයින් කඩු දෙකක් දෙකිසිල්ලෙන් ගෙන අනික් කඩු තලය දතින් අල්ලා ගත් මේ යුවතිය වටයක් පිනුම් ගසා ගෙන ගොස් කෙළින් සිටියා ය. කඩු එකකුත් ලිහිල් නොවී එසේ ම තිබිණ.

ඉන් පසු ඇති වූයේ අකුසු ගත් ගොව්වන් දෙදෙනකු විසින් මෙහෙයනු ලැබූ ඇතුන් දෙදෙනකුගේ පොරයකි. මේ සතුන් දෙදෙනා එකිනෙකා දළින් අනිමින් සොඬින් පහර දෙමින් පැය බාගයක් තිස්සේ දරුණු සටනක යෙදුණෝ ය. ජය ගත් ඇතු විසින් අනිකා කෙළි බිමෙන් පිටත එළවනු ලැබීමෙන් සටන කෙළවර විය. ඇතුන් පිට නැඟී සූදනම් ව බලා සිටි වෙනත් ගොවුවන් විසින් මේ ඇතුන් දෙදෙනා මිනිසුන් අතරට යා නොදී රැක ගත්හ.

මෙයින් පසු භේරී තූර්ය වාදන හා නැටුම් සන්දර්ශනයක් ද විය. අවසාන අංකය වූයේ දුන්නෙන් විදීමේ දස්කම් පෑම ය. රටේ හොඳ ම නම ගිය දුනුවායන් දෙළොස් දෙනෙක් එකකු දිනන තුරු උනුන් තරග කළෝ ය.

විනිශ්වයකරුවන්ගේ කැඳවීම පිට එක් වැද්දෙක් ඉදිරියට ආයේ ය.

"ඇයි අප්පේ, මේ සෙලා වැද්ද නොවැ," යි හැන්ස් කී ය.

"ඒ තමා රජතුමාගෙ දඩයක්කාරයා; කොහොම ද හැන්ස් ඔහු අඳුනන්නෙ?" කපිතාන් විමසුවේ ය.

"මා නොදන්නවා නම් කවුද දන්නෙ? සෙලා නිසා නොවෙයි නම් අද මා මෙහි එන්නෙ නෑ. ඔහු තමා මා පලා ගිය මග සොයා ගිහින් මා අල්ලා දුන්නෙ," හැන්ස් කී ය.

"එහෙම ද?—වැද්දකු අල්ලා ගන්ට තව වැද්දකු යොද තියනවා නේ!" කපිතාන් කීවේ ය.

"උන්දැ එද මා අල්ලන්නෙ නෑ මගෙ පය ඇඹරිලා මට යා ගන්ඩ බැරි ව ගියේ නැති නම්."

"හා, කමක් නෑ. දැන් අපි බලමු මේ දුනු හරඹෙ; වැද්ද කොයි දවත් එන්නෙ අන්තිමට ම තමා," කපිතාන් කී ය.

වැද්ද ඉදිරියට එද්දී අවට්න්—මණ්ඩපයන්ගෙන් මෙන් ම මහජනයා සිටි පිටියෙන් ද—නැගී ආ අත් පොළසන් හඬින් මේ වැද්ද සූරයකු සේ පිළිගැනී ඇති බවක් හෙළි විය.

මෙවෙලේ තරඟ කරුවනට තබා තුබුණු ඉලක්කය පෙරට වඩා කුඩා වඩා දුරින් වූවකි. සිංහල දුනුවායා ඊ හතරක් විද්දේ හතර ම ඇතුළු වටයේ වැදුණේ ය. සෙලා වැද්දගේ මුල් ඊය ම හරියට ඉලක්කය මැදට වැදුණේ ය.

ඊළඟට චංචල වස්තුවකට විදීමෙන් ඔවුන්ගේ දක්ෂකම පෙන්විය යුතු විය. ලෑලි කඩකින් කපන ලදුව සූත්‍රයකින් දුවන්ට සැලසූ මීවින්නකුගේ රූපයක් යාර පණහකට පමණ දුරින් විය.

මෙයට ලක් කළ සිංහල දුනුවායාගේ ඊ තුන ම ඉවත ගියේ ය. සෙලා වැද්දගේ දෙවෙනි ඊයෙන් මීවිනි රුවේ පිටෙන් පතුරක් ගළවා ගෙන ගියේ ය. අවට්න් ප්‍රීති ඝෝෂාවත් අත්පොළසන් හඬත් නැගී ගියේ ය.

මෙයින් නොසතුටට පැමිණි රජ, "මගේ හොඳ ම දුනුවායාට වත් බැහැ නේ වැද්දකු තරම හොඳට විදින්ට," යයි තානාපති-වරුන් අමතා කීවේ ය. එසේ කියා අනික් අතට හැරුණු රජතෙම කපිතාන් ෆෙපරෙයිරා ළඟට කැඳවා රහසින් යමක් කොදුළේ ය. ආචාර කළ ෆෙපරෙයිරා එතැනින් නැගී ගියේ ය.

මේ අතර කාන්තාවන් සිටි මණ්ඩපයේ කලබලය මහත් සේ පෙනිණ. එහි ඉතා රූමත් යුවතියෝ දෙදෙනෙක් වූහ. රජතුමාගේ ලේලිය වූ නාලිනී හා ඇගේ ඉතා කුලුපග යෙහෙළියක වූ

සුජාතාත් මේ දෙදෙනා වූහ. මණ්ඩප සඳලුවේ සිටි නාලිනී හදිසියේ රජු සිටි මණ්ඩපය දෙස බලා "අනේ සුජාතා, අර බලන්ඩ. කවුද අර?" විමසුවා ය.

"අර මේ ළඟදි කැලෙන් අල්ලා ගෙන ආවා කියන සුදු වැද්ද ඔයා වෙන්ඩ පුළුවනි," යි ඕ කීවා ය.

"ඒක හරි, මං අහන්නෙ ඒ කවුද කියලා?"

එවිට සුදු වැද්ද දැක ගනු කැමති වූ අනික් කාන්තාවෝ ද එතැනට රොක් ව හැන්ස් දෙස බැලුවෝ ය. ස්ටෙරවෙල්ට් කපිතාන් රජතුමා දෙස බලා සිටියේ ය.

"කවුද මේ මෙහෙ ඉන්නවා කීවෙ?" තානාපතිවරුන් වූ ස්ලෙව්ට් ද රීර් ද පුදුමයෙන් විමසුවෝ ය.

"ඔබට පෙන්නන්ට මා හංගා ගෙන හිටිය අලුත් දෙයක්," රජ සිනාසුණේ ය.

"ඔහු මොන ජාතියකට අයිති කෙනෙක් ද, මහ රජතුමනි?"

"ඔය තරම ජයට ඇඳලා නැතුවාට ඒ ඕලන්දජාතිකයෙක්." වැන් ස්ටෙරවෙල්ට් කපිතාන්ට කතා කොට, "ඔය කොලුවා-ගෙන් අහමු අර වැද්ද එක්ක තරග කරන්ට හැකි ද කියා?" අණ කෙළේ ය.

තමා කලකින් දුන්නක් අල්ලාවත් නැතැයි ද, කොහොමටත් වැද්ද තරම හොඳින් විදින්ට සමත් නොවේ යයි ද හැන්ස් මැළි කෙළේ ය.

"ඒවා නිකම් බොරු කතා. ඔහු විදින්ඩ ඕනෑ. මම අණ කරනවා. අර මගෙ හේවායන්ගෙ දුනුවලින් එකක් තෝරලා ඔහු අතට දෙමු." මේ අසා සිටි රජ තෙම කීවේ ය.

කපිතාන් තැන ඇලි මැළි කරන හැන්ස් දුනුවායන් වෙතට කැඳවා ගෙන ගියේ ය. "රජතුමා අණ කරනවා. දැන් මේ වැඩෙ කරන්ඩ ඕනෑ. එහෙම නොකළොත් පල විපාක නරකට හිටින්ඩ පුළුවනි. බැරි උණාට වැරදුණාට කමක් නෑ. පුළුවන් උත්සාහ ගනිමු." හේ අවවාද කෙළේ ය.

හැන්ස් පළමුවරට දුටු පිරිස අතර කලබලයත් මුණුමුණුවත් වැඩි වන්ට විය. දිවි සමකින් පමණක් ඉණ වසා ගත්, ලැසි ගමනින් යුතු එලෙන රන්වන් කෙහෙ හා වැඩුණ ශක්තිමත් මස් පිඩුවෙන් පිරුණ එළිමහනේ ඉර එළියෙන් දිලිසෙන අඟපසඟ ඇති මේ තරුණයා ඔවුන් වෙතට ආ කිසියම් වන දෙවියකු මෙන් මිනිස්සු දුටුවෝ ය.

"බලන්ඩ, අන්න ඔහු විදින්ට යනවා." දුන්නක් තෝරා ගන්ට යන හැන්ස් දුටු සුජාතා කීවා ය.

එහෙත් නාලිනි කිසිවකුත් නො කීවා ය.

හැන්ස් සිතින් නොසිතින් තෝරා ගත් දුන්න සෙලා හා කරග කළ දුනුවායා අතට ගත් දුන්න ම විය. දුන්න අතට ගත් හැන්ස් එහි දුනු දිය ලිහා තද වෙන්ට බැඳ ගත්තේ ය. සෙලා වැද්ද නොසැලකිල්ලෙන් මෙන් මේ ක්‍රියාව බලා සිටියේ ය. හැන්ස් ඔහු දෙස බලා සිනාසුණ නමුත් මින් ඉහත කිසිදක නොදුටු කෙනකු දෙස බලන්නාක් මෙන් වැද්ද නිකම් බලා සිටියේ ය.

හැන්ස් කිසි උනන්දුවක් නැති ව දුන්න අතින් ගෙන නියමිත තැනට ගොස් සිටිය විට පිරිස අතර මහත් නිශ්වලතාවක් ඇති විය. මීවින්නා දුවවන්ට සලසන ලදි. හැන්ස් දුන්න නගා හීයක් විද්දේ ය. එය වැරදී ගියේ ය. පිරිස අතර නැවතත් මුණුමුණු ව වැඩි වී ගියේ බලාපොරොත්තු කඩ ව ගිය මිනිසුන් අතරෙන් ඇති වූවක් මෙනි. හැන්ස් දෙවනුව තුන් වෙනුව විදින ලද හී දෙකමත් ඉලක්කය වැරදී ඉවත ගියේ ය.

දෙමනසට පැමිණියකු මෙන් හේ දුන්න අයිතිකරු අතට දෙමින්, ''මා කීවා නේ හරියන්නෙ නැහැ කියලා,'' හැන්ස් කීවේ ය.

මෙහිදී සෙලාට විදීමට අණ කෙරුණෙන් හේ වඩා නො-වෙහෙසී ඉලක්කය ගෙන විද්දේ මීවින්නාගේ තටටමට විද්දේ ය.

''සෙල්ලා! සෙලා!'' මෙහිදී සෙලා අගය කරන්නෝ කෑ ගාන්ට වූවෝ ය.

හැන්ස් වෙත පැමිණි ස්ටෙරවෙල්ට ඔහුගේ පිටට අත ගසා, ''හැන්ස් දුන්න ඇල්ලූ හැටියෙන් පෙනුණා වැද්දට වඩා හොඳින් විදින්ට පුළුවන් වග. මේ පිරිස ගැන හිතන්ඩ එපා. කවුරුත් මෙතන නෑ කියා හිතාගෙන විදින්ඩ. හොඳයි මම තෝරාදෙන්නම් හොඳ දුන්නක්,'' යයි කීවේ ය.

''එයින් පලක් නෑ. ඔය දුනු ඊවලින් විදලා මට පුරුදු නෑ; මේ ඊතලත් මට පුරුදු ඒවාට වඩා බරයි.'' හැන්ස් පිළිතුරු දුන්නේ ය.

''එහෙම නම් වැද්දගෙ දුන්න ඇරගෙන විදින්ඩ දෙන්න.'' මෙහිදී හැන්ස් ගැන පැහැදුණ සිංහල දුනුවායා යෝජනා කෙළේ ය.

හැන්ස් සෙලා දෙස බලා දුන්න සඳහා අත පෑවේ ය.

එහෙත් සෙලා වැද්ද ''ඒවා මගෙ දුනු ඊ, මම දෙන්නෙ නෑ. මා එක්ක තරග කරන්ට නම් ඔහු දුනු ඊ ගෙන එන්ට ඕනෑ,'' කී හෙතෙම ඒවා පිටුපසට කර ගත්තේ ය.

''උඹ හිතනවා ද මෙවෙලෙ එහෙම කළ හැක කියා? දීපන් උඹේ දුනු ඊ, නැත්නම් පැමිණිලි කරනවා රජතුමාට,'' එක් විනිශ්චය කාරයෙක් වැද්දට කීවේ ය.

වැද්ද නොසතුටින් ම දුන්න භාර දුන්නේ ය.

දුන්න අතට ගත් කෙණෙහි ම හැන්ස්ට ඒ ගැන විස්වාසයක් ඇති විය. එහි දුනු දිය තමාට බුරුලු වැඩි බව සලකා ගත් හැන්ස් එය ලිහා දුනු කෙළවර බිම තබා දණ තබා නවා නැවත බැඳ ගත්තේ සෙලාගේ ඊවලින් තුනක් තෝරා ගත්තේ ය. ඉන් පසු කපිතාන් දෙසට හැරුණ හේ, ''මේ දුන්න මට අලුත් එකක් නිසා හුළං අත දැන ගන්ටත් එක්ක මම හිටිවන ඉලක්කයට විදින්නම් ඉස්සර වෙලා?'' හේ විමසී ය.

විනිශ්වය කරුවන් මීට එකඟ වූ හෙයින් එය කාටත් ඇසෙන සේ ප්‍රකාශ කරන ලදි.

මෙයින් වැන් ස්ටෙරවෙල්ටගේ මුහුණ සතුටින් පිපී ගියේ ය. හැන්ස් ඔහුගේ මිනිහා විය.

නාලිනී තම සළුව අත වටේ දවටමින් නොඉවසිලිමත් ව, ''අනේ මම කැමතියි ඔහු දිනනවා නම්,'' ඈ කීවා ය.

''මාත් කැමති යි,'' සුජාතා ද එකඟ වූවා ය.

පැතිර ගිය නිශ්ශබ්දතාව පෙන්නුම් කෙළේ කවුරුත් මේ ගැන උනන්දුවෙන් බලා සිටින බව ය.

බොහෝ දෙනා පරදු තැබූහ. සියල්ල හැන්ස් නොදිනන බවට ය. එහෙත් ඒ එකකුත් පිළිගත් කිසිවෙක් නො වී ය.

''විස්සට එකක් පරදු, සෙලා දිනනවාට'' පොහොසතකු සේ පෙනුණ තරබාරු කෙනෙක් කීවේ ය,

''කොයි එක ද?'' මෙහි දී කෙනෙක් විමසූවේ පිරිස සිනා ගැන්වී ය.

''තිහට එකක් පරදු, හතළිහට එක, පණහට එක පරදු'' හේ කීවේ ය.

සිටුවා තුබූ ඉලක්කයකට හැන්ස් ඊ දෙකක් විද්දේ ය. එයින් එකක් නියම තැනට අඩියක් පමණ දකුණෙන් වැදුණ අතර අනික් ඊය අඩි බාගයක් පමණ වමෙන් වැදුණේ ය.

''පනහට එකක් පරදුයි, සෙලා දිනනවා!'' හූදුකාරයා නැවතත් කී ය.

''සියයක් ඇල්ලුවත් දිනනවා. ඊ දෙකකින් ම හිටිවන ලක්කෙට විදින්ට බැරි මිනිහා අනික් ඉතිරි ඊයෙන් දුවන ලක්කෙකට කොහෙ විදින්ට ද?'' බලා සිටියෙක් කීවේ ය.

"එච්චර ම දුහුවෙට හිතන්ඩ එපා," යයි මෙහිදී ඔහුට බාධා කළ සෙලා හා තරග කළ සිංහල දුනුවායා, "ගෙහාදයි මම අල්ලන්නම් ඒ පරදුව. කෝ කවුද පරදු තිබුවෙ?" හේ විමසී ය.

"කීය ද පරදුව?"

"මේ රිදී පහ."

"හොඳයි."

හැන්ස් දුන්න අරා සිටියේ ය. මීවිනි රුව දුවන්ට සලසන ලදී. හැන්ස් බලා සිටි නමුත් නො විද්දේ ය.

"සතා දුවනවා සැර වැඩියි මා හිතනවා," හුදුකාරයා කී ය.

"ඒවා හරි වේලාවට ඇති යාළුවා," දුනුවායා පිළිතුරු දුන්නේ ය.

ඉලක්කය මිදී යාමට ළං වනවාත් සමග ම තද නිශ්ශබ්දතාවක් ඇති විය.

"දැන්" වැන් ස්ටෙරවෙල්ට පිටුපසින් සිට කීවේ ය.

හැන්ස් කෙළින් සිට එක් ලතාවකට දුන්න නගා දුනුදිය ඇද ඊය මුදා හැරියේ ය. ඊය කෙළින් ම ගොස් ඉලක්කයේ වැදුණේ ය. ඊ පහර සතාගේ හදවත පසා කර ගෙන ගොස් තිබිණ. ඊට හොඳ ඉලක්කයක් තවත් නැත.

පිරිස අතරෙන් නැගී ආ අත්පොළසන් හඬ කන් බිහිරි කරවන තරම් විය.

"මම හිතුවා ඔහු දිනන වග, මම හිතුවා ඔහු දිනන වග," කලබල වූ නාලිනී අත්පොළසන් දෙමින් කීවා ය. රන්දමින් බැඳ ඇගේ ගෙල එල්ලා ගෙන සිටි ඉඳුනිල් මිණ මෙහිදී මොනවට දිලිසුණේ ය.

සෙලාට නැවත වරක් විදීමට කී නමුත් වැද්ද හැන්ස් අතින් දුන්න උදුරා ගෙන යන්ට සැරසුණේ ය. පැරද පලා යන වීරයාට පිරිස මහ හඬින් සිනා සෙන්ටත් විසුළු කරන්ටත් වූහ.

මෙහිදී එතැන අනික් කලබලයක් ද විය. පරදු ගත් සිංහල දුනුවායා පරදු තැබූ හුදුකාරයාගේ ඉණෙන් අල්ලා ගෙන, "නැහැ ළඹ යන්නෙ නෑ. මගෙ දිනූ මුදල දීලයි යන්නෙ," කියන්ට විය.

"දැන් මා අත නැහැ. මම හෙට දෙන්නම්." පැන යාමට උත්සාහ කරන තරබාරු තැනැත්තා කී ය.

"හෙට සමහර විට නේන්ට පුළුවනි. ඔච්චර කෑ ගහලා ඔටවු අල්ලන කොට වුවමනා මුදල් ළඟ තියා ගන්ඩ දැන ගන්ඩ ඕනෑ.

හොඳයි ඒ මුදල දෙන තෙක් මම මේක උගසට තබා ගන්නම," කී හෙතෙම ඔහුගේ ඉණ වටේ දෙපටක් ඔතා තුබුණ රිදී හවඩිය උනා ගත්තේ ය. අවට සිටියෝ ඒ ගැන සතුටු ව කෑ ගැහුවෝ ය.



කදිම ඉලක්කය

රජතෙම වැද්දා හා හැන්ස් ද ළඟට කැඳවී ය. තරුණ වයසේ හොඳ ක්‍රීඩකයකු මෙන් ම දක්ෂ දුනුවායෙක් ද කදිම අශ්වාරොහකයකු මෙන් ම නිර්භීත යොධයෙක් ද වූ රජතුමා කෙනකුගේ දක්ෂතාවට හැම විට ම ගරු කෙළේ ය. මෙහිදී හැන්ස් පෙන්වූ සපත්කම මෙන් ම කලින් කළ වීර ක්‍රියා ද රජුගේ ප්‍රසාදයට හේතු විය.

ඔවුන් දෙදෙනාට ම ප්‍රශංසා කළ රජතුමා හැන්ස්ට රන් කාසි වගයක් තෑගි දුන්නේ, වැද්දට අනික් තෑග්ගකට වඩා උන් අගය කරන බුලත් පුවක් හා දුම්කොළ ද පොඩි කාසි මල්ලක් ද තෑගි වශයෙන් දුන්නේ ය.

තරඟකරුවන්ට ඉලක්කය වූ මිවින්නා රජතුමා හා තානාපතිවරු ද පරීක්ෂා කළෝ ය. හැන්ස්ගේ ඊ පහර උගේ හදවත සිදුරු කර ගෙන ගොස් තුබුණ අතර සෙලාගේ ඊය වැදී තුබුණේ උගේ තට්ටමට විය. මේ දෙදෙනා ම තමන්ගේ ගොදුරට විදීමේ දක්ෂයෝ යයි තානාපති වැන් ඊර් ප්‍රකාශ කෙළේ ය. ''අපි මොවුන් ලවා වෙනත් දේකට විද්දවා බලමු,'' ගේ යෝජනා කළේ, එතැන වූ මහා රුස්ස කොස් ගසේ මුදුන දෙස බලා, ''අර ගහ මුදුනේ තියන කුඩා ගෙඩියට,'' යයි කීවේ ය.

''ඒක හොඳ අදහස,'' රජතුමා සිනාසුණේ අසුනේ මඳක් ඇළ ව, ''මේ අපේ වැන් ඊර් තානාපති තුමා කියනවා, තොප දෙන්නාගේ ම ඊ පහරවල් ලක්කරන සතා මැරීමට සෑහෙයි කියා; දැන් එතුමා කැමතියි අර ඉහළ පෙනෙන කොස් ගෙඩියට විදිනවා දකින්ඩ,'' යයි ඔවුන්ට කීවේ ය.

සමහර විට නැති වුණ දිනුම නැවත ලබා ගන්ට අදහස් කිරීමෙන් සෙලා එක වර ම මීට කැමති විය. ඔහු විද හරිනු ලැබූ ඊය කොස් ගෙඩියේ වැදී එහි ඇමිණී සිටියේ ය.

මෙවිට තානාපති තුමන් දෙස රළු බැල්මක් හෙළූ සෙලා, ''මට විදින්ට කී නිසා විද්දා. දැන් මගෙ ඊ ගහ ඇරගෙන දෙන්ට ඕනෑ,'' යයි වේගයෙන් කීවේ ය.

මෙයට කවුරුත් සිනා සුණෝ ය. මහ වාසල අනික් මිනිසුන්ට වඩා වැද්දන්ට කථා කිරීමේ නිදහස සැලසී තුබුණේ ය.

මෙහිදී වැන් ස්ටෙරවෙල්ට් ඇමතූ රජතුමා, ''අර කොලුවාට කියමු වැද්දාගේ ඊය එළවා දෙන්ට කී ය.

ගසට නැඟීමේ අදහසින් හැන්ස් ගස දෙසට අඩි කීපයක් ගියේ රජු විසින් අතක් ඔසවා ඔහු වළකන ලදී.

''ගහට නැග නො වෙයි, දුන්නෙන්.''

හැන්ස් සෙලාගේ නොකැමැත්තෙන් ම ඔහුගේ අතින් දුන්න ගත්තේ අඩි කීපයක් ඉදිරියට ගොස් කොළතුරෙන් හොඳින් බලා ඊයක් විද හැරියේ ය. ඊ පහරින් නටුව කැපී ගිය කොස් ගැටය වැද්දාගේ ඊයත් සමග බිම වැටුණේ ය. හැන්ස් ඊය ගළවා දුන්නත් ඊයත් අයිතිකරු අතට දෙමින්, උඹේ දුන්න හොඳා යයි කීවේ ය. එහෙත් ඒ කළ ප්‍රශංසාව ගැන තැකීමක් නොකළ වැද්දා තමාගේ ආයුධ උදුරා ගෙන නොසතුටෙන් මෙන් යන්ට ගියේ ය.

ක්‍රීඩා ඉවර වී වැන් ස්ටෙරවෙල්ට් හා හැන්ස් ද රජුගෙන් සමු ගෙන කාන්තාවන් සිටි මණ්ඩපය අසලින් යන විට සළුවක් උඩින් පහත් වී හැන්ස්ගේ කරේ රැඳුණේ ය. උඩ බැලූ හැන්ස්ට

දකින්ට ලැබුණේ නිල්වන් ඇස් ඇති රූමත් යුවතියක් ඔහු දෙසට අත පා සිටින බව ය. හේ එහි උඩව නැග සළුව ආපසු කුමරියට දුන්නේ ය.

ඔවුන් එතැනින් පිට වී යන අතර වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හැන්ස්ට කතා කර, "ඒ කුමරිය කවුරු ද දන්නවා ද? ඒ තමා රජතුමා බොහොම ආදරේ තියෙන එතුමාගෙ ලේලි ය. මහ වාසල ඉන්න වඩා ම රූමත් කුමරිය" යි කීවේ ය.

# 22

# හැන්ස් සැලකිලි ලබයි

ක්‍රීඩා සන්දර්ශනයට පසු ව තානාපතිවරුන් ආපසු ගොස් සතියක් ගතවිය. එක් දිනක් වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හැන්ස් දකිමට පැමිණියේ, "ඔබට අලුත් නිවාසයක් ලැබෙනවා," යි කීවේ ය.

"කොහේ ද?" හැන්ස් විමසුවේ ය.

"එද පෙන්නූ හපන්කම් ගැන රජතුමා සතුටු වෙලා ඔබට රජ මාලිගය ළඟ ගෙයක ඉන්ට සලසා තියනවා."

හැන්ස්ගේ දෙනෙත දිලිසී ගියේ ය.

"වරදලා හිතා ගන්ඩ එපා. කොහේ ගියත් ඔබ මා භාරෙ ඉන්නා හිරකාරයා. මට පොරොන්දු වෙලා ඉන්න හැටියට මිසක් පැන යන්ට හෙම හිතන්නෙ නෑ. එහේ ගියත් රාත්‍රි කාලයටත් දවල් කාලෙන් වැඩි කොටසකත් යතුරු ලාපු ගෙයක තමා ඉන්ට වෙන්නෙ. හවස් කාලෙදි විතරක් ඒකෙ නියමිත කොටසක ඇවිදින්ටත් ව්‍යායාම කරන්ටත් ඉඩ දෙනවා," කපිතාන් තැන විස්තර කෙළේ ය.

"ඒක බොහො ම අගෙයි," හැන්ස් සතුට පෙන්නුවේ ය.

"ඔව් අගෙයි තමා; ඒත් මතක තියා ගන්ඩ රජතුමාට ළං වීම වැඩි වුණ තරමට වඩා ප්‍රවේසම් වෙන්ඩත් ඕනෑ කියල. මතක නේද අර ඉංග්‍රීසි ජාතිකයා ගැන මා කී කතාව?"

“ඒක නම් මට අමතක වෙන්නේ නැහැ,” හේ දෙවුර ගැකුළුවේ ය.

පසුව ද හැන්ස් මේ අලුත් තැන වාසයට යවන ලදි. එය හොඳට එළියත් ඉඩකඩත් ඇති තැනක් විය. එහි ඉදිරියේ කුඩා පිළක් ඇති වූ අතර දෙරටුවේ පොලු අතරෙන් මාලිගාව පිටුපස වත්තේ කොටසක් හා සුළු සේවකයන් එහා මෙහා යන එන දෙරටුව ද එතැනට පෙනුණේ ය. මොහුට හවස් කාලයේ ව්‍යායාම සඳහා ඉඩ දී තුබුණේ මෙහි තුරු වදුලේ විය. ඔහු එහි හැසිරිය යුතු සීමාවත් කපිතාන් ඔහුට පෙන්වා දුන්නේ ය. ඔහු හොඳින් සැලකිලි ලැබුවේ ය. කෑම්පීම් පවා ලැබුණේ මහ වාසලෙනි. මේ සියල්ලක් මෙසේ වුව ද ඔහුගේ ඇඳුමේ වෙනසක් ඇති කිරීමට නම් අවසරයක් නො වී ය.

රජතුමා මෙතරම් ළඟින් හැන්ස් තබා ගැනීමේ හේතුව එතුමා උසස් පෙළේ දුර්ලභ වන සතකුගෙන් ලබන විනෝදය ඔහු කෙරෙන් ලැබීම විය. අනික් අතට රජ වාසල මුර හේවායන් අතර ඔහුගේ ආරක්ෂාව වඩා හොඳින් සැලසීම ය. හැන්ස්ගේ සම්පූර්ණ වග කීමේ බර තමා කෙරෙහි පැවරී ඇති බව වැන්ස්ටෙරවෙල්ට්ගේ සිතින් බැහැර ව නො ගියේ ය. මිනිසුන්ගේ ගති ගුණ ගැන හොඳ විනිශ්චයකරුවකු වූ රජතුමාට මේ ඕලන්දයන් දෙදෙනාගේ කුලුපගකම තේරුම් ගියේ ද විය. එසේ ම මේ කපිතාන් කෙරෙන් පැන නොයන බවට හැන්ස් දිව්රුම් දී ඇති බවත් ඔහු මේ දිවුරුම කඩ නොකරන බවත් දැන සිටි රජ තෙම මුරකාවලට වඩා එම සම්බන්ධය දැඩි බවත් සලකා ගත්තේ ය.

මේ අතර මහ වාසල කටයුතු කරන සමහර දෙනකු දැක ගැනීමට හා නිදහස් ව සිටින පැයේදී කථා කරන්ට ලැබුණු සමහරකුගෙන් රජ වාසල කටයුතු ගැන අවබෝධයක් ලබා ගැනීමටත් හැන්ස්ට පුළුවන් විය.

රජුගේ පුද්ගලික සේවයේ යෙදී සිටියෝ හැම දෙන ම උසස් පවුල්වලට අයත් තරුණයෝ වූහ. ඔවුහු කොණ්ඩා වඩා සිටියෝ ය. රජ වාසල නියුක්ත වූ යුවතියෝ ද එසේ ම කුලවත් රදළ වරුන්ගේ දූවරු වූහ. ඔවුන් වසන බිසෝ මාලිගය මෙයින් එහා පැත්තේ වූ හෙයින් ඔහුට ඔවුන් දක්නට ලැබුණේ රජු ඇවිදින විට දක්නට ලැබෙන්නාක් මෙන් කලාතුරකින් විය. එහෙත් මහ වාසල මුළුතැන් ගෙයි සිටින කාන්තාවන් දකීමට ඔහුට අවස්ථා සැලසුණේ ය. මොවුන්ගේ හැසිරීමෙන් බැල්මෙන් ඔවුන් තමා හා කුලුපග කමක් ඇති කර ගැනීමට කැමැත්තෙන් සිටින නමුත් ඊට බියෙන් සිටින බව පෙනී ගියේ ය.

ජීවිතයේ කිසි දිනකත් නොලැබූ තරම හොඳින් ආහාර පාන ලැබූ හැන්ස් දවසේ එක් කොටසක් ලැබූ නිදහස ද ඇති ව මදක් ප්‍රීතියෙන් කාලය ගෙවූයේ ය.

තමාගේ ශරීරයේ සනව වැඩුණු ශක්තිමත් මස් පිඩු බොල් වී යනු දුටු හැන්ස් ළං ළං ව පිහිටි මහ ගස් දෙකක් අතර ව්‍යායාම කරන්ට වන්නේ ය. ගසේ හුරුබුහුටි ලෙස නැග යන මොහු එහි අත්තෙන් අත්තට පැන ගොස් අනික් ගසේ අත්තකට පනියි. නිකම් සිටියෝ ඔහුගේ මේ ක්‍රියාව මවිතයෙන් බලා සිටියෝ ය. මුර සෙබලෝ දුන්නට නගා ගත් හී ඇති ව පරීක්ෂා-වෙන් බලා සිටියෝ ය. මුර හේවායන්ට ඔහු ගැන මෙතරම් කරදර වීමට හේතුවක් නැත. හැන්ස් කපිතාන්ට වූ පොරොන්දුව හේ කඩ නො කරන්නේ ය.

කපිතාන් දිනපතා ම හැන්ස් දකිමට පැමිණියේ ය. බොහෝ විට මිත්‍රයා වූ ගැස්පර් ෆෙපරෙයිරා ද ඔහු සමග ආවේ ය. හැන්ස් මේ ව්‍යායාමයෙහි යෙදී සිටිනු පළමු වරට දුටු ඔවුහු තමන් මින් පෙර නොදුටු අපූරු විද්දත් රඟුමක් දකින්නා සේ ත්‍රාසයෙන් බලා සිටියෝ ය. ගස මුදුනේ සිටි හැන්ස් කෙළින් ම බිමට වැටීම වැළැක්වීමට ගසේ අතු යම් තුම් අල්ලමින් වේගයෙන් පහත් වී බිමට පනිනු බලා සිටි ෆෙපරෙයිරා, ''මේ නම් මිනිහෙක් නො වෙයි, වඳුරෙක්,'' යයි කීවේ ය. හැන්ස්ගේ කම්මුලට හුරතලයට පහරක් ගැසූ හේ තමා අත තුබුණු කජු වගයක් ඔහු අතට දුන්නේ ය.

මින් සතියකට පසු ව කපිතාන් තැන රජ අණක් රැගෙන එහි ආවේ, ''රජතුමා ඔබ කැඳවනවා. ඉක්මනින් එන්ඩ. මීට වඩා දෙයක් මට කියන්නට වේලාවක් නැහැ. රජතුමා මොනවා ඇහුවත් බොහොම ප්‍රවේසමෙන් උත්තර දෙන්ට ඕනෑ. රජතුමා කියන යමක් කරන්ඩ කැමති වෙන්ඩ ඕනෑ. ඒ වගේ ම එතුමා කෝප නොකරවන්ඩ ප්‍රවේසම් වෙන්ඩ ඕනෑ. අහන ප්‍රශ්නයට හරියට උත්තරය දුන්නොත් බය වෙන්ඩ කිසි ම හේතුවක් නැහැ,'' යි කීවේ ය.

හැන්ස් ධෛර්‍යවත් කිරීමට හේ මෙසේ උත්සාහ ගත් නමුත් මේ කැඳවීමෙන් කවර ප්‍රතිඵලයක් වේ දැයි සිතා ගත නොහැකි වූයේ බිය පත් ව සිටියේ ය.

රජතුමා පෞද්ගලික ව ඔවුන් පිළිගත්තේ ය. තමා එදා සුදු ගෝනා පිට නැඟී ගිය කතාව ඇත්තක් දැයි රජතුමා හැන්ස් විමසුවේ ය. ඒ එසේ යයි ඔහු පිළිතුරු දුන් විට, එදයින් ඉහතදීත් එසේ කොට පුරුදු ඇද්දැයි විමසී ය. තමා නිතර ගෝනා පිට නැඟී විල් එළියේ එහා මෙහා ගිය බව හැන්ස් කීවේ ය. මේ ගෝනා සමග මෙතරම්

හිතවත් වූයේ කෙසේ දැයි රජු විමසූ විට දිවියන් දෙදෙනකු එක් ව උං මරා ගැනීමට උත්සාහ ගනිද්දී තමා උංට උපකාර වීමෙන් උගේ දිවි ගළවා මිතුරු වූ සැටි හේ විස්තර කෙළේ ය.

නැවත කළු දිවියා ගැන ද ප්‍රශ්න කළ රජතුමා ඒ පිළිබඳ ව ඔහු කළ විස්තරයට ද හොඳින් කන් දී සිටියේ ය. හැන්ස් හා කෙරුණ කතාවෙන් සතුටට පැමිණි බව ඇඟ වූ රජතුමා හැන්ස්ට හොඳ හැටි සැලකිලි ලැබේ දැයි විමසුවෙන් ඒ සියල්ලක් මනාව ඉෂ්ට වන බවත් ඒ ගැන තමා කෘතඥ වන බවත් හැන්ස් කියා සිටියේ ය.

ඕලන්ද භාෂාවෙන් හැන්ස් කී කතා පෘතුගීසි භාෂාවෙන් රජුට පරිවර්තනය කර දුන් වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් තැන හැන්ස්ගේ සමහර දැඩි වචන වෙනස් කොට වඩා ශිෂ්ට විදියකින් ඉදිරිපත් කෙළේ ය.

රජුගෙන් සමු ගෙන මාලිගයෙන් පිට ව යන කපිතාන්, හැන්ස් අමතා, ''යම්තම් ඇති, ඔබ පිළිතුරුවලින් රජතුමා සතුටු වුණා. ඔබේ ග්‍රහයන්ඩ පින් දෙන්ඩ හොඳයි,'' කියා සැනසුම් සුසුමක් ලැවේ ය.

හැන්ස් සතුටෙන් සිනාසුණේ ය. එහෙත්. . . .

''දුටුවා නේ ද රජතුමාගෙ අදහස මොකක් ද කියා?'' යනුවෙන් වැන් ස්ටෙර්වෙල්ට් විමසන විට ඔහුගේ මුහුණ වෙනස් විය.

''ඒ මොකක් ද?'' හේ විමසුවේ ය. රජතුමාගේ කරුණාවත් වචනවලින් උදම් ව සිටි හැන්ස් අනික් දෙයක් ගැන නො සිතුවේ ය. රජතුමා ඔහු කෙරෙහි පැහැදීමක් ඇති කර ගත්තේ ඔහුගේ පිළිතුරුවල වූ ඍජු භාවයත් අවනත භාවයත් නිසා විය.

''ඔය සතුන් ගෙනැවිත් භාර දෙන්ට කියා ඔබට අණ කරන දිනය එතරම් දුර නොවන බව පෙනෙනවා,'' හේ කී ය.

හැන්ස් කෙරෙහි මෙතෙක් පැවති සතුටු සහගත බව ඔහු කෙරෙන් දුරු වී ගියේ ය. ''එහෙම දවසක් නේනවා හොඳයි,'' හේ පිළිතුරු දුන්නේ ය.

''එහෙම අදහසක් හිතේ ඇති කර ගන්ට එපා. අනික් දවසෙ රජතුමා කැඳවා එවුවාම එදට දිය යුතු පිළිතුර ගැන විතරක් කල්පනා කරන්ඩ හොඳයි. ඔය පෙන්වන කරුණාවට ප්‍රත්‍යුප්කාරයක් රජතුමා බලාපොරොත්තු වෙනවා. එතුමාගෙ කරුණාව ගැන ඔබ ප්‍රවේසම් වෙන්ඩ ඕනෑ.''

# 23

# රාජාඥාව

සතියකට පසු ව වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හැන්ස් සිටි මැදිරියට පැමිණ පුටුවේ හිඳ ගෙන ඔහුට කතා කෙළේ ය. "අද යි ඔබේ නඩුව විනිශ්චය කරන දවස, හැන්ස්. මම හිතනවා රජතුමාට දීමට සුදුසු පිළිතුර සූදනම් කර ගෙන ඇත කියා."

හැන්ස් කිසිවක් කීමට සැරසෙන බව දුටු හේ අතක් ඔසවා ඔහු නතර කෙළේ, "කතාව මට කරන්ට ඉඩ දෙමු, ඒකට අපට වැඩි වේලාවක් නැහැ. හැන්ස් දුටුවා නේද රජතුමන්ගෙ සතුන් ගාල? දුටුවා නේද කොයි තරම සැලකිල්ලකින් ඔවුන්ගෙ සැප පහසුකම් සලසා තියනවා ද කියාලා? මහ කැලේ නිතර බයෙන් ඉන්න ඔය විකාර සතාට හොඳට සැප ඇතු ව කිසි බයක් නැතුව මෙහෙ ඉන්ට ලැබුණා ම කොයි තරම හොඳ ද? නැත් නම් වැඩි කල් නොගොහින් ඌ දිවියකුට ගොදුරු වෙනවා," යයි කීවේ ය.

"ඒක වඩා හොඳ යි. මුළු ජීවිතේට ම හිර මැදිරියක හිර ජීවිතයක් ගෙවනවාට වඩා ඒක සැප යි. මේ රජතුමන්ගෙ හිරකරුවන් හැටියට මෙහෙ ඉන්නා ඔබත් අනිත් අයත් හොඳ හැටි දන්නවා මගෙ කත වෙ ඇත්ත. සතුන්ගෙ නැහැ මිනිසුන්ට වඩා අමුත්තක්. උනුත් කැමති යි උන්ගෙ නිදහසට. ඔය සතුන් ගාලේ කූඩුවල හිරකර ඉන්න අසරණ සතුන්ගේ බැගෑපත් මූණුත් මිනිසුන් ළං වන විට උන්ට ඇති වන තැති ගැන්මත් දුටුවා ම මට ලොකු කනගාටුවක් ඇති වුණා," හැන්ස් පිළිතුරු දුන්නේ ය.

කපිතාන් තැන සුසුමක් හෙළා නැවත කතාව පටන් ගත්තේ ය. "හැන්ස් කියන කතාවෙ ඇත්තක් නැත්තෙ නෑ. ඒ දැන් මෙතන මේ සතා වෙනුවට ඔබේ ජීවිතය කැප කරන්ට යි ඇත්තෙ. මම හැමදාමත් මේ ගැන කියා හිටියා. මීට වැඩි දෙයක් කරන්ට මට බැහැ. හා ඉතින් යමු."

ඔවුන් එහි යන විට හැන්ස් ගෙන ඒමට සම්බන්ධ වූ අදිකාරමත් දිසාවේ හා විදානේත් එහි පැමිණ සිටියාහ. පැයකට

පමණ පසු ව පැමිණි රජතුමා අසුන් ගත් විට සියලු දෙනා වැඳ වැටී ආචාර කළෝ ය. කපිතාන් තැන යුද්ධ හමුදා ආචාරය පැවැත් විය.

මෙහිදී පෙර මෙන් පූර්විකා කිසිවකුත් නො වී ය. රජතුමා අදිකාරම් තුමාට හිසින් සංඥවක් කෙළේ අදිකාරම් තුමා එද මෙන් පෘතුගීසි භාෂාවෙන් කතා කෙළේ ය. වැන් ස්ටෙරවෙල්ට් කතා පරිවර්තකයා විය.

සුදු ගෝනා අල්ලා ගෙන ඒමට විදනේ යටතේ තවත් පිරිසක් යැවීමට රජතුමා අදහස් කරන බවත්, ඒ කාරිය සඳහා මේ පිරිසට හැන්ස්ගේ සහයෝගය ලැබේ යයි බලාපොරොත්තු වන බවත්, එසේ කිරීමට හැන්ස් කැමති ද යන්න දැන ගැනීමට වුවමනා බවත් හැන්ස්ට දන්වන ලදි.

සුදු ගෝනා තවමත් එහි සිටී දැයි තමාට නො කිය හැකි බව මීට පිළිතුරු වශයෙන් හැන්ස් කීවේ ය. සමහර විට ඒ පෙදෙසේ බහුල ව සිටින දිවියන් අතින් ඌ මැරුම් කන්ට බැරි නැතැ යි ද හේ කියා සිටියේ ය.

ඒ සියල්ලක් තමා දන්නා බව හා ප්‍රශ්නයෙන් මග හැර යාමට උත්සාහ නොකොට සිරකරුගේ ම යහපත සඳහා අසන ප්‍රශ්න-යට කෙළින් පිළිතුරු දිය යුතු බවත් රාජ පුරුෂයන්ට මේ සඳහා දිය හැකි හැම ආධාරයක් ම දීමට තමා සූදනම් ද කිය යුතු බවත් ඔහුට දන්වන ලදි.

මුල් වතාවේදී මෙන් මෙහිදී ද හැන්ස් පිළිතුරු දීමට මැළි බවක් පෙන්වා සිටියේ ය. ප්‍රමාද නොකර ප්‍රශ්නයට පිළිතුරු දිය යුතු බවට ඔහුට අවවාද දෙන්නැ යි මෙහිදී අදිකාරම් කපිතාන්ට නියම කෙළේ ය. මොහු මේ සතා මහ වාසලට අල්ලා ගෙනවුත් දුන්නොත් ඔහුට ලොකු තෑග්ගක් ලැබෙන බවත් සමහර විට නිදහස පවා ලැබෙන බවත් හැන්ස්ට දැන්වී ය. මේ අතර රජතුමා උකුසු ඇසින් ඔහු දෙස බලා සිටියේ ය.

මේ කතාව තෝරා දෙනු ලැබූ හැන්ස් ඇත් එකතු කොට හිස නමා රජු ඉදිරියේ නමස්කාර කෙළේ ය. ඉන් පසු හේ වැන් ස්ටෙරවෙල්ට් දෙස බලා ගොත ගසමින් මෙසේ කී ය. ''කරුණා-කර රජතුමාට දන්වන්න ඒ කාරිය මට කරන්ට බැරි දෙයක් කියා. ඒ සතාත් මාත් සහෝදරයන් දෙදෙනකු වගෙ යි.''

මේ කතාව පෙරළා කීමට මැළි කළ කපිතාන් තැන හැන්ස් දෙස නෙත් යොමා බලා සිටියේ ය. හැන්ස්ගේ අදහස වෙනස් කරවීමට අදහස් කළ එතෙම ඒ තම බැල්මට වචනයෙන්

නොකිය හැකි වූ බියත් සිතේ අවුලත් එක් කෙළේ ය. එහෙත් හැන්ස් ඔහු කෙරෙන් දෙනෙත් ඉවත් කොට ගෙන බිම බලා ගත්තේ ය.

"ඔව, මොකද කොලුවා කියන්නෙ?" අදිකාරම සැරෙන් විමසුවේ ය.

මෙහිදී රජුගෙන් සමාව අයැද සිටි කපිතාන් ඔහුගේ කතාව පෙරළා කීවේ ය.

රජුගේ මහත් දෙනෙත ගිනි පුලිඟු මෙන් දිලිසෙන්ට විය. "ඔය මුරණ්ඩු මෝඩයාට දන්වමු, වැඩි දවසක් නොගිහින් ඔය කී අහංකාර වචන ගිල ගන්ට වෙයි කියා. කපිතාන්, මේ මෝඩයාට මීට හොඳින් කරුණු කියා දිය යුතු ව තුබුණා. කපිතාන්ට ඔහුගෙ භාරය තව දුරටත් පවරන්ට බැහැ. ඒ බරෙන් මම දැන් කපිතාන් නිදහස් කරනවා. දැන් යමු," යි අණ කෙළේ ය.

කපිතාන් වැන් ස්ටෙරවෙල්ට් රජුට ආචාර කොට හැරුණේ තවත් වරක් හැන්ස් දෙස බැලීමට එඩිතර නොවූයේ පිට වී ගියේ ය.

රජුගේ අත්පොළසනකින් යෝධ කාබෙරියෙක් එහි පෙනී සිටියේ ය. "මොහු ගෙන ගොස් ඇඳිරි ගෙයි ලා මුර කරව. ඔහුට ආහාර පාන කිසිවක් නොදෙව," යි රජ අණ කෙළේ ය.

කාබෙරියා හැන්ස්ගේ අත වලසකු මෙන් දැඩි ව අල්ලා ගත්තේ ඔහු එතැනින් එළියට තෙරපා හැරියේ ය.

රජුගේ දෙනෙත විදනේ දෙසට යොමු විය. "දූටුවා, නේද- තා ගැම්මකට නැති නරියා. ඒක තා හිතන තරම් ලේසි නෑ. මෙයින් පිට වී යව. මට වුවමනා විටක කැඳවීමට නුවරින් පිටත නොගොස් සිටුව," යි රජ තෙම අණ කෙළේ ය.

බලාපොරොත්තු කඩ ව ගිය විදනේ පා පහර ලත් බල්ලකු මෙන් ඇකිළි ඇකිළී එතැනින් පිට විය.

හැන්ස්ට දින පහකින් ම ආහාර පාන කිසිවක් නො දෙන ලදි. බිම හිඳ ගෙන දෙ දණ මත හරස් කොට තැබූ ඇතට හිස දී හිඳ ගෙන ගේ කල්පනා කෙළේ ය. රජුගෙන් ගැළවීමක් නොවන බව ඔහුට පෙනී ගියේ ය. ඔහුගේ දෙපා යදම්වලින් බැඳ එහි වූ මහ ගලක සවි වූ මුදුවකට ගලනා තිබිණ. ඔහුගේ මුව වියලී කෙළ සිඳී ගොසිනි. කෙළ ගිලින්ට උත්සාහ කළ හැම විටක ම උඟුර වේදනා විය. රජුගේ අදහස ඉටු කරවා ගැනීමට කරන අවසාන ප්‍රයත්නයක් වශයෙන් තමා හාමතේ තබා යටත් කර ගැනීමට උත්සාහ කරන බව ඔහුට හැඟී ගියේ ය.

තමා කී වචනයෙන් බැහැර නොගොස් සිටීමට තමාට ශක්තිය ලබා දෙන සේ හේ දෙවියන්ගෙන් ඉල්ලා යාච්ඤා කෙළේ ය. ඔහුගේ එක ම ප්‍රාර්ථනය එය වී ය.

ඔහු රැකවලෙහි යෙදී සිටි කාබෙරියා රෑ දවල් දෙකේ එතැන රැක සිටියේ ය. ඔහු යම් කාරියක ඉවත ගියේ එතරම් ම දරුණු අනිකකු ඔහුගේ තැන ගත් විට පමණි.

හැන්ස් විනිශ්චය ශාලාවට ගෙන යනු ලැබුවේ මේ කාබෙරින් දෙදෙනා විසිනි. රජුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් විශාල සෙනගක් එහි රැස් ව සිටියහ. ඔවුන් අතර ඇඩ්මොන්ට් වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් හා ගැස්පර් ඩිපෙරෙයිරා කපිතාන් ද අදිකාරම්වරු දෙදෙනෙක් හා තවත් නිලමේවරු ද එදා ක්‍රීඩා නැරඹීමට පැමිණ සිටි කුලවත් කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් ද එහි වූහ. රූමත් නාලිනීගේ මුහුණ තම මාමාගේ තරුණ සිරකරුවා කෙරේ වූ අනුකම්පාවෙන් දුක් මුසු ව පෙනිණි. මේ හැම දෙනා ම ලොකු බලාපොරොත්තුවකින් නිශ්ශබ්ද ව සිටිනු හැන්ස් දුටුවේ ය.

රජතුමා පැමිණ ශාලාවෙහි අසුන් ගත්තේ ය. එතුමා දෙපසින් කඩු හා හෙල්ල දරා ගත් උඩු කය නිරාවරණය වූ යෝධ කාබෙරියෝ දෙදෙනෙක් සිටියහ.

මේ මහා ශාලාව සම්පූර්ණයෙන් නිශ්ශබ්ද වූ විට වැන් ස්ටෙරවෙල්ට් කපිතාන්ට කතා කළ රජතුමා, "කපිතාන්, දැන් ඔබේ රට වැසියාගෙන් අහන්ට, කියන්ට යමක් ඇද්ද කියා," අණ කෙළේ ය.

හැන්ස් මුර සෙබළුන් දෙදෙනා අතර නිශ්ශබ්ද ව ම සිටියේ ය. රජුට ඔහුගෙන් වුවමනා කරන්නේ එක ම පිළිතුරකි. හේ කිසි දිනෙකත් ඒ පිළිතුර නො දෙයි.

රජ තෙම ශාන්ත වූ එහෙත් දැඩි ස්වරයකින් සභාව අමතා කතා කෙළේ ය. මේ කතාව අඩ නින්දේ සිටින්නකුට මෙන් හැන්ස්ට ඇසුණේ මෙසේ විය.

"මේ සුදු මිනිහා, මගේ අණින් රාජ පුරුෂයන් අල්ලා ගනු ලැබ සිටි වන සතකු නිදහස් කර හැරියා—ඒ වරද හරි ගැස්සීමට ඔහුට පහසුවෙන් හැකි කම තිබෙද්දි ඒ සතා නැවත අල්ලා ගැනීමට රාජ පුරුෂයන්ට උදව් දීම මුරණ්ඩු කමින් මගේ අණටත් අකීකරු ව ප්‍රතික්ෂේප කරනවා. හෙට ඉර උදා වී දෙපැයකින් මොහු වධක භූමියට ගෙන ගොස් ඇතකු ලවා අත් පා ඉරා දමා මැරීමට රාජාඥා කරවනවා," යි තීරණය දුන්නේ ය.

හැන්ස් එතැනින් ඉවතට ගෙන යන ලදි. ඉතා සුළු කාලයකදී විනිශ්චය ශාලාවේ කාර්යය කෙළවර විය. රජු අතින් දුන් සංඥාවක් අනුව මුළු පිරිස විසිර ගියා ය.

හැන්ස් දැඩි මුරකාවල් ඇති ව සිටි නමුත් ඔහු කැමති වූ දෙයක් ඔහුට ලැබුණේ ය. බඩගින්නේ සිටි හේ කෑමබීම ඉල්ලී ය. ශරීරය ප්‍රාණවත් කරවන දුම්කොළ ඉල්ලී ය. ඔහුට ඒවා ලැබිණ. ගමන් කිරීමට ශක්තියක් නොමැති සේ හේ දුබල ව සිටියේ ය.

රාත්‍රිය ළං ව ආයේ ය. බලාපොරොත්තු රහිත අඳුරු සිතකින් යුතු ව ඔහුට මග බැස යාමට සිදු වෙයි. තමාට විඳින්ට සිදු වන ඉරණම පිළිබඳ භයංකර දර්ශන ගැන හේ නො සිතයි. වධක භූමියක භයංකර දර්ශනය ඔහු අසා ඇත. මිනී මස් ගසා කෑමට බලා ගෙන රැඳී සිටින බල්ලන්, තැන තැන උල හිඳු වූ මිනිසුන්, අවට ගස්වල රැඳුණු මිනිස් අත් පා ආදි අවයවයන්, කපුටන් උකුසන් විසින් ඇද ඇද කනු ලබන මිනිස් අවයව,—මේ භයානක දර්ශනය මග හැරවීමට හේ අතින් මුහුණ වසා ගත්තේ ය. මේ සියල්ලක් ගැන මෙවෙලේ සිතීම නිෂ්ඵල කාරියක් වෙයි. සිතට ධෛර්යය ගෙන මිනිහකු මෙන් මරණයට මුහුණ පෑමට සූදනම් විය යුතු ය.

හේ දණින් වැටී දෙවියන්ට යාච්ඤා කෙළේ ය. තමාගේ මවුපියන්ගේ ආරක්ෂාව සලසන සේ හේ දෙවියන් අයැදියේ ය. රන්දූනා, රනී හා පෙමා ද සිහි කොට ඔවුන්ගේ ආරක්ෂාව පතා හේ යාච්ඤා කෙළේ ය. ඔවුන්ට ආයුබෝවන් නොකියා ඕනෑකමින් ම ඔවුන් අත්හැර දමා ගියේ යයි නොසිතන සේ කියා හේ යාච්ඤා කෙළේ ය. ඒ හොඳ මිත්‍රයා ෆ්‍රිට්ස් ඔහුට සිහි විය. ඔහු කොහේ සිටියත් තමාගේ ආත්මය ද ඔහු වෙත යේවායි හේ ප්‍රාර්ථනා කෙළේ ය. මා මරණයට යන මේ මොහොතේ ඒ නිර්භීත පුරුෂයා මා වෙත සිටී, යි සිතීමට මට ශක්තිය ලැබේ වා; හෙට උදේ මා වෙත පැමිණෙන මගේ ඉරණමට මුහුණ පෑමට මට ශක්තිය ලැබේ වා! යි හේ යාච්ඤා කෙළේ ය.

ඊට ටික වේලාවකට පසු ව ඔහු වීදියට ගෙන ගිය විට ඔහු අනුව වධක භූමියට යාමට පිරිසක් එහි රැස් ව සිටියා ය. සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසී එහි සිටි කපිතාන් වැන් ස්ටෙරවෙල්ට් හා කපිතාන් ෆෙරෙයිරා ද ඔහුට යුද්ධ හමුද ආචාරයෙන් ආචාර කළෝ ය. මොවුහු හැන්ස් සමග වධක භූමියට යාමට රජුගේ අවසරය ලබා ගෙන මෙහි පැමිණ සිටියෝ වූහ. හිස කෙළින් කර සෘජු ව සිටි ඔවුන්ගේ ගම්භීර මුහුණු දැකීමෙන් හැන්ස්ගේ සිතට ධෛර්යයක් ඇති විය. ඔහු දෙදෙන තමා

දෙපසින් යුද සෙබළ ගමනින් පිය තබා යන විට හැන්ස් ද වඩා සාජු ව වඩා එඩිතර පියවරකින් ගමන් කෙළේ ය.

මිනිහකු මැරෙන හැටි දැකීමේ කුතුහලයෙන් මග දෙපස පෙළ සැදී සිටි මිනිසුන් දෙස ඕනෑකමකින් නොබැලූ හැන්ස් උදෙවේගත එන ඉරේ එළියත් අවට්න් ඇහුණ මනහර කුරුලු නාදයත් වඩා හොඳින් ආස්වාදය කෙළේ ය.

එක් එළිමහන් බිමක් වට කර ගෙන විශාල පිරිසක් රැස් ව සිටිනු දැකීමෙන් තමා වධක භූමියට පැමිණි බව හේ සලකා ගත්තේ ය.

කොපුව නැති කඩුවක් පසෙකින් ඇති ව උඩුකය නොවසා සිටි විශාල දේහයක් ඇති මිනිහෙක් ඉදිරියට පැමිණ හැන්ස්ගේ භාරය ලබා ගත්තේ ය.

වැන් ස්ටෙරවෙල්ට් කපිතාන් තැන හැන්ස්ගේ අත අතින් ගෙන අනික් අත ඔහුගේ උරය මත තැබුවේ ය. ඉන්පසු ඔහුට යුද්ධාචාරයෙන් ආචාර කළ හේ එතැනින් ඉවත් විය. කපිතාන් ඡ්පරෙයිරා ද එසේ ම ආචාර කෙළේ ය. මේ හේවා භටයන්ගේ අයෝමය ධෛර්‍ය්‍ය තමා වෙත රැඳුණ බවක් හැන්ස්ට හැඟී ගියේ ය.

වධකයා හැන්ස් කැඳවා ගෙන පිටිය මැද හිඳුවා තුබූ කණුවක් වෙත ගියේ ඔහු එහි බැඳ තබා ඉවත් ව ගියේ ය.

එයට ටික වේලාවකට පසු ව මෙතෙක් අසල ගස් සෙවණක සිටි ඇතකු ඇතරුවා පිට හිඳුවා ගෙන මෑත් ව එනු දුටුවේ ය. ඇතරුවා විසින් ''දහ දහ'' යයි මෙහෙයනු ලැබූ ඇතා ළං ළං ව ආයේ ය.

ඇතා අඩි විසි පහකින් පමණ ළං ව සිටි විට උගේ දෙකන හා වලිගය ද එසවී දෙනෙත් දීප්ත ව ගියේ ය. මිනිසුන් මැරීමට පුහුණු කරනු ලැබ සිටි මේ සතා තමා කටයුත්තේ කුමක් දැයි දත්තේ ය. උගේ දෙනෙතේ දීප්තියත්, උල් යකඩ විලි දමා තුබුණ මහත් දෙදළේ භයානක කමත් ඔහුට පෙනුණේ ය. ඇතරුවා විසින් 'පුරු' යනුවෙන් මෙහෙයනු ලැබ ඉක්මන් ගමනින් පැමිණි මේ මහා හස්තියා හැන්ස්ට හොඳට ම ළං විය. බලා සිටිනු නොහැකි වූ හේ දෙනෙත් පියා ගත්තේ තමා ඇතාගේ සොඬට අසු වී මිරිකෙන මොහොත බලාපොරොත්තුවෙන් සිටියේ ය.

ඇතා ඉව කරන උණුසුම් සුසුම හැන්ස්ගේ ගතට දැනුණේ ය. ඒ සමග ම ඇතරුවා ''පුරු පුරුමා'' යි ඇතා ඉක්මන් කරවනු ද ඇසුණේ ය. එහෙත් වෙනත් කිසිවක් සිදු නො වී ය. හැන්ස් ඇස් හැර බැලුවේ ය.

ඔහුට දකින්ට ලැබුණේ මේ විශාල ඇතා පිට නැගී සිටි ගොව්වා අකුස්සෙන් ඇන ඇන 'පුරු, පුරුමා' යයි කෑ ගසමින් උං ඉදිරියට යැවීමට උත්සාහ ගැනීම ය.

එහෙත් ඇතා සිරකරුවා කෙරෙන් තව තවත් පසු බසින්ට වී ය. පිරිස අතර මුණුමුණු ව වැඩි වී ගියේ ය. ඒ ළඟට පිරිස කෑ කෝ ගසන්ට වූහ. පිරිස අතර කෙනකු ''තිරිසන්නු මිනිසුන්ට වඩා කරුණාවන්ත යි,'' කියනවා ද ඇසුණි.

කෝපාවිෂ්ට වූ ඇතරුවා ඇතාට කෑ ගසා අණ දෙමින් ඌට අකුස්සෙන් වේගවත් පහරක්. ඇන්නේ ය. ඇතා එහා මෙහා ඇඹරෙමින් කෑ ගසන්ට විය. වේදනාවත් කෝපයත් මිශ්‍ර ව මේ සතා කෑ ගෑ හඬින් පිරිසේ සිටියෝ බියපත් ව ගියහ. උදේ ම රා බී මේ කාරියට සැරසී සිටි ඇත්ගොව්වා ඇතාට තව තවත් අකුස්සෙන් ඇන්නේ ය. මෙයිනුත් නොසෑහුණු හේ ඇතාගේ ඉස ළඟින් ඉදිරියට නැමී උගේ සොඬය මුල මරු නිලයට පහරක් ඇන්නේ ය. අහස ගොරවන හඬක් මෙන් වේගවත් හඬ නැගීමක් ඇති විය. ඒ සමග ම ඇතා තදින් පිට සොලවන්ට විය. පිට උඩින් වැටෙන්ට ගිය ගොව්වා නැවතත් නැග ගෙන ආසනයෙහි හිඳ ගත්තේ ය. මීළඟට ඔහු ඇතාගේ කරමුලට පයක් ගසා දිග අකුස්සේ කෙළවරින් අල්ලා ගෙන පැත්තට නැමී උගේ කිහිල්ලට එයින් ඇන්නේ ය. දුෂ්කර අවස්ථාවල ඇතුන් හැසිරවීමට මේ නිලයට ඇනීමෙන් පුළුවන්කම ඇති වේ. මෙහිදී ඇතා වඩාත් වේගයෙන් නාද කරමින් පස්සට ගියේ බිම පා සැපුවේ ය. උගේ මුළු ශරීරය වේගයෙන් සලිත කරවා ඇත් ගොව්වා පිටෙන් බිමට හෙළුවේ ය.

ඉන්පසු ඔහු වෙත ගිය ඇතා තමාගේ එක් පයක් ඔහුගේ ළය මත තබා තද කෙළේ ය. අවට පිරිසේ ඝෝෂාව මැඩ ගෙන නැගී ගිය මර ලතෝනියකින් හා දුක් මුසු කෙඳිරියකින් ද පසු ව ඔහු කෙරෙන් ප්‍රාණ වායුව ඉවත් විය. නැවත ඇතා ඔහුගේ මළ කඳ හපයක් වන සේ පාගා පොඩි කෙළේ ය. ඉන්පසු තමා පුහුණු කරනු ලැබ සිටි සේ මේ සතා මළ මිනිහාගේ අත් පා ආදි අවයව කඩ කඩා දුරට විසි කෙළේ ය. අවට රැක සිටි හොරිකඩ පර බල්ලෝ ඒවා ඔසවා ගෙන ඉවත දිවුවෝ ය. වෙනත් බල්ලෝ ඔවුන් පසුපස දුවමින් එකිනෙකා කා ගත්තෝ ය.

කලබල වූ, අවට සිටි පිරිසට කර ගත හැකි වූයේ මේ සියල්ලක් බලා සිටීම පමණකි. මෙය සිරකරුවකු මැරීමට වඩා බිය ජනක දර්ශනයක් වූ හෙයින් තෝමර දරා සිටි සෙබළුන්ට හෝ ඇතුන් නැගී සිටි ඇත්ගොව්වන්ට හෝ කිසිවක් කර ගත නො හැකි ව ඔවුහු භීතියෙන් ගල් ගැසී බලා සිටියෝ ය.

මේ බිහිසුණු කාරිය කොට නිම වන විට ඇතාගේ දරුණු ගතිය වෙනස් වී ගියා සේ පෙනිණ. ආපසු සිරකරුවා වෙත ගිය මේ ඇතා ඔහුට එතැනින් නැගී සිටීමට අනුබල දෙන්නාක් මෙන් ඔහු සොඬින් පිරිමැද්දේ ය. එහෙත් සිරකරුවා එහි බැඳ සිටින බව දුටු සතා ඔහුත් සමග ම කණුව ගලවා බැඳ තුබුණ කඹ පොට අතර සොඬය යවා එහි බැමි බුරුල් කොට කොටය ගෙන ඉවතට වීසි කෙළේ ය. බැම්මෙන් මිදී ගිය හැන්ස්ට බිම පය ගසා නැගී සිටීමට හැකි විය.



මුළු ඇඟ මහත් වැරෙන් සොලවා ඇතා ගොවුවා බිම හෙළයි.

ඇතා ඔහු ළඟ දණ ගසා පිටට නැගීමට ඉඟි කොට සිටියෙන් හැන්ස් උගේ කනක් අල්ලා ගෙන පිට උඩට පැන කරමුල දෙපසට දෙ පය ලා හිඳ ගත්තේ ය. ඉන් පසු ඇතා කැරකී සිට විසිරී යන පිරිසෙන් ඇති වූ ඉඩවරයකින් මහ මග දෙසට පිය නැගුවේ ය. ඇතුන් ගැන දන්නා නිර්භීත ඇත් ගොව්වෝත්

ඌ මෙ යන ගමනේ සැටියෙන් තියුණු යකඩ විලි ලූ දළ ඇති ව සිටින මෙ සතාට බාධා නොකිරීමට තරම ප්‍රවෙසම් වූවෝ ය.

කිසි දිනක නොදුටු මේ අපූරු සිද්ධිය දුටු මහජනයාගේ ඝෝෂාව මහා කෝලාහලයකට පෙරළිණ. මෙහි සිටි ෆෙරෙයිරා-කපිතාන් වහා අසකු පිට නැඟී ඇතා ගමන් කරන මග සැතපුම-කින් පමණ දුර ව පිහිටි රජ මාලිගය කරා අසු පැන්නෙව්වේ ය.

මෙ විස්මය ජනක කතාව අසා නිම වූ කෙණෙහි ම මාලිගයේ සඳැල්ලට නැග බැලූ රජුට ඇතු පිට අරා ගත් දෙවියකු මෙන් යන හැන්ස් දැකිය හැකි විය. එතැන පසු කර යන හැන්ස් එහි සිටි රජුගේ පළල්ව ගිය දෙනෙතේ පැහැදිලි ව පෙනුණ විස්මය හා තැතිගැන්ම ද හොඳ හැටි දුටුවේ ය.

හැන්ස් මාලිගය පසු කර ගිය විට රජ තෙම් මේ පෘතුගීසි කපිතාන්ට හදිසි අණක් දුන්නේ ය.

කපිතාන් ෆෙරෙයිරා රජ වාසල මුර හේවායන් ද කැටුව මහ මගට බැස ගත්තේ හැන්ස් අනුව යන මහ සේනාව වැළකුවෝ ය.

පලා යන ඇතා හා හැන්ස් ද කිසිවකු විසිනුත් නොවැළකිය යුතු යයි රජතුමා අණ කරන බවට පණිවිඩයක් රැගත් අසරුවෝ දෙදෙනෙක් ඇතා පසු කර ඉදිරි මාර්ගයෙහි ගමන් ගත්තෝ ය.

නුවර වීදි දිගේත් ගම්බද වට මංවලත් ගොස් හේවායන් රැක-වලේසිටි මුරපළවලුත් පසු කර ගිය ඇතා එක් අධිෂ්ඨානයකින් දිග ගමනකට සැරසී ගන ගියේ ය. පිට උඩ හිඳ ගෙන උන් හැන්ස් උගේ ගමනට අනුව එහා මෙහා වැනී ගියේ ය. අත ළඟ ම සිදුවන්ට ගොස් යම්තම් ගැළවී ගත් මරණය පිළිබඳ විස්මෘතයෙන් ඔහු තවමත් ප්‍රකෘති සිහියට පැමිණ සිටියේ නො වී ය.

ආපසු නගරයට ගිය වෑන් ස්ටෙරවෙල්ට් හා ෆෙරෙයිරා ද මෙ වේලාවට ම ඔවුන්ගේ නිවාසයට පැමිණියෝ ඔවුන්ගේ හිස් වැසුම් ගළවා එළියේ බිත්තියේ සවි කොට තුබුණ ගෝන අංවල එල්ලා තැබුවෝ ය. ගැස්පර් ෆෙරෙයිරා ගෙට ගොස් අරක්කු බරණියක් හා වීදුරු දෙකක් ද ගෙනවුත් මේසයක් උඩ තැබුවේ ය.

''ශුද්ධ වූ දේව මාතාවනි, මෙ වගේ දෙයක් මින් ඉහත දැක තිබෙ ද?'' කුරුසයේ සටහන අඳිමින් හේ කීවේ ය.

''අද්භූත ප්‍රාතිහාර්‍යයන් සිද්ධ වූ කාලය පසු වී ගියේ ය කියන මිනිසුන් ඉන්නවා නො වේ ද?'' ස්ටෙරවෙල්ට් කතාවට එකතු විය.

"අද අප දුටු මේ සිද්දිය අවුරුදු දහක් තිස්සේ කියා ඇවිද්දත් ඒ විස්වාස කරන කෙනකු හමුවන්නෙ නෑ."

"කාට ද කියන්ට පුළුවන්, මේක තමා මිනිහාගේ කෑර විනිශ්චයට විරුද්ධ ව දෙවියන් වහන්සේ දුන් දේව විනිශ්චය."

ෆෙරෙයිරා අරක්කුවලින් වීදුරු පිරෙව්වේ, "එන්ඩ මිත්‍රයා, අපි මේ වීර තරුණයා සිහි කරලා බොමු," අනිකාට කථා කෙළේ ය.

ඔහු දෙදෙන වීදුරු එකට ගටා ඒ සැර බීම කටෙ වත්කර ගත්තෝ ය.

මගට බැස ගත් ඇතා ඒ වේගයෙන් ම සැතපුම් හතරක් ගමන් කෙළේ ය. කඳු පාමුල කටු දෙරටුව ඔවුන් වෙනුවෙන් විවෘත ව තුබුණේ ය. මුර භේවායෝ පසෙකට වී ආචාර කළෝ ය. කන්දෙන් බැස පහත මීටියාවත් ඔස්සේ ගමන් කළ ඇතා මිනිසුන් යන එන මං හැර ඇතුන් යන වන මංවලට බැස ගත්තේ ය. දූන් දූන් ගමන් වේගය අඩු විය. මේ විශාල දේහයක් ඇති සතා බෑස්මේ ගමන් කරනවාට හොඳින් හෙලේ නැග ගියේ ය. පස්සා ගාත් දෙක නමා කෙළින් වී ඌ හෙලේ නගින විට පිට උඩ සිටි හැන්ස්ට බිම නොවැටී සිටීමට උගේ පිට බදගෙන කෙළින් අතට හිඳීමට සිදු විය.

මෙසේ බොහෝ දුර ගමන් කළ ඇතා ඇල්ලකට පහතින් වූ දියකඩක් අසලට පැමිණියේ දිය බී විඩා හැර යාමට එහි නැවතුණේ ය.

මෙහිදී ඇතු පිටින් බැස ගත් හැන්ස්, ඇතාගේ දළ දෙකෙහි බහා සවි කොට තුබූ භයානක පෙනුම ඇති තියුණු උල් යකඩ විලි දෙක ගළවා ගිරි කඳුරට වීසි කෙළේ ය. ඉන්පසු හේ ඇතාගේ සොඬය වැළඳ ගෙන ඊට කම්මුල තබා ඉකි ගසා හඬන්ට වන්නේ ය. "දිකුද්! අනේ මගෙ දිකුද්."

## 24

# ගෙදර බලා වනයට යයි

හැන්ස් හා ඇතා ද වැද්දන් ඊතල තනවා ගන්නා කම්මල්කාරයාගේ නිවසට එන විට ඒ අප්‍රේල් මාසය විය. වැස්සෙන් පසු ව වනයේ ගස් මල් පල්ලෙන් බර ව කුරුල්ලන්ගේ මිහිරි ගීත නාදයෙන් පිරී පැවතිණ. බල්ලාගේ බිරීමට එළියට පැමිණ බැලූ යකඩ තලන්නා ඉදිරියට එන හැන්ස් දෙස විස්මයෙන් බලා සිටියේ ය. ඔහුගේ කැඳවීමෙන් ගෙතුළ සිටි බිරිඳ හා අටළොස් හැවිරිදි දියණිය ද එළියට ආවෝ ය. හැන්ස් තමා ගෙන ආ, එද උදෑසන මරා ගත් මුවකුගේ මස් මොහුගෙ ද ආධාර ඇති ව වහලේ පරාල කෙළවරක එල්ලුවේ ය. කම්මල්කරු යටත් පහත් ව කතා කෙළේ ය.

"ආයිබෝවන්ඩ, තමුන්නාන්සෙ ගැන ම වෙන්ඩැති අප මේ මෙච්චර දේවල් ඇහුවෙ?"

"මොනවා ද ඇහුවෙ?" හැන්ස් විමසුවේ ය.

"වැද්දන් වගේ මේ වනේ වසන සුද්දෙක් රජතුමාගෙ අණින් මරණයට කැප වෙලා මරන්ට නිල කරපු ඇතා ම බේරා ගෙන ගියයි කියලා," හේ කීවේ ය.

"ඔව්, ඒ මා තමා."

"හරි පුදුම දෙයක් නේ සිද්ද වෙලා තියෙන්නෙ; ඒ කතාව මේ රට පුරාම පැතිරිලා ගිහින්; රජතුමා ආඥවක් පතුරුවලා තියෙනවා කිසි ම කෙනෙක් ඒ ගිය දෙන්නාට කවදාවත් කිසි ම හිරිහැරයක් නොකරන හැටියට."

"රජතුමා බොහො ම හොඳයි," හැන්ස් කීවේ ය.

"අවසර, මේ පුදුමෙ කොහොම ද සිද්ද උණේ? රජ වාසල ඔක්කොම ඇතුන්ට වඩා දරුණු ම මේ ඇතා තමුන්නාන්සෙට මේ විදියට සලකන්ට?" හේ කුතුලහයෙන් විමසුවේ ය.

"කවුරු දනිද්ද" යි දෙවුර හැකුළු හැන්ස්, "මා ඥතින් වන සතුන්ට බොහො ම ආදරෙයි නේ. උන් අමාරුවක වැටී හිටිය හැම වෙලාවක ම මම උන්ට උපකාර කළා," යි කීවේ ය.

මෙහිදී කම්මල්කරුගේ බිරිඳ හා දියණිය ද කැවුම හා අග්ගලා ද නැවුම් වළං දෙකක දමා ඔහු ඉදිරියේ තැබූවෝ ය. කෙසෙල් ගෙඩි ඇවරියක් ද ගෙනවුත් තැබූවෝ ය. මෙවැනි කැවිලි අගනුවර සිටි දවස්වල ඔහුට කෑමට ලැබුණේ ය. හැන්ස් කටෙ තුබුණු බුලත් හපය ඉවත විසි කොට තරුණිය විසින් කොතලයකින් දෝතට එළනු ලැබූ දියෙන් කට සෝද ගත්තේ හිඳගෙන ඒ රස කැවිලිවලින් සුළු කොටසක් කෑවේ ය. "මේ ඉතිරි කැවිලි ටික මම ගන්ඩ ද පස්සෙ කෑමට? අනිත් එක මේ ඇතිලි දෙකත් මට දෙන්ඩ පුළුවන් ද? මේ වගේ දේ කැලේ අපට නැහැ," යි හේ කීවේ ය.

"ආ, ඒක මොකක් ද?" ඔවුහු එකඟ වූහ.

"මේ ඇත්තො බොහො ම කරුණාවන්තයි," හැන්ස් කීවේ ය.

"යමක් ඕනෑ උණා ම මෙහාට එන්ඩ. අපි දෙන්නම්," ඔවුහු කියා සිටියෝ ය.

"කෝ ඉතින් මේ වැද්දන්?" කම්මල්කරුවා විමසුවේ ය.

"කැලේ ගල් ගෙයි ඉන්නවා; මම මේ එහෙ තමා යන්නෙ."

"අපි මෙතෙක් කලක් ගනු දෙනු කළා. මම එක දවසක වත් දුටුවෙ නැහැ නේ ඔය වැද්දකු."

තමාට ලැබූ තෑගි හොඳ හැටි ඔතා වැල්පටවලින් බැඳගත් හැන්ස් කම්මල්කරුවාට හා ඔහුගේ බිරිඳට ද ස්තුති කොට ඔවුන්ගෙන් සමුගෙන ගමනට පිටත් විය. ලොකු ආසාවකින් නොනැවතී ගමන් කළ හේ වැද්දන් වසන ගල් ගේ ඇති කඳු පාමුල තෙක් ගමන් කළේ, තමන්ගේ දිවි ගළවා දුන් ආදරණීය දිකුද් සනසා උගෙන් වෙන් විය. මෙවිට අලුයම විය. වැදි ගෙදර ඇත්තෝ උදයෙන් ම කටයුතු අරඹා තිබිණ. ඔහු ගලේ නැග ගල් ගේ දෙසට එනු දුටු ගල් ගෙයි වැද්දෝ සතුටින් හා විස්මයෙන් කෑගෑවෝ ඔහු ආදරයෙන් පිළිගත්හ. ඔහු එදා පිට ව යන විට එහි සිටියෝ තුන් දෙනෙක් පමණක් වුවත් මෙවිට එහි හතර දෙනෙක් වූහ. පෙමා ඔහුගේ මනමාලිය කැඳවා ගෙනවුත් සිටියේ ය. අවුල් හිසකේ හා විකසිත දෙනෙත් ඇති මෝතොමෝ කුදුස් හැවිරිදි යුවතියක වූවා ය. හැන්ස් දැකීමෙන් වැද්දන් තිදෙනාගේ මුහුණු ප්‍රීතියෙන් පිපී ගියේ ය. රනී දෙස බැලූ හේ මේ වන සුන්දරියගේ රූප ශෝභාව පළමු වරට දුටුවකු මෙන් රස වින්දේ ය.

හැන්ස් තමන්ගේ මිනිසුන් අතරට ආවේ ය යන ප්‍රීතිමත් හැඟීමෙන් ඔවුන් අතර හිඳගෙන උන්නේ ය. ඔහු මේ ගමන වනයේ එන අතර, ඕලන්දයන් අයිති කර ගෙන සිටින දකුණු වෙරළ බඩ ප්‍රදේශය කරා යම් දූයි කල්පනා කෙළේ ය.

නැවතත් තමන්ගේ මිනිසුන් අතරට යන්ට ලැබීම එක් වාසනාවකි. එහි ගිය ඔහු හැඳින ගත් විට තමා කලින් බැඳී සිටි නැව් සමාගම තමා නැවතත් ඔවුන්ගේ සේවයට ගැනීමට බැරි සැකක් නැත. එසේ වූවොත් ඔහුට නැවතත් දිය ගොඩ සටන්වල යෙදෙන්ට ද සිදු වේ. රජ මාලිගාවේදී ඔහු ලැබූ අත්දැකීම්වලින් ඔහුට දූන් මිනිස් සමාජය එපා වී ඉවර ය. මේ වනය එසේ නො වේ. මෙහි සාමයත් නිදහසත් පවතී. අවුරුදු හයක් වාසය කොට පුරුදු මේ වනයේ දුෂ්කරතා ඇති වුවත් එහි වසන වනචර මිනිස්සු හිතවත් ය. වන සත්තු හා කුරුල්ලෝ ද එසේ ම හිතවත් වෙති. ගම සිටින මවුපියන් ගැන දූන් සිතීමට වුවමනාවක් නැත. තමා ඔවුන් දූන් සිතින් අත් හැර දමා ඇත. නැවේ සිටි සියලු දෙනාත් සමග නැව විනාශ වූ බව සමාගම මවුපියන්ට දන්වන්ට ඇත. ඒ කරුණු එසේ ම තහවුරු වීමට ඉඩ දීම වඩා සුදුසු යයි සිතූ හේ ඒ අදහස අත්හැර වැද්දන් වෙත ම ගියේ ය.

රනී කෑම උයා පළල් කැන්ද කොළයකට බෙද ඔහු ඉදිරියේ තැබුවා ය. හැන්ස් ඈ දෙස බලා සිනාසුණේ ය.

කෑම කා ඉවර වූ හැන්ස්ගෙන් වැද්දෝ ආ ගිය තොරතුරු විමසුවෝ ඔහුගේ කතාව අසා මහත් විස්මයට පැමිණියෝ ය. අන්තිමේදී පෙමා හැන්ස් ගෙන ආ පොදිය පෙන්නා මේකෙ මොනවා දැයි විමසුවේ ය.

"බලාගන්ට බැරියැ," හැන්ස් සිනාසුණේ ය.

ඔවුන් දඩයමේ ගොස් ආපසු ගල් ගෙට පැමිණි විට හැන්ස් ගල් ගෙඩිවලින් ලිප් දෙකක් තනා වළංවලට දිය වත් කොට උණුවන්ට ලිප තැබුවේ ය. ඔහු මේ කරන දෙය රනී ආසාවෙන් බලා සිටින අතර හැන්ස් එයට අලුත් මුව මස් කැබලි හා පෙති ගැසූ අල ද සහල් ද එකතු කළේ, නැවත ලුණු මිරිස් හා කරපිංචා ද දමා එය රසවත් කෙළේ ය. මේ කරපිංචා ඔහු එද්දී කඩාගෙන ආ අතර ලුණු, මිරිස්, හාල් හා අල ද කම්මල්කාරයාගෙන් ලැබුණ දේවල් විය. මේ බත් පැහිය රසවත් මෙන් ම පෝෂ්‍යදායක ද විය. වැද්දෝ ඒ ඉතා හොඳ යයි පිළිගත්හ.

උගුරට එන තෙක් මේ කෑම කෑ පෙමා "මේවා කෑමට මා කැමතියි," කීවේ ය.

හැන්ස් ගෙනවුත් දුන් දුම්කොළ ටිකා නොසෑහී බතට පෙර එය ගිල දැමූ පෙමා, "මේ කළුකොළ මගෙ ඉහ කරකවනවා" කෙඳිරි ගෑවේ ය. පෙමා දෙවට ගොස් ආපසු පැමිණ "අපරාදෙ හොඳ කෑම ටික කැලේ ගියා," යි පසුතැවිලි විය.

හැන්ස් මින් පෙර කිසි දිනක දැක නොසිටි තරමේ ප්‍රීතියකින් රනී පසු වූවා ය. මේ වගේ පිච්ච මල් සොයා ගැනීමට සුලභ

නොවූ දෙයක් වුවත් කොහෙන්දෝ නෙළා ගත් [illegible] මල් වගයක් ඈ හිසේ පැළඳ සිටියා ය. රන් රුවන් ආභරණවලට වඩා හොඳින් මේ මලින් ඇගේ ශෝභාව දියුණුව පෙනිණි.

පසුව ද හැන්ස් තනිව වනයට ගොස් දණ්ඩක් කපා අපූරු දුන්නක් තැනුවේ ය. පටටා ලනුවකින් දුනුදිය තනාගත් හේ එයින් මුවකු විද මරා ඌ මස් නොකොට ගල් ගෙට ගෙන [illegible] මේ මුවා හා දුන්නත් ඊතල දෙකකුත් රන්දූනා ඉදිරියේ තැබුවේ ය. හැන්ස් තමාගේ බිරිඳ හැටියට රනී ඉල්ලා සිටින බව කවුරුත් තේරුම් ගත්හ.

මහලු වැද්ද ඔහුගේ ඉල්ලීම ඉවසා සිනාසුණේ ය. පෙමා ද එය අනුමත කරන සිනාවකින් සංග්‍රහ කෙළේ ය. රනීගේ ප්‍රීතිය නිමහිම් නැති විය. ඇගේ හදවත තදින් ගැහෙන්ට විය.

හැන්ස් මරා ගෙන ආ මුවා මස් කොට ආහාර පිළියෙල කර කවුරුත් එක් ව කා බී සිටි කල රනී පොරෝකෙටිය කරගන්නා ගෙන ගොනා මෙන් ගල් ගෙයින් එළියට බැස්සා ය. ඊළඟ මොහොතේ හැන්ස් ද තම ආයුධ අතට ගෙන ''අපි යනවා අප්පොච්චි,'' යි කීවේ ය.

රන්දූනා සිනාවකින් ඔහුට සමු දුන්නේ ය.

මග නතර ව සිටි රනී ඔහුට හමු වී ය. දෙදෙනා අතින් අත ගෙන වනයේ ඇවිද ගෙන ගියෝ ය.

හැන්ස් අදහසක් ඇති ව දුර ගමනක යෙදෙන්නාක් මෙන් යනු දුටු රනී ඔහු අමතා, ''අප මේ කොහෙ ද යන්නෙ?'' යි විමසුවා ය.

''අර මා කී විල ළඟට රනී. ඇලිගෝනා ඉන්නා වනේට. අපට එහෙ ගියා ම දිකුද්, දීයා, ටිකී හෙමත් හම්බ වෙන්ඩ පුළුවනි. මතකයි නේ ද රනී කීවා උන් දකින්ට එහෙ යන්ට ආසයි කියා.''

අවසානය